THE BRAZILIAN CAT

කළු ව්‍යාඝ්‍රයා

සහ තවත්
ෂර්ලොක් හෝම්ස් කථා



චන්දන මෙන්ඩිස්

http://sherlockholmesinvestigations.blogspot.com

Reading Purpose Only.. Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com



කළු ව්‍යාඝ්‍රයා

සහ තවත්

ෂර්ලොක් හෝම්ස් කථා

http://sherlockholmesinvestigations.blogspot.com

කළු ව්‍යාඝ්‍රයා

සහ තවත්

ෂර්ලොක් හෝම්ස් කථා

අසංක්ෂිප්ත පරිවර්තනය

චන්දන මෙන්ඩිස්

චන්දන මෙන්ඩිස් ප්‍රකාශන

141/2, ධුව පාර, බැද්දගාන, කෝට්ටේ

Reading Purpose Only. Not For Print.

http://sherlockholmesinvestigations.blogspot.com

පටුන

1. ග්‍රොව්නර් හෝටලයේ මිනීමැරුම — 13
THE DEATH OF A STRANGER

2. පැරඩොල් කුටියේ වික්‍රමය — 82
THE ADVENTURE OF THE PARADOL CHAMBER

3. සමර්සෙට් ඛේදවාචකය — 126
THE MYSTERIOUS DEATH OF MRS. MARY STEWART

4. කළු ව්‍යාඝ්‍රයා — 211
THE ADVENTURE OF THE BRAZILIAN CAT

Reading Purpose Only...Not For Print...

http://sherlockholmesinvestigations.blogspot.com

"කොක්ස් සහ සමාගමට අයත් බැංකුවේ සුරක්ෂිතාගාරයක, තැළී, පළුදු වී, දුර්වර්ණ වී ගිය ලෝහ ට්‍රන්ක පෙට්ටියක් තැන්පත්ව ඇත.

ඉන්දියන් යුද්ධ හමුදාවේ
කලින් සේවය කළ
දෙස්තර ජෝන්. එච්. වොට්සන් (එම්. ඩී)

යනුවෙන් පින්තාරු කොට ඇති මේ පෙට්ටිය කඩදාසි හා ලිපිගොනුවලින් පිරී ඇත. මේ කඩදාසි සියල්ලක්ම පාහේ මගේ මිතු ෂර්ලොක් හෝම්ස් විවිධ කාලවලදී කළ පරීක්ෂණ පිළිබඳ විස්තර සටහන්ය......"

ගල් පාලමේ ඛේදවාචකය (**THE ADVENTURE OF THE THOR BRIDGE**) කථාව ආරම්භයේදී ඉහත සඳහන් ඡේදය කියවන්නට ලැබුණු බව ඔබට මතක ඇතුවා නිසැකය.

"අවසන් ගැටලුව" කථාන්තරයේදී මහාචාර්ය මොරියාටි සමග කළ "මල්ලව පොරය" ට පැය කිහිපයකට පෙර හෝම්ස්.......

"......මගේ මේ අපරාධ පරීක්ෂණ වෘත්තිය අද රෑට අවසන් වුණත්, ගෙවී ගිය කාලය දිහා මට උපේක්ෂාවෙන් බලන්න පුළුවනි. පරීක්ෂණ දහසකට අධික ගණනක මං යෙදිල තියෙනවා....."

දෙස්තර වොට්සන් අභිරහස් පරීක්ෂණ කීයක්, ඔහු කිසිසේත් හෙළි නොකරන "අතිශය රහසිගත" ලිපිගොනුවට දමා වසා දමුවාද?

Reading Purpose Only..Not For Print.
http://sherlockholmesinvestigations.blogspot.com

"මේ ඡායාරූපයේ ඉන්නේ මෙරී...... ඇගේ වැඩිමහල්
සොහොයුරා ජෙරාඩ් සමග.....

http://sherlockholmes...blogspot.com
Reading Purpose Only. Not For Print

"මේ ඡායාරූපයකුයි ඉන්ග්‍රිඩ් මේරි...... ඇගේ වැඩිමහල්
සොහොයුරා ජෙෆ්රි සමග......"

http://sherlockholmesinvestigations.blogspot.com

Reading Purpose Only. Not For Print

ශ්‍රීමත් ආතර් කොනන් ඩොයිල්

http://sherlockholmesinvestigations.blogspot.com

"අපි විවාහවුණේ ක්‍රයිස්ට්චර්ච් නගරයේදී........."

http://sherlockholmesinvestigations.blogspot.com

ලෝහිත පරීක්ෂණය සඳහා ජෝජ් හචිංසන්
නිර්මාණය කළ චිත්‍රය.

http://sherlockholmesinvestigations.blogspot.com

ග්‍රොව්නර් හෝටලයේ මිනීමැරුම

"ෂර්ලොක් හෝම්ස් මහත්මයාණෙනි,

අභිරහස් මිනීමැරුමක්. වහාම ග්‍රොව්නර් හෝටලයට එන්න.

බැක්වෝටර් සාමි"

නොකඩවා දොරට තට්ටුකළ පණිවුඩකරුවකු ගෙන ආ කෙටි ලිපියේ සඳහන්ව තිබුණේ එයයි. එද අප දෙදෙනා උදේ ආහාරය සඳහා මේසයට හිඳගත්තා පමණි.

"දැන් මොකක්ද වොට්සන් අපි කරන්නේ?" මගේ මිත්‍රයා ඇසුවේ සිතේ දෙගිඩියාවෙන් බව මම දැනගතිමි. "කෑම කාල ඉවර කරලම යනවද? නැත්නම් ඒ කටයුත්තට ගිහිං, පස්සෙ ඇවිත් කෑම කමුද?"

"මිනිය මැරිලා ඉවර නම් දැන් ගියත් තවත් පැය භාගයක් පනුවෙලා ගියත් ඒකේ වෙනසක් නැහැ නේද හෝම්ස්?" මා ඇසුවේ මේ වනවිටත් මා අධික කුසගින්නකින් සිටි බැවිනි. "ඔන්න මිනිහෙක් බරපතල තුවාල ලබලා පණ අදින අවස්ථාවේවත් හිටිය නං....."

"බලාගෙන ගියාම ඔබේ කථාවත් ඇත්ත" හෝම්ස් මගේ අදහසට එකඟවුවත් ඒ කැමැත්තෙන් නොවන බව මම තේරුම් ගතිමි. "එතැනට ගියාට පස්සෙ තව පැය කීයක් ඒ වැඩේට ගත වේවිද දන්නෙ නෑ. කාල බීල අවසන් කරල හිටින එක කොයිඑකටත් හොඳයි"

පණිවුඩකරුවා පැමිණ සිටියේ රෝද හතරේ ලොකු කුලීරියකිනි. මිනිත්තු කිහිපයකින් එන බව අපි ඔහුට දන්වූයෙමු. ඔහු රැඳී සිටියදී, අපි කා බී ඉක්මනින් ඇඳ පැළඳ ගතිමු.

බැක්වෝටර් සාමිවරයා එකල එංගලන්තයේ ප්‍රසිද්ධව සිටියේ මහා ධනකුවේරයකු ලෙසය. පාරම්පරිකව ඔහුට හිමිවී තිබූ විශාල වතුයාය කිහිපයක් විකුණා, ඒ මුදලින් ඔහු ලන්ඩනයේ දැවැන්ත හෝටලයක් සහ අවන්හල් කිහිපයක් ඉදිකළේය. එයින් ඔහු සාර්ථක ව්‍යාපාරිකයෙක් බවට පත්විය. සියලු නවීන පහසුකම්වලින් සමන්විත වූ ග්‍රොව්නර් හෝටලය, ධනවත් විදේශික

http://sherlockholmesinvestigations.blogspot.com

සංචාරකයන්ගේ සිත් ඇදගත් තැනක් විය. ඉන්දියාවෙන් පැමිණි මහරාජාවරුන් මෙන්ම එක්සත් ජනපදයෙන් පැමිණි කෝටිපති ව්‍යාපාරිකයන් ද එංගලන්තයට පැමිණිවිට නවාතැන් ගත්තේ මෙම හෝටලයේ බව ප්‍රකට කරුණකි. මෙහි මිනීමැරුමක් වැනි අපරාධයක් තබා සුළු සොරකමක් ගැනවත් අපට කිසිදිනෙක අසන්නට ලැබී තිබුණේ නැත. එබැවින් මෙම ආරංචිය අප දෙදෙනාගේම සිත්වල දැඩි කුතුහලයක් ඇතිකිරීමට සමත් විය.

අපේ රිය ග්‍රොව්නර් හෝටලයට ළඟාවෙද්දී උදේ නවය පසුවී තිබිණ. හෝටලයේ ආලින්දයේ සිටි බැක්වෝටර් සාමිවරයා, හෝටල් කළමනාකරු සමග පැමිණ අප පිළිගත්තේය. ඒ සමීපයේම ස්කොට්ලන්ඩ්යාඩ් පොලිසියේ රහස් පරීක්ෂක ස්ටැන්ලි හොප්කින්ස් ද සිටිනු මම දුටුවෙමි.

"සුභ උදෑසනක් හෝම්ස් මහත්මයා" සාමිවරයා ආශිංසනය කළේ හෝම්ස් අශ්වකරත්තයෙන් බැසීමටත් පෙරය. "හරිම වැඩක් නේ වෙලා තියෙන්නේ. හෝටලයේ නවාතැන් ගත් අමුත්තෙක් ඊයෙ රෑ මරාදමලා. මෙහෙම දෙයක් මගේ ජීවිතේට වෙලා නෑ. මේ ආරංචිය ලෝකෙ පුරා පැතිරුණොත් මට වෙන්නේ විශාල අලාභයක්. අමුත්තන් කවුරුවත් මගේ හෝටලයට එන්නෙ නැතිව යාවි......."

කඩා හැළෙන දිය ඇල්ලකින් වතුර ගලන්නාක් මෙන් සාමිවරයා නොනවත්වාම කියාගෙන ගියේ හුස්ම ගැනීමටවත් නොනවතිමිනි.

"උදේ පාන්දරම අපි ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියට දැනුම් දුන්නා." හෝටල් කළමනාකරු කීය. "එහෙන් එවපු මේ හොප්කින්ස් මහත්මයා තමයි කිව්වේ මේක ෂර්ලොක් හෝම්ස් මහත්තයාට භාරදෙන එක වඩා හොඳයි කියල"

අප සියලුදෙනාටම හෝටලයේ ඇතුළත කාමරයක් වෙත පැමිණෙන මෙන් කළමනාකරු සංඥා කළේය. බැක්වෝටර් සාමිගේ පෞද්ගලික කාමරය වූ එය පිහිටි පැත්තට, අමුත්තන්ට ඇතුළුවීම තහනම් බව දැක්වෙන පුවරුවක් සවිකර තිබිණි.

සාමිවරයාගේ නියමය අනුව අපි සුවපහසු ආසනවල හිඳගත්තෙමු. "ග්‍රීන්වුඩ්." බැක්වෝටර් සාමි කීවේ හෝටල් කළමනාකරුට ය. "ඔබට කියන්න තියෙන හැම දෙයක්ම දැන් මේ මහත්වරුන්ට කියන්න."

 http://sherlockholmesinvestigations.blogspot.com

"මහත්වරුනි. මං හැම්විටම ක්‍රියාකරන්නේ මට මෙතුමාගෙන් ලැබී ඇති නියෝගවලට අනුකූලව" ග්‍රීන්වුඩ් පැවසුවේ සාමිවරයා දෙසට හිස පහත් කරමිනි. "හෝටලයට නවාතැන් ගන්න එන සෑම අමුත්තෙක්ම, ඔහුගේ නම හා ලිපිනය අමුත්තන්ගේ පොතේ සටහන් කළ යුතුයි. මේ කියන අමුත්තා හෝටලයට එන වෙලේ, ඒ කියන්නේ පහුගිය පෙබරවාරි 4 වැනිද සවස 4ට පමණ මං හිටියේ අමුත්තන් පිළිගන්නා අංශයේ.

"සති තුනක් හතරක් මට මෙහේ නවතින්න උවමනායි. තනි කාමරයක් දෙන්න පුළුවන්ද?" ඔහු ඇසුවේ විදේශික උච්චාරණයකින් ඉංග්‍රීසි කථාකරමින්.

"ඔව් පුළුවන් මහත්මයා" අපේ ලිපිකරු කිව්වා. "අප ළඟ තියෙනවා පළමුවැනි, දෙවැනි හා තුන්වැනි පංතියේ කාමර. ඔබට උවමනා මොන පංතියේ කාමරයක්ද?"

"මට පළමුවැනි පංතියේ කාමරයක් දෙන්න" අමුත්තා කිව්වා.

"සති තුනකටද? හතරකටද?" ලිපිකරු ඇහුවා.

"සති හතරකට"

"කෑම සඳහා අයකිරීම් ඇතුළුව ගාස්තුව පවුම් එකසිය අසූඅටයි සිලිං දහයක් වෙනවා මහත්මයා" ලිපිකරු කිව්වේ කාමර ගාස්තුව ගණන් බැලීමෙන් පසු.

"බොහොම හොඳයි" අමුත්තා කිව්වේ ඔහුගේ මුදල් පසුම්බිය ඉවතට ගනිමින්. "මෙතැන තියෙනවා පවුම් එකසිය පනහක්. මට මේකට රිසිට්පතක් දෙන්න. ඉතිරි මුදල් දින කිහිපයකදී මම ගෙවන්නම්" ඔහු කිව්වා.

සාමාන්‍යයෙන් හෝටලයට එන අමුත්තන්, ලැගුම් ගන්නා වෙලාවේදීම මේ තරම් විශාල මුදලක් ගෙවන්නෙ නැහැ. බොහොම දෙනෙක් සතියක් දෙකක් නවතින්න බලාපොරොත්තු වුණත්, එකවර මුදල් ගෙවන්නෙ දින තුන හතරකට පමණයි. ඒ හින්ද මං කරමින් හිටි කටයුත්තු නවත්වා ඔහු දිහා බැලුවා. මේ වන විට ලිපිකරුවා රිසිට්පත ලිවීමට සූදානමින් සිටියා.

"මහත්මයා ඔබේ නම හා ලිපිනය?"

"මැතිව් ජෙප්, බර්න් චතුරශ්‍රය, සූරිච්, ස්විට්සර්ලන්තය." අමුත්තා කිව්වා. අඩි පහයි අඟල් අටක් පමණ උස, මධ්‍යම ප්‍රමාණයේ සිරුරක් තිබුණු ඔහු, වයස අවුරුදු තිහක - තිස්පහක කෙනෙක්. ඔහු

http://sherlockholmesinvestigations.blogspot.com

ස්විට්සර්ලන්ත ජාතිකයෙක් කියා මට කොහොමටවත් හිතුණේ නැහැ. ඒ මොකද ඔහුගේ තිබුණු අව්වට පිළිස්සුණු ස්වභාවය නිසාත්, සැරසී සිටි ඇඳුම් පැළඳුම්වල තිබූ අපිළිවෙළ නිසාත්. පසුගිය සති තුන පුරාම මට ඔහු ඒ හැටි දකින්න ලැබුණේ නැහැ. ඔහු තමන්ගේ කෑම, තම කාමරයට ගෙන්වා ගත් බවත් මට අහන්න ලැබුණා.

ඊයේ හවස හෝටලයේ මිදුලේ සිටි ඔහු, රාත්‍රී 7ට පමණ ආපහු ඇවිත් තියෙන්නේ තවත් අමුත්තෙකු සමග, වෙනදට ඔහු මේ ආකාරයට අමුත්තන් සමග එන්නෙ නැති බවයි සේවකයන් කියන්නේ. දවල් කාලයේදී නම් ඔහු අමුත්තෙකු සමග ආ හැටි ලිපිකරුවා දැකල තියෙනවා. ජෙප් මහත්තයා දන්නුවලු දෙදෙනෙකුට කෑම, රාත්‍රී 9ට තමන්ගේ කාමරයට එවන්න කියල. ලිපිකරුවා ඒ බව පොතේ සටහන් කරගෙන මුළුතැන්ගෙට දැනුම්දීල තියෙනවා.

රාත්‍රී 9ට හෝටලයේ වේටර් කෙනෙක් රාත්‍රී කෑම අරගෙන ජෙප් මහතාගේ කාමරයට ගියා. වේටර්ට දකින්න ලැබුණේ ජෙප් මහතාත් අමුත්තාත් විස්කි පානය කරමින්, ගොඩාහොම උස් හඬින් හිනාවෙමින්, කතාබහ කරමින් සිටි බවා. ඒ අමුත්තා කොයි වෙලාවේ හෝටලයෙන් පිටවී ගියාද කියන එක අපි දන්නේ නැහැ.

එම වේටර්වරයාම උදේ කෑම හා කෝපි පෝච්චිය අරගෙන ගිහිං ජෙප් මහතාගේ දොරට තට්ටුකරලා තියෙනවා. කිහිපවිටක්ම තට්ටු කළත් පිළිතුරක් ලැබිල නැහැ. බොහොම වෙලාවට රෑ වෙනතුරු මත්පැන් බොමින් ඉඳල නිදාගන්නා අමුත්තන් උදේට අවදිකරන්න අමාරුයි. එහෙම හිතලා වේටර් නිකමට උත්සාහ කර බැලුවාලු, දොර අරින්න පුළුවන්ද කියලා. එය පහසුවෙන්ම විවෘත වුණු හැටි දකලා ඔහු පුදුමයට පත්වුණාලු. මිළඟට වේටර් "මහත්මයා" කියල උස්හඬින් කථාකළාලු. එයටත් පිළිතුරක් නොමැති තැන කාමරය ඇතුළටම ගිය ඔහුට දකින්න ලැබුණේ මොකක්ද? අපේ නේවාසික ජෙප් මහතා, ඔහුගේ හාන්සිපුටුවේම මරාදමා ඇති අන්දම!.

තිගැස්සීමට පත් සේවකයා අතින් කෝපි පෝච්චිය සහිත බන්දේසිය බිම අතහැරුණාලු. ඔහු වහාම දුව ඇවිත් මට දැනුම් දුන්නා. එවිටයි මං පොලීසිය දැනුවත් කළේ"

 http://sherlockholmesinvestigations.blogspot.com

එම විස්තරයට සවන්දුන් පසු අමුත්තා වෙනුවෙන් රාජකාරි කළ වේටර්වරුන් හමුවීමට හෝම්ස් කැමැත්ත පළකළේය.

"මළසිරුර හොයාගත් ජෝන් නම් සේවකයා හිටියේ හිතේ හරිම කැලඹීමෙන්. මං කිව්වා ඔහුට ගෙදර ගිහින් හෙට එන්න කියලා. අනෙක් සේවකයා තවම වැඩට ඇවිත් නැහැ"

මීළඟට අපි මිනීමැරුම සිදුවූ තැන බැලීමට ගියෙමු.

දෙවැනි තට්ටුවේ පිහිටි පළමුවැනි පංතියේ සුඛෝපභෝගී කාමරයක් වූ එහි දොර විවෘතව තිබිණි. පොලිස්භටයෙක් ඒ අසල මුරට සිටියේය.

එය ඉතා විශාල කාමරයක් විය. ගිනි උදුනට මුහුණ ලා සැපපහසු හාන්සිපුටු දෙකක් තිබිණි. අවාසනාවන්ත අමුත්තා ඉන් එකක් මත මියගොස් සිටියේය. ඔහුගේ හිස දැත්තකට කඩා වැටී තිබිණි. ශරීරය ලෙයින් නැහැවී තිබූ අතර සිරුරෙන් ගලා ගිය ලේ පුටුව යටත් කාමරයේ තැන් කිහිපයකත් එකතු වී තිබිණ. පුටුවට දකුණු පසින්, අඩි දෙකක් පමණ ඈතින් මකාල්ට් වර්ගයේ රිවෝල්වරයක් බිම වැටී තිබූ අයුරු අපි දුටුවෙමු. මරණය සිදුවූයේ කෙසේද යන්න බැලූ බැල්මට පෙනිණ. ඉදිරියේ සිට අනිත ලද උල් පිහියක් පේජ් මහතාගේ පපුවේ වම්පැත්ත පසාකරගෙන ගොස් තිබිණි. එය මිට ළඟටම ළය තුළට කිඳා බැස තිබූ බව හොඳින් බැලීමේදී දැකිය හැකි විය.

කිසිවක් නොකී ෂර්ලොක් හෝම්ස් ඇසිපිය නොහෙළා මෘත ශරීරය දෙස බලා සිටියේය. මිනිත්තුවක් දෙකක් පමණ නිහඬව සිටි ඔහු දෙස අන් අය බලා සිටියහ.

"කාමරය තවත් අවුල්වෙන්න කලින් මාව මෙහි කැඳවීම ගැන ඔබ හැමදෙනාටම මම ස්තුති කරනවා" හෝම්ස් කීවේ බැක්වෝටර් සාමි හා හොප්කින්ස් දෙස බලමිනි.

"පොලිස් ශල්‍ය වෛද්‍යවරයාට මරණයට හේතුව තීරණය කිරීම ඒ තරම් අපහසු වේවි කියල මං හිතන්නෙ නැහැ. කොහොම වුණත් ඔහුගේ පැමිණීම තවත් පැයකින් කල්දමන්න ඔබට පුළුවන්ද හොප්කින්ස්?"

"හෝම්ස් මහත්මයා" පොලිස් නිලධරයා කීය.

"මේකෙදි මරණ පරීක්ෂණය සඳහා මිනිය මෘත ශරීරාගාරයට යැව්වාම ඇති. ඔබ කැමැති තරම් වෙලා අරගෙන ඔබේ පරීක්ෂණ කටයුතු අවසන් කරන්න."

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔබට ස්තුතියි හොජ්කින්ස්" කී හෝම්ස් මීළඟට තම අවධානය යොමුකළේ හෝටලයේ කළමනාකරු දෙසටය. "දැන් අපි මේ කාමරය පරීක්ෂාකිරීම අරඹනවා. එය අවසන් කරන තෙක් ඔබේ අමුත්තන්ට හෝ සේවකයන්ට මේ පැත්තට එන්න ඉඩදෙන්න එපා....... තවත් එක ප්‍රශ්නයක් ග්‍රීන්වුඩ් මහත්මයා. මේ පිහිපාර එල්ල වෙද්දී මේ මනුස්සයාගෙ කටින් භයානක මරලතෝනියක් පිටවෙන්න ඇති. හෝටලයේ කාටවත්ම එය ඇහුණේ නැද්ද? හෝටලයේ සේවකයෙකුට? නැත්නම් අමුත්තෙකුට?"

"මහත්මයා" ග්‍රීන්වුඩ් කීය. "මේ සුඛෝපභෝගී අංශයේ කාමර වැඩිගණනක් කොහොමටත් මේ දිනවල හිස්. ඒ නිසා සේවකයන් යනවා එනවා අඩුයි. ඉන්න අමුත්තන් දෙතුන් දෙනාත් තවමත් තමන්ගෙ කාමරවල නිදි. දවල් වෙද්දී අපට ඔවුන්ගෙන් විමසා බලන්න පුළුවනි, එහෙම විලාපයක් ඇහුණාද කියලා"

"ග්‍රීන්වුඩ්. අපි මේක පුළුවන් තරම් රහසිගතව තබාගත යුතුයි" බැක්වෝටර් සාමි කීය. "මේක මහා අපකීර්තිමත් සිද්ධියක්. පිටකෙනෙක් හෝටලයට ඇවිත් අමුත්තෙක් ඝාතනය කරල යෑම අපට අපහාසයක්, ලැජ්ජාවක්, නින්දාවක්. ග්‍රාව්නර් හෝටලයේ මිනීමැරුමක් වුණා කියල එංගලන්තයේ පුවත්පත්වල පළවුණොත් ඒක ඇමරිකාවේ හා යුරෝපයේ පුවත්පත්වලටත් යාවි. ඊළඟට මුළු ලෝකය පුරාම ප්‍රචාරය වේවි"

"සාමිතුමනි" හෝම්ස් කීය. "අපි නම් මේක අනිවාර්යයෙන්ම රහසිගතව තබාගන්නවා. ඒත් මේ ආරංචියට දැනටමත් පුවත්පත් වාර්තාකරුවන් වෙත ගිහින් ඇති. ඒ ගැන සැකයක් නෑ."

බැක්වෝටර් සාමිවරයාගේ මුහුණේ පළවූයේ කැළඹීමට පත් ලකුණුය. "හෝම්ස් මහත්තයල මෙහෙ පරීක්ෂණය කරපුවාවෙ." ඔහු කීය. "අපි ගිහින් සේවකයින් කැඳවලා දැනුම්දෙමු. මේක රහසිගතව තබා ගත යුතු කරුණක් බව"

ඔවුන් දෙදෙනා එතැනින් පිටවී යනු දුටු මගේ මිත්‍රයාගේ මුවගට නැඟුණේ සිනාවකි.

"ඒක අපට ලොකු පහසුවක්" කී හෝම්ස් මුලින්ම තම සටහන් පොත එළියට ගෙන කාමරයේ සැලැස්ම ඇඳගැනීමට පටන්ගත්තේය. මළසිරුර වැටී තිබූ පුටුවද ලකුණු කළ ඔහු ඉන්පසු ටේප් පටියෙන්, යම් යම් දුර ප්‍රමාණද මැන බැලීම ඇරඹුවේය.

 http://sherlockholmesinvestigations.blogspot.com

"පැමිණ සිටි අමුත්තා බොහෝවිට පෙප්ගේ මිතුරෙක් වෙන්න ඇති" ස්ටැන්ලි හොප්කින්ස් කීවේ මෘතශරීරය අසලට ළංවෙමිනි. "එහෙම නැත්නම් ඔහු දෙන්නාටම රෑ කෑම ඇණවුම් කරන එකක් නැහැ. එහෙම නේද හෝම්ස් මහත්මයා?"

"ඔව් හොප්කින්ස්" හෝම්ස් කීය. "ඒක තේරුම් ගැනීම එච්චර අමාරු නැහැ. නමුත් මේ විධියට ක්ෂණිකව ඔහුව මරා දමන්න හේතුව අපට හිතාගැනීම අමාරු වෙනවා. මොහු පිස්තෝලය ඇදලා අරගෙන තියෙනවා අමුත්තාට වෙඩිතියන්න. අමුත්තා පිහියෙන් ඇන්න ඇත්තේ ඒකට පිළිතුරු ලෙස"

හෝම්ස් මුලින්ම මෘතශරීරය පරීක්ෂා කර බැලුවේය. පිහිය සිරුරේ ඇණී තිබූ කෝණය ගැන හෝම්ස් දැඩි අවධානයක් යොමු කළේය. ඉන්පසු මියගිය පුද්ගලයා හැඳසිටි ඇඳුම්වල සාක්කු, කාමරයේ අල්මාරියේ එල්ලා තිබූ කබා හා කලිසම්වල සාක්කු ද පරීක්ෂා කළේය.

උසින් අඩි පහයි අඟල් අටක් පමණ වූ මධ්‍යම ප්‍රමාණයේ සිරුරක් තිබූ මේ අමුත්තාගේ මුහුණ මෙන්ම සිරුරේ සම ද සුදුමැලි වී තිබිණි. වම් අතේ පිටි අල්ලේ කොටියෙකුගේ මුහුණක් ද, දකුණු බාහුවේ ඇතුළු පැත්තේ කිඹුලෙකුගේ මුහුණක් ද වම් උරහිසේ නැංගුරමක ලකුණක් ද පච්ච කොටා තිබූ බව හෝම්ස් අපට පෙන්වා දුන්නේය. මොහුගේ දකුණු අතේ ඇඟිල්ලක දියමන්තියක් සවිකළ මුද්දක් තිබූ අතර බෙල්ලේ ගනකම් රත්රන් මාලයක් විය. ඊට අමතරව පසෙකින් එල්ලා තිබූ කබායේ සාක්කුවක, රත්රනින් නිමකළ වටිනා සාක්කු ඔරලෝසුවක් සහ මුදල් පිරුණු පසුම්බියක් විය.

හෝම්ස් එම මුදල් පසුම්බිය පරීක්ෂා කරන අයුරු අපි බලා සිටියෙමු. එහි පවුම් සියයක් පමණ වටිනාකමට බ්‍රිතාන්‍ය පවුම් හා ඇමරිකානු ඩොලර් විය. මොහුගේ මුදල්පසුම්බියේ වත් පෞද්ගලික දේවල් අඩංගු ගමන්මල්ලේ වත්, ඔහුගේ අනන්‍යතාවය දක්වෙන කිසිදු ලියවිල්ලක් දක්නට නොලැබිණ. මොහුගේ රත්රන් ඔරලෝසුව හෝම්ස් පරීක්ෂා කළේ උත්තල කාචයේ ආධාරයෙනි. එහෙත් එයින් සතුටුදයක යමක් සොයාගැනීමට හැකිවූ බවක් මගේ මිත්‍රයාගේ මුහුණෙන් නොපෙනිණ.

"මේ පුද්ගලයා ඇඳුම්වල ගේ නම මැතිව් පෙප් බවත් රට ස්විට්සර්ලන්තය කියල කිව්වට, මට හිතෙනවා ඒවා බොරු කියල"

http://sherlockholmesinvestigations.blogspot.com

හෝම්ස් කීය. "මොකක් හරි හේතුවක් නිසා, ඔහු තමන්ගේ නියම අනන්‍යතාවය සඟවාගෙන හිටියා කියලයි මට හිතෙන්නෙ"

"ඒ බව අපට හොයාගන්න හැකි වෙන කිසිම දෙයක් නැත්තෙ ඇයි?" මම ඇසීමි. "ඔහු ඒවාත් හිතාමතාම වසන් කළාද?"

"බාගවෙලාවට නියම අනන්‍යතාවය හෙළිවෙන ලියවිලි ඔහු සතුව තිබුණා වෙන්නත් පුළුවන්" හෝම්ස් කීය. "අපරාධය කළ පුද්ගලයා මිනීමැරුමෙන් පස්සෙ ඒවා ඉවත් කළා වෙන්න පුළුවනි. ඔබට මොනවද හොප්කින්ස් ඒ ගැන හිතෙන්නේ?"

"මටත් මොකුත් හිතාගන්න අමාරුයි හෝම්ස් මහත්තයා" පොලිස් නිලධරයා පිළිතුරු දුන්නේය.

"මේ තරම් විශාල මුදලක් සමග වටිනා ආභරණ තිබිලත්, මිනීමරුවා ඒ කිසිදෙයක් අරගෙන ගිහින් නැහැ. ඒකෙන් අපට කාරණා දෙකක් හිතාගන්න පුළුවනි. එකක්, මේ මිනීමැරුම කරලා තියෙන්නේ ධනය ඇහැරගැනීමකට නොවන බව. අනික මිනීමරුවා ධනවත් පුද්ගලයෙකු බව"

"ඇයි හෝම්ස් මහත්මයා ඔබ එහෙම කියන්නේ?"

"මොහු ළඟ තිබූ පෞද්ගලික ලියකියවිලි ඉවත්කරගෙන යන්න තරම් අපරාධකාරයා මෙතන කාලය ගතකළා. නමුත් ඔහු දියමන්ති මුද්දටත් මුදල් පසුම්බියටවත් අත තියල නෑ."

මීළඟට හෝම්ස්ගේ අවධානය යොමුවූයේ කාමරයේ තැන්පත්ව තිබූ අනෙක් ද්‍රව්‍ය වෙතය. එනම් මියගිය පුද්ගලයාගේ ඇඳුම් පැළඳුම්, කාමරයේ පොළොව, සිගරට් අළු බඳුන, හා කුණු කූඩය වෙතය.

"කාමරයේ එළා තිබෙන ඇලුම කලාලය නිසා කිසිම පා සටහනක් හොයා ගන්න බැහැ" මගේ මිත්‍රයා කීවේ බලාපොරොත්තු කඩවූ ස්වරයකිනි. "ඊට අමතරව මේ මියගිය තැනැත්තා දුම්පානය කරන්නෙකු නොවෙයි. ඒකත් අපට පාඩුවක්. නමුත් මෙහි පැමිණ ගිය අපරාධකාරයා නම් දුම් බොන්නෙක් - ඔහු බොන්නේ පයිප්පය"

"ඔබ කොහොමද එය කිව්වේ?" මම ඇසීමි.

"කලාලයේ එක් තැනක තිබෙනවා, පයිප්පයෙන් ඉවතට වැටුණු දැවී ගිය අලුත් දුම්කොළ අළු" හෝම්ස් කීය. "ඊළඟට මේ අළු බඳුනේ තිබෙනවා පයිප්පය දැල්වීමට භාවිත කළ ගිනිකූරු කිහිපයක්ම"

 http://sherlockholmesinvestigations.blogspot.com

"ඇයි පයිප්ප බොන්නෙක් කියුවුනේ? ගිනිකූරු පාවිච්චි කරලා තියෙන්නේ සිගරට් හෝ සුරුට්ටු දල්වීමට වෙන්න බැරිද?" හොප්කින්ස් ඇසීය.

"පයිප්පය දල්වීමට ගිනිකූර අල්ලන්නේ වෙනස් කෝණයකට" හෝම්ස් පිළිතුරු දුන්නේය. "එනම් දල්වෙන කෙළවර හුඟක්ම පහතට සිටින සේ. නමුත් සිගරට් හෝ සුරුට්ටු දල්වීමේදී බොහෝවිට ගිනිකූර අල්ලන්නේ තිරස්ව. මේ ගිනිකූරුවල උඩහරිය කළුපාට වීමෙන් පෙනෙනවා දල්වා තිබුණේ පයිප්පයක් බව. ඊට අමතරව මේ වැටී ඇති අළු සිගරට් හෝ සුරුට්ටු අළු නොවන බව මට හොඳටම විශ්වාසයි"

"වෙන මොනවද හෝම්ස් මහත්මයා ඔබට කියන්න පුළුවන්?" හොප්කින්ස් ඇසීය.

"මිනීමැරීමට යොදාගත් ආයුධය ඒ අපරාධකාරයාටම අයත් එකක්" හෝම්ස් කීය. "මං ඒක ඉවතට ගන්න කැමැති නැහැ, පශ්චාත් මරණ පරීක්ෂණයට එයින් අවහිරතා ඇතිවිය හැකි නිසා. එය අවසන් වූ පසු මට මේ ආයුධය ලබාදෙන්න හොප්කින්ස්. අපරාධකාරයා කවුරු වුණත් ඔහු කාලයක් අප්‍රිකානු රටක ජීවත්වෙලා තියෙනවා......... ඒ සහරා කාන්තාරයට දකුණෙන් පිහිටි අප්‍රිකානු රටක. මං එහෙම කියන්නේ මේ පිහියේ මිටේ දිග හා හැඩය අනුව. මේ වර්ගයේ කිණිසි පාවිච්චි කරන්නේ අප්‍රිකාවේ නීග්‍රෝ ජාතිකයන්. ඔබට පෙනෙනවා ඇති මෙහි මිට සත්ත්ව අඟක් කපා සෑදූ එකක් බව. සහරාවට උතුරෙන් තිබෙන අප්‍රිකානු රටවල භාවිත කරන්නේ "ඛන්ජර්" නමින් හැඳින්වෙන අරාබි ජාතිකයන්ගේ පිහිය. එහි මිට තනාන්නේ ලෝහයෙන්. එහි මල්වැල් කැටයමක් තියෙනවා. තලය යන්තමින් වක්වෙලා."

"ඔහු මේ පිහිය එංගලන්තයේදී මිලදී ගන්නා වෙන්න බැරිද?" මම ඇසීමි.

"මිලට ගත්තා කියලා නම් හිතන්න අමාරුයි" හෝම්ස් කීය. "කාගෙන් හෝ තෑගි ලැබුණා නම් විසක. මං ඔබට තවත් ඉතා වැදගත් කරුණක් දෙකක් කියන්නම්. අපරාධකාරයා, වමත්කාරයෙක්. ඔහු මේ අපරාධය සිදුකරලා තියෙන්නේ ඈත සිට පිහියෙන් දමාගැසීමෙන්. ඔහු ඉලක්කයට පිහිය විසිකිරීමට හොඳ පළපුරුද්දක් තියෙන අයෙක් විය යුතුයි. මෙන්න මේ මිට අසල තලය දෙපැත්තේ තිබෙන පිහාටු වැනි කොටස් දිහා බලන්න.

http://sherlockholmesinvestigations.blogspot.com

ඒ විධියට හදල තියෙන්නෙන් සමබරව සුළං කපාගෙන ඉලක්කයට යන්න. මෙය සිදුකළ තැනැත්තා, මේ තරම් නිවැරදි ඉලක්කයට පිහිය විසිකළේ කොහොමද? ඔහු ඒක නිතර පුරුදු පුහුණු කළ අයෙක් නිසා.

බලන්න මේ පිහිය පපුවට ඇතුළුවෙලා තියෙන්නෙ පපුවේ මැද සිට. තලය ගිය දිශාව වමට හා ඉහළට. වමත්කාරයෙකුට මිස දකුණත්කාරයෙකුට ඒක කරන්න කොහොමටවත් බෑ. විශේෂයෙන්ම වාඩිවී සිටින කෙනෙකුට පිහියක් විසිකිරීමේදී.

"හෝම්ස් මහත්මයා" හොප්කින්ස් කීය. "ඔබ හිතන්නේ අපරාධකාරයා අල්ලාගැනීමට ඔය කරුණු ප්‍රමාණවත් වේවි කියලද?"

"කොහොමටවත් නැහැ හොප්කින්ස්" හෝම්ස් පිළිතුරු දුන්නේය. "මං මේ කිව්වේ මං සොයාගත් කරුණු ස්වල්පයක් පමණයි. මියගිය තැනැත්තාගේ අනන්‍යතාවය නැතිවීම අපට විශාල පාඩුවක්. ඔහු ලන්ඩනයට ආවේ මොකටද? ඔහු කාගෙ කවුද? ඔහුගේ රට කුමක්ද ආදිය අපට තවමත් හිතාගන්න අමාරුයි.

ඔබට මතකද වොට්සන් අපි රහස්පරීක්ෂණ පටන්ගත් මුල් කාලයේදීම මෙන්න මේ වගේ තත්ත්වයකට මුහුණ දුන්නා. අර........."ලෝහිත පරීක්ෂණය" කියලා විචිත්‍රවත් නමක් යොදලා ඔබ පාඨකයන්ට ඉදිරිපත් කළේ. නමුත් එතැනදී අපි මියගිය තැනැත්තාගේ අනන්‍යතාවය මුල ඉඳලම දැනහිටියා. මෙතැන ලේ හුගාක් ගලාගෙන ගිහින් තියෙනවා. මෙතැනදී දන්න නමක් ඔබට නැතිවේවිද මන්ද"

මේ අතර පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා මළසිරුර ගෙනයෑමට සේවකයෝ පැමිණියහ.

"හෝම්ස් මහත්මයා මොකද කියන්නෙ?" ස්ටැන්ලි හොප්කින්ස් විමසුවේය. "මළසිරුර ගෙනියන්න ඉඩදෙන්නද?"

"ඔව් ඔව්. මං ඒකට අවසර දෙන්නම්" හෝම්ස් කීය. "මං සෑහෙන තරම් දුරට එය පරීක්ෂා කළා. තවත් අවශ්‍ය වුණොත් මෘත ශරීරාගාරයට ඇවිත් බලන්නම්. හොප්කින්ස් කරුණාකරල මට එක් උදව්වක් කරන්න. සූක්ෂමව සෝදිසි කිරීම සඳහා මේ පුද්ගලයාගේ ඇඳුම් පැළඳුම් හැම එකක්ම, පාවහන් පවා මට අවශ්‍යයි. ඒව අයින්කරගෙන මට ගෙනැත් දෙන මෙන් කරුණාකරල ඔබේ සේවකයාට නියම කරන්න."

 http://sherlockholmesinvestigations.blogspot.com

"ආ. ඒක සුළු දෙයක් මහත්මයා" හොප්කින්ස් කීය. "අද දවල් වෙද්දී ඒවා මං ඔබේ බේකර් වීදියේ නිවහනටම එවන්නම්."

"තවත් දෙයක් හොප්කින්ස්. මේ විස්කි බෝතලය සහ වීදුරු දෙක මට උවමනායි. මං ඒවා අරගෙන යනවා. පරීක්ෂා කර අවසානයේ ඔබට එවන්නම්"

මළසිරුර ඉවත්කරගෙන ගිය පසු ද හෝටල් කාමරය පරීක්ෂා කිරීම හෝම්ස් අතින් සිදුවිය. මියගිය මැතිව් ජෙප් මහතාට අයත් බඩුබාහිරාදිය ලෙස කාමරයේ තිබුණේ භාණ්ඩ ඉතා ස්වල්පයකි. එහි තිබූ ඇඳුම් පැළඳුම් ස්වල්පය ඔහු ලන්ඩනයෙන් මිලට ගත් ඒවා බව අපි පහසුවෙන්ම හඳුනාගත්තෙමු. ස්තුතිදායක හෝඩුවාවක් කිසිවක් සොයා ගැනීමට නොහැකි වූයෙන් මගේ මිත්‍රයා සිටියේ බලාපොරොත්තු කඩවූ ස්වභාවයකිනි.

"මෙතැන තවදුරටත් කාලය නාස්තිකිරීමෙන් වැඩක් නෑ වොට්සන්" හෝම්ස් කීය. "අපි ආපහු යමු. සාමිවරයා පහළ තට්ටුවේ හිටියොත් ඔහුටත් කථාකරල යමු"

බැක්වෝටර් සාමිවරයා ඔහුගේ පෞද්ගලික කාර්යාල කාමරයේ, අප බලාපොරොත්තුවෙන් තවදුරටත් රැඳී සිටියේය.

"කොහොමද හෝම්ස් මහත්මයා ඔබේ වැඩකටයුතු?" සාමිවරයා විමසුවේය. "මේ පුද්ගලයා හෝ අපරාධකාරයා හොයා ගැනීමට ඔබ වැදගත් යමක් සොයාගත්තද?"

"සුළු සුළු දේවල් නම් හමුවුණා" හෝම්ස් පිළිතුරු දුන්නේය. "නමුත් මට ඒවායින් සෑහීමකට පත්වෙන්න අමාරුයි. මං මේ විශේෂයෙන්ම ආවෙ ඔබට ඒ බව දැනුම් දෙන්නයි"

"කමක් නෑ. ඔබ පටන් ගත්තා විතරයි නේ" බැක්වෝටර් සාමි කීවේ හෝම්ස් දෙසට චෙක්පතක් දිගු කරමිනි. "මේ මුළු යුරෝපයටම ඉන්න අංක එකේ අපරාධ පරීක්ෂණ විශේෂඥයා ඔබ බව මට සහතිකයි. ඒ ගැන වචන දෙකක් නැහැ. මේ චෙක්පත ඔබේ මූලික වියදම් සඳහා. වැඩකටයුතු ඉදිරියට යද්දී ඔබට අවශ්‍ය කොපමණ මුදලක්ද කියන එක මට දැනුම් දෙන්න. සුභ දවසක් මහත්වරුනි"

අපි ඔහුගෙන් සමුගෙන ආපසු ඒමට පිටත්වුණෙමු. ආපසු එන අතරතුර ද හෝම්ස්ගේ කිසිදු කථාබහක් නොවීය. දකින්නට ලැබුණු දර්ශනය ගැන නළල රැළිකරගෙන කල්පනා කරමින් සිටියා මිස මා

සමග සාකච්ඡාවකට ඔහුට සිතක් නොවූ බව මම තේරුම් ගත්තෙමි.

නිවහනට පැමිණි පසු හෝම්ස් තම අවධානය යොමුකළේ හෝටල් කාමරයෙන් ගෙන ආ මත්පැන් බෝතලය හා වීදුරු දෙක වෙතය. ඒවා ඔහුගේ සියුම් පරීක්ෂාවකට ලක්වුවත් සතුටුදයක ප්‍රතිඵල ලැබුණු අයුරක් ඔහුගේ මුහුණෙන් නොපෙනිණ.

මා බොහෝ විට මගෙන් ප්‍රතිකාර ලබන රෝගීන් පරීක්ෂා කිරීම සඳහා ගියේ දහවල් ආහාරයෙන් පසුවය. ඊට හේතු වූයේ කාගේත් ගමන් බිමන් අඩු එම වෙලාවට කුලී රියක් අල්ලා ගැනීම සඳහා තිබූ පහසුවය. මගෙන් ප්‍රතිකාර ලැබූ වයස්ගත රෝගියෙකු බැලීමට බටහිර කෙන්සිංටන් වෙත යාමට දින කිහිපයක සිට මට අවශ්‍යව තිබිණි. එහෙත් ඊට ඉඩක් නොලැබිණි. අපරාධ පරීක්ෂණය ගැන කතාබහක යෙදීමට තරම් මගේ මිත්‍රයාගේ ද ආකල්පයක් නොතිබිණි. එබැවින් රෝගියා පරීක්ෂා කිරීම සඳහා එදින හවස්වරුවේ යාමට මම තීරණය කළෙමි.

වැඩකටයුතු නිමාකොට හැන්දෑවේ මා ආපසු එද්දී ඔහු සිටියේ වඩාත් සතුටු සිතකිනි. සුවඳ හැමූ චර්මනියා දුම්කොළ යොදා පිගන් මැටි පයිප්පය දල්වාගෙන, හෝම්ස් විසිත්ත කාමරයේ ඉහළ පහළ ඇවිදිමින් සිටියේය.

"අද උදේ හාරවුණු පරීක්ෂණය ගැන ඔබ යම්තරමක සතුටුදයක ප්‍රතිඵල ලබල වගෙයි. එහෙම නේද හෝම්ස්?" මම ඇසීමි.

"විශිෂ්ටයි වොට්සන්" ඔහු කීය. "ඔබ කොහොමද දැනගත්තෙ?"

"නිරීක්ෂණ කරන්න පුළුවන් ඔබට විතරද?" මම ඇසීමි. "මං නිරීක්ෂණ කළා. ඒ මගින් නිගමනයන්ට ආවා"

"හොඳයි එහෙනම් අහගන්න මගේ ඉදිරිගමන ගැන" හෝම්ස් කීවේ ළඟ තිබූ හාන්සිපුටුවේ වාඩිවනු මෙන් මට සංඥා කරමිනි.

"අර මැතිව් ජේප් ගේ ඇඳුම් පැළඳුම් හොප්කින්ස් සේවකයෙකු අතේ මෙහේට එවල තිබුණා. ඒකෙන් මට හැකිවුණා තවත් කරුණු කිහිපයක් සොයා ගන්න.

මුලින්ම මං සෝදිසි කළේ ඔහුගේ පාවහන්. ඒවා සෑහෙන තරම් අලුත් නොගෙවුණු ඒවා. ඒවා තනා තිබූ විශේෂ සම් වර්ගයත් අඩියේ සැකිල්ලත් නිසා මේවා මිලෙන් වැඩි පාවහන් වර්ගයක් බව පහසුවෙන් කියන්න පුළුවනි. එංගලන්තයේ නම් මෙවැනි පාවහන්

 http://sherlockholmesinvestigations.blogspot.com

ජෝඩුවක් පවුම් අටකටවත් ගන්න බැහැ. . මේ පාවහන් නිෂ්පාදකයාගේ නම මට දකින්න ලැබුණේ, පාවහනක් කැල්ලෙන් කැල්ල ගළවා වෙන්කළ පසු. එහි සඳහන් නම රොබට් මැකන්සි, පාවහන් නිෂ්පාදකයෝ, දුම්රියපොළ අසල, ජොහැන්නස්බර්ග්.

මොහු අප්‍රිකාවට සම්බන්ධ විදේශිකයෙක් කියලා අපේ සිත්වල ඇතිවුණු මුල් සැකය එයින් තහවුරු වෙනවා. මොහු බොහොම දුරට දකුණු අප්‍රිකානු ජාතිකයෙක් විය හැකියි.

ඊළඟට මොහුගේ කබාය. ඒක ළඟදී එංගලන්තයේදී මිලට ගත් එකක්. බොන්ඩ් වීදියේ පිරිමි ඇඳුම් සලකින් විකිණූ එකක් බව එහි සඳහන්. ඒ නිසා මං හිතන්නේ නෑ වෙළඳසලේ මොහු පිළිබඳ තොරතුරු ඇති කියල. නමුත් ඔහුගේ කබායේ ඇතුළත සාක්කුවකින්, මට වැදගත් කඩදාසි කෑබලි දෙකක් හමුවුණා."

"ඒ මොනවද?"

"එකක් කවුරුන් හෝ ඔහුට එවූ ලියුමක්. මේ බලන්න" හෝම්ස් නම සටහන් පොත තුළින් කෙටි ලිපියක් එළියට ගත්තේය. හොඳ වර්ගයේ ලියුම් ලියන කඩදාසියක්. තද දම් පැහැති තීන්තෙන් ලියා තිබූ එහි මෙලෙස සඳහන් විය.

Mathew Page Esq.,
Room No 27
Grovenor Hotel

Dear Friend,

Unable to come on Wensday. Shall make it Friday at 6 p.m.

J.R.

මැතිව් පේජ් මයා.
කාමර අංක 27,
ග්‍රෝව්නර් හෝටලය.

හිතවත් මිත්‍රය,

බදාදා පැමිණීමට නොහැකියි. සිකුරාදා සවස හයට එන්නෙමි.

ජේ.ආර්"

Reading Purpose Only, Not For Print
http://sherlockholmesinvestigations.blogspot.com

"මේ ලියුම ටිකක් පරීක්ෂා කරල බලන්න වොට්සන්" හෝම්ස් කීවේ එය මා අතට දෙමිනි. "මොනවද ඔබට කියන්න පුළුවන්?"

මම එය මිනිත්තු කිහිපයක් පරීක්ෂා කර බැලුවෙමි. එහෙත් මට සොයාගත හැකි වූයේ එතරම් වැදගත් යැයි සිතිය නොහැකි කරුණු ස්වල්පයක් පමණි.

"මේ කඩදාසිය ලාභ එකක් නෙමෙයි, මිල වැඩි එකක්" මම කීවෙමි. "ඒ නිසා මේක එවූ පුද්ගලයා ධනවතෙක් කියා හිතන්න පුළුවනි. කඩදාසියේ දිය සලකුණක් තියෙනවා "එස්කුදෝ" කියල. ඒක මං හිතන්නේ ලතින් ඇමරිකානු වචනයක්."

"ඔව්. ඔබේ ඒ නිරීක්ෂණය හොඳයි" හෝම්ස් කීය. "එස්කුදෝ කියන්නේ පෘතුගාලයේ මුදල් ඒකකය බව ඔබට අමතක නැතුව ඇති. නමුත් ඒක වෙළඳ භාණ්ඩ සඳහා වෙළඳනාමයක් ලෙසත් යොදගන්නවා. එතකොට මේ ලියුම එවූ ජේ. ආර් ගැන මොනවද ඔබට කියන්න පුළුවන්?"

"ඔහු පාවිච්චිකරලා තියෙන තීන්තවල වර්ණය නම් ටිකක් අසාමාන්‍යයයි. ඒක අමුතුම දම්පාටක්" මම කීවෙමි.

"ඒ නිරීක්ෂණයත් හරිම වැදගත්" මගේ මිත්‍රයා කීය. "ඔබ කිව්වා වගේ මේක අපට සාමාන්‍යයෙන් දකින්න ලැබෙන දම්පාට නෙමෙයි. දම්පාටට කළුපාට මිශ්‍රකරලා වගෙයි මට නම් පෙනෙන්නේ. බාගවෙලාවට ඔහුගේ දම්පාට තීන්ත බෝතලයේ තීන්ත ඉවරවෙගන ගිහින්. ඔහු ඒකට කළු පැහැති තීන්ත ස්වල්පයක් එකතු කළා වෙන්න පුළුවන්. වෙන මොනවද ඔබට දකිය හැක්කේ?"

"මට හිතෙන හැටියට ඔහුගේ අත්අකුරුවල තියෙනවා, වැඩිහිටියෙකුගේට වඩා ළමයෙකුගේ අත් අකුරුවල පෙනුමක්. එහෙම නේද?"

"ඔබ නිවැරදියි වොට්සන්. බලන්න ඔහු සමහර ඉංග්‍රීසි වචන ලියා ඇති හැටි. බදාදට ඔහු ලියා තියෙන්නේ Wensday කියල මිසක් Wednesday කියල නිවැරදි ක්‍රමයට නෙමෙයි. ඊළඟට ඔහු Grosvenor කියල ලිවිය යුතු ග්‍රෝවිනර් කියන වචනය ලියල තියෙන්නේ Grovnor කියල. වචන ඔහුගේ කනට ඇහෙන එනම් ශබ්දවෙන ආකාරයට ලියලා මිසක් මේක නිවැරදි අක්ෂර වින්‍යාසය නෙමෙයි.

http://sherlockholmesinvestigations.blogspot.com

"හරි හරි. ඇත්ත නේන්නම්" මම කියැවිණි. "ඒක මට මගහැරුණු හැටි හරි පුදුමයි"

"හොඳයි වොට්සන් දැන් කියන්න බලන්න. එම කරුණුවලින් අපට නිගමනය කළ හැක්කේ මොකක්ද?"

"මේ ලියුම ලියූ ජේ. ආර් ගේ ඉංග්‍රීසි දැනුම දුර්වලයි. බාගවෙලාවට ඔහු ක්‍රමානුකූල අධ්‍යාපනයක් නොලැබූ......."

"අන්න හරි." හෝම්ස් කීය. "මට හිතෙනවා ඉංග්‍රීසි දැනුම දුර්වල වීමට හේතුව ඔහු ක්‍රමානුකූලව ඉගෙනීමක් නොලැබූ විදේශිකයෙක් වීම කියල. අපට ඒ තරම් දුර යා හැකියි. අපට උවමනා කරන මිනීමරුවා බොහොම වෙලාවට ජේ. ආර්. වෙන්නත් පුළුවනි. නමුත් අපේ අවාසනාවකට වගේ, ඔහු ලියුම ලියද්දී තමන්ගේ ගෙදර ලිපිනය ලියා නැහැ."

"තව මොකක්ද ලියවිල්ලක් ඔබට හමුවුණා කිව්ව නේද?"

"මේ බලන්න මේක" හෝම්ස් දිනපොතෙන් වෙනත් කඩදාසි කැබැල්ලක් එළියට ගත්තේය.

"යූස්ටන් දුම්රියපොළේ, ගමන් බඩු රඳවා තබා යන ගබඩා කාමරයෙන් නිකුත් කළ කුවිතාන්සියක්. මැතිව් පේජ් නමට මේක නිකුත් කරල තියෙන්නේ පෙබරවාරි 09 වැනිදා, ඒ කියන්නේ ඔහු හෝටලයේ ලැගුම් ගෙන එක දවසකට පසු. හෝටලයේ කාමරයකුත් තිබෙනවා නම්, ඇයි ඔහු ගමන්බඩු හෝටලයට ගෙනෙන්නේ නැතුව දුම්රියපොළේ තැබුවේ? ඒක අපට හිතාගන්න අමාරුයි. අපි වහාම හොප්කින්ස් සමඟ ගිහිං මේ ගමන්බඩු මොනවද කියල හොයල බලමු. මට හිතෙනවා මේ ගැටය ලිහන්න පුළුවන් හෝඩුවාව ඇත්තේ එතැන කියලා" හෝම්ස් කීවේ අතිශය සතුටෙනි.

අපි එවේලේම එම කටයුත්ත සඳහා යාමට තීරණය කළෙමු. ගමන්බඩු රඳවා තැබූ ලියවිල්ල, අපි අදාළ නිලධරයාට ඉදිරිපත් කළෙමු. මෙහි සඳහන් පේජ් මහතා කුලින්ද රාත්‍රියේ ඝාතනයට ලක්වූ බව සඳහන් කළ පොලිස් නිලධරයා, ඒ බව ගමන්බඩු පොතේ අත්සන් තබා සහතික කළේය. එම කාමරය විවෘත කළ සේවකයා මැතිව් පේජ් භාරදී තිබූ "ගමන්බඩු" ගෙන ආවේය. ඒ "ග්ලැඩ්ස්ටන් බෑග්" නමින් ජනප්‍රිය වූ අතේ ගෙන යන වර්ගයේ හම්බෑගයකි. මෙය විවෘත කිරීම සඳහා පොලිස් ස්ථානයට

http://sherlockholmesinvestigations.blogspot.com

ගෙනයන තුරු හෝම්ස් සිටියේ නොඉවසිල්ලෙන් බව මම තේරුම් ගතිමි.

යතුරු නොතිබූ බැවින්, එය විවෘත කරන ලද්දේ හෝම්ස් ළඟ තිබූ "හොර යතුරු" කැරැල්ලෙන් තෝරා ගත් යතුරක ආධාරයෙනි.

"හෝම්ස් මහත්මයා" හොප්කින්ස් පැවසුවේ සිනාසෙමිනි. "මේ යතුරු කැරැල්ලෙන් ඔබ කොහෙ හරි ගෙදරක දොරක් අරිනවා පොලීසියට අහුවුණොත් හෙම...... දන්නවද මොකද වෙන්නේ කියල? ඔබට යන්න වේවි මහජනයාගේ නිවාඩු නිකේතනයට, බරපතල වැඩ ඇතිව හය මාසෙකට!"

"මට මේ යතුරු කැරැල්ල තෑගි කළෙත්, ඒ නිවාඩු නිකේතනයේ මාස අටක් ගත කළ කෙනෙක් හොප්කින්ස්" හෝම්ස් පිළිතුරු දුන්නේ ද සිනාමුසු මුහුණෙනි.

ඉතා පරෙස්සමෙන් බෑගයේ පියන විවෘත කළ හෝම්ස් එය තුළ තිබූ දෑ බිමට හැලුවේය. එහි වූයේ තරමක් ගනකම් ලියුම් කවරයක් පමණි. ඔහු එය විවෘත කළේය.

"කාමරයෙන් අපට හොයාගන්න බැරිවුණු ලියවිලි මේ තියෙන්නේ" මගේ මිත්‍රයා පැවසුවේ අපමණ සන්තෝෂයෙනි. මියගිය පුද්ගලයාගේ ඡායාරූපය ඇලවූ ගමන් අවසර පත්‍රයක් එහි විය. ඔහුගේ නම එහි සඳහන් කර තිබුණේ බැසිල් රොබින්සන් යනුවෙනි.

ඔහු දකුණු අප්‍රිකානු ජාතිකයෙකු බවත් වයස අවුරුදු 35ක් බවත් එහි සඳහන් විය. ඔහුගේ රැකියාව කුමක්ද යන්න එහි සඳහන් නොවූ අතර ලිපිනය, අංක 228, නේපියර් වීථිය, රිච්මන්ඩ්, ජොහැන්නස්බර්ග් යනුවෙන් සඳහන් වී තිබිණ.

"මේ පුද්ගලයා හිතාමතාම ඔහුගේ ගමන් අවසර පත්‍රය මෙහි රඳවා තැබුවේ ඇයි කියල ඔබට හිතන්න පුළුවන්ද?" හෝම්ස් ඇසුවේ ස්ටැන්ලි හොප්කින්ස්ගෙනි.

"මට ඒක හිතාගන්න අමාරුයි හෝම්ස් මහත්මයා"

"ඔහුගේ ඇත්ත නම බැසිල් රොබින්සන්" හෝම්ස් කීය. "එහෙනම් ඇයි ඔහු බොරු නමකින් හෝටලයේ ලැගුම් ගත්තේ? මට සැහෙන විශ්වාසයක් තියෙනවා, මොහු එංගලන්තයට ආවෙ යහපත් කටයුත්තකට නොවෙයි. මැතිව් පේජ් කියල බොරු නමකින් හෝටලයේ ලියාපදිංචි වීමෙන්ම ඒ බව පෙනෙනවා. ඊළඟට ඇත්ත

http://sherlockholmesinvestigations.blogspot.com

තොරතුරු අඩංගු මේ පත්‍රිකාව දුම්රිය පොළේ රැඳෙව්වේ යම් කටයුත්තක් කරලා වහාම රටින් පනින්න. මොකක්ද ඒ කටයුත්ත? බොහොම වෙලාවට කවුරු හරි ඝාතනය කිරීම. කවුද ඒ පුද්ගලයා? ඒක අපට හිතාගන්න අමාරු නෑ. ඔහු කවුරු වුණත් ඔහු තමා බැසිල් රොබින්සන් හෙවත් ජේ්ව ඝාතනය කළේ"

"හෝම්ස් මහත්තයා. මං හිතන්නේ ඔබ නියම පාරට වැටුණා" හොප්කින්ස් කීය.

"ඔව්. ඔබට මතකද මං කිව්වා මොහු මැරීමට යොදාගත් පිහිය අප්‍රිකානු රටක එකක් කියලා?" හෝම්ස් ඇසීය. "ඒකෙන් පෙනෙනවා රොබින්සන් ඇවිත් තියෙන්නේ ජේ. ආර්. හොයාගෙන. ඔහු රිවෝල්වරය එළියට ඇදලා තියෙන්නේ සණ්ඩුවක් නිසා නෙමෙයි; ක්ෂණික කෝපයකින් වෙඩි තියන්න නෙමෙයි. ඔහුගේ සැලැසුම වෙන්න ඇත්තේ හෝටල් කාමරය තුළ ජේ. ආර්. ඝාතනය කර පැන යාම. අපට තේරුම් ගන්න අමාරු සංකීර්ණ ගැටලුවක් එතැනට එතකුරු නැහැ. ඒ හරිය තේරුම් ගන්න පුළුවනි. මීළඟට අප හමුවට එන ලොකුම ප්‍රශ්නය වෙන්නේ, කාලයක් අප්‍රිකානු රටක වාසය කළ ජේ. ආර්. කවුද කියලා හොයා ගැනීම"

අපි පොලිස් ස්ථානයෙන් පිටවී අපගේ නිවහන වෙත ආපසු ආවෙමු. ඒ එන අතරේ ද හෝම්ස් කල්පනා කරමින් සිටියා මිස එක් වචනයක් හෝ මා සමග කතාබහ නොකළේය. ඔහුගේ නිහඬභාවය රාත්‍රී ආහාරයෙන් පසුව ද එලෙසම පැවතුණි. තද දුර්ගන්ධයක් නිකුත් කළ දුම්කොළ තම පයිප්පයට පුරවා ගත් ඔහු, එය දල්වාගෙන ගිනිඋඳුන අසල හාන්සිපුටුවට වී දිගටම කල්පනා කළේය.

පසුදා උදේ ආහාරය ගත් වහාම ග්‍රොව්නර් හෝටලය බලා පිටත් වී යන බව හෝම්ස් මට දැනුම් දුන්නේය. මම වහා සූදානම් වී ඔහුට එක්වූයෙමි.

"හෝටලයේ සේවකයන්ගෙන් ප්‍රශ්න කිරීම මේ දක්වාත් අපට කරන්න බැරිවීම ලොකු පාඩුවක් වොට්සන්" හෝම්ස් කීවේ අප කුලීරියට නැගී ගමන්ගන්නා අතරේය. "බාගවෙලාවට මේ පුද්ගලයා ගැන වැදගත් තොරතුරු මොනවා හරි ඔවුන් දැන තිබෙන්න ඇති. මට ඒක අමතකවුණු එක මටම පුදුමයි."

http://sherlockholmesinvestigations.blogspot.com

මැතිව් පේජ්ගේ කාමරයට ආහාර ගෙන ගිය සේවකයින් දෙදෙනා වහාම කැඳවීමට හෝටල් කළමනාකාර ග්‍රීන්වුඩ් මහතා පියවර ගත්තේය.

"අපි දෙන්නා තමයි මාරුවෙන් මාරුවට වගේ පේජ් මහත්තයාගේ කාමරයට කෑම අරගෙන ගියේ" ඩික්සන් නම් වයස්ගත සේවකයා කීවේය. "මං හැන්දෑවට ගෙදර ගියාම රෑට ඒ කටයුතු හොයා බැලුවේ මේ ජෝන්.

කෑම ගෙනිහිං දොරට තට්ටු කළාම පේජ් මහත්තයා දොර ළඟට ඇවිත් කෑම බන්දේසිය ඇතුළට ගත්තා. කොයි වෙලාවකවත් අපට කාමරය ඇතුළට එන්න ඉඩදුන්නේ නෑ. කලින් කෑම කාලා හිස්වුණු බන්දේසි ආපහු භාරදුන්නේත්, අලුත් බන්දේසියක් ඇතුළට ගනිද්දී"

"කෑමවලට අමතරව ඔහු මොනවා හරි ඔබ ලවා ගෙන්වා ගත්තාද?"

"ඔව් මහත්මයා" වයස්ගත සේවකයා පිළිතුරු දුන්නේය. "ආව දවසෙම මට කිව් ඉද් තමයි, හැමදම උදේට නොවරදවාම "මෝනිං ක්‍රොනිකල්" "ඩේලි ටෙලිග්‍රාෆ්" අහ "ටයිම්ස්" පුවත්පත් ඔහු වෙත ගෙන ආ යුතු බව. ඔහු හෝටලයේ නවතින්න ආවෙ පෙබරවාරි 4 වැනිද දවල්. ඒ වෙලාවෙත් එම පුවත්පත් ඔහු අතේ තිබුණු බව මං දුටුවා. පහුවද ඉඳල නොවරදවාම මං ඒ පත්තර ඔහුට ගෙනිහින් දුන්නා"

"ඔහුගේ නමට ලිපි ලැබුණද?"

"පෙබරවාරි පස්වැනිද ඉඳල ලොකේ වෙනතුරු හැමදම වගේ දවසකට ලියුම් හත අටක් වගේ ලැබුණා. ඉන්පස්සේ ලැබුණේ දවසකටම ලියුම් එකක් හෝ දෙකක් පමණයි"

"ඒවායේ ලිපිනයන් ලියා තිබුණේ කොහොමද?"

"මැතිව් පේජ් මහතා, කාමර අංක 27, ග්‍රොව්නර් හෝටලය."

"ඔහු කොපමණ පුවත්පත් ගෙන්වා ගත්තත් කාමරයේ තිබී අපට ඒවා හමුවුණේ නැහැ" හෝම්ස් කීය. "හමුවුණේ මියගිය දවසේ පුවත්පත පමණයි"

"දවසක් ගතවුණු ගමන් පරණ පුවත්පත් අරගෙන යන්න කියලා ඔහු අපට භාරදුන්නා" සේවකයා කීය.

"කෝ එහෙම ඉවත්කළ පරණ පුවත්පත්? මට එයින් එකක් හෝ දෙකක් බලන්න පුළුවන්ද?" හෝම්ස් ඇසීය.

 http://sherlockholmesinvestigations.blogspot.com

"අපි ඒවා එදිනම හෝටලයේ මුහ කසළබඳුනට දමනවා. මං හිතන්නෙ නෑ එකක් වත් හොයාගන්න හැකිවේවි කියල"

"ඔහු හමුවෙන්න අමුත්තන් නිතර ආවද? ආව නම් ඒ මොන වගේ පුද්ගලයන්ද?" හෝම්ස් විමසුවේය.

"ආව අය ගැන එහෙම විශේෂ ලකුණක් කියන්න අමාරුයි මහත්මයා" සේවකයා පිළිතුරු දුන්නේය. "ආව ඔක්කොම වගේ පිරිමි අය. සමහරු හුඟක් වයසක අය. සමහරු මැදිවියේ. තරුණ ජෝඩුවකුත් ආවා වගේ මතකයි"

"එහෙම ආවම ඔවුන් කොයිතරම් වෙලාවක් කාමරයේ රැඳී හිටියද?"

"ආව අය කෙළින්ම කාමරය ඇතුළට ගත්තා." සේවකයා කීය. "අපි දැකපු වෙලාවල්දී නම් ඔවුන් කාමරයේ රැඳුණෙ මිනිත්තු පහක් නැත්නම් දහයක්. බොහොම ඉක්මනට ගියා. අපි නොදුටු වෙලාවලදී වැඩි කාලයක් කාමරයේ රැඳුණාද කියන්න අපි දන්නෙ නෑ"

"ඔවුන් එහෙම ආවෙ මොකක් සම්බන්ධයෙන්ද? ඔවුන්ගේ කතාබහක් ඔබේ කනට වැටුණේ නැද්ද?"

"නැහැ මහත්මයා"

"හොඳයි. ඊයේ රෑ ජෙප්ප් මහත්තයාට හා ඔහුගේ මිත්‍රයාට කෑම අරගෙන ගියේ කවුද?"

"මමයි ගෙන ගියේ" ජෝන් නම් තරුණ සේවකයා ඉදිරිපත්ව පැවසුවේය.

"ජෙප්ප් මහත්මයා කෑම බන්දේසිය ඇතුළට ගත්තේ වෙනදා පිළිවෙළටමද?" හෝම්ස් ඇසීය. "ඒ කියන්නේ ඔබ දොරට තට්ටු කළා. එතකොට ඔහුම දොර ඇරලා බන්දේසිය ගත්තා?"

"ඔව් මහත්මයා"

"ඒ වෙලාවෙ ඔවුන් හිටියේ මත්පැන් පානය කරමින් කියල ඔබ කිව්වා?"

"ඔව් මහත්මයා. අඩක් හිස් කළ විස්කි බෝතලයක් හා වීදුරු දෙකක් මේසය උඩ තිබුණා. මං කාමරයට ළං වෙද්දීත් ඔවුන් මිත්‍ර ලීලාවෙන් හිනාවෙමින් කතාබස් කළ හඬ ඇහුණා. දොරට තට්ටු කළාම කතාව නැවතුණා. මං පිටවී යද්දී යළිත් කතාව පටන්ගත්තා"

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔබ හරිහැටි දුටුවාද ඒ අමුත්තාව?"

"දොර හොඳට ඇරිලා නැති නිසාත්, මං කාමරය ඇතුළට නොගිය නිසාත් හරි හැටි දුටුවේ නැහැ"

"ඔබේ හිතේ අමුත්තා ගැන යන්තමින් හෝ මොකක් හරි දෙයක් සලකුණු වුණාද?" හෝම්ස් විමසුවේය. "මං අදහස් කරන්නේ ඔහුගේ ඇඳුම කොහොමද? ඔහු මැදිවියේ හෝ වයස්ගත කෙනෙක්ද? නැත්නම් තරුණයෙක්ද? සුදුහම ඇති කෙනෙක්ද? නැත්නම් දුඹුරු හෝ කළුහම ඇති කෙනෙක්ද?"

"සැකයක් නෑ. ඔහු අපි වගේ සුදුහම ඇත්තෙක්" ජෝන් පිළිතුරු දුන්නේය. "ඒ අමුත්තා පේජ් මහත්තයාට වඩා වයස්ගත කෙනෙක්. ඔහුගේ හිසේ සම්පූර්ණයෙන්ම තට්ටය පෑදිලා........... මට මතක හැටියට ලොකු උඩුරැවුලක් තිබුණා. ඒක තරමක් සුදු වී තිබුණු බවත් යන්තමින් මතකයි"

"බොහොම හොඳයි" හෝම්ස් කීවේ ප්‍රශංසාත්මක හඬෙනි. "ඔය ඔබ දකල තියෙන්නෙත් හුගක් වැදගත් කරුණු. වෙන මොනවද?....... ඇඳුම් මොනවද?"

"ඇඳුමේ නම් විශේෂයක් මට මතක නෑ මහත්මයා"

"කටහඬ මොන වගේද?"

"මං එතැන ඉද්දි ඔහු කථාකළේ නැහැ"

"ඔබ කියන මේ අමුත්තා මීට කලිනුත් පේජ් මහත්තයා හමුවෙන්න ආවද?"

සේවකයා මඳක් කල්පනා කළේය.

"...................... මං හිතන්නේ ඔහු ආවා" ජෝන් කීය. "දවස් පහකට හයකට කලින් හැන්දෑවෙ හයට විතර අමුත්තෙක් ආවා................ මං හිතන්නේ-ඒ ඔහු. ඩික්සන් රාජකාරි ඉවර කරල මං රාජකාරි භාරගන්න වෙලාවෙයි ආවේ. මං හිතන්නේ ඩික්සනුත් දකින්න ඇති.........."

"...................... ඔව් මං වැඩ ඇරිල ගෙදර යන්න හදන වෙලාවෙ අමුත්තෙක් ආව බව නම් මට මතකයි. හැබැයි ඒ කවදද කියල නම් මට හරියට මතක නෑ" ඩික්සන් කීය. "ඔහු අපෙන් කිසිදෙයක් අහන්නෙ නැතුව කෙළින්ම ඩිකිහනේ කාමරේට ගියේ"

"ඒ කියන්නේ ඔහු ඊටත් කලින් ඇවිල්ල ඇති?" හෝම්ස් ඇසුවේය.

"ඔව් ඇවිත් ඇති. නැත්නම් 22 කාමරය කොහේද කියා අපෙන් අහනවා නොවැ" ඩික්සන් පැවසුවේය.

"දැන් ඩික්සන් මතක් කරලා බලන්න, මේ එද ආව අමුත්තාගේ පෙනුම ඔබට මතක හිටියෙ කොහොමද කියලා?" හෝම්ස් ඉල්ලා සිටියේය.

වයස්ගත සේවකයා නිහඬව අප දෙස බලාසිටියේ තම මතකය අවදිකිරීමට උත්සාහ දරමිනි. මිනිත්තු කිහිපයක් එසේ සිටි ඔහුට කීමට යමක් නොතිබිණි. "කියන්න තරම් විශේෂ දෙයක් නෑ මහත්තය"

බේකර් වීථියේ අපේ නිවහන වෙත ආපසු පැමිණි පසු මගේ මිත්‍රයා මුලින්ම කළේ සේවක ළමයා වූ බිලී කැඳවීමය. පසුගිය සති තුනක කාලයක "ටයිම්ස්," "මෝනිං ක්‍රොනිකල්" හා "ඩේලි ටෙලිග්‍රාෆ්" පුවත්පත් සොයාගෙන එන මෙන් ඔහුට හෝම්ස්ගෙන් නියෝගයක් ලැබිණ. පුවත්පත් සියල්ල පිළිවෙළින් සකස්කරගත් හෝම්ස් ඒවා පෙරළා බැලීමට පටන්ගත්තේය. මිනිත්තු කිහිපයක් ගතවෙද්දී ඒ ගැටලුව ලිහාගැනීමට ඔහුට හැකිවූ බැව් පෙනිණ.

"මේක මට කලින් මගහැරුණු එක පුදුමයක් නෙවෙයි වොට්සන්" ඔහු කීවේ පුවත්පතක් මා අතට දී එහි පළවූ දැන්වීමක් වෙතට මගේ අවධානය යොමුකරමිනි. "මේ වගේ දැන්වීම් හැමදමත් පුවත්පත්වල පළවෙනවා. ඒ නිසා මං ඒවා ගැන විශේෂ සැලකිල්ලක් යොමු කරන්නේ නෑ. මා සාමාන්‍යයෙන් කියවන්නේ "පෞද්ගලික" තීරය නේ. දැන් බලනකොට කියවිය යුතු වැදගත් දේවල් වෙනත් තැන්වලත් තියෙනවා. බලන්න ඔය පෞරාණික භාණ්ඩ කියන මාතෘකාව යටතේ තුන්වැනි පිටුවේ තිබෙන දැන්වීම.

"අගනා පුරාවස්තු පෞද්ගලිකව විකිණීමක්"

ඊජිප්තුවේ සකාරා, මෙම්ෆිස්, තීබ්ස්, කර්ණැක් සහ තවත් තැන්වල කැණීම්වලදී හමුවූ කුඩා ප්‍රමාණයේ පුරාවස්තු, ලෝහමය ස්ෆින්ක්ස් ප්‍රතිමා, කිරිගරුඬ හා ඇලබැස්ටර් දේව ප්‍රතිමා සහ පිරමීඩවලින් හමුවුණු පැපිරස්.

ඊජිප්තුවේ කැණීම්වලට සහභාගී වී ඇමරිකාව බලා යාත්‍රා කරන මහත්මයෙක් තමාගේ භාණ්ඩ එකතුවේ ඇති අතිරේක පුරාවස්තු සාධාරණ මිලකට විකුණයි.

http://sherlockholmesinvestigations.blogspot.com

පරීක්ෂා කර බැලීමට හා මිලට ගැනීමට වේලාවක්, ලිපියක් මගින් කලින් වෙන්කරවා ගතයුතුය. බ්‍රෝකර් වරු අනවශ්‍යයි. ලිපියකින් විමසන්න. මැතිව් ජේප්. කාමර අංක 27, ග්‍රොව්නර් හෝටලය."

"මේ දැන්වීම මමත් දවස් කීපයක්ම මුම දුටුවා" මම කීවෙමි. "ඒ වුණත් මේ වගේ දැන්වීම් නිතර නිතර පුවත්පත්වල පළවෙන නිසා මං මේකෙ වැදගත්කමක් දුටුවේ නෑ"

"ඔහු මේ දැන්වීම පෙබරවාරි 5 වැනිද ඉඳල පෙබරවාරි 14 වැනිද වෙනතුරු මේ පුවත්පත් තුනේ දිගටම පළකරල තියෙනවා" හෝම්ස් කීය. "මේ දැන්වීමට ප්‍රතිචාර හැටියට තමා ඔහු හමුවෙන්න මිනිසුන් හෝටලයට එන්න ඇත්තෙ"

"ඔබ කිව්වා නේද ජේප් එංගලන්තයට ආවෙ තමන්ගේ සතුරෙක් හොයාගෙනයි කියල?" මම ඇසීමි. "එහෙනම් ඔහු ඇයි මෙහෙම දැන්වීමක් පළකළේ? මොකක්ද අපට ඒකෙ තියෙන වැදගත්කම? ඒක මට තේරුම් ගන්න අමාරුයි"

"ඔබට ඒක ටිකක් නොපැහැදිලි බව මට තේරෙනවා වොට්සන්" හෝම්ස් කීය. "මැතිව් ජේප් හෙවත් රොබින්සන් එංගලන්තයට ආවෙ ඔහුගේ සතුරා සොයාගෙන බව ඇත්තයි. නමුත් මිලියන හතරක් විතර වෙන මේ ජනයා අතර තමන්ගේ සතුරා ඉන්නේ කොහේද කියල කොහොමද ඔහු හොයාගන්නේ? ඔහුගේ සතුරා ඊජිප්තු පුරාවස්තු එකතු කරන්නෙක්. ඒවා මිලට ගන්නෙක් බව රොබින්සන් දන්නවා. ඔහු මොකද කරන්නේ? සතුරාව තමන්ගේ හෝටලයට ගෙන්වා ගත හැකි විධියට ඇමක් දානවා. ඒක තමයි මේ පුරා වස්තු අලෙවි කරන බවට කළ දැන්වීම. නමුත් දැන් තවත් ගැටලුවක් මතුවෙනවා"

"ඒ මොකක්ද?"

"මේක ඉතා සියුම් කාරණයක්. තේරුම් ගැනීම ටිකක් අමාරුයි" හෝම්ස් කීය. "රොබින්සන් දන්නවා ඔහුගේ සතුරා ජේ. ආර්. බව. නමුත් රොබින්සන් ඉන්නේ නම මාරුකරගෙන, බාගවෙලාවට වෙස් වලාගෙන. ඒ නිසා ජේ. ආර්ට රොබින්සන්ව හඳුනන්න බෑ. ඔබට ඒක තේරුම් ගන්න පුළුවන්ද වොට්සන්?"

"පුළුවන්. නමුත් ඔබ කොහොමද එහෙම දෙයක් කියන්නේ?"

 http://sherlockholmesinvestigations.blogspot.com

"ඇයි. පුවත්පතේ තිබුණු දැන්වීමට පිළිතුරු ලෙස ජේ. ආර්. ඇවිත් රොබින්සන් හෙවත්, ජෙප් හමුවුණා. මේ තමාගේ හතුරෙක් කියලා ජේ. ආර්. තේරුම් ගත්තා නම් ඔහු ඊට පස්සෙත් හෝටලය පැත්තේ එයිද? නමුත් සේවකයන්ගේ සාක්ෂිවලින් කියැවුණා ඔහු කීපවාරයක්ම හෝටලය පැත්තේ ඇවිත් ජෙප් හමු වූ බව. ඊට අමතරව මිනීමැරුම ද රාත්‍රියේ රෑ කෑම ඇණවුම් කරලා, මධුවිත තොලගාමින් සුහද කතාබහක යෙදිල තිබුණා. ජෙප් තමාව හෝටලයට කැඳෙව්වේ, තමාව මරාදමන්න කියලා ජේ. ආර්ට අඹමල් රේණුවක සැකයක් තිබිල නෑ."

"දැන් මට වැටහෙනවා මෙතැන වෙලා තියෙන්නේ මොකක්ද කියන එක" මම කීවෙමි. "නමුත් ජෙප් හෙවත් රොබින්සන්ගේ කාමරයේ එකම පුරාවස්තුවක්වත් අපට දකින්න ලැබුණේ නැහැ නේද?"

"ඒකෙ පුදුමයක් නෑ" හෝම්ස් පිළිතුරු දුන්නේය. "එක්කෝ රොබින්සන් ඒ හැමදෙයක්ම විකුණන්න ඇති. ඔහු සතුව විශාල මුදලක් තිබීමෙන් ඒ බව පෙනෙනවා. එහෙමත් නැත්නම් රොබින්සන් මරාදැමුවට පස්සේ ජේ. ආර්. ඒ තිබුණු හැමදෙයක්ම අරගෙන යන්න ඇති. ඒකෙත් ඔහුට අමතර වාසියකුත් සැලසෙනවා"

"ඒ මොකක්ද?"

"මරාදැමුණු පුද්ගලයා. ඊජිප්තු පුරාවස්තු හා සම්බන්ධ කෙරෙන හෝඩුවාවත් එතැන නොතිබීම"

"ඔව් ඒකත් හරි" මම කීවෙමි. "ඉතින් දැන් ඔබ කොහොමද මේ අපරාධකාරයා අල්ලා ගන්නේ?"

"ඒක තමයි මා ඉදිරියේ තියෙන අභියෝගය" මගේ මිත්‍රයා කීය. "මේකෙ තියෙන සංකීර්ණ බැරෑරුම් බව නිසාමයි ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසිය මේකට අතනොගහ මට භාරදුන්නේ. මං හුගාක් කල්පනා කරල බැලුවා. ජේ. ආර්. හොයන්න යොදා ගත හැකි ක්‍රියා මාර්ග තුනක් හෝ හතරක් මට කල්පනා වුණා. අපි ඒවා එකින් එක යොදල බලමු. පළමුවැනි එක බොහොම සරල ක්‍රමයක්. මේක හරියාවි කියල මගේ කිසිම විශ්වාසයක් නැහැ. නමුත් අපට යොදන්න පහසුම ක්‍රමය මේකයි. අපේ සම්පූර්ණ උත්සාහය යොදල බලමු. හැබැයි ඒ වැඩේට මට බේකර් වීදිය අතහැර හෝටලයක පදිංචියට යන්න සිදුවෙනවා"

http://sherlockholmesinvestigations.blogspot.com

"මොනවා?"

"ඔව් මගේ හිතවත් වොට්සන්" හෝම්ස් කීය. "මට තව පැය කාලක් දෙන්න. එතකොට මං ඔබට පෙන්වන්නම් මගේ සැලැස්ම"

සුදු කඩදාසියක් හා පෑන අතට ගෙන ලියන මේසයේ හිඳගත් මගේ මිත්‍රයා කල්පනා කරමින් යමක් කුරුටුගාන අයුරු මම දුටුවෙමි. මිනිත්තු දහයකට පසු ඒ කුමක්දැයි මට දැකගන්නට ලැබිණි.

"බලන්න මේ දැන්වීම" ඔහු කීය. "මේක පුවත්පත්වල පළකිරීම සඳහා අදම භාරදෙන්නයි මං බලාපොරොත්තු වෙන්නේ"

පුරාවිද්‍යාත්මක වටිනාකම් ඇති භාණ්ඩ පෞද්ගලිකව විකිණීම

පසුගිය වසරේ ඊජිප්තුවේ නයිල් ගඟ අසබඩව ද රජවරුන්ගේ හා බිසෝවරුන්ගේ නිම්නවලින් ද, ඇලෙක්සැන්ඩ්‍රියාව, මෙසපොතේමියාව, රොසෙටාව හා සක්කාරාවලින් ද ඇමරිකානු පුරාවිද්‍යාඥයින්ට හමුවූ මහඟු පුරාවස්තු මිලට ගැනීමට මෙන්න දුර්ලභ අවස්ථාවක්.

ව්‍යාජ ඒවා නොවෙන බවට සහතික කරමු. ඊජිප්තු කිරිගරුඬ ප්‍රතිමා, මෙසපොතේමියාවේ ලෝකඩ ප්‍රතිමා, අඛෙනතොන් රජුගේ මමිය සමග හමු වූ රිදී පිගන්, ඉතාම දුර්ලභ සොයාගැනීමක් වූ අමෙන්හොටෙප් රජතුමාගේ හා නෙෆෙර්තිති බිසවගේ හිසේ අනුරූ යයි සැලකෙන කුඩා රන් පිළිම, ඔබට සාධාරණ මිලකට ලබාගත හැක.

අප මැදපෙරදිගින් ගෙන ආ මෙම භාණ්ඩ අලෙවිය සඳහා මීළඟට රැගෙන යන්නේ නිව්යෝක් වෙතය. ඊට පෙර ඔබට අවශ්‍ය භාණ්ඩ තෝරා ගන්න. හමුවීම ලිපියක් මගින්, කලින් වේලාවක් වෙන්කර ගැනීමෙන් පමණි. ආචාර්ය ඩේවිඩ් ලින්කන්, කාමර අංක 43, ලැංහැම් හෝටලය, බටහිර ලන්ඩනය"

"කොහොමද වොට්සන් දැන්වීම හොඳද?"

"ඉතාම ආකර්ෂණීයයි" මම කීවෙමි. "ඕනෑම පෞරාණික භාණ්ඩ එකතු කරන්නෙක් මේකට පොළඹවා ගන්න හැකිවේවි"

"ලැංහැම් හෝටලයේ කාමරයක් වෙන්කරගෙන අපි මේක පුවත්පත්වලට දෙමු"

"ඉතින් ඔබ ගිහින් හෝටලයේම රැඳී ඉන්නද හදන්නේ?"

 http://sherlockholmesinvestigations.blogspot.com

"එහෙම දෙයක් කරන්න දැන්ම අවශ්‍ය වෙන්නේ නැහැ වොට්සන්" ඔහු කීවේ හැඳපැළඳ ගනිමිනි. "අපි කාමරය වෙන්කරගන්නේ ආචාර්ය ඩේවිඩ් ලින්කන් නමට. මං උදේ හවස ගිහින් ඒ නමට තිබෙන ලියුම් අරගෙන එනවා. දවසක් දෙකක් ගතවුණාම ලියුම් ඒක පණිවුඩකාරයෙක් මගින් ගෙන්වා ගන්න හැකිවේවි"

"ජේ. ආර්. ඇරෙන්න අනෙක් අයත් සෑහෙන ගණනක් ඉඳීවි. ඔබෙන් පුරාවස්තු මිලට ගන්න්." මම කීවෙමි. "ඔවුනට මොකද කරන්නේ? මං හිතන්නේ නෑ හෝම්ස් ඔබ ළඟ ඊජිප්තුවෙන් ගෙනා ගල්කැටයක්වත් ඇති කියලා?"

මා කී දෙයට ඔහුට සිනාපහළ විය.

"ඔවුනට ලිපි යවනවා, හමුවීමට දිනයක් හා වේලාවක් ළඟදීම දන්වනවා. සූදානමෙන් ඉන්න කියලා"

"හෝම්ස් ඔබ හිතන්නේ ජේ. ආර්. මේ ඇම කාලා හෝටලයට එවි කියලද? "මම ඇසීමි. "මේ විධියටම හෝටලයකට ඇවිත් ඔහු බොහොම භයානක අත්දැකීමකට මුහුණදීලා දවස් කීපයයි ගතවුණේ. ඉතින් යළිත් වරක් මේ වගේ එකකට ඔලුව දන්න එයි කියලා හිතන්න පුළුවන්ද? බාගවෙලාවට ඔහු තේරුම් ගන්න ඉඩ තියෙනවා, මේක ඔහු අල්ලාගන්න යෙදූ උපක්‍රමයක් කියලා"

"මෙහෙමයි වොට්සන්" හෝම්ස් කීවේ යළිත් වරක් අසුනේ හිඳගනිමිනි. "මං මුලින්ම ඔබට කිව්වා වගේ මේක සාර්ථක ක්‍රමයක් කියල මං කොහොමටවත් හිතන්නේ නෑ. නමුත් අපි මොහොතකට හිතමු ඔහු මේ විධියට පුරාවස්තු මිලදී ගන්න හුරුපුරුදු පුද්ගලයෙක් කියලා. එහෙම නම් ඔහු අරක මේකත් එක්ක සම්බන්ධයි කියල සැක හිතන එකක් නැහැ. තවත් එකක්. හැමදේම තීරණය වෙන්නේ ඔහුට ඉන්නා හතුරන් ගණන උඩ. ඔහුට හිටි එකම හතුරා රොබින්සන් නම් මේ දැන්වීමෙන් ජේ. ආර්. ගේ හිතේ චකිතයක් ඇතිවෙන එකක් නෑ. ඔහුට තවත් හතුරන් ඉන්නවා නම් ඔහු බොහොම පරෙස්සම් වේවි. අපේ මේ දැන්වීම්වලට පිළිතුරු එවන එකක්වත් නැහැ. ඒකයි මං මුලදී කිව්වේ මේක බොහොම දුර ඉඳන් විදින ඊතලයක් කියලා. ඉලක්කයට යන්න තියෙන ඉඩකඩ හුඟාක් අඩුයි. නමුත් අපට විශාල පාඩුවක් වෙන්නේ නැහැ"

"ඇයි නැත්තේ? ලෑහැම් හෝටලයේ කාමරයට ඔබට විශාල මුදලක් ගෙවන්න සිදුවේවි."

"බැක්වෝටර් සාමිවරයා මට දුන්නු චෙක්පතෙත් ඒ හැමදේකටම මුදල් තියෙනවා"

අපි ලැංහැම් හෝටලයට ගොස් කාමරය වෙන්කරවාගෙන ඉන්පසු පුවත්පත් කාර්යාලවලට දැන්වීම භාරදුන්නෙමු.

"හෝම්ස්. මේ දැන්වීම දැම්මා වගේ නෙමෙයි. පුරාවස්තු සෝදිසි කරලා. ඒවා මිලට ගන්න එන මිනිසුන්ට පෙන්වන්න. මොනවද ඔබ ළඟ තියෙන පෞරාණික භාණ්ඩ?" මම ඇසීමි.

"ඔබ දන්නවාද වොට්සන් මගේ මිත්‍රයෙක් ඉන්නවා හැරෝවේ, සඩ්බරිහිල් මාවතේ මයිකල් විල්කොක්ස් කියලා?"

"මට හරියට මතක නෑ"

"මතක නෑ?" හෝම්ස් ඇසුවේ පුදුමයට පත්වූ ස්වරයෙනි. "මීට කලින් පරීක්ෂණ කිහිපයකදීම ඔහු මට උදව්කරල තියෙනවා. මොනවා හරි පුරාවස්තු ටිකක් තාවකාලිකව හෝටලයෙන් ගිහින් තියාගන්න. ඔහුගෙන් ඉල්ලාගන්න පුළුවනි"

"එහෙම මොනවා හරි බඩු ටිකක් ගෙනැත් තියාගෙන හරියාවිද?" මම ඇසීමි. "පුවත්පත් මගින් ප්‍රසිද්ධකරලා තියෙන්නෙ ඊජිප්තුවෙ පිරමිඩවල තිබූ දුර්ලභ පුරාවස්තු, මෙසපොතේමියාවෙන් සොයාගත් ලෝකඩ පිළිම ආදිය කියල නේ........"

"ඒ ගැන හයවෙන්න දෙයක් නෑ මිත්‍රයා. පළමු වැනි කාරණය විල්කොක්ස් ළඟ තියෙනවා සෑම ශිෂ්ටාචාරයකටම අයත් දුර්ලභ පුරාවස්තු. දෙවැනි කාරණය මට හිතෙනවා මෙතැනදී මට පුරාවස්තු අත්‍යවශ්‍ය නැහැ කියල"

"හොඳයි හොඳයි. ඔබ හිතනවා නම් එහෙම සතුටුදායක ප්‍රතිඵල ලැබේවි කියල........... මට කමක් නෑ"

දින දෙකක් ගතවෙද්දී අපේ දැන්වීම්වලට පිළිතුරු ලෙස ලිපි ගණනාවක් ලැබිණි. එහෙත් ඒ එකක් වත් අප බලාපොරොත්තු වූ පුද්ගලයාගෙන් නොවේ.

"සමහරවිට ඔහු දැන් වෙනත් කවදාසි වර්ගයක්, නැත්නම් වෙනත් වර්ණයක තීන්ත භාවිත කරනවා වෙන්න පුළුවනි" හෝම්ස් කීවේ අපට ලැබී තිබූ ලියුම් විවෘතකර බලද්දීය.

"ඒ වුණත් ඔහුගේ අත්අකුරු වෙනස් කිරීම ඒ තරම් පහසුවෙන්නේ නැහැ. කවුරුහරි ඔහු පිටුපස ලුහුබඳිනවා කියල

 http://sherlockholmesinvestigations.blogspot.com

සැකකලොත් ඔහු අත්අකුරු වෙනස් කරන්න උත්සාහ දරාවි. නමුත් ඔහුගේ ලිපිනය අපට නොඑවා ඔහු කොහොමද පුරාවස්තු මිලට ගන්න වෙලාවක් ලබාගන්නේ?"

"ඔව්. ඒකත් ඇත්ත"

සතියක් ගෙවී ගියේය. දිනපතාම ලැබුණු ලියුම් අපි දැඩි අවධානයකින් සෝදිසි කර බැලුවෙමු. එහෙත් සතුටුදායක ප්‍රතිචාරයක් නොවීය. පුරාවස්තු පරීක්ෂාව සඳහා යථා කාලයේ දිනයක් හා වේලාවක් ලබා දෙන බවට දනුම් දෙන ලිපි ගණනාවක්, හෝම්ස් යතුරුලියනය කර තබාගත්තේය. බලාපොරොත්තු වූ ලිපිය නොලැබුණු අතර, අනෙක් සෑම එකකටම ඔහුගෙන් යැවුණේ ඒ යතුරුලියනය කළ පිළිතුරුමය.

"වැඩේ හරියන්නෙ නැහැ වගේ වොට්සන්" හෝම්ස් කීවේ මා රෝගියෙකු පරීක්ෂා කිරීමට ගොස් ආපසු නිවහනට පැමිණි මොහොතකයි.

"අදත් ලියුම් අටක් ලැබුණා. ඒත් මේ එකකවත් අප හොයන මිනිහා නැහැ. දැන් සතියකට වඩා ගතවුණා. මං හිතන්නෙ මිනිහගේ හිතේ සැකයක් ඇතිවෙලා, මගහරිනවද කොහෙද. අපට වෙනත් ක්‍රමයක් යොදගන්න සිදුවෙයි වගේ"

"කඩදාසිය හා තීන්ත වෙනස් කළත් ඔහුගේ අත් අකුරු තිබිය යුතුයි. එහෙම නේද හෝම්ස්?"

"මට වෙලාවකට මෙහෙම හිතෙනවා වොට්සන්. ඊයෙ පෙරේද ඔහු මුහුණදුන් අත්දැකීම නිසා බාගවෙලාවට ඔහු වෙනත් කෙනෙකුගේ........... ඒ කියන්නේ මිත්‍රයෙකුගේ මාර්ගයෙන් අයැදුම් කළාද දන්නෙ නෑ"

"ඒක මට හරියට පැහැදිලි නෑ. මොකක්ද ඔබ අදහස් කළේ?"

"ජේ. ආර්. දන්නවා ඔහු ලිපියක් හෝ ලිපි දෙක තුනක් රොබින්සන්ට යැවූ බව" හෝම්ස් කීය. "ඝාතනයෙන් පස්සෙ රොබින්සන් ළඟ තිබුණු දේවල් ඉවත්කරගෙන යද්දී ඔහු අනෙක් ලිපි ඉවත්කරගන්න ඇති. නමුත් මේ එක ලියුමක් ජේ. ආර්ට ලැබුණේ නැහැ. ඔහුට ඒක හොය හොයා ඉන්න වෙලාවක් තිබුණෙත් නැහැ.

කොහොම හරි අපේ හොඳ වෙලාවට ඒක තිබුණේ රොබින්සන්ගේ කබායේ ඇතුළු සාක්කුවක. ජේ. ආර්ගේ භය

ඇත්තේ මේ ලියුම පොලීසිය අතට පත්වෙන්න ඇති කියල. ඔහු බුද්ධිමතෙක් නම් දන්නවා, තමන්ගේ නම හා ලිපිනය නොමැති වුණත් අත්අකුරු එතැන තිබෙන බව"

"ඒ කියන්නේ, මේ වගේ දැන්වීමකට ඔහු කොහොමටවත් තමන්ගේ ඇත්ත නමෙන් හා ලිපිනයෙන්, තමන්ගේ අත්අකුරෙන් පිළිතුරු සපයන එකක් නැහැ. එහෙම නේද හෝම්ස්? තත්ත්වය ඒක නම් අපට ඔය ක්‍රමය යොදලා තවදුවත් ඔය මිනිහව අල්ලගන්න බැරිවේවි"

"බොහොම හරි වොට්සන්" හෝම්ස් කීය. "දැන් අපට ප්‍රශ්නය වෙලා තියෙන්නේ ඔහු ලුහුබැඳයන්න අපට වෙනත් කිසිම හෝඩුවාවක් නැතිකම. ඒකයි මං කිව්වේ මිනිහා බුද්ධිමත් අපරාධකාරයෙක් කියලා. කිසිම හෝඩුවාවක් ඉතිරි නොවෙන්න කාමරය සුද්ධ කරලා ගිහින්"

"මිනීමැරීමට යොදගත් පිහිය ඔබට ලැබුණා නේද? ඒකෙන් මොනවද ඔබට දැනගන්න හැකිවුණේ?"

"මං කලින් කියූ තොරතුරුවලට අමතරව මොකුත්ම නැහැ කියන්න පුළුවනි" හෝම්ස් පිළිතුරු දුන්නේය. "ඒක හදලා තියෙන්නේ පණපොවා නැති යකඩවලින්. මෙවා මුවහත් කළ හැකි වාගෙන් නෙවෙයි. දැන් කාලේ එහෙම පිහි නිෂ්පාදනය කරන්නේ නොදියුණු රටවල............ ඒකත් ගම්බද්ව සිටින කම්මල්කරුවන්. එංගලන්තය වැනි කාර්මික රටක, කර්මාන්ත ශාලාවක තැනූ පිහියක් නොවෙයි. විශේෂයෙන් මට කිව්හැකි තවත් කරුණක් තියෙනවා. මෙහි මිටට යොදගෙන තියෙන්නේ ස්ප්‍රිං බොක් මුවාගේ අඟක කොටසක්"

"ඔබ කොහොමද දන්නේ ස්ප්‍රිංබොක් එකෙක් කියලා?"

"උගේ අඟේ පෘෂ්ඨයේ දැඩි රැළිවක් නැහැ" හෝම්ස් කීය. "තියෙන්නේ කුඩා බොත්තම් වැනි ඉලිප්පීම් තැනින් තැන. ඒ නිසා පිහියක මිටට යෙදුවාම, ඒක පාවිච්චිකරන තැනැත්තාගේ අතට තුවාලයක් හෝ අපහසුවක් නැහැ. ඒ වගේම මිට ඉතාම ශක්තිමත්. මොන විධියකින්වත් කැඩෙන්නේ නැහැ. ඒ නිසාම තමයි දකුණු අප්‍රිකානු රටවල ආයුධ තැනීමේදී මිටට ස්ප්‍රිං බොක් අඟ යොදන්නේ. මේ කරුණ මට මතක තිබුණා. මේ ගැන මං තවදුරටත් පරීක්ෂා කර බැලුවා අර කෝෂ ග්‍රන්ථයේ. ඒක පීටර් බෝතා සහ

 http://sherlockholmesinvestigations.blogspot.com

මාටින් ස්ටයින් නම් සත්ත්ව විද්‍යාඥයින් ලියූ "අප්‍රිකානු මහාද්වීපයේ මුවගෝත්‍ර පරපුර" නම් ග්‍රන්ථය."

"බාගවෙලාවට මේ පිහිය රොබින්සන් ළඟ තිබුණු එකක් වෙන්න බැරිද?"

"එහෙම වෙන්නත් පුළුවනි" හෝම්ස් කීය. "නමුත් වැඩි ඉඩක් තියෙන්නේ මේක ජේ. ආර්. ගේ වීමටයි. බලන්න ඒක විසිකිරීමේදී සමබරව ඊතලයක් වගේ ගමන්කරන්න ඇති හැකියාව. දෙපැත්තේ ඇති ලෝහ පිහාටු නිසයි මේක ඉලක්කයට යැවිය හැක්කේ. බලන්න වොට්සන් මේකෙ තලය උල්කරලා. දෙපැත්ත මුවහත් කර ඇති හැටි. කිසි සැකයක් නෑ. ජේ. ආර්. මේක යොදගෙන පිහිවිසිකිරීම නිතර පුහුණුවෙලා තියෙනවා. මට හොඳටම විශ්වාසයි ඔහු මේක නිතර ළඟ තබාගත්ත ඇත්තේ හම් කොපුවක දමලා."

"ඒ කියන්නේ හෝම්ස්, ජේ. ආර්. දැනගෙන ඉන්න ඇති කවදහරි සතුරෙක් ඔහු හොයාගෙන එයි කියලා?"

"බොහොම වෙලාවට ඔව්" හෝම්ස් කීය. "ඔහුට විරුද්ධව ඇත්තේ එක සතුරෙක්ද සතුරන් කිහිපදෙනෙක්ද කියන්න අපි තාවමත් දන්නෙ නෑ. කොහොම හරි ඔහුත් හොයා ආව හතුරා කවුද කියන එක ඔහු අන්තිම මොහොත වෙන තුරු හඳුනාගෙන ඉඳපු බවක් පෙනෙන්න නැහැ."

"අපට බැරිවේවිද මේ රොබින්සන් කවුද කියල හොයල බලන්න?" මම ඇසීමි. "බොහොම වෙලාවට ඔහුගේ බිරිඳ නැත්නම් පවුලේ අය දන්නවා ඇති ඔහු වෛර බැඳගෙන හිටියේ කවුරුන් සමගද, ඒ මොන කාරණයක් උඩද කියන එකත්"

"ඔබගේ අදහස ඉතාම හොඳයි" මගේ මිත්‍රයා පිළිතුරු දුන්නේය. "මං දැනටමත් ජොහැන්නස්බර්ග් පොලිසියට මේ මරණය ගැන විස්තර දන්වලයි තියෙන්නේ. ඔවුන්ගෙන් පිළිතුරු එන්න ටික කාලයක් ගතවෙයි. මහාද්වීපික විදුලිපුවත් සේවාව කටයුතු කෙරෙන්නේ බොහොම හෙමින්. විශේෂයෙන් අප්‍රිකාවේ ඈත කෙළවරට."

තවත් සතියක් ගෙවී ගියේය. දකුණු අප්‍රිකානු පොලිස් සේවාවෙන් හෝම්ස් නමට විදුලිපුවතක් ලැබිණ. එහි සඳහන්ව තිබුණේ බැසිල් රොබින්සන් නම් තැනැත්තා, සඳහන්ව තිබූ

http://sherlockholmesinvestigations.blogspot.com

ලිපිනයට පදිංචිය සඳහා පැමිණ ඇත්තේ මෑතකදී බවය. එබැවින් ඔහු පිළිබඳ හෝ ඔහුගේ පවුලේ තොරතුරු සොයාගැනීම අපහසු වී ඇත. තවද මොහු අපරාධකාරයෙකු බවට ජොහැන්නස්බර්ග් හෝ අනෙකුත් පොලිස් මූලස්ථානවල සටහන්ව නොමැතිබවය.

"අපට යමක් හොයාගෙන ඉදිරියට යන්න තිබුණු එකම පොටත් කැඩුණා වොට්සන්" හෝම්ස් කීවේ විදුලිපුවත ගුළිකොට ගිනිඋදුනට විසිකරමිනි.

කිසිදු ප්‍රයෝජනවත් තොරතුරක් නොලැබී තවත් දින හතරක් ගතවී ගියේය. අපරාධය විසඳීමට කිසිදු අයුරකින් සතුටුදායක දත්ත නොලැබී හෝම්ස් සිටියේ කිසිවකු නොරුස්සනා ගතියෙනි. බැක්වෝටර් සාමිවරයා හමුවීමට හෝම්ස් දෙතුන්වරක් ගියේය. ඒ සමගම ඔහු යළිත් වරක් හෝටලයේ සේවකයන් හා කළමනාකරු සමග කතාබස් කළේ මග හැරී ගිය යම්කිසි විස්තරයක් තිබුණෙොත් ඒ දැනගැනීමේ අරමුණෙනි. එහෙත් අප කුමන ක්‍රමයෙන් ළඟාවෙමින් සිටියේ කොතැනකටද? ඒ, විසඳීමට නොහැකි යයි පසෙකට කරන තවත් අභිරහස් මිනීමැරුමක් වේත යයි අප දෙදෙනාගේම සිත්වල සැක පහළවීමට පටන් ගෙන තිබිණි.

පුවත්පත්වලට දුන් දැන්වීම නොකඩවා පළවුවද එයට ලැබෙන ප්‍රතිචාර ක්‍රමයෙන් අඩුවී ගියේය. දොළොස්වන දිනයේ ද උදේ ආහාරය ගෙන අප නොඉවසිල්ලෙන් බලාසිටියේ කාට්රයිට් නම් අපේ පණිවුඩකරුවා එනතුරුය. ආචාර්ය ඩේවිඩ් ලින්කන් නමට ලැංහැම් හෝටලයට ලැබුණු ලිපි, අප වෙත ගෙන එන ලද්දේ කාට්රයිට් නම් තරුණයා විසිනි. ඔහු මීට ප්‍රථම ද අපේ වැඩකටයුතුවලට සහාය වූ බව ඔබට මතක ඇතුවා නිසැකය.

"මන්න හෝම්ස් මහත්මයා, අද තියෙන්නේ එකම ලියුමයි" කාට්රයිට් කීවේ මෙතෙක් කල් දිනකට ලිපි තුනක් හතරක්වත් ලැබුණු බැවිනි.

"ඔබට ස්තුතියි කාට්රයිට්" හෝම්ස් කීවේ සාක්කුවෙන් කාසි කිහිපයක් රැගෙන පණිවුඩකරුවා අත තබමිනි. ඔහු අපේ විසිත්ත කාමරයෙන් පිටවී යනතුරු සිටි මම, දෙල් වසා දමා ආපසු ගිනිඋදුන අසලට ගියෙමි.

මගේ මිත්‍රයා ඇසිපිය නොහෙළා තම දෙනෙත් යොමුකරගෙන සිටියේ ලිපියේ කවරය වෙතය.

http://sherlockholmesinvestigations.blogspot.com

"වොට්සන්" ඔහුගේ කටහඬේ තිබූ ප්‍රමෝදය මම තේරුම් ගතිමි. "අද ලැබිල තියෙන ලියුම නම් බොහොම සිත්ඇදගන්නා එකක් වගෙයි. මේ බලන්න" තවමත් දිවෘත නොකළ ලිපිය ඔහු මා අතට දුන්නේය.

සුදු පැහැති කවරයක් වූ එහි ලිපිනය ලියා තිබුණේ කළු පැහැය මිශ්‍ර වූ දම් පැහැති තීන්තෙනි.

ආචාර්ය ඩේවිඩ් ලින්කන්

කාමර අංක 43, ලැංහැම් හෝටලය.

බටහිර ලන්ඩනය.

කවරයේ දරය කතුරෙන් කැපූ හෝම්ස් ඇතුළත වූ ලිපිය ඉවතට ගත්තේය. එය මේසය අසලට ගෙන ගිය ඔහු ගෑස් පහනේ ආලෝකය වැඩි කළේය.

ආචාර්ය ඩේවිඩ් ලින්කන් වෙත,

ඔබ ඩේලි ටෙලිග්‍රාෆ් පුවත්පතේ පළකොට තිබූ දැන්වීම පිළිබඳවය. මම මැදපෙරදිග පුරාවස්තු එකතු කරන්නෙක්මි. දැනට එකතු කරන ලද කුඩා පුරාවස්තු අති විශාල ප්‍රමාණයක් මා සතුව ඇත. එබැවින් යමක් මිලට ගැනීම තීරණය කිරීමට පෙර, ඔබ සතු පුරාවස්තු හරියටම මොනවාද යන්න නිශ්චිතව දැනගැනීමට කැමැත්තෙමි. කරුණාකර පහත සඳහන් විස්තර ඉදිරිපත් කරන්න.

i) පුරාවස්තුව අදාල රට

ii) පුරාවස්තුව කුමක්ද යන විස්තර

iii) ඔබ එයට අපේක්ෂා කරන මුදල

එම විස්තර සඳහන් කොට පහත සඳහන් ලිපිනයට මා වෙත ලිපියක් එවන්න.

ජේම්ස් ඩයිසන්

හැමර්ස්මිත් තැපැල් කාර්යාලය බාරේ

"ලියුම කියවා මඳ වේලාවක් කල්පනා කළ මගේ මිත්‍රයා එය මා අතට දුන්නේ, කුඩා දේ විශාල කර බලන උත්තල කාචය සහ ජේ. ආර්., රොබින්සන් වෙත එවා තිබූ ලිපියද සමගිනි.

"වොට්සන්. මේ දෙක සංසන්දනය කරල බලන්න. කියන්න ඔබට මොනවද හිතෙන්නේ කියල"

ලිපි දෙක සසඳමින් මම මිනීත්තු කිහිපයක් ගත කළෙමි. ලියුම් දෙකම ලියා තිබුණේ "එස්කුදෝ" දිය සලකුණ සහිත කඩදාසිවලය.

http://sherlockholmesinvestigations.blogspot.com

ලියුම් දෙකම ලිවීමට යොදාගත් තීන්තවල වර්ණය කළු මිශ්‍ර දම් පැහැති අසාමාන්‍ය එකකි. මීළඟට මම අත්අකුරු වෙත අවධානය යොමුකළෙමි. ඉංග්‍රීසි භාෂාව හිඩිමත් ලෙස ලිවීමට නුගත් පුද්ගලයකු කරන වැරදි මෙම ලිපියේ ද මම දුටුවෙමි.

"මට නම් සැකයක් නෑ හෝම්ස්" මම කීවෙමි. "ජේ. ආර්. තමයි ජේම්ස් ඩයිසන් කියලා වෙනත් නමකින් ලියල තියෙන්නේ"

"විශිෂ්ටයි වොට්සන්" හෝම්ස් කීය. "සියුම් දේ නිරීක්ෂණයට ඔබේ ඇති හැකියාව දිනෙන් දිනම වැඩිවෙනවා. ඒ ගැන මට හරිම සන්තෝෂයි. දැන් අපි ලියුම් දෙක බොහොම පරෙස්සමෙන් සංසන්දනය කර බලමු.

අත් අකුරු වෙනස් කරන්න මුලදී ඔහු උත්සාහයක් දරල තියෙනවා. නමුත් ඒක සාර්ථක වෙලා නැහැ. බලන්න කැපිටල් T, I, F, අකුරු ලිවීමේදී උඩින් තියෙන හරස් ඉර ඔහු 45^0ක කෝණයකින් ඇදට ලියා ඇති හැටි. ඒ ලක්ෂණය ලියුම් දෙකේම එකම විධියට. ඊළඟට බලන්න ඔහුගේ සිම්පල් g අකුර. ඔහු ලියා තියෙන්නේ අපි සාම්ප්‍රදායිකව අතින් ලියන g අකුර නෙවෙයි. මුද්‍රණයේ හා යතුරුලියනවල දකින g අකුර. මේ අන්දමින් සමානකම් දහයකට වැඩි ගණනක් තියෙනවා. ඒ නිසා මටත් ස්ථිරවම කියන්න පුළුවනි ජේ. ආර්. තමා ජේම්ස් ඩයිසන් යන නමින් ලිපිය එවා තියෙන්නේ. මේ නම නිසැකවම ආරූඪ කරගත් නමක්. නමුත් අපි දැනට ඔහු ඒ නමින් හඳුන්වමු.

මිනිහා ලෝක කෞරාඩිකයෙක් වගෙයි. තමන්ගේ ලිපිනය අපට නොඑවා, අපෙන් තොරතුරු ලබාගන්නයි හදන්නේ. ඔහුට සැකයක් ඇතිවෙලා තියෙනවා. මේ දැන්වීම පළකරන්නේ සත්‍ය වශයෙන්ම පුරාවස්තු අලෙවිකරන්නෙක්ද කියලා. බාගවෙලාවට ඔහුගේ හිත කියනවා ඇති මේ විධියට ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියට උගුලක් අටවන්න වුණත් පුළුවන් කියලා. ඒ නිසාමයි මෙච්චර දවසක් අපේ දැන්වීමට පිළිතුරු නො එව්වෙත්. විනෝදාංශයක් ලෙස පුරාවස්තු එකතු කරන කෙනෙකුට, අතේ සල්ලිත් තියෙනවා නම් අපේ දැන්වීම දුටුවාම ඇතිවන්නේ යටපත් කරගන්න බැරි ආශාවක්. ඉතින් කෙළින්ම මේකට ඔලුව නොදා, හැංගිලා ඉඳගෙන උත්සාහයක් කරල බලන්න, අන්තිමේදී ඔහුට හිතෙන්න ඇති."

 http://sherlockholmesinvestigations.blogspot.com

"හෝම්ස්. දැන් ඉතින් වැඩේ අමාරු වෙනවා නේද?" මම ඇසීමි. "මයිකල් විල්කොක්ස් බඩු අලෙවි කළාට ඒවා ගැන පුරා විද්‍යාත්මක තොරතුරු දන්නවා ඇති කියලා මං හිතන්නේ නෑ. ඔබ යවන තොරතුරු හුගක් ආකර්ෂණීය ඒවා නොවුණොත් මිනිහා ඇම ගිලින එකක් නැහැ."

"ඔබ කියන දේ ඇත්ත, මගේ හිතවත් වොට්සන්. දැන් වැඩේ තවත් අමාරු වෙනවා. ඒ වුණත් අපරාධකාරයා ජේ. ආර්. හෙවත් ඩයිසන් තවමත් ලන්ඩනයේ පදිංචිව ඉන්නා බව දැනගැනීමට ලැබීම සතුටක්. ඔහුව උගුලක පටලවා ගැනීම කියන්නේ මහා අභියෝගයක්. මේ මිනිහා මං හිතුවාටත් වඩා කෛරාටික එකෙක්. බලන්න තමන්ගේ ලිපිනය එවනවා වෙනුවට තැපැල් කාර්යාලය බාරේ ලිපි ගෙන්වා ගන්න සැලසුම් කළ හැටි. දැන් ඔහුට පුළුවනි අපට නොපෙනී, ගිහින් තැපැල් කාර්යාලයෙන් අපේ ලියුම අරගන්න" සුසුමක් හෙළූ මගේ මිත්‍රයා හාන්සිපුටුවේ දිග ඇදී පයිප්පය දල්වා ගත්තේය.

ඊළඟට ඔහු දුම්ගුළි ඉහළට යවමින් කල්පනා කරන්නට පටන්ගත්තේ මා එහි සිටින බව ද අමතක කරමිනි. හෝම්ස්ට අවශ්‍ය වී තිබුණේ නිදහසේ කල්පනා කිරීම බව තේරුම් ගෙන මම එතැනින් ඉවත් වී ගියෙමි.

එදා දහවල් කෑම වේලාව වන තුරුත් මගේ මිත්‍රයා සිටියේ එම ඉරියව්වෙන්මය. ඔහු පවසන අන්දමට ජේම්ස් ඩයිසන් යනු අංක එකේ කෛරාටිකයෙකි. ඔහු අල්ලා ගැනීම එතරම් පහසු කටයුත්තක් නොවනු ඇත.

දහවල් එක පමණ වෙද්දී යම්කිසි තීරණයකට පැමිණියාක් මෙන් හෝම්ස් තම අසුනෙන් නැගිට කෑම මේසය අසලට පැමිණියේය. ඔහුගේ මීළඟ පියවර කුමක්දැයි දැනගැනීමට මමද එතැනට ආවෙමි.

"මං හිතන්නේ ඔහුව අල්ලා ගැනීමට ඔහු සඳහා විශේෂ දැලක් වියන්න ඔබට සිදුවේවි. එහෙම නේද හෝම්ස්?"

"මටත් ඒක හිතෙනවා. ඒ හින්දම දවල් කෑම අවසන් කළ වහාම මං පිටත්වෙලා යනවා"

හෝම්ස් ආපසු එනවිට සවස් වී තිබිණ.

"මං ගියා බ්‍රිතාන්‍ය කෞතුකාගාරයට වෝඩ් මෝටිමර් හමුවෙන්න" හෝම්ස් කීය. "ඔහු මගේ පරණ මිත්‍රයෙක්. දැන් ඔහු

http://sherlockholmesinvestigations.blogspot.com

ඉතාමත් ඉහළ තනතුරක් දරන්නෙක්. ඒ නිසා ඔහු හමුවෙන එක මට ටිකක් අපහසු වුණා"

"වැඩේ කරගත්තද?"

"මං මෝටිමර්ට කිව්වා මගේ උවමනාව ගැන" හෝම්ස් කීය. "දැනට හොයාගෙන තියෙන කුඩා ප්‍රමාණයේ එහෙත් ඉතාම දුර්ලභ ඊජිප්තු පුරාවිද්‍යාත්මක භාණ්ඩ හත අටක් හා මෙසපොතේමියානු භාණ්ඩ තුනක විස්තර ලියල දෙන්න කියල මං මෝටිමර් ගෙන් ඉල්ලා හිටියා. ඒවල දැනට තක්සේරු කෙරෙන මිල ගණනුත් සටහන් කරන්න කියල මං දැනුම් දුන්නා"

"කවදටද ඒවා ලැබෙන්නෙ?"

"හෙට දහවල් ඔහුගේ කාර්යාලයට එන්න කිව්වා" හෝම්ස් කීය. මෙක ටිකක් වෙලා ගතවෙන වැඩක්. මගේ මිත්‍රයාට අධික වශයෙන් කරදර කරන්න මං කැමැති නෑ."

පසුවද හෝම්ස් ඔහුගේ මිත්‍රයා වෙතින් අදාළ ලියවිල්ල රැගෙන ආවේය.

"මේකෙ තියෙනවා ඔක්කොම ශාස්ත්‍රීය කරුණු" හෝම්ස් කීවේ අතිශය සන්තෝෂයෙනි. "මං මේවා යතුරුලියනයෙන් පිටපත් කරලා ලියුමකුත් ලියනවා"

"මේ සඳහන් කරල තියෙන දේවල් හෝටල් කාමරයට ගෙනියන්න ඔබට ලැබෙනවද?" මම ඇසීමි.

"කොහොමටවත් නෑ!" හෝම්ස් කීවේ ශබ්ද නගා සිනාසෙමිනි. "මේවා සමහරක් බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේවත් නෑ වොට්සන්. එතකොටයි මේකෙ ආකර්ෂණීය බව තවත් වැඩිවෙන්නෙ. ප්‍රංශයේ හා නිව්යෝක්වල පෞද්ගලික එකතු කරන්නන් ළඟ මේ සමහර භාණ්ඩ තියෙනවා. මං මේ ළඟදී "ටයිම්ස්" පත්තරයේ තියෙව්වා පුරාවස්තු හොරකමක් ගැන පුවෘත්තියක්. වඩාත් ආකර්ෂණීය වීම සඳහා මං ඒකත් ඇතුළු කළා. ඔබට මතක ඇති මං අර දැන්වීමෙත් සඳහන් කළා.

මේ තියෙන්නෙ යටින්ම ඒවා ගැන. අමෙන්හොටෙප් රජතුමාගේ හා ඔහුගේ බිසව නෙෆෙර්තිති ගේ මුහුණු ලෙස සැලකෙන ඉතාම කුඩා ප්‍රමාණයේ රත්රන් පිළිම දෙකක් මාස හයකට පමණ පෙර හමුවුණාලු. ඊජිප්තුවේ කර්නැක්වලදී කැණීම්වලින්. ඒවා ළඟ තබාගෙන හිටි පුරාවිද්‍යාඥයාගේ කයිරෝවේ හෝටල් කාමරයේදී ඒවා හොරකම්කරල තියෙනවා.

http://sherlockholmesinvestigations.blogspot.com

ඒකත් මේකට ඇතුළු කළේ ඩයිසන්ගේ සිත ඇදගන්න. බලමු ඔහුගේ ප්‍රතිචාරය මොකක්ද කියල. මෙන්න වොට්සන් ලියුම. කියවල බලන්න"

ලැංහැම් හෝටලයේදීය

ජේම්ස් ඩයිසන් මහතා,
හැමර්ස්මිත් තැපැල් කාර්යාලය බාරේ,

හිතවත් මහත්මයාණෙනි,

පුරාවස්තු ගැන විමසමින් ඔබ එවූ ලිපියට ස්තුතියි. අලෙවිකිරීම සඳහා මවිසින් ගෙනඑනු ලැබූ පුරාවස්තුවලින් දැනට ඉතිරිව තිබෙන්නේ පහත සඳහන් ඒවා පමණි. පසුගිය දිනවල පැමිණි ගනුදෙනුකරුවෝ අනෙක් සියල්ල මිලදී ගත්හ. පෙබරවාරි 25 වැනිදා සවස 3ට ලැංහැම් හෝටලයේ අංක 43 කාමරයේදී ඔබ හමුවිය හැක. පුරාවස්තු පරීක්ෂා කිරීම හා මිලදී ගැනීම එදිනට. මුදල් ගෙවීම බ්‍රිතාන්‍ය පවුම් හෝ ඇමරිකානු ඩොලර්වලිනි. චෙක්පත් භාරනොගන්නා බව කරුණාකර සලකන්න.

ඔබ පැමිණෙන හෝ නොපැමිණෙන බව වහාම විදුලිපුවතක් මගින් මා වෙත දන්වා එවනු මැනවි.

මේ හිතවත්
ආචාර්ය ඩේවිඩ් ලින්කන්.

"ඔබට හිතෙන්නේ මිනිහ එවි කියලද?" ලියුම ආපසු දෙමින් මම ඇසීමි.

"කිසි සැකයක් නෑ ඔහු එනවා" හෝම්ස් කීය. "අන්තිමටම මං කියූ හොරකම් කළ රන්පිළිම මිලට ගන්න ඔහු බොහොම කැමැති වේවි. මේ වගේ දෙයක් මිලට ගන්න සමහර විට කෙනෙකුට ජීවිතයටම ලැබෙන්නේ එකම අවස්ථාවයි. ගැනුම්කාරයෝ ඒ බව දන්නවා. ඉතින් ඒ වගේ දේවල්වලට ඔවුන් නිකම්ම ආකර්ෂණය වෙනවා. ඒකට එක් විශේෂ හේතුවක් තියෙනවා. හොරකම් කළ පුරාවස්තු විකිණෙන්නේ එහි නියම වටිනාකමෙන් බාගෙකටත් අඩු මිලකට. මයිකල් ආන්ජෙලෝගෙ සිතුවමක් වගේ තමයි. ව්‍යාජ එකක් නෙමෙයි කියල තේරුම් ගත්තොත්, ඒක මිලට ගන්න ගැනුම්කාරයෝ පොරකනවා"

ලිපිය තැපැල්කොට අපි දින දෙකක් නොඉවසිල්ලෙන් බලා සිටියෙමු. අන්තිමේදී මගේ මිත්‍ර "ආචාර්ය ඩේවිඩ් ලින්කන්" ට

http://sherlockholmesinvestigations.blogspot.com

පිළිතුරක් ලැබිණි. එහෙත් එය බලාපොරොත්තු නොවූ ආකාරයේ එකක් විය.

මහත්මයාණනි,

ඔබේ ලිපියට ස්තුතියි. එම පුරාවස්තු සමහරක් මිලදී ගැනීමට මගේ කැමැත්තක් ඇත. එහෙත් පෞද්ගලික හේතූන් නිසා ඔබේ හෝටල් කාමරයට පැමිණීමට මට හැකියාවක් නොමැත. ඔබේ පුරාවස්තු රැගෙන මා දන්වා එවන තැනකට පැමිණීමට ඔබට හැකි නම් මේ ගනුදෙනුව සතුටුදායක ලෙස අවසන් කළ හැක.

ඊට කැමැති නම් පෙබරවාරි 25 වැනිදා දවස 3ට ඔබේ හෝටල් කාමරයේම රැඳී සිටින්න. ඔබ පැමිණිය යුතු තැන දන්වා, ඔබ කැඳවාගෙන යාමට මගේ අශ්වකරත්තය හා රියැදුරා එවමි. පිළිතුරක් එවන්න.

ජේම්ස් ඩයිසන්.

"බලන්න වොට්සන් මං කිව්ව හේද, මොහු අංක එකේ කෛරාටිකයෙක් කියලා?" හෝම්ස්ගේ සිනාමුසු මුහුණෙනි. "අපරාධය කළ එකාගේ හිතේ ඒබව හැම නිසයේම හොල්මන් කරනවා. හදිසියේ මේක එයා අල්ලගන්න ගැහුව ගැටයක් නම්, එයින් බේරෙන්න ඉඩ සලස්වාගන්නයි මෙහෙම ඉල්ලීමක් කරන්නේ. ඩයිසන් ඔහු පදිංචි තැන අපට හෙළිකරන්නේ නෑ. අපි මුණගැහෙන්න හෝටල් කාමරයට එන්නෙත් නෑ. ඇයි?

ඒ දෙවිධියේම පොඩි අවදානමක් තියෙනවා නොවැ. මිනිහ මාව ගෙන්වාගන්නේ එයාට ආරක්ෂාව සලස්වාගන්න පුළුවන් තැනකට. මං හිතාගෙන හිටියේ ස්ටැන්ලි හොප්කින්ස් සහ ඔබ කල් ඇතුව මගේ හෝටල් කාමරයේ සඟවාගෙන ඉන්න. එතකොට මිනිහ ඇතුළට ආව ගමන් අත්අඩංගුවට ගන්න තිබුණා. දැන් ඉතින් ඒක හරියන්නේ නෑ" කී හෝම්ස් පුටුවේ පිටුපසට හේත්තු වී කල්පනා කිරීමට පටන්ගත්තේය. පැයක් පමණ හාන්සිපුටුවේ ගතකළ ඔහු තීරණයකට පැමිණි බැව් මම තේරුම් ගතිමි.

"වොට්සන්. ඔබේ රිවෝල්වරය හොඳට ක්‍රියාත්මක වෙනවද?" හෝම්ස් ඇසුවේ අසුනෙන් නැගිටිමිනි.

"මොකද එකපාරටම මගේ රිවෝල්වරය උවමනා වුණේ?"

"මේ ඩයිසන් කියන මිනිහා බොහොම භයානක එකෙක්" හෝම්ස් පිළිතුරු දුන්නේය. "ඔහු පාවිච්චි කරන්න වඩා කැමති

http://sherlockholmesinvestigations.blogspot.com

විසිකරන පිහියද රිවෝල්වරයද කියන එක මට කියන්න අමාරුයි. නමුත් ඒ කොයි එක හරි නිවැරදි ඉලක්කයට පාවිච්චි කරන්න ඔහු දක්ෂයෙක් බවට සැක නෑ. ගෙනෝ මෙහාට දෙන්න ඔබේ රිවෝල්වරය. මං ඒකට උණ්ඩ පුරවලා අත්හදා බලන්න ඕන. උවමනා වෙලාවට ඒක ක්‍රියාත්මක නොවුණොත් මං ඉවරයි"

ලාච්චුවේ තිබූ මගේ රිවෝල්වරය ද උණ්ඩ පෙට්ටිය ද රැගෙන මගේ මිත්‍රයා අතට දුන්නෙමි. පළමුවෙන් ගිනිඅවියේ උණ්ඩ නොමැති බව සැක හැර දැනගත් ඔහු, කොකා ගැස්සීම නිවැරදිව සිදුවේ දැයි පරීක්ෂා කර බැලීය. වෙඩි පහර නිකුත්වන කට තුළට රෙදි කැබැල්ලක් යවා එය පිරිසිදු කර, එම කට කාචයෙන් පරීක්ෂා කර බැලුවේය. අනතුරුව දෙර අගුළුවලට තෙල් දමන බඳුනකින් බින්දු කිහිපයක් ආයුධයේ තැන් තැන්වලට දමා යළිත් කොකා ගස්සා බැලුවේය. එම ආයුධයේ ක්‍රියාකාරිත්වය ගැන ඔහු සෑහීමට පත්වෙන බවක් හෝම්ස් ගේ මුහුණේ මම දුටුවෙමි. මීළඟට ඔහු රිවෝල්වරයට ජීවූ උණ්ඩ පුරවද්දී මගේ සිතේ තැතිගැන්මක් ඇතිවිය.

"හෝම්ස්. ඔබ හදන්නේ වෙඩිතියලා බලන්නද?" මම ඇසීමි.

"ඔව්" ඔහු පිළිතුරු දුන්නේ මා දෙස වත් නොබලමිනි. "රිවෝල්වරය හොඳින් ක්‍රියාකළාට වැඩක් නෑ, වෙඩිල්ල නියම ඉලක්කයට වදින්නෙ නැත්නම්"

"කොහේදිද, කවදාද, කොයි වෙලාවෙද ඔබ වෙඩිතැබීම අත්හදා බලන්නේ?"

"හයවෙන්න එපා වොට්සන්" හෝම්ස් කීය. "මං ඔබට වෙඩි තියන්නෙ නෑ. ඔබට කිසිම හිරිහැරයක් වෙන්නෙ නෑ. ගිනිඅවිය ගැන කියනවා නම්; ඒක අත්හදා බලන්නේ අද; මේ මොහොතෙ; මේ කාමරය ඇතුළෙ!"

"දෙයියෝ සාක්කි හෝම්ස්!" මට කෑගැසිණ. "හඩ්සන් මහත්මිය විලාප ගහමින් උඩට දුවගෙන ඒවි. අනේ අසරණ ගෑනි. ඇය හිතාවි අපි දෙන්නා මේක ඇතුළෙ සටනේ වැදිලා මරාගන්නවා කියල"

"කලබල වෙන්න එපා වොට්සන්. ඇය දන්නවා අපි ඒ වගේ සණ්ඩුකරගන්නා මිත්‍රයින් නොවෙන වග" කී හෝම්ස් රිවෝල්වරයේ ආරක්ෂක අගුළ ලිහිල් කළේය. ගිනිඅවිය දකුණු අතට ගෙන එහි කට ඉහළට සිටින සේ හෝම්ස් දකුණු අත වැළමිට ළඟින් නැමුවේ සිරුවෙන් සිට ගනිමිනි. අනතුරුව ගිනිළදුනේ සිට

http://sherlockholmesinvestigations.blogspot.com

ඉවතට පියවර හතරක් තැබූ ඔහු ක්ෂණිකව ආපසු හැරුණේ ද්වන්ධ සටනක යෙදෙන ඇමරිකානු කැරලිකරුවෙකු විලසිනි. මම භයෙන් ත්‍රස්ත වී බලාසිටියෙමි.

ගිනි උදුන් පඩියට ඉහළින් වූ ඉලක්කයකට දෙනෙත් යොමු කළ හෝම්ස්, රිවෝල්වරය රැගත් අත සෘජුව ඉදිරියට දිගු කළේය. මීළඟට තම හිස, දකුණු උරහිස දෙසට පහත් කළ ඔහු, වම් ඇස වසාගෙන දකුණු ඇසෙන් ඉලක්කය ගත්තේය. මම වහාම දෑත්වලින් මගේ දෙකන් වසා ගතිමි. මිනිත්තුවක් ගතවීමට පෙර හෝම්ස් පිට පිට වෙඩිපහර හයක් බිත්තියට එල්ල කළේය. බිත්තියේ 'V' අකුරක් සලකුණු විය. මා දෙස් බලා ජයග්‍රාහී සිනාවක් පෑ මගේ මිත්‍රයා, ගිනිඅවිය රැගත් අත පහත දමා එය මේසය උඩින් තැබුවේය. විසිත්ත කාමරයේ පිරුණු වෙඩිබෙහෙත් දුම ඉවතට යන සේ මම ජනේල කිහිපයක් හැර දැමුවෙමි.

"වෙඩි ශබ්දෙ කන්බිහිරි කරවන තරම්" මම කීවෙමි. "පුදුමයි හඩ්සන් මහත්මිය විලාප කියාගෙන උඩට දුවගෙන ආවෙ නැති එක"

"ඒකෙ පුදුමයක් නෑ මිත්‍රයා" හෝම්ස් කීය. "ඇය අද මේ වෙලාවෙ ගෙදර නැති බව මං දන්නවා. ඒ නිසයි මං බිත්තියට වෙඩි තියල බලන්න පසුබට නොවුණෙ"

"ඔබ කොහොමද දන්නෙ ඇය ගෙදර නැතිබව?"

"ඇය සාමාන්‍යයෙන් එළවළු ගන්න වෙළඳපොළට යන්නෙ සඳුදා උදේ 10ට" හෝම්ස් කීය. "අසනීපයක් නොතිබුණොත් ඒක හැමදාමත් ඇගේ සිරිත. අද සඳුදා. ඉතින් මේ වෙලාව වෙනකොට ඇය ඇත්තෙ වෙළඳපොළේ. පැය භාගයකට විතර කලින් මට ඇහුණා අපේ ගේ දොරකොඩින් පිටත් වී ගිය අශ්වකරත්තයක හඬ. ඒ හයිෆීල්ඩ් ගේ අශ්වකරත්තයේ හඬ. ඔහුගේ අශ්වයාගේ එක කකුලක තිබෙන සුළු ආබාධයක් නිසා ඒ හඬ විශේෂයි. හඩ්සන් මහත්මිය හැමවිටම වෙළඳපොළට යන්න කැඳවන්නේ හයිෆීල්ඩ්. ඊට අනතුරුව මට ඇහුණා, අපේ සේවක ළමයා බිලී උස් හඬින් ගීයක් සිවුරුහන් කරන හඬත්, ඒකට මුළුතැන්ගෙයි සේවිකාව ඔහුට බැණවදින හඬත්. හඩ්සන් මහත්මිය ගෙදර හිටියා නම් ඔය ශබ්ද කිසිවක් අපට අහන්න ලැබෙන්නේ නෑ."

"හොඳයි. මගේ රිවෝල්වරය කොහොමද?"

 http://sherlockholmesinvestigations.blogspot.com

"අනර්ඝයි. මේක මීට ඉහතත් අපේ ජීවිත ආරක්ෂා කරන්න පිහිටවෙලා තියෙනවා. යළිත් ඒ සේවාව මට ලබාදෙන බවට සැක නෑ"

"හෝම්ස්. ඔබ ජේම්ස් ඩයිසන් හමුවෙන්න යන්නෙ තනිවමද?" මම ඇසීමි. "ඒක තරමක් අවදානම් වැඩක්. කවුද දන්නෙ විසිකරන පිහියකින්ම ඔහු ඔබව පිළිනොගනීවිද කියලා?"

"කරන්න දෙයක් නෑ මිත්‍රයා," හෝම්ස් පිළිතුරු දුන්නේය. "මා සමග තවත් කවුරුවත් එනවට ඔහු කැමැති වෙන එකක් නෑ. ඔහු ඒ බව තමන්ගේ රියැදුරාට දැනුම්දීල ඇති. මේ කටයුත්ත සාර්ථක කරගන්න නම් මට තනියම යන්න වෙනවා, ඒක කොයිතරම් අවදානම් වුණත්"

"ඉතින් ඔබ යන්නෙත අවදටද?"

හෝම්ස් පැය භාගයක් පමණ කල්පනා කළේය. ඔහු සිතෙන් යම් කටයුත්තක් සැලසුම් කරගත් බව මම තේරුම් ගතිමි.

"අද සඳුදා නේ" හෝම්ස් කීය. "ඒ ගමන මං යොදගන්නවා අනිද්දට........... ඒ කියන්නේ බදාදට. එනකොට වෙලා තියෙනවා, කල්වේලා ඇතිව මං තැපැල් කරන ලියුම ඔහුට ලැබෙන්න. මටත් වෙලා තියෙනවා උවමනා දේවල් සූදානම් කරගෙන හෝටලයේ කාමරයට වෙලා ඉන්න"

"මට මොකක් කරන්න කියලද ඔබ උපදෙස් දෙන්නෙ?"

"මං ඒ ගැනත් හිතුවා වොට්සන්" හෝම්ස් කීය. "මේකයි අපේ සැලැස්ම. මේ රිවෝල්වරය මගේ ළඟ තියාගන්නවා. ඔබ සහ ස්ටැන්ලි හොප්කින්ස් දෙන්නත් ආයුධ සන්නද්ධව සිටිය යුතුයි. හොප්කින්ස්ට මං කියන්නම් ඔබ වෙනුවෙන් පොලිස් රිවෝල්වරයක් ගෙන එන්න කියලා.

ඔබ දෙදෙනාට තියෙනවා වොට්සන් පොඩි පහේ නාටකයක් රඟදක්වන්න. මේක ඔය වේදිකා නාට්‍ය වගේ නෙමෙයි. ඔබ දෙදෙනාගේ රඟපෑමේ සාර්ථකත්වය උඩයි මගේ ජීවිතය රැඳී තියෙන්නේ. ඔබට තේරුණාද?"

"එහෙම වෙන්නෙ කොහොමද?"

"ඔන්න අහගන්න." හෝම්ස් කීය. "මං හොප්කින්ස්ට කියනවා අශ්වකරත්ත රියැදුරෙක් වගේ සැරසිලා, හෝටලයේ කුලීරථ ගාලට වෙලා ඉන්න කියලා. ඔහු පදවාගෙන එන්නේ කොළ පාට

http://sherlockholmesinvestigations.blogspot.com

වහලක් තියෙන කුලීරියක්. වොට්සන් ඔබ සිටින්නේ දේවගැතිවරයෙකුගේ ඇඳුමෙන්."

"දේවගැතිවරයෙකුගේ?"

"ඔව්. එතකොට දකින කෙනෙක් සැකකරන්නේ නැහැ." හෝම්ස් කීය. "ඔබ ලැංහැම් හෝටලයේ දොරටුව පෙනෙන තෙක් මානයේ, ටිකක් ඈතින් ඉන්න. මාව කැඳවාගෙන යන්න ඩයිසන්ගේ රියැදුරා එනවා ඔබට දකින්න ලැබේවි. ඔහු මාව හමුවෙන්න හෝටලය තුළට ඇවිත් මිනිත්තු තුනක පමණ කාලයකදී, මං හෝටලයේ ඉදිරි දොරටුව ළඟට එනවා. ඊළඟ රියැදුරා එක්ක මා එන්නේ පිටත් වී යන්න සූදානමෙන්.

එතකොට ඔබ ඔහුට පෙනෙන විධියට හෝටලය ඉදිරිපිටට හෙමින් ඇවිදගෙන එන්න. ඇවිත් නගින්න හොප්කින්ස්ගේ කරත්තෙට. මා රැගත් කරත්තය හෝටලය ළඟින් පිටත්වෙද්දී, ඔබත්, හොප්කින්සුත් ඒ පිටිපසින් එන්න ඕන. මාව කැඳවාගෙන ඔහු කොහේට යාවිද කියන්න බැහැ. කොහොම වුණත් ඔවුන් ඔක්ස්ෆඩ් වටරවුම පසුකර යා යුතුයි නේ. එතැන මං වෙනත් කුලී රියක් සූදානම් කරල තියන්නම්. ඒක රතුපාට වහලක් තියෙන එකක්. ඒකෙ රියැදුරා කරත්තයෙන් බැහැල අශ්වයින් ළඟට වෙලා ඉඳගෙන අතින් සංඥා කරාවි. එතකොට ඔබට තියෙන්නේ ඔබ දෙදෙනා යන කුලී රිය පාර අයිනේ නවත්වලා, රතු වහල තියෙන ඒ රියට නැගලා ඒක පදවාගෙන ඒම"

"මොකටද එහෙම දෙයක් කරන්නේ?" මම ඇසීමි. "ඒකෙන් මිනිත්තු කිහිපයක් නාස්ති වෙනවනේ?"

"අපි හෝටලයෙන් පිටත්වෙලා එද්දිම තවත් කරත්තයක් අපේ පිටුපසින් එන බව ඩයිසන්ගේ රියැදුරා දකීවි" හෝම්ස් කීය. "ඔහුට එක්වරම පෙනෙන්නේ ඒක කොළ පාට වහලක් තිබෙන රියක් බව. මඳ දුරක් ගියාට පස්සේ ඒක දකින්න නොලැබුණාම ඔහුගේ හිතේ ඇතිවෙන සැකය අඩුවේවි. රතුපාට වහල තිබෙන අශ්වකරත්තයට මාරුවුණු ගමන් ඔබ උඩින් ඇඳගෙන ඉන්න දේවගැති ලෝගුව ගලවා දමන්න ඕන වොට්සන්. අපි යන්නේ හෝටලයකට වුණොත්, ඔබටත් පුළුවනි ඒ හෝටලයට එන්න. ඔබ පමණක් නෙමෙයි හොප්කින්සුත් ඔබ සමග ආ යුතුයි."

"හෝම්ස්. ඔබ හිතන්නේ, ඔහු කල්ඇතුවම මොකක් හරි හෝටලයක කාමරයක් වෙන්කරගෙන රැඳී ඉදීවි කියලද?"

http://sherlockholmesinvestigations.blogspot.com

"මට එහෙම හිතෙනවා. නමුත් හරියටම කියන්න බැහැ. බාගවෙලාවට ඔහු ගෙදරදීම මාව පිළිගන්නත් පුළුවනි. එහෙමවුණොත් ඔබ දෙදෙනාගෙන් උදව් ලබාගැනීමට මට හැකිවෙන්නෙ නැහැ"

"ඩයිසන් ඔබව, ඔහුගේ ගෙදරට කැඳවාගෙන නොයාවි කියල ඔබ හිතන්නෙ ඇයි?"

"මෙහෙමයි වොට්සන්" හෝම්ස් කීය. "ඔහු හිතාගෙන ඉන්නේ, ඔහු ගනුදෙනු කරන්නේ පුරාවස්තු වෙළඳාම් කරන්නෙක් සමග කියල නේ. ඒ වගේ නාඳුනන මිනිසුන් අප්‍රමාණ ගණනක් එක්ක ඔහු ගනුදෙනු කරල ඇති. ඒ කොහොම වුණත් තමන් අපරාධකාරයෙක් බව ඔහුට අමතක නැහැ. පොලීසිය අපරාධකාරයා හොයාගන්න විමසිල්ලෙන් ඉන්න බවත් ඔහුට අමතක නෑ. රොබින්සන් ලන්ඩනයට ඇවිත්, පුරාවස්තු විකිණීම කළ බව, පොලීසිය හොයාගෙන ඇති කියල ඔහු අනුමාන කරාවි. ඔහු නොහිතන්නේ තමන් ඒ අපරාධයට පටලැවෙන යමක් ආචාර්ය ඩේවිඩ් ලින්කන් නම් නාඳුනන පුද්ගලයා ළඟ ඇතියි කියන කරුණ පමණයි. ඉතින් නාඳුනන කෙනෙකුට තමන්ගේ ගෙදර තිබෙන තැන පෙන්වන්න ඩයිසන් කැමැති වෙන එකක් නැහැ. මහෝටලයක කාමරයක් වෙන්කර ගැනීම බොරු නමකින් කරන්න පුළුවනි. ඔවුනට බොරු ලිපිනයක් දෙන්නත් ඔහුට පුළුවනි. ඔහු එතැනින් පිටවෙලා ගියාට පස්සේ කාටවත් හොයන්න බැහැ, කාමරයේ හිටි මිනිහගේ ඇත්ත නම් ගම්. නමුත් තමන් පදිංචි නිවසට අමුත්තෙකු කැඳවීම අවදානම් කටයුත්තක්. ඒ හින්ද මං හිතනවා, ඔහු රියැදුරා ලවා මාව කැඳවාවි කොහේ හරි හෝටලයකට"

"ඔබේ ළඟ කිසිම පුරාවස්තුවක් නැහැ කියල දැනගත්තාම ඔහු කෝපාවිෂ්ය වේවි" මම කීවෙමි. "එතකොට ඔහු වඩාත්ම සැකකරන්න ඉඩ තියෙනවා, ඔබ ඔහු පසු පස්සේ එළවන අපරාධ පරීක්ෂකයෙක් බවට. එයින් ඇතිවෙන ප්‍රතිඵල මොන වගේ භයානක ඒවා වේවිද කියල මට හිතාගන්නත් අමාරුයි හෝම්ස්.......... ඔය ක්‍රමය වෙනුවට නැද්ද වෙනත් විකල්පයක්?"

"මගේ හිතවත් මිත්‍රයා" හෝම්ස් කීය. "ඔබ ඔහොම කියන්නේ ඔබේ හිතේ ඇති අවංක මිත්‍රත්වය නිසා. ඒක මං අගය කරනවා. මට අනතුරක් වේවි කියල ඔබේ හිතේ භයක් ඇතිවුණා නේද? ඔව්. මට

http://sherlockholmesinvestigations.blogspot.com

කටයුතු කරන්න වෙලා තියෙන්නේ බොහොම භයානක මිනිහෙක් එක්ක. නමුත් මට කරන්න දෙයක් නෑ වොට්සන්. මේ වෙලාවේ මට වෙන කිසිම විකල්ප ක්‍රමයක් ගැන හිතාගන්න අමාරුයි....... කළ යුතු වැඩකටයුතු රාශියක් තියෙනවා. මං වහාම යායුතුයි"

මගේ මිත්‍රයා නිවසෙන් පිට වී ගිය පසු මම මේ පිළිබඳව වැඩිදුර කල්පනා කිරීමට පටන්ගත්තෙමි. අප නිමුවේ ඇත්තේ බැරෑරුම් කටයුත්තකි. මෙවැනි බිහිසුණු පුද්ගලයකු තනිවම දමනය කරගැනීමට හෝම්ස්ට හැකිවේද? මීට පෙර භයානක අපරාධකරුවන් අත් අඩංගුවට ගත් සෑම විටකම පාහේ, හෝම්ස්ගේ සහයට මා පමණක් නොව පොලිස් නිලධරයෙක් ද සිටියේය. ලෙස්ට්‍රේඩ් හා ග්‍රෙග්සන් අපට සහය වූ එවැනි අවස්ථා ගණනාවක් මට සිහිපත් කළ හැක. එහෙත් මෙවර හෝම්ස්ට ආරක්ෂාව සඳහා ඇත්තේ මගේ රිවෝල්වරය පමණි. එය කබා සාක්කුවෙන් එළියට ගැනීමටවත් ඔහුට ඉඩක් ලැබේවිද?

නිවසෙන් පිටවී ගිය හෝම්ස් ආපසු එනවිට රෑ බෝවී තිබිණ. ගිය කටයුතු කොතරම් දුරට සාර්ථක වූවාද යන්න ඔහු මට පැවසුවේ නැත.

බදාදට පහන් විය. මගේ මිත්‍රයා ලොකු ගමන්මලු දෙකක යම් යම් දේ අසුරන අයුරු මම දුටුවෙමි. පැරණි ජෝණ්, පුවත්පත්, ඉරිගිය පාවහන් යුගලක් හා පරණ ඇඳුම් මේ අතර විය. ලොකු ගමන් මලු දෙකට අමතරව කරේ එල්ලාගෙන යා හැකි අමතර මල්ලක් ද ඔහු සූදානම් කරගත්තේය. ඇසිරීම අවසන් වූ පසු ඒවා අතිශයින්ම බරින් වැඩිවූ අතර, තනි පුද්ගලයෙකුට රැගෙන යාමට අපහසු තරම් විය. උදේ ආහාරය නිමකළ වහාම හෝම්ස් ලැංහැම් හෝටලය වෙත යාමට තීරණය කළේය.

"මං කල් ඇතුව ගිහින් කාමරයේ පදිංචි වෙලා ඉන්න එක හොඳයි වොට්සන්" ඔහු කීය. "අපි කොහොමද දන්නෙ? බාගවෙලාවට ඩයිසන් හෝටලය අසල ඔත්තුකාරයෙකුව රඳවලාද කියන්නත් බැහැ. මිනිහ ඒ තරම් කපටියෙක්. මං කල් ඇතුව ගිහින් හෝටල් කාමරේට වෙලා විවේක ගන්නම්. එතකොට, මේ ප්‍රශ්නයට මං මුහුණ දිය යුත්තේ කොහොමද කියන එක ගැන මට තවදුරටත් කල්පනා කරල බලන්න පුළුවනි."

"එතකොට මං කොහොමද ක්‍රියාකරන්න ඕන?" මම ඇසීමි. "ඒ ටික මට පැහැදිලිව විස්තර කරල දෙන්න"

 http://sherlockholmesinvestigations.blogspot.com

"මං ඩයිසන්ට වෙලාව දුන්නා ඔහුගේ රියැදුරා හවස 3ට ලැංහැම් හෝටලයට එවන්න කියලා" හෝම්ස් කීවේ ඔහුගේ සටහන් පොත පෙරලා, ලියාගත් දේවල් යළිත් වරක් පරීක්ෂා කරමිනි. "හවස දෙක වෙනකොට ස්ටැන්ලි හොප්කින්ස් බේකර් වීථියට එනවා. ඒ කියන්නේ අර කොළපාට වහලක් සහිත අශ්වකරත්තය දක්කාගෙන අපේ නිවහන ළඟට එනවා. ඒ වෙලාව වෙනකොට ඔබ අර දේවගැති ඇඳුමෙන් සැරසිලා සූදානම්ව ඉන්න ඕන. ඔබේ ඇඟේ මිම් අරගෙන මැහුවා වගේ, ඒක ඔබේ ඇඟට ගණනට හරියාවි. ඒක ඊයෙ හවස මං ඉල්ලා ගත්තේ මාලිබෝන් දෙව්මැදුරේ දේවගැතිතුමාගෙන්.

හරි. ඔබ දෙදෙනා දෙකට මෙහෙන් පිටත්වෙලා ලැංහැම් හෝටලය දෙසට එන්න ඕන වොට්සන්. හෝටලයට යාර සියයක් තියලා ඔබ කුලීරියෙන් බැසිය යුතුයි. ඊටපස්සේ හොප්කින්ස්ට කරත්තය දක්කාගෙන හෝටලය වෙත යන්න ඉඩඇරල ඔබ ආ යුත්තේ පයින්."

"එතැනට එනතුරු මට පැහැදිලියි. ඊළඟට?"

"හොඳයි. හොප්කින්ස් කරත්තය පදවාගෙන ඇවිත් හෝටලයේ කුලීරථ ගාලේ නවත්වාගෙන ඉන්නාවා. ඔබ හෝටලය දිහාවත් නොබලා, හෝටලය පසුකරගෙන දිගටම ඇවිදගෙන යනවා. තවත් යාර සීයක් විතර ඉදිරියට යද්දී ඔබට හමුවෙන්නේ ටොරිංටන් ආර්යා ළමා රෝහල. වොට්සන් ඒ ගේට්ටුවෙන් ඇතුළුවෙන්න. හවස තුනට කිට්ටු වෙනතුරු රෝහල් බිමේ රැඳී ඉන්න. තුනට මිනිත්තු පහක් තියලා ආපසුමත් හෝටලය පැත්තට එන්න. වොට්සන් ඔබට පුළුවනි රියගාලුපෙනෙන තෙක් මානයේ ඇතින් ඉන්න. තේරුණාද?"

"ඔව්"

"හරියටම නියම වෙලාවට, ඒ කියන්නේ හවස 3ට ඩයිසන්ගේ රියැදුරා ඒවි. එනකොට මං ඔහුත් සමග පිටත්වෙනවා. ඔබට පෙනේවි මගේ අත්ශෙකම හා උරහිසේ එල්ලාගත් ගමන්මලු තිබෙන බව. මගේ "පුරාවස්තු" තියෙන්නේ ඒවල. මං අශ්වකරත්තයට නඟිද්දීම වගේ ඔබත් හොප්කින්ස්ගේ කරත්තයට නඟින්න ඕන. මං හිතන්නේ මා යන කරත්තය පිටුපසින් ඒම ඔබට අපහසුවෙන එකක් නැහැ."

http://sherlockholmesinvestigations.blogspot.com

"හොඳයි. එතැනට එහාතෙක් හැමදෙයක්ම පැහැදිලියි" මම කීවෙමි. "ඊළඟට මොකක්ද ඔබේ සැලැස්ම?"

"එතැනින් ඉදිරියට කිසිම සැලැස්මක් නෑ වොට්සන්" හෝම්ස් කීය. "ඉස්සරහට වෙන්න තියෙන්නෙ මොනවද කියල අපි දන්නෙ නෑ. ඉතින් එන හැටියකට මුහුණ දෙනවා මිසක් එහෙම සැලැස්මක් ගැන හිතන්නවත් බැහැ.

ඔබ දෙදෙනාටත් පැමිණෙන්න කියලා මං කියන්නේ මොකද? ජේම්ස් ඩයිසන් කියන්නෙ අරුණුකමත් සපටි කෛරාටිකකමත් දෙකෙන්ම අනූන සතුරෙක්. බොහෝවෙලාවට ඔහු ශාරීරිකවත් ශක්තිමත් කෙනෙක් වෙන්න පුළුවනි. ඒ තත්ත්වය උඩ ඔහු සම්පූර්ණයෙන්ම යටත් කරගන්න තවත් කෙනෙකුගේ උදව් අවශ්‍යවේවි කියලා මට නිකමට හිතෙනවා. ඒ කොහොම වුණත් ඩයිසන් මුහුණට මුහුණ හමුවෙද්දී ඔයා දෙදෙනා කැඳවාගෙන යන්න මට ඉඩක් ලැබෙන්නෙ නෑ."

මගේ මිත්‍රයා නිවසෙන් පිටව් ගිය පසු ඔහු මා සඳහා ගෙනැවිත් තිබූ දේවගැති ලෝගුව හැඳ බැලීමි. එය මගේ සිරුරට හොඳින් ගැළපෙන බව මට ද පෙනිණ. දහවල් ආහාරය කල් ඇතිව ගෙන මම සූදානම් වූයෙමි. දහවල් දෙකට අශ්වකරත්තයක් අපේ නිවස ඉදිරිපිට නවත්වන හඬ ඇසිණ. දොර විවෘතමා මම නිවසෙන් පිටවූයෙමි.

දීප්තිමත් කොළ පැහැති වහලක් සහිත කුලීරියක් පදවාගෙන ඇවිත් සිටියේ පොලිස් පරීක්ෂක ස්ටැන්ලි හොප්කින්ස්ය.

"ආයුබෝවන් වොට්සන් මහත්මයා" ඔහු කීවේ මුවපුරා සිනාසෙමිනි. "මට ඔබ අඳුනාගන්නත් බැරිවුණා. ඔබ නම් දේවගැතිතුමෙක් වගේමයි. නගින්න කරත්තෙට"

මා නැගුණු පසු ඔහු කුලීරිය ඇංහැඹ හෝටලය දෙසට පැදවීමට පටන් ගත්තේය.

"මං ඔබටත් රිවෝල්වරයක් අරගෙන ආවා" ඔහු කීය. "මතක ඇතුව ඒක දුන්ම ඔබේ සාක්කුවට දමාගන්න. උණ්ඩ පුරවලයි තියෙන්නේ. අපට මෙල්ලකරගන්න වෙන මිනිහා භයානක එකෙක් බව අමතක කරන්න එපා"

"ඔව්. ඔබේ කතාව ඇත්ත" මම කීවෙමි. "මේක කොයි අතකට හැරේවිද කියල අපට කල් ඇතුව හිතා ගන්න බැහැනේ. ඒකයි මගේ හිතට තියෙන ලොකුම භය"

 http://sherlockholmesinvestigations.blogspot.com

"ඔව ඔහොම තමයි ඩෙස්තර් මහත්තයා" පොලිස් නිලධරයා කීය. "භයානක අපරාධකාරයන් අල්ලන්න යනකොට අපේ ජීවිතේ ගැන විශ්වාසයක් තියන්න බැහැ. රාජකාරියේදී මැරුම් කෑවොත් අපට තනතුරේ උසස් වීමක් ලැබෙනවා; වැටුප අපේ පවුලට දිගටම ගෙවනවා; භූමදානය කෙරෙන්නේ පොලිස් ලොක්කන්ගේ ගෞරවාචාර මැද්දේ. ඒත් හෝම්ස් මහත්තයාට වැරදුණොත් මොන දෙයියන්ට කියන්නද? එයාට පවුලකුත් නෑ; උසස්වීම නෑ; ගෞරවාචාර නෑ; වැරදුණොත් කපෝතියි. එහෙම නේද?"

එසේ කියූ හොප්කින්ස් මහතාඩින් සිනාසීමට පටන් ගත්තේය. එහෙත් එම කථාව නිසා මගේ සිතේ ඇතිවූයේ අප්‍රමාණ භයකි.

හෝටලයට යාර සීයයක් පමණ තිබියදී මම කුලීරියෙන් බැස්සෙමි. හොප්කින්ස් රිය පදවාගෙන දිගටම ඉදිරියට ගියේය. පස්වරු 3ට තවත් ඇහෙන වේලාවක් තිබූ බැවින් මම සෙමෙන් සෙමෙන් ඇවිද ගියෙමි. ඒ වෙලාවේ තිබූ අධික උණුසුම සහ නුපුරුදු ඇඳුම නිසා මට තදින් ඩහදිය දමන්නට විය.

හොප්කින්ස්ගේ රිය කුලීරථ ගාලේ තිබෙනු මම ඈතදීම දුටුවෙමි. ඔහු මුහුණ ආවරණය වන සේ හිස්වැස්ම දමාගෙන, රියැදුරු අසුනේම පිටුපසට දිගාවී සිටියේය. මෙය එතරම් කලබකාරී වෙලාවක් නොවූ බැවින් හෝටලයේ ඉදිරිපිට තදබදයක් නොවීය. කුලීරියගාලේ තවත් එක්දු රියක්වත් නොවීය. හෝටල් ආලින්දය අසල ගස් සෙවණක වූ බංකුවක වයසක ජෝඩුවක් කතාබහ කරමින් සිටිනු මම දුටුවෙමි. මැත්වරයින් හෝ ඩයිසන් ගේ ආධාරකරුවන් යයි සිතිය හැකි කිසිවෙක් පෙනෙන තෙක් මානයක නොවීය. මම දිගටම ඉදිරියට ඇවිද ගියෙමි.

ළමා රෝහල වත්තේ මඳ වේලාවක් ගතකොට මම ආපසු ඒමට පිටත්වුණෙමි. හෝටලයට සමීපවෙද්දී හෝටලයේ කුළුනේ වූ ඔරලෝසුවේ තුන නාද විය. මිනිත්තුවක් ගතවීමට පෙර අශ්වයින් දෙදෙනෙකු බැඳි පෞද්ගලික අශ්වකරත්තයක් හෝටලයේ මිදුලට ළඟාවිය. එහි රියැදුරා කරත්තයෙන් නොබැසම හෝටලයේ මුරකරුගෙන් යමක් විමසුවේය. හිස සොලවමින් එයට පිළිතුරු දුන් මුරකරුවා රථගාල දෙසට අතදිගුකර, යමක් කියන අයුරු මම දුටුවෙමි.

ජේම්ස් ඩයිසන්ගේ අශ්වකරත්තය මෙය විය යුතුය. එය අලුත් රියකි. එහි තිබූ ඔපයෙන් ද, පිත්තල ලාම්පු, වෛවර්ණ වහල හා

http://sherlockholmesinvestigations.blogspot.com

නිරෝගී පෙනුමක් තිබූ අශ්වයින්ගෙන් ද පැවසුණේ එය ධනවතෙකුට අයත් සුඛෝපභෝගී අශ්වරියක් බවය. රියෙන් බට රියැදුරාගේ ද තිබුණේ ප්‍රතාපවත් පෙනුමකි. අඩි පහයි අඟල් අටක් පමණ උස් වූ ඔහුගේ සිරුර සිහින් වුවත්, ඔහු ශක්තිමත් පුද්ගලයෙකු බව බැලූබැල්මට පෙනිණි. අලුත්ම රියැදුරු නිලඇඳුමකින් ඔහු සැරසී සිටියේය. උපතින් යුරෝපියයකු යයි සිතිය හැකිවුවත් ඔහුගේ සමේ තිබුණේ දුඹුරු පැහැයකි. ඒ දිගින් දිගටම අව්වට නිරාවරණය වීම නිසා බව මම තේරුම් ගතිමි. ඔහුගේ වයස අවුරුදු පනහක් පමණ විය යුතු යයි මම අනුමාන කළෙමි. හෝටල් කුළුණේ ඔරලෝසුව වෙත නෙත්යොමු කළ ඔහු කඩිසර ගමනින් හෝටලය වෙත ඇවිදගෙන ගියේය.

ඔහු හෝටලය තුළ අනාපෙනී යනු බලාසිටි මම, මීළඟට හොප්කින්ස් හා ඔහුගේ කුලීරිය දෙස බැලීමි. මා කලින් ද සඳහන් කළ වයසක ජෝඩුව එතැනට ළංවී හොප්කින්ස් සමග කතාබස් කරමින් සිටියහ. මම හෙමින් හෙමින් එතැනට ළංවීමි. මේ වයසක යුවළ හොප්කින්ස්ගෙන් ඉල්ලා සිටින්නේ කොහේ හෝ කුලී ගමනක් යෑමටද? එසේ වුවහොත් අපට මුහුණපෑමට සිදුවන්නේ බරපතල ප්‍රශ්නයකටය.

"ඒ හැටි දුරක් නෑ රියැදුරු උන්නැහේ" වයසක කාන්තාව කීවාය. "හැමර්ස්මිත් පාලම ළඟට විතරයි. ඔහේට ඕන ගණනක් අය කරනවා. මේ වයසක මිනිහා පපුවෙ අමාරු කාරයෙක්. ඒකයි මං මෙච්චර වැඳ වැටෙන්නෙ"

"බෑ කිව්වම බෑ නෝනා" හොප්කින්ස් කීය. "මං මේ කරත්තය නවත්වාගෙන ඉන්නෙ සුවාමී කෙනෙක් එනතුරු. එතුමාට ගමනක් යන්න ඕන කියල මට කලින් සල්ලි ගෙව්වා. මං ඒ ගමනට පොරොන්දු වෙලයි ඉන්නේ............. ආ ඔය කියන කොටම එන්නේ. සුවාමී. අපි යමුද එහෙනම්?"

"මං කියන දේ අහන්න සුවාමී" කාන්තාව මා දෙසට හැරී පින්සෙන්Dු වූවාය. "මේ මිනිහට අද දවාලට කෑමත් නෑ. එයා පපුවෙ අමාරු කාරයෙක්. හාමත්වෙලා ඉන්න මිනිහා පයින් ගියොත් පපුවේ කැක්කුම එවි. එතකොට මොන දෙයියන්ට කියන්නද? මං කොච්චර කිව්වත් මේ කරත්තකාරයා ඒක අහන්නෙ නෑ......."

http://sherlockholmesinvestigations.blogspot.com

ඇගේ කරුණුවට සවන් දෙමින් කරන ගමන්ම මම හෝටලය දෙස බැලිමි. හෝම්ස් දොරටුවෙන් එළියට ආවේය. ඒ ඩයිසන්ගේ රියැදුරා සමගය. තමන්ගේ අතේ තිබූ ගමන් මලු දෙක හා කරේ තිබූ ගමන් මල්ල හෝම්ස් රියැදුරා අතට දෙන අයුරු මම බලාසිටියෙමි. අප දෙස එක් වරක් වත් හැරී නොබැලූ හෝම්ස් කරත්තයට නැගුණේය.

"........................ මා කිව්ව දේ ඔබට ඇහුණද සුවාමි?" කාන්තාව ඇසුවාය.

"හොප්කින්ස් සූදානම් වෙන්න. අපි යමු" මා කියද්දී කාන්තාව ඔහුගේ අතින් අල්ලාගෙන ආයාචනා කරමින් සිටියාය. මට ඇය ගැන කණගාටු සිතිණි. එහෙත් මේ ඔවුනර් පිහිටවෙමින් සිටීමට වෙලාව නොවේ. අන්තිමට ඇය පසෙකට වූයේ අප දෙදෙනාටම බැණ වදිමිනි.

හෝම්ස් නැගුණු වහාම ඩයිසන්ගේ සුඛෝපභෝගී අශ්වකරත්තය පිටත්විය. ඔවුනට මිනිත්තුවක කාලයක් ඉදිරියට යාමට ඉඩහැර අපි පිටත්වූයෙමු. ඔවුන්ගේ රිය හා අපේ රිය අතර තිබුණේ තවත් එක් රියක් පමණි.

"මිනිහා වේගය වැඩි කළා. අපිත් ඉක්මන් කරමු වොට්සන් මහත්තයා," කී හොප්කින්ස් අශ්වකරත්තයේ වේගය වැඩි කළේය. "අර අනෙක් කරත්තය තියෙනවා කිව්වේ කොහේද? ඔක්ස්ෆඩ් වටරවුමෙද?"

"ඔව්. දැන් ඒ කරත්තය සූදානමෙන් ඇති" කී මම මගේ දේවගැති ඇඳුම ඉක්මනින් ගළවා ඉවත් කළෙමි.

අප ඔක්ස්ෆඩ් වටරවුමට ළඟාවෙද්දීත් ඩයිසන්ගේ රිය ගමන් කළේ අපට යාර සියයක් පමණ ඉදිරියෙනි. අප වටරවුමට ළංවෙත්ම කාසල් බාලිකා විද්‍යාලයේ ඇරී එහි සිසුවියෝ විශාල පිරිසක් මහාමාර්ගය හරහා පැනීමට දුව ආහ. ඔවුනට යාමට ඉඩදී රිය නැවැත්වීමට අපට සිදුවිණි.

"දෙයියෝ සාක්කි!" මට කෑගැසිණ. "මේ කෙල්ලන් පාර හරහා පැන්නා මදිවාට යන්නෙත් හෙමින් හෙමින්. උසුළු විසුළු කරමින්"

"ඔය වයසෙ කෙල්ලන්ගෙ හැටි ඔහොම තමා දොස්තර මහත්තයා. අපට තියෙන හදිසිය උන් දන්නෙ නැහැනේ" කී හොප්කින්ස් කරත්තය මඳක් ඉදිරියට ගෙන කෑගැසුවේය. "අයින් වෙයල්ලා! අශ්වයා කුළප්පුවෙලා!" ඒ කෑගැසීමට බිය වූ දැරියෝ

ඉවතට පැන දිවූහ. ඒ අවසරයෙන් රිය ඉදිරියට ගැනීමට හොප්කින්ස්ට හැකිවිය.

අප වෙනුවෙන් සූදානම්ව තිබූ අශ්වයින් දෙදෙනෙකු බැඳි රතු වහල සහිත කුලීරිය පාර අයිනේ නවත්වා තිබූ හැටි මම ඈතදීම දුටුවෙමි. එහි රියැදුරා බිමට බැස සංඥා කළේ අප හඳුනාගෙනය. ඔහු අපේ රියට නැග එය භාරගනිද්දී, අපි දුවගොස් ඒ රියට නැගුණෙමු. එක කෙවිටි පහරෙන්ම ඒ අශ්වයෝ ගමන් ඇරඹූහ. එහෙත් හෝම්ස් රැගත් රිය දැන් යාර දෙසීයයකටත් වඩා ඈතට ගොසිනි. මම ඒ බව හොප්කින්ස්ට කීවෙමි.

"ඔවුන් යන්නේ අධික වේගයෙන්" ඔහු කීය. "අපිත් වේගය වැඩිකරලා බලමු. මට බය ඉස්සරහ හන්දිය ගැන. සාන්ත ජේම්ස් චතුරශ්‍රය ළඟ හතරමං හන්දියෙන් ඔවුන් පැනගත්තොත් අපි වැටෙන්නේ ලොකු අමාරුවක. එතැන නැමතිස්සේම ලොකු වාහන තදබදයක් තියෙන තැනක් නේ"

අප කොපමණ වේගයෙන් ගියත්, ඩයිසන්ට අයත් රියේ වේගය ඊට වඩා වැඩිවූ බව අපි දුටුවෙමු.

"ඩයිසන්ගේ රියැදුරා කරන්නෙ පුදුමාකාර හදිසියකින්" හොප්කින්ස් කීය.

"මං වාහන හසුරුවන්න පාරේ හිටියා නම් දෙයියම්පා මං ඌව බෙල්ලෙන්ම අල්ලා ගන්නවා."

සාන්ත ජේම්ස් චතුරශ්‍රය අසල සතරමං සන්ධියේ තිබුණේ අධික වාහන තදබදයකි. දෙපැත්තෙන් ආ වාහන ගැන කිසිම තැකීමක් නොකළ ඩයිසන්ගේ රියැදුරා, දකුණු පැත්තේ වූ වොක්ස්හෝල් පාරට රිය දැම්මේ, මාර්ග නීති හෝ මිනිස් ජීවිත ගැන සැලකීමක් නොකරමිනි. ඒ මොහොතේ වෙනත් රියක නොගැටී ඔවුන් බේරුණේ අනූනවයෙනි. ඒ සමගම ඔහුට ශාපකළ අනෙක් කුලී රථ රියැදුරෝ මංසන්ධිය මැදට තම රථ පැදවූහ. මාර්ගය සම්පූර්ණයෙන්ම අවහිර විය.

"දෙයියන්ට ඔප්පු වෙච්චාවේ!" මට කෑගැසිණ. "අපට තව පැය කාලක් වත් මෙතන ඉන්න වේවි. දැන් කොහොමද මෙතෙන් රිංගලා යන්නේ?"

"හෝම්ස් මහත්තයාව අරගෙන එද්දී, ලුහුබැඳ එන වාහනවලින් ගැළවිලා එන්න කියලා ඩයිසන් රියැදුරාට උපදෙස් දෙන්න ඇති

http://sherlockholmesinvestigations.blogspot.com

හොප්කින්ස් කීය. "ඔවුන් කොහේද ගියාද කියල හොයන්න ක්‍රමයක් නෑ. අපට යන්න ඉඩක් ලැබුණාම වොක්ස්හෝල් පාර දිගේ ඉදිරියට ගිහිං බලමු. වෙන කරන්න දෙයක් නෑ."

මිනිත්තු දහයකට පසු ඉතා අපහසුවෙන් හන්දියේ තදබදයෙන් රිංගා, රිය වොක්ස්හෝල් පාරට ගැනීමට හොප්කින්ස් සමත්විය. මිළඟට ඔහු අශ්වයින්ට තලමින් රියේ වේගය වැඩි කළේය. හෝම්ස් දැගත් රියේ සලකුණක් හෝ නොවීය. මගේ මිත්‍රයාට කුමන ඉරණමකට මුහුණපාන්නට සිදුවේවිද? දැනටමත් සියල්ල සිදුවී අවසානද? මගේ සිතේ භීතියක් ඇතිවිය.

තවත් සැතපුමක් පමණ ඉදිරියට යද්දී අප ළඟාවූයේ වොක්ස්හෝල් පාලම වෙතය. පාලමට නුදුරින් ඩයිසන්ගේ රියට සමාන රියක් නවත්වා තිබෙනු දැක මම තරමක් පුදුමයට පත්වීමි. අප එතැනට ළංවෙද්දී දකින්නට ලැබුණු දසුනෙන් අපි ගල් ගැසී බලාසිටියෙමු.

ඩයිසන්ගේ රියැදුරා අශ්ව කරත්තයෙන් බිමට පැන පාරදිගේ ඉදිරියට දිව්වේය. ඒ වහාම කරත්තයෙන් පිනූ හෝම්ස් රියැදුරා පිටිපස එළවාගෙන ගියේය. එක්වරම පාර අයිනේ වූ තැපැල් කණුවකට මුවා වූ රියැදුරා හෝම්ස් දෙසට වෙඩි පහර කිහිපයක් එල්ල කළේය. හෝම්ස් එක් ක්ෂණයකින් බිමට පහත් වී එතැන නවතා තිබූ පලතුරු කරත්තයකට මුවාවුණේය.

අපි පාර අයිනේ කරත්තය නවත්වා එයින් බිමට පැන්නෙමු. හෝම්ස්ගේ සලකුණක් නොදුටු විට, රියැදුරා අතුරු පාරකට පිවිස ඒ දිගේ පලා ගියේය. වෙඩි හඬෙන් බියවී ගල්ගැසුණු මහමග සිටි ජනතාව අසරණව බලා සිටියහ. හෝම්ස්ට වෙඩි පහරෙන් අනතුරක් නොවූ බව නිසැකය. රියැදුරා පලාගිය අතුරුපාරට පැන අපි දෙදෙනාම ඔහු ලුහුබැඳ ගියෙමු. අපට යාර පනහක් පමණ ඉදිරියෙන් ඔහු වේගයෙන් දිවගිය අයුරු අපි දුටුවෙමු. එක් නිමේෂයකට නැවතුණු ඔහු ආපසු හැරී අප දෙසට වෙඩි පහරක් එල්ල කළේය. ඒ අප වෙත කළ මරණ තර්ජනයකි. එහෙත් එයින් බියපත් වූයේ ස්ටැන්ලි හොප්කින්ස් නොවේ. ගිනිඅවි දැගත් අපරාධකාරයන් ලුහුබැඳයාම ඔහුට හුරුපුරුදු දෙයකි. මේ වනවිට හෝම්ස් ද අපට එකතුවිය. රියැදුරා පලාගිය පටුපාර හැතැක්ම කාලක් පමණ ඉදිරියෙන් අවසන් වූ බැව් අපි දුටුවෙමු. එහි

http://sherlockholmesinvestigations.blogspot.com

කෙළවරට සම්බන්ධ අතුරු මාර්ග නොතිබුණේ නම් ඔහු අල්ලා ගැනීම එතරම් අපහසු නොවනු ඇත.

ඉදිරියෙන්ම දිවගිය හොප්කින්ස් "නැවතියන්! නැත්නම් වෙඩි තියනවා!" යයි කෑගසනු ඇසිණ. ඒ සමගම අපේ හතුරා පාර කෙළවර වූ අලුතින් ඉදිකරමින් තිබූ තට්ටු ගොඩනැගිල්ලක් දෙසට දිවයන අයුරු අපි දුටුවෙමු. ඔහු තරප්පු පෙළ දිගේ ඉහළට දිවයන්නට ඇත. තත්පර ගණනකින් ඔහු දෙවැනි තට්ටුවේ ජනේලයකින් පාරේ සිටි හොප්කින්ස් වෙත වෙඩි පහර කීපයක් එල්ල කළේය. ක්ෂණයකින් ඉවතට පැනගැනීමට පොලිස් නිලධරයා සමත් විය. මීළඟට ඔහු ද ගොඩනැගිල්ලට ඇතුළු විය. අපි ඔහු පිටුපස එහි පිවිසියෙමු. අඩක් ඉදිකළ තරප්පුපෙළ දිගේ හතර වැනි තට්ටුව අවතා අපරාධකරු දිව යන අයුරු අපට පෙනිණ. ඔහුට ළංවී සිටි හොප්කින්ස් පොලිස් රිවෝල්වරයෙන් වෙඩි පහර කිහිපයක් රියැදුරාට එල්ල කළේය. ඔහුට එයින් එකක්වත් වැදෙන්නට ඇත. රියැදුරා මරහඬ දෙමින් තරප්පු පෙළේ ඇද වැටිණි. මීළඟට ඔහු බිමට පෙරළී ගෙන ආවේ ලේ පෙරමිනි. ඔහු අත තිබූ ගිනිඅවිය ද ඒ වනවිට ගිලිහී තිබිණ. මොහොතක්වත් පමා නොවූ පොලිස් නිලධරයා තම සාක්කුවෙන් ගත් මාංචු යුගලෙන් රියැදුරාගේ දෑත් සිරකළේය.

"හොප්කින්ස්. ඔබ හොඳ වෙලාවට ආවේ" හෝම්ස් කීවේ හතිදමමිනි. "තව ටිකෙන් මේකා මටත් වෙඩි තියල පැනගන්නවා. දන්නවාද මෙයා කවුද කියල?"

"නැහැ. ඇයි මේ ඩයිසන්ගේ රියැදුරා නෙමෙයිද?"

"රියැදුරෙක් නෙමෙයි. රියැදුරු ඇඳුමෙන් සැරසුණු ජේම්ස් ඩයිසන්!"

"දෙයියෝ සාක්කි!" මට කියැවිණි.

ඩයිසන්ගේ තුවාල එතරම් බරපතල ඒවා නොවූ බැව් දුටුවහාම මම තේරුම් ගතිමි. ඔහු අල්ලාගත් විගසම, ඔහුගේ සාක්කු පරීක්ෂා කිරීමට හෝම්ස් අමතක නොකළේය. රොබින්සන් මරා දැමීමට යොදාගත් ආකාරයේ පිහි දෙකක් ඩයිසන් ළඟ තිබී සොයා ගැනීමට මගේ මිත්‍රයා සමත් විය. ඉන් එකක් අපරාධකරුගේ සාක්කුවේ තිබූ අතර, අනෙක රබර්පටියකින් ඔහුගේ වම් කෙණ්ඩට බැඳ තිබිණි. ඔහු රෝහල වෙතත්, එතැනින් රක්ෂිත බන්ධනාගාරයේ අධිආරක්ෂිත

 http://sherlockholmesinvestigations.blogspot.com

මැදිරියක් වෙතත් ගෙන යන ලදී. ඔහුගේ දීර්ඝ කථාන්තරයට සවන් දීමට අපට අවස්ථාව සැලසුණේ එතැන්දීය. එය දැන් ඔබ වෙත ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි.

"මහත්වරුනි, ඔබ හිතනවා ඇත්තේ මං අනුකම්පා විරහිත මිනීමරුවෙක් කියල. නමුත් ඇත්ත ඒක නෙමෙයි. මට ඒ දේ කරන්න සිද්ධවුණා. මං එය කළේ මගේ ආත්මාරක්ෂාවට. මාව මරාදැමීමට තැත්කළ රොබින්සන් මරාදමනවා ඇරෙන්න, මට ඒ වෙලාවේ වෙනත් විකල්පයක් තිබුණෙ නැහැ. ඔබ අහවී ඇයි ඔහු මාව මරන්න ආවෙ කියල. ඒක බොහොම දිග කතාවක්. මං කිසිදෙයක් හංගන්නෙ නැතුව ඔබට ඒ හැමදෙයක්ම කියන්නම්. කරුණාකරල මට තුවත් වතුර වීදුරුවක් දෙන්න. ලේ ගැලූ නිසා වෙන්න ඇති. මට හරිම පිපාසයි.

මහත්වරුනි. මගේ ඇත්ත නම ජේම්ස් ඩයිසන් වත් ජෝන් රිච්ඩ්ස් වත් නෙමෙයි. මගේ ඇත්ත නම රැල්ෆ් වොන්හාට්. මං දකුණු අප්‍රිකානු ජාතිකයෙක්. අපේ මුතුන්මිත්තෝ ඕලන්දයෙන් දකුණු අප්‍රිකාවට සංක්‍රමණය වුණු අය. ඔවුන් බොහොම මහන්සියෙන් ගොවිතැන් කරලා, මහ වනාන්තරයක්ව තිබුණු අප්‍රිකාව සශ්‍රීක ගොවිබිමක් කළා. වනචාරී කළුමිනිසුන්ව ශීලාචාර කරලා උන්ට දෙවියන් වහන්සේ ගැන ඉගැන්නුවා. නමුත් පසුවෙලා අපේ රටට කඩාවැදුණු ඉංග්‍රීසි ජාතිකයෝ මොකද කළේ? උන් අපිව පන්නා දමල රට අයිතිකරගත්තා. ඒත් ඒක වෙනම කතාවක්.

අපි ජීවත්වුණේ ජොහැන්නස්බර්ග් නගරයේ. මට යන්න සිද්ධවුණේ ඉංග්‍රීසි පාසලකට. අවුරුදු දහසය දහත වෙනතුරු ඉස්කෝලෙ ගියාට ඉගෙනීම කියන දේ මගේ හිතට ඇල්ලුවේ නෑ. මං ඉස්කෝලෙන් පැන්නා. මට උවමනා වුණේ රස්සාවක් කරලා ඉක්මනට සල්ලි හම්බකරන්න.

එද ඉඳන් අවුරුදු දහතුනක් මං මුළු දකුණු අප්‍රිකාව පුරාම කරක් ගැහුවා. ඒ දුප්පත් පුද්දෙක් විදිහට. සෑහෙන පඩියක් ලැබෙන රස්සාවක් හොයාගන්න, මට කිසිම තැනකින් බැරිවුණා. මං එතකොට එක රස්සාවක් අත්ඇරල තවත් එකකට ගියා. ඒකෙන් තවත් එකකට ගියා. ඒත් පණ කෙන්ද රැකගන්න කෑම ටිකක් මිලට ගන්න පඩියක්, මට කවදාවත් ලැබුණේ නෑ. ඒ ජීවිතය හරියට අපායෙ ජීවත්වීම වගෙයි. මං කරන්න ඇති රස්සා සියගණනක්.

පලතුරු වතුවල පලතුරු කැඩුවා. ගල්අඟුරු ආකාරවල ඉල්ලම් හෑරුවා. අශ්වකරත්ත දැක්කුවා. පාර අතුගෑවා. කේප්ටවුන් වරායේ නැව්වල බඩුබෑවා. රේල්පාරවල් හදන්න සිල්පර කොටන් ඉස්සුවා. පාරවල් හදන්න ගල්කැඩුවා. මිනීවළවල් හෑරුවා. මං නොකළ දෙයක් නෑ. අවුරුදු අහතුනක් ඩර්බන් ඉඳල ඩමාරලන්ඩ්වලටත්, ඔරෙන්ජ් රිවර් ඉඳල මැටබීලිවලටත්, මං නොගිය තැනක් නෑ. රක්සාවක් නැති කාලෙට මත්පැන් ටිකක් උවමනා වුණාම, මං සුද්දන් ළඟට ගිහින් හිඟා කෑවා. කළු මිනිසුන්ගෙන් කෑම ඉල්ලා ගත්තා. සුද්දෙත් කල්ලොත් එක වගෙයි. උන් මට තඹ කාසි කීපයක් දුන්නෙ සාපකරමින්.

ඔහොම ඉන්නු අතරේ මං අන්තිමට සංක්‍රමණය වුණා ස්වාසිලන්තය පැත්තට. ඒක තිබෙන්නේ පෘතුගීසීන්ගේ පාලනය යටතේ, තිබෙන නැගෙනහිර පැත්තෙ. ඔබ අහල ඇති ලොරෙන්සෝ මාකේස් ගැන, ඩෙලාගෝවා බොක්ක ගැන. ස්වාසිලන්තය තියෙන්නෙත් ඒ කිට්ටුව. ඉතාම ලස්සන රටක්. ඒකෙ තැන්තැන්වල සුදු ජාතිකයො පදිංචිවෙලා හිටියා.

කොහොම හරි එහේ තිබෙන උම්බාබෙන් නගරයේ තැබෑරුමකදී තමයි මට ඉයන් රොබින්සන් මුණ ගැහුණේ. කාගෙන් හරි මත්පැන් වීදුරුවක් හිගාකන්න මං බලාගෙන හිටියේ. ඔහු මට බොන්න මත්පැන් අරන් දුන්නා. මං ඔහුට කිව්වා මං රක්සාවක් නැතිව තැන තැන ඇවිදින මිනිහෙක් බව. ඔහු කැමැති වුණා මට රක්සාවක් දෙන්න. ඔහු එක්ක කතාබහ කරද්දීම මට තේරුණා, මිනිහා ලෝකෙ කාල වතුරබීපු කට්ට යුරෝපීය එකෙක් බව. ඒ වගේ මිනිසුන් හම්බවෙන්නෙ බොහොම කලාතුරකින්. උන්ගෙන් බොහොම පරෙස්සම් වෙන්න ඕනෑ. ඒත් මට වෙන විකල්පයක් තිබුණේ නෑ. මට ඕනවුණේ ජීවත් වෙන්න රක්සාවක්. ඒ හින්ද රොබින්සන්ගේ යෝජනාවට මං එකඟ වුණා. ඔහු මට වඩා උසයි මහතයි. වයසින් අවුරුදු හැටක් විතර. උකුසු හොටක් වගේ නාසයක් එක්ක මුහුණ රතුපාටයි කළුකුමෙකුගේ වගේ. ඔහුගේ කළුපාට ඇස්දෙකේ හැම තිස්සේම තිබුණේ මහා කුරිරු බැල්මක්.

ඉයන් මට කිව්වේ ඔහුගේ කඩේ බලාගන්න එන්න කියල. ඔහුට අයිති කඩේ වෙළඳාම භාරව හිටි කළමනාකාරයා හදිසියේම මැරුණලු. කැමැති නම් මට ඇවිත් කඩේ වෙළඳාම භාරගන්න

 http://sherlockholmesinvestigations.blogspot.com

කිව්වා. ඉයන් රොබින්සන් ඒක කියද්දී ඔහුගේ ඇස්දෙකේ තිබුණා බැල්මක්. මට ඒකෙන්ම හිතාගන්න පුළුවන් වුණා සේවකයා හදිසියේ මැරුණෙ කොහොමද කියලා. ඒ වුණත් මට වැඩිදුර හිතන්න දෙයක් තිබුණෙ නෑ. ක්‍රාල් එකක් ගාගෙන ඇවිද ගිහින්, උන් අහක දන කෑම හිගාකනවට වැඩිය. ඉයන් දුන්නු රැකියාව භාරගැනීම හොඳයි කියලයි මට හිතුණෙ.

ඉයන් මාව කැඳවාගෙන ගියා ඔහු පදිංචි ගමට. හැතැක්ම තිහක් හතළිහක් අශ්ව කෝච්චියෙන් ගිහින්, ඊළඟට තවත් හැතැක්ම අටක් දහයක් කඳු නැග්ගා පයින්ම. අන්තිමට අපි එතැනට ළඟාවුණා. ඒ එයා මහ ඉහළින් වර්ණනා කළ එයාගෙ වෙළඳසලට. සාඩින් ටින් දෙකකුයි, මැරිච්ච මීයො තුන්හතර දෙනෙකුයි ඇරෙන්න ඒකෙ වෙන ඉටිගෙඩියක් තිබුණෙ නෑ. මට එකපාරටම තේරුණා මේ මිනිහා අවංකව වෙළඳාමක් කරන මිනිහෙක් නොවෙන වග. මං ඒක තේරුම්ගත්ත බව ඔහුටත් වැටහෙන්න ඇති. මගේ හිතේ සැකයක් ඇතිවුණු බව ඔහුට පෙන්වන්න මං උත්සාහ කළේ නෑ. ඒ මොකද මං දැනහිටියා කලින් එතන වැඩ කළ මිනිහා හදිසියේ මියගිය බව.

ටිකකාලයක් ගතවුණා. ඉයන්ටත් තේරුණා, මං ඔහුගේ නියෝගවලට කීකරුවෙලා ඔහුට පක්ෂපාතව වැඩකරන බව. ඔහුගේ ඇත්ත ව්‍යාපාරය මොකක්ද කියන එක මට තේරුණා. ඒක මට හංගන්න මිනිහ උත්සාහ කළේ නැහැ. ඔහු ව්‍යාපාර දෙකක් එක සැරේ කළා. මං ඔබට කිව්වා මේ ගම්මානය තිබුණේ පෘතුගාලය යටතේ පැවතුණු රටේ මායිමේ බව. ඒ රටේ කළු ස්වදේශිකයන් පෘතුගීසීන්ට විරුද්ධව කැරලි ගහමින්නුයි හිටියේ. උන් නිදහස ඉල්ලා සටන්කළා. මේ කළු කැරලිකරුවන්ට ආයුධ සැපයුමේ ස්වාමිලාත්තය පැත්තෙන් ඉයන් රොබින්සන් කළේ ආයුධ වෙළඳාම. කැරලිකාරයන්ට උවමනා පිස්තෝල, තුවක්කු වෙඩි උණ්ඩ කඩු කිණිසි හැමදෙයක්ම ඔහු විකුණුවා. ඔහුගේ අනෙක් ව්‍යාපාරය වුණේ නීතිවිරෝධී මත්පැන් වෙළඳාම. ඔහු මේ හොර මත්පැන් අලෙවිකළේ කළුමිනිසුන්ට. ඒ මොකද එතැනට හැතැක්ම ගණනාවක් යනතුරු වෙනත් සුදුමිනිස්සු පදිංචිවෙලා හිටියේ නැහැ.

ඔහුගේ ගනුදෙනු පිළිබඳව පොත්වල ගණන් තබාගැනීම මට පැවරුවා. ගම්මිරිස් කියල ගිණුම් පොතේ ලියාගත්තෙ තුවක්කුවලට

http://sherlockholmesinvestigations.blogspot.com

දමන පතරොම්. දුඹුරු- ශීනි කියල ලියාගත්තෙ වෙව්බෙහෙත්; රටකජු කියල ලිව්වෙ පිස්තෝල උණ්ඩ. ඉයන්ට කීකරුව වැඩකළ නිසා මට අවාසියක් වුණේ නැහැ. ඔහු මට හොඳ වැටුපක් දුන්නා. අවි ගනුදෙනුවට හා හොර මත්පැන් වෙළඳාමට අමතරව ඔහු මුදල් පොලියට දීමත් කළා.

ඉයන් එක්ක ගනුදෙනු කළ කළු ජාතිකයන් හුගක් හිටියා. උන් අතරින් කැපී පෙනුණු මිනිහෙක් වුණේ කොංගා. අඩි හයහමාරකටත් වඩා උස ඔහු කර්ම කළු යෝධයෙක් වගේ දුවැන්ත පුරුෂයෙක්: කටඇරියාම මුහුණේ තිබුණේ යක්ෂයෙකුගේ වගේ භයංකාර පෙනුමක්. ඔහුගේ කළුපාට මහත තොල් එළියට දික්වෙන කොට දිවත් ඇස්දෙකත් එළියට නෙරා ආවා. ඔහු ගෝත්‍රික නායකයෙක්. කොංගා මත්තර ගුරුකම් වැඩකළ කට්ටඩියෙක්. ඊට අමතරව පෘතුගීසින්ට එරෙහිව සටන්වැදුණු කැරලිකාරයන්ට ආයුධ වෙළඳාමේ අතරමැදියෙක් හැටියටත් ක්‍රියාකළා. කොංගා එනවා සතියකට දින තුනක්වත් ඉයන් හමුවෙන්න. මුල්කාලයේ කොංගා එක්ක මිත්‍රවුණු අලුත, ඔහුට ඉයන් සංග්‍රහ කරල තිබුණේ මත්පැන්වලින්. එහෙම බීල බීල කොංගා මත්පැන්වලට ඇබ්බැහිවෙලයි තිබුණේ. මේක ඉයන්ගේ වෙළඳ උපක්‍රමයක් කියලයි මට හිතුණේ. ඒ මොකද පනුම්වෙනකොට ඉයන් ඔහුගේ අමුත්තන්ට මත්පැන් නොමිලේ දුන්නෙ නැහැ. ඔහු කොංගාටත් මත්පැන් විකිණුවා. අතේ සල්ලි නැතිවෙලාවට කොංගා බිව්වේ ණයට. හවස ඉර බහින වෙලාවට ඉයන්ගේ වෙළඳ සලේ කොටසකට වෙලා මත්පැන් බොන කොංගා, මැදියම් රැයට පැයක් දෙකක් තිබෙද්දී වෙරීවෙලා සිහිනැතිව වැටෙනවා. ඉතින් ඔහුගේ සේවකයන් තමා කොංගාව ආපහු ගෙදර අරගෙන යන්නේ.

කරදර ඔක්කොම පටන් ගත්තේ; මං ඉයන්ගේ රැකියාව බාර අරගෙන මාස නවයකට විතර පස්සේ. ඉයන්ගෙන් ගත්ත ආයුධ හා මත්පැන්වලට මේ මිනිස්සු ගෙව්වේ පෘතුගීසි රන්කාසිවලින්. නමුත් උන්ට හැමවිටම කාසි තිබුණේ නැහැ. මේවා නොතිබුණු වෙලාවට උන් ගෙවන්නේ ඇත්දළවලින්; එහෙමත් නැත්නම් සතුන්ගේ හම්වලින්. ඊටත් වඩා ලොකු මුදලක් ලැබුණා දියමන්තිවලට. ස්වාසිලන්තයේ මිනිස්සු ප්‍රිටෝරියාවේ හා බ්ලොම් ෆොන්ටේන්වල දියමන්ති පතල්වල වැඩට ගියා. ඒ පතල්වලින් උන් හොරකම් කළ දියමන්ති ස්වාසිලන්තයේ අලෙවි කෙරුණා.

http://sherlockholmesinvestigations.blogspot.com

කොහොම වුණත් කල්යද්දී කොංගා ළඟ ඉයන්ට ගෙවන්න තරම් මුදල් තිබුණේ නැහැ. මත්පැන් බොන්න ආව කොංගා ආපහු ගියේ ඒවා නොලැබී. ඒ මොකද ඔහුට මත්පැන් ණයට ලැබුණේ නැහැ. ඔහු ඉයන්ගෙන් විශාල මුදලක් ණයට අරගෙන තිබුණා. නමුත් ඒ කිසිම ගනුදෙනුවක් ඉවර නොකර, පොත්වල විශාල මුදලක් හා පොලියක් එකතු වී තිබුණා. එදා මත්පැන් නොලැබුණු එකට ඔහුට හුඟක් කේන්ති ගියා, ඔහුගේ ලොකු යෂ්ටිය හෙවත් සැරයටිය ලෙලවා තර්ජනය කළා. අඩි හතරහමාරක් පමණ දිග එය සාමාන්‍ය සැරයටියකට වඩා වට ප්‍රමාණයෙන් වැඩි පොල්ලක් වගේ එකක්.

ඒත් ඉයන් රොබින්සන් ඒවට භයවුණේ නෑ. ස්වාසි ජාතික කළුමිනිසුන් ඔහුට තර්ජනය කරන්න පටන් අරන් තිබුණේ බොහොම කාලෙක ඉඳල. ඔහු ඒවට සැළුණේ නෑ.

එක දවසක් හවස කොංගා ආවෙ වෙනද වගේ ඔහුගේ සහචරයනුත් පිරිවරාගෙන. උන් එළියෙ ඉද්දී ඔහු ඉයන් රොබින්සන්ගේ කාර්යාල කාමරයට ඇතුළුවුණා.

"රොබිං මහත්තයා" කොංගා කිව්වා. "මෙන්න මං උඹට තියෙන ණයටයි පොලියටයි හිලව් වෙන්න බඩුවක් ගෙනාවා. මේක අරගෙන උඹේ ණය කපා දමපං. එච්චර විතරක් නෙමෙයි. මට ඕන කරනවා මත්පැන් බෝතල දහයක් පිස්තෝල හත අටක්. ඒවට උණ්ඩ"

කොංගා ඔහු ගෙනාව දේ ඉයන් වෙත දිගු කළා. ඒක ඉතාම වටිනා ඒ වගේම අලංකාර දියමන්තියක්. ඔලිව් ගෙඩියක් තරම් ලොකු කපා ඔපදමා තිබුණු දියමන්තියක් අලංකාරව බබළමින් තිබුණේ. ඒකෙ වටිනාකම නම් ඉතාම ඉහළ බව බැලූ බැල්මටම පෙනුණා. මෙය කොහෙන් හෝ හොරකම් කළ එකක් බව අමුතුවෙන් කියන්න උවමනා වුණේ නැහැ.

"උඹට කොයින්ද මේක ලැබුණේ?" ඉයන් ඇහුවා.

"ඒක උඹට වැඩක් නෑනෙ ලොක්කා" කොංගා කිව්වා. "උඹට වෙලා තියෙන ණය ඔක්කොම ගෙවලා තවත් බඩු රාශියක් ගන්න තරම් මේක වටිනවා. එහෙම නෙවෙයි කියන්න එපා"

දියමන්තිය අතේ තියාගෙන ඉයන් ඒක දිහා බලාගෙන හිටියේ ලොකු ආශාවකින්. එය වටිනා එකක් බව ඔහු තේරුම් ගත්තා.

http://sherlockholmesinvestigations.blogspot.com

නමුත් ඔහුගේ තණ්හාව නිසා ඔහු උත්සාහ කළේ මේක ඉතා අඩු මුදලකට ගන්න.

"මේක බොහොම වටිනා එකක් කියල උඹට කිව්වෙ කවුද?" ඔහු කොංගාගෙන් ඇහුවේ කටපැත්තකට ඇද කරමින්. "බලපං. මේකෙ එක පැත්තක පුංචි පළුද්දක් තියෙනවා. කමක් නෑ. මං මේක අරගන්නම්. උඹට උදව්වක් හැටියට මං ණයත් පොලියත් ඔක්කොම කපා හරින්නම්. මත්පැන් බෝතල් දහයකුත් දෙන්නම්. ඒත් පිස්තෝල හා උණ්ඩ දෙන්න බැහැ. ඒව ඕනෙ නම් තවත් මේ වගේ එකක් අරං වරෙං"

ඒ කතාවට කොංගාට හොඳටම තරහ ගියා. "ආයෙත් කල්පනා කරල බලපං රොබින් මහත්තයා" ඔහු කිව්වා. "මං මේ උඹට දෙන අන්තිම අවස්ථාව. මං කිව්ව දේ අහල ආයුධ ටිකත් මට දීපං. මේ දියමන්තිය ඊට වඩා හුගාක් වටිනවා"

ඒ කතාව අහල ආයුධ ටිකත් දුන්නා නම් කොංගා ඔහුගේ පිරිස සමග පිටවෙලා යනවා. ප්‍රශ්නය එතැනින් ඉවරවෙනවා. නමුත් ඉයන් ඒක කළේ නැහැ. මේ වෙලාවේ නීග්‍රෝ වනචාරීන් අතට ආයුධ දෙන්න බාගවෙලාවට ඉයන්ට භය හිතෙන්න ඇති. ඔහු අවඥවෙන් හිනාවෙලා කොංගාට බැණවැදුණා.

"කළු බල්ලා! බැහැපං එළියට!"

එහෙම කිව් වහාම කොංගා, ඉයන්ගේ කාර්යාලයෙන් එළියට ඇවිත්, ඉස්සරහ ඉස්තෝප්පුවේ බිම දිගාවුණා. ඔහුගේ ගෝල බාලයින් ටික ඔහු වටා රැස්වෙලා ඔහු අතට කළු කුකුළෙක් දුන්නා. ඔහු මොනවාදෝ මන්තර වගයක් උස් හඬින් ජප කරලා කුකුළාගේ බෙල්ල කඩා ලේ බිව්වා. ඊට පස්සේ වැතිර හිටි තැනින් නැගිටලා මන්තර කියා කෑගසමින් කොංගා නටන්න පටන්ගත්තේ, කොළ අතුදෙකක් වනමින්. නැටුම එක්වරම නැවතුණා. ඔහුගේ ඇඟම ඊළඟට වෙවුලන්න පටන්ගත්තේ සන්නියක් හැදුණා වගේ. ඊළඟට ඔහුගේ කටින් මහා විලාපයක් පිටවුණා. ඊටපසු ඔහු කටින් පෙණ දමාගෙන බිම ඇදවැටුණේ සිහිනැතිවෙලා. ඔහුගේ සහචරයන් කොංගාව කරතියාගෙන යන්න ගියා. ගනුදෙනුව ගැන එකඟතාවයකට ආවෙ නැති නිසා ඉයන්ට දියමන්තිය ලැබුණේ නැහැ. කොංගා ඒක අරගෙන ගියා.

 http://sherlockholmesinvestigations.blogspot.com

නීග්‍රෝ වනචාරීන්ගේ මන්තර ගුරුකම් ගැන අහලා තිබුණට සුදු මිනිස්සු ඒවා විශ්වාස කළේ නැහැ. ඒවාට හයවුණෙත් නැහැ. ඒ නිසා හැන්දෑවේ වුණු සිදුවීම අපි අමතක කර දැම්මා.

අප්‍රිකාවේ කැලෑවෙන් වටවුණු ගම්මානවල මිනිස්සු ඇඳිරි වැටෙන කොට රෑ කෑම කනවා. ඊළඟට වැඩිය රෑවෙන්න කලින් නින්දට යනවා. එද ඉයන්, ඔහුගේ බිරිඳ මාර්තා සහ මම රෑ කෑමට වාඩිවුණේ වෙනද වෙලාවටමයි. රෑ කෑමෙන් පස්සේ ඉයන් එයාගේ කන්තෝරු කාමරේට ගියා. එදිනෙදා ගනුදෙනු ගැන පොත්වල කළ සටහන්. රෑට නිදගන්න කලින් ගණන් හද බැලීම ඔහුගේ සිරිතක්. මාර්තා කෑම මේසය අස්කරද්දී, මං මගේ කාමරයට ගියා නිදගන්න.

රෑ දෙකට විතර කවුදෝ නොකඩවාම මගේ කාමරයේ දොරට ගැහුවා. දොර ඇරලා බලනකොට ඉයන්ගේ බිරිඳ මාර්තා.

"බොන්හාට්" ඇය කිව්වා. "කෑම කාලා ඇඳේ හාන්සිවුණා විතරයි. මට නින්ද ගියා. දැන් ඇහැරිලා බලන කොට ඉයන් නිදගන්න ඇවිත් නැහැ කාමරේට. ඔහු මෙච්චර වෙලා මොනවා කරනවද? අනේ කරුණාකර ගිහිං බලන්න...................... මගේ හිතට බයයි..................

මං වහාම ඇඳෙන් නැගිටලා ගියේ ඉයන්ගේ කන්තෝරු කාමරයට. මාර්තා ආවා මගේ පිටුපසින්. ඔහුගේ කන්තෝරු කාමරයේ දොර වසා තිබුණා. තට්ටු කළත් ඔහු දොර ඇරියේ නැහැ. ඉතින් මං දොර තල්ලු කරගෙන ඇතුළට ගියා.

කාමරය ඇතුළේ ඉටිපන්දමක් දැල්වුණා. ඉයන් හිටියා ඔහුගේ මේසය ළඟ පුටුවක වාඩිවෙලා: ඇස්දෙක විශාල කරගෙන. අත්දෙකෙන් පුටුව තදින් අල්ලාගෙන ඉස්සරහ බලාගෙන හිටියා. ඔහුගේ මුහුණේ තිබුණේ මහා භයානක පෙනුමක්. මුහුණ කළුවෙලා තිබුණා. එයින් මං තේරුම් ගත්තා, ඉයන් වාඩිවෙලා හිටි පුටුවෙම මියගිහින් බව. පැය ගණනකට පෙර මියගිහින්!

ඒක තේරුම් ගත්තු හැටියෙම මාර්තා විලාප නැගුවේ ගේ දෙවනත් වෙන්න. මං බොහොම අමාරුවෙන් ඇයව කාමරයෙන් එළියට යැව්වා. ඊළඟට මං කාමරය සෝදිසි කරලා බැලුවෙ ඉයන් මේ තරම් බියකරු ලෙස මියගියේ කොහොමද කියල. දත් හැලිච්ච නාකි කාපිරියෙකුට පුළුවන්ද, ඔහුගේ මන්තර ගුරුකම්වලින් ඉයන්ව මරන්න? මං ඒක විශ්වාස කළේ නැහැ.

http://sherlockholmesinvestigations.blogspot.com

මං කාමරය හොඳට සෝදිසි කරල බැලුවා. ඒත් කාමරයේ ජනේලයක් කඩාගෙන හෝ දොරක් ඇරගෙන සතුරෙක් ආව බවට කිසිම සලකුණක් තිබුණේ නැහැ. ඉයන්ගේ සිරුරේ මට පෙනෙන්න තුවාලයක් තිබුණෙත් නැහැ. නමුත් කොහොමද ඔහු මියගියේ? ඔහු දකලා තියෙනවා මොකක් හරි භයානක දර්ශනයක්. ඒකෙන් තමයි මියයන්න ඇත්තෙ.

අපි පසුවද ඉයන් රොබින්සන්ව භූමදාන කළා. මරණයේ කටයුතු ඉවරවුණු දට පසුවෙනිද කොංගා රොබින්සන් නිවහනට ගොඩ වැදුණා. ඔහුගේ මුහුණේ කණගාටුවක ලකුණක් වත් සන්තෝෂයක ලකුණක්වත් තිබුණේ නැහැ.

"මට පුළුවන්ද මගේ සැරයටිය ගෙනියන්න?" ඔහු ඇහුවා. "කලින් දවසේ රෑ රොබින්ස් මහත්තයාගේ කාමරේ මං ඒක අමතක වෙලා දාල ගියා"

ඔහුගේ සැරයටිය කන්තෝරු කාමරයේ අමතක වෙලා බිම දමල ගිහින් තිබුණු හැටි මං දුටුවා. නමුත් ඒක ඔහුට ගෙනැත් දෙන්න මට උවමනාවක් තිබුණේ නැහැ.

"තමුසෙට ඒක අමතක වුණා නම් ගිහින් අරගන්නවා" මං කිව්වා. ඔහු ඒකත් අරගෙන යන්න ගියා.

දවස් දහයක් දොළහක් යද්දී මාර්තා ඇගේ හඬා වැලපීම නවත්වලා ඉයන්ගේ ව්‍යාපාර කටයුතු යළි පටන්ගත්තා. ඔහු ඇයට හැමදෙයක්ම හොඳින් කියල දීල තිබුණු බවයි මට පෙනුණෙ. මට පොරොන්දු වුණු පඩිය ඒ විධියටම ගෙවන්න ඇය කැමැති වුණා. ඒ අනුව ඇගේ කළමනාකරු හැටියට දිගටම වැඩකරන්න තීරණය වුණා.

"රොබින්සන් නෝනා" මං කීවා. "ඉතිං කොංගා මහ භයානක මිනිහෙක්. ඒ මිනිහා ගෙනා දියමන්තිය අරගෙන අපි ඔහුගේ ණයයි පොලියයි අමතක කරමු. ඔහු ඉල්ලන ආයුධත් මත්පැනුත් දීල ඔක්කොම ඉවරයක් කරල දමු. ඒක වඩාත් පරෙස්සම්"

"තමුසෙ කවුද මට ඔහොම උපදෙස් දෙන්න?" ඇය මට කඩා පැන්නා. "මට ඕන කරන්නෙ සල්ලි. මට පාඩු විඳින්න බැහැ. මට සල්ලිවලින් කරන්න හුඟක් වැඩ තියෙනවා. තමුසෙ දන්නවද අපි මේ හැටි සල්ලි හොයන්නෙ මොකටද කියලා......... ඒත් ඒකෙන් තමුසෙට ඇති වැඩක් නෑ. වහාම පණිවුඩයක් යවනවා කොංගාට.

 http://sherlockholmesinvestigations.blogspot.com

කියනවා දියමන්තියයි සල්ලියි අරගෙන ඇවිත් අපට ගෙවන්න තියෙන ණය බේරලා, උවමනා කරන බඩු අරගෙන යන්න කියල"

ඇයට කාරණා තේරුම් කරල දෙන්න මං උත්සාහ කළා. නමුත් වැඩක් වුණේ නැහැ. ඇයගෙ පිළිවෙළේ ඉයන්ට වඩා වැඩි වෙනසක් තිබුණේ නැහැ. ඉතින් මං පහුවදම කොංගා වෙත පණිවුඩයක් යැව්වා. ඔහු ආවා කන්තෝරු කාමරයට මාව හමුවෙන්න. මං වාඩිවෙලා හිටියේ එද ඉයන් මියගිය පුටුවේමයි.

"ඔහේට එන්න කිව්වේ රොබින්සන් නෝනා" මං කිව්වා. "ඇයට ගෙවන්න තියෙන ණයයි අපාලියයි ඔක්කොම ගෙවනවා. නැත්නම් හමුසෙ වැටෙන්නෙ ලොකු අමාරුවක"

"නාකි කොංගා එක්ක ගනුදෙනු කරන හැටි ඔහේට අමතක වුණාද ඉලන්දරියා?" ඔහු ඇහුවේ අවඥාවෙන් හිනාවෙමින්. "නාකි සුද්ද දනගෙන හිටියේ නෑ කොංගාගේ හපන්කම් ගැන." මෙහෙම කියූ ඔහුගේ රතුපාට දෑස්වලින් පිටවුණේ වෛරය බව මම දුටුවා.

"උඹේ කතාවලින් වැඩක් නෑ කොංගා" මං කිව්වා. "නාකි සුද්දී මට කිව්වෙ, උඹ සල්ලි නොගෙව්වොත් උඹට වෙඩි තියල මරල දන්න. උඹ දන්නවා නේද අපි ළඟ තියෙනවා බොහොම භයානක, ඉක්මනින් වෙඩි තියන්න පුළුවන් රයිෆල්. වහාම ගෙනෙං අර දියමන්තිය. තව සල්ලිත් අරගෙන වරෙං"

මගේ කතාවට ඔහු මහ හයියෙන් හිනාවුණා. මං කීව ඒව ඔහු ගණන් ගත්තේ නෑ. අර අලංකාර දියමන්තිය අරගෙන ඇඟිලි දෙකෙන් ඉහළට ඔසවලා මට පෙන්නුවා. ඒත් ඒක අපට නොදෙන බව පෙන්වමින්, රෙදි කෑල්ලක දවටලා ඉණේ ගැටගසා ගත්තා. ඊළඟට කාමරයෙන් එළියට ගිහින් බිම දිගාවුණා. ඔහුගේ ගෝල බාලයින් එතැනට ඇවිත් කලින් දවසේ වගේ මන්තර ගුරුකම් පටන් ගත්තා.

එද රෑ නිදගන්න මං මගේ කාමරයට ගියේ නැහැ. ඒ මොකද ඒ කාමරයේ ජනේල ඒ තරම් ශක්තිමත් නැහැ. කොංගාගේ මිනිස්සු ජනෙල් වීදුරුව බිඳලා මට විෂපෙවූ ඊතලයකින් විදීවි නැත්නම් හෙල්ලකින් දමල ගහවි කියන භය මගේ හිතේ ඇතිවුණා. නමුත් ඉයන්ගෙ කන්තෝරු කාමරය ඊට වඩා ආරක්ෂා සහිතයි. මං හිතුවා ඒකට වෙලා එළිවෙනතුරු ඇහැ ඇරගෙන ඉන්න. කොංගා ඉවත්ව ගියත්, මං නිදානොගෙන සෝදිසියෙන් ඉන්න තීරණය අරගෙනයි හිටියෙ.

http://sherlockholmesinvestigations.blogspot.com

වරින්වර මට නින්ද යාගෙන ආවා. ඒත් තිගැස්සිලා මං ඇහැරුණා. රිවෝල්වරය අතේ තියාගෙන මං කළුවරේම බලාහිටියා. මේ එංගලන්තයේ වගේ නෙමෙයි. අප්‍රිකානු වනාන්තරයේ රෑටත් නොයෙක් ශබ්ද ඇහෙනවා. ඈතින් වන සතුන් කෑගහන හඬ. ළඟින් තේරුම් කරන්න බැරි නොයෙකුත් ශබ්ද. රෑ දෙළහ විතර වෙද්දී හඳ පායලා මං හිටි කාමරය තුළට එළියක් යන්තමින් වැටුණා. ඒ එළියෙන් මං තවත් සැරයක් කාමරයේ හැමතැනක්ම බැලුවා. විශේෂ යමක් නෑ. ඉතින් මට හිතුණේ ටික වේලාවකට සෝපාවේ වැතිරෙන්න. එහෙම හිතුවා විතරයි; අමුතු ශබ්දයක් කාමරය ඇතුළෙන්ම ඇහුණා.

මං වහාම නැගිට්ටා. ඒ ශබ්දය ඇහුණේ දොර ළඟින්. මම ඉටිපන්දම පත්තු කරලා බැලුවා. දෙවියනේ! බිම පෙරළී තිබුණේ මොකක්ද? කොංගාගේ සැරයටිය. ඒක කෑලිදෙකකට වෙන්වෙලා. ඒකෙ එක කෑල්ලක මං දුටුවා සියුම් සෙලවීමක්. තවත් තත්පර දෙකක් යද්දී සෙලවීමට හේතුව මොකක්ද කියල මට පෙනුණා. බාග දෙකට වෙන්වුණු සැරයටියේ ඇතුළේ තිබුණේ කුහරයක්. ඒ කුහරය ඇතුළෙන් එළියට ආවේ සර්පයෙක්. අඩි දෙකක් පමණ දිග සර්පයා දඟලමින් එළියට ඇදෙන හැටි මං හඳඑළියෙන් දුටුවා. සම්පූර්ණයෙන්ම එළියට ඇදුණු ඌ මිළඟට ඉළියක් වගේ එකට රවුම්වෙලා හිස පමණක් ඉහළට එසෙව්වා.

ඒ මොන සර්පයාද කියන එක මං දුටුවේ එතකොටයි. ඒ තමයි අප්‍රිකාවේ ඉන්න ඉතාම භයානක විෂඝෝර සර්පයා - කළු මාම්බා. ඌට පුළුවන් විදුලි වේගයෙන් පනින්න. වේගයෙන් ගමන්කරන අශ්වයෙකු පිටට පැනලා, අශ්වාරෝහකයාට දෂ්ට කරන්න වුණත් මාම්බාට පුළුවනි. ඌ දෂ්ට කළොත් මිනිත්තු හතරක් ඇතුළත මරණය නියතයි. ඌගේ විෂ ඒ තරම් ප්‍රබලයි. මගේ මුළු ඇඟෙන්ම ඩහදිය වැගිරෙන්න පටන්ගත්තා. ඉයන් රොබින්සන් පුටුවේම මැරී ගල්ගැසී හිටි සැටිත්, ඔහුගේ මුහුණ දම්පාටට හැරී තිබුණු සැටිත් මට මතක්වුණා. දැන් කළ යුත්තේ වහාම මෙතැනින් පැනගැනීමයි. නමුත් මට දොර පැත්තටවත් යන්න පිළිවෙළක් නෑ. මාම්බා ක්‍රියාත්මක වෙන්නේ මිනිස් සිරුරෙන් නිකුත්වෙන ගඳටයි උණුසුමටයි.

මං හෙමින්ම ජනේලය ඇරියා. ජනේලයේ පොලු මොකුත් තිබුණේ නැහැ. නමුත් ජනේලය තිබුණේ පොළොවට අඩි හතරක්

 http://sherlockholmesinvestigations.blogspot.com

පමණ උඩින්. මං ඒකට නැගිද්දී ඇතිවෙන චලනය ඇති, මාම්බාට මගේ ඇඟට පනින්න. ඌ දෙර දෙසට ඇදේවිද කියලා මං ටික වේලාවක් බලාගෙන හිටියා. ඌ උගේ හිස ඒ මේ අතට දිගු කරන හැටි මං හඳ එළියේ දුටුවා. මේ මගේ මොහොත.

මං එකපාරටම පුටුවෙන් නැගිටලා ජනේලය වෙතට පැන්නා. මගේ ජීවිතය බේරුණේ ඒ වෙලාවේ මට වුණු අත්වැරැද්දකින්. මම ජනේලය වෙත පනිද්දී මගේ කකුල වැදුණේ බිම තිබුණු කුණු කූඩයේ. ඒක වේවැල්වලින් වියූ කුණුකූඩයක්. මගේ කකුල වැදුණු පාරට ඒක විසිවුණේ සර්පයා දෙසට. චලනය වුණු යමක් දුටු වහාම මාම්බා ඒකට දෂ්ට කළා. මං විදුලි වේගයෙන් ජනේලයෙන් පැනලා දුවගෙන ගිහින් නැවතුණේ මගේ කාමරයේ.

පහුවදා උදේ, අපේ වෙළඳසලට උවමනා බඩු වගයක් ගේන්න මං එම්බාබෙන් නාගරයට ගියා. මං ආපහු ආවේ දින හතරකට හෝ පහකට පස්සේ. එතකොට මට දැනගන්න ලැබුණා මාර්තා රොබින්සන් මියගිය බව.

මං නගරයට පිටත්වෙලා ආව දවසේ උදේ කොංගා ඇවිත් තිබුණා, ඔහු අමතක වෙලා දාලා ගිය සැරයටිය ගෙනියන්න. ඊළඟට එද හැන්දෑවේම කොංගා යළිත් ආවලු මාර්තා හමුවෙන්න. ඔහුගේ අතේ තිබුණලු අර දියමන්තිය. ඒක අරගෙන ණය කපා හැරලා මත්පැන් හා ආයුධ දෙන්න කියලා කොංගා ඉල්ලා තියෙනවා. ඇය ඒක ප්‍රතික්ෂේප කරලා ඔහුට බැණවැදුණලු. එද රෑ ඔහු යන්න ගිය බවත්, පහුවදා උදේ බලන කොට, ඉයන් මියගිය ආකාරයටම මාර්තා හාන්සි පුටුවේම මියගිහින් හිටි බව ගෙදර සේවිකාව කිව්වා. මං ඇහුවා කොංගා ඊට පස්සෙත් ආවද කියලා. ඔහු ඇවිත් තිබුණා එදත් ඔහුට අමතක වෙලා ගිය සැරයටිය ගෙනියන්න."

දීර්ඝ කථාවක් කීමෙන් පසු සිරකරුවා වෙහෙස වී සිටි බැව් අපි දුටුවෙමු. ඔහු යළිත් වරක් බීමට වතුර ඉල්ලා සිටියේය. වතුර වීදුරු කිහිපයක් පානය කළ ඔහු කථාව යළිත් ඇරඹුවේය.

"ඉතින් මහත්වරුනි මං දැනගත්තා, මට එතැනින් පිටවී එන්න කාලය පැමිණ ඇති බව." සිරකරු කීය. "ඉයන් රොබින්සන් ඉපයූ විශාල මුදලක් ඔහු කොහේ හෝ සඟවා ඇති බව මං දැනහිටියා. ඔහුගේ ධනයට වෙනත් හිමිකාරයෙක් නොහිටි නිසා, මං ඒක

http://sherlockholmesinvestigations.blogspot.com

ගැනීමේ වරදක් වංචාවක් තිබුණේ නැහැ. මං ගෙදර එක් කොණක ඉඳලා අනෙක් කොණටම පොළොව හාරමින් මුදල් හෙව්වා. ඒකට මට සති තුනක් ගතවුණා. නමුත් අන්තිමට මට ඒක ලැබුණා.

ඒක ඔබට හිතාගන්නත් බැරි තරම් අතිවිශාල මුදලක්. ඉයන් රොබින්සන් අන්තිම අසාධාරණ විදියට සල්ලි හම්බකළා. ඒත් ඔහුවත් මාර්තාවත් එයින් එක ක්‍රූගර් රැන්ඩ් එකක් ඒ ලෝකෙට අරගෙන ගියේ නැහැ. මං ඒ මුදලත් අරගෙන එංගලන්තයේ පදිංචියට ආවා. මා ලන්ඩනයේ නිවසක් මිලට ගත්තා. ජෝන් රිච්ඩ්සන් කියලා නමකුත් අරගෙන, කාටවත් කරදරයක් නොකර පාඩුවේ ජීවත්වුණා. මගේ විනෝදාංශය වුණේ පුරාවස්තු එකතු කිරීම. ඊජිප්තු ඉතිහාසය පුවත්පත්වලින් හා පොත්වලින් කියවා ලබාගත් දැනුමක් මට තියෙනවා. මං රොබින්සන්ල ළඟ ඉන්න කාලෙත්, කේප්ටවුන්වලදී නාවිකයන්ගෙන් අඩු මුදලට ගත් ඊජිප්තු හා මෙසපොතේමියානු පුරාවස්තු තුනහතරක් මා ළඟ තිබුණා. සමහර දවස්වලට මා පුරාණ ඊජිප්තුවේ විස්තර කියද්දී ඉයන් හා මාර්තා ඒව අහගෙන හිටියේ හරි පුදුමයෙන්.

ඊජිප්තුවේ සංචාරය සඳහා යන යුරෝපා හා ඇමරිකානු ජාතිකයෝ, ඔවුන් එහිදී මිලට ගත්තු පුරාවස්තු ගෙනැත් පැරිසියේ හා ලන්ඩනයේ විකුණනවා. ඔවුන් පුවත්පත්වල දැන්වීම් පළකරලා විකුණද්දී මෙහෙම අයගෙන් ඒවා මිලදී ගැනීම මං බොහොම කාලයක සිට කරනවා. පහුගිය දිනවල මැතිව් ජෙප් නම් මහත්මයෙක් පුවත්පත් තුනකම මෙවැනි පුරාවස්තු අලෙවිය ගැන දැන්වීම් පළකර තිබුණා.

කලින් වෙලාවක් වෙන්කරගෙන මම ඔහු හමුවෙන්න ගියා. ඔහු බොහොම සාදරයෙන් මාව පිළිගත්තා.

"ජෝන් රිච්ඩ්සන් මහත්මයා මට සමාවෙන්න" ඔහු කිව්වා. "මා ළඟ තිබුණු හොඳම පුරාවස්තු විකිණීම අවසන් වුණා. දැන් මා ළඟ තියෙන්නේ මෙන්න මේ ටික විතරයි"

ඔහු ළඟ තිබුණේ එතරම් වටිනාකමක් නැති කිරිගරුඬ හා ඇලබැස්ටර් පාෂාණයෙන් කැපූ පිළිම හා පැපිරස් ලියවිලි කිහිපයක් පමණයි. මං ඉල්ලූ අඩු මුදලට ඔහු ඒවා ඔක්කොම දුන්නේ බොහොම කැමැත්තෙන්. ඒ නිසා අප දෙන්නා අතර ඇතිවුණේ ලොකු හිතවත් කමක්.

http://sherlockholmesinvestigations.blogspot.com

"රිචඩ්සන් මහත්මයා" ඔහු කිව්වා. "මගේ ගම ජොහැන්නස්බර්ග්වල රිච්මන්ඩ් නගරයේ. මං හිතනවා ඔබත් දකුණු අප්‍රිකානු ජාතිකයෙක් කියලා?"

"ඇත්තෙන්ම ඔව්" මං කීවා. "ඔබ කොහොමද ඒක දැනගත්තේ?"

"ඔබ ඉංග්‍රීසි භාෂාව උච්චාරණය කරන පිළිවෙළට, මං ඒක තේරුම් ගත්තා." ඔහු කිව්වා. "අපේ රටේ කෙනෙක් හමුවුණු එක කොයිතරම් සන්තෝෂයට කරුණක්ද" එහෙම කිව් ඔහු වයින් බෝතලයක් ඇරලා මට සංග්‍රහ කළා. ඊට පස්සේ අපි දෙන්නා පැය ගණනාවක් කතාබහ කළේ දකුණු අප්‍රිකාව ගැන. ඔහු මට වඩා වයසින් බාලයි. ඒ වුණත් කේප්ටවුන්, ප්‍රිටෝරියා හා ජොහැන්නස්බර්ග්වල මං දන්නා පුද්ගලයින් කිහිපදෙනෙකු ගැන ඔහු දැන හිටියා. ඉතින් බොහොම ඉක්මනට අපි මිත්‍රයන් බවට පත්වුණා. එද රාත්‍රි ඔහුගෙන් සමුගනිද්දී ඔහු මට ආරාධනා කළා. දින හතරකින් ඔහු සමග රාත්‍රි භෝජනයට එන්න කියලා. නමුත් පෞද්ගලික අපහසුතාවයක් නිසා මට එදට එන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. ඒ නිසා දින දෙකකින් එන බව මං ඔහුට දැන්නුවා.

ඒ අනුව එද සිකුරාද මං හෝටලයට ගියාම ඔහු මාව සාදරයෙන් පිළිගත්තා. අප දෙදෙනාටම රෑ කෑම ඇණවුම් කරලා, කාමරයට ගියාම, ඔහු මට සංග්‍රහ කරන්න ගත්තේ ඉස්තරම් විස්කි වර්ගයකින්.

"රිචඩ්සන් මහත්මයා. ඔබ කවදා හරි ගිහින් තියෙනවාද අපේ රටේ ලස්සනම තැනට? ඒ කියන්නේ නැගෙනහිර කෙළවරේ ස්වාසිලන්තයට?" ජෙප් ඇහුවා.

"මොකද නැත්තේ?" මං කීවා. "මං අන්තිමට රැකියාව කළේ එහේ. මට එහේදි හොඳ හොඳ අත්දැකීම්වලට මුහුණ දෙන්න ලැබුණා. ඇයි ජෙප් මහත්තයා එහෙම අහන්නේ?"

"මගේ යාළුවෙකුගේ දුර නෑ කෙනෙක්, ඔය ස්වාසිලන්තයේ පදිංචිවෙලා හිටියා" ජෙප් කිව්වා. "ඔහු හිටියේ එම්බාබෙන් පැත්තේ. මං හිතන්නේ ඔහු ඒ කාලයේ වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන ගියා. නමුත් පස්සේ ඔහු ගැන ආරංචියක් නැතිව ගියා............ ඉයන් රොබින්සන් කියල කෙනෙක්? ඔබට එහෙම ඔහු ගැන අහන්න ලැබිල තියෙනවද?"

"ඒක හරි පුදුමයි නේ" මං කිව්වා. "මං රැකියාව කළේ ඉයන් රොබින්සන් ළඟ. ඔබ දන්නවාද ජෙප් මහත්තයා රොබින්සන් යුවළට වුණු දේ? ඔබේ යාළුවා ඒක කවදා හරි කියල තියෙනවාද?"

http://sherlockholmesinvestigations.blogspot.com

"නෑ නෑ මට කියල නෑ. රොබින්සන්ලට මොකද වුණේ?" ඔහු ඇහුවේ මගේ වීදුරුවට විස්කි පුරවා ඔහුටත් ස්වල්පයක් දමාගනිමින්. ඉතින් මහත්වරුනි මං ඔහුට කථාව සම්පූර්ණයෙන්ම කිව්වා. ඔබට මා දැන් කියූ කථාව ඒ විධියටම කිව්වා. කිසි අඩුවක් නොකර. ඒකට පැයකට වඩා ගතවෙන්න ඇති. මේ අතරේ හෝටලයේ සේවකයා රාත්‍රී කෑමත් කාමරයට අරගෙන ආවා මට මතකයි. මත්පැන් පානය කර සිටි නිසා ඒක මතක මට යන්තමින්. නමුත් මගේ කථාව ඉවරවුණාම ඔහු ප්‍රශ්නයක් ඉදිරිපත් කළා. ඒක මට හොඳට මතකයි.

"එතකොට රොබින්සන්ලාගෙ කුළුමනාකාරයා හැටියට අවුරුද්දක් වැඩ කළෙ ජේම්ස් ටෝන්හාට් ඔබද?" ඔහු ඇහුවේ අමුතු කටහඬකින්.

"ඔව් මම තමා. මං ඒ කාලෙ පාවිච්චි කළේ ඒ නම" මං කීවා. "ඇයි ඔබ එහෙම අහන්නෙ?"

"කාලකණ්ණි මහා තක්කඩියා" ඔහු ගිගුරුවේ කබායේ සාක්කුවෙන් රිවෝල්වරයක් එළියට ඇදලා මට එල්ල කරමින් "මං මුළු ලෝකයෙන්ම භාගයක් දුර හොයාගෙන ආවේ උඹ හොයාගෙන තමයි. ජෝන් රිචඩ්සන් කියල බොරු නමක් ආරූඪ කරගත්තම උඹට බේරිලා ඉන්න පුළුවන් වෙයි කියලද හිතුවේ? මේ උඹේ අවසාන මොහොත. දැන් ඉතින් දෙවියන් සිහිකර ගනිං!"

මගේ වෙරි හිඳුණා. මගේ තොල් කට වේළුණා.

"ඇයි............ ඇයි දෙවියනේ..............මං මොන වැරැද්දක් කළාටද ඔහේ මට වෙඩි තියන්න හදන්නේ?............. ඔහේ ඇත්තටම කවුද?"

"උඹ ඔය කිව් බොරු කතාව කියල අනික් මිනිස්සු රැවැට්ටුවාට මාව රවට්ටන්න පුළුවන් කියලද හිතුවේ?" ජෙප් කිව්වේ කෝපයෙන් ගුගුරමින්. "මගේ නම මැතිව් ජෙප් නෙමෙයි. මම බැසිල් රොබින්සන්. උඹ ඒ මරා දැම්මේ මගේ තාත්තයි අම්මයි"

"මහත්තයා" මං කිව්වා "දෙයියම්පා මං කියන්නේ ඇත්ත. මං ඔබේ තාත්තාවත් අම්මාවත් මරා දැම්මෙ නැහැ. ඒක කළේ කොංගා"

"බොරු කියන්න එපා තක්කඩියා" ඔහු කිව්වේ රිවෝල්වරය මා දිහාට එල්ල කරලා ඉලක්කය ගනිමින් "මට වින්ඩෙලා ඔක්කොම කිව්වා. උඹට මතකද ගෙදර වැඩට හිටිය කළු ජාතික සේවිකාව වින්ඩෙලා? මාව කුඩා කාලෙදි බලා ගත්තෙ, මාව හැදුවෙ ඒ ගෑනි

http://sherlockholmesinvestigations.blogspot.com

තමයි. මගේ තාත්තත් අම්මත් මහන්සි වෙලා දුක් විඳ විඳ හම්බ කළේ මට උගන්වන්න. මාව ඇමරිකාවට යවලා උගතෙක් කළේ ඔවුන් දුක් මහන්සියෙන් හම්බ කළ සල්ලිවලින්. බාගවෙලාවට මගේ තාත්තා මියගියේ කොංගාගේ උපක්‍රමයකින් වෙන්න පුළුවන්. ඊට පස්සේ උඹ මගේ අම්මා මරා දමලා, සේවක සේවිකාවන් එළවා දැම්මා. එතකොට මගේ හැම තැනම හාරලා මුදල් ටික හොරකම් කර ගැනීම උඹට අමාරු වුණේ නෑ. රොබින්සන්ලට පුතෙක් හිටි බව උඹ දැනගෙන ඉන්න නැහැ. උඹ මගේ අම්මා මැරූ එකට නම් උඹට මගෙන් සමාවක් ලැබෙන්නෙ නෑ වොන්හාට්. දැන් ඉතින්............"

මට ජීවත්වෙන්න තිබෙන්නේ තවත් තත්පර කීපයක් පමණක් බව ඔහු එහෙම කියද්දී මං තේරුම් ගත්තා. එවැනි අවදානම් වෙලාවකට ප්‍රයෝජනයට ගන්න පිහියක් මගේ වම් සාක්කුවේ කොයිවෙලෙත් තිබුණා. ඔහු පිස්තෝලයේ කොකා ගස්සන්න කලින් මං ක්‍රියාත්මක වුණා. මහත්වරුනි. මං එය කළේ මගේ ජීවිතය බේරා ගන්න. ඔබ ඒක අලකන්නෙ මිනීමැරුමක් කියලද? අපරාධයක් කියලද? දෙවියන්වහන්සේ දන්නවා එවැනි වෙලාවක වෙන ඕනෙම කෙනෙක් කරන්නෙත් ඒ ටිකමයි" කියූ සිරකරුවා තම කථාව නිම කළේය.

බොහෝ වේලාවක් ගතවී තිබූ බැවින් ස්ටැන්ලි හොප්කින්ස් අපට හෝපැනින් සංග්‍රහකළේ පොලිස් මූලස්ථානයේදීය.

"හෝම්ස් මහත්තයා ඔබ අපට කිව්වේ නැහැනෙ" හොප්කින්ස් කීවේ අප එතැනින් පිටවී ඒමට සූදානම් වෙද්දීය. "අශ්වකරත්තයේ ඇතිවුණු ජවනිකාව මොකක්ද කියල. මං කැමතියි ඒක දැනගන්න"

"හෙට හැන්දෑවට බේකර් වීදියට ආවොත් මං කියන්නම් කතන්දරේ" මගේ මිත්‍රයා පිළිතුරු දුන්නේය.

පසුවද හැන්දෑවේ අපේ නිවහනේ විසිත්ත කාමරයට අමුත්තෝ දෙදෙනෙක් පැමිණ සිටියහ. ඒ ස්ටැන්ලි හොප්කින්ස් හා ටෝබියස් ග්‍රෙග්සන්ය. රාත්‍රී භෝජනය හෝම්ස් ඉතාලි අවන්හලකින් ඇණවුම් කර තිබිණි. එය අවසානයේ අප කෝපි පානයට සැරසෙද්දී මගේ මිත්‍රයා කතාබහ ඇරඹුවේය.

"මං ආචාර්ය ඩේවිඩ් ලින්කන් හැටියට හෝටල් කාමරේට වෙලා බලාහිටි බව ඔබට මතක නේ. හවස තුන පහුවෙලා මිනිත්තු දෙකට

http://sherlockholmesinvestigations.blogspot.com

කවුද දොරට තට්ටු කළා. මං දොර විවෘත කළා. රියැදුරු ඇඳුමෙන් සැරසුණු මිනිහෙක් දොර ළඟ බලා හිටියා.

"මහත්මයා ඔබ ඩේවිඩ් ලින්කන්ද?" ඔහු ඇහුවා.

"ඔව්?"

"මගේ ස්වාමියා ජේම්ස් ඩයිසන් මහත්මයා. එතුමා කිව්වා, ඔබ එතුමාගේ නිවසට කැඳවාගෙන එන්න කියල. ඔබට අලෙවි කිරීමට තිබෙන පුරාවස්තුත් ඔක්කොම අරගෙන එන්න කියල ඔහු කිව්වා." එහෙම කියූ රියැදුරා මා දිහා ඇසිපිය නොහෙළා බලාගෙන හිටියේ මං මොන වගේ මිනිහෙක්ද කියල තේරුම් ගන්න උත්සාහ කරමින්.

වොට්සන්. මං මේ කරුණ මීට කලිනුත් ඔබට කියල ඇති. ලෝකයේ විවිධ රටවලින් එංගලන්තයට සංක්‍රමණය වුණු අය ලන්ඩනයේ ජීවත්වෙනවා. ඔවුන් ඉංග්‍රීසි කථා කරනවා. නමුත් ඔවුන්ගේ ඉංග්‍රීසි උච්චාරණයේ විවිධ වෙනස්කම් තියෙනවා. ඔබ දන්නවා බ්‍රිතාන්‍යයේ ප්‍රාන්ත අතර පවා මේ උච්චාරණයේ වෙනස්කම ඇති බව.

ඉතින් මං මේ කියන්න හැදුවේ; රියැදුරාගේ කතාබහෙන් මං තේරුම් ගත්තා ඔහු කුඩා කාලයේ සිට එංගලන්තයේ හැදුණු කෙනෙක් නොවෙන බව. නමුත් ඔහු සුදු ජාතිකයෙක්. එහෙනම් ඔහු කොයි රටක කෙනෙක්ද? ඒක ඇමරිකානු ඕස්ට්‍රේලියානු හෝ යුරෝපීය රටක උච්චාරණය නොමෙයි. ඒකෙ තිබුණා දකුණු අප්‍රිකානු ගතිය. අපි දන්නවා මැරුම් කෑ පුද්ගලයාත්, ඝාතකයාත් දෙදෙනාම දකුණු අප්‍රිකානු ජාතිකයන් බව. එහෙනම් මේ රියැදුරාත් ඩයිසන් විසින් තමන්ගේ මවුරටෙන් ගෙන ආ කෙනෙක්ද? බොහොම අය නාඳුනන රටවල පදිංචියට යද්දී, එහෙම තමන්ගේ රටේ මිනිසුන් කැඳවාගෙන යනවා. ඒ නමුත් මගේ හිතේ ඇතිවුණා පුංචි සැකයක්. ඒ මොකක්ද? මේ රියැදුරු ඇඳුමෙන් සැරසිලා ඉන්නෙත් බාගවෙලාවට ඩයිසන්ම වෙන්න පුළුවන් බව. ඒකත් කල් ඇතුව සෝදිසි කරලා දැනගත්තොත්, මගේ කටයුතු වඩාත් පහසුවෙන බව මට වැටහුණා.

මගේ කාමරයේ තිබුණු බඩු ටිකත් මසවාගෙන, කාමරයේ දොර වහලා මං රියැදුරා සමග එන්න පිටත් වුණා. යාර පහක් හයක් ඉදිරියට ගිහිං මං එක්වරම නැවතුණා.

"ෂෘ හරි වැඩේනේ උණේ" මං කිව්වා. "අද බදාදා නේද? මට ඒ බව අමතක වුණා. මං පුරාවිද්‍යා විශේෂඥයෙකුට හෝටලයට

 http://sherlockholmesinvestigations.blogspot.com

එන්න කිව්වා මගේ පුරාවස්තු පෙන්වන්න. කමක් නෑ. අපි ඔහුට පොඩි ලියුම් කැල්ලක් ලියලා දොරේ අමුණලා යමු"

"මහත්මයා අමුත්තන් පිළිගන්න අංශයට ගිහින් පණිවුඩයක් දීල ගියත් හරි නේද?" ඔහු ඇහුවා.

"නෑ නෑ. ඒ මිනිසුන්ගෙ වැඩ හරි නොසැලකිලියි. දන් ඉන්න මිනිහා රාජකාරි මාරුවෙලා යද්දී අපි දෙන ලියුම් කැබැල්ල කොහේ හරි දමාවි. අපි ලියුමක් ලියලා දොර අගුලේ ලියුම රඳවලා යමු"

මං එහෙම කියද්දී මගේ අත්දෙකේම හා උරහිසේ ගමන්මලු. "රියැදුරු උන්නැහේ මට උදව්වක් කරන්න" මං කිව්වා. "මගේ කබා සාක්කුවේ තියෙනවා උල්පත් පෑන සහ නෝට් පොතක්. මං වෙනුවෙන් කුඩා සටහනක් ලියන්න"

"හොඳයි ඔබ කියන දෙය මං ලියන්නම්" කිව් ඔහු මගේ සටහන් පොත හා පෑන අතට ගත්තා.

"මෙහෙම ලියන්න" මං කියෙව්වා.

වෝඩ් මෝටිමර් මහතා,
පුරාවිද්‍යා අධ්‍යක්ෂක.
සමාවෙන්න. මට අමතක වුණා. බදාදා මගේ නිවාඩු දවස.
කරුණාකර හෙට මේ වෙලාවට එන්න.

ඩී. ලින්කන්"

ඔහු ලියූ ඒ ලියුම් කැබැල්ල මං කාට්රයිට් ලවා අද උදේ ගෙන්වා ගත්තා. මේ බලන්න.

Mr Ward Mortimer,
Director of Archiology.

Sorry. I forgot. Wensday is my off day. Pleese come tomorrow at this time.

D. Lincoln

මේ ලියුම කියෙව්වොත් ඔබට පෙනේවි ඔහු කර ඇති වැරැදි. Archaeology, Wednesday කියන වචන දෙකම ඔහු වැරැද්දුවා. ඊට අමතරව Please කියන වචනයට යෙදුවෙත් වැරැදි අක්ෂර වින්‍යාසයක්. මුල් වචන දෙක ජේ. ආර්. වරද්දලා තිබුණෙත් මය ආකාරයටමයි. එහෙම නේද වොට්සන්? ඒක අහඹු සිදුවීමක් විය හැකිද? නමුත් එපමණක් නොවෙයි. ඩයිසන් මට එවූ ලියුමේ අත්

http://sherlockholmesinvestigations.blogspot.com

අකුරුවල a, e හා o අකුරු ඉතාම කුඩා නොපැහැදිලි ඒවා. P අකුර ඇදයි. ඩයිසන්ගේ රියැදුරා ලියූ මේ ලියුම් කැබැල්ලත් ඒ විධියමයි. ඩයිසන් විධියටම රියැදුරාත් ලියනවා කියලද හිතන්න තියෙන්නේ? අපරාධකාරයාගේ පෙනුම හෝටල් සේවකයන් දක තිබුණේ යාන්තමට. ඒ කරුණුත් මට සිහිවුණා. මෙතැනදී මං තවත් වැදගත් දෙයක් නිරීක්ෂණය කළා. රියැදුරා අකුරු ලිව්වේ වම් අතින්. ඔබට මතක ඇති රොබින්සන්ට පිහිය දමා ගැසූ තැනැත්තා වමත් කාරයෙක් බවට මා පැවසූ බව.

අශ්වකරත්තයේදී ඒක තවදුරටත් තහවුරු වුණා. ඔහු දකුණු අතින් රේන්ස්පටිය අල්ලාගෙන, අශ්වයින්ට කසයෙන් ගැසුවේ වම් අතින්. කරත්තය ඇතුළේදී එක්වරක් ඔහුගේ හිස්වැස්ම ගැළැවී වැටුණා. ඔහුට තිබුණේ එකම කෙස්ගහක් නැති සම්පූර්ණ තට්ටයක්. හෝටල් සේවකයා දක තිබූ කරුණු යම්තරමකට මේ වෙලාවෙ සනාථ වුණා.

ඔබට මතක ඇති හෝටලය ළඟදී ඔබේ කරත්තයට නගින්න ආ නාකි ජෝඩුව. මට කිසිම සැකයක් නෑ; ඒ දෙදෙනාත් ඩයිසන් විසින් කල්ඇතුව සැලසුම් කර, රඳවා හිටි මිනිසුන්. ඔහු පිටුපස කරත්තයක් ලුහුබැඳ එන්න හැඳුවොත් එය පමාකරන්නයි ඒ උත්සාහය. කොහොම හරි ඔවුන් ඇතිකළ මිනිත්තුවක පමණ ප්‍රමාදය ඔහුට වාසියක් වුණා.

"කොහොමද ඔබ දෙදෙනා අතර සටන ඇවිළුණේ?" මම ඇසීමි.

"ඔබේ කරත්තය මඟහැරලා ඔහු රථය වොක්ස්හෝල් පාරට දගත්ත නේ" හෝම්ස් කීය. "ඔහු වේගය තවත් වැඩිකළා. ඉතින් මං දැනගත්තා ඔබෙන් පිහිටක් ලබාගැනීමට මට අවස්ථාවක් නොලැබෙන බව. ඔහු නොහිතන මොහොතක මං පිටුපසින් රිවෝල්වරය ඔහුගේ බෙල්ලට තදකරලා තියල කිව්වා,

"ජේම්ස් ඩයිසන්, දඟලන්න හදන්න එපා. තමුසෙ අපරාධකාරයෙක් බව අපි දන්නවා. මං ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියෙන්. වහාම රිය පාර අයිනේ නවත්වලා, අත් දෙක ඔසවනවා!"

ඔහු එකපාරටම තිගැස්සුණා. එක වචනයක් වත් කථාකළේ නෑ. බාගවෙලාවට මෙහෙම දෙයකට මුහුණදෙන්න උවමනා වුණොත් ඒකටත් සූදානමෙන් ඔහු ඉන්න ඇත්තෙ. මිනිත්තු තුනක් හතරක්

http://sherlockholmesinvestigations.blogspot.com

කරත්තය වේගය අඩුවෙමින් ඉදිරියට ගියා. එත්වරම ඔහු අසුන්ව යැව්වා පාර අයිනේ කාණුවකට. කරත්තයේ රෝදයක් වළකට වැටිලා දෙපැත්තට පැද්දිලා කරත්තය නැවතුණා. ඒ ගැස්සීමට මගේ රිවෝල්වරය එහා මෙහා වුණා. ඒ අවසරයෙන් ඔහු කරත්තයෙන් පැන්නා. මං ඔහු පසුපස ලුහුබැඳ එන අතරේ වාසනාවකට වගේ ඔබ දෙදෙනා එතැනට ළඟාවෙලා තිබුණා." හෝම්ස් කථාව අවසන් කළේය.

"හෝම්ස් මහත්තයා, ඔබ හිතන්නේ මේ ඩයිසන් කිව් කථාව ඇත්ත කියලද?" හොප්කින්ස් විමසුවේය. "රොබින්සන් මහත්මියගේ මරණය ගැන ඔහු වගකිවයුතු නැහැ කියල?"

"සමහර විට ඒක ඇත්ත වෙන්නත් පුළුවනි" හෝම්ස් කීය. "ඒ මොකද අර කොංගා ඉඳල තියෙන්නේ රොබින්සන්ල සමග වෛරයෙන්. අනික් අතට ඩයිසන් හෙවත් වොන්හාට් අවස්ථාවෙන් ප්‍රයෝජන ගත්තා වෙන්නත් පුළුවනි. තමන් නිර්දෝෂයි කියල ඔහු කියන වචනය මම නම් සියයට සීයක් විශ්වාස කරන්නෙ නෑ."

මැතිව් ජෙප් හෙවත් බැසිල් රොබින්සන් ඝාතනය කිරීමේ චෝදනාවට ජේම්ස් ඩයිසන් හෙවත් රැල්ෆ් වොන්හාට්ට එරෙහිව නඩුව සති කිහිපයක් තිස්සේ විභාගයට ගැනිණ. චූදිතයා වැරැදිකරුද නිවැරදිකරුද යන්න තීරණය කිරීමට ජූරි සභාවට බොහෝ වේලාවක් ගතවිය. අන්තිමේදී ඔහු අහියම් මිනීමැරුමට වරදකරු ලෙස තීරණය විණි. ඒ අනුව විත්තිකරුට බරපතල වැඩ ඇතිව අවුරුදු දහයක සිරදඬුවමක් නියම විය.

බැක්වෝටර් සාමිවරයා දැඩි උත්සාහයක් ගත්තත්, මේ අපරාධය පිළිබඳව විස්තර පුවත්පත්වල පළවිණි. අපරාධයට සම්බන්ධ පුද්ගලයන් දෙදෙනාම විදේශිකයන් බවත් ග්‍රොව්නර් හෝටලය ඊට සම්බන්ධ නොමැති බවටත් පුවත්පත් දැන්වීම් මගින් ප්‍රචාරය කෙරිණි. මෙම අපරාධය ඉක්මනින් විසඳා හෝටලයේ නම පිරිසිදු කිරීමට හෝම්ස් අතින්වුණු මෙහෙය බැක්වෝටර් සාමිවරයාගේ ඇගයීමට ලක්විය. ඔහුගෙන් මගේ මිත්‍රයාට ලැබුණු ත්‍යාග මුදල ඉලක්කම් හතරක ගණනක් බව මගේ විශ්වාසයි.

http://sherlockholmesinvestigations.blogspot.com

පැරඩෝල් කුටියේ වික්‍රමය

වැහි අන්ධකාරය බිඳගෙනලමින් විදුලිකෙටීමක් ඇතිවූයේ අන්ධකාරව තිබූ අපේ නිවහන එක් මොහොතකට ආලෝකමත් කරමිනි. ඒ සැණින් බේකර් වීදියේ කොහේ හෝ හෙණයක් පුපුරා ගියේය. ඒ බිහිසුණු ශබ්දයෙන් මම තිගැස්සුණෙමි. එක්වරම මා දෙස බැලූ මගේ මිත්‍ර ෂර්ලොක් හෝම්ස්ගේ දෙතොලට සිනාවක් නැගිණ. මීළඟට ඔහු යළිත්වරක් අප ඉදිරියේ අසුන්ගෙන සිටි අනුග්‍රාහිකාව වෙත සිය අවධානය යොමුකළේය.

ඒ වසන්ත සෘතුවේ වැසිබර කාලගුණයක් තිබූ දවසක උදෑසනකි. මුළු ලන්ඩනයම වැසී තිබුණේ යෝධ පළසක් වැනි ඝන වලාකුළකිනි. වරින් වර වහළට වැටුණු වැහිබිඳුවලින් නැගුණු ශබ්දය ඉතා තියුණු විය. අපේ නිවහනේ අඳුර දුරුවනසේ, ගෑස්පහන් දල්වා තිබිණ. ඔහු සෑහැති ගින්නක් ගිනිළඳුනේ ඇවිළුණේ අධික සීතල සමනය කොට උණුසුම් බවක් ඇතිකරමිනි.

ඇය වයස අවුරුදු විසිපහක් පමණ වූ තරුණියකි. ඇගේ සිරුර මධ්‍යම ප්‍රමාණයේ එකක් වූ අතර, මුහුණ ශෝභාසම්පන්න විය. බාහිර පෙනුම නිරීක්ෂණයෙන් ඇය ගැන නිගමනයන්ට පැමිණීමට හෝම්ස්ට අපහසු වී ඇතැයි මට සිතිණි. ඔහු තම තීක්ෂණ දෙනෙත් ඇය වෙතටම යොමුකරගෙන සිටියේය. ඒ, ළඟ එන ලොකු ගැටලුවක් විසඳීමට එයින් පිහිටක් ලැබෙතැයි අපේක්ෂාවෙන් වියයුතුය. සති ගණනාවක් තිස්සේ සතුටුදායක පරීක්ෂණයක් නොමැතිව, ඔහු සිටියේ සෑහෙන අසහනයකින් බව මම දැනසිටියෙමි. එහෙත් මෙවැනි සන්සුන් සුන්දර තරුණියකට, හෝම්ස්ගේ සිතේ කුතුහලයක් හා උද්දාමයක් ඇතිකළ හැකි ගැටලුවක් ඉදිරිපත් කිරීමට හැකියාව තිබේද? මෙවැනි අහිංසක ලලනාවක වටා එබඳු ගුළු අභිරහසක් ඇතැයි සිතිය හැක්කේ කාටද?

"කරුණාකරල ඔබ කීමට අදහස් වුණු දේ කියන්න" හෝම්ස් කීය. "මේ තරම් අයහපත් කාලගුණයක් තිබෙන වෙලාවක ඇයි අප

http://sherlockholmesinvestigations.blogspot.com

හමුවෙන්න ආවෙ? ඒකයි ඔබ කියන්න සූදානම් වුණේ. හොඳයි. අපි කලින් තේ කෝප්පයක් බීලම ඉඳිමු. අපට දුම්දමන තේ පෝච්චියක් එවන්න තරම් හඩ්සන් මහත්මිය කරුණාවන්න වුණා. වොට්සන් ඔබට කරදරයක් නැත්නම්..........."

මම අසුනෙන් නැගිට, තේ කෝප්පය පිළියෙල කොට තරුණිය අතට දුන්නෙමි.

"ස්තූතියි මහත්මයා" එය අතට ගනිමින් ඇය කීවාය. "හෝම්ස් මහත්මයා. මේ තරම් කෙටි කාලයක් තුළ ඔබ හමුවෙන්න අවස්ථාවක් ලබාදීම ගැන මං ඔබට කෘතඥ වෙනවා..........."

"ආ............ ඒක සුළු දෙයක්. ඉතින් ඔබේ කථාව කියන්න"

"මගේ නම ග්‍රේස් හැමිල්ටන්" ඇය කීවාය. "මට වහාම ඔබෙන් උපදෙස් ලබාගැනීමට උවමනා වී තියෙනවා. ඒ මොකක් ගැනද කියල මං කියන්නම්. ඒ වුණත් මං මගේ කථාව ඔක්කොම කිව්වාම, ඔබ හිතාවි මට පිස්සු කියල. එහෙමත් නැත්නම් මං හරි මෝඩයි කියල"

"අපි එහෙම හිතාවි කියල, ඔබේ කථාන්තරය කීමට පසුබට වෙන්න එපා." මගේ මිත්‍රයා කීය. "ඔබ කැමැති දෙයක් නිදහසේ ප්‍රකාශ කරන්න, ඔබට අවසර තියෙනවා. ඒ ගැන මගේ සම්පූර්ණ අවධානය යොමු කරන බවට මං සහතික වෙන්නම්."

"මං මුලින්ම ඔබට කියන්න කැමැතියි, මං හොල්මන්, අවතාර විශ්වාස කරන කෙනෙක් නොවෙන බව" ඇය කීවාය. "අද්භූත දේ, මායාවන් වගේ විද්‍යාත්මකව ඔප්පු කරන්න බැරි දේවල් නිසා මගේ හිත කැළඹීමට පත්වෙන්නෙ නැහැ. ඒ වුණත් මට එහෙම දේකට මුහුණදෙන්න සිද්ධවුණා හෝම්ස් මහත්තයා."

යළිත් වරක් කත් අඩි දෙදරවමින් අහස ගුගුරා ගියේය. ඇගේ සිත භීතියෙන් තිගැස්මට පත්ව තිබිණි.

"කොහේදිද කවදද මේ දේ සිද්ධවුණේ?" හෝම්ස් ඇසුවේ තත්පර කිහිපයකට පසුවය.

"හරියටම මීට සතියකට කලින් දවසක මධ්‍යම රාත්‍රියේ. එය සිද්ධවුණේ මගේ ඥාතිවරියකට අයත් පැරඩෝල් මන්දිරයේ. ඇය මගේ ආච්චිගේ ලොකු අක්කා. ඔබ සමහර විට ඇගේ සැමියා ගැන අහලත් ඇති. ඔහු තමා කලකට පෙර මියගිය හෙන්රි සාමි හෙවත් ලින්කන්ෂයර්හි ආදිපාදවරයා. ඇය හැඳින්වෙන්නේ පෙනිලොප්

http://sherlockholmesinvestigations.blogspot.com

ආර්යාව නමින්. පැරඩොල් මන්දිරය තියෙන්නේ සරේ ප්‍රාන්තයේ වොකිං නගරයට කිට්ටුව."

"ඔබ දීර්ඝ කාලයක් විදේශයක ගතකරලා එංගලන්තයට ආවෙ දින කිහිපයකට පෙර නේද?" හෝම්ස් විමසීය.

"ඇත්තෙන්ම ඔව් හෝම්ස් මහත්මයා. මං මේ ඒ ගැන ඔබට කියන්නයි සූදානම් වුණේ. ඔබ කොහොම මං විදේශයක හිටි බව දැනගත්තේ?"

"මං හිතන්නේ ඔබ වාසය කරලා තියෙන්නේ ඉන්දියාවේ. එහෙම නේද?" හෝම්ස් ඇසීය. "මට නිගමනයකට එන්න පුළුවනි. ඔබේ සැමියා ඉන්දියාවේ රැඳවා තිබෙන බ්‍රිතාන්‍ය යුද්ධ හමුදාවේ නිලධරයෙක් බවට"

"මහත්මයා!" ඇය කීවේ අතිශය පුදුමයෙනි.

"ඔබ කොහොමද මේ හැමදෙයක්ම.........."

"ඔව්.......... මං ඒ දේවල් දැනගත්තේ නිරීක්ෂණය කර ඒ මගින් නිගමනයන්ට එළැඹීමෙන්." මගේ මිතුරා කීය. "ඔබ හුගක්ම සුදු පැහැති සමක් ඇති කාන්තාවක්. ඒ වුණත් ඔබ සෑහෙන කාලයක් අව්රශ්මියට නිරාවරණය වෙලා තිබෙන බව පෙනෙනවා. උතුරු යුරෝපය සහ එංගලන්තය මෙවර් ඉතාම දීර්ඝ ශීත සෘතුවකටයි මුහුණ දුන්නේ. නමුත් ඔබ මෑතකදී ජීවත්වෙලා තියෙන්නේ එවැනි පෙදෙසක නොවෙන බව ස්ථිරයි. ඔබේ ඇඟිල්ලක ඇති මුදුව දුටුවාම ඔබ විවාහක බව පැහැදිලියි. ඔබ රැගෙන ආ කුඩය මා දුටුවා. එහි ලී මිටේ ඇත්දත්වලින් යෙදූ මෝස්තරයක් දැකිය හැකියි. එය ඉන්දියාවටම විශේෂිත මෝස්තරයක් මෙන්ම කැටයමක්. මිට වටේ සවිකොට ඇති පිත්තල ආවරණයේ හමුද අනුබණ්ඩයක ලාංඡනය කැටයම් කර ඇති බව පෙනෙනවා. මේ අනුව මට හිතාගත හැක්කේ මේ කුඩය ඉන්දියාවේ හමුද සේවය හැර එන නිලධරයෙකුට හෝ ඔහුගේ බිරිඳට පිරිනැමුණු ත්‍යාගයක් බව."

"ඔබ කියූ දෙය නිවැරදියි හෝම්ස් මහත්මයා" ඇය කීවාය. "මගේ සැමියා ජේම්ස් ෆැරිංටන්. ඔහු ඉන්දියාවේ 112 වැනි කාලතුවක්කු රෙජිමේන්තුවේ කපිතාන්වරයෙක් හැටියට සේවය කළා. මගේ තාත්තාත් හමුදනිලධරයෙක්. ඔහු එඩ්වඩ් කෝල්බෲක්. පසුගිය අවුරුදු තුනක කාලයක් තාත්තා සේවය කළේ ඉන්දියාවේ. තාත්තාගේ හමුදසේවය නිසා මාත් අම්මාත් ඔහු සමග ඒ රටේ

http://sherlockholmesinvestigations.blogspot.com

පදිංචිව සිටියා. මට ජේම්ස්ව හමුවුණේ මීට මාස 14කට පෙර ඉන්දියාවෙදිමයි"

"ඔබේ දෙමව්පියන් තවමත් එහේද?" මම ඇසීමි.

තරුණිය මා වෙත හෙළුවේ ශෝකයට පත් බැල්මකි.

"මගේ තාත්තා තවමත් එහේ සේවය කරනවා" ඇය කීවාය. "ගියා අවුරුද්දේ ග්‍රීෂ්ම ඍතුවේ පැතිරගිය කොලරා වසංගතයකින් මගේ අම්මා මියගියා"

"ඒ ගැන අහන්නත් කණගාටුයි" හෝම්ස් කීය. "ඉතින් ඔබ ආපසු එංගලන්තයට එන්න තීරණය කළේ මොකක් නිසාද? ඔබේ සැමියාට උසස්වීමක් ලැබුණද?"

"නැහැ හෝම්ස් මහත්මයා" ඇය පිළිතුරු දුන්නාය. "ඉන්දියාවේ පන්ජාබ් ප්‍රදේශයේ දරුණු කැරැල්ලක් හට ගැනුණා. ඒ කැරලි මර්දනයට ගිය බ්‍රිතාන්‍ය යුදහමුදවට දුබල ප්‍රහාරයක් එල්ල වුණා. ඔහු සමග ගිය කිහිපදෙනෙකුගේ ජීවිත ගලවාගන්න මගේ සැමියා සමත්වුණා. නමුත් ඒ අතරෙදී ස්වදේශිකයන් එල්ල කළ වෙඩිපහරකට ලක්වෙලා මගේ සැමියා බරපතල ලෙස තුවාල ලැබුවා. ඔහුගේ කකුලකට සිදුවූ තුවාල නිසයි ආපසු එංගලන්තයට එවුණේ." ෆැරිංටන් මහත්මිය මා දෙසත් හෝම්ස් දෙසත් මාරුවෙන් මාරුවට බැලුවාය.

"කොහොම වුණත් ඔහුට සෑහෙන තරම් සුවයක් ලැබෙන තුරු අපට ඉන්දියාවේම ඉන්න සිදුවුණා" ඇය යළිත් කීවාය. "ඒ මොකද බරපතල ලෙස රෝගාතුරව නැවක ගමනාගමනය සුදුසු නැති නිසා. නැවෙන් ආපසු එන ගමනටත් සති ගණනාවක් ගතවුණා. කොහොමහරි ආපහු අපේ රටට ආවාම නවතින්න තැනක් ලැබෙන බව අප දැනගිටියා. ඒකත් හිතට ලොකු සැනසීමක් වුණා"

"එය සුදානම් කළේ ඔබේ ලොකු ආච්චිද?"

"ඔව් ඇය තමා" තරුණිය පිළිතුරු දුන්නාය. "අපේ තාත්තා හමුදා නිලධරයෙක් හැටියට ජීවිතයේ වැඩි කාලයක් ගතකළේ එංගලන්තයෙන් පිට. ඉතින් අම්මාත් මමත් ඔහු සමග රටින්රට ගියා. ඒකෙන් ලොකු ආච්චිව ළඟින් ආශ්‍රය කරන්න මට කවදාවත් ඉඩක් ලැබුණෙ නෑ. ඇත්තම කියනවා නම් මං ජීවිතේටම ඇයව දැකලා තිබුණේ වරක් හෝ දෙකක් පමණයි. ඒකත් මං බොහොම පුංචි ළමයෙක් කාලෙ. කොහොම වුණත් අවුරුදු ගණනකට කලින් මං

http://sherlockholmesinvestigations.blogspot.com

ඉන්දියාවෙ ඉඳල ඇයම–නත්තල් සුභපැතුමක් එව්වා. ඇය ඒකට මට පිළිතුරු එව්වා. ඒ සමගම ලොකු ආච්චිත් මාත් අතරේ ආදරණීය මිත්‍රත්වයක් ඇතිවුණා. මගේ සැමියා අනතුරකට මුහුණපෑව බව මං ඇයට දන්වලා එව්වා. සැමියාට සෑහෙන තරම් සුවවුණාම අපි එංගලන්තය බලා එනබවත් මං ලොකු ආච්චිට ලියල එව්වා. ඒකට ඇය කියල එව්වේ අප එංගලන්තයට එනවා නම් ඇගේ වලව්ව වුණු පැරඩෝල් මන්දිරයේ අපට නවතින්න පුළුවන් බව. ඇය තදින්ම කියල තිබුණා වෙන කොහේවත් නවතින්න සූදානම් වෙන්න එපා කියල. ඉතින් ගිය සතියේ අපි එංගලන්තයට ළඟාවුණාම කෙළින්ම ගියේ එහේට."

"කොයිතරම් හොඳද" හෝම්ස් කීය. "ඒ හමුවීම සමහරවිට නොඉවසිල්ලෙන් බලාඉගන උන්නු දෙදෙනෙකුගේ හමුවීමක් වෙන්න ඇති?"

"නොඉවසිල්ලෙන් බලාගෙන ඉඳපු බව නම් ඇත්තයි" තරුණිය කීවාය. "ඒ වුණාට අපව පිළිගැනුණේ නම්, බලාපොරොත්තු වුණු ආකාරයට නෙමෙයි. හරිම පුදුමාකාරයි. අමුතු අමුතු දේවල් සිදුවෙන්න පටන්ගත්තේ අප ඒ වලව්වේ වහළ යටට ගිය මොහොතෙ ඉඳලමයි"

"ඒ මොනවද?"

"අපි ලන්ඩන් සිට වොකිං දක්වා දුම්රියක ගියා. වොකිං සිට ඇගේ නිවසට අශ්වකරත්තයක ගියා" ෆැරිංටන් මහත්මිය කීවාය. "එද මට පෙනුණෙ, මට හිතුණෙ හැමදෙයක්ම අපට වැරදී ඇති බව. එක්කො ඒ මට පෙනුණු හැටිද කියන්න මං දන්නෙ නැහැ. පැරඩෝල් වලව්ව ඒ තරම් විශාල මන්දිරයක් නෙමෙයි.

ඒක තට්ටුදෙකේ ශක්තිමත් ගොඩනැගිල්ලක් බව ඇත්තයි. නමුත් පුංචි කාලයේ දැකල මගේ මනසේ තැන්පත් වෙලා තිබුණු ආකාරයේ මහ විශාල තැනක් නෙමෙයි. එහි තිබුණේ සිත් කලකිරවන මුස්පේන්තු පෙනුමක්. අශ්වකරත්තය එතැනට ළඟාවුණු වෙලාවෙම මං ඒ බව දුටුවා. ඒක දුටු වෙලාවෙ මගේ ඇඟ සීතල වුණා."

"ඔබ ඉන්දියාව වගේ රටක.........." මම කීවෙමි. "දිගු කාලයක් ගතකර ඇති නිසා සීතල කාලගුණයක් තිබෙන දවසක.........."

"දොස්තර මහත්මයා......... මං දන්නවා ඔබ කියන්න හදන දේ" ඇය කීවාය.

 http://sherlockholmesinvestigations.blogspot.com

"යම් තරමකට එවැනි දේශගුණික බලපෑමකුත් තියෙන්න ඇති. නමුත් මගේ සිත භීතියට පත්වුණේ එයින් නෙමෙයි....... මුළු මිදුලම හා ගේ අවට උද්‍යානය හොඳටම වල්බිහිවෙලයි තිබුණෙ. ඒකට උයන්පල්ලෙකු මාස ගණනකින් අත තියල නැහැ. අශ්ව කරත්තයෙන් බැහැල ගිහින් අපි දොරට තට්ටුකළේ කැළඹුණු හිතකින්.

මිනිත්තු කිහිපයක් ගතවෙන තුරු කිසිකෙනෙක් ආවෙ නැහැ. අපි එන බව හා වෙලාව ඔවුන්ට දන්වලා තිබුණා. නමුත් මට හිතුණේ ඒ පණිවුඩය ඔවුනට ලැබෙන්න නැතිව ඇති කියලයි. තුන් හතර වරක් දොරට තට්ටු කළාට පස්සේ කෙනෙක් ඇවිත් දොර ඇරියා. ඔහු අවුරුදු තිස්පහක හෝ ඊට මඳක් අඩුවැඩි වයසේ තරුණයෙක්. අප එහි යාම ගැන ඔහුගේ හිතේ සතුටක් ඇතිවුණා කියල මට හිතුණේ නැහැ. වෙනත් වචනවලින් කියනවා නම්, සාදරයෙන් පිළිගැනීමක් කියන දේ පෙනුණෙ නැහැ. ඒක මටත් මගේ සැමියාටත් දෙදෙනාටම තේරුණා.

බඩුමලු දෑත්වලින් ඔසවාගෙන අපි දෙන්නා දොර ළඟ හිටි හැටි ඔහු හොඳින් දුටුවා. ඒ වෙලාවේ ඔහුගේ මුහුණේ පළවුණු හැඟීම් මට තේරුම් ගන්න අමාරු වුණා. මං හිතුවා අප ගිහින් තියෙන්නේ වැරදි ගෙදරකටද කියලා. මේ තරුණයා කවුද කියන එක මට මතක් වුණේ මිනිත්තු දෙක තුනකට පස්සෙයි. ඔහුගේ නම ජෙරෙමි වොල්කොට්. ඔහු අපට බොහොම දුරින් නෑදෑ වෙන ඥාති සොහොයුරෙක්.

කථාවට සවන්දීම නැවැත්වූ හෝම්ස් එක්වරම තම අසුනෙන් නැගී සිටියේය. ඔහුගේ ලියන මේසය අසල රාක්කය වෙත ගිය හෝම්ස්, එහි තිබූ යමක් සෙවීමට පටන් ගත්තේය. එම රාක්කයේ තිබුණේ ඔහු විසින්ම වරින්වර ෆුල්ස්කැප් කඩදාසිවල තබා තිබූ සටහන්, පුවත්පත්වලින් තෝරාගත් පිටු සහ පුවත්පත්වලින් කපාගත් ප්‍රවෘත්ති ඇලවූ ස්ක්‍රැප් පොත් කිහිපයක් පමණි.

"........................ ෆැරිංටන් මහත්මිය" හෝම්ස් කීය.

"කරුණාකර ඔබේ කථාව දිගටම කියන්න."

"මගේ සැමියාත් මමත් අප කවුද කියන එක හඳුන්වා දුන්නා" ඇය කීවාය. "අප එහි ගියේ කුමකටද කියන එකත් කිව්වා. මං කවුද කියන එක ජෙරෙමි දන්නිටි බවයි මට හිතුණේ. නමුත් ඔහු එක දිගට

http://sherlockholmesinvestigations.blogspot.com

මිනිත්තුවක් දෙකක් අෂ-දිගා බලාගෙන හිටියා. කිසිම කතාබහක් නැතිව එහෙම හිටියේ පුදුමයට පත්වෙලා වගේ. ඊට පස්සේ අන්තිමට, ඔහු අප පිළිගන්න අත ඉදිරියට දිගු කළා.

"මට සමාවෙන්න" ඔහු කිව්වා. "ඔබ දකින්න ලැබීමෙන් මං හරි පුදුමයකටයි පත්වුණේ. ඔබ අද මෙහි එන බවක් පෙනිලොප් ආර්යාව මට කිව්වේ නැහැ. එහෙම කියලා තිබුණා නම්, ඔබ වෙනුවෙන් මං හැමදෙයක්ම සූදානම් කරල තියනවානෙ"

"ඇයි අපේ පැමිණීමෙන් මොකුත් ප්‍රශ්නයක් ඇතිවුණාද?" මං ඇහුවා. "අප මෙහි නවාතැන් ගැනීම කරදරයක් නම්, අපට පුළුවනි නවතින්න වෙන කොහේ හරි හොයාගන්න"

එක්වරම පිළිතුරක් නොදී ඔහු මදක් පැකිළුණා. ඊට පස්සෙයි කථා කළේ.

"නෑ නෑ කමක් නෑ" ඔහු කිව්වා. "ඔබට නවාතැන් ගන්න මෙහේ ඉඩ තියෙනවා. පෙනිලොප් ආර්යාව ඔබව ඇරයුම් කරල තියෙනවා නම්, මං කොහොමද ඔබව ආපහු හරවලා යවන්නෙ? නමුත් කණගාටුවට කරුණ මේකයි. මාස කිහිපයකට කලින් තිබුණාට වඩා දැන් තත්ත්වය වෙනස් වෙලා. පෙනිලොප් ආර්යාව තදබල ලෙස අසනීප වුණා. ඇගේ රෝගී තත්ත්වය ක්‍රමක්‍රමයෙන් වැඩිවුණේ දැන් සෑහෙන කාලයක ඉඳලයි. වයස යද්දී ලෙඩවෙන එක වළක්වන්න කාටවත් බැහැනේ........ ඉතින් එන තත්ත්වයට මුහුණ දෙන්න අපට සිද්ධවේවි. ඒකයි මං ඔබට මතක් කළේ."

"හෝම්ස් මහත්මයා, මේ කථාව ඇහුවාම මං හරි පුදුමයකටත් කැළඹීමටත් පත්වුණා" ෆැරිංටන් මහත්මිය කීවාය. "ලොකු ආච්චි මට ලියුම් කීයක් නම් එව්වද.. ඒත් ඒ එකකවත් ඇගේ අයහපත් සෞඛ්‍ය තත්ත්වයක්, ලෙඩ රෝගයක් ගැන එක වචනයක්වත් ලියල තිබුණේ නැහැ. මං ඒ බව ජෙරමි වොල්කොට් තරුණයාට කිව්වා"

"පෙනිලොප් ආර්යාව ටිකක් ආඩම්බර කෙනෙක් නේ" ඔහු කිව්වා. "තමන්ගේ ඇගේ තිදත්ගත රෝගයක් තිබෙන බව පිළිගන්න ඇය කැමැති නෑ. බාගද මේක වයසට යන ගෑනු පිරිමි කාගේත් පිළිවෙළ වෙන්න ඇති. තමන් පිළිගත්තත් නැතත් අසනීපය ටික ටික වැඩිවෙනවා. මනුස්සයා එන්න එන්නම දුර්වල වෙනවා. ප්‍රශ්නය වෙලා තියෙන්නේ, ඇගේ සෞඛ්‍යය පමණක්

 http://sherlockholmesinvestigations.blogspot.com

නෙමෙයි, ආර්ථික තත්ත්වයත් පිරිහෙන්න පටන් අරගෙන. වැටුප් ගෙවීමට ඇති අමාරුව නිසා සේවකයන් තියාගැනීමත් අපට ප්‍රශ්නයක් වුණා. මෙහේ තත්ත්වය තේරුම් අරගෙන හුගදෙනෙක් රැකියාවෙන් අස්වෙලා යන්න අවසර ඉල්ලුවා. එක් සේවිකාවකට හැරෙන්න අනික් හැමදෙනාටම යන්න අපි අවසර දුන්නා. ඉතුරු කරගත්තේ මුළුතැන්ගෙයි සේවිකාව පමණයි. අමතර ගෙවීමක් නැතිව ගෘහසේවිකාවගේ රාජකාරි කරදෙන්නත් ඇය කැමැතිවුණා. ඒ නිසා ඇයව රඳවා ගත්තා. දැන් ඔබට තේරෙනවා ඇති මුදල් හදල් අතින් අප පත්වී ඇති තත්ත්වය"

"ඔහොම දෙයක් ගැන මට නිකමටවත් හිතුණෙ නැහැ" මං කිව්වා.

"කමක් නැහැ. අපි දුක හැටියකට මුහුණදෙමු." මගේ සැමියා කිව්වේ මා ධෛර්යමත් කරමින්.

"අපි බලමු ඉක්මනින් ඔබ වෙනුවෙන් කාමරයක් සූදානම් කරන්න" ජෙරෙමි කිව්වා. "ඔබ පැමිණි බව මං පෙනිලොප් ආර්යාවට දැනුම්දෙන්නම්"

"එහෙම කියා ඔහු එතැනින් පිටුවෙලා ගියා. සෑහෙන වේලාවකුත් ගතවුණා" ෆැරිංටන් මහත්මිය කීවේ ලේන්සුවෙන් ඇගේ මුහුණේ එකතු වූ ඩහදිය පිසදමමිනි. "ඔහු ආපසු විසිත්ත කාමරයට ආවේ රෝදපුටුවක් තල්ලු කරගෙන.

ඇගේ හැටි දුටුවාම මගේ හදවත වේදනාවෙන් හඬාවැටුණා හෝම්ස් මහත්තයා. ලියුම්වලින් දැනහඳුනාගෙන අපි දෙන්නා ආදරයෙන් කොයිතරම් ළංවෙලා හිටියද? එහෙම ඉඳලා අන්තිමට මං ඇය බලන්න එද්දි ඇගේ තත්ත්වය .... මට විශ්වාස කරන්නත් අපහසු වුණා. ජෙරෙමි තල්ලු කරගෙන ආ රෝද පුටුවට වෙලා ඇය බොහොම අපහසුවෙන් නැමී හිස ඔසවාගෙන හිටියේ. ඇගේ මුහුණ මට පෙනුණේ තුනී සමක් ඇතිරූ හිස් කබලක් වගෙයි. යම් තරමක දීප්තියක් තිබුණේ ඇගේ දෙනෙත්වල පමණයි. මට ඇය පෙනුණේ ඇඳුම් අකුරේ රැඳුණු ඇටසැකිල්ලක් වගෙයි. මුහුණේ රැලි ආවරණය කරගන්න දෝ ඇය තුනී වේල්පොටකින් මුහුණ වසාගෙන සිටියා. නමුත් ඒ හරහා ඇගේ මුහුණේ හැටි මට පෙනුණා. ඇය අපට කථාකළේ බොහොම අමාරුවෙන්, කෙඳිරිගාන හඬකින්. ඇය ජෙරෙමිට නම් බොහොම රළු විධියටයි

http://sherlockholmesinvestigations.blogspot.com

කථා කළේ. මට නම් හිතුණේ මේ අසරණ තරුණයා ඇගේ උවමනා සපුරාලන්න ලොකු උත්සාහයක් දැරූ බවයි. නමුත් ඇගෙන් ඔහුට අනුකම්පාවක් හිමිවුණේ නෑ"

මේ මොහොතේ විදුලි කෙටීමක් සමගම අහස ගුගුරා තවත් අකුණක් පුපුරා යන හඬ අපට ඇසිණ. ඒ අපේ නිවහනට ගෙවල් දෙකක් තුනක් ඈතින් විය යුතුය. රාක්කයෙන් තමන් සොයාගත් පුවත්පත් දෙසට හෝම්ස් එක් මොහොතකට දෙනෙත් යොමු කළේය. මීළඟට ඔහු යළිත් වරක් අවධානය යොමුකළේ ග්‍රේස් ෆැරිංටන් මහත්මිය වෙතය.

"ඔබට පෙනිලොප් ආර්යාවගෙන් අන්තිම ලියුම ලැබිලා කොච්චර කල්වුණාද?" හෝම්ස් ඇසීය.

"මං හිතන්නේ මාස දෙකක් විතර වුණා"

"ඔව්" හෝම්ස් කීවේ හිස ඉදිරියට හා පිටිපසට සොලවමිනි. "මාස දෙකක් කියන්නේ ලොකු කාලයක්. සෑහෙන තරම් දේවල් ඒ කාලයේදී සිද්ධවෙන්න පුළුවන්"

"ඒක සම්පූර්ණ ඇත්ත" මම එකඟවූයෙමි. "පෙනිලොප් ආර්යාවගේ වයසේ අයට මාස දෙකක් කියන්නේත් දීර්ඝ කාලයක්. ඒ වගේමයි, ඔවුන් තමන්ට සමීප, තමන් වෙනුවෙන් කැපවෙලා වැඩකරන දූ දරුවන්ට ඥාතීන්ට හරිම අකරුණාවන්ත වෙන්න පුළුවන්. ටික කාලයකදී හරිම සැර්පරුෂ අය බවට පත්වෙනවා. මේකට හේතුව වයස නිසා මොළයේ පටක ඉක්මනින් මියයාම"

"ඔව්. ඒක එහෙම වෙන්න ඇති" ෆැරිංටන් මහත්මිය කීවාය. "ඒ වුණත් මට පුදුම, ඇය මට කලින් එවා තිබූ ලිපිවල පිළිවෙළ. ඒ ලිපි ඉතාම ආදරයෙන් කරුණාබරව ලියූ වාක්‍යවලින් පිරිලා. ඇය දුටුවට පස්සේ මටම පුදුමයි; මේ ආච්චිද අර ලියුම් ලිව්වේ කියලා. බාගවෙලාවට ඇය මේ දේවල් වෙන කෙනෙකුට කියලා ලියවන්නත් ඇති."

මීළඟට හෝම්ස් තම අසුනේ තවත් ඉදිරියට නැමුණේය. ඔහුගේ කටහඬේ වූයේ නොඉවසිලිමත් බවකි. "හිතවත් ෆැරිංටන් මහත්මිය" ඔහු කීය. "ඔබේ ලොකු ආච්චි හමුවුණු මේ සිද්ධිවීම, ඔබේ හිතේ දුඩි ශෝකයක් ඇති කළ බවට මට සැකයක් නැහැ. ඔබ එයින් කම්පාවට පත්වෙලයි ඉන්නේ. නමුත් ඔබ මා හමුවෙන්න එන්න ඇත්තේ ඒ නිසාය කියල මං හිතන්නේ නෑ"

http://sherlockholmesinvestigations.blogspot.com

"කොහොමටවත් නෑ හෝම්ස් මහත්මයා" ඇය කීවාය. "මං ඔබ හමුවෙන්න ආවේ වෙනත් දෙයකටවා. ඒ මාව අප්‍රමාණ භයකට පත්කළ කරුණක්. මට උවමනා කරන්නේ ඒ ගැන ඔබට දැනුම්දීලා, ඔබේ අදහස් දැනගන්න. ඒක සිද්ධවුණේ අප පැරඩෝල් වලව්වට ඇවිත් එහි නවාතැන්ගත්ත පළමුවැනි දවසේම රාත්‍රියේ.

රාත්‍රී කෑම මේසයට ඇරලා, අපව කෑමට කැඳෙව්වා. පෙනිලොප් ආර්යාව රෝද පුටුවේ තියලා මේසය ළඟට තල්ලු කරගෙන එනු ලැබුවා. සතුටු සාමීචියක යෙදීමට තරම් පරිසරයක් එතැන තිබුණේ නැහැ. අපේ හිත්වල තිබුණු කලකිරීම මගහරවන්න වෙන්න ඇති, ජෙරෙමි උත්සාහ කළා කතාබහක් පටන්ගන්න. නමුත් ඒක ඒ හැටි සාර්ථක වුණේ නැහැ. ජෙරෙමිගේ යාළුවෙක් ඇවිත් හිටියා ලෙස්ටර් හෝන් කියල මහත්මයෙක්. ඉන්දියාව ගැන උනන්දුවක් දැක්වූ ඔහු අපෙන් ප්‍රශ්න රාශියක් ඇහුවා. අපි ඒවට පිළිතුරු දුන්නා. පෙනිලොප් ආර්යාව ඇගේ රෑ කෑම ඉක්මනින් අවසන් කළා. ඊළඟට ඇය ජෙරෙමිට නියෝග කළා තමාව ඉක්මනින් කාමරයට ගෙනයන ලෙසට. ඊට පැයකට විතර පස්සේ මමත් සැමියාත් අපේ නිදන කාමරයට ගියා.

එදා රාත්‍රියේ මොකුත් වැස්සක් හෝ කුණාටුවක් තිබුණේ නැහැ. ඒ වුණත් මට පොඩ්ඩක්වත් නින්ද ගියේ නැහැ. ඒකට හේතුව නුපුරුදු ගෙදරක, නුපුරුදු ඇඳක නිදාගන්න තැත්කිරීමද මම දන්නේ නෑ. එහෙමත් නැත්නම් දීර්ඝ ගමනක යෙදීම නිසා ඇඟට දැනුණු විඩාවද කියන්න මට තේරෙන්නේ නැහැ. කොහොම වුණත් මට නින්ද ගියේම නැහැ. බාගවේලාවට අපට දකින්න හා අහන්න ලැබුණු දෙයින් හිතේ ඇතිවුණු කැළඹීම, නොසන්සුන් බව වෙන්නත් පුළුවනි. පැය කීපයක්ම මං ඇඳේ ඒ මේ අතට පෙරළෙමින් හිටියා. දෙවියන්ට පින්සිද්ධවෙන්න මගේ සැමියාට නම් හොඳට නින්ද ගිහින් තිබුණා. කකුලේ තිබූ බරපතල තුවාලය නිසා ඔහුට නින්ද අවශ්‍යවෙලයි තිබුණේ. ඒක ඔහුට නොඅඩුව ලැබීම මගේ හිතට ලොකු සහනයක් වුණා. ඒත් මං හිටියේ සම්පූර්ණයෙන්ම අවදිව.

ඈත ඔරලෝසුවක රෑ එක වදින ශබ්දය මට ඇහුණා. තවදුරටත් ඇඳට වෙලා ඉන්න, මට පුළුවන් කමක් තිබුණේ නැහැ. මං ශබ්ද නොකර ඇඳෙන් නැගිටලා, මගේ ඩ්‍රෙසිං ගවොම ඇඳගෙන

http://sherlockholmesinvestigations.blogspot.com

සෙරෙප්පු දෙක දෙපගේ දමාගත්තා. මුළුතැන්ගෙට ගිහින් කිරි උණුකරලා උණුසුම් කිරි වීදුරුවක් පිළියෙල කරගන්නයි මං හිතුවේ. ඒ මගින් නින්දට යෑම පහසුවේවි කියල මට හිතුණා.

ඉතින් මම ශබ්ද නොනගා කාමරයෙන් එළියට ඇවිත් ඉටිපන්දමක් දල්වා ගත්තා. ඊටපස්සේ ඒ ඉටිපන්දමේ එළියෙන් හෙමින් හෙමින් තරප්පු පෙළ බැස්සා. නිවස මැදින්ම වැටී තිබුණා ප්‍රධාන කොරිඩෝවක්. ඒක දෙපැත්තේම කාමර. මේ කොරිඩෝව දිගේම ගියාම මට මුළුතැන්ගෙට ළඟාවෙන්න පුළුවන් බව මං දැනගෙන හිටියා. නමුත් මගේ කිරිවීදුරුව වෙනුවෙන් ගෙදර සේවිකාව අවදිකරන්න මං හිතුවේ නැහැ. දල්වූ ඉටිපන්දමක් අතේ අරගෙන, මම කොරිඩෝව දිගේ ගියත්................"

ඇය කථාව නැවැත්වූවාය.

"ඇයි මොකක්ද සිදුවුණේ?" හෝම්ස් ඇසුවේ නොඉවසිල්ලෙනි. ඇය මුහුණදුන් අත්දැකීමක බියකරු බව සිහිවීමෙන් දෙර ග්‍රේස් ෆැරිංටන් ගේ මුහුණ සුදුමැලි වී තිබිණි.

"...................... ය්. ඒ වෙලාවේදී අපට බලාපොරොත්තුවිය හැකි විධියමයි." ඇය කීවාය. "කොරිඩෝවේ කිසිකෙනෙක් හිටියේ නෑ. ඒ වුණත් මං ඉටිපන්දමත් එළිය කරමින් කොරිඩෝව දිගේ ඉදිරියට ගියා. එහි බාගයක් පමණ දුර ගියාම හමුවෙන කාමරයක දොර විවෘතව තිබූ හැටි මං ඈතදීම දුටුවා. එහි තිබූ දූර්වල එළියක් කොරිඩෝවට වැටී තිබුණා. මං එතැනට ළංවෙද්දී මහ පුදුමාකාර ශබ්ද වගයක් ඒ කාමරය පැත්තෙන් අහන්න ලැබුණා.

හැකි තරම් දුරට නිශ්ශබ්දව මං ඉදිරියට පියවර කිහිපයක් ගියා. එතැනට ළං වෙද්දී එක්තරා දේවල් දෙකක් දොරෙන් එළියට තල්ලුවී තිබුණු හැටි මං දුටුවා. එතැනට ළංවුණු මම ඒ දේවල් ඇහිදලා මගේ අතට ගත්තා. අතේ තිබුණු ඉටිපන්දමේ එළියෙන් ඒ මොනවද කියල දකගන්න මට හැකිවුණා. එකක් රෙදිවලින් මැසූ කාන්තාවන් පළඳින අත්වැස්මක්. ඒකෙ අසාමාන්‍ය ආකාරයේ පැල්ලම් වගයක් දකින්න ලැබුණා. ඒකෙ මැණික්කටුව හරියේ කාගේ හරි නමක මුල්අකුරු එම්බ්‍රොයිඩර් කර තිබුණා. මට හම්බවුණු අනික් බඩුව වුණේ පුංචි බිළිඳුන් නැළැවීමට ගන්නා "රැට්ල්" එකක්. මේක මගේ අතේ එහා මෙහා සොලවද්දී මිහිරි නාදයක් නැගුණා. නමුත් මා පුදුමයට පත් කළ කරුණ මොකක්ද දන්නවද? මේ ගෙදර කිසිම බිළිඳු දරුවෙක් තියා ලොකු ළමයෙක් වත් හිටියේ නැහැ.

 http://sherlockholmesinvestigations.blogspot.com

පෙනිලොප් ආර්යාවට දඬුවන් හිටියේ නැහැ. මේ ගෙදරට පුංචි ළමයි ආගිය බවක් සඳවත් ඇය මට එවූ ලිපියක කියල තිබුණෙත් නැහැ.

ඒ වෙලාවේ එක්වරම කොහෙන්දෝ හමා ආව සුළඟකින් මගේ ඉටිපන්දම නිවුණා. මං හිටියේ හොඳටම ආවරණය වුණු තැනක. නමුත් ඉටිපන්දම නිවෙන්න තරම් සුළං පහරක් එතැනට ආවේ කොහොමද? නමුත් සිදුවුණේ එයයි. කොහොම හරි නිරායාසයෙන්ම මගේ දෙනෙත් යොමුවුණේ අර කාමරය දෙසට. හෝම්ස් මහත්මයා, මං ඔබට කිව්වා කාමරය පෙනෙන තෙක් මානයක යම් එළියක් තිබුණු බව. මගේ ඉටිපන්දම නිවී ගියත් මේ අද්භූත කාමරය ඇතුළත බලන්න මට අපහසුවක් වුණේ නැහැ. දැල්වුණු ආලෝකයක් නොතිබුණත් මේ කාමරයේ තිබුණේ කහපැහැති අද්භූත එළියක්. ඉතා දීප්තිමත් නෙවෙයි. නමුත් කාමරය ඇතුළත යන්තමින් දකගැනීමට ඒ එළිය ප්‍රමාණවත් වුණා.

මං ඔබට කලින්නුත් කිව්වා වගේ, මං අවතාර විශ්වාස කරන කෙනෙක් නෙමෙයි. ඒ වුණත් ඒ මොහොතෙ නම් අවතාර කියල දෙයක් මෙලොව තියෙන බව පිළිගන්න මට සිදුවුණා. කාමරයේ තැන් දහයකින් දොළහකින් දීප්තිමත් ඇස් මා වෙත යොමු වී තිබුණා. ඒ පහළ මට්ටමේන් නෙවෙයි: කාමරයේ බොහොම ඉහළින්.

ඒ කුටියේ මට පෙනුණේ අරුණු වනසතුන්ගේ හැඩහුරුකම ඇති භයානක යක්ෂයින් රැසක් කියලයි මට හිතුණේ. සතෙකු ගොරවන හඬක් නැත්නම් කෙඳිරිගාන ශබ්දයක් ඒ කුටියෙන් පිටවුණු බව මට සහතිකයි. ඒ වගේම මට දකින්න ලැබුණා තවත් අරුම පුදුම දෙයක්. දැලකින් කොටුකර තිබූ කුඩුවක් වගේ එකක හිටියා ප්‍රාණියෙක්. ඒ මනුෂ්‍යයෙක්ද සතෙක්ද කියා ඔබට කියන්න අමාරුයි. නමුත් ඌට එළියට ඒමට නොහැකි වන සේ තිබූ යකඩ දැලක් අතින් අදිමින්. කෙඳිරිගාමිනුයි ඌ හිටියේ. ඒක තමයි ඒ කාමරයේ මට දකින්න ලැබුණු භයානකම දෙය!"

"දෙයියෝ සාක්ෂි!" මට කෑගැසිණ. එම කථාවට බාධා කිරීම ගැන හෝම්ස් ක්ෂණිකව මා වෙත හෙළුවේ අමනාප බැල්මකි.

"ෆැරිංටන් මහත්මිය" හෝම්ස් කීය. "කරුණාකර ඔබේ කථාව දිගටම කියන්න. ඔබේ විස්තරයට මම සම්පූර්ණ අවධානය යොමුකරගෙනයි ඉන්නේ"

"මං මගේ ජීවිතේටම මේ වගේ හයකට පත්වෙලා නැහැ හෝම්ස් මහත්මයා" ඇය කීවාය. "මං ඒක පිළිගන්නවා. මගේ අතේ තිබුණු සෙල්ලම් බඩුව හා කාන්තා අත්වැස්ම, මා අතින් ගිලිහුණා. මං වහාම ආපහු හැරිලා දිව්වා. මං කොයිතරම් ඉක්මනට ආපහු හැරිලා කොරිඩෝවට ඇවිසුණාද කිව්වොත්, මගේ සෙරෙප්පුවකුත් කකුලෙන් ගැලවිලා ගියා. ඒක ගන්නවත් මං හිටියේ නැහැ. මං කෙළින්ම දිව්වේ තරප්පු පෙළියට. කළුවරේම ඒක නගින්න ගිහින් දෙතුන් වාරයක් පය පැටලී මාව වැටෙන්නත් ගියා. නමුත් කොහොම හරි මග ඇද නොවැටී අපේ කාමරයටම ආපහු දුවගෙන යන්න මට හැකිවුණා.

කාමරයට ඇවිත් ඇඳට වැටෙද්දී මට හොඳටම හති. ඊළඟට මං කළ යුත්තේ මොකක්ද කියන එක මට හිතාගන්න බැරිවුණා හෝම්ස් මහත්මයා. මං මුහුණදුන් ඒ අත්දැකීමෙන් හිතේ ඇතිවුණු භීතිය තනියම දරාගන්න මට හැකියාවක් තිබුණේ නැහැ. මං වහාම මගේ සැමියා අවදිකළා. ගැඹුරු නින්දකට වැටී සිටි ඔහුට අපි මේ ඉන්නේ කොහේද කියන එක තේරුම්ගන්න මඳ වේලාවක් ගතවුණා. ඊළඟට, මං මුහුණදුන්නු දේවල් හැමදෙයක්ම මං ඔහුට කිව්වා. මං කොයිතරම් කැළඹීමකට පත්වෙලා හිටියද යන්න ඔහුට තේරුම් යන්න ඇති. මගේ අත්දෙකම අල්ලාගත් මගේ සැමියා මාව සන්සුන් කරන්න උත්සාහ කළා.

"ඔන්න ඔන්න" ඔහු කීවා. "ඔයා හොඳටම වෙවුලනවා. හයවෙන්න කිසි දෙයක් නැහැ ග්‍රේස්. ඔයා නරක හීනයක් දැකල. එච්චරයි"

"ජේම්ස්" මං කිව්වා. "මට එක මොහොතක් නින්ද ගියේ නැහැ. ඉතින් කොහොමද මං හීන දකින්නේ? ඔයාට මං කියන දේ විශ්වාස නැද්ද? එන්න යන්න මාත් එක්කම. මං පෙන්වන්නම් මං හයවුණේ මොකකටද කියල"

ඔහු මාව කොපමණ සනසන්න හැදුවත්, ඔහු කියූ දේවල් මං පිළිගත්තේ නෑ. "ජේම්ස්. මේ ගෙදර මොකක් හරි භයානක දෙයක් සිද්ධවෙනවා. ඒක මට හොඳටම විශ්වාසයි. ඒක මොකක්ද කියල දැනගන්න තුරු, මට තවත් එක මොහොතක් මේ ගෙදර නින්ද යන එකක් නැහැ"

"කමක් නෑ. මං එන්නම් ඔයත් එක්ක යන්න" ජේම්ස් කිව්වා. "අපි ගිහින් බලමු ඔයා මොකකටද මේ හයවෙලා තියෙන්නෙ කියල. දෙන්න මගේ සැරයටිය මෙහාට"

 http://sherlockholmesinvestigations.blogspot.com

ඇඳ ළඟ තිබුණු රාක්කයක ලන්තෑරුමක් තිබුණා. ඔහු ඒක දල්වාගෙන මා සමග තරප්පු පෙළ බැස්සා. විශ්වාස කරන්න මහත්වරුනි. අර බිහිසුණු කුටිය යළිත් වරක් දකින්න මට කිසි උවමනාවක් තිබුණේ නැහැ. ඒ වුණත් මගේ නිර්භීත සැමියා සමග මං ඒ ගමන ගියේ ඇයි? මට උවමනා වුණා ඔහුට පෙන්වන්න, ඒක මං දුටු හීනයක් නොවන විග.

අපි කොරිඩෝවෙ ඉදිරියට යද්දී අර කාමරයේ දොර තවමත් විවෘතව තිබුණා. මගේ කකුලෙන් ගැළවී ගිය සෙරෙප්පුව තවමත් කොරිඩෝවේ පැත්තක තිබුණා. මගේ සැමියා ඉදිරියෙන් ගියේ, ඔහු අතේ තිබුණු ලන්තෑරුමෙන් කොරිඩෝව එළිය කරමින්. මගේ සෙරෙප්පුව තිබුණත් අර බිලිඳු සෙල්ලම් බඩුව හෝ කාන්තා අත්වැසුම එතැන තිබුණේ නැහැ. ඒවා අතුරුදන් වෙලා. මට හොඳට මතකයි. මං ආපහු පැනදුවද්දී ඒවා කොරිඩෝවේ දමා ආ බව.

මං ඊටත් වඩා පුදුමයට පත්වුණේ අර කාමරයේ ඇතුළත දැකලා. අප ගෙනගිය ලන්තෑරුමෙන් ඒ කාමරය හොඳින් ආලෝකමත් වුණා. දැන් මට දකින්න ලැබුණේ මේ කාමරය බොහොම ඉඩකඩ තිබුණු කාමරයක් බවයි. බිත්තිවල අලංකාර තෙල්සායම් චිත්‍ර කිහිපයක් එල්ලා තිබුණා. ඊට අමතරව මේස හා පුටු කිහිපයක්ම තිබුණා. එහි සීලිම තිබුණේ හුගක් ඉහළින්. කොටින්ම කියනවා නම් ඒක මං දුටු බියජනක කාමරය නෙමෙයි. දිළිසෙන ඇස් තිබූ යක්ෂයින් හා කුරිරු සතුන් ඔක්කොම අතුරුදන් වෙලා. මෙහි පොළොවේ එළා තිබුණා අලංකාර පෙරදිග බුමුතුරුණක්. වටිනා ලීයෙන් තැනූ කැබිනට් මත, වීදුරු බඳුන්වල දැමූ මල් තිබුණා.

පුදුමයට පත්වුණු මම ඊළඟට පත්වුණේ හරි ලැජ්ජාවකට. මගේ සැමියා මේ හැමදෙයක් දිහාම බලලා, ඊළඟට මං දිහා බැලුවේ උපහාසාත්මක සිනාවක් සමග. මං මොන තරම් බොරුකාරයෙක්ද කියලා ඔහුට හිතෙන්න ඇති. මං කී දේවල් ඔප්පු කළ හැකි කිසිම සාක්ෂියක් ඒ කාමරයේ අපට දකින්න ලැබුණේ නැහැ. තත්ත්වය වඩාත් නරක අතට හරවමින්, අපට ඇහුණා, කවුරුත් හෝ තරප්පුව බැස කොරිඩෝව දිගේ ඉදිරියට එන බව. ඒ ජෙරෙමි - මගේ ඥාති සොහොයුරා.

"ඇයි මොකක්ද ප්‍රශ්නෙ?" ජෙරෙමි ඇසුවේ ඔහුගේ නිදිබර දෙනෙත් පිසදමමින්.

http://sherlockholmesinvestigations.blogspot.com

"මොකුත් ප්‍රශ්නයක් නැහැ කියලයි මට හිතෙන්නේ" ජේම්ස් කිව්වා. "මං හිතන්නේ මගේ බිරිඳ මොකක්දෝ භයානක හීනයක් දැකලා. එච්චරයි"

"නපුරු හීනයක්?" ජෙරෙමි ඇහුවා.

"මට නම් හොඳටම විශ්වාසයි. මං මොකක් හරි භයානක දර්ශනයක් මේ කාමරයේ හුඹු බව" මං කිව්වා. "නැත්නම් මගේ සෙරෙප්පුව මෙතැන වැටුණේ කොහොමද?"

"එහෙම නම් ඔබ නින්දෙන් ඇවිදින්න ඇති" ජෙරෙමි කිව්වා. "මටත් ඉන්නවා නංගි කෙනෙක්. ඇය ඔහ ඒට ගේ ඇතුළෙ ඇවිදිනවා. සමහරවිට දොරවල් ඇරගෙන ගේයින් එළියටත් යනවා."

"නැහැ! මේක හීනයකින් ඇවිදීමක් නොවෙයි." මට කෑගැහුණා. "බාගවෙලාවට මං දුටුවේ ඊළඟ කාමරයද දන්නෙ නැහැ" ·

ජෙරෙමි එය විවෘත කරන තුරු මං බලාහිටියේ නැහැ. මම ම එය විවෘත කළා. ඒක භෝජනාගාරයට කෑම සූදානම් කිරීම සඳහා පිඟන් සහ හැඳි ගෑරුප්පු තබා තිබූ සේවක කාමරය. ඊළඟ එක භෝජනාගාරය. කොරිඩෝවේ තිබූ කාමර හැම එකක්ම මගේ සෝදිසියට ලක්වුණා. නමුත් මා දුටු බිහිසුණු දර්ශනය සහිත කාමරයක් නම් මට දකින්න ලැබුණේ නැහැ. හෝම්ස් මහත්මයා. මගේ ජීවිතේට කවදාවත් මං මේ තරම් ලැජ්ජාවකට පත්වෙලා නැහැ.

මීළඟට මට මුහුණදෙන්න සිදුවුණේ තවත් දේකට. කොරිඩෝවේ අනෙක් පැත්තේ තිබුණු කාමරයක් තමයි පෙනිලොප් ආර්යාවගේ නිදන කාමරය හැටියට සකස් කරල දීල තිබුණේ. ඒ මොකද ඇගේ දුර්වලකම නිසා තරප්පුව ඉහළට නැගීමට ඇයට හැකියාවක් තිබුණේ නැහැ. කොරිඩෝවට වෙලා අප කළ කතාබහට හා ශබ්දවලට ඇයට නින්දෙන් ඇහැරිලා. හෝම්ස් මහත්මයා. ඔබ දන්නවා වයස්ගත අයට නින්ද යනවා හොඳටම අඩුයි. ඇත්තටම නින්ද ගියත් ඔවුන් හිතන්නේ නින්ද ගියේ නැහැ කියලා. මේ ශබ්දවලින් ඇහැරුණු නිසා ආර්යාවට හොඳටම කේන්ති ගිහින්. එවෙලේ මගේ හිතේ ඇතිවුණු හැඟීම් කොහොම විස්තර කරන්නද කියලා මට තේරෙන්නේ නැහැ. මං ගිහින් මගෙන් වුණු හිරිහැරයට ඇගෙන් සමාව ඉල්ලුවා. ඊට පස්සෙ මම සැමියාත් සමඟ අපේ නිදන කාමරයට ගියා. එළිවෙන යාමයේ

http://sherlockholmesinvestigations.blogspot.com

මට පැයක් හෝ දෙකක් යන්තම්න් නින්ද යන්න ඇති. නමුත් මට දුනුණේ ලොකු අපහසුවක්"

කථාව හොඳින් තේරුම් ගත් බව හඟවමින් හෝම්ස් හිස සෙලෙව්වේය. "ඊට පස්සේ දවල් වෙලාවේ ගිහින් ඔබ ඒ කුටි සෝදිසි කරල බැලුවද?"

"ඇත්තෙන්ම ඔව් මහත්මයා" ඇය කීවාය. "මගෙ සැමියාත් මගෙ උදව්වට ආවා. කලින් දවසේ රාත්‍රියේ අප කළ කලබලය නිසා ටිකක් පරෙස්සම් වෙන්න අපට සිදුවුණා. අපේ සෝදිසිය කළේ අනෙක් අයගෙ අවධානයට ඒ නොහැම් ලක්නොවන විධියට. ඒත් හැමතැනකම දකින්න ලැබුණේ පැරණි වලව්වක දකින්න ලැබෙන විධියමයි. මං දුටු බිහිසුණු කුටිය කිසිම සලකුණක් ඉතිරි නොකර සම්පූර්ණයෙන්ම අතුරුදන්වෙලා ගිහින්. ජේම්ස් නම් කියන්නෙ එක්කෝ මේක හීනයක්. නැත්නම් මගෙ හිතේ මැවී පෙනුණු මායා දර්ශනයක් කියලයි. නමුත් ඔබ දෙදෙනාට මං සහතික වෙන්නම් මහත්වරුනි. මං ඒ දුටු දේ සත්‍යයක්මයි! ඒක කොහොමටවත් මායා දසුනක් නොවෙයි".

අසුනෙන් නැගී සිටි ෂර්ලොක් හෝම්ස් දෑත් පිටිපසට බැඳගෙන කාමරයේ ඉහළ පහළ ඇවිදීමට පටන් ගත්තේය.

"ඔබට හොඳටම විශ්වාසද ඔබ පසුව ගියෙත්, කලින් ගිය කොරිඩෝවෙමයි කියලා?" හෝම්ස් ඇසීය.

"මට හොඳටම විශ්වාසයි"

"ඔබට දකින්න ලැබුණු බිහිසුණු දර්ශනය ගැන ඔබ පෙනිලොප් ආර්යාවට කිව්වද?"

"මං කිව්වෙ නෑ. හෝම්ස් මහත්මයා. ඇයි ඔබ එහෙම අහන්නේ? ඇගේ අයහපත් සෞඛ්‍ය තත්ත්වය නිසා ඒ ගැන නොකියන එක වඩාත් හොඳයි කියල මට හිතුණා"

"ඊට පස්සේ වෙන මොනවා හරි අසාමාන්‍ය දෙයක් ඒ ගෙදර සිදුවුණාද?"

"නැහැ හෝම්ස් මහත්මයා. කලින් දවසෙ රාත්‍රියේ වගේ එකක් නම් සිදුවුණේ නැහැ. ඒ වුණත්......... ඒ වුණත් මට වචනයෙන් කිව නොහැකි විධියේ මොකක් හරි දෙයක් අප වටා පවතිනවා."

"මොන වගේ දෙයක්ද?" හෝම්ස් ඇසීය.

"හෝම්ස් මහත්මයා, පිරිමින්ට නොතේරෙන සමහර දේවල් ගැහැනුන්ට ඉවෙන් වගේ දැනෙනවා. එහෙම දෙයක් වැටහෙන්නේ

http://sherlockholmesinvestigations.blogspot.com

කොහොමද කියල ඇහුවොත්, ඒකට දිය හැකි පිළිතුරක් මා ළඟ නැහැ. නමුත් මට නම් හිතෙන්නේ කොතැනක හරි මොකක් හරි වැරැද්දක් තියෙනවා................"

"ඔබට පුළුවන්ද ඒකට ආසන්නතම සිදුවීමක් අපට කියන්න?"

"මට හිතෙනවා ලොකු ආච්චි - ඒ කියන්නේ පෙනිලොප් ආර්යාව, ඇය දන්නා හැම දෙයක්ම අපට කිව්වේ නැහැ කියලා. මට වෙලාවකට හිතෙනවා ඇය, අප පැරඩෝල් මන්දිරයට කැඳවා ගත්තේ වෙනත් උවමනාවකටද කියලා. නමුත් ඒ මොකක්ද කියලා මට හිතාගන්න බැහැ.

ආර්යාවගේ මොකක් හරි රාජකාරියක් සඳහා ජෙරෙමි අද ලන්ඩනයට එන බව අපට ඊයේ කිව්වා. ඉතින් මාත් මගේ සැමියාත් ඔහු සමග ගෙන එන්න කියලා අපි ඔහුගෙන් ඉල්ලා හිටියා. අපි බොරුවට කිව්වේ අපට සාප්පු ගිහින් බඩුමුට්ටු ගන්න තියෙනවා කියලයි. මගේ අරමුණ වුණේ වහාම ඇවිත් ඔබව හමුවෙන්න. ජේම්ස් ගියා හමුදාවෙ ඔහුගේ පරණ මිතුරන් කිහිපදෙනෙකු හමුවෙන්න. මං ඉක්මනින් ඔහු වෙත ආපසු යායුතුයි"

"ජෙරෙමි වොල්කොට් ලන්ඩනයට ආවෙ මොන කටයුත්තකටද? ඔබට අහන්න ලැබුණෙ නැද්ද ඒ ගැන?"

"ආ...............ඔව්" ඇය කීවාය. "විස්තර හැමදෙයක්ම මං දන්නෙ නෑ. නමුත් ඔවුන් කතාබහ කරද්දී මට යන්තමින් ඇහුණා. ඔහු එන්නෙ නීතිඥයෙක් හමුවෙන්න. ආර්යාව ඔහුට කිව්වා මට මතකයි........ අද හවසට නීතිඥයා නොවරද්දාම පැරඩෝල් මැඳුරට ගෙන්විය යුතු බව. ඇය ඒ කරුණ තදින් අවධාරණය කළා." කථාව අවසන් කළ ග්‍රේස් ෆැරිංටන් තම අසුනෙන් නැගිට්ටාය.

"ඉතින් හෝම්ස් මහත්මයා. ඔබ මට දෙන උපදේශය මොකක්ද? මගේ හිතේ ඇතිවූ කුතුහලය මෙන්ම ගැටලුව තවමත් එහෙමමයි. ඒක මං විසඳා ගතයුතුමයි. නැත්නම් මට එක මොහොතක් සැනසිල්ලේ කාලය ගතකරන්න බැරිවේවි. ඔබට හිතෙන්නේ මං හරි මෝඩයි කියලද?"

"මං කොහොමටවත් එහෙම හිතන්නේ නෑ ෆැරිංටන් මහත්මිය" හෝම්ස් කීය. "ඔබ මෝඩයි කියල මට හිතන්න වෙන්නේ ඔබ ඇත්ත සොයා නොගියොත්.

හොඳයි. දැන් මං කියන දේට කන්දෙන්න. ඔබ කළ යුත්තේ මෙයයි. ඔබ හිතාගෙන හිටි විදියටම ආපහු ඔබේ සැමියා වෙත

 http://sherlockholmesinvestigations.blogspot.com

යන්න. අපේ මේ හමුවීම ගැන ඔහුටවත් කියන්න එපා. ඔබ දෙදෙනා ජෙරෙමි සමග ආපසු පැරඩෝල් මැඳුර වෙත යායුතුයි. එහිදී සාමාන්‍ය විධියටම ඉන්න. මොකුත් අමුත්තක් පෙන්වන්න එපා. නමුත් හොඳ කල්පනාවෙන් ඉන්න. අද හවස තුන පමණ වෙද්දී මමත් දෙස්තර වොට්සනුත් පැරඩෝල් මන්දිරය වෙත එනවා. ඒ ඇවිත් අපි හොයා බලන්නම්"

කාන්තාව ඇගේ අත්බෑගයෙන් කඩදාසියක් එළියට ගත්තාය. "මන්දිරයට එන මාර්ගය මං කල් ඇතුව මේකෙ ඇඳගෙන ආවා. එතකොට ඔබට පහසුවේවි. ඒ හැරුණත් මගදී කාගෙන් හරි අහලා දැනගන්න බැරිකමකුත් නැහැ"

"මේක අගනා අදහසක්" හෝම්ස් කීවේ සතුටෙනි.

වියළීම සඳහා එල්ලා තිබූ ඇගේ වැහිකබාය හා කුඩය රැගත් හෝම්ස්, ඒවා ඇය අතට දුන්නේය. මම ඇය වෙනුවෙන් දොර විවෘත කරගෙන සිටියෙමි.

"ඔබට බොහොම ස්තුතියි" ශ්‍රේස් ඇරිංටන් අපට කීවාය. "ඔබත් සමග කථාකළාට පස්සේ මගේ හිතට සැහෙන සහනයක් දැනෙනවා."

"මට හොඳටම විශ්වාසයි, ඔබට ඔබේ ගැටලුව විසඳා දීමට අපට හැකිවෙන බවට. අද හවස හමුවෙමු" මගේ මිත්‍රයා කීවේ හිස පහත් කොට ඇයට ආචාර කරමිනි.

"හෝම්ස්. ඔබ කොහොමද කියන්නේ මේක විසඳා දෙන්න පුළුවන් බව හොඳටම විශ්වාසයි කියලා?" මා ඔහුගෙන් ඇසුවේ දොර වසා දැමීමෙන් පසුවය. "මේ යක්ෂයින්, අවතාර, හොල්මන් වගේ බහුබූත කොහොමද විසඳන්නේ? සමහරුන්ට නම් මේවා දකින්න ලැබෙනවා. ඒත් අපට දකින්න ලැබෙන්නේ නැහැ. ඔබ යක්ෂ අවතාර ගැන විශ්වාස කරනවද?"

මගේ මිත්‍රයාගේ මුහුණේ දකින්නට ලැබුණේ බරපතල ගැටලුවකට මුහුණ දුන් ලකුණුය. "වොට්සන්. මේ ලෝකයේ යක්ෂයින් හරියට ඉන්නවා. නමුත් උන් ඔක්කොම අවතාර හෝ හොල්මන් නොවෙයි. උන් මනුස්සයින්ගේ ලේ උරාබොන්නෙත් නෑ. වවුලන් බවට හැරිලා අහසේ පියාසර කරන්නෙත් නෑ............ ඒකෙන් කමක් නෑ. ඇරිංටන් මහත්මිය ගැන ඔබට මොනවද හිතෙන්නෙ වොට්සන්?"

http://sherlockholmesinvestigations.blogspot.com

"මට නම් හිතුණේ ඇය එඩිතර කාන්තාවක් කියලයි" මම පිළිතුරු දුන්නෙමි. "ඔබ අහන්නේ මගේ මතය වෛද්‍යවරයෙකු හැටියටද? සැකයක් නෑ. ඇය නිරෝගී මනසක් ඇති ස්ත්‍රියක්. බාගෙට පිස්සු හැඳුණු ගෑනියක් නොවෙයි. මොකක් හරි සැඟවුණු ප්‍රශ්නයක් ඇයට තියෙනවද කියල නම් මම දන්නෙ නැහැ."

"ඔබේ මතයට මං එකඟවෙනවා" ඔහු කීය. "ඇය විස්තර හැමදෙයක්ම පැහැදිලිව ඉදිරිපත් කළා. ඇත්තෙන්ම ඇය බුද්ධිමත් කාන්තාවක්. ඒ නිසා ඇය කියූ දේවල් සුළුකොට හිතලා අමතක කරන්න පුළුවන් කියලා මං හිතන්නේ නෑ."

"හෝම්ස්. ඔබ හිතන්නේ ඇය විස්තර කළ දර්ශනය, ඇය ඇත්තටම දුටු සත්‍ය එකක් කියලද?"

"ඇය එවැනි දෙයක් දුටු බව මට විශ්වාසයි" ඔහු කීය. "නමුත් බාගවෙලාවට ඇයට දකින්න ලැබුණු දේ උවමනාවටත් වඩා විශාලව, බිහිසුණුව ඇගේ හිතේ මැවුණා වෙන්නත් පිළිවන්."

"ඒක මොන වගේ දෙයක් කියලද ඔබ හිතන්නේ?" මම ඇසීමි.

"විය හැක්කේ මෙයයි කියලා අදහස් කිහිපයක්ම මගේ හිතට නැඟුණා." හෝම්ස් කීය. "නමුත් මට ප්‍රමාණවත් තරම් දත්ත නෑ. එයින් සමහරක් ලන්ඩනයෙන් එකතුකරගත යුතු ඒවා. තවත් සමහරක් දකින්න වෙන්නෙ පැරඬෝල් මන්දිරයේ. ඒ සියල්ලම ලැබෙන තුරු මතයක් ඉදිරිපත් කරන්න බෑ වොට්සන්."

එසේ කී මගේ මිත්‍රයා ඔහුගේ ගමන් කබාය හා කැප් තොප්පිය අතට ගත්තේය. පසුගිය සති කිහිපය තිස්සේ ඔහු කාලය ගතකළේ පරීක්ෂණ කිසිවක් නොමැතිව ඉතා අලස අයුරෙනි. දැන් එය එක් ක්ෂණයකින් වෙනස් වී ඇත.

"මොකද මිත්‍රයා කියන්නේ?" ඔහු විමසීය. "ඔබ එනවද මේ පරීක්ෂණයටත් මා සමග හවුල්වෙන්න? එහෙම නම් අපි වහාම පිටත්වෙමු."

"ඔබේ සහයට එන්න ලැබෙනවා නම් ඒක මට ලොකු සතුටක්"

ෆැරිංටන් මහත්මිය පිටත් වී ගියත්, අප විසින් ලන්ඩනයේ සම්පූර්ණ කරගත යුතු කාරණා රැසක් ඇති බැව් මගේ මිත්‍රයා කීය. ඒ අනුව අපි ප්‍රථමයෙන් වෙස්ට්එන්ඩ් පෙදෙස බලාගියෙමු. ඉහළ පෙළේ නිවාස හා විලාව් සඳහා සේවක සේවිකාවන් සපයා දෙන

 http://sherlockholmesinvestigations.blogspot.com

රැකියා ඒජන්සි කිහිපයක් තිබුණේ වෙස්ට්එන්ඩ් ප්‍රදේශයේය. හෝම්ස්ට සතුටුදායක පිළිතුරක් ලබාගත හැකිවූයේ, අප ගිය පස්වැනි ආයතනයේදීය. එතැන භාරව සිටියේ කලිනන් නම් මහතෙකි. පැරඩෝල් මන්දිරයෙන් ඉවත්කරනු ලැබූ සේවකයන් කිහිපදෙනෙකු ගැනම කලිනන් මහතාට මතක තිබිණ. ඔවුන් ගැන තොරතුරු භාරා අවුස්සා ගැනීමට හැකිවූයේ හෝම්ස්ගේ දක්ෂතාවය නිසා යයි මට සිතිණ.

"හරිම කණගාටුදායක සිද්ධියක් මහත්මයා" කලිනන් මහතා අපට කීය. "ප්‍රධාන ගෘහසේවකයා මන්දිරයේ අවුරුදු 30ක් සේවය කරල තිබුණා. තවත් සේවක සේවිකාවන් කිහිපදෙනෙක්ම අවුරුදු පහළොවක් හෝ ඊට වැඩිය සේවය කළ අය. අවුරුදු දහයකට දෙළහකට කලින් නේ හෙන්රි සාමි මියගියේ. මේ අය හැමදෙනෙක්ම හෙන්රි සාමිව හොඳින් දැනගෙන හිටියා. ඔවුන් හැමදෙනෙක්ම ජීවත්වෙලා තිබුණේ එක පවුලේ අය වගේ සුහදව. නමුත් පෙනිලොප් ආර්යාව බංකොලොත්වුණාම ඔවුනට යන එන මං නැතිවුණා. හුග දෙනෙක් අස්කරල තිබුණේ කලින් දැනුම්දීමක් නොමැතිව. ඒ මදිවාට ඉදිරි කාලය සඳහා දීමනාවක් වත් ලැබිල තිබුණේ නැහැ."

"ඔව්. ඒ ඉතින් මාස ගණනාවකට කලින් නේද?" හෝම්ස් ඇසීය.

"මාස කිහිපයකට............" කියමින් කලිනන් මහතා ලොකු පොතක් අතට ගෙන පිටු පෙරළුවේය. "ඔව් මේ තියන්නේ.......................... හරියටම කියනවා නම් සති හතකට කලින්. සේවිකාවන් දෙදෙනෙකුට සහ උද්‍යාන පාලකයාට මං රැකියාවන් හොයල දුන්නා. ප්‍රධාන ගෘහසේවකයාටත්, මුළුතැන්ගෙයි සේවිකාවටත් සතුටුදායක රැකියා තවම ලැබුණේ නැහැ. අනික් සුළුසේවකයන් කිහිපදෙනෙකුටත් නැහැ."

එසේ කියූ කළමනාකරු අප දෙස බලාසිටියේ දල්වා ගත් දෙනෙතිනි. "ඉතින් මහත්වරුනි. ඔබ දෙදෙනාගෙන් කාට හරි මං අර කියූ සේවකයෙක් උවමනා වෙනවා නම්..............................."

"කණගාටුයි කියන්න. දැනට නම් අවශ්‍ය වෙන්නේ නැහැ" හෝම්ස් පිළිතුරු දුන්නේය. "එහෙම උවමනා වුණොත් අපි නිසැකවම එනවා, ඔබ 'හොයාගෙන"

http://sherlockholmesinvestigations.blogspot.com

ඒ සමගම ඔහුගෙන් සමුගෙන අපි එතැනින් පිටවී ආවෙමු. දුම්රියපොළට යාම සඳහා ඉක්මනින් කුලීරියක් අල්ලා ගැනීමට අපට හැකිවිය.

"වොට්සන්. ඔබ මේ කරත්තය රඳවාගෙන මොහොතක් ඉන්න. මං ඉක්මනින් එනවා" කියූ හෝම්ස් මා කුලීරිය තුළ සිටියදීම ගියේ කුඩා වෙළඳසලක් වෙතය. ඒ, පාවිච්චි කළ පැරණි පොත් හා සඟරා අලෙවි කළ තැනක් බව මම දුටුවෙමි. මිනිත්තු කිහිපයකට පසු ඔහු ආපසු පැමිණ කුලීරියට නැගුණෙත් අපි දුම්රියපොළ බලා පිටත්වූයෙමු.

වෝටලූ දුම්රියපොළෙන් දහවල් 1.45ට පිටත්වෙන දුම්රිය අල්ලා ගැනීමට අපට තවත් ඉතිරිව තිබුණේ මිනිත්තු කිහිපයක් පමණි. ඊට පෙර අපි දුම්රියපොළේ භෝජනාගාරයෙන් දහවල් ආහාරය ඉක්මනින් ගත්තෙමු.

වොකිං බලා ගිය දුම්රියේ ගමන සතුටුදායක එකක් විය. උදේ වරුවේ ඇද හැළුණු මහ වර්ෂාවෙන් දුම්රිය මග දෙපස වැහි ජලය එකතු වී තිබිණ. එහෙත් ඒ වන විට වැසි නැවතී හිරු දීප්තිමත්ව පායා තිබිණ. දුම්රියට නැගුණු වෙලේ සිටම මගේ මිත්‍රයා කාලය ගතකළේ, ඔහු මිලදී ගත් සඟරා කිහිපය කියවමිනි. ඒ අතරේ තම සටහන් පොත එළියට ගත් ඔහු, වැදගත් කරුණු එහි සටහන් කරගන්නා ආකාරය ද මම දුටුවෙමි. පැය භාගයක් පමණ ඒ වෙනුවෙන් ගතකළ හෝම්ස් අනතුරුව පොත වසාදමා මග දෙපස වෙත නෙත් යොමු කළේය.

"මොකක්ද හෝම්ස් ඔබට හිතෙන්නේ? අර රැකියා ඒජන්සියෙන් දැනගන්න ලැබුණු විස්තර ප්‍රයෝජනවත් වෙයිද?"

"ඔව්"

"ග්‍රේස් ෆැරිංටන් කියූ දේවල් ඇත්ත බව ඒ කතාවලින් ඔප්පු වුණා නේද?" මම ඇසීමි.

"ඔව්. ඒ වගේ තමයි පෙනෙන්නෙ"

"ඇය කියූ මේ තත්ත්වයට මූලික හේතුව ආර්යාවගේ ආර්ථික තත්ත්වයේ කඩාවැටීම කියල ඔබට හිතෙන්නේ නැද්ද?"

"ඔබ කොහොමද වොට්සන් එහෙම කියන්නේ?"

"මෙන්න අහගන්න. මට හිතුණේ මෙන්න මේකයි" මම කීවෙමි. "ෆැරිංටන්ලාට තමන්ගේ ගෙදර ඇවිත් නවතින්න කියල ආර්යාව

 http://sherlockholmesinvestigations.blogspot.com

ඇරයුම් කළා නේ. ඇගේ ආර්ථික තත්ත්වය බොහොම අසතුටුදායක බව ඇය එතකොටත් දැනගිට්යා. මේ ගොල්ලන්ගෙන් ඇයට ලොකුවට උදව් උපකාර ලැබේවි කියල ඇය බලාපොරොත්තුවෙන්න ඇති. ක්‍රියාන්විතයේදී බරපතල තුවාල ලබන හමුදා නිලධරයන්ට විශාල වන්දිමුදලක් ලැබෙනවා. මං හමුදා සේවය කළ කාලෙ දුන්නෙ සුළු විශ්‍රාම වැටුපක් විතරයි. දැන් එහෙම නෙමෙයි. සෑහෙන විශාල වන්දියක් ලැබෙනවා. ඒක ප්‍රසිද්ධ කරුණක්. ආර්යාව හිතන්න ඇති ෆැරිංටන්ල තමන්ගේ ගෙදර නවත්වා ගත්තොත්....................

"අනුන්ට උදව් නෙමෙයි; දැන් ෆැරිංටන්ලටයි උදව් උවමනා වෙලා තියෙන්නේ. එහෙම නේද වොට්සන්?"

"මට හිතෙනවා හෝම්ස් මෙහෙම දේකුත්" මම කීවෙමි. "සේවකයන් රැසකට පඩිගෙවන්න ආර්යාවට සිදුවෙලා තිබුණා නේ. ඇය බලාපොරොත්තුවෙන්න ඇති ෆැරිංටන් මහත්මියගෙන් උදව්වක්. ප්‍රධාන ගෘහ පාලකයාගේ සහ ගෘහ පාලිකාවගේ කටයුතු ෆැරිංටන් මහත්මිය බලාගත්තොත් ලොකු මුදලක් ඉතිරි කර ගත හැකියි. ආර්යාවගේ හිතේ ඒ අරමුණත් තිබෙන්න ඇති කියල අපට හිතන්න පුළුවනි."

"එච්චරද ඔබට හිතන්න පුළුවන්?"

"තවත් දෙයක් මට හිතුණා හෝම්ස්" මම කීවෙමි. "බාගවෙලාවට ග්‍රේස් ෆැරිංටන් මහත්මියට මුදලයෙන් උරුමවෙන වටිනා යමක් තිබෙනවා වෙන්නත් පුළුවනි. හැබැයි ඒ ගැන ඇය දන්නේ නැහැ. නමුත් පෙනිලොප් ආර්යාව ඒ කරුණ දන්නවා. ඒ නිසා ෆැරිංටන් යුවළ තමන්ගේ විහළ යටට ගෙන්වාගන්න ඇති"

"ඔව්. ඒකත් වෙන්න පුළුවනි" හෝම්ස් කීය. "මට පෙනෙන්නේ අපේ අනුග්‍රාහිකාවට වගේම ඔබටත් ආර්යාව ගැන ලොකු සැකයක් ඇතිවෙලා. එහෙම නේද?"

"ඔව්. ඇයි මොකක්ද ඒකෙ ඇති වැරැද්ද?"

"මගේ හිතවත් මිත්‍රයා. මං වැරැද්දක් කිව්වා නෙමෙයි" හෝම්ස් කීය. "එතකොට අර හොල්මන් සහ අවතාර සහිත භයානක කුටිය ගැන ඔබේ මතය මොකක්ද වොට්සන්?"

"ඒ ගැන මට කිසිම මතයක් නෑ" මා පිළිතුරු දුන්නේ එතරම් සතුටකින් නොවේ.

http://sherlockholmesinvestigations.blogspot.com

"බයවෙන්න දෙයක් නෑ වොට්සන්" මගේ මිත්‍රයා කීවේ අසුනේ පිටුපසට හේත්තු වී දෙනෙත් පියාගනිමිනි. "මට හිතෙන්නේ මේක අර ජිග්සෝ ප්‍රහේලිකාවක් වගෙයි. ඔක්කොම කෑලි ටික තියෙනවා නම් ඒක නියම පිළිවෙළට හරිගැස්සුවාම සැඟවුණු චිත්‍රය මතුවෙනවා. ගැටලුව විසඳෙනවා. ඒ වගේ අපට මතුපිටින් තේරුම් ගන්න අමාරු තවමත් අපේ අතට අහුනොවුණු කෑලි කිහිපයක් තියෙනවා පෙනිලොප් ආර්යාවගේ සැමියා - හෙන්රි සාමි ගැන ඔබට මතකද? ඔහු මියගියේ කොහොමද? ඔබට මතක නෑ? මටත් දැන් ඒක මතක නෑ. ඒ ඒක මට මතක් කරගන්න හැකිවුණා නම් බොහොම ප්‍රයෝජනවත් වෙන්න තිබුණා. ඔහු මියගිහින් අවුරුදු දෙළහක් පමණ වෙනවා. ඒ දවස්වල පුවත්පත්වල නම් ඔය කාරණා හැමදෙයක්ම පළවුණා. කමක් නෑ වොට්සන්. ඔබේ රිවෝල්වරය ගෙන එන්න ඔබ අමතක කළේ නැහැ නේද?"

"රිවෝල්වරය නම් මං අරගෙන ආවා" මා කීවේ පුදුමයෙනි. "මොනවා හෝම්ස්? ඔබ හිතන්නේ මේක ගිනිඅවියක් උවමනා වෙන තරම් දුරදිග යන වැඩක්ද?"

"තවමත් අපට හරියටම කියන්න බෑ මිත්‍රයා" ඔහු කීය. "ඒත් මට එක කරුණක් හොඳටම විශ්වාසයි. පැරඩෝල් මන්දිරයේ මොකක් හරි කුට ප්‍රයෝගකාරී වැඩක් නම් සිද්ධවෙනවා. ඒක මිනීමැරුමක් වෙන්නත් පුළුවනි. අපි ඒක කොහොම හරි හෙළිකරගත යුතුයි."

එතරම් ප්‍රමාදයක් නොවී අපේ දුම්රිය, වොකිං දුම්රියපොළට ළඟාවිය. පැරඩෝල් මන්දිරය පිහිටියේ එිට සැතපුම් පහක් පමණ ඈතින් බව අපට අසන්නට ලැබිණ. ඒ අනුව එහි යාම සඳහා අපි කුලීරියක් යොදවා ගත්තෙමු. අපේ ගමන්මග එතරම් හොඳින් සකස්කළ මාවතක් නොවීය. එබැවින් කරත්තයේ ගමන සිද්ධවූයේ ඉතා සෙමින්ය. අළු පැහැති බිත්ති සහිත පැරඩෝල් මන්දිරය අපේ නෙත් ගැටෙද්දී සවස තුනට ළංවී තිබිණ.

"රියැදුරු උන්නැහේ" හෝම්ස් කීය. "අපි මේ හරියෙන් බහිනවා. මං පරීක්ෂා කළ යුතු ඉඩම් කට්ටි කීපයක්ම තියෙන්නෙ මේ හරියෙ. මෙහෙන් බැස්සොත් වැඩිය පහසුයි"

තම කුලිය ලබාගත් රියැදුරා, කරත්තය ආපසු හරවාගෙන, එය ආපසු වොකිං දෙසට දක්කාගෙන ගියේය. පැරඩෝල් මැඳුර වෙත වැටුණු මාවතට මා පිය නගද්දී, හෝම්ස් මා නැඳවූයේ ඉන් ඉවතටය.

http://sherlockholmesinvestigations.blogspot.com

"වොට්සන්. අපි මේ පැත්තෙන් යමු. ප්‍රධාන පාරෙන් ගියොත් ඔවුන් අපව ඉක්මනටම දකීවි. මේ කුඹුරට බැහැලා සෑහෙන දුරක් ගිහිං, ඊට පස්සේ කැලෑරොද මැදින් වැටුණු පාරෙන්, මන්දිරයට අයත් ඉඩමේ පිටුපසට යන්න පුළුවනි. පරීක්ෂා කරල බලන්න කොයි තරමක් දේවල් තියෙනවද?"

මැඳුර වටේට වතුයාය පුරාම විශාල ගස් මෙන්ම, මධ්‍යම ප්‍රමාණයේ පඳුරු ද විය. ඔවුනුට උයන්පල්ලකුගේ සේවය මෑත කාලයක නොලැබීම ද අපේ වාසියට හේතුවිණ. වලව්වේ නැගෙනහිර පැත්තේ මායිම දෙසින් අපි ඇතුළට ඇතුළුවූයෙමු. අනවශ්‍ය වල්පඳුරු ඉතා සාරවත්ව වැවී තිබුණේ වර්ෂා කාලයේ ප්‍රතිඵලයක් ලෙස වියයුතුය. යළිත් වැස්සක් ඉක්මනින් කඩාවැටෙන බව අපට හඟවමින්, අහස කළු වලාකුළෙන් වැසීයන්නට පටන්ගත්තේය. සවස ඉරඑළිය ආවරණය වී අඳුරුවීම එක් අතකින් අපට වාසියක් විය. එහෙත් ධාරානිපාත වර්ෂාවකට අපේ සූදානමක් නොතිබිණි. එහෙයින් වැස්සොත් අප වැටෙන්නේ ලොකු අමාරුවක බැව් මම තේරුම් ගත්තෙමි.

නිවසේ නැගෙනහිර පැත්තේ බිත්තිය දිගටම වහල දක්වාම ලීයෙන් තැනූ ගරාදියක් විය. මල්වැල් යවා බිත්ති අලංකාර කිරීමට සාදන මෙය බොහෝ පැරණි වලව්වල දක්නට ලැබෙන ආකාරයේ එකකි. වටපිට බැලූ හෝම්ස් කිසිවෙකු ළඟක නොමැති බව දැක ගරාදියට නැගුණේය. එය කෙනෙකුට යන්නමින් අඩියක් තබා නැගීමට තරම් ඉඩකඩ සහිත එකකි. එහෙත් එය කොයිතරම් ශක්තිමත්ද යන්න ගැන මගේ හිතේ සැකයක් ඇතිවිය. ලීය දිරාගොස් තිබුණොත් ගරාදිය කැඩීයාමට ඉඩ ඇත. මේවා සාදන්නේ මනුෂ්‍යයෙකුගේ බර ඉසිලීමට නොව, මල් පඳුරුවල බරට ඔරොත්තුදීමටයි. ගරාදිය කැඩී බිමට වැටුණොත් හෝම්ස්ගේ ඇටකටු ද කැඩී යනු නියතය.

"හෝම්ස්!................. ඔක අවදානම් වැඩක්"

මා අනතුරු ඇඟවීමට උත්සාහ කළා පමණි.

"ෂ්!" කියූ මගේ මිත්‍රයා ගරාදිය දිගේ පහසුවෙන්ම ඉහළට නැගුණේ, සර්කස්වල ඉණිමං දිගේ ඉහළ නගින ගෝරිල්ලෙකු විලසිනි. වහළ මට්ටමට ළඟා වූ ඔහු, නිවසේ ඉහළ මාලයේ ජනේලයක් අල්ලා ගෙන, වහළ මතින් ඒ පැත්තට ගියේය. මගේ

දර්ශන පථයෙන් ඔහු එළෙස් ඉවත් වූ පසු, ඔහු කුමක් කරනවාද යන්න සිතාගැනීමට මට හැකියාවක් නොවීය. මට ඊටත් වඩා සිතාගැනීමට අපහසු වූයේ ඊළගට මා කුමක් කළ යුතුද යන්නය. සුළං හමද්දී අතු සෙලවුණු ගස්වල හඬ හැරුණුවිට, සෑම අතකින්ම තිබුණේ නිහඬබවකි. එක්වරම මට දැඩි තනිකමක් දැනිණ. නාඳුනන පලාතක, නාඳුනන නිවසක බිත්තියකට හේත්තු වී සිටින මා, එම නිවසේ භාරකරුට අසුවුවොත්? ඔහුට දීමට නිදහසට කරුණක් මට සිතාගැනීමට අපහසුය. එක් අතකින් මගේ මිත්‍රයා සමග ගරාදිය දිගේ වහලට ගියා නම් තත්ත්වය වඩාත් සතුටුදායක වන්නට ඉඩ තිබිණ. සෑහෙන වෙලාවක් ගතවී ගියත්, මා කළ යුත්තේ කුමක්ද යන්නට හෝම්ස්ගෙන් උපදෙස් නොලැබිණ. මම ඔරලෝසුව අතට ගෙන වෙලාව පරීක්ෂා කර බැලීමි. වෙලාව සවස තුන පසුවී මිනිත්තු දහයක් බව දුටුවෙමි. මේ වන විට අපගේ පැමිණීම බලාපොරොත්තුවෙන් ග්‍රේස් ෆැරිංටන් මහත්මිය බලාසිටිනු නොඅනුමානය.

අශ්වයෙකුගේ කුරහඬ හා අශ්ව කරත්තයක රෝදවල හඬ මට ඇතින් ඇසිණි. මම එතැන සිටගෙනම නිවස දෙසට වැටී තිබූ ඇතින් පිහිටි මාර්ගය දෙස බැලීමි. සෑහෙන තරම් දුරින්, සුඛෝපභෝගී පෙනුමක් තිබූ අශ්වකරත්තයක් එනු මම දුටුවෙමි. එය පදවාගෙන එනු ලැබුවේ තරුණයෙකු විසිනි. ඔහු ළගම මගී අසුනේ සිටි පුද්ගලයා මැදිවිය පසුකළ අයෙක් විය. රිය එන්නේ පැරඩෝල් මැඳුර වෙතට බවට සැකයක් නොවීය. ගේට්ටුව විවෘත කොට වන්නට රිය ඇතුළුකොට, එය ඉක්මනින් මැඳුර දක්වාම පදවාගෙන එන ලදී. මෙය මගේ මිතුරාට දැනුම්දීම අනවශ්‍ය බව මම සිතුවෙමි. එහෙත් එය කළ හැක්කේ කෙසේද?

"හෝම්ස්! ඔබ කොහේද?" මා ඇසුවේ මෘදු කටහඬකිනි.

"ඔබ හිතනවාට වඩා ඔබට ළගින් වොට්සන්" ඔහු කියද්දී, මම තිගැස්සී ආපසු හැරී බැලුවෙමි. ඔහු මා සමීපයටම ඇවිත් සිටියේය. එහෙත් ඔහු ළංවෙන හඬක් මට නොඇසිණි.

"ඔබව තිගැස්සීම ගැන මට කණගාටුයි මිත්‍රයා" ඔහු කීය. "ඒ වුණත් කරන්න දෙයක් නැහැ. අර ගරාදිය දිගේ ගිහින් වහළ උඩට නැග්ගාම වටේටම හොඳට අපනෙනවා. අශ්වකරත්තයක් මේ පැත්තට එන බව මං දුටුවේ ඒක හැතැක්ම බාගයක් පමණ ඈතින්

http://sherlockholmesinvestigations.blogspot.com

එද්දීම. මං වහලේ හිටියොත් ඔවුන් දකීවි කියල මට හය හිතුණා. ඒ හින්ද මං ඉක්මනට වහලෙන් බහින්න තීරණය කළා. මේ වගේම තවත් ගරාදියක් ගෙයි අනෙක් පැත්තෙත් තියෙනවා වොට්සන්. ඒකෙන් පහළට බැහැලයි, ගේ පිටුපසින් මං මෙතැනට ආවේ"

"වහළ උඩදී ඔබට මොනවද දකින්න ලැබුණේ?" මම විමසුවෙමි.

"මගේ සිතේ ඇතිවූ සැකයක් නිවැරදි බව තහවුරු කරන සාධක මං දුටුවා. එයින් මේ අභිරහසේ අඳුරු බව නැතිකිරීමට ආලෝකයක් ලැබේවි." ඔහු පිළිතුරු දුන්නේය.

මීළඟට ඔහු කථාකළේ මිදුලට ළඟාවූ අශ්වකරත්තය දෙසට ඇඟිල්ල දිගුකරමිනි. "මට විශ්වාසයි ඔය ආවේ ජෙරමි වොල්කොට්, ඔවුන්ගේ නීතිඥයා සමග. මං දුටුවා ඔය කරත්තය වොකිං දුම්රියපොළේ රථගාලේ නවත්වා තිබුණා. නීතිඥයා එන්න ඇත්තෙත් අප ආව දුම්රියේම වියයුතුයි. ඔහුට වොල්කොට් හමුවෙන්න ඇත්තේ අප දුම්රියපොළෙන් පිටවී එද්දී"

"අපි ආවෙ නරක වෙලාවට" මම කෙඳිරිලි හඬෙන් කීවෙමි.

"නෑ නෑ. අපි ආව වෙලාව හොඳයි" හෝම්ස් කීය. "දැන් ඉතින් අපි ගිහින් ඒ අවස්ථාවෙන් ප්‍රයෝජන ගමු."

පැරඩෝල් වලව්ව ඉදිරිපිට නවත්වා තිබූ අශ්වකරත්තය මේ වනවිට අපට නොපෙනිණ. එබැවින් අප නිවස ඉදිරිපිටට ගියත් කිසිවෙකුට නොපෙනෙනු ඇතැයි අනුමාන කළෙමු. අපි ඉදිරියට ගමන්කළෙමු. බිත්තිය කෙළවර වන තැනදී මදක් නැවතී බැලුවෙමු. අශ්වකරත්තය එහි නවත්වා තිබිණ. අප එබී බලද්දීම දෙදෙනෙක් විවෘතව තිබූ ඉදිරි දොරෙන් මැදුරට ඇතුළු වී නොපෙනී ගියහ. ඒ සමගම දොර වසා දැමිණ.

"අපි ජනේලවල මට්ටමට වඩා පහත්වෙලා ඉදිරියට යමු වොට්සන්" හෝම්ස් කීය. "ජනෙල් වීදුරුවෙන් ඔවුන් අපේ ඡායාව වත් දුටුවොත් අපේ වැඩ අවුල්වෙනවා"

පළමුවැනි ජනේලයට ළංවූ මගේ මිතුරා බිත්තියට මුවාවී, නිවස ඇතුළතට බැල්මක් හෙළුවේය. මීළඟට ඔහු අසලට එන මෙන් මට සංඥා කළේය. දෙවැනි ජනේලය ළඟදී ද ඔහු කළේ ඒ දෙයමය. අනතුරුව අපි වසා තිබූ ඉදිරි දොර පසුකොට තවත් ඉදිරියට ගියෙමු. ඒ අසල තිබූ තුන්වැනි ජනේලය තුළින් හෝම්ස් එබී බලද්දී මම එතැනට ළංවූයෙමි.

http://sherlockholmesinvestigations.blogspot.com

"අපි නියම තැනට ආවා" ඔහු කීවේ කෙඳිරිලි හඬිනි. "මේ ජනේලය විවෘත වෙන්නේ විසිත්ත කාමරයට. ගෙදර ඉන්න හැමෝම දැන් මෙතැනට එකතු වෙන බවයි පෙනෙන්නේ"

හෝම්ස් කළ අයුරෙන් බිත්තියට මුවාවී මම ද ජනෙල් වීදුරුව තුළින් බැලීමි. නීතිඥයා හා ජෙරමී වොල්කොට් දෙදෙනා අපට පිටුපා සිටගෙන සිටියහ. ඒ ජනේලයට මදක් ඇතුළතින් වූ සෝපාවක් අසලය.

ග්‍රේස් හැරිංටන් සහ තවත් තරුණියෙක් මේ මොහොතේ දකුණු පැත්තේ වූ අසුන්වල වාඩිවීමට සූදානම් වූහ. කොරගසමින් ආ මේ තරුණයා ජේම්ස් හැරිංටන් මහතා විය යුතුයයි මම අනුමාන කළෙමි. සුදු ඇඳුමකින් සැරසී තවමත් සිටිගෙන සිටි කාන්තාව, මුළුතැන්ගෙයි සේවිකාව වියයුතුය. ගේ ඇතුළත සිට රෝද පුටුවක් තල්ලු කරගෙන ආවේ තවත් තරුණියෙකි. පෙනිලොප් ආර්යාව රෝද පුටුවේ හිඳගෙන සිටියාය. ඇගේ දුර්වල, මරණාසන්න බව ගැන හැරිංටන් මහත්මිය කියූ දෑ මෙවේලේ මගේ සිහියට නැගුණි. ඒ සියල්ල ඇත්ත බව ආර්යාව දෙස හෙළූ එක් බැල්මෙන්ම මම දුටුවෙමි.

ගේ ඇතුළේ තිබූ උණුසුම, ඩහදිය ගලන බව නිසාදෝ ජනේලය විවෘත කළ යුතු බව කවුදෝ කියනු ඇසිණි. එය අපට වඩාත් වාසි සහගත විය. ඇතුළේ සිදුවුණු කතාබහට හොඳින් සවන්දීම වඩාත් පහසුවිණි. නීතිඥයාගේ නම ජෝෂුවා ට්‍රෙන්ටන් බව පැවසූ වොල්කොට්, ආර්යාව හා අනෙකුත් අය ඔහුට හඳුන්වා දුන්නේය. රෝදපුටුව තල්ලුකරගෙන ආ තරුණියා ලෙස්ටර් තෝන් බැව් එයින් අපි දැනගතිමු.

"ඔබ අප්‍රමාදව මෙහි පැමිණීම මං අගය කරනවා නීතිඥ මහත්මයා" ආර්යාව කීවාය. "ලියකියවිලි සියල්ලම සූදානම් කරලා ඔබ අරගෙන ආවාද?"

"ඇත්තෙන්ම ඔව් ආර්යාවෙනි" යයි නීතිඥයා පැවසීය. "එය නියමිත පිළිවෙළකට සකස්කළ ලියවිල්ලක්. මට කරන්න තියෙන්නේ, ඔබතුමිය නියමකරන පරිදි හිස්තැන් පුරවා, ඔබේ අත්සන ලබාගැනීම පමණයි. උවමනාවටත් වඩා සාක්ෂිකාරයන් මෙතැන ඉන්නවා. ඒක අපේ වාසනාවක්"

මේ ආකාරයෙන් ලියවිල්ලක් අත්සන් තැබීම පිළිබඳව මගේ සිතේ ඇතිවූයේ සැකයකි. එමෙන්ම කුතුහලයකි. ඒ නිසා මම

 http://sherlockholmesinvestigations.blogspot.com

හෝම්ස් දෙස බැලීමි. තමා දෙතොල හරහා දබරැඟිල්ලක් තැබූ ඔහු මට නිහඬතාවය රකින මෙන් සංඥා කළේය. ඒ සමගම ඔහු ගේ තුළ කතාබහට වඩාත් හොඳින් තම අවධානය යොමු කළේය.

"ආර්යාවනි. මේ ඔබ කටයුතු කරන්නේ මං කියූ විධියට නොවෙයි නේ" ජෙරෙමි වොල්කොට්ගේ කටහඬ ඇසිණි. "මට නම් පෙනෙන්නේ නැහැ......................."

"ජෙරෙමි!" ආර්යාව කෑගැසුවාය. කටහඬ දුර්වල වුවත් එහි තිබුණේ සැරපරුෂ බවකි.

"මේ කටයුත්ත............... ඉදුවිය යුතුමයි" අමාරුවෙන් හුස්ම අල්ලමින් ඇය කීවාය.

"..................... මගේ .... මගේ සෞඛ්‍ය තත්ත්වය අයහපත් බව මොකෝ මම දන්නෙ නෑ කියලද හිතුවේ? කවුරුත් ඒ කාරණාව මතක තියාගත්තොත් හොඳයි. ට්‍රෙන්ටන් මහත්මයා. ඔය ලියවිල්ලට අද දිනේ යොදලද තියෙන්නේ?"

"එහෙමයි ආර්යාවනි"

"බොහොම හොඳයි" කී ඇය මඳකට නැවතී හුස්ම ඉහළ පහළ ගත්තාය.

"ඔහේලා කාටත් දැනගැනීමටයි මං මේ කියන්නේ......... මේ නීතිඥ මහත්මයා මේ සූදානම් කරල තියෙන්නේ මගේ අන්තිම කැමැති පත්‍රය!"

එම කථාවෙන් තිගැස්සුණු ග්‍රේස් ෆැරිංටන් මහත්මිය එක්වරම හුස්මක් ඉහළට ඇදගත් අයුරු අපට ඇසිණ.

"මගේ ආදරණීය දරුවා" ආර්යාවගේ ඒ ඇමතුම ෆැරිංටන් මහත්මියටයි. "මං කී දෙයට ඔබේ සිතේ කම්පනයක් ඇතිවුණා වගෙයි. ඒ ඔබ මට ආදරේ නිසා. ඒ වුණත් ඔබ මා වෙනුවෙන් දුක් සුසුම් හෙළන්න උවමනා නැහැ. ඒක වෙනත් කෙනෙකු වෙනුවෙන් කරන්න. ඒ මොකද.............. මං මේ ලෝකෙ............ දීර්ඝ කාලයක් සතුටෙන් ජීවත් වුණා. ඒ නිසා තවත් වැඩි දවසක් මේ ලෝකෙ ජීවත්වෙන්න බැරිවෙන එක ගැන මගේ හිතේ දුකක් නැහැ..................."

ආර්යාව කියූ දෙයට දිගින් දිගටම බාධා ඇතිවූයේ ඇය කැස්සෙන් පීඩා විඳි බැවිනි.

"............ හොඳයි, ට්‍රෙන්ටන් මහත්මයා. මං ඔබට නියමකරනවා........, මං මේ කියන පිළිවෙළට මගේ දේපොළ

http://sherlockholmesinvestigations.blogspot.com

ලියන්න කියලා......... මගේ මේ හැරඩෝල් මන්දිරය සහ එය පිහිටා තිබෙන මුළු වතුයායම, මගේ ගිණුම්වල තවමත් ඉතිරි වී තිබෙන සුළු සුළු මුදල් සියල්ල. මං කැමතියි එක් පුද්ගලයෙකු වෙත හිමිකරන්න."

කාමරයේ පැතිරගියේ දැඩි නිහඬතාවයකි. එය කෙතරම් වීද යත්, නීතිඥයාගේ පෑනෙන් ඔහු කඩදාසිය මත ලියද්දී නැඟුණු හඬ පවා මට ඇසිණ.

"............ ඔව්. කවුරු වෙනුවෙන්ද ඔබ ඒ දේවල් ලියන්නේ?" නීතිඥයා විමසුවේය.

"............... මටත් මගේ සැමියාටත්.......... දරුවන් හිටියේ නැහැ. ඒ නිසා මං තීරණය කළා ඒ හැමදෙයක්ම මගේ ආදරණීය ඥාති මුණුබුරා වන ජෙරෝමි වොල්කොට් ගේ නමට ලිවීමට"

මිනිත්තුවක පමණ නිහඬතාවයක් පැතිර ගියේය. අනතුරුව අපට අසන්නට ලැබුණේ වොල්කොට්ගේ කටහඬය.

"ඒක බොහොම කරුණාවන්ත කටයුත්තක්" ඔහු කීය. "ඒ වුණත් මං ඔබෙන් ඉල්ලා හිටිනවා මේක ලියලා අවසන් කරන්න කලින් තව ටිකක් කල්පනා කරල බලන්න කියල"

වයසක කාන්තාව වෙවුලන දකුණු - අත ඉහළට ඔසවා, දබරැඟිල්ල දිගුකළේ තර්ජනාත්මක අයුරිනි.

"උඹට පිස්සුද ජෙරෝමි? උඹේ දෙමව්පියන් ජීවත්ව ඉද්දිදී මට ඉතාම හොඳින් සැලකුවා. උඹේ ඔතු දියුණුව සලසන බවට මං ඔවුනට පොරොන්දු වුණා. අන්තිමට මගේ අසනීපවලදී පිහිටවෙමින් උඹත් මා ගැන හොයා බැලුවා. උඹ මං නිසා කොයිතරමක් දුක්කරදර වින්දද? මේ ඒ වෙනුවෙන් ලැබෙන කුටු පඩුරක්."

එයට ජෙරෝමි වොල්කොට් ගෙන් පිළිතුරක් නොලැබිණි. ඇගේ වත්කම මොනතරම් පරිහාණියකට පත්වී ඇත්දැයි ආර්යාවට පැවසීමට ඔහුට නොසිතෙන්නට ඇත. ඔහුට හෙළා ගැනීමට ඇත්තේ ඉතා දුප්පත් අස්වැන්නකි. මම යළිත් වරක් ජනේලයෙන් ෆැරිංටන් මහත්මිය දෙස බැලීමි. බැරෑරුම් සිතිවිලිවලින් ඇගේ සිත කැලැඹී ඇති බවක් මුහුණෙන් පෙනිණ. අන්තිම කැමැත්ත ලියූ ආකාරය පිළිබඳ අසතුටක් ඇගේ මුහුණෙන් දිස්වූයේ නැත.

"ඔන්න ඔක්කොම හරි" නීතිඥයා කීවේ ලියවිල්ල සකස්කිරීමෙන් පසුවය. "හැම දෙයක්ම සම්පූර්ණයි. වොල්කොට්

 http://sherlockholmesinvestigations.blogspot.com

මහත්මයා. ඔබට තියෙන්නේ මේ අන්තිම කැමැත්ත යළිත්වරක් කියවා බැලීමට ඔබේ මිත්තණිය අතට දීමයි. ඊළඟට ඇයගේ අත්සන ලබාගන්න. මේකට සාක්ෂියට අත්සන් කිරීමට අපි සාක්ෂිකාරයන් සූදානම් කරගමු."

අසුනෙන් නැගී සිටි වොල්කොට්, අන්තිම කැමැති පත්‍රය සියතට ගත්තේය. ඊළඟට ඔහු එය ආර්යාව වෙත ගෙන ගියේ මදක් පැකිළෙමිනි.

ඇගේ ඇඳුම් තුළින් උපැස් යුගලක් අතටගත් ආර්යාව, එය පැළඳගෙන ලියවිල්ල කියවා බැලුවාය. එයින් සෑහීමට පත්වීමට ඇයට ඒ තරම් වේලාවක් ගත නොවිණි. මීළඟට නීතිඥයා ඉක්මනින්ම පෑන ඇය වෙත ගෙන ආවේය. ආර්යාව වෙවුලන අතින්, නිසි තැන්වල සිය අත්සන තැබුවාය. සාක්ෂියට අත්සන් කිරීම සඳහා එහි පැමිණෙන මෙන් ජෙරෙමි, ග්‍රේස් ෆැරිංටන්ට, ඇගේ සැමියාට, ලෙස්ටර් තෝන්ට, හා මුළුතැන්ගෙයි සේවිකාවට සංඥා කළේය.

"මං හිතන්නේ අපි මේ බලාගෙන හිටි, අහගෙන හිටි හරිය හොඳටම ඇති" කී හෝම්ස් සිටි තැනින් ඉවත්ව ඉදිරි දොර දෙසට යෑමට සූදානම් විය. මම ඔහුට අවහිර කළෙමි. "ඔහොම ඉන්න හෝම්ස්. අපි කොහොමද අනුන්ගේ පෞද්ගලික වැඩවලට බාධා කරන්නේ?"

"පැත්තකට වෙන්න වොට්සන්" ඔහු කීවේ මා ඉවතට තල්ලුකරමිනි. "අපට පමාවෙන්න එක මොහොතක් වත් නෑ! පැත්තකට වෙලා ඉඳියුතු වෙලාවලුත් තියෙනවා. මේක එහෙම එකක් නොවෙයි. එන්න මගේ පස්සෙන්. මේක වහාම ක්‍රියාශීලී වියයුතු වෙලාව"

හෝම්ස්ගේ මුවෙන් මේ වචන පිටවෙද්දීම නිවස තුළින් අවිශබ්ද කිහිපයක් ඇසිණ. ඉදිරිදොර විවෘතවිය. එළියට ආවේ කෝපයෙන් මුහුණ රතු කරගත් ජෙරෙමි වොල්කොට්ය. ලෙස්ටර් තෝන් ඔහු ළඟින්ම සිටියේය.

"ඔහේලා කවුද? මොන යක්ෂ වැඩකටද මෙහේට ආවෙ?" වොල්කොට් කෑගැසීය.

"ආවෙද?" හෝම්ස් ඇසුවේ උපහාසාත්මක ලෙස උස් හඬින් සිනාසෙමිනි. "ආවෙ මහා අසාධාරණ කටයුත්තක් නවත්වන්න. ඒක නවත්වන්න අපි දැනටමත් ප්‍රමාද වැඩිද කියල නම් මම දන්නේ

http://sherlockholmesinvestigations.blogspot.com

නෑ." මෙසේ කියූ හෝම්ස්, වොල්කොට් පැත්තකට තල්ලුකොට නිවසට ඇතුළුවිය. මම ඒ පිටිපසින් ගියෙමි. ග්‍රේස් හැරිංටන් භයෙන් ත්‍රස්තව අප දෙස බලා සිටියාය.

"හැරිංටන් මහත්මිය. ඔබ ලියවිල්ල අත්සන් කළාද?"

"නැහැ. ඇයි ඒ?" ඇය ඇසුවාය.

"බොහොම හොඳයි. ඕක අත්සන් කරන්න එපා"

"මේ බලනවා උන්නැහේ" කී ජෙරමී වොල්කොට් නිවස තුළට වින් හෝම්ස් ඉදිරියෙන් සිටගත්තේ කෝපාවිෂ්ට බැල්මක් හෙළමිනි. "මේ විදියට ගෙවල් ඇතුළට කඩාවදින්න තමුසෙට කවුද අවසර දුන්නෙ? අපේ පෞද්ගලික වැඩ කටයුතුවලට ඇඟිලි ගහන්න තමුසෙට තියෙන අයිතිය මොකක්ද?"

මේ අවස්ථාවේ හැරිංටන් මහත්මියගේ සැමියා - ජේම්ස් හැරිංටන් ද වොල්කොට්ගේ සහායට ආවේය. කකුලේ තිබූ තුවාලය නිසා වේදනාවෙන් කොරගසමින් ආවත්, හමුදාභටයකු සතු එඩිතර බව ඔහු වෙතින් දිස්විය.

"ඒ කතාවට මාත් එකඟයි" හැරිංටන් කීය. "මං කැමතියි දැනගන්න ඔහේ කවුද කියලා. අපේ මේ පෞද්ගලික වැඩවලට අතදාන්න මොකක්ද ඔහේට තියෙන අයිතිය?"

"බොහොම හරි මහත්මයා. ඔබේ කතාව ඇත්ත. මගේ නම ෂර්ලොක් හෝම්ස්. මෙතැන ඉන්න මගේ මිත්‍රයා දොස්තර වොට්සන්. මං ඔබට සහතික වෙන්නම්. අපි මෙහේ ඇවිත් ඉන්නේ යහපත් අරමුණකින්, හොඳ චේතනාවකින් බවට. ඊට අමතරව පෙනිලොප් ආර්යාවගේ අයිතිවාසිකම් වෙනුවෙනුත් මං පෙනී ඉන්නවා."

වයසක කාන්තාව රැගත් රෝදපුටුව මේ වනවිට අප සිටි තැනට ළංවෙමින් තිබිණ. එය තල්ලුකරන ලද්දේ සුදු ඇඳුමකින් සැරසී සිටි සේවිකාව විසිනි. පෙනිලොප් ආර්යාව හෝම්ස් වෙත හෙළුවේ කෝපයට පත් බැල්මකි. "මහත්මයා. කවුද ඔබට මෙහේට එන්න කිව්වෙ? මං ඔබෙන් උදව් ඉල්ලුවේ නෑ?"

"ඒක වෙන්න පුළුවනි" හෝම්ස් කීය. "ඒත් මං දූත් මෙහේ ඇවිල්ලයි ඉන්නෙ. මට කරන්න තියෙන කටයුතු සම්පූර්ණ නොකර මෙතැනින් පිටවෙලා යන්න මං සූදානම් නැහැ"

හෝම්ස්ගේ උස හැඩිදැඩි පෙනුම නිසාත්, වාග් විලාසයේ තියුණු බව නිසාත් කවුරුත් නිහඬව බලා සිටියා යයි මට සිතිණ. "හොඳයි

 http://sherlockholmesinvestigations.blogspot.com

ඔබ කවුරුත් දැන් මෙතැන ඉන්නවා නේ. සම්පූර්ණයෙන්ම වෙනත් කාරණයකට සාක්ෂිකාරයින් වීමට මං ඔබට අවස්ථාව සලසා දෙන්නම්.

දැන් කරුණාකර මගේ පිටුපසින් එන්න. මං මෙහේ ආවෙ මොකටද කියල දැනගන්න කැමැති නම්, ඔබ හැමදෙනෙක්ම එන්න. ෆැරිංටන් මහත්මිය. මං හිතනවා ඔබ සඳහන් කළ කොරිඩෝවද අන්න අරක වෙන්න ඇති කියල"

හෝම්ස් ඒ දෙසට ගමන් කරද්දී එය අනුමත කරමින් කාන්තාව හිස සැලුවාය.

ශ්‍රේස් ෆැරිංටන් ඇගේ සැමියා සමඟ හෝම්ස් පිටුපස එද්දී අනෙක් අය ද ඒ සමඟ ආහ. සියලුදෙනාටම යාමට ඉඩහැර මම ඔවුන් පිටිපසින් අන්තිමට ගමන්කළෙමි. ජෙරමි වොල්කොට් හා ලෙස්ටර් තෝන් එකිනෙකාගේ මුහුණුබැලූ අයුරු මම දුටුවෙමි. එහෙත් ඒ කුමක් නිසාද යන්න තේරුම් ගැනීම මට අපහසු විය.

විසිත්ත කාමරයේ සිට ප්‍රධාන කොරිඩෝවට පැමිණි පසු අපට දකින්නට ලැබුණේ, ඒ දෙපස පිහිටි කාමරවලට ඇතුළුවන දොරටු කිහිපයකි. කොරිඩෝවේ පොළොව ආවරණය වන සේ වටිනා පෙරදිග බුමුතුරුණක් එළා තිබිණ. එහෙත් කොරිඩෝවේ අයිනට වන්නට බිම සැකසීමට යොදා ලැලි දිස්විය. කොරිඩෝව දෙපසම, මල් දමූ පිගන්මැටි මල් පෝච්චි, ප්‍රතිමා සහ පොත් පුරවා තිබූ වීදුරු දොරවල් සහිත පොත් අල්මාරි තැනින් තැන දැකිය හැකි විය.

"හොඳයි. අපි දැන් පටන්ගනිමු" හෝම්ස් කීවේ අප කොරිඩෝවේ මැද හරියට පැමිණි පසුය.

"පසුගිය සතියේ සිදුවුණු ඉතාම අසාමාන්‍ය සිදුවීමකට ෆැරිංටන් මහත්මිය මගේ අවධානය යොමුකළා"

"හෝම්ස් මහත්මයා" ඇය කීවේ කලැඹීමට පත් ස්වභාවයෙනි. "මං බලාපොරොත්තු වුණේ නැහැ මෙහෙම දෙයක්. මං හිතුවේ ඔබේ පරීක්ෂණ කටයුතු බොහොම රහසිගතව කරාවි කියලයි?"

"සමාවෙන්න මහත්මිය" හෝම්ස් කීය. "මං බලාපොරොත්තු වුණේ ඒ ආකාරයෙන් කරන්න තමයි. නමුත් දැන් තත්ත්වය ඊට වෙනස්. මේක තවදුරටත් රහසිගතව තියාගන්න අපට හැකියාවක් නැහැ"

http://sherlockholmesinvestigations.blogspot.com

"මේ මිනිස්සු මොනවා ගැනද මේ දොඩවන්නේ?" පෙනිලොප් ආර්යාව තරහෙන් කෑගැසුවාය. "ජේරෙමි! තමුසෙ මට මේ කිසිම දෙයක් කිව්වේ නෑ. ඒ ඇයි?"

"කියන්න තරම් වැදගත් දෙයක් තිබුණෙ නෑ." වොල්කොට් පැවසුවේ කිසිවක් නොරුස්සනා හඬිනි. "ග්‍රේස් මොකක්ද භයානක හීනයක් දැකලා, හීනෙන් ඇවිදලා. මං හිතුවා අපි ඒක ඒ වෙලාවෙ විසඳගත්තා කියල. දැන් බලනකොට ඇය මේක දිගින් දිගටම අරගෙන ගිහිං. මොනවටද ග්‍රේස් මේ වගේ සුළුදේකට ඔබ පිට මිනිස්සු කැඳෙව්වේ?"

"මහත්මයා ඔහොම කතාකරන්න එපා" ජේම්ස් ෆැරිංටන් තරවටු ස්වරයෙන් පැවසුවේ දබරැඟිල්ලක් ඉහළට ඔසවමිනි. "මගේ බිරිඳ කොහොමටවත් එහෙමු දෙයක් කරන්නෙ නෑ. ඇය කළේ මෙතැනට අවශ්‍ය යයි පෙනුණු දේ විතරයි."

"ඒ කොහොම වුණත් මෙතැන මොකක් හරි ප්‍රයෝගයක් නෑ" වොල්කොට් කීය. "ඔහේලටම පුළුවනි ඇවිත් බලන්න" කී ඔහු කාමරයක දොර විවෘත කළේය.

පසුවද උදෑසන තමාට දකින්නට ලැබුණේ යයි ග්‍රේස් ෆැරිංටන් විස්තර කළ කාමරය අපි දැන් දුටුවෙමු. බොහෝ ඉඩකඩ සහිත වූ එහි මේස, පුටු හා කැබිනෙට්ටු කිහිපයක්ම විය. කලාලයක් බිම අතුරා තිබූ අලංකාර පියකරු තැනක් වූ එහි සිත හීතියට පත් කළ හැකි කිසිවක් නොතිබිණි.

කාමරයට ඇතුළු වී, තම දෙනෙත් වටේටම යොමුකළ හෝම්ස් ෆැරිංටන් මහත්මිය දෙසට හැරුණේය.

"ඔව් ඇත්ත තමා. මෙතැන නම් ප්‍රයෝගකාරී දෙයක් මොකුත් නෑ" හෝම්ස් කීය. "ෆැරිංටන් මහත්මිය, දැන් හොඳට කල්පනා කරල බලන්න. ඔබ කිව්වා ඇරල තිබුණු කාමරයේ දොර අසල ඔබට දකින්න ලැබුණු යම් යම් දේවල් ගැන. කාන්තා අත්වැස්මක්, බිළිඳු සෙල්ලම් බඩුවක්. ඊළඟට ඔබ කිව්වා ඔබ අතේ තිබූ ඉටිපන්දම, අසාමාන්‍ය ලෙස හදිසියේ හැමූ සුළං පාරකට නිවී ගිය බව. ඔබ කාමරයට එබී බැලුවා. ඔබට දකින්න ලැබුණේ භයානක දසුනක්. ඔබ ආපසු හැරිල උඩුමහලට දිව්වා. ඔබේ සැමියාත් කැඳවාගෙන වහාම ආපහු ආවා. එහෙම නේද?"

"ඔව් මහත්මයා. ඒක නිවැරදියි"

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔබ මෙතැනින් ඉවත්වෙලා ගිහින් ආපහු එන්න කොයිතරම් වෙලාවක් ගතවෙන්න ඇතිද?"

"මිනිත්තු කිහිපයක් ගතවෙන්න ඇති............ මිනිත්තු දෙකක්........... තුනක්..........?"

"ඔබට හිතෙන්නේ එහෙමයි" හෝම්ස් කීවේ එය වැරැදි බව හඟවමිනි. "හිතේ ඇතිවී තිබූ තිගැස්ම හා කැලැඹීම නිසා ඔබට හිතෙන්නේ ඒක ඉතාම කෙටි කාලයක් කියලයි. නමුත් අපි හිතල බලමු. ඉට්පන්දම් එළියෙන් ආව් ඔබ ආපහු ගියේ කොහොමද? තිත්ත කළුවරේ අතපතගාමින්. ඉටිපන්දම් එළියක් හෝ වෙනත් කිසිම එළියක් නොතිබුණු නිසා ඔබ ගමන්කලේ අන්ධකාරයේ. මේක ඔබට හුරුපුරුදු මඟක්ද? නැහැ. කිසිසේත් නුපුරුදු තැනක්. ඔබ කොරිඩෝවේ පැත්තේ බිත්තියක් අතගාමින් ඉදිරියට යන්න ඇති. හරිද?"

"ඔව්"

"ඊළඟට ඔබට තරප්පු පෙළේ ඉහළට නගින්න තිබුණා. නමුත් ඒකටත් කිසිම ආලෝකයක් නැහැ. අන්ධකාරයේ අතපතගාමින් නුපුරුදු තරප්පු පෙළක ඉහළට නැග්ගා. ඊළඟට ඔබ කාමරයට ගිහිං තද නින්දේ සිටි සැමියා අවදිකළා. ඔහුට කථාව කියන්න මඳ වෙලාවක් ගතවුණා. එහෙම නේද?"

"ඔව්"

"නමුත් ඒ කථාව ඇත්තක් කියලා ඔහුට ඒත්තු ගන්වන්න ඔබට ඊට වැඩි වෙලාවක් ගතවුණා. අන්තිමට ඔහු කැමැතිවුණා පහළ තට්ටුවට ඇවිත් බලන්න. නමුත් කකුලේ තුවාලය නිසා ඉක්මනින් ඇවිද එන්න ඔහුට හැකියාවක් තිබුණේ නැහැ. ඒ වගේ බරපතල තුවාලයක් ලැබූ කෙනෙකුට රාත්‍රි කාලයේ නුපුරුදු තරප්පුවක් බහින්න වෙන එක මොනතරම් අමාරු කටයුත්තක්ද? ඒක අතිශයින්ම වේදනාකාරී දෙයක්. නමුත් බිරිඳගේ හිත කැලැඹුණු වෙලාවේ ඔහු නිහඬවම වේදනාව දරාගත්තා මිස, ඒ ගැන ඇයට කියන්න ගියේ නෑ..............

කාගේත් නෙත් යොමුවූයේ කපිතාන් පැරිංටන් වෙතය. හෝම්ස් කියූ දෙය සැබෑ බව පළකරන හැඟීම ඔහුගේ මුහුණේ මතුවිය. ඒ සමගම ඔහුගේ දෙතොලේ සිහින් සිනාරැල්ලක් නැගිණ.

"............ ඒ වේදනාව දන්නේත් එහෙම දෙයකට මුහුණ දුන් කෙනෙක් විතරයි" කපිතාන්වරයා කීය.

"අන්න හරි" හෝම්ස් එකඟවිය. "ඊළඟට ඔබ දෙදෙනා ලන්තෑරුම් එළියෙන් කොරිඩෝව දිගේ ඇවිදගෙන ආවා. ඒ සම්පූර්ණ කාලය මිනිත්තු පහළොවකට වැඩිවුණොත් මිස අඩු නම් නැහැ. ලොකු කටයුත්තක යෙදෙන්න පුරුදු කාරයෙකුට ඒ කාලය ඕන තරම් ඇති"

"ලොකු කටයුත්තක?" ෆැරිංටන් විමසීය. "මොන කටයුත්තකද? කවුද එහෙම දේක යෙදුණේ?"

"ඒ කටයුත්ත තමයි අවතාර හොල්මන් කුටිය අතුරුදන් කරවීම"

"මොන පිස්සු කතාවක්ද මේ?"

ජෙරමි වොල්කොට්ට කෑගැසිණ.

"කිසිම පිස්සුවක් නෑ" මගේ මිත්‍රයා කීය. "ෆැරිංටන් මහත්මිය යම්කිසි දර්ශනයක් දුටු බව සත්‍යයක්. ඒක තේරුම් කළ හැකි තර්කානුකූල විධියක් තිබිය යුතුයි. ඒ ගැන මට සැකයක් තිබුණේ නැහැ. බැලූ බැල්මට එතරම් වැදගත් කමක් නොපෙනෙන කාරණා රාශියක්ම තිබෙනවා. ඒ කාරණාත් මෙය සිදුවූ දවසත් එකට සම්බන්ධ කළාම යම්කිසි උපකල්පනයක් ගොඩනගන්න අපට පුළුවනි. මං කළ විමසීම්වලින් අමතර තොරතුරු දැනගන්න ලැබුණා. ඊට අමතරව ඔබේ වහළෙනුත් කරුණු කිහිපයක් සොයා ගැනීමට මට හැකිවුණා. ඒ කරුණුවලින් මගේ මුල් උපකල්පනය වඩාත් තහවුරු වෙනවා."

"මේ ගෙදර වහළෙන්?" ෆැරිංටන් මහත්මිය විමසුවේ පුදුමයෙනි.

"වහළේ තිබෙන වීදුරු තහඩුව ගැනයි මං අදහස් කළේ ෆැරිංටන් මහත්මිය" හෝම්ස් කීය. "නිවස ඇතුළට ආලෝකය වැටෙන සේ වහළේ සවිකර ඇති වීදුරු තහඩු. මේ මන්දිරයේ එවැනි වීදුරු තහඩු දෙකක් තිබෙනවා. එකක් තිබෙන්නේ අනිකට දළ වශයෙන් අඩි තිහක් පමණ දුරකින්. මෙතැන ඉඳගෙන වහළ දිහා බැලුවාම ඔබට එකක් පැහැදිලිවම පෙනෙනවා. ඒත් කෝ අනෙක? ඒක මේ කාමරෙත් නෑ. කෑම භාජන සූදානම් කරන අනෙක් කාමරේද? නැත්නම් භෝජනාගාරයේද? මං හිතන්නේ නෑ ඒ එකකවත් ඇති කියල.

මිනිත්තු කිහිපයකට කලින් මං මේ ගෙදර වහළට නැඟුණා. වහළේ ඉඳගෙන මේ වීදුරු තහඩු දෙකෙන්ම මං ගේ ඇතුළට එබී බැලුවා. එකකින් දකින්න ලැබුණේ ලී බඩුතබා ඇති මේ කාමරය. කෝ එතකොට අනෙක් කාමරය? ඒ වීදුරුවෙන් මට දකින්න

 http://sherlockholmesinvestigations.blogspot.com

ලැබුණේ අවුරුදු දෙළහකට කලින් හෙන්රි සාමි මියගිය ආකාරය සිහිගන්වන දේවල්"

"එහෙනම් මට වැරැද්දීමක් වෙලා නෑ?" ෆැරිංටන් මහත්මියට කියැවිණ. "මං දුටු කාමරය ඇත්තටම මේ ගෙදර තියෙනවා?"

"ඒ ගැන සැකයක් නෑ" කී හෝම්ස් කොරිඩෝවේ ඉදිරියට පියවර කිහිපයක් තැබුවේය. ඒ සමගම ඔහු පොළොව වෙත නෙත් යොමුකරමින් එහි තිබූ යම් යම් අලකුණු වෙත ද අවධානය යොමු කළේය. පොත් තබා තිබූ අල්මාරියක් අසල නැවතුණු ඔහු පහත් වී, ඒ අසලම ලෑලි පොළොව පිරික්සා බැලීය. මීළඟට ඔහු තම දකුණු අතේ මහපටැඟිල්ලේ නියපොත්තෙන් එම ලෑලි මත සූරා බැලුවේය. නියපොත්තට සිරි ආ සුදු පැහැති ද්‍රව්‍යයක් දුටු හෝම්ස්ට සතුටෙන් කෑගැසිණ. "ඩයන්! ඔබට පෙනෙනවා ඇති මේ හරියෙ බිත්තිය අනෙක් හරියේ තරම් දුර්වර්ණ වී නොමැති බව. වොට්සන්. මට ඔබේ උදව් උවමනා වෙනවා"

ඔහු මා කැඳවූයේ උස, වීදුරු පොත් අල්මාරියේ අනෙක් පැත්තටය. ඉන්පසු ඔහු ද එතැන්ට පැමිණියේය. "හරි. දැන් අපි මේ අල්මාරිය තල්ලු කරමු වොට්සන්. එකයි, දෙකයි තුනයි......... හරි!"

මුලදී මඳක් අපහසු වූවත් ඒ බර පොත් අල්මාරිය ඉවතට තල්ලුකිරීමට අපිට හැකිවිණ. ලෑලි බිම මත සබන් තවරා තිබීම නිසා අල්මාරිය තල්ලුවූයේ ශබ්දයක් නො නගමිනි. අපි එය තිබූ තැන සිට අඩි පහක් හෝ හයක් ඉවතට ගෙනගියෙමු.

"අන්න බලන්න!" ශ්‍රේස් ෆැරිංටන් පුදුමයෙන් කෑගැසුවාය. ඇගේ අවධානය යොමු වී තිබුණේ, පොත් අල්මාරියෙන් ආවරණය වී, බිත්තියේ සැඟවී තිබූ වසා දැමූ දොරක් වෙතය. හෝම්ස් වහාම එතැනට ගියේ එම දොර විවෘත කිරීමේ අරමුණෙනි. ඔහු දොර අගුළ වෙත අත තැබුවා පමණි.

"නවත්තපන් ඔය වැඩේ!" කෝපයෙන් කෑගැසුවේ පෙනිලොප් ආර්යාවය.

මෙතෙක් වේලා ඇය කථා කළ දුර්වල හඬට වඩා ප්‍රබල බවක් ඒ කටහඬේ ගැබ් වී තිබිණි. ඒ සමගම ඇගේ වැරහැලි ගවොමේ සාක්කුවකින් ඇය එළියට ගත්තේ රිවොල්වරයකි. එය කෙළින්ම එල්ල වූයේ හෝම්ස් වෙතය. මෙතෙක් වේලා රෝද පුටුවේ සිටි ඇය එයින් නැගිට්ටාය. මීළඟට ඇය පියවර කිහිපයක් ඉදිරියට

http://sherlockholmesinvestigations.blogspot.com

තැබුවේ රිවෝල්වරය අප වෙත එල්ල කරගෙනමය. ඉන්පසු ඇය වෙතින් අසන්නට ලැබුණේ වෙනස් කටහඬකි.

"ජෙරමී. මේක දුරදිග ගියා වැඩියි" ඇය කීවාය. "මුන් දන්න ප්‍රමාණය හොඳටම වැඩියි"

"ඒ ඔක්කොම උඹේ මෝඩකම නිසා" ජෙරමීට කෑගැසුණේ කෝපයෙනි.

ඉන්පසු සිදුවූ සියල්ලට ගතවන්නට ඇත්තේ මිනිත්තුවක් හෝ ඊට අඩු කාලයකි. එහෙත් එය සිදුවූ අයුරු තවමත් මගේ මතකයේ රැඳී ඇත.

රිවෝල්වරය එල්ල කරගත් ආර්යාවගේ, ජෙරමීගේ හා ලෙස්ටර් තෝන්ගේ දෙනෙත් එල්ල වී තිබුණේ හෝම්ස් හා මා වෙතටය. මෙතෙක් වෙලා තම සැරයටියට බරවී සිටි කපිතාන් ජේම්ස් ෆැරිංටන්ගේ දෙනෙත්වල දීප්තියක් ඇතිවූ අයුරු මට පෙනී නොපෙනී ගියේය. එක්වරම සැරයටිය ඉහළට එසවූ ඔහු එය, ආර්යාවගේ රිවෝල්වරය රැඳුණු අත මතුට පහත් කළේ අකුණක් ගසන තරම් වේගයකිනි. ඇය වේදනාවෙන් මරහඬ දෙද්දී ගිනිඅවිය ඉවතට විසිවී ගියේය. හෝම්ස් එය ක්ෂණිකව අහුලා ගත්තේය. සියල්ල වැරදීගිය බව දත් වයස්ගත කාන්තාව එතැනින් පැනදිවීමට තැත්කළාය. ඇය හැඳගෙන සිටි දිගු රැළිගවුම ඇයටම පැටලුණි. එයින් කකුල පැටලී ඇය බිම පෙරළෙන්න ගියේ මා අසලින්මය. මම කබා සාක්කුවෙන් වහාම මගේ රිවෝල්වරය ගෙන ඇය දෙසට එල්ල කළෙමි. එම අවස්ථාවෙන් ප්‍රයෝජන ගත් ජෙරමී වොල්කොට් හා ලෙස්ටර් තෝන් දෙදෙනා, නිවසේ ප්‍රධාන දොරටුව දෙසට පැන දිවූහ. එහෙත් හෝම්ස්ගේ කටේ ශබ්දය ඊට වඩා වේගවත් විය.

"ඔහොම නැවතියල්ලා! නැත්නම් මං වෙඩිතියනවා!"

හෝම්ස්ගේ අනතුරු ඇඟවීමේ තිබුණේ අනුකම්පා විරහිත බවකි. පැන දිවූ දෙදෙනා එතැනම නැවතී, ආපසු හැරී දෑත් ඉහළට එසවූහ.

හෝම්ස් තම අතේ වූ ගිනිඅවිය කපිතාන් ජේම්ස් ෆැරිංටන් අතට භාරදුන්නේය.

"කපිතාන්. මේ දෙදෙනායි, සේවිකාවයි මේ ආයුධයේ අණසක යටතේ තබාගැනීම ඔබට භාරයි. මේ ට්‍රෙන්ටන් මහත්මයා නම් මේ කල්ලියේ කෙනෙක් කියලා මං හිතන්නේ නෑ............." හෝම්ස් කීය.

 http://sherlockholmesinvestigations.blogspot.com

එවිට සුදුමැලිව ඩහදිය වගුරුවමින් සිටි නීතිඥයා කථා කළේය.

"..................... මං........................ මං මේ වොල්කොට් සහ .... පෙනිලොප් ආර්යාව දුටුවෙත් අඳමයි.................. මට මවුන් මීට කලින් හමුවෙලා නැහැ."

"පෙනිලොප් ආර්යාව ගැන කියනවා නම්" හෝම්ස් කීය. "ඔබට ඇය තවමත් හමුවෙලා නැහැ."

එසේ කියූ මගේ මිත්‍රයා බිම වැටී සිටි ආර්යාව වෙත ගොස් ඇය ඉහළට එසවූයේය. මීළඟට ඇගේ මුහුණ වසා තිබූ වේල්පොට මෙන්ම හිසේ වූ සුදු පැහැති කෙස් වැටියෙන් අල්ලා වේගයෙන් ඉවතට ඇද්දේය. ඒ සියල්ල පහසුවෙන් ගැළවී ගියේය. මීළඟට මුහුණේ අලවා තිබූ වෙස්මුහුණක් වැනි රබර් සිවි කිහිපයක් හෝම්ස් නම ඇඟිලි තුඩින් ගලවා දැම්මේ බලාසිටි අය මවිතයට පත්කරමිනි. වෙස්ගැන්වීම් ඉවත්කළ සඳ අප ඉදිරියේ සිටියේ, දුඹුරු පැහැති කොණ්ඩය කෙටියට කැපූ, සිහින් සිරුරක් තිබූ මිටි තරුණයෙකි. මේ දසුනෙන් තිගැස්සුණු ෆැරිංටන් මහත්මිය එක්වරම හුස්මක් ඉහළට ඇදගත්තාය.

"මට ලොකු වැරදීමක් නොවෙයි නම් මේ ඉන්නේ දක්ෂ වේදිකා නළුවෙක්. මොහුගේ නම ඇන්තනී ක්ලිසන්" හෝම්ස් කීය. "මගේ සාක්කුවේ තිබෙනවා මෑතකදී වේදිකා ගතකළ "වැන්දඹුවකගේ අභිරණය" නම් නාට්‍යයේ රැඟුම් විස්තර පත්‍රිකාව. ඒකෙ වයස්ගත වැන්දඹුවගේ චරිතය නිරූපණය කළේ මේ ක්ලිසන් මහත්මයා. මේ ලෙස්ටර් තෝන්ගේ නමත් ඒකෙ තියෙනවා. නාට්‍යයේ නිෂ්පාදකයාගේ නම ජෙරෙමි වොල්කොට්.

ෆැරිංටන් මහත්මිය. ඔබ මේ කථාව කියාගෙන යද්දී වොල්කොට් කියන නම මීට කලින් අහල පුරුදු එකක් බව මට මතක් වුණා. මං ළඟ තවමත් තියෙනවා කලකට ඉපර "ඩේලි ටෙලිග්‍රාෆ්" පුවත්පතේ පළවූ කලා අතිරේකය. ඒකෙ තියෙනවා ප්‍රයෝජනවත් ලිපියක්. ජෙරෙමි වොල්කොට් විසින් නිෂ්පාදනය කරන ලද නාට්‍ය ගණනාවක් අසාර්ථක වී ඔහු මුදල් පරිහාණියකට පත්වුණු හැටි ගැන එහි සඳහන්. ඊළඟට මට මතක්වුණේ මෑත කාලයක ඉඳලා පෙනිලොප් ආර්යාවගේ හැසිරීම වෙනස් වූ බවට ඔබ කළ ප්‍රකාශය. ඔන්න එතකොට මගේ හිතේ සැකයක් ඇතිවුණා. ඔබේ ඥාති සොහොයුරා පැරඩෝල් මන්දිරයේත් ඔහුගේ නාට්‍යයක් රඟදක්වන්න සැලසුම් කළාද කියල.

http://sherlockholmesinvestigations.blogspot.com

මේකට ප්‍රධාන අවහිරයක් වුණේ මැඳුරේ දීර්ඝ කාලයක සිට රැකියාව කළ සේවක සේවිකාවන්. ඔවුන්ට ආර්යාව හඳුනාගැනීම අපහසු නෑ. ඉතින් ඔවුන් මේ දර්ශන තලයෙන් ඉවත්කර දම්මේ ඒ නිසයි. නැතුව වැටුප් ගෙවන්න මුදල් නැතිකම නිසා නොවෙයි. වොල්කොට් ඔබට කියල තිබුණා මුළුනැන්ගෙයි සේවිකාව පමණක් රඳවාගත්තා කියල. නමුත් මං රැකියා ඒජන්සියෙන් දැනගත්තා ඒ සේවිකාවත් අස්කර ඇති බව. එහෙනම් ඒ වෙනුවට ගත්තේ වෙනත් කෙනෙක්. ඒ කරුණ නිසාත් මගේ හිතේ ලොකු සැකයක් ඇතිවුණා."

"නමුත් මගේ ලොකු ආච්චිට - ඇත්ත ආර්යාවට මොකද වුණේ? කෝ දැන් ඇය?" ෆැරිංටන් මහත්මිය ඇසුවේ නොඉවසිල්ලෙනි.

"ඒකට පිළිතුර මං හිතන්නේ මේ ළඟම ඇති." කී හෝම්ස් කලින් විවෘත කිරීමට නැත්කළ වසා දමා තිබූ මැදුර අවන ගියේය. එහි යතුරු දමා නොතිබිණි. දොර අහසුවෙන් විවෘත විය.

කාමරයේ එක් බිත්තියක් අසල බැඳ දමා තිබූ මිනිස් සිරුරක හැඩයක් අපට දකින්නට ලැබිණ. වහා එතැනට ගොස් රෙදි ආවරණය ඉවත්කරද්දී අපට දක්නට ලැබුණේ ඒ මහලු කාන්තාවක බවය.

ඇය යථා තත්ත්වයට පත්කිරීමට සෑහෙන තරම් වෛද්‍ය ප්‍රතිකාර ලබා දිය යුතු බව මම තේරුම් ගත්තෙමි. කෙසේ වෙතත් ඇගේ හද ගැස්මේ දුර්වල බව නිසා දුරබැහැර රෝහලකට ගෙන යාමද අවදානම් කටයුත්තක් බව මම හෝම්ස්ට දැනුම් දුන්නෙමි.

"වාසනාවකට වගේ ඇය තවමත් ජීවතුන් අතර" මම කීවෙමි. "ඇගේ නාඩි වැටෙනවා. නමුත් දුර්වලයි. අබිං වැනි ප්‍රබල මත්ද්‍රව්‍යයකින් ඇයව නිද්‍රාවට පත්කරල."

"ඇය වෙනුවෙන් කළ හැකි දෙයක් කරන්න වොට්සන්"

ඇය බැඳ දමා තිබූ රැහැන් පොටවල් කපා දමා, පිරිසිදු වාතාශ්‍රය ලබා දුන්නෙමු. මඳ වේලාවක් ගතවෙද්දී ඇය ක්‍රමයෙන් හුස්ම ගැනීමට පටන් ගත්තාය. භීතියට පත්ව සිටි ෆැරිංටන් මහත්මිය සැනසුම් සුසුමක් හෙළුවාය.

"මහත්මිය. මෙන්න තියෙනවා ඔබ දුටු බිහිසුණු හොල්මන් කුටිය" මගේ මිත්‍රයා කීවේය. එම කාමරය පිළිබඳව අපගේ දෙනෙත් යොමු වූයේ එවිටය. කුටිය ගැන සඳහන් කළ වහාම යළිත් වරක්

 http://sherlockholmesinvestigations.blogspot.com

ෆැරිංටන් මහත්මියගේ මුහුණ බියෙන් ඇළලී ගිය අයුරු මම දුටුවෙමි.

හෝම්ස් විසින් සඳහන් කරන ලද වහලේ වූ අනෙක් වීදුරු තහඩුව, මේ කාමරයේ සිට අපට දකිය හැකි විය. මෙය දීර්ඝ කාලයකින් කිසිම පිරිසිදු කිරීමකට ලක් නොවූ කාමරයකි. එය තට්ටු ගණන් දූවිලිවලින් හා මකුළුදැල්වලින් වැසී තිබිණි. කුටියේ බිත්තිවල ඉහළ මට්ටමෙන් වනසතුන්ගේ සංරක්ෂණය කළ ශීර්ෂ සවිකොට තිබිණි. මුවන්, ගෝනුන්, වල්ඌරන් හා කුළු මීහරකුන්ගේ ඖෂධ යොදා සංරක්ෂණය කළ හිස් එහි විය. ඒවායේ දෙනෙත් වෙනුවට වීදුරු බෝල සවිකොට තිබිණි. ඒවායේ රැඳුණු හා එල්ලා වැටුණු මකුළුදැල්වලින් බිහිසුණු දසුනක් ඇතිවීම පුදුමයක් නොවේ. කාමරයේ වූ මේස දෙකක් හා රාක්කයක් මත, ඖෂධ කවා සැකසූ සිංහයෙකුගේ, දිවියෙකුගේ හා මහාරවමින් පැනීමට සූදානම් වළසෙකුගේ සිරුර ද විය. මේවා ද මකුළුදැල්වලින් වැසී තිබිණි. කට ඇරගෙන, දත් විලිස්සාගෙන, උන්ගේ උල් නියපොතු ඉදිරියට දිගුකරගෙන තිබූ මෙම සත්ත්ව සිරුරු අඩ අඳුරේ දකින කෙනෙකු ඇඟ කිළිපොළා යන භීතියකට පත් නොවන්නේ කෙලෙසද?

"මට තේරෙනවා" ෆැරිංටන් මහත්මිය කීවේ ආර්යාව අසලින් දණගසා ගනිමිනි. දවල් හිරු එළියේ පවා මේකෙ තියෙන්නේ සිත භයට පත්කරවන භයානක පෙනුමක්. ඒ වුණත් මං මේකෙ දුටු අද්භූත කහ එළිය මොකක්ද?"

"හරියටම සතියකට කලින් හඳ පුන්හඳ පායලා තිබුණු දවස" හෝම්ස් කීය. "රෑ එක විතර වෙද්දී හඳ මුදුන් වෙන කොට වහලේ වීදුරු තහඩුව හරහා මේ අඳුරු කාමරයට කහපාටට සඳ එළිය වැටෙන්න ඇති. ඔබට එද රාත්‍රී නින්ද නොගිහින් පහළ තට්ටුවට එන්න සිදුවුණා. ඒ නිසා තමයි ඉමී කාමරයේ දොර ඇරලා තියෙනවා දකින්න ලැබුණේ"

"ඒ වුණත් ඒ වෙලාවෙ ඔවුන් මොකටද දොර ඇරියෙ?"

"සැකයක් නෑ. ඔබේ ඥාති සොහොයුරා එන්න ඇති කාමරයට" හෝම්ස් කීය. "ඔහු හිතන්න ඇති ඒ වෙලාවෙ කාමරයට ඒම පරෙස්සම් සහිතයි කියලා.......................... බාගවෙලාවට ආර්යාව මත්කරන්න.

එහෙමත් නැත්නම් ඔහු මේ කාමරයේ කබඩ්, අල්මාරි, ලාච්චු අරිමින් යමක් හොයන්න - පවුලේ ඉඩකඩම් ආදියේ ඔප්පු. ඔබට

http://sherlockholmesinvestigations.blogspot.com

අර බිලිදෙකුගේ සෙල්ලම් බඩුවක් දකින්න ලැබුණා නේ. ඒ ලාච්චුවක් කලබලයෙන් අවුස්සා බැලූ බවට සලකුණු"

"ඒ වුණත් ඔහු කාමරය ඇතුළේ ඉන්නවා මං දුටුවේ නැහැ. ලාම්පුවක් දල්වලා තිබුණෙත් නැහැ" ඇය කීවාය.

"ඔබ තරප්පුව බැහැගෙන කොරිඩෝවේ එන ශබ්දෙ ඔහුට ඇහෙන්න ඇති" හෝම්ස් කීය. "ඔහු තමන් ළඟ තිබුණු ලාම්පුව වහාම නිවාදමන්න ඇති. ඔහුට දොරවහන්න තරම් වෙලාවක් තිබුණෙ නැහැ. ඔහු හැංගිලා බලාගෙන හිටියා, කවුද එන්නෙ මොකද කරන්නේ කියලා. ඔබ නැවතිලා සෙල්ලම් බඩුව ඇහිඳගෙන කාමරය තුළට එද්දි ඔහුට කළ හැකි දෙයක් තිබුණේ නැහැ. නමුත් ඔහුට හැකිවුණා, ඔබේ ළඟ තිබූ ඉටිපන්දම නිවෙන සේ හුළං පාරක් පිඹින්න. ඒ සමගම ශුභනිලොල් ආර්යාව වේදනාවෙන් කළ කෙඳිරිගෑමෙන් හා සතුන්ගේ බිහිසුණු දර්ශනවලින් ඔබ තැතිගත්තා. එතකොට ඒකත් ඔහුගේ වාසියට හිටියා."

"ඇත්තෙන්ම ඔව්. මම භයට පත්වුණු තරමක්"

"ඔබ ඔබේ සැමියා සමග තේ බොයි මොහොතේ හෝ ආපසු ඒමට ඉඩ ඇති බව ඔහු දැනගෙන හිටියා." හෝම්ස් කීය. "එහෙම ඇවිත් කාමරය ඇතුළත දුටුවොත් හැමදෙයක්ම හෙළිවෙනවා - විශේෂයෙන්ම ඇත්ත ආර්යාවට ඔහු දී ඇති දඬුවම. ක්ෂණිකවම කළ හැකි එකම දේ, කාමරය වසාදමලා එහෙම තැනක් නොමැති බව පෙන්වීමයි. සෙල්ලම් බඩුව හා අත්වැසුම කාමරය ඇතුළට දමලා ඔහු අනෙක් කාමරයේ නිදසිටි ඔහුගේ මිතුයින් අවදිකරවා ගත්තා. ඊළඟට මේ දොර ආවරණය වන විධියට පොත් අල්මාරිය තල්ලු කිරීම ඔහුට අපහසු වුණේ නැහැ. බිම ලැල්ලේ සබන් තවරා තිබීම නිසා ශබ්දයක නැගුණෙත් නැහැ. ඇන්තනි ක්ලිසන් වහාම කාමරයට රිංගාගෙන ආර්යාව ලෙස ඇඳුනා. ඒ ඔහුගේ භූමිකාව රඟපාන්න. ඊළඟට ජෙරෙමි ඔබේ සෙරෙප්පුව සැඟෙන්න ඇතට දැම්මා - භෝජනාගාරයේ දොර ළඟට. එතකොට ඔබ ඇවිත් විමසීම් කරන්නෙ ඔබේ සෙරෙප්පුව තිබුණු තැන.

මේ අතරේ ඔබ සැමියා සමග පහළ තට්ටුවට බැස එන හඬ ජෙරෙමිට ඇහෙන්න ඇති. ඔහු කොහේ හරි මුල්ලක හැංගුණා. ඔබ ඉදිරියට ගියාට පස්සේ ඔහු ශබ්දයක් නගමින් ආවේ උඩතට්ටුවේ කාමරයක නිදාගෙන ඉඳලා ආවා වගේ. ඇවිත් අහිංසක විධියට

 http://sherlockholmesinvestigations.blogspot.com

කතාබහක යෙදුණා. ඔහුත් බොහොම දක්ෂ නළුවෙක් බවයි මට කියන්න තියෙන්නේ"

"ඔහු මට පෙන්නුවේ වෙනත් දෙරක්, වෙනත් කාමරයක් බව, මට තේරුම් ගන්න බැරිවුණා" ෆැරිංටන් මහත්මිය කීවාය.

"ඒකෙ පුදුමයක් නෑ" හෝම්ස් කීය. "බොහොම දෙනෙකුට ඒ විධියේ වැරැදීමක් වෙන්න පුළුවනි. තමන්ට කිසිසේත් නුපුරුදු නිවසක, රාත්‍රී කාලයේ, අන්ධකාරයේ, භයෙන් තැතිගත් වෙලාවක, වැරදුණේ නැත්නම් තමයි පුදුමේ. ඉතින් ඔබේ ඥාති සොහොයුරාගේ කූට ප්‍රයෝගය සාර්ථක වුණා. ඊළඟට ඔහු දිගටම මත්ද්‍රව්‍ය පොවමින් ආර්යාව වසඟ කරලා තියාගත්තා. ඒ ඇගේ දේපොළ හොරකම් කරගන්න, වංචනිකව අන්තිම කැමැති පත්‍රය ලියවා ගන්න."

"ඒ වුණත් හෝම්ස්" මම ඇසීමි. "ඇගේ අත්සන වෙනස් එකක් වුණොත් ඒ වංචාව එළිවෙනවා නේද? මොනවා හරි ලියවිල්ලක ඇය කලින් යෙදූ අත්සනක් සසඳලා බැලුවොත්.............?"

"මොනවද වොට්සන් ඔවුනට දකින්න ලැබෙන්නෙ? වයස්ගත රෝගී කාන්තාවක් වෙවුලන අතකින් යෙදූ අත්සනක්. ඇත්තනී ක්ලිසන් රඟපාන්න දක්ෂයෙක් වගේම හොර අත්සන් ගහන්නත් දක්ෂයෙක් බවට මගේ සැකයක් නෑ. මේ සැලසුමේ ඇති වැදගත්ම ලක්ෂණය මොකක්ද? ලන්ඩන් නගරයෙන් ගෙන්වූ නීතිඥයෙකු ඉදිරියේ අන්තිම කැමැත්ත ලියැවීම"

"ඇයි නීතිඥයෙකු ලන්ඩන් නගරයෙන්ම?" මම ඇසීමි.

"ඒක ඔවුන්ට දෙපැත්තකින් වාසියි." හෝම්ස් කීය. මේ පළාතක නීතිඥයෙකු සමහර විට මේ නියම පෙනිලොප් ආර්යාව නොවෙන බව හඳුනාගන්න ඉඩ තියෙනවා. අනික ලන්ඩන් නගරයේ පිළිගත් නීතිඥ මහතෙකු මේ කටයුත්ත කළා කිව්වාම පිළිගැනීම තවත් වැඩියි.

දුර්වලව සිටි ආර්යාව අන්තිම කැමැති පත්‍රයට අත්සන් කළේ තමා ඉදිරියේම බව නීතිඥයා සහතික කරාවි. ඊට අමතරව සාක්ෂිකාරයොත් ඉන්නවා. මේකෙන් කිසිම වාසියක් නොලබන ආර්යාවගේ ළඟම ඥාතිවරියක වන ෆැරිංටන් මහත්මිය සාක්ෂියට අත්සන්කිරීම මේ හොර කක්කඩින්ගේ ලොකුම වාසනාව වෙනවා............"

"එහෙම අත්සන් කළා නම් මේ ලියවිල්ල වඩාත් පිළිගත හැකි නීත්‍යානුකූල එකක් වෙනවා. එහෙම නේද හෝම්ස්?" මම ඇසීමි.

"ඇත්තෙන්ම ඔව්" ඔහු කීය. "ඒ විතරක් නෙමෙයි ඇය මේ වංචාවට හවුල්කරුවෙකු වෙනවා. ඒකයි මං වහාම ඉදිරිපත්වෙලා ඇයව නැවැත්තුවේ. මට සැකයක් නෑ; ඔවුන් සැලැසුම් කරගෙන ඉන්න ඇති මොනවා හරි ක්‍රමයකින් ආර්යාව ඉක්මනින් මරණයට පත්කරන්න. එතකොට ඊ වෙලාවක ඇගේ මළසිරුර ඇඳ මතට ඒවි. ඇන්තනී ක්ලීසන් මහත්මයා ඇඳුම් මාරුකරගෙන ශෝකවෙන අය අතර ඉඳීවි. වොල්කොට්ට උරුම වෙන දේපොළෙන් කොටසක් ක්ලීසන්ටත් ලැබේවි."

"හෝම්ස් මහත්මයා. ඔබ හෙන්රි සාමිගේ මරණය ගැන සඳහන් කළා" ෆැරිංටන් මහත්මිය කීවාය. "එතැනදීත් මේ වගේ මොකක් හරි කූට ප්‍රයෝගයක් සිදුවුණාද?"

"කොහොමටවත් නෑ." හෝම්ස් කීය. "ඔහු මියගියේ වනසතුන් දඩයම් කිරීමට ගිය ගමනකදී. අප්‍රිකාවේ වල්අලින් වෙඩිතැබීමට ගිය ඔහු, වල්අලියෙකුගේ ප්‍රහාරයෙන්ම මියගියා. මේ කාරණය මට අමතක වෙලයි තිබුණේ. නමුත් මේ ගෙදර වහළේ වීදුරු තහඩුවෙන් එබී බලද්දී මා දුටුවා යම් යම් දේවල් එතුකොට හැමදෙයක්ම මගේ සිහියට ආවා. හෙන්රි සාමිවරයා ඛේදජනක ලෙස මියගියේ සතුන් දඩයමට ගිහින්. දැඩි ශෝකයටත් කම්පාවටත් පත් ආර්යාව, බාගවෙලාවට මේ කාමරය වසා දමන්න නියම කරන්න ඇති. ඔබේ ඥාති සොහොයුරා මේක දුටුවාම ඔහුට හිතෙන්න ඇති, ඔහුගේ දුෂ්ට සැලසුම ක්‍රියාත්මක කරන්න මේ කුටිය යොදගන්න."

මම යළිත් වරක් ආර්යාව සෝදිසි කර බැලීමි. ඇගේ නාඩි වැටීම තරමක් සතුටුදායක තත්ත්වයට අත්ව තිබිණ. ඇය ප්‍රතිකාර සඳහා රෝහලක් වෙත ගෙනයාමට සුදුසු තත්ත්වයේ බව මම හෝම්ස්ට කීවෙමි.

"බොහොම හොඳයි. අපි ඉක්මනින් ඇයව රෝහලකට යවමු" ඔහු කීය.

"මේ තක්කඩින් ගැනත් අපි අමතක කරන්න නරකයි. ආර්යාව රෝහලට යවන රියෙන්ම පොලිස් නිලධරයන් කැඳවාගෙන ඒමත් කරමු. ෆ්‍රෙන්ටන් මහත්මයා. මට උවමනා වෙනවා ඔබ ඇසින් දුටු සාක්ෂි"

 http://sherlockholmesinvestigations.blogspot.com

"ඒ දේ මං බොහොම සතුටින් ඉටුකරන්නම් මහත්මයා"

* * *

ග්‍රේස් ෆැරිංටන් මහත්මිය යළිත් වරක් ලන්ඩනයේ අපේ නිවහන වෙත පැමිණියාය. මෙවර ඇගේ සැමියා වූ කපිතාන් ජේම්ස් ෆැරිංටන් ද ඇය සමග විය. කාලගුණය යහපත් අතට හැරී තිබුණු මෙදින, ඇය හෝම්ස් අතේ ලොකු ගනකම් ලියුම් කවරයක් තැබුවාය. එය පුරවා තිබුණේ මුදල් නෝට්ටුවලින් බව මම තේරුම් ගතිමි.

"හෝම්ස් මහත්මයා. මේ පෙනිලොප් ආර්යාවගෙන් ඔබට තෑග්ගක්. ඔබෙන් වුණු මිල කළ නොහැකි සේවාවට සුළු තෑග්ගක්"

"ඇය බොහොම කරුණාවන්තයි" හෝම්ස් කීවේ ලියුම් කවරය අතට ගනිමිනි.

"දැන් කොහොමද ඇගේ සෞඛ්‍ය තත්ත්වය?"

"ඇය සම්පූර්ණයෙන්ම සුවය ලැබුවා" ග්‍රේස් ෆැරිංටන් කීවාය. "වාසනාවකට වගේ ඇය නිරෝගී ශරීරයක් තිබෙන තැනැත්තියක්. ජෙරෙමි අපට පෙන්නුවේ සම්පූර්ණයෙන්ම වැරැදි චිත්‍රයක්. ලොකු ආච්චි මට එවූ ලියුම්වල වගේම, කරුණාවන්ත, සෙනෙහබර තැනැත්තියක් බව මට පෙනෙනවා. ඔබ දෙන්දෙනාට බොහොම ස්තූතියි" කී ෆැරිංටන් යුවළ අපෙන් සමුගෙන බේකර් වීථියේ නිවසෙන් පිටවී ගියහ.

ඇන්තනි ක්ලීසන් හා ජෙරෙමි වොල්කොට් දෙදෙනාටම අවුරුදු දහය බැගින් සිරදඬුවම් ලැබිණ. ඔහුට විරුද්ධව තිබූ සාක්ෂි ප්‍රමාණවත් නොවූ නිසා ලෙස්ටර් තෝර්න් චෝදනාවලින් නිදහස් විය.

http://sherlockholmesinvestigations.blogspot.com

සමර්සෙට් ඛේදවාචකය

මගේ හිතමිත්‍ර ෂර්ලොක් හෝම්ස් මහතාට අපරාධ පරීක්ෂණ සඳහා බ්‍රිතාන්‍යයේ සෑම අස්සක් මුල්ලක් නෑර්ම සංචාරය කිරීමට සිදු වූ බව අමුතුවෙන් කිවයුතු නොවේ. එහෙත් සමහර ප්‍රාන්තවලට ඔහුට යෑමට සිදුවූයේ ඉතාමත් කලාතුරකින් බව, මගේ වාර්තා පරීක්ෂා කිරීමේදී පෙනීයයි. මෙවැනි එක්තැනක් දකුණු එංගලන්තයේ සමර්සෙට් ප්‍රාන්තයයි. ලෝඩර් ගම්මානයේ මේරි ඇන්ජලීනා ස්ටුවට් මහත්මියගේ අභිරහස් මරණය ගැන සෙවීමට අප එහි කැඳවනු ලැබුවේ 1889 වසරේ ග්‍රීෂ්ම සෘතුවේදීය. ලන්ඩනයේ වයිට්චැපල් ප්‍රදේශයේදී බිහිසුණු ලෙස කාන්තාවන් ඝාතනය කළ "ජැක් ද රිපර්" නමින් හැඳින්වූ ඝාතකයා ක්‍රියාත්මක වූ වර්ෂය 1888 වර්ෂයයි. එංගලන්තය පමණක් නොව බටහිර යුරෝපයම භයෙන් ත්‍රස්ත කළ, ජැක්ගේ කුරිරු ඝාතනවලින් මහජනතාවගේ සිත් භීතියෙන් ඇළලී ගිය්‍ය. එබැවින් එම කාලයේදී සිදුවූ මේරි ස්ටුවට් මහත්මියගේ මරණයට එතරම් අවධානයක් යොමු නොවීම පුදුමයක් නොවේ.

හෝම්ස් මේ ගමන උදේ පාන්දරින්ම පිටත්වීමට තීරණය කළේ ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියේ රහස් පරීක්ෂක බ්‍රැඩ්ස්ට්‍රීට් විසින් කළ දැනුම්දීමකට අනුව ය.

"උදේ කෑමට මොනවා හරි අපි මගදී මිලට ගමු වොට්සන්. පොලිස් නිලධරයන් ගිහින් එතැන අවුල් කරන්න කලින් අප එතැනට ගිහින් හිටියොත් හොඳයි" උදේ පාන්දරින්ම අවදි වූ මගේ මිත්‍රයා කීවේ හැඳපැළඳ ගනිමිනි. සේවක ළමයා ගෙන ආ කෝපි බී අපි කුලීරියකින් දුම්රියපොළ බලා පිටත්වී ගියෙමු. දුම්රියේ භෝජනාගාරය ගැන වැඩි විශ්වාසයක් තැබීමට නොහැකි වූ නිසා අපි දුම්රියපොළ අසල වූ අවන්හලක් වෙත ගියෙමු. මිලට ගත් කෑමදුව්‍ය පාර්සල් කරවාගන්නා අතරේ උදෑසන පුවත්පත් කිහිපයක්ම මිලට ගැනීමට ද හෝම්ස් අමතක නොකෙළේය.

 http://sherlockholmesinvestigations.blogspot.com

"අද හැම පත්තරේකම මගේ ප්‍රධාන ප්‍රවෘත්තිය වෙලා තියෙන්නේ මේ අපරාධය" හෝම්ස් කීවේ "මෝනිං ක්‍රොනිකල්" පුවත්පත දිගහරිමිනි.

"සමාවෙන්න මහත්වරුනි!" මං ප්‍රමාද නැහැ නේද?" අපේ කතාබහට බාධාකරමින් එතැනට පැමිණි කිසිවෙක් පැවසුවේය.

කෑම පාර්සලය ගමන්මල්ලේ දමාගන්නා අතර මම ආපසු හැරී බැලීමි. ඒ උස මහත පුද්ගලයා මා මුලදී අදහන් කළ බ්‍රැඩ්ස්ට්‍රීට් ය.

"සුභ උදෑසනක් බ්‍රැඩ්ස්ට්‍රීට්" හෝම්ස් කීය. "අපි මේ ඔබටත් එක්ක උදේ කෑම මිලට ගත්තා. මොනවද අලුත් ආරංචි? ඔබ ඊයෙ රෑ මට දැනුම්දුන් විස්තර, දොස්තර වොට්සන්ට කියන්න මට තවමත් බැරිවුණා"

"අලුත් ආරංචි කොහොමත්ම නෑ හෝම්ස් මහත්තයා" පොලිස් නිලධරයා කීය. "ඔය අද පත්තරවල පළවෙලා තියෙන්නෙත් ඊයෙ පොලීසියට දැනගන්න ලැබුණු දේවල්ම තමා. වඩාත්ම හොඳ විස්තරයක් තියෙන්නේ, මං හිතන්නේ "ඩේලි ටෙලිග්‍රාෆ්" පුවත්පතේ" ඔහු කීවේ අප ප්‍රවේශපත්‍ර මිලටගෙන, වේදිකාවට පා තබද්දීය.

මේ දුම්රියෙන් යෑමට බොහෝ විශාල සෙනගක් වේදිකාවේ රැස්ව සිටි අයුරු අපට දකින්නට ලැබිණි. පළමුවෙනි පංතියේ දුම්රිය මැදිරියක, උප මැදිරියක්, බ්‍රැඩ්ස්ට්‍රීට් අප වෙනුවෙන් වෙන් කරවාගෙන තිබිණි. එබැවින් අවහිරයකින් තොරව නිදහසේ කතාබහ කරමින් යෑමට අපට අවකාශ සැලසිණ. අසුන්වල වාඩිගත් වහාම අපේ අවධානය යොමු වූයේ පුවත්පත්වල මුල් පිටු වෙතය. මා දැන් ඔබට ඉදිරිපත් කරන්නේ "ඩේලි ටෙලිග්‍රාෆ්" පත්‍රයේ පළවූ එම ප්‍රවෘත්තියයි.

හමුද නිලධරයාගේ බිරිඳ අභිරහස් ලෙස ඝාතනයට ලක්වේ. මිනීමරුවා නිදැල්ලේ!

විශ්‍රාමලත් ජ්‍යෙෂ්ඨ හමුද නිලධරයෙකු වූ මේජර් ජෙනරාල් ජෝන් සැමුවෙල් ස්ටුවට් මහතාගේ බිරිඳ වූ මේරි ඇන්ජලීනා ස්ටුවට් මහත්මිය ඊයේ අවස සාහසිකයෙකුගේ වෙඩිපහරට ලක්ව අවසන් හුස්ම හෙළුවාය. ශාෆ්ට්ස්බරි නගරයට නුදුරින් පිහිටි

ලෞඩර් ගම්මානයේ පදිංචිව සිටි සුප්‍රකට සමාජ සේවිකාවක් වූ ඇයගේ ඛේදජනක මරණය නිසා ප්‍රදේශවාසීහු බලවත් ශෝකයටත් කම්පාවටත් පත්ව සිටිති. පුවත්පත මුද්‍රණයට යන අවස්ථාව වනවිටත් අපරාධකරුවා අල්ලා ගැනීමට සමර්සෙට් පොලීසියට හැකිවී නොතිබිණ. මෙම බිහිසුණු අපරාධය, ඉතාම සංකීර්ණ එමෙන්ම අභිරහස් එකක් බවට පත්වී ඇති නිසා, වැඩිදුර පරීක්ෂණය ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියට යොමු කෙරිණි. මෙහි අභිරහස් බව නිසාම, ලන්ඩන්යේ සුප්‍රකට අපරාධ පරීක්ෂණ විශේෂඥ ෂර්ලොක් හෝම්ස් මහතාගෙන් මේ සඳහා උපදෙස් ගැනීමට පොලිස් ප්‍රධානීන් තීරණය කර ඇතැයි විශ්වාස කටයුතු ආරංචි මාර්ගවලින් හෙළි වී තිබේ. මූලික පොලිස් පරීක්ෂණවලදී සිද්ධිය පිළිබඳව දැනගන්නට ලැබී ඇති තොරතුරු සැකෙවින් මෙසේය.

යුද්ධ හමුදාවෙන් විශ්‍රාම ලැබීමෙන් අනු මේජර් ජෙනරාල් සැමුවෙල් ස්ටුවට් හා ඔහුගේ බිරිඳ දිගු කලක සිට පදිංචිව සිටියේ ලෞඩර් ගම්මානයේ "ඔක්ටගන්" නම් නිවසේය. මෙය ඔවුනටම අයත් පෞරාණික නිවසකි. ඔවුන්ගේ පුතුන් දෙදෙනාම විවාහ වී විදේශ රටවල හමුදා සේවයේ නිරතව සිටිති.

ඊයේ සිකුරාදා හොඳ පැහැබර කාලගුණයක් තිබූ දවසකි. ස්ටුවට් මහතා සවස 2.30ට නිවසින් පිටත්වීමට සූදානම් විය. ඒ ගොල්ෆ් ක්‍රීඩාව සඳහා "සනිග්‍රීන්" නම් ගොල්ෆ් පිට්ය වෙත යෑම සඳහායි. ඔවුන් සතු අශ්වකරත්තයක් තිබුණත්, මෙම ගමන සැමවිටම ව්‍යායාමයක් ලෙස පයින්ම යෑම ස්ටුවට් මහතාගේ සිරිතකි. මෙම අවස්ථාවේ තම සැමියා සමගම නිවසින් පිටත්වී වෙනත් ගමනක් යෑමට ස්ටුවට් මහත්මියට උවමනා වී ඇත.

නිවසේ සිට සැතපුම් භාගයක් දුර යනතුරු ස්ටුවට් යුවළ එකටම ගමන් කළහ. ඒ වනවිට ඔවුහු තම වතුයාය කෙළවර වන තැන ගේට්ටුව දක්වා පැමිණ සිටියහ.

මෙතැන් සිට එක් පැත්තකට විහිදී තිබෙන්නේ ආතර් හෙන්ඩසන් මහතාට අයත් වතුයාය යි. විශ්‍රාමලත් දුම්රිය ඉංජිනේරුවරයෙකු වන හෙන්ඩසන් මහතා අවුරුදු අසූවක් වයසැති පුද්ගලයෙකු වේ. ඔහු ස්ටුවට් පවුලේ ළගම හිතවතෙකි. හෙන්ඩසන් මහතාගේ වත්තේ කෙළවරේ, එනම් ස්ටුවට් වත්තේ මායිම් වැට සමීපයේ උස්බිමක මත ගොඩනැංවුණු කුඩා උද්‍යාන

 http://sherlockholmesinvestigations.blogspot.com

කුටියක් ඇත. සමහරුන් ලතා මණ්ඩපය නමින් ද හඳුන්වන මේ කුඩා ගෙදර ඉදිරිපස විවෘත ආලින්දයකි. උස්බිමක් මත පිහිටීම නිසා මෙම ආලින්දයට පැමිණි විට සැතපුම් ගණනක් ඈතට අලංකාරව දැකගතහැකිය. එක් පැත්තකින් සෝල්ස්බරි දක්වා ද අනෙක් පැත්තෙන් බ්ලැක්මුවර් විල්ලුවද දැකගත හැකි මෙතැනට වී, සොබා සෞන්දර්යයේ අසිරිය දැකගැනීමට ස්ටුවට් මහත්මිය සැමවිටම ප්‍රියකළාය. එබැවින්, සැමියාගෙන් සමුගෙන ඇය, වනමල්වලින් වැසී තිබුණු ලඳු කැලැව අතරින් වැටුණු අඩිපාරේ උද්‍යාන කුටිය වෙත ගමන් කළාය. මේ වනවිට වේලාව සවස තුන වී තිබිණි. තමා මිනිත්තු කිහිපයක් මෙතැන විවේකීව හිඳ ඉක්මනින් ආපසු නිවස වෙත යන බව ඇය සැමියාට දන්වා සිටියාය. ඇය පමා නොවී සවස 4ට පෙර තම නිවසට යා යුතුව තිබිණි. ඒ තේ පානය සඳහා තම නිවසට සවස 4ට පැමිණීමට නියමිත මිතුරියක පිළිගැනීම සඳහා යි.

"සනිග්‍රීන්" ක්‍රීඩාපිටියේ මිනිත්තු විස්සක් පමණ ගතකළ හමුදානිලධරයා, වෙනත් පාරකින් තම නිවස බලා ආපසු ඒමට පිටත්විය. යාබද ගමේ කඩමණ්ඩිය හරහා පැමිණි ඔහුට පළාතේ දෙව්මැඳුර භාර ඇලෙක් ලැංඩන් දේවගැති තුමා ද හමුවිය. පිට පළාතකින් පැමිණ සිටි තරුණ තරුණියන් කිහිපදෙනෙක්, මෙම ගම්මානයේ සුන්දර තැන් ඡායාරූප ගතකරමින් දේවගැතිතුමාගේ අශ්වකරත්තයේ ගමන් කළහ. ඔවුනට ස්ටුවට් මහතා හමුවද්දී වේලාව සවස 4.15 බව මෙතැන සිටි එක් තරුණියකට මතක තිබිණ.

තමාගේ අශ්වකරත්තය ස්ටුවට් නිවස දෙසට ගමන්කරන නිසා, නවතා තිබූ තම අශ්වකරත්තයට නගින මෙන් ලැංඩන් දේවගැතිතුමා ස්ටුවට් මහතාට ඇරයුම් කළේය. එහෙත් තමා ව්‍යායාමයක් ලෙස ඇවිදින නිසා ස්ටුවට් මහතා එම ඇරයුම කාරුණිකව ප්‍රතික්ෂේප කළේය. මීළඟට ඔහු සැහෙන දුරක් ඉදිරියට ගිය පසු, අශ්වකරත්තය ඉක්මනින් පැමිණ ඔහු පසුකර යාමට සූදානම් විය. මෙතැනදී දේවගැතිතුමා යළිත් වරක් ස්ටුවට් මහතාට කරත්තයට නගින මෙන් ඇරයුම් කළේය. තම සාක්කු ඔරලෝසුවෙන් වේලාව පරීක්ෂා කළ හමුදානිලධරයා මෙවර ඒ ඇරයුම පිළිගත්තේය. විඩාපත්ව සිටි තමා පයින්ම ගෙදර ගියහොත්

http://sherlockholmesinvestigations.blogspot.com

අමුත්තා පිළිගැනීමට පමාවිය හැකි බැව් ඔහුට වැටහිණි. ඒ බැව් කියූ ඔහු ලැංඩන් දේවගැතිතුමාට ස්තුති කිරීමටද අමතක නොකෙළේය.

තේ පානය සඳහා ස්ටුවට් නිවසට පැමිණෙන මෙන් ඇරයුම ලැබී තිබුණේ අයිලීන් හේග් නම් කාන්තාවටය. පනස් හැවිරිදි අවිවාහක කාන්තාවක වූ ඇය, ස්ටුවට් මහත්මියගේ හිතෛෂී මිතුරියකි. සවස හතරට නිවසට පැමිණෙන මෙන් ඇරයුම් ලැබී තිබුණත්, ඇය එහි ළඟාවනවිට සවස 4.20 පමණ වී තිබිණි. ගෙහිමියාවත් ඔහුගේ බිරිඳවත් නිවසේ නොසිටි බැව් දුටු හේග් මෙනෙවිය පුදුමයට පත්වූවාය. මිනිත්තු කිහිපයක් ඉවසූ ඇය මඳක් අමනාපයෙන් මෙන් නිවසෙන් පිටවී යාමට තැත් කළාය. එහෙත් ආයාචනා කොට ඇය රඳවා ගැනීමට ගෘහසේවිකාවට හැකිවිණි.

තම නිවසට ආපසු පැමිණි මේජර් ජෙනරාල් ස්ටුවට් අතිශය පුදුමයට පත්විය. බිරිඳ තවමත් ආපසු පැමිණ නොසිටීම ගැන හේග් මෙනෙවියගෙන් සමාව ඉල්ලූ ඔහු, තේපැන් සංග්‍රහය වහා සූදානම් කරන මෙන් සේවිකාවට නියෝග කළේය. තම බිරිඳ දැන් කොයි මොහොතක හෝ නිවසට ළඟාවිය හැකි නිසා, ඇය එනතෙක් තේ පානය අරඹන මෙන් ඔහු හේග් මෙනෙවියගෙන් ඉල්ලා සිටියේය.

කාලය ගතවී ගියේය. සවස 5.20ට ළංවෙද්දීත් ස්ටුවට් මහත්මිය ආපසු නොපැමිණියාය. ඒ ගැන ඇගේ සැමියාගේ සිතේ ඇතිවූයේ දැඩි කැළැඹීමකි. අන්තිමේදී ඇය සොයා යාමට ඔවුහු තීරණය කළෝය. සිවුරුහන්කොට තම සුරතල් බල්ලා ද කැඳවාගත් ස්ටුවට් මහතා පෙරමුණ ගත්තේය.

ස්ටුවට් මහත්මිය ආපසු පැමිණීමට නියමිත පාර දිගේ ඔවුහු ඉදිරියට ගමන්කළහ. එම පාර දෙකට බෙදෙන මංසන්ධියකට ඔවුන් පැමිණියත්, ස්ටුවට් මහත්මියගේ ලකුණක් හෝ නොවීය. උද්‍යාන කුටිය දක්වා වැටෙන අඩිපාරට හැරී යා යුතුව තිබුණේ මෙතැනදීය. අත්‍යවශ්‍ය කටයුත්තක් සඳහා තවත් පමානොවී තමා පිටත්වී යායුතු බව අයිලින් හේග් මෙනෙවිය මෙතැනදී පැවසුවාය. එබැවින් ස්ටුවට් මහතා සමග උද්‍යාන කුටිය වෙත යාමට ඉතිරිව සිටියේ සුරතල් "චීටා" පමණි. අපමණ සිත් කැළැඹීමෙන් සිටි ස්ටුවට් මහතා උද්‍යාන කුටියට ළඟාවෙන විට සවස 5.35 වී තිබිණි.

මෙතැනට ළංවෙද්දී බල්ලා හැසිරුණු ආකාරයේ වෙනස්කමක් හමුදා නිලධරයාට දකින්නට ලැබිණි. ඌ උද්‍යාන කුටිය දෙස බලාගෙන නොනවත්වාම උඩුබුරලන්නට පටන්ගත්තේය. එහි

 http://sherlockholmesinvestigations.blogspot.com

ආලින්දයේ කිසිවෙකු සිටි බවක් පහළ සිට බැලූ බැල්මට නොපෙනිණ. ස්ටුවට් මහතා එහි තරප්පු පෙළ දිගේ අඩියට දෙකට ඉහළට නැගුණේය. දකින්නට ලැබුණු දසුනෙන් ඔහු භීතියෙන් ගල්ගැසිණි. අඩ අඳුරේ ඔහුට දකින්නට ලැබුණේ බිම ඇදවැටී සිටි කාන්තාවකගේ රුවය.

ඒ තම බිරිඳ බව හඳුනාගැනීමට ඔහුට ගතවූයේ එක් නිමේෂයකි. ඔහුට එක්වරම සිතුණේ තම බිරිඳ ක්ලාන්ත වී ඇද වැටී සිටින බවකි. එතැනට ළංවූ ඔහුට ඇගේ හිසෙන් ගලා ගිය ලේ දකින්නට ලැබිණ. සටන් පෙරමුණේ මරණය දැක තිබූ ඔහු තම බිරිඳ ඛේදජනක ලෙස මරණයට පත්වී ඇති බව වටහා ගත්තේය. එහෙත් ඇගේ අතින් අල්ලා ගත් ඔහු නාඩිවැටීමක් දැනේදැයි මොහොතක් විමසිලිමත් විය. එවැන්නක් නොවීය.

මේජර් ජෙනරාල් ස්ටුවට්ට දැනුණේ තම හිසට කුළුගෙඩි පහරක් එල්ල වූ අයුරකි. ශෝකයෙන් මෙන්ම භීතියෙන් ද දැඩි කම්පාවට පත් වූ ඔහු එතැනින් දිවගියේ,

"දෙවියනේ! ඇය මරාදමලා!" යයි වියරුවෙන් මෙන් කෑගසමිනි.

ඔහුගේ අසල්වැසියා වූ ආතර් හෙන්ඩසන් මහතාගේ ඉස්තාලය තිබුණේ උද්‍යාන කුටියට සැතපුම් කාලක් පමණ දුරිනි. ස්ටුවට් මහතා වියරුවෙන් මෙන් එහි දිවගියේය. ඔහු තිබූ ඉස්තාලයේ දොරට, ඔහු නොනවත්වාම අහරදුන්නේය. ඇතුළත සිටි අශ්වකරත්ත රියැදුරා එළියට ආවේ පුදුමයට පත්වය.

"ඇය මරාදමලා! දෙවියනේ ඇය මරාදමලා!" මේජර් ජෙනරාල් ස්ටුවට්ට කියාගත හැකිවූයේ එපමණකි. මීළඟට ඔහු ක්ලාන්ත විය.

මේ ඛේදජනක සිදුවීම ගැන වහාම සමර්සෙට් පොලීසියට දැනුම්දෙන ලදී. එහෙත් ඒ වන විට ඇඳිරි වැටී තිබූ බැවින් ආරක්ෂාවට පොලිස් භටයුන් යොදා, වැඩිදුර පරීක්ෂණ අදට කල්තබන ලදී"

සිද්ධිය පිළිබඳව සෑම පුවත්පතකම පාහේ පළවී තිබුණේ එම කරුණු පමණි. එහෙත් "මෝනිං ක්‍රොනිකල්" පත්‍රයේ පමණක් කළු ඉරකින් කොටුකර, ස්ටුවට් මහත්මිය ගැන තොරතුරු සටහනක් කෙටියෙන් තිබිණ.

මේරි ඇන්ජලීනා ස්ටුවට් 1831-1889

චාල්ස් කේ. හාට්ලි දේවගැතිතුමාගේ හා තෙරේසා හාට්ලි මහත්මියගේ දියණිය වූ මේරි ඇන්ජලීනා, බෝන්මත්හි ක්‍රයිස්ට්

http://sherlockholmesinvestigations.blogspot.com

චර්ච් බාලිකා විද්‍යාලෙන් අධ්‍යාපනය ලැබුවාය. ලන්ඩන් පොලිටෙක්නික් ආයතනයෙන් ඇඳුම් නිර්මාණය පිළිබඳව උසස් අධ්‍යාපනයක් ලැබූ ඇය, 1855 දී කර්නල් ජෝන් සැමුවෙල් ස්ටුවර්ට් සමග අතිනත ගත්තාය.

සිය සැමියා මොරොක්කෝවේ, ජිබ්‍රෝල්ටාවේ හා දකුණු අප්‍රිකාවේ නොයෙක් ප්‍රදේශවල රාජකාරිය සඳහා යද්දී, ඇය ද එහි ගියේ සැපේදී මෙන්ම දුකේදීත් සැමියා සමග එක්වෙමිනි. ආපසු එංගලන්තයට පැමිණීමෙන් අනු සමර්සෙට් ප්‍රාන්තයේ ලෞඩර්හි පදිංචි වූ ඇය, තම කාලය ගතකළේ සමාජසේවය සඳහාය. අනාථ ළමයින්ට පිහිටවීම සඳහා සමර්සෙට් ප්‍රාන්තයේ නිවාස ගණනාවක්ම පිහිටුවා ඇත. මේවා පරිපාලනය සඳහා ඇති කමිටුවේ සභාපතිත්වය දැරුවේ මේරි ස්ටුවර්ට් මහත්මිය ය. උද්භිද විද්‍යාව පිළිබඳ හසල දැනුමක් තිබූ ඇය, එංගලන්තය පුරා විසිරී ඇති කැලෑමල් වර්ග පිළිබඳව ලියූ ග්‍රන්ථයක කර්තෘවරිය ද වේ. ඇගේ අකල් මරණයෙන් ශෝකවන්තූන් අතර ඇගේ සැමියා මේජර් ජෙනරාල් සැමුවෙල් ස්ටුවර්ට්, පුතුන්වන කපිතාන් රෙජිනෝල්ඩ් ස්ටුවර්ට් සහ ලුතිනන් ආනෝල්ඩ් ස්ටුවර්ට් ද වෙති"

"අපි අද උදේ දුම්රියෙන් එන බව, මං පොලිස් පරීක්ෂක හෝක්ට දන්නුවා" බ්‍රැඩ්ස්ට්‍රීට් කීය. "මං විශ්වාස කරනවා ඔවුන් පොලිස්මුර යොදල මුළු ප්‍රදේශයම ආරක්ෂා කරාවි කියල"

"ඔව් බ්‍රැඩ්ස්ට්‍රීට්" හෝම්ස් කීය. "බලන්න එන සෙනගයි, පොලිස් භටයොයි ඔය පැත්තෙ ඉහළ පහළ දුවලා හෝඩුවාවන් මකා දැම්මොත් අපි යන මේ ගමනෙන් ප්‍රයෝජනයක් නැතිවෙනවා"

අප ගෙනගිය කෑම පාර්සලයේ වූ "සැන්ඩ්විච්" ආහාරයට ගෙන, දුම්රිය භෝජනාගාරයෙන් උණුසුම් කෝපි පානය කළෙමු. යළිත් අපේ අසුන් වෙත පැමිණි පසු, මෙම මිනීමැරුම ගැන වැඩිදුර සාකච්ඡා කිරීමට පොලිස් පරීක්ෂකයාට අවශ්‍ය විය. එහෙත් මගේ මිත්‍රයා එයට කැමැත්තක් දක්වූයේ නැත. ඒ වෙනුවට ඔහු දෙනෙත් පියාගෙන කල්පනා කිරීමට පටන් ගත්තේය. ඉන්පසු බ්‍රැඩ්ස්ට්‍රීට් කතාබහ කළේ මා සමගය. ඒ ලන්ඩනයේ සිදුවූ "ජැක් ද රිපර්" ගේ ඝාතන පිළිබඳවයි.

 http://sherlockholmesinvestigations.blogspot.com

අප ගිලිංහැම් දුම්රියපොළට ළඟාවෙද්දී උදේ 11 පමණ වී තිබිණ. සමර්සෙට් පොලීසියේ පරීක්ෂක හෝක් මහතා අප පිළිගැනීමට දුම්රියපොළට පැමිණ සිටියේය.

"මේ ෂර්ලොක් හෝම්ස් මහත්මයයි, දෙස්තර වොට්සනුයි. ඔබට මේ මහත්වරු දෙන්නා මීට කලින් හමුවෙලා ඇතිනේ" බ්‍රැඩ්ස්ට්‍රීට් හෝක්ට කීවේ අප හඳුන්වාදෙමිනි.

"මේ මහත්වරු දෙන්නා මට කවදාවත් හමුවෙලා නැහැ" හෝක් කීය. "ඒත් සංකීර්ණ අපරාධ සාර්ථකව විසඳීමට හෝම්ස් මහත්තයාගේ ඇති විශිෂ්ට හැකියාව ගැන නම් හොඳට අහල පුරුදුයි"

උසින් අඩි හයකටත් මඳක් වැඩි වූ ඊටම සරිලන මහතක් තිබූ හෝක්, පොලිස් නිලඇඳුමෙන් සැරසී සිටියේය. ඔහුගේ කළු හිසකෙස් කෙටියට කපා තිබූ අතර දෙපසට විහිදුණු උඩු රැවුලට කරණවෑමියකු කිසිදිනෙක කතුර තබා නැතැයි මට සිතිණි.

"මහත්වරුනි අපි මුලින්ම යන්නේ "ඩෙන්මාක් ඉන්" නම් තානායමට" හෝක් පැවසුවේය. "ඔබ ලන්ඩනයේ ඉඳල ආවෙ හරිහැටි කෑමක් නොගෙන බව මං දන්නවා. බඩ පිරෙන්න උදේට කෑම ටිකක් කාලම පරීක්ෂණය අරඹමු"

රෝදහතරේ ලොකු අශ්වකරත්තයක් අප වෙනුවෙන් සූදානම්ව තිබිණි. හෝම්ස්ගේ අදහස් ගැන මනා අවබෝධයක් තිබුණාක් මෙන්, මිනීමැරුම ගැන එක් වචනයක් හෝ කථාකිරීමට, පොලිස් පරීක්ෂකවරයා උත්සාහ දැරුවේ නැත.

"ඩෙන්මාක් ඉන්" මෑතකදී ගොඩනංවන ලද තානායමක් බැව් දකින්නට ලැබිණි. හෝම්ස් සහ මා වෙනුවෙන් එහි සුවපහසු කාමර දෙකක් වෙන්කර තැබීමට හෝක් මහතා පියවර ගෙන තිබිණි. දිගින් දිගටම කල්පනාවේ වෙළී සිටි මගේ මිත්‍රයා කතාබහ ඇරඹුවේ දහවල් ආහාරය ද නිම කළ පසුවය.

"හෝක් මහත්මයා" හෝම්ස් කීය. "අද උදේ වෛද්‍යවරයා පශ්චාත් මරණ පරීක්ෂණය පවත්වා නිමකරන්න ඇති කියල මං විශ්වාස කරනවා. මොනවද ඒකෙදි තීරණය වුණේ? කවුද ඒ සඳහා පැමිණි වෛද්‍යවරයා?"

"හෝම්ස් මහත්තයා. ලන්ඩනයේදී වගේ පොලිස් ශල්‍ය වෛද්‍යවරයෙකුගේ සේවය ලබාගන්න, ගම්බදව අපට පහසුකම් නැහැ" හෝක් කීය.

http://sherlockholmesinvestigations.blogspot.com

"මේ ගමෙන්, අල්ලපු ගමෙන් පළපුරුදු වෛද්‍යවරු දෙදෙනෙක්ම පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා කැඳෙව්වා. ඔවුන්ගේ තීරණ මං විස්තර සහිතවම කියන්නද?"

"ඔව් කියන්න" හෝම්ස් පිළිතුරු දුන්නේය.

"එක් වෛද්‍යවරයෙක් ටිකක් වයස්ගත කෙනෙක්" හෝක් කීය. "ඔහුගේ නම බේකර්. ඔහු එතැනට ආවේ මළසිරුර හොයාගෙන පැය 1 1/2 කට පමණ පසුව. වෙඩි උණ්ඩවලින් ඇතිවුණු තුවාල දෙකක් ස්ටුවට් මහත්මියගේ හිසේ ඔහුට දකින්න ලැබුණා. එකක් ඇයගේ වම් කම්මුලේ. අනෙක ඇගේ දකුණු කනට ටිකක් පිටුපසින්. මේ පසුව කී තුවාලය අවට, වෙඩිබෙහෙත්වලින් පිළිස්සුණු සලකුණු තිබුණා. ඒකෙන් අපට හිතාගන්න පුළුවනි එම වෙඩිපහර එල්ල වෙද්දී ගිනිඅවිය තියෙන්න ඇත්තේ ඇගේ හිසට කිට්ටුවෙන් කියලා.........................."

"ඔව් පැහැදිලිවම" බැල්ඩස්ට්‍රීට් කීය. "ඉතින් මොකක්ද ප්‍රශ්නේ?"

"වෛද්‍ය බේකර් කියනවා ස්ටුවට් මහත්මිය සියදිවි නසාගෙනලු!"

"දෙයියන්ට ඔප්පු වෙච්චාවෙ!" මට කියැවිණි.

"ඔහු එහෙම කිව්වාම මටත් කියවුණේ ඔය විදිහටම තමා දෙස්තර මහත්මයා "හෝක් කීය. "පුවත්පත්වල සඳහන් නොවුණාට මෙතැන මංකොල්ලකෑමකුත් සිද්ධවෙලා තියෙනවා. ස්ටුවට් මහත්මියගේ ඇඟිලිවල සම ගැළවී ගිහින්. ඇය ඇඟිලිවල පැළඳහිටි මුදු හතරක් බලෙන් ගලවාගෙන ගොස් ඇති බවයි අපට පෙනෙන්නේ."

"ඒ මුදු ගැන තොරතුරු හොයාගැනීමට ඔබට හැකිවුණාද?" හෝම්ස් විමසුවේය.

"ඔව් මහත්මයා" හෝක් කීය. "මෙයින් එකක් ඇගේ මගුල් මුද්ද - ඒක රත්රන් පට්ටම් මුද්දක්. දෙකක් දියමන්ති ඇල්ලු මුදු. ඔවුන් දකුණු අප්‍රිකාවේ ගතකළ කාලයේ මිලදී ගත් දියමන්තියකින් සෑදූ එක් මුද්දක්. තව එකක් ඇගේ මවගෙන් තෑගි ලැබුණු දියමන්ති මුද්දක්ලු. හතරවැනි මුද්ද ඇගේ බාලපුතුයා ඇයට තෑගි කළ ඉන්දියානු මරකත මැණිකක් ඇල්ලූ මුද්දක්"

"එපමණද ඇගෙන් පැහැරගෙන තියෙන්නේ?"

"නැහැ" හෝක් වැඩිදුරටත් කීය. "ඇය නිවසෙන් පිටතට යද්දී කුඩා මුදල් පසුම්බියක් ගෙන යෑමට පුරුදුව හිටියලු. එය තබාගෙන

 http://sherlockholmesinvestigations.blogspot.com

ඉදල තියෙන්නේ ඇගේ සායේ ඉදිරිපස සාක්කුවේ. එම සාක්කුව වටේටම කපලා මුදල් පසුම්බියත් පැහැරගෙන ගිහින්"

"එතකොට වෛද්‍ය බේකර්ගේ මතය බොරුවෙනවා නේද?" මම ඇසීමි. "මුදුන් ගලවලා අහකට විසිකරලා, සාක්කුව කපලා මුදල් පසුම්බියත් විසිකරලා, මරණීය තුවාල දෙකක් සිදුවෙන සේ ඔලුවට වෙඩි තියාගන්න ඇය සමත්වුණේ කොහොමද?"

"ඔය ප්‍රශ්නේ අපෙනුත් එල්ල වුණා" හෝක් කීය. "නමුත් වෛද්‍ය බේකර්ට ඒවට පිළිතුරු තිබුණේ නැහැ"

"එතකොට අනෙක් වෛද්‍යවරයා?...................................... මොකක්ද ඔහුගේ නම? .... ඔහු මොනවද කියන්නේ?" හෝම්ස් විමසුවේය.

"ඔහු වෛද්‍ය හීත්." පොලිස් නිලධරයා කීය. "ඔහු කියන්නේ ස්ටුවට් මහත්මිය නැගිටලා ඉද්දි පිටිපසින් ආව කෙනෙක් ඇයට වෙඩිතබා ඇති බවයි. මේ පළමුවෙඩිල්ල තබලා තියෙන්නේ ඇගේ දකුණු කනට බොහොම කිට්ටුවෙන් ඉදලා. දෙවැනි වෙඩිල්ල ඇය බිම වැටුණාට පස්සේ තැබූ බවයි ඔහුගේ මතය. අපට පිළිගන්න වෙලා තියෙන්නේ එයයි"

මේ වනවිට අපි උදේ ආහාරය අවසන් කර සිටියෙමු. තවත් පමා නොවී අපරාධය සිදුවූ තැන බවත් යාමට හෝම්ස් යෝජනා කළේය.

"මේජර් ජෙනරාල් ස්ටුවට් මොන වගේ පුද්ගලයෙක්ද?" මගේ මිත්‍රයා පොලිස් නිලධරයාගෙන් විමසුවේ අප අශ්වකරත්තයේ ගමන්කරනා අතරදීය.

"හෝම්ස් මහත්මයා. ඔබ ඔය ප්‍රශ්නය අහවි කියල මට හිතුණා" හෝක් කීය. "ලන්ඩනයේ රාජකාරී කරන පොලිස් නිලධරයෙකුට නැති වාසියක් අපට මෙහෙදි තියෙනවා. ඒ තමයි මේ පළාත්වල ප්‍රසිද්ධ පුද්ගලයින් ගැන අපි කල්තියා දැන හඳුනාගෙන සිටීම. හැම කෙනෙකු ගැනම සෑහෙන තොරතුරු ගම්වල අය දන්නවා. ඔහුගේ රැකියාව මොකක්ද, ඔහු මොන විධියේ පුද්ගලයෙක්ද, චරිතය කොහොමද, අපරාධකාරයින් හා සම්බන්ධකම් තියෙනවද මේ ආදී වශයෙන්.

ස්ටුවට් පවුල මේ පළාතේ වංශවත් පවුලක්. සැමුවෙල් ස්ටුවට්ට ඔය මන්දිරය හා වතුයාය හිමිවුණේ ඔහුගේ පියාගෙන්. මෙයින් අක්කර සියගණනක් පලතුරු හා ධාන්‍ය වගා කළ ඉඩම්. තිසීම

http://sherlockholmesinvestigations.blogspot.com

වගාවක් නොකළ කැළෑ ඉඩම් ප්‍රමාණයත් මං හිතන්නේ අක්කර පනහකට වැඩියි. පවුලේ එකම දරුවා වුණු ඔහු හමුදා සේවයට බැඳුණේ රැකියාවක් හැටියට නෙමෙයි; රටට සේවයක් කළ යුතුයි යන අධිෂ්ඨානයෙන්"

"කොයිතරම් කල් ඉඳලද ඔබ ස්ටුවට් මහත්මයාව අඳුනන්නේ?" හෝම්ස් ඇසීය.

"අවුරුදු දහයක පමණ කාලයක සිට - ඒ කියන්නේ ඔහු හමුදා සේවයෙන් විශ්‍රාම අරගෙන ඇවිත් එංගලන්තයේ පදිංචි වුණාට පස්සෙයි මට ඔහුව හඳුනාගන්න ලැබුණේ. ඔහු සමග ළඟින් ආශ්‍රය නොකළාට, ඔහු කොයිවගේ කෙනෙක්ද කියන එක මං දන්නවා. ඒක කවුරුත් දන්නවා"

"ඒ කියන්නෙ?"

"මං එයින් අදහස් කළේ ඔහු නරක මිනිහෙක් කියන එක නෙමෙයි" හෝක් පැවසුවේය. "දීර්ඝ කාලයක් හමුදා සේවයේ උසස් නිලතල දැරූ කෙනෙකුගෙන් අපට බලාපොරොත්තුවිය හැක්කේ මොකක්ද? අන්න ඒ හැම දේකම ඔහුගේ චරිතයේ අතුරටම තියෙනවා. නීතිගරුකයි. අසාධාරණය දුටු තැන කටපියාගෙන ඉන්නේ නැහැ. දෙකට තුනට පැකිළෙන්නෙත් නැහැ. කෙළින් කථාකරනවා. ආඩම්බරයි. වැරැද්ද දුටු තැන තදින් කේන්ති යනවා. ඒ වගේම අවංකයි. අනුන්ගේ දේවල් කඩාවඩා ගන්න ඔහුට උවමනාවක් නෑ, ඔහු ධනවතෙකු නිසා"

"ඔහුගේ බිරිඳ ඔබට හමුවෙලා තියෙනවද? ඇය කොයි වගේ තැනැත්තියක්ද?"

"ස්ටුවට් මහත්මයා නම් මට කිහිපවිටක්ම හමුවෙලා තියෙනවා" හෝක් කීය. "නමුත් ඇය නම් මට හමුවෙලා තියෙන්නෙ එක්වරක් හෝ දෙවරක් පමණයි. වරක් විවාහමංගල්‍ය උත්සවයකදී. අනෙක මං හිතන්නෙ නත්තලට දුප්පතුන් වෙනුවෙන් තෑගි පාර්සල් බෙදුන් වෙලාවක. ඇය ඉතාම කාරුණික ත්‍යාගශීලී තැනැත්තියක බවට ප්‍රසිද්ධයි. ලැඩින් දේවගැතිතුමා ඊයෙත් මා එක්ක කිව්වෙ. ඇගේ මරණයෙන් ලොකුම පාඩුව වුණේ මේ පළාතේ දුප්පත් අසරණ මිනිස්සුන්ට කියලයි. සමර්සෙට් ප්‍රාන්තයේ අනාථ නිවාස හතරක් තියෙනවා. ආබාධිත දරුවන් සඳහාත් නිවාසයක් තියෙනවා. මේවා පාලනය කෙරෙන්නේ ස්වේච්ඡා මණ්ඩලයක්

 http://sherlockholmesinvestigations.blogspot.com

මගින්. ඇය තමයි එහි සභාපතිනිය. මේවා සඳහා රජයෙන් ඒ හැටි ආධාර මුදලක් ලැබෙන්නේ නැහැ. පළාතේ ත්‍යාගශීලි ධනවතුන්ගේ පරිත්‍යාගවලින් තමා මේවා පවත්වාගෙන යන්නේ. මීට අමතරව ඇය දේවමැඳුරේ කටයුතුවලටත් අසල්වාසී දුගී දුප්පත් අයටත් මුදලින් කරන උදව්වල සීමාවක් නැහැ."

මේ වනවිට අපි ස්ටුවර්ට් පවුලේ නිවස වූ 'ඔක්ටගන්' මන්දිරය වෙත වැටෙන ප්‍රධාන ගේට්ටුවට ළඟා වී සිටියෙමු. ප්‍රධාන පාරෙන් හැරුණු අශ්වකරත්තය ගමන්කළේ අඩිතිහක් පමණ පුළුල් වූ ගල් අතුරා සකස් කළ මාවතකය. පාර දෙපසම සිටුවා තිබූ 'යූ' ගස් පේළිදෙක නිසා ගමන්මග සෙවණ විය. මඳ කඳුබෑවුමක් දිගේ ඉහළට වැටුණු පාර තැනින් තැන වංගු සහිත විය. යාර දෙසීයක් පමණ ඉදිරියට යද්දී අපට ඈත සිටම 'ඔක්ටගන්" මන්දිරය දැකගත හැකි විය. එංගලන්තයේ වැවෙන විශාල ගස් සෑම එකක්ම වත්ත පුරා වවා තිබූ අතර, මල්වලින් බර වූ මල් පඳුරු ද අපි දුටුවෙමු. ශීත දේශගුණික රටවල නිතර දකින්නට ලැබෙන මල්වර්ගවලට අමතරව, ආගන්තුක ගස්වැල් හා මල් වර්ග ද මෙහි තිබෙනු මම දුටුවෙමි. හමුදා නිලධරයා විදේශ සේවයේ යෙදී සිට ආපසු එද්දී ඔහුගේ බිරිඳ විසින් මෙම දුර්ලභ ශාක වර්ග ගෙන එන්නට ඇතැයි මම අනුමාන කළෙමි.

"හෝම්ස් මහත්මයා" හෝක් කීය. "ඔබට හිතේවි අපි මේ ගමන්කරන්නේ සමර්සෙට් ආදිපාදවරයාගේ මාලිගයට වැටුණු පාරෙ කියල. එහෙම නේද? මේ විදියට මල් වවල වත්ත අලංකාරව තියාගන්න කොයිතරම් මහන්සියක් දරන්න වෙනවද. මේ හැම එකක්ම ස්ටුවර්ට් මහත්මියගේ හපන්කම්"

"හැබෑවටම ලස්සනයි" මම කීවෙමි.

අප ගිය අශ්වකරත්තය නවත්වනු ලද්දේ නිවස ඉදිරිපස වූ විශාල උද්‍යානයේය. එයද මල්වත්තක් මෙන් අලංකාර වූ බැව් කිවයුතුය. තවත් අශ්වකරත්ත තුනක් මිදුලේ තැන් තැන්වල නවත්වා තිබූ අතර, නිවසේ ද සෑහෙන සෙනගක් රැස්වී සිටි බව අපි දුටුවෙමු. පොලිස් පරීක්ෂකවරයාගේ නියමයෙන් හදිසි මරණ පරීක්ෂණ විභාගය (ඉන්ක්වෙස්ට් විභාගය) අප එනතුරු ප්‍රමාද කරතිබූ බැව් මම තේරුම්ගතිමි. අවුරුදු සියයකට පමණ පෙර ගොඩනංවා තිබූ මෙම මැඳුර, මෑතකදී හොඳින් නවීකරණය කර තිබූ

http://sherlockholmesinvestigations.blogspot.com

ලකුණු දකගත හැකිවිය. හදිසි මරණ පරීක්ෂකවරයා සහ අනෙක් නිලධරයෝ විසිත්ත කාමරය තුළ අසුන්ගෙන සිටියහ.

උසින් අඩිහයක් පමණ වූ ඊටම සරිලන මහතක් තිබූ මේජර් ජෙනරාල් ස්ටුවට් ගේ මුහුණේ තිබුණේ ප්‍රතාපවත් පෙනුමකි. එහෙත් ඛේදවාචකය නිසා සිතේ ඇතිවූ කණගාටුව ද දරාගත නොහැකි තරම් ප්‍රබල වූ බව ඔහුගේ මුහුණෙන් ප්‍රකාශ විය. හැත්තෑහැවිරිදි වුවත් ඔහු තවමත් නිරෝගී ශක්තිසම්පන්න පුද්ගලයෙකු බැව් පැහැදිලිවම පෙනිණ. හිසකෙස් හා පුළුල් උඩුරැවුල බොහෝදුරට පැසී තිබිණ. ඔහුගේ දුඹුරුපැහැති දෙනෙත්වල හමුදාවේ ඉහළ නිලධරයෙකුට උරුම නිර්භය එඩිතර බව මම එක්වරම දුටුවෙමි. මුහුණේ සම අව්වට පිළිස්සී දුඹුරු පැහැයට හැරී තිබිණ. පරීක්ෂණය සඳහා ඔහුගේ නම අඬගැසෙද්දී පපුව ඉදිරියට දමා සිරුර කෙළින් තබාගෙන ඔහු නොපැකිළ ඉදිරියට පා තැබුවේය. ඔහුගෙන් අසන්නට ලැබුණු සාක්ෂිය මම ඒ අයුරින්ම ඔබ වෙත ගෙන එමි.

"මේජර් ජෙනරාල් ජෝන් සැමුවෙල් ස්ටුවට් මහත්මයා. හොඳයි. දැන් ඔබට දකින්න ලැබුණු දේ ඒ අයුරින්ම අපට විස්තර කරන්න" මරණ පරීක්ෂකවරයා ඉල්ලා සිටියේය.

ස්ටුවට් මහතා:

මම ගොල්ෆ් ක්‍රීඩාව සඳහා සතියට දින තුනක් නොවරදවාම යනවා. ඒ සඳුද, බදාදා සහ සෙනසුරාදා. ඊයේ සිකුරාදා මං ගොල්ෆ් ක්‍රීඩාව සඳහා යන දවසක් නෙමෙයි. නමුත් සෙනසුරාදා - ඒ කියන්නේ අද මට ලන්ඩනයට යාමට නියමිතව තිබුණා. ඒ, විශ්‍රාමික හමුදානිලධරයන්ගේ සංගමයේ කාරක සභා රැස්වීමකට සහභාගිවීමට. ඒ නිසා ඊයේ උදේ මං තීරණය කළා, ඊයේ හවස ගොල්ෆ් ක්‍රීඩාව සඳහා යන්න.

උදේ කෑම මේසෙදී මේ බව මං මගේ බිරිඳ - මේරිට කිව්වා. එතකොට ඇය කිව්වා, ඇය සවස තේ පානය සඳහා අයිලීන් හේග් මෙනෙවියට ගෙදරට ආරාධනා කළ බව.

"සෑම්. ඔයා අද හවස සෙල්ලම් කරන්න යාවි කියල මං හිතුවේ නෑ." ඇය කිව්වා.

"අයිලීන් මෙහේ එන්න ඕනෙ කියල, කිය කිය ඉන්නෙ හුඟක් දවසක ඉඳල. මං දකුණු අප්‍රිකාවෙ ඉඳිද්දී එකතුකරගත්තු මල් වියළා හැදූ පොත බලන්න. ඇය හරි ආශාවෙන් ඉන්නෙ"

 http://sherlockholmesinvestigations.blogspot.com

"ඉතින් මං මොකටද ඒ වැඩේට?" මං ඇහුවා. "ඔයාටම බැරිය යාළුවට මල් පෙන්න පෙන්න ඒවල විස්තරේ කියන්න. මට හෙටත් ගොල්ෆ්වලට යන්න ලැබෙන්නේ නෑ. ඒකයි මං අද යන්න හිතුවෙ"

"ආ.................. කමක් නෑ." ඇය කිව්වා. "ඔයා එහෙනම් යන්නකෝ. මං අයිලීන්ට එන්න කියලා තියෙන්නේ සවස හතරට. ඔයා අද ටිකක් කලින් ගිහින්, එතැනින් කලින් එන්න. හත්රහමාර වෙද්දී ආවත් ඇති."

ඇය එහෙම කියලා හවස තේ පානයට හේග් මෙනෙවිය එන බව ප්‍රධාන ගෘහසේවිකාවට මතක් කළා.

සාමාන්‍යයෙන් දවල්කෑම කෑව ගමන් මං ටිකක් නිදාගන්නවා. අවදිවෙන්නේ දෙකට විතර. මේරි එයාගෙ ලියුම්කියුම්වල යෙදෙන්නේ ඒ වෙලාවට."

"මොනවද මේ ලියුම් කියුම්?"

"ඇගේ අනුශාසකත්වය යටතේ තියෙනවා අනාථ හා ළමා නිවාස කිහිපයක්. ඒවායේ ගනුදෙනු හා පරිපාලනයට අදාළ ලියවිලි. මීට අමතරව පිටරට සිටින අපේ දරුවන්ට සහ ඇගේ මිතුරියන්ට යවන ලිපි ලිවීමටත් ඇය යොදා ගත්තෙත් ඒ කාලය"

"කවුද ඔබට සිටින දරුවන්?"

"මගේ වැඩිමහල් පුතා රෙජිනල්ඩ් ස්ටුවට්. දැන් වයස අවුරුදු 32යි. ඔහු කපිතාන්වරයෙක්. දකුණු අප්‍රිකාවේ ඩර්බන්හි බ්‍රිතාන්‍ය හමුදා කඳවුරේ සේවය කරනවා. බාල පුතා ආනල්ඩ් ස්ටුවට්. ඔහුට වයස විසිනවයයි. ඔහු ඉන්දියාවේ ලක්නව්හි බ්‍රිතාන්‍ය හමුදා කඳවුරේ ලුතිනන්වරයෙක්. දෙදෙනාම විවාහකයි"

"හොඳයි ඔබේ කථාව කියන්න"

"ගොල්ෆ් ක්‍රීඩාව පටන්ගන්නෙ සවස 3.30ට පමණ." ස්ටුවට් මහතා යළිත් කථාව ඇරඹුවේය. "ඉතින් සවස දෙකට පමණ අවදිවෙලා මං ඒ සඳහා යන්න සූදානම් වුණා. මං දෙකයි තිහට ගෙදරින් පිටත්වෙන්න සූදානම් වෙද්දී, මේරිත් හැඳපැළඳගෙන සිටි බව මං දුටුවා.

"අයිලීන් එන්න කලින් ලස්සන මල් ටිකක් කඩාගෙන ඇවිත් ගේ සරසන්න ඕන" ඇය කිව්වා.

මේ දෙදෙනාම මල්මාර්ග ගැන දැනුමක් ඇති අය. ඒ නිසා මං ඒකෙ අමුත්තක් දුටුවේ නැහැ."

http://sherlockholmesinvestigations.blogspot.com

"ඇය වෙනදටත් ගිහින් මෙහෙම මල් කඩාගෙන එනවද?"

"ඔව්. තනියම ගිහින් වත්ත පහළ අප වැවූ මල් හෝ කැලෑරොදේ ඇවිදලා කැලෑමල් කඩාගෙන එනවා. මං හවස 2.30ට ගෙදරින් පිටවෙද්දී ඇයත් මා සමඟ එළියට බැස්සා"

"ඇගේ සාක්කුව කපලා අපරාධකරු මුදල් පසුම්බිය පැහැරගෙන ගිය බව අපට අහන්න ලැබුණා" මරණ පරීක්ෂකවරයා කීය. "කැලෑමල් කඩන්න ගියා නම් මුදල් පසුම්බිය ගෙනගියේ ඇයි? වෙනදටත් නිතරම ඇගේ සාක්කුවේ මුදල් පසුම්බියක් ගෙනියනවාද?"

මෙවේලේ එක්වරම පිළිතුරක් දීම ස්ටූවට් මහතාට අපහසු විය. ඔහු තත්පර කිහිපයක් ගොත ගසනු අපි දුටුවෙමු.

"...................... ඒ ගැන මට කියන්න අමාරුයි" ඔහු අන්තිමේදී කීය. "මුදල් ගෙනියන්න අවශ්‍යතාවයක් තිබුණේ නැහැ. ගෙදරින් ඉවත යද්දී මුදල් පසුම්බිය ඇගේ සාක්කුවට දමාගන්න හැටි මං දැක තිබෙනවා. නමුත් ඒ ගැන අහන්න මට කවදාවත් උවමනාවක් වුණේ නැහැ."

"හොඳයි ඔබේ කථාව කියන්න"

"අපි ඇවිදගෙන ගියේ බොහොම හෙමින්. අපේ වත්තේ කෙළවර ගේට්ටුව ළඟට යද්දී හවස තුන විතර වුණා. ඒ මොකද යන අතරෙත් ඇය මඟදී නැවතිලා මල් කඩාගත්තා. අපේ වත්ත කෙළවර වෙන තැන, හෙන්ඩසන් මහත්මයාගේ වත්ත පටන්ගන්නා තැනින් අඩිපාරක් තියෙනවා. ඒ ඔහුගේ වත්තේ උද්‍යාන කුටිය වෙත වැටී ඇති අඩිපාර."

"ඒක තිබෙන්නේ ඔබේ ගේට්ටුවේ සිට කොපමණ දුරකින්ද?"

"යාර එකසිය පනහක් පමණ දුරකින්"

"නමුත් ඔබේ ගේට්ටුව ළඟට එය හොඳින් පෙනෙනවා?"

"ඔව්"

"උද්‍යාන කුටියට එන්න තියෙන්නේ මේ අඩිපාර පමණක්ද? වෙනත් පැතිවලින් ඒකට ළඟාවෙන්න බැරිද?"

"හෙන්ඩසන් මහත්මයාගේ වත්ත පිටුපස කැලෑව වැවිලයි තියෙන්නේ. ඒ හරියේ මොකුත් වගාකර නැහැ. උද්‍යාන කුටියට පිටිපස හොඳටම කැලෑව. ඊටත් එහායින් එක පැත්තක ඔහුගේ සේවකයන්ගේ නිවාස. ඒවායේ සිට වැටුණු අඩිපාරවල්වලින් වුවත් මෙතැනට ළඟාවෙන්න පුළුවනි."

 http://sherlockholmesinvestigations.blogspot.com

"හැරෙන තැනදී ඔබේ බිරිඳ මොකද කිව්වේ?"

"දැන් වෙලාව තුනයි" ඇය කිව්වා. "මං කුටියේ සඳළුතලයට වෙලා, ටිකක් වෙලා ඈත දර්ශන නරඹනවා. ඊට පස්සේ නවත් මල් ටිකකුත් කඩාගෙන ඉක්මනට ගෙදර යනවා. ඔයා ප්‍රමාදනොවී එන්න"

වෙනදටත් මෙමහෙම මා සමග හෝ මා නැතිව ඇය එතැනට එන නිසා, මට වැඩිපුර හිතන්න දෙයක් තිබුණේ නැහැ. මං සනිග්‍රීන් ගොල්ෆ් පිටිය දෙසට සාමාන්‍ය ගමනින් ඇවිද ගියා"

"ඒ අතරේ ඔබට කවුරුවත් මුණගැහුණද?"

"ඔව්. ශාෆ්ට්ස්බරි හි කාර්මික විද්‍යාලයේ විදුහල්පතිවරයා මට මුණ ගැහුණා. ඒ හවස තුනහමාරට විතර, ගොල්ෆ් පිටියේ ගේට්ටුව ළඟදී. ඔහු මට ආචාරකර යන්න ගියා."

"ඊට පසු ඔබ දුටු කවුරුන් හෝ සිටිනවාද?"

"ඔව්............... ක්‍රීඩා මණ්ඩපයේ සේවකයෙක් - මං හිතන්නේ නම ජිවර්ස්. මට අවශ්‍ය උපකරණ ඔහු ලබාදුන්නා. ඔහු මට සහාය වුණා"

"ඒ කීයට විතරද?"

"3.35ට හෝ 3.40ට පමණ වෙන්න ඇති. මං සාමාන්‍යයෙන් ක්‍රීඩා කිරීමට එන දවසක් නොවෙන නිසා මගේ හුපුරුදු මිතුරන් ඇවිත් හිටියේ නැහැ. ඒ නිසාත් මං ඉක්මනින් ආපහු යන්න තීරණය කළා. හවස හතරට විතර මං ගොල්ෆ් පිටි සේවකයාට භාරදී එතැනින් ආපහු එන්න පිටත්වුණා."

"ඔබ ආපහු ආවෙත් ගිය පාරෙන්මද?"

"නැහැ. වතු උඩින් වැටුණු පාරෙන් ආවොත් ගමන් මග කෙටියි. නමුත් මං හිතුවා මහපාර දිගේ එන්න. ඒ මොකද මගේ පයිප්ප දුම්කොළ අවසන් වී තිබුණා. ඒ නිසා කඩමණ්ඩියෙන් දුම්කොළ ටිකක් මිලට ගන්න මම හිතුවා."

"ඒ එන අතරෙදී මොකද වුණේ?"

"මට මගදී ලැංඩන් දේවගැතිතුමා හමුවුණා." ස්ටුවට් මහතා කීය. "එතකොට වෙලාව හවස හතරයි කාල පහුවෙන්න ඇති. පිටපළාතකින් ආව තරුණ තරුණියන් කිහිපදෙනෙකුත්, කැමරා අතැතිව හිටියා. දේවගැතිතුමා රියැදුරා සමග අශ්වකරත්තයේ හිටියේ. කරත්තය මුහුණ දමා තිබුණේ මගේ නිවස දිශාවට. ඒ නිසා දේවගැතිතුමා මට ඇරයුම් කළා කරත්තයෙන් යන්න."

http://sherlockholmesinvestigations.blogspot.com

"නමුත් ඔබ ඒ ඇරයුම ප්‍රතික්ෂේප කළා. ඒ ඇයි?"

"ව්‍යායාම කිරීම නිසා මට අධික වශයෙන් ඩහදිය දමලයි තිබුණේ. ඉතින් අපිරිසිදුව ඔවුන් අතරට යන්න මගේ කැමැත්තක් තිබුණේ නැහැ. අනික කරත්තය නවත්වලා ඔවුන් ඡායාරූප ගැනීමේ යෙදී හිටියා. මං හිතුවේ නැහැ කරත්තය ඉක්මනට එතැනින් පිටත්වේවි කියලා. ඊට පස්සේ මං දුම්කොළ වෙළෙන්දගෙන් පයිප්ප දුම්කොළ මිලට ගත්තා. මං තවත් යාර දෙසීයක් විතර ඉදිරියට ගියාට පස්සේ, කරත්තය ඉදිරියට ඇවිත් මා ළඟ නැවැත්තුවා. දේවගැතිතුමා මට යළිත් ඇරයුම් කළ නිසා මං එයට නැගුණා."

"ඔබ ආපසු නිවසට එද්දී වෙලාව කීයද? එතැන් සිට ඉදිරියට සිදුවුණු දේවල් අපට කියන්න" . මරණ පරීක්ෂකවරයා නියම කළේය.

"මං ගෙදර එද්දී 4.40 පමණ වෙන්නැති. තේපානය සඳහා ඇරයුම් කර සිටි අමුත්තා අයිලින් හේග් මෙනෙවිය අපේ ගෙදරට ඇවිත් හිටියා. නමුත් මගේ බිරිඳ ඇවිත් හිටියේ නැහැ."

"කෝ මේරි ගෙදර නැද්ද?" මං ඇහුවේ පුදුමයෙන්. "ඇය මං පිටත්වෙලා යද්දී ගියේ මල්කඩාගෙනෙනු එන්න කියලා. අයිලින් හතරවෙද්දී ඒවි. ඒ හින්ද ඉක්මනට ආපහු එන බවයි ඇය කිව්වේ."

"ඒක නේන්නං" හේග් මෙනෙවිය කිව්වා. "මං 4.20 වෙනකොට ආවා. ඔබත් මේරිත් දෙන්නාම ගෙදර නැති නිසා මං යන්නයි හැදුවේ. සේවිකාව මට වද කළ නිසයි මං නැවතුණේ"

"අපේ ප්‍රමාදය ගැන මට සමාවෙන්න" මං කිව්වා. "මේරිට මේ හැටි ප්‍රමාද වෙන්න හේතුවක් ගැන මට හිතාගන්නවත් බැහැ. බාගවෙලාවට ඇය දූන් මග එනවා ඇති" කී මම තේ සූදානම් කරන ලෙස වයලට් නම් අපේ සේවිකාවට නියම කළා.

තේ පානය ඉක්මනින් අවසන් කළත් මගේ බිරිඳ ආපසු ආවෙ නැහැ. ඉතින් තවත් බලා නොසිඳ ඇය සොයායන්න මං තීරණය කළා. හේග් මෙනෙවිය ඊට එකඟවුණා. අපේ සුරතල් බල්ලා වීටා ද මා සමග ආවා. අප ගියේ මගේ බිරිඳ ආපහු ඒමට නියමිත පාරෙන්. ගේට්ටුව දක්වා ගිය නමුත් ඇයව දකින්න ලැබුණේ නැහැ.

"මට තවත් රාජකාරියකට යන්න තියෙනවා ස්ටුවට් මහත්මයා" මේ වෙලාවේ හේග් මෙනෙවිය මට කිව්වා. "මේරිට කියන්න මං

 http://sherlockholmesinvestigations.blogspot.com

ඇවිත් තේ බීලා ගිය බව. ඉරිදට දෙව්මැඳුරේදී අපි හමුවෙනවා නොවැ" එහෙම කියූ ඇය ප්‍රධාන පාර දිගේ යන්න ගියා. ඉතින් මං ගියා හෙන්ඩසන් මහත්මයාගේ උද්‍යාන කුටිය පැත්තට.

අපි යාර හැටක් හැත්තෑවක් ඉදිරියට යද්දී "වීටා" කලබල වෙලා බුරන්න පටන්ගත්තා. ඌ වරින්වර මග නැවතෙමින් උඩුබුරලන්න ගත්තේ වෙන කවදවත් නොකළ විදියට. උගේ කැළඹිලි ස්වභාවයට හේතුව මට තේරුම් ගැනීමට හැකිවුණේ නැහැ. කුටියේ සඳළුතලය තියෙන්නේ, පාරට අඩි හයක් හතක් ඉහළ මට්ටමෙන්. එය විවෘත එකක්. ඒත් අයින දිගේටම වටේට අඩි 2 1/2 ක් පමණ උස ආරක්ෂක වැටක් තියෙනවා.

එහි කිසිවෙකු සිටින බවක් මට දකින්න ලැබුණේ නැහැ. නමුත් බල්ලා දිගින් දිගටම බිරූ නිසා, තරප්පු කිහිපය ඉහළට නැග මං එයට ඇතුළුවුණා. එවිට මට දකින්න ලැබුණා ඇය බිම ඇදවැටී ඇති හැටි. මට එක්වරම හිතුණේ ඇය ක්ලාන්තවෙලා වෙන්න ඇති කියලයි. නමුත් ළඟට ගියාම මං දුටුවා හිසවටා ලේ ගලාගොස් ඇති අන්දම. මං ඇගේ නාඩි බැලුවා. ඇය මියගොස් ඇති බව මං තේරුම් ගත්තා............... "කථාව නැවැත්වූ මේජර් ජෙනරාල්වරයාට ශෝකය දරාගත නොහැකිව හැඬිණ." .... ඊටපස්සේ තමයි මං හෙන්ඩසන්ලගේ ඉස්තාලයට දුවල ගිහින් පීසැදුරු මැකිනොෂ්ට කතාකරල මේ ගැන කිව්වේ"

මරණ පරීක්ෂකः මේරි ස්ටුවට් මහත්මිය ඝාතනය ගැන ඔබ සැකකරන්නේ කවුරුන්ද?

ස්ටුවට් මහතාः එහෙම සැකකළ හැකි කෙනෙක් ගැන මට හිතාගන්නවත් බැහැ.

මරණ පරීක්ෂකः ඔබේ පවුල් සමග අමනාප අය - ඔබේ හෝ බිරිඳගේ සතුරන් කවුරුන් හෝ සිටිනවාද?

ස්ටුවට් මහතාः එහෙම කවුරුත් නැහැ. ඇය කාටත් උදව් උපකාර කළා මිසක්, කාගේවත් හිත් රිදවූ කෙනෙක් නෙමෙයි.

මරණ පරීක්ෂකः ඇයගේ මේ මරණය නිසා ඇය සතු දේපොළ උරුමවෙන්නෙ කාටද?

ස්ටුවට් මහතාः මටත් දරුවන් දෙදෙනාටත් තවත් ඥාතිවරියකටත් උරුම වේවි.

මරණ පරීක්ෂකः කවුද ඇගේ ඥාතීන්? මං අදහස් කරන්නේ ඇගේ සහෝදර සහෝදරියන් මාපියන් ආදිය?

http://sherlockholmesinvestigations.blogspot.com

ස්ටුවට් මහතා: ඇගේ මාපියන් දෙදෙනාම මියගිහින් බොහොම කල්. එකම සහෝදරයයි සිටියේ. ඔහුත් ඔහුගේ බිරිඳත් දෙදෙනාම අවුරුදු පහළොවකට පමණ පෙර දුම්රිය අනතුරකින් මියගියා. ඔවුන්ගේ එකම පුතා අවුරුදු දෙකකට හෝ තුනකට පෙර සියරා ලියෝන්හි රන් ආකරවල රැකියාවකට ගියා. එහිදී ඔහු වසංගත උණ රෝගයකින් මියගිය බව අපට දැනගන්න ලැබුණා. තවමත් ජීවතුන් අතර ඉන්නා එකම ඥාතිවරිය මේරිගේ අවිවාහක පුංචි අම්මා කෙනෙක්. අවුරුදු අනූවක් වයසැති ඇය ඉන්නේ ලන්ඩනයේ වැඩිහිටි නිවාසයක. ඇය ගැන සොයා බලන්නේ අපි"

මරණ පරීක්ෂක: හොඳයි. ජෙනරාල් ස්ටුවට් මහතාණනි. දැනට එපමණයි. අනෙක් අයගේ සාක්ෂි විමසලා, ඉන්පසු අපේ ප්‍රශ්න ඔබට ඉදිරිපත් කරන්නම්.

මීළඟට සාක්ෂි සඳහා කැඳවනු ලැබුවේ, තේ පානය සඳහා නිවසට පැමිණි අමුත්තා වූ අයිලීන් හේග් මෙනෙවිය ය. ඇගේ සාක්ෂියෙන් ස්ටුවට් මහතා දුන් සාක්ෂිය තවදුරටත් තහවුරු විය. ඇලෙක් ලැංඩන් දේවගැතිතුමා, 'ඔක්ටගන්' නිවසේ සේවක සේවිකාවන්, අශ්වකරත්ත රියැදුරු මැකිගෙනන්, සනිග්‍රීන් ගොල්ෆ් පිටියේ සේවකයා රිචඩ්ස් බහුතාක්ෂණික විද්‍යාලයේ විදුහල්පති සමර්විල් මහතා පිළිවෙළින් සාක්ෂි දුන්හ. ඔවුන් දුන් සාක්ෂිවලින් ස්ටුවට් මහතා කියූ දේවල් අකුරටම නිවැරදි බැව් පෙනී ගියේය. අනතුරුව පොලිස් පරීක්ෂක හෝක් මහතා සාක්ෂියට කැඳවිණි.

මරණ පරීක්ෂක: මේ මරණය සිදු වූ ආකාරය ගැන ඔබ දරන මතය කුමක් ද?

පොලිස් නිලධරයා: මරණ පරීක්ෂණය පැවැත්වූ වෛද්‍ය හීත්ගේ මතයයි අප පිළිගන්නේ. ඔහු කියන්නේ මියගිය තැනැත්තියට එල්ල වූ වෙඩිපහර දෙකක් නිසා මරණය සිදුවී ඇති බව. එකක් ඇගේ දකුණු කනට පිටුපසින් සිදුවී ඇති තුවාලය. අනෙක ඇගේ වම් කම්මුලට ඇතුළු වූ උණ්ඩයෙන් ඇති වූ තුවාලය. මේ තුවාල දෙකම 320 බෝර් රිවෝල්වරයකින් තැබූ වෙඩිපහරින් ඇතිවූ තුවාල බවට වෛද්‍යවරයා සහතික කරනවා.

මරණ පරීක්ෂක: ස්ටුවට් මහතා සතුව ගිනිඅවි තියෙන්න පුළුවන්. ඔබ ඒ ගැන සොයා බැලුවද?

පොලිස් නිලධරයා: ඔව්. ඔහු ළඟ රිවෝල්වර තුනක් තිබුණා. ඔහු ඒවා සිය කැමැත්තෙන් මට භාර දුන්නා. එයින් දෙකක් .45

http://sherlockholmesinvestigations.blogspot.com

ප්‍රමාණයේ වෙබ්ලි රිවෝල්වර අනෙක .455 කෝල්ට් රිවෝල්වරයක්.

මරණ පරීක්ෂක: ඔබ කියන්නේ ස්ටුවට් මහත්මියට සිදු වී ඇති තුවාල මේ රිවෝල්වරයකින් කළ වෙඩි තැබීම් නොවෙයි කියලද?

පොලිස් නිලධරයා: මේ රිවෝල්වර කිසිසේත් යොදාගෙන නැහැ.

මරණ පරීක්ෂක: මූලික පරීක්ෂණවලින් ඔබ සොයාගත් වෙනත් කරුණු මොනවාද?

පොලිස් නිලධරයා: වෙනත් කිසිවක් නැහැ ස්වාමීනි.

මේ අනුව මෙම මිනීමැරුම හඳුනානොගත් පුද්ගලයෙකු හෝ පුද්ගලයින් විසින් සිදුකර ඇතැයි තීරණය කළ මරණ පරීක්ෂකවරයා අපරාධකරුවන් අත්අඩංගුවට ගන්නා මෙන් පොලීසියට නියෝග කළේය.

දහවල් දෙකයි තිහ පමණ වෙද්දී මරණ පරීක්ෂණ විභාගය අවසන් විය. දහවල් ආහාරය සඳහා ඉක්මනින් තානායම වෙත ගොස් ආපසු පැමිණීමට මගේ මිත්‍රයා තීරණය කළේය. අපි කුලීරියක නැගී "ඩෙන්මාක් ඉන්" තානායමට බලා ගියෙමු.

"මට නම් හිතෙන හැටියට මෙතැන තියෙන්නේ බොහොම සංකීර්ණ ගැටලුවක් වොට්සන්" ඔහු කීවේ අප දහවල් ආහාරය සඳහා සූදානම් වෙද්දීය. දහවල් අහර සඳහා විශාල පිරිසක් තානායමේ රැස්වී සිටියහ. එහෙත් පොලිස් නිලධරයා කර තිබූ විශේෂ ඉල්ලීම නිසා අපට ආහාර ගැනීම සඳහා වෙනම කාමරයක් වෙන්කර දෙන ලදි. එහෙයින් අපේ කතාබහට කිසිවෙකු හොරෙන් සවන්දෙතැයි බියක් ද නොවිණි.

"මෙතැන අපට තියෙන ලොකුම වාසිය, පොලීසිය මේ අවට අවුල් නොකර අපට භාරදුන්නු එකයි" හෝම්ස් කීවේ මගෙන් පිළිතුරක් නොලැබුණු විටය. "ඒක අතකින් මේ හෝක්ල වගේ තරුණ නිලධරයන් එක්ක වැඩකරන එක හරි ලේසියි. පරණ මිනිස්සු ආව ගමන් හැම එකක්ම අවුල් කරනවා. ඊට පස්සේ මොකුත් හොයාගන්න බැරිවුණාම අපට භාරදෙනවා. ඉතින් අපේ වැඩ රාජකාරිත් අමාරු වෙනවා"

"හෝම්ස්" මම කීවෙමි. "මගේ හිතට ආව එක දෙයක් මං ඔබට කියන්නද? මේ අපරාධයට මේජර් ජෙනරාල් ස්ටුවට් වගකිව යුතුයි කියල ඔබට හිතන්නේ නැද්ද?"

"ඇයි වොට්සන් ඔබ එහෙම කියන්නේ?"

"හවස දෙකයි තිහට ඔහු ඇය සමග ගෙදරින් පිටවී ගිය බවට සාක්ෂි තියෙනවා" මම කීවෙමි. "ඒ ගෙදර මෙහෙකරුවන්ගේ සාක්ෂි. ඊළගට 3.30ට ඔහු ගොල්ෆ් ක්‍රීඩාංගනය අසල දුටු කෙනෙක් ඉන්නවා. මේ පැය ඇතුළත ඔහුට මොනවා කරන්න බැරිද?"

"තර්කානුකූලව ඔබේ නිගමනය නිවැරදි වෙන්න පුළුවන් මිත්‍රයා" හෝම්ස් පිළිතුරු දුන්නේය. "නමුත් මට නම් හිතෙන්නේ ඔය වගේ නිගමනයකට එන්න තවම කලින් වැඩියි කියලයි. ඒ මොකද ඔය ගොල්ෆ් ක්‍රීඩාංගණය තියෙන්නේ කොපමණ දුරින්ද කියල අපි දන්නේ නෑ. අපරාධය සිදුවූ තැනවත් ඒ අවටවත් අපි පරීක්ෂා කළේ නැහැ. අඩුම ගණනේ තව පැය විසිහතරක් යනතුරුවත්..................... මට හැකිවෙන එකක් නැහැ.............."

"මොකක්ද?"

"මේ අපරාධය සිදුවුණු ආකාරය පිළිබඳව කල්පිතයක් ගොඩනගා ගන්න"

"කොතැනින්ද හෝම්ස් ඔබ මේ පරීක්ෂණය අරඹන්න බලාපොරොත්තු වෙන්නෙ?"

"මං හිතුවේ මුලින්ම පුහුණු කළ සුනඛයින් යොදවා උද්‍යාන කුටිය අවට ඉව කිරීමට උත්ට ඉඩ සලස්වන්න"

"ඒත් කෝ බල්ලෙක්? අපට ටෝබි ගේන්න ලන්ඩනයට යන්න වෙච්?" මම කීවෙමි.

"නැහැ. ටෝබිම අවශ්‍ය නැහැ" හෝම්ස් කීය. "මං මේ ගැන හොක්ට කිව්වා. වෙස්මින්ස්ටර් පොලිස් ස්ථානයේ හොඳ දක්ෂ පොලිස් සුනඛයන් ඉන්නවලු. ඔහු එහෙට විශේෂ අශ්වකරත්තයක් යැව්වා. බාගවෙලාවට අද හවස්වෙද්දී ලන් අරගෙන ඒවි. ඒ අතරෙ අපට පුළුවනි, මේ අවාසනාවන්ත කාන්තාව අන්තිම ගමන ගිය මාර්ගය හා කුටිය සෝදිසි කරන්න. කොයි එකටත් අපි මුලින්ම ඇගේ සැමියා සමග කතාබහ කරල ඉන්න ඕන. මං විශ්වාස කරනවා, ඔහු ඒකට සුදුසු තරම් මානසික තත්ත්වයක ඉදීවි කියල"

දිවා ආහාරයෙන් පසු අපි අශ්වකරත්තයක නැගී "ඔක්ටගන්" මන්දිරය වෙත ගියෙමු. ඒ වනවිට කලින් එතැනට රැස්වී සිටි අය විසිරගොස් සිටියහ. එබැවින් වැඩකටයුතු පහසුවන බැව් අපට වැටහිණ. අප නිවසේ විසිත්ත කාමරයට පිවිසෙද්දීම, සෝපාවේ

 http://sherlockholmesinvestigations.blogspot.com

වැතිරී සිටි හමුද නිලධරයා අපට දකින්නට ලැබිණි. අප දුටු සැනින් ඔහු එතැනින් නැගිට්ටේය. අප පිළිගත් ඔහු ඒ සමීපයෙන්ම හිඳගන්නා මෙන් අපෙන් ඉල්ලා සිටියේය.

"හෝම්ස් මහත්මයා" ඔහු කීවේ ශෝකයෙන් බරවුණු හඬකිනි. "මං ඔබ ගැන මීට කලින් අහල තියෙනවා. ඒත්.................. දෙවියනේ .... මං මුහුණදුන්නු ඛේදජනක අත්දැකීම ගැන හොයා බලන්න ඔබ මේ ගෙදරට ඒවි කියල මං කවදාවත් හිතුවෙ නැහැ. හීනෙකින් වත් හිතුවේ නැහැ. මගේ මේරි මට අහිමිවුණා කියන්නේ මං ජීවත්වෙලා වැඩක් නෑ. මේ අපරාධය කළ එකා අහුවුණොත් මං උගේ වෙඩිතියනවා. දෙයියම්පා! උසාවියෙදි නඩුවක් අහන්න මං උගෙ ඉතුරු කරන්නෙ නෑ." ස්ටුවට් මහතා නොනවත්වාම කියාගෙන ගියේය.

"මේ ප්‍රශ්නය විසඳන්න ඔබ මැදිහත්වීම මට ලොකු සහනයක් හෝම්ස් මහත්මයා. මං ඔබට ඉල්ලන මුදලක් දෙන්නම්. මේ අපරාධය කළ එකා මට හොයල දෙන්න. දැන් ඔබ ඕනෙම ප්‍රශ්නයක් අහන්න. මං සූදානම් ඒවාට පිළිතුරු දෙන්න."

"ස්ටුවට් මහත්මයා" හෝම්ස් කීවේ මෙතෙක් ඔහුගේ මුවේ දුම්දමමින් තිබූ පයිප්පය නිවා කබා සාක්කුවේ දමා ගනිමිනි. "මේ ගැටලුව ඉතාම සංකීර්ණ එකක් බවට සැක නෑ. ඒ නිසා මං කැමතියි, කාරණා ගැඹුරටම හාරා අවුස්සා බලන්න. ඒ මොකද සමහරවිට ඒ ගැටලුවකට විසඳීම සැඟවී තියෙන්නේ අවුරුදු ගණනාවකට කලින් වුණු සිදුවීමක වෙන්න පුළුවන්. මට මුලින්ම කියන්න ඔබ විවාහ වුණේ මොන කාලෙද? ඔබේ සහ ඇගේ පවුල් පසුබිම් මොනවාද?"

"මං ඔබට ඒ හැමදෙයක්ම කියන්නම්" ස්ටුවට් මහතා පැවසුවේ බීමට යමක් ගෙන එන මෙන් සේවකයෙකුට සංඥා කරමිනි.

"මං හමුද සේවයට බැඳුණේ වයස අවුරුදු 17දී. මං ලබා තිබුණු අධ්‍යාපනය නිසාත්, මගේ කැපවීම නිසාත්, මට හැකිවුණා ඉක්මනින් හමුදවේ ඉහළට යන්න. මං බැඳුණේ රාජකීය ඉංජිනේරු බලකායට. ඒ 1835 දී. අවුරුදු තුනකට පස්සේ මට යන්න සිදුවුණා මොරොක්කෝවේ අපේ හමුද සේනාංකයට. එහේදී මං කළ සේවය නිසා වයස අවුරුදු විසිදෙක වෙද්දි මං ලුතිනන් තනතුරට උසස්වුණා. එතැනින් මාව යැවුණේ ජිබ්‍රෝල්ටාවට. ජිබ්‍රෝල්ටාව මොන තරම් වැදගත් යුද කඳවුරක්ද කියන එක මං ඔබට අමුතුවෙන්

http://sherlockholmesinvestigations.blogspot.com

කියන්න ඕන නෑ. මං එහේ සෑහෙන කාලයක් සේවය කළා. 1855 වෙද්දී මං එතැන හමුද අනු ඛණ්ඩයක් භාර කපිතාන්වරයා හැටියට උසස්වීමක් ලැබුවා. ඒ අවුරුද්දේ තමයි මං විවාහවුණේ.

මට ඇයව හමුවුණේ ඊට කලින් අවුරුද්දේ ලන්ඩනයේ පැවති රාජකීය සම්භාෂණ උළෙලකදී. ඇගේ පියා බෝන්මත් ප්‍රදේශයේ ක්‍රයිස්ට්චර්ච් නගරයේ මෙතෝදිස්ත දේවමැදුර භාරව සේවය කළ චාල්ස් හාට්ලි දේවගැතිතුමා. අපි විවාහ වුණේ 1855 දී. එතකොට මට වයස 37යි. ඇය මට වඩා අවුරුදු දොළහක් බාලයි. අපි බොහොම ආදරයෙන් විවාහදිවිය ගෙව්වා. මං වරද දුටු තැන තරහ යන ඉක්මනින් තීරණ ගන්න කෙනෙක්. නමුත් ඇය බොහොම ඉවසිලිවන්ත, කරුණාවන්ත කෙනෙක්. ඔබ පුවත්පත්වල දකින්න ඇති, දුප්පතුනට අසරණයන්ට පිහිටවෙන්න ඇය කවදාවත් පසුබට වුණේ නැහැ. අපේ දරුවන් දෙදෙනාම විවාහවුණත් ජීවත්වෙන්නේ පිටරට. ඒ නිසා මේරි ඇගේ කාලය ගතකළේ ඔය අසරණ - සරණ සමිති සමාගම්වල කටයුතුවලට. ඇයට ඇගේ පියාගෙන් සෑහෙන ධනයක් හිමිවුණා. ඒ මුදල් ඇය දෙමාපියන් අනාථයින් වෙනුවෙන් වියදම් කළා. වෙනත් කටයුත්තකට ඇය කාලය ගතකළා නම්, ඒ මල්වැවීමට පමණයි."

"ස්ටුවට් මහත්මයා. හොඳට කල්පනා කරලා බලන්න" හෝම්ස් කීය. "ඔබේ හමුද සේවය නිසා ඔබ සමග තදින් අමනාප වුණු අය හිටියද? එහෙමත් නැත්නම් දේශපාල නිසා ආරවුල් ඇතිකරගත් අය?"

"දේශපාල නිසා නම් කවුරු සමගවත් කිසිම ආරවුලක් නෑ." ස්ටුවට් මහතා පිළිතුරු දුන්නේය. "මං භුක්ති විඳින මේ ඉඩම් මට මගේ දෙමව්පියන්ගෙන් හිමිවුණු ඒවා. මං පවුලේ එකම දරුවා. ඒ නිසා අයිතිය පිළිබඳ ප්‍රශ්න නෑ. මගේ වතුයායේ එක් මායිමක් ආතර් හෙන්ඩසන් මහතාට අයත් වත්තේ මායිම. ඒක ගැන කිසිම ආරවුලක් නෑ. අපි දෙන්නා හොඳ හිතවත්තු. ඒ හිතවත්කම අපේ දෙමව්පියන්ගේ කාලෙත් තිබුණා. මගේ ඉඩමේ තවත් මායිමක් ඇවොන් ගඟේ අතු ගංගාවක්. අනෙක් මායිම් දෙකම රජයේ රක්ෂිත කැලෑ ඉඩම්. ඒ නිසා මායිම් ප්‍රශ්න නැහැ.

ඊළඟට මං දන්න තරමින් මෑත කාලයක මා සමග අමනාප වුණු කවුරුවත් නැහැ. මං හමුද සේවයෙන් විශ්‍රාම අරගෙන දැන් අවුරුදු දහයක් පමණ වෙනවා. අපි කවුරුවත් සමග ආශ්‍රයට යන්නෙ

 http://sherlockholmesinvestigations.blogspot.com

නැත්නම්, වෛරයක් ඇතිකරගන්න තරම් අවස්ථාවක් මතුවෙන්නෙ නැහැ නේද?"

"ඔබ හමුදා සේවයේ යෙදුණු කාලෙ කොහොමද?"

"මට ඔබට කියන්න බැරිවුණා එක දෙයක්" ස්ටුවට් මහතා යළිත් කථාව ඇරඹුවේය. "ජිබ්‍රෝල්ටාවෙන් මං ගියේ දකුණු අප්‍රිකාවට. මං ගියේ නතාලයේ හා සුලුලන්තයේ අපේ හමුදාවේ රාජකීය ඉංජිනේරු සේනාංකය භාර නිලධරයා හැටියට. ඒ 1862 දී. එතකොට මම ලුතිනන් කර්නල් ධූරයට උසස්වීමක් ලැබිලා. ඔය කාලේ මා යටතේ සිටි හමුදා භටයෙක් මා සමග ප්‍රශ්න ඇති කර ගත්තා"

"ඔහුගේ නම හා විස්තර ඔබට මතකද?"

"ඔව්. ඔහු නමා ශ්‍රීමත් ඔගස්ටස් මොරාන්ගේ පුතා - සෙබස්ටියන් මොරාන්"

"ඔබ අදහස් කරන්නේ කුප්‍රකට කර්නල් සෙබස්ටියන් මොරාන්ද?" හෝම්ස් විමසුවේය.

"ඒ කාලේ ඔහු තරුණ කෝප්‍රල්වරයෙක් විතරයි." ස්ටුවට් මහතා කීය. "ඔහුට ඒ තනතුර ලැබුණෙත් ඔහුගේ පියාගේ බලපෑම නිසා. ඔහු හමුදාවේ විනය ගැන කිසිම තැකීමක් නොකර, සුලුලන්තයේ කැලෑවල සතුන් දඩයමේ ගියා. කිහිපවාරයක් අවවාද කළත් ඔහු ඒවාට කන්දුන්නේ නෑ. මගේ ආඥාවලට අකීකරුවීම නිසා, මං ඔහුට දඬුවම් කරලා ආපහු එංගලන්තයට එව්වා. ඊටපස්සේ ඔහු ඉන්දියාවේ සටන් පෙරමුණට යැවුණා කියල ආරංචියි. මා හමුදාවේ සිටි කාලයේ මා සමග දැඩි අමනාපයක් ඇතිකරගත් පුද්ගලයෙක් සිටියා නම් ඒ ඔහු පමණයි."

"ඒක ව්‍යාඝ්‍රයෙකු අමනාප කරගැනීමට සමානයි ස්ටුවට් මහත්මයා" හෝම්ස් කීවේ නළල රැළිකරගනිමිනි. "කර්නල් මොරාන් ගිනිඅවි පාවිච්චියට බොහොම දක්ෂයි. නමුත් ඒ රිවෝල්වර නෙමෙයි; රයිෆල් පාවිච්චියට. වෙනත් කිසිම කෙනෙක් අමනාප නැහැ කියලයි ඔබ කියන්නේ?"

"වෙනත් අමනාප කෙනෙක් ගැන මට නම් සිහිකරන්න අමාරුයි"

"හොඳයි මහත්මයා. ඔබට ස්තුතියි" හෝම්ස් කීය. "දැනට ඔබෙන් විමසීමට තිබෙන්නේ එපමණයි. කරුණාකරල ඔබට පුළුවන්ද අපට කියන්න උද්‍යානකුටිය වෙත ළඟාවිය හැකි පාර?"

http://sherlockholmesinvestigations.blogspot.com

ස්ටුවට් මහතා අප යා යුතු මඟ විස්තර කර දුන්නේය. ඔහුගෙන් සමුගෙන අපි එළියට බැස්සෙමු.

"වොට්සන්" හෝම්ස් කීවේ මෘදු ස්වරයෙනි.

"බලන්න ඔබේ ඔරලෝසුවේ වේලාව හරියටම කීයද කියල. අපි බලමු හෙමින් හෙමින් ගියොත් වත්තෙ ගේට්ටුව ළඟට යන්න කොපමණ වේලාවක් ගතවෙනවද කියල"

වැඩිවේලා දෙරටුව ළඟ බලා නොසිට ස්ටුවට් මහතා ඉක්මනින් නිවස තුළට ගිය බැව් ආපසු හැරී බැලූ මම දුටුවෙමි.

"කාන්තාවක් අභිරහස් ලෙස ඝාතනය වුණු හැමවිටකම" හෝම්ස් කීය. "මිනීමරුවා අතටම අහුවුණේ නැත්නම්, මුලින්ම සැකය එල්ලවෙන්නේ කාන්තාවගේ ස්වාමිපුරුෂයා වෙත. මේක හරි අවාසනාවන්ත තත්ත්වයක්. නමුත් කරන්න දෙයක් නෑ" කියූ හෝම්ස් අතට ගත් ඔරලෝසුව සාක්කුවේ දමා ගත්තේය.

"හෝම්ස් ඔබ කියන්නේ ඔබේ හිතෙත් ස්ටුවට් ගැන සැකයක් ඇතිවුණා කියලද?"

"මම එහෙමම කියන්නේ නෑ මිත්‍රයා" හෝම්ස් කීය. "කෙලින්ම ඇඟිල්ල දිගු කළ හැකි අපරාධකාරයෙක් මෙතැන නැහැ. එහෙම වුණාම සැකය ඕනෑම කෙනෙක් වෙත එල්ල වෙන්න පුළුවනි. අපි මුලින්ම බලමු ඔහු කියූ කතාව ඇත්තද කියල"

තවත් මඳ දුරක් ඉදිරියට යද්දී වත්ත පහළ පිහිටි ගේට්ටුව අපට ඈතින් දකගත හැකි විය. මල් වවා තිබූ වත්ත මැදින් වැටුණු බොරළු පාර අශ්වකරත්ත ගමන්කිරීම නිසා හෑරී තිබිණ. මේ අප මුලින් "ඔක්ටගන්" මැඳුර වෙත පැමිණි ගල්දමා සකස් කළ පුළුල් මාවත නොවේ.

"ඔහු කිව්වා මේ ගේට්ටුව ළඟට එන්න ඔවුන් දෙදෙනාට පැය භාගයක් ගතවුණා කියල" හෝම්ස් කීඉවිසුළින් ඔරලෝසුව පරීක්ෂා කර බලමිනි.

"අපට මිනිත්තු විසිහතරක් ගතවෙලා තියෙනවා. උසින් අඩු කාන්තාවකගේ වේගය මීට වඩා අඩුයි. අනෙක පාර දෙපැත්තේ තිබූ මල්වලට අවධානය යොමු කරමින් ගියා නම් කොහොමටත් වැඩි කාලයක් ගතවෙන්න ඇති. ඒ නිසා මේ දක්වා ඔහු කියූ දේ නිවැරදි බව අපට හිතන්න පුළුවනි.

ආ............... අර තියෙන්නෙ. අරක වෙන්නැති හෙන්ඩසන් මහත්මයාගේ වත්තේ තිබෙන උද්‍යාන කුටිය. ස්ටුවට් මහත්මයා

 http://sherlockholmesinvestigations.blogspot.com

කීවේ ගේට්ටුව ළඟදී බිරිඳ හනියම අඩි පාර දිගේ යද්දී ඔහු සනිග්‍රීන් ගොල්ෆ් පිටිය දෙසට ගමන් කළා කියල. අපි ඒ පැත්තටත් ගිහින් බලන්න ඕන. නමුත් මුලින්ම මං කැමතියි උද්‍යාන කුටිය පරීක්ෂා කර බලන්න"

පොළොවේ සිට අඩි හතක් හෝ අටක් ඉහළට ගල්වලින් තැනූ අත්තිවාරමක් මත එය සාද තිබිණි. ඒ සඳහා යායුතු අඩිපාර වැටී තිබුණේ ලඳු කැලෑවෙන් වටවූ පහත්බිමක් මැදිනි. කුටිය වෙත යෑමට ගල්වලින්ම තැනූ තරප්පු පෙළක් විය.

උද්‍යාන කුටියේ ඉදිරිපස තිබුණේ කඳුකර පලාත්වල උද්භිද උද්‍යානයන්හි දක්නට ලැබෙන ලතා මණ්ඩපවල පෙනුමකි. එනම් ෂඩාස්‍රාකාර ආලින්දයකි. එහි අයින දිගේ අඩි 2 1/2ක් හෝ තුනක් පමණ උසට සෑදූ ආරක්ෂක වැටක් විය. ආලින්දයේ සිට බැලූ විට සැතපුම් ගණනාවක් ඈත පෙදෙස් දක්නට ලැබිණ. එක් පැත්තකින් බ්ලැක්මුවර් විල්ලුවත් අනෙක් පසින් සෝල්ට්ස්බරි දක්වා තැනිතලා ඉඩම් හා කුඹුරු අලංකාරව දිස්විය. ආලින්දයට පිටුපසින් තිබුණේ ඉබියතුරු දමා වසා තිබූ කොටසය. එය කුඩා විසිත්ත කාමරයකින්, කුස්සියකින්, නානකාමරයකින් හා නිදන් කාමරයකින් සමන්විත බැව් පොලිස් නිලධර හෝක් අපට කල් තබා පවසා තිබිණි.

මෙය දිගින් දිගටම වසා තිබූ නිසා එය ඇතුළත පරීක්ෂා කර බැලීමට මගේ මිත්‍රයාට අවශ්‍ය වූයේ නැත. එහෙත් ඔහු එහි දොරගුළු පරීක්ෂා කර බැලුවේය. මළසිරුරෙන් ගලාගිය ලේ ඉවත්කොට ආලින්දය පවිත්‍රකොට තිබූ නිසා වැදගත්ම හෝඩුවාවන් ඉවත් වී ඇතැයි මගේ මිත්‍රයා සිටියේ නොසතුටෙනි.

"මේ කාන්තාවට වෙඩිපහර දෙකක් වැදුණා නම් මේ කිට්ටුව තිබෙන නිවසක අයට වෙඩි ශබ්ද නොඇසී තියෙන්න හැටියක් නෑ" හෝම්ස් කීය. "අර බලන්න වොට්සන්. අර පැත්තේ තියෙනවා ගෙයක්. ඊළඟට අර පැත්තේ තියෙනවා තවත් ගෙයක්. මේවල කවුරුහරි පදිංචිව හිටියා නම් රිවෝල්වරයකින් තැබූ වෙඩිල්ලක හඬ ඔවුනට නොඇසී යන්න හැටියක් නෑ. ඒ ගැන අපි පසුව හොයල බලමු. ඉස්සර වෙලා බලමු උද්‍යාන කුටිය වටේ පොළොව"

"ඔබ හිතන්නේ එළිමයේ මං සටහන් මොනවා හරි දකගන්න හැකිවේවි කියලද?"

http://sherlockholmesinvestigations.blogspot.com

"එහෙම හිතන්න අමාරුයි" හෝම්ස් කීය. "මේ පැත්තට මාස ගණනකින් වැහැල නැහැ. පොළොව සවි ශක්තිමත් සිමෙන්ති පොළොවක් වගේ. මොනම ආකාරයක පා සටහනක් වත් අපට බලාපොරොත්තුවෙන්න බෑ. ඊයේ හවස හිට මෙතැන ගැවසුණු අය නිසා තිබුණු සලකුණුත් විනාශවෙලා ඇති. අපි ගිහිං බලමු අර ගෙවල් පැත්තට"

අපි පළමුවෙන්ම දකින්නට ලැබුණු නිවස වෙත ගියෙමු. ඒ හෙන්ඩසන් මහතාගේ රියැදුරා වූ මැකිනොන්ගේ නිවස විය. මේ සිද්ධිය වෙද්දී ඔහු සිටියේ ඉස්තාලයේ නිසා, වෙඩිහඬක් අසන්නට නොලැබුණු බව ඔහු පැවසීය. එහෙත් ඔහුගේ බිරිඳට කීමට ඊට වඩා යමක් තිබිණි.

"මං මගේ පුංචි දූවගේ හිස පීරමින් සිටියේ ඉස්සරහ දොර ළඟ" මැකිනොන් මහත්මිය කීවාය. "උද්‍යානකුටිය පැත්තෙන් රතිඤ්ඤා පුපුරනවා වගේ ශබ්දයක් ඇහුණා. තත්පර කිහිපයකට පස්සේ තවත් ඒ වගේ පුපුරණ ශබ්ද දෙකක් ඇහුණා. ඒ මොකක්ද කියල බලන්න මං ඒ පැත්තට ගියේ නැහැ. මහත්තයා ගෙදර ආවම මං ඔහුට ඒ බව කිව්වා."

"ඔබට හොඳටම විශ්වාසද පුපුරණ ශබ්ද තුනක් ඇහුණා කියලා?" හෝම්ස් විමසුවේය. "ඒ මොකද ස්ටුවට් මහත්මියට එල්ලවුණේ වෙඩි පහර දෙකක් කියලයි පොලීසිය විශ්වාස කරන්නේ"

"මට හොඳටම විශ්වාසයි පුපුරණ ශබ්ද තුනක් ඇහුණා කියල" ඇය පිළිතුරු දුන්නාය. ඊට වඩා යමක් කීමට ඇය කැමැති නොවූ බැව් පෙනිණ. අපි ඔවුන්ගෙන් සමුගෙන පිටත්ව ඒමට සූදානම් වූයෙමු.

"අර ළඟ පෙනෙන්න තියෙන අනෙක් ගේ කාගෙද?" හෝම්ස් විමසුවේ මැකිනොන්ගෙනි.

"ඒකෙ ඉන්නෙ වෝකර්. එයා හෙන්ඩසන් මහත්තයාගෙ උද්‍යාන සේවකයා"

වයස්ගත වෝකර් මේ වනවිට රාජකාරි සඳහා නිවසෙන් පිටවී ගොස් සිටියේය. අප හමුවට පැමිණියේ ඔහුගේ වයස්ගත බිරිඳ හා තරුණ දියණිය ය.

"ඔය වෙලාව මට හොඳට මතකයි" වෝකර් මෙනෙවිය පැවසුවාය. "මං වැඩකරන්නේ නගරයේ පොත් සාප්පුවක. මං ඊයේ

 http://sherlockholmesinvestigations.blogspot.com

හවස්වරුව නිවාඩු ඉල්ලාගෙන දවල් ගෙදර ආවා. ඒ මට ඉවසන්න බැරි හිස කැක්කුමක් තිබුණු නිසා. ඒ නිසා දවාලට කෑම කෑවෙත් ගෙදර ඇවිත් ප්‍රමාද වෙලා"

"ඒ කියන්නේ කීයට විතරද?" හෝම්ස් විමසුවේය.

"මං නාල කෑම කන්න පටන්ගන්න කොට හවස තුනයි" ඇය කීවාය. "සාප්පුවෙ ඉන්න දවසට හවස තුනට තේ බොන වේලාව නේද කියල මට මතක් වුණා. කෑම කන්න මට මිනිත්තු දහයක් යන්න ඇති. ඒ ඉවරකරල ඇඳේ හාන්සිවුණා විතරයි, මට ඔය ශබ්ද ඇහෙන කොට"

"ඒ කියන්නෙ හවස 3.10 හෝ 3.15 විතර වෙන්න ඇති?"

"ඔව්"

"ඔබට හිතුණද ඒ වෙඩිහඬක් කියල?"

"ඔව්" ඇය කීවාය. "සමහරදාට අඩුලේනුන් හාවුන් දඩයම් කරන්න අසල්වැසි මිනිස්සු කැලෑවෙරාදට එනවා. මං හිතුවේ ඔවුන් සතෙකුට වෙඩි තැබූ හඬ කියල"

"ඔබට වෙඩිහඬ කීයක් ඇහුණද?"

"තුනයි"

"කාගෙවත් විලාප හඬක් එහෙම ඇහුණද?"

"නැහැ. නමුත් වෙඩි හඬ තුනක් ඉක්මනින්, එක ළඟින් ළඟින් ඇහුණා"

"ඔබට ඒක හොඳටම විශ්වාසයි?"

"ඔව්. මට ඒ වෙලාවෙ හදියට තරහත් ගියා. හිසකැක්කුම හැදිලා නිදාගන්න හදන කෙනෙකුට, නින්දට බාධා වෙන විධියේ ශබ්ද ඇහෙන කොට තරහ යන එකේ පුදුමයක් නැහැ නේද? මං හිතුවා මට නින්දක් නැතිවේවි කියල"

ඇයට ස්තුතිකොට අපි නිවසෙන් පිටත්ව ආවෙමු.

"ඔන්න වොට්සන්. අපට ඉතාම වැදගත් සාක්ෂි දෙකක් දැන් ලැබිල තියෙනවා." හෝම්ස් කීවේ උද්‍යාන කුටිය දෙසට ඒමට පිටත්වෙමිනි.

"වෙඩිතැබීම හා මරණය සිදුවුණු වෙලාව 3.15යි. වෙඩිපහරවල් තුනක් නිකුත්වුණා. නමුත් පොලීසිය මේ ගැන දන්නෙ නෑ. එක්කො හොයන්න උවමනාවක් තිබුණෙ නෑ. නැත්නම් අදක්ෂකම"

http://sherlockholmesinvestigations.blogspot.com

"ඉතින් මොකක්ද ඔබ කරන්න බලාපොරොත්තු වෙන්නෙ?" මම ඇසීමි.

"ඉස්සරවෙලා අපි මේකට ගිහින් බලමු" ඔහු කීවේ උද්‍යාන කුටියට පිවිසීම සඳහා තිබූ තරප්පු කිහිපය නගිමිනි. "තුන්වැනි වෙඩි උණ්ඩය වැදිල තියෙන්නෙ කොහේටද කියල මුලින්ම බලමු. ඇගේ මළසිරුර බිම වැටී තිබුණු ආකාරය තමා රටහුණුවලින් බිම ලකුණු කරලා තියෙන්නෙ." කී හෝම්ස් එතැන දණගසා ගත්තේය.

"අපට හිතාගන්න පුළුවනි ඇයට වෙඩි එල්ල වෙද්දී ඇය හිටියේ ඉදිරිය බලාගෙන කියල. ඝාතකයා ගිනිඅවිය එල්ල කළ බවක් බාගවෙලාවට ඇය දකින්නත් නැහැ. එහෙනම් ඔහු ඉන්න ඇත්තේ මෙන්න මේ හරියේ. එතකොට ඇයට නොවැදුණු තුන්වැනි වෙඩිඋණ්ඩය ගියේ කොහේටද?"

මිනීමරුවා සිටියේ යයි ඔහු උපකල්පනය කළ තැනට ගිය හෝම්ස්, එතැන සීරුවෙන් සිට ගත්තේය. ඊළඟට සිතේ මවාගත් පිස්තෝලයක් දකුණු අතේ තබාගෙන, ඔහු වෙඩිතැබීමේ අභිරූපන රංගනයක යෙදුණේය.

"ඉවතට ගියේ පළමුවැනි වෙඩිල්ලද? දෙවැනි එකද? තුන්වැනි එකද?" ඔහු තමාටම කියාගත්තේය. ඊළඟට ඔහු අඩි කිහිපයක් කෙළින්ම ඉදිරියට ගියේය. යළි ආපස්සට පැමිණ බිම දණගසා ගත්තේය. කබා සාක්කුවෙන් කාචය එළියට ගත් හෝම්ස් උද්‍යාන කුටියේ ඉදිරි කෙළවරේ බිත්තිය පරීක්ෂා කිරීමට පටන් ගත්තේය.

"හරියට හරි!" ඔහු කීවේ ජයග්‍රාහී හඬෙනි. "මෙන්න තියෙනවා ඉවතට ගිය උණ්ඩය. ඒක වැදිලා තියෙන්නෙ බිත්තියට. මේක තමයි පළමුවැනි වෙඩිල්ල. මේකෙ ශබ්දයට ඇය හැරිල බලන්න සූදානම් වෙන්න ඇති, බොහෝවිට. ඔහු තැබූ දෙවැනි වෙඩිල්ල තමයි ස්ටුවට් මහත්මියගේ දකුණු කන අසලට වැදුණේ. ඇය බිම ඇදවැටුණාම ඔහු තැබූ තුන්වැනි එක තමා ඇගේ වම් කම්මුලට වැදුණේ."

සාක්කුවෙන් දුනුපිහිය අතට ගත් හෝම්ස් එයින් බිත්තිය හාරා, බදමය තුළට ගිලාබැස තිබූ වෙඩිඋණ්ඩය ඉවතට ගත්තේය.

"මේකත් .32 ප්‍රමාණයේ උණ්ඩයක්මයි. එතකොට ඒ කාරණයත් හරි" කී ඔහු දිනපොතෙන් කඩදාසි කැබැල්ලක් ගෙන උණ්ඩය ඔතා එය මුදල් පසුම්බිය තුළට දමාගත්තේය.

 http://sherlockholmesinvestigations.blogspot.com

"හෝම්ස්. මෙහෙම දෙයක් වෙන්න බැරිද?" මම ඇසීමි.

"කොහොම දෙයක්ද?"

"මොකක් හරි හේතුවක් නිසා ස්ටුවට් ඔහුගේ බිරිඳට වෙඩිතියනවා. ඔහු ඒකට යොදගන්නේ සම්පූර්ණයෙන්ම වෙනත් රිවෝල්වරයක්" මම කීවෙමි. "ඊට පස්සේ ඔහු ඒක අපට හොයාගන්න බැරි විධියට කැලේට විසිකරනවා. පොලීසියෙන් ඔහුගේ ගිනිඅවි ඉල්ලුවාම තමන් ළඟ තිබූ පාවිච්චි නොකළ ගිනිඅවි ඉදිරිපත් කරනවා."

"බොහොම හොඳයි වොට්සන්. තර්කානුකූලව ඔබේ මතයත් පිළිගතහැකියි. නමුත් මෙහෙම දෙයක් කරන්න ඔහුට බැරි ඇයි. සිතාමතා බිරිඳව ඝාතනය කරන්න උවමනා නම් ඔහුට ඒක රාත්‍රී කාලයේ ගෙදරදී කරන්න තිබුණා. පස්සෙ කියනවා ගෙදරට හොරෙක් ඇවිත් මංකොල්ලකන්න තැත්කිරීමේදී වෙඩිතබා පැනගියා කියලා. එහෙම නොකොට මහදවාලෙ සම්පූර්ණයෙන්ම එළිමහන් තැනකට ඇය කැඳවාගෙන ඇවිත් එහෙම කළා කියල හිතන්න අමාරුයි නේද? වෙඩි ශබ්දය ඇහිල කවුරුහරි දුවගෙන නොඒවි කියල කොහොමද ඔහු දන්නෙ?"

"මං අදහස් කරන්නේ කලින් සැලසුම් කරගෙන මෙතැනට ඇවිත් අපරාධය කළා කියන එක නෙමෙයි" මම කීවෙමි. "ඔවුන් දෙදෙනා ගෙදරින් පිටවෙලා එද්දි බහින්බස් වීමක් ඇතිවුණා. ඒක දුරදිග ගියා. ස්ටුවට් මහත්මයා දැඩි කෝපයකට පත්වෙලා ගිනිඅවිය අරගෙන වෙඩි තැබුවා."

"ඒක උපකල්පනයක් හැටියට ඔබේ හිතේ කොණක තියාගන්න වොට්සන්" හෝම්ස් කීය. "අපි බලමු ඊකට පක්ෂව හෝ විපක්ෂව කරුණු හොයාගන්න පුළුවන්ද කියල. දැන් අපි බලන්න ඕන මේජර් ජෙනරාල් ස්ටුවට් ගොල්ෆ් ක්‍රීඩාංගනයට යාමට හා ඒමට ගතකළා කියන කාල වේලාවන් කොයි තරම් දුරට නිවැරදිද කියල.

ඔහු කිව්වේ සවස 3ට පමණ ඔහු ගේට්ටුව ළඟින් පිටත්වී ගියා කියල. ඔහු ගියා කියල අපට හිතන්න පුළුවන් වේගයෙන් අපි යමු." හෝම්ස් කීවේ සාක්කු ඔරලෝසුව අතට ගෙන එහි වෙලාව සනිටුහන් කරගනිමිනි. "දැන් වෙලාව 4.42යි. හරි යමු"

කිහිපදෙනෙකුගෙන් මඟ අසාගැනීමට සිදුවුවත් ක්‍රීඩාංගනය පිහිටි තැන සොයාගැනීම අපහසු නොවීය.

http://sherlockholmesinvestigations.blogspot.com

"මගේ වෙලාව 5.07 යි. අපට ගතවුණා මිනිත්තු 25ක් මේ හැතැක්ම 1 3/4 පමණ දුර එන්න." හෝම්ස් කීවේ යළිත් වරක් ඔරලෝසුවට නෙත් යොමුකරමිනි. ස්ටුවට් මහත්මයා අපට වඩා හෙමින් ආව නිසා පැය 1/2ක් ගතවුණා. ඒ ටික හරියටම හරි. ස්ටුවට්ගේ කාලය ඊටපස්සේ ගතවුණු පිළිවෙළ ඔබට මතකද වොට්සන්?"

"ඔව්. ඔහු 3.35 වෙද්දී ගොල්ෆ් පිති අරගෙන ක්‍රීඩාකරන්න පටන්ගත්තලු."

"දැන් අපට එක් කාරණයක් හොඳින් තහවුරු වෙනවා" හෝම්ස් කීය. "හවස 3.15ට ඔහුගේ බිරිඳට වෙඩිතියලා, හවස 3.30 වෙද්දී ගොල්ෆ් පිටියේ පෙනීඉන්න ස්ටුවට් මහත්තයාට කොහොමටවත් බෑ. මෙතැන හැතැක්ම එකයි තුන්කාලක දුරක් තියෙනවා. රට හරහා දිවීමේ දක්ෂ, තරුණ මලල ක්‍රීඩකයෙකුට නම් අමාරුවෙන් හැකිවේවි මේ දුර මිනිත්තු 15කදී දුවන්න. නමුත් ස්ටුවට් මහත්මයා අවුරුදු 70ක් වයසැති මදක් තරබාරු කෙනෙක්. ඒ හින්ද මං හිතන්නෙ නෑ ඔහුට ඒ කටයුත්ත කරන්න හැකිවුණා කියල. හැබැයි කාටවත් නොපෙනී බයිසිකලයක් පැදගෙන ගියා නම් හරි. නමුත් ඔහු පයින් ගිය බවට දුටු සාක්ෂි තියෙනවා"

"ඊළගට අර සේවකයා - රිචඩ්ස් සාක්ෂි දෙනවා ස්ටුවට් සවස 4ට පමණ ක්‍රීඩා පිටියෙන් ආපසු එන්න පිටත්වුණා කියල" මම කීවෙමි. "අපට පුළුවනි ඒකත් පරීක්ෂා කරල බලන්න."

"ඔව් වොට්සන්. ඔහු ආපහු ගිය පාර දිගේම අපිත් ගිහින් බලමු. ඔහු ගමන්කරල තියෙන්නෙත් කඩමණ්ඩිය හරහා නෙ. අයිලීන් හේග් මෙනෙවිය කිව්වේ ඔහු ගෙදර එද්දී 4.40 වුණු බව. ඒ කියන්නෙත් මිනිත්තු 40ක් ගතවෙලා තියෙනවා. ඔහු ගමනේ කොටසක් අශ්වකරත්තයෙන් ආ බවත් අපට අමතක කරන්න බැහැ."

අපි ස්ටුවට් මහතා ගමන්ගත් මාර්ගයේම ආපසු පැමිණියෙමු. මිනිත්තු 50කින් එම දුර ඒමට අපට හැකිවිය. ඒ අනුව ස්ටුවට්ගේ එම සාක්ෂිය සත්‍ය බැව් අපට තහවුරු විය.

"අදට මේ ඇති වොට්සන්" හෝම්ස් කීවේ හතිදමමිනි. "අපටත් හොඳ ව්‍යායාමයක් ලැබුණා. හරි මහන්සියි නේද. දැන් කුලීරියක නැගලා ආපහු නානායමට යමු. බාගවෙලාවට අපට හෙට උදේ පොලිස් පුහුබයන් ලැබේවි. එතකොට ඉතිරි වැඩකටයුතුවල යෙදෙමු"

 http://sherlockholmesinvestigations.blogspot.com

නානායමට පැමිණි අපි රාත්‍රී ආහාරයට සඳහා සූදානම් වූයෙමු. පොලිස් පරීක්ෂක හෝක් හෝම්ස් හමුවීමට එහි පැමිණියේ අප රාත්‍රී ආහාරය ගනිමින් සිටියදීය.

"මට සමාවෙන්න හෝම්ස් මහත්තයා" ඔහු කීය. ඔබට පොරොන්දුවුණු විධියට, අදම පොලිස් සුනඛයන් රැගෙන ඒම මට කරන්න හැකිවුණේ නැහැ. උන් වෙනත් පරීක්ෂණයක් සඳහා අරගෙන ගිහින් බව මට දැනගන්න ලැබුණා. මං කිව්වා කොහොම හරි හෙට උදේ නවය වෙද්දී එවන්න කියලා"

"ඔබට ස්තුතියි හෝක්. එහෙනම් අපි හෙට උදේ හමුවෙමු"

රාත්‍රී ආහාරයෙන් පසු කෝපි බොමින් සිටියදී, මගේ මිත්‍රයාට මා සමග යමක් සාකච්ඡා කිරීමට උවමනා වී ඇති බව මම තේරුම් ගතිමි. එබැවින් කියවමින් සිටි පුවත්පත ඉවතදමා, ඔහු පිටුපස ඔහුගේ නිදනකාමරයට ගියෙමි.

"ඔබට අවංකව මොකක්ද හිතෙන්නෙ වොට්සන්?" ඔහු ඇසුවේ ඔහුගේ වෙරිවුඩ් පයිප්පයේ කෝච්චි අලුතෙන් දුම්කොළ පුරවමිනි. "මේජර් ජෙනරාල් ස්ටුවට් ගැන තවමත් ඔබේ හිතේ සැකයක් තියෙනවද?"

"දැන් නම් මට හිතෙනවා ඔහු මේ කටයුත්තට සම්බන්ධ නැහැ කියලා" මම කීවෙමි. "මට දැන් හිතෙනවා මේක ඇගේ මුදු හා මුදල් කොල්ලකෑමට කවුරුන් හෝ කළ අපරාධයක් කියලා"

"ඔව්. බොහොම දුරට එහෙම හිතන්න පුළුවනි" හෝම්ස් මගේ අදහසට එකඟවිය. "එහෙම කළා නම් කවුරු කළ වැඩක් කියලද ඔබට හිතෙන්නේ?"

"ඇයි ඔබ එහෙම අහන්නෙ? ඔය ගම්බද පළාත්වල සැරිසරන, රස්තියාදුකාර හිඟන මැරවරයෙක් වෙන්න පුළුවනි. ඔවුන් අතේ ලොකු මුදලක් නෑ. මොනවා හරි විකුණන බවක් පෙන්වමින් ගම්වල සැරිසරනවා. පාළු ගෙයක් දක්කොත් ඒකෙ දොර කඩාගෙන ඇතුළුවෙලා, තියෙන දෙයක් ගන්නවා. අයිතිකාරයන් පෙනෙන්න නොහිටියොත් මිළලක තියෙන දෙයක්, අච්චට දමල තියෙන කබායක් කලිසමක් හරි හොරකම් කරගෙන යනවා. අතමිට මුදල් තියෙන කෙනෙක් පාළු තැනකදී හමුවුණොත් ඔහුව මරාදමල හරි මුදල් සහ ආභරණ පැහැරගෙන යනවා"

"ඔව්. ඔබේ අදහසට යම් තරමක් දුරට එකඟවෙන්න මට පුළුවනි." හෝම්ස් කීවේ දල්වා ගත් පයිප්පයෙන් දුම්

වලාවක් පිටකරමිනි. "නමුත් එහෙම පුද්ගලයන් බොහෝවිට ආයුධයක් හැටියට පාවිච්චි කරන්නේ පිහිය. එහෙමත් නැත්නම් පොල්ලක් වැනි දෙයක්. එහෙම නේද? ඒ මොකද ගිනිඅවියක් වගේ දෙයක් ස්ථිරව ඔවුන් ළඟ තියාගනීවි කියල හිතන්න අමාරුයි.

රිවෝල්වරයක් කියන්නෙත් මැරවර සමාජයේ සෑහෙන මිලකට විකුණන්න පුළුවන් දෙයක්. ඒකට ලොකු මුදලක් ලබාගන්න පුළුවන්. ඒ නිසා මේ වගේ පුද්ගලයන් එහෙම දෙයක් ළඟ තබා ගනීවිද? ගම්වල ගැවසෙන රස්තියාදුකාර හිගන්න, තක්කඩියෙක් ළඟ ගිනිඅවියක් තිබුණා කියල මට නම් හිතන්න අමාරුයි.

මට මෙහෙම දේකුත් හිතෙනවා වොට්සන්. බාගවෙලාවට ඔය පුද්ගලයා කලින්ම උද්‍යානකුටියට ඇතුළුවෙලා ඉන්න ඇති........... සමහරවිට ඒකෙ ජනේලයක් නැත්නම් දොරක් කඩාගෙන ඇතුළුවෙලා, මොනව හරි හොරකම් කරගන්න බලාපොරොත්තුවෙන් ඔහු එතැන රැඳී ඉන්න ඇති. ස්ටුවට් මහත්මිය එතැනට එන හැටි ඇතුළුවීම දැකලා ඔහු හැංගෙන්න ඇති. ඇය මේ පාළුතැනට ඇවිත් මොකද කරන්නෙ කියල ඔහු බලාගෙන ඉන්න ඇති. බාගවෙලාවට ඇය කෑගහන්න තැත්කළ නිසා ඔහු වෙඩිතැබුවා වෙන්නත් පුළුවනි"

"ඔව්. මටත් හිතෙනවා ඔබ ඒ විස්තර කළ අයුරින්ම තමා ඕක සිද්ධවෙන්න ඇත්තේ කියල" මම ඒ උපකල්පනය අනුමත කළෙමි.

"වෙඩිශබ්ද තුනක් නිසා, ඒව ඇහිල කවුරුහරි හෝ මේ පැත්තට ඒවි කියල සමහරවිට ඔහු මොහොතකට හැංගෙන්න ඇති." හෝම්ස් කීය. "කවුරුවත් ආපු නැති නිසා ඔහු ඇගේ වටිනා මුදුත් ගළවාගෙන, මුදල් පසුම්බිය දැමූ සාක්කුවත් කපාගෙන පැනයන්න ඇති"

"ඔය අපරාධකාරයා අරමුණක් නොමැතිව රස්තියාදුවෙච්ච ඉඳලා, ක්ෂණිකව මේ මිනීමැරීම කරා කියල හිතමු." මම කීවෙමි. "එහෙම කෙනෙකු හොයාගැනීම අපට සෑහෙන්න අමාරු වේවි"

"ඔව්. ඔබේ අදහස නිවැරදියි" හෝම්ස් කීවේ නින්දට යාමට සූදානම් වෙමිනි. "හෙට උදේ අපට වැඩකටයුතු රාශියක් තියෙනවා. ඒවා උදෙන්ම පටන්ගත්තොත් හොඳයි. ඔබට සුභ රාත්‍රියක් වොට්සන්"

පසුවද උදේ අප ආහාරය ගනිමින් සිටියදීම අශ්වකරත්තයක් තානායම් දෙරකඩට ළඟාවන හඬ ඇසිණ. මිනිත්තුවක් ගතවෙද්දී නිලඇඳුමෙන් සැරසුණු පොලිස් සැරයන්වරයෙක් ආලින්දයට පිවිසෙන අයුරු අපි දුටුවෙමු. ඔහු තානායමේ සේවකයෙකු අමතන රළු කටහඬ අපට කෑමකන කාමරයට ද ඇසිණ.

"ෂර්ලොක් හෝම්ස් මහත්තයා ඉන්නවද?"

"ඉන්නවා. මේ වෙලාවෙ කෑම කනවා" සේවකයා පිළිතුරු දුන්නේය.

මිනිත්තු පහක් ගතවෙද්දී පොලිස් නිලධරයා අප ඉදිරියට පැමිණ සිරුවෙන් සිටගෙන ආචාර කළේය.

"මම සාජන්ට් මිලර්" ඔහු කීය. "සමාවෙන්න හෝම්ස් මහත්මයා. ඊයේ දවල් සුනඛයන් ඉවනත් තැනකට ගෙනියන්න සිදුවුණා. ඒකෙන් අපට ඊයෙ එන්න බැරිවුණා"

"ආ කමක් නෑ සාජන්ට්" හෝම්ස් කීය. "අද ඔබ ආවා නෙ. එහෙනම් ඉර අව්ව සැරවෙන්න කලින් අපේ රාජකාරි පටන්ගමු. ඔබට පුළුවනි අපේ කරත්තය පිටුපසින් එන්න."

අප වෙනුවෙන් සූදානම්ව තිබූ කුලීරියට නැගී අපි ස්ටුවර්ට් වතුයාය දෙසට ගමන්කළෙමු. සාජන්ට් මිලර්ගේ පොලිස් බල්ලන් දෙදෙනා රැගත් රිය ඒ පිටිපසින් ආවේය. ස්ටුවර්ට් මැඳුරට පිවිසෙන විකල්ප මාර්ගයේ ගේට්ටුව අසල රථ නවත්වන ලදී. හෝම්ස්ගේ සංඥව අනුව මිලර් ඔහුගේ බල්ලන් දෙදෙනා ද කැටිව උද්‍යානකුටිය වෙත පැමිණියේය.

"මේ කළු එකා ජුලියන්. දුඹුරුපාට එකා ෂෝන්" මිලර් කීවේ උන්ගේ කරට දමා තිබූ රැහැන් බොටෙන් අදිමිනි. "හොරු අල්ලන්න හොඳ පුරුදුකාරයෝ." මිලර් බල්ලන්ට කෑමට දීම සඳහා යමක් හෝම්ස් අතට දුන්නේය. හෝම්ස් ඒවා බල්ලන්ට දී උන්ගේ හිස අතගාමින් උන් යාළුකර ගත්තේය. අනතුරුව පොලිස් සුනඛයන් උද්‍යානකුටිය තුළට ගෙනයනු ලදී.

ඔවුහු මිනිත්තු දහයක් පමණ කුටියේ ආලින්දයේ පොළොව ඉවකරමින් සිටියහ. විශේෂයෙන්ම ස්ටුවර්ට් මහත්මිය වැටී සිටි තැන සමීපයේ බිමත්, ඒ අසලම වූ ආරක්ෂක වැටත් ඉවකළහ. කුටියෙන් පිටවී යාමට උන්ට හදිසියක් නොතිබූ බව මම දුටුවෙමි.

මීළඟට උන් දෙදෙනාම බුරමින් කෙළින්ම ගමන් කළේ කුටිය පිටිපස වූ පඳුරු සහිත කැලෑවටය. එහි ඝනව වැඩුණු පඳුරු

කිහිපයක් අතර බුරමින්-මිනිත්තු කිහිපයක් ගතකළහ. හෝම්ස්ගේ සංඥාවක් අනුව මිලර් බල්ලන් ඉවතට ගත්තේය. ඉන්පසු ඔහු එතැනට රිංගුවේ, ගස්වල අතු කිහිපයක් කැඩී ඇති බව අපට ද පෙන්වා දෙමිනි. අපරාධකරුවා සෑහෙන වේලාවක් මෙතැන රැඳී සිටිබව අපට සිතාගත හැකි විය. හතරට නමා එතැන බිම තබා තිබූ කබායක් හෝම්ස්ගේ උකුසුම්නෙතට හසුවිය. ඔහු එය ඉවතට ගනිද්දී සිතේ ඇතිවූ සතුට නිසාදෝ ඔහුට සිඹුරුහන් කෙරිණි. කබායට අමතරව සිගරට් කොට කිහිපයක් ද හෝම්ස් ඒ අවට සෝදිසි කොට අහුලා ගත්තේය. තවත් පරීක්ෂා කර බැලුවත් වෙනත් යමක් හමුවූ බැව් නොපෙනිණ. තමා අතට පත් වූ ඈ කබා සාක්කුවෙන් ගත් කඩදාසියක ඔතාගත් මගේ මිතුරා, බල්ලන් සමග ඉදිරියට යෑමට තමා සූදානම් බව පොලිස් නිලධරයාට පැවසීය.

ලඳු කැලෑ පෙදෙසේ ඝනව පඳුරු වැවී තිබුණත්, පොළොවට අඩි 3ක් පමණ ඉහළ අතුබෙදී නොතිබිණි. එබැවින් කොන්ද නමාගෙන ගස් අතරින් රිංගා යෑම එතරම් දුෂ්කර කාරියක් වූයේ නැත. අඩි විස්සක් පමණ ඉදිරියට යද්දී බිම වැටී තිබූ රෙදි කැබැල්ලක් වෙත ළංවූ බල්ලෝ සලිත් බිරීමට පටන්ගත්හ. සාජන්ට් මිලර් එය අහුලාගෙන හෝම්ස් අතට භාරදුන්නේය. ඒ, ස්ටුවට් මහත්මියගේ දුඹුරු කොටු සහිත කහ පැහැති සායෙන් කැපී ගිය කැබැල්ලක් බව දුටු වහාම අපි හඳුනාගත්තෙමු. ඇය මියගිය පසු අපරාධකරුවා, ඇගේ මුදල් පසුම්බිය උදුරා ගැනීම සඳහා ඇගේ සාක්කුව කපාගෙන තිබුණේ සායේ කොටසක් ද සමගිනි. තවත් පියවර කිහිපයක් ඉදිරියට යද්දී පඳුරක් අසල නැවතුණු බල්ලෝ දකුණට හැරී බිරීමට පටන් ගත්හ. එතැන ද හෝම්ස්ගේ අවධානයට ලක්විය. ඇතුළට රිංගා ගිය ඔහු ආපසු ආවේ රෝස පැහැති කාන්තා මුදල් පසුම්බියක් ද අතැතිවය. සුදු පැහැති රේන්ද මෝස්තරයකින් හැඩදමූ එහි මුදල් කිසිවක් නොවීය.

මේ දක්වාම අප ගමන්ගත්තේ පඳුරුවලින් වැසුණු කැලෑබිමක බව මම සඳහන් කළෙමි. මෙම පෙදෙසේ පොළොව ඉතා ශක්තිමත් වූ අතර, වියැළී බිම වැටුණු කොළවලින් එය වැසී තිබිණ. තවත් යාර දෙසීයක් පමණ ඉදිරියෙන් කැලෑ අඩවිය අවසන් වූ බැව් අපට පෙනී ගියේය. එය අවහුරා වූයේ අඩි පහක් පමණ උස වැටකිනි. ලී කොට ළං ළං ව සිටුවීම නිසා පැළවුණු වැටක් වූ එහි, අතරින් පතර

 http://sherlockholmesinvestigations.blogspot.com

ලෑලි ගසා අහුරා තිබිණි. එම් හෝඩ්සන් මහතාට අයත් වතුයායේ කෙළවර බව අපි තේරුම් ගත්තෙමු. තමන්ට එතැනින් ඉදිරියට යාමට නොහැකි බව තේරුම් ගත් සුනඛයෝ නොනවත්වාම බිරීමට පටන් ගත්හ.

වැටෙන් එහා පැත්තේ තිබුයේ කුමක්දැයි අපි එයට ළංවී පරීක්ෂා කර බැලුවෙමු. එය වගාකර නොතිබූ කුඹුරු යායක් බව අපිට දැනගන්නට ලැබිණ. අප සිටි පොළොව මට්ටමට සෑහෙන තරම් පහතින් තිබූ එය, කිසියම් ධාන්‍ය වර්ගයක් වගා කිරීම සඳහා මෑතක් වනතුරුම යොදගත් එකකි. සමහර විට වැහිසමය එනතුරු යළි වගාකිරීම අත්හැර දමුවා වන්නට ඇත. කෙසේ වෙතත් කොහෙන් හෝ ගලා ආ දියපාරක් නිසා එහි පසේ තෙත් බවක් තිබිණ. ඊට අමතරව කුඹුරුයාය හරහා හමා ආ සුළඟේ මඩ ගඳක් ද දැනිණි. තම වත්තේ එක් මායිමක් ඇවොන් ගඟේ අතු ගංගාවක් බවට ස්ටුවට් මහතා කළ ප්‍රකාශය මට සිහිවූයේ එවිටයි.

"හෝම්ස් මහත්තයා" මෙතෙක් නිහඬවම තම කාර්යය කළ සාජන්ට් මිලර් කථා කළේය. "ඉක්කඩියා මොකා වුණත් ඌ මේ වැටෙන් පැනලා තමයි ගිහින් තියෙන්නේ. මෙන්න තියෙනවා ඌ වැටේ ලෑලි කඩා දමූ තැන. බල්ලන් ලස්සලා වැටෙන් එහා පැත්තට දමලා, අපිත් පනිමු ඒ පැත්තට"

"එපා! එපා!" හෝම්ස් කෑගැසීය. "මතන අපට බොහොම ප්‍රයෝජනවත් වෙන තැනක්. මඩ ගතිය නිසා නොවැරදීම බිම ඇති අඩි සටහන්. අපි අඩි දහයක් පමණ එහා තැනකින් වැට කඩාගෙන රිංගමු. ඊට පස්සේ ඒ පැත්තෙන් මේ හරියට ඇවිත් බලමු."

අඩි කිහිපයක් ඈතින් වැටට සවිකර තිබූ ලෑලි කඩා දමා අපට රිංගා යා හැකි කපොල්ලක් සාද ගත්තෙමු. එතැනින් එහා පැත්තට රිංගා මුලින් සඳහන් කළ තැන වෙත ගියෙමු.

"මෙන්න තියෙනවා මෙතෙක් මට දකින්න නොලැබුණු වැදගත්ම ලකුණක්" හෝම්ස් කීවේ වැටෙන් පැනීමේදී මෘදු පොළොවට හොඳින් තාවැදී තිබුණු සපත්තු අඩි සලකුණු පෙන්වමිනි. "ඔබට පෙනෙනවා ඇති මේ ලකුණුවලට යටින් තියෙන්නේත් මේ වර්ගයේම සපත්තුවල අඩි සලකුණු බව; නමුත් විරුද්ධ දිශාවට. ඒකෙන් කියන්නේ අපරාධකාරයා ඇවිත් තියෙන්නෙත් මේ පැත්තෙන්; පිටවෙලා ගිහින් තියෙන්නෙත් මේ පැත්තෙන්. ඔහු මේ මාර්ගය ගැන දන්නා පුරුදු කාරයෙක් වගෙයි"

http://sherlockholmesinvestigations.blogspot.com

තම සාක්කුවෙන් සටහන් පොත ඉවතට ගත් හෝම්ස් පිටුවක් පිරෙන්නට සපත්තුවේ ලාංඡනය ඇඳ ගත්තේය. මීළඟට උත්තල කාචයෙන් මඩේ තිබූ ලාංඡනය පරීක්ෂාකරමින් වැදගත් ලකුණු රැසක් පොතේ සටහන් කරගත් අයුරු අපි බලා සිටියෙමු.

අනතුරුව ඔහු තම සැලකිල්ල යොමු කළේ වෙනත් දෙයකටය. අඩි පහක් පමණ ඈතින් වූ පඳුරක් දෙසට බල්ලෝ නොකඩවා බුරමින් සිටියහ.

"හරි! අපට නොපෙනුණාට වැදගත් දේවල් බල්ලන්ගේ ඉවට කොහොමටවත් මග ඇරෙන්නේ නෑ" කී මගේ මිත්‍රයා වැටේම වූ ගසකින් සිහින් දිග කෝටුවක් කඩා ගත්තේය. ඉන්පසු ඔහු යමක් වෙත කෝටුවේ තුඩ දිගුකරමින් එය ළංකර ගැනීමට උත්සාහ දැරුවේය. මිනිත්තු දහයක් පමණ දැඩි මහන්සියෙන් පසු එය පහතට ගැනීමට හෝම්ස් සමත්විය. ඒ "බෙරේ" නමින් හැඳින්වෙන විල්ලුද රෙද්දෙන් මැසූ කොළ පැහැති සැහැල්ලු හිස්වැස්මකි. හමුදා සෙබලුන් කැලෑසටන්වලදී පළඳින වර්ගයේ එකක් වූ මෙය දැකීමෙන් හෝම්ස් අතිශය සතුටට පත්විය.

බල්ලන් දෙදෙනාගේ මුහුණුවලට එය ළං කළ විට උන් හඬනැගුවේ, තම හපන්කම හැඟී සතුටට පත් අයුරෙනි. අපරාධකරුවා පිළිබඳ මතකය සුනඛයන්ට අලුත් කිරීම සඳහා සාජන්ට් මිලර් මේ හිස්වැස්ම යොදාගත්තේය. මීළඟට උන් ඉදිරියට මෙහෙයවද්දී බල්ලෝ නොපැකිළව තමන් යායුතු දිශාව හඳුනාගත්හ. ඒ කුඹුරු මැදින් වැටී තිබූ පුළුල් වේල්ලක වූ අඩිපාරකය. වේල්ලේ පොළොව අව්වට වියළී ගොස් තිබිණ. එහි තැනින් තැන වැවුණු, රවුම් කොළ පැහැති ගෙඩි සහිත ගස්වර්ගයක් දක්නට ලැබිණ. මෙවැනි තැන්වලදී පයින් ගමන් කළ අය ගමන් කළේ කුඹුරට බැසීමෙන් පසුව බැව් අපි දුටුවෙමු. කුඹුරේ පස මෘදු වූ නිසා පා සටහනේ පැහැදිලි ලාංඡනය යළිත් දක්නට ලැබිණ. එය කොතරම් පැහැදිලිවී ද යත්, ඒ අසලින් බිම හිඳගත් හෝම්ස් සාක්කුවෙන් ටේප්පටියක් ගෙන, සපත්තුවේ දිග සහ පළල මැන සටහන් කරගත්තේය. ඊට අමතරව පියවර දෙකක් අතර දුර, වම් හා දකුණු කකුල්වල ලාංඡනවල වැඩිපුර විස්තර ද සොයා ගැනීමට ඔහු සමත් විය. කුඹුරුයාය අවසන් වූ තැන තිබුණේ කඳු බෑවුමකි. එයද කැලෑ ඉඩමක් බැව් පෙනිණ. එය රජයේ රක්ෂිත ඕත් වගා

 http://sherlockholmesinvestigations.blogspot.com

ව්‍යාපෘතියක් බව දක්වෙන පුවරුවක් අපට දක්නට ලැබුණේ පසුවය. එහි තිබූ අඩිපාර දිගේ සුනඛයෝ නොපැකිළව ඉදිරියට දිවගියහ. සැතපුම් කාලක් පමණ ඉදිරියට ගිය පසු එම අඩිපාර අවසන් විය. එහිදී අපට දක්නට ලැබුණේ ගල්දමා සකස්කරන ලද වාහන ගමන්කරන පුළුල් පාරකි.

අපරාධකාරයාගේ ඉව දිගේ මෙතෙක් දුර පහසුවෙන් ඉදිරියට ආ ජූලියන් හා ෂෝන් අතරමං වූ කලක මෙන් එක තැනම රවුමට කැරකෙන්නට පටන්ගත්හ. ඉව එතැනින් අවසන් වූ බව අපි තේරුම් ගත්තෙමු.

"සැකයක් නෑ" හෝම්ස් කීය. "අපරාධකාරයා මෙතැනදී මොකක් හරි වාහනයකට නැගලා ගිහිං තියෙනවා. මේක අශ්වකෝච්චි ගමන්ගන්නා ප්‍රධානපාරක් වෙන්න ඇති"

"හෝම්ස් මහත්මයා" මිලර් කීය. "මං හිතන හැටියට මේක තමයි බ්ලැන්ඩ්ෆඩ් සහ ඉයෝවිල් සම්බන්ධ කරන මාර්ගය. මේකෙ අශ්වකෝච්චි පමණක් නෙමෙයි කුලීරථ පවා ගමන් කරනවා. කොහොම වුණත් ජූලියන් ෂෝන් දෙන්නාගේ රාජකාරී මෙතැනින් ඉවරයි"

"ඔවුන් මේ අපරාධය විසඳීමට විශාල වැඩ කොටසක් කළා" හෝම්ස් කීය. "මේ අපරාධය කිරීමට සහභාගි වෙලා තියෙන්නේ එකම පුද්ගලයයි. ඔහු මේ පැත්තෙන්ම ඇවිත් මේ පැත්තෙන්ම පිටවී ගිහින් තියෙනවා. ඒකෙන් තේරෙන්නේ ඔහුට මේ ගමන්මාර්ගය හුරුපුරුදු බව."

අප ආපසු තානායමට ළඟාවෙද්දී දහවල් කෑම වෙලාව ළංවී තිබිණ. පොලිස් පරීක්ෂක හෝක් අප හමුවීමට තානායමට පැමිණ සිටියේය.

"කොහොමද හෝම්ස් මහත්මයා, ඔබේ වැඩකටයුතු සාර්ථක වුණාද?" ඔහු ඇසුවේ අප එහි පිවිසෙද්දී අසුනෙන් නැගී සිටිමිනි.

"සෑහෙන තරම් සාර්ථකයි කියන්න පුළුවන්. අපි කෑම කන ගමන් කථාකරමු" කී මගේ මිතුරා දහවල් ආහාරය ගන්නා අතරේ අප කළ සොයාගැනීම් ගැන කෙටි විස්තරයක් කළේය.

"මෙයින් අපට පැහැදිලිවම එක් නිගමනයකට එන්න පුළුවනි" හෝම්ස් කීය. "කාගෙ හරි හිතේ මේජර් ජෙනරාල් ස්ටුවට් ගැන සැකයක් ඇතිවුණා නම්, ඒක සම්පූර්ණයෙන්ම බැහැර කරන්න පුළුවනි. ඔහු නිර්දෝෂයි"

http://sherlockholmesinvestigations.blogspot.com

"එතකොට ඔබ හිතන හැටියට අපරාධකාරයා කවුද?" හෝක් විමසුවේය.

"බොහොම වෙලාවට ඔහු මේ ගමේ කෙනෙක් නෙමෙයි." හෝම්ස් කීය. "අර රස්තියාදුකාර හිඟන මැරවරයෙක් ගැන වොට්සන් මට කිව්වා. ඒක අපට ටිකක් සංශෝධනය කරන්න වෙනවා. ඔහු මැරවරයෙක් බවට සැක නෑ. හිඟන්නෙක්ම කියන්න බැරිවුණත් ලොකු පොහොසතෙක් නෙමෙයි. නමුත් ගෙයින් ගෙට යන හිඟන්නෙක් වගේ, ගෙදරක මොකක් හරි තිබුණොත් හොරකම් කරගෙන යන පුද්ගලයෙකුත් නොවෙයි. ඔහු උද්‍යානකුටියට ආවෙ මොන අරමුණකින්ද කියන්න බැහැ. බාගවෙලාවට එහි අගුළු දමා ඇති දොර ජනේල කඩල ඇතුළට යන අරමුණෙන් කුටිය සමීපයේ කැලෑරොදේ සැඟවී හිටියා වෙන්නත් පුළුවනි. කොහොමවුණත් ඔහු අඩි හයක් පමණ උස කෙට්ටු පුද්ගලයෙක්. බාගවෙලාවට යුද්ධහමුද සේවයේ ඉඳල පලාගිය නැත්නම් සේවයෙන් පහකළ අයෙක් වෙන්න පුළුවනි. නමුත් අද මං සොයාගත් දේවල් වැඩිදුර පරීක්ෂා නොකර නිශ්චිත යමක් කියන්න බැහැ."

"මොනවද හෝම්ස් මහත්මයා අප ඊළඟට ගතයුතු පියවර?"

"ඒ ගැන හරි තීරණයකට එන්න මට තවමත් බැරිවුණා හෝක්" හෝම්ස් කීය. "අද හවස දුම්රියෙන් ලන්ඩනය බලා යන්නයි අපි හිතුවේ. ඊට කලින් මං කැමැතියි ස්ටුවර්ට් මහත්මයා හමුවෙන්න. අපරාධකරුවා ගැන මොනවා හරි හෝඩුවාවක් අපට හමුවුණු බව දැනගැනීම ඔහුගේ හිතට සුළු සැනසීමක් හරි ගෙන ඒවි"

"හෝම්ස් මහත්මයා. ඔබ කියන්නේ ඉදිරියට යන්න තරම් ප්‍රමාණවත් හෝඩුවාවන් ලැබුණේ නැහැ කියලද?"

"මට නම් හිතෙන්නේ එහෙමයි"

දහවල් අහර ඉක්මනින් අවසන් කොට ආපසු ලන්ඩනය බලායාමට, අපේ ගමන්මලු සූදානම් කරගත්තෙමු. තානායමේ ගාස්තුගෙවා අප අශ්වකරත්තයට නැගුණේ, පළමුව ස්ටුවර්ට් නිවසට ගොස් දෙවනුව දුම්රියපොළට යාමේ අරමුණෙනි.

"හෝම්ස් මහත්මයා" මේජර් ජෙනරාල් ස්ටුවර්ට් කීවේ අප පිළිගනිමිනි. "මං අද උදේ ඉඳලම බලාගෙන හිටියේ ඔබ එනතුරු. මං විශ්වාසකරනවා ඔබ මොනවා හරි සැනසිලි දයක ආරංචියක් අරගෙන ආවා කියල?"

 http://sherlockholmesinvestigations.blogspot.com

"බොහොම සුළු හෝඩුවාවන් කිහිපයක් ලැබුණා. මේ ඔබේ බිරිඳගේ මුදල් පසුම්බිය. මේ ඇගේ සාය පිහියකින් කැපීමේදී කැපී ගිය රෙදි කැබැල්ල. එහෙම නේද?"

බලාපොරොත්තු නොවූ ලෙස මේ දේවල් දකීමෙන් ස්ට්‍රැවට් මහතා දැඩි කම්පනයකට පත්විය. ඔහුගේ දෙනෙත්වලින් කඳුළු කැට කඩා හැලෙනු මම දුටුවෙමි. සංග්‍රාම භූමියේදී මරණය දක දක ජීවිත කාලයක් සටන්කොට ඇති මේ සෙන්පතියා, තම බිරිඳගේ අකල් වියෝවෙන් කම්පාවට පත්ව ඇති අයුරු පුදුම සහගත නොවේද?

ස්ට්‍රැවට් මහතා යථා තත්ත්වයට පැමිණි පසු, එදා දවසේ අපට දැකගන්නට ලැබුණු දේ පිළිබඳව හෝම්ස් කෙටි විස්තරයක් කළේය.

"ස්ට්‍රැවට් මහත්මයා, මං කැමතියි ඔබෙන් කාරණා කිහිපයක් ඉක්මනින් අසා දැන ගන්න." හෝම්ස් කීවේ තම සාක්කු ඔරලෝසුව එළියට ගෙන වේලාව ද පරීක්ෂා කරමිනි. "ඔබේ ගෙදර සේවය කළ සේවකයන් කවුරු හරි, නැත්නම් අශ්වකරත්තයේ රියැදුරෙකු පසුගිය කාලයේ ඔබ සේවයෙන් අස්කර දැම්මාද? ඔවුන්ගේ සේවය අසතුටුදායක වීම නිසා, නැත්නම් හොර වංචාවක් නිසා?"

ස්ට්‍රැවට් මහතා මඳ වේලාවක් කල්පනා කළේය. මීළගට නිවසේ කාමරයක් තුළට ගිය ඔහු ෆුල්ස්කැප් ප්‍රමාණයේ දිග පළල පිටු ඇති පොතක් ගෙන ආවේය. එහි පිටු කිහිපයක් පෙරළද්දී හෝම්ස්ගේ ප්‍රශ්නයට පිළිතුරු දීමට ඔහු සූදානම් බැව් පෙනිණ.

"දැන් ඉන්න අශ්වකරත්ත රියැදුරා අප ළඟ ඉන්නේ අවුරුදු හයක සිට. ඊට කලින් දීර්ඝ කාලයක් තිස්සේ හිටි රියැදුරා අසනීප වී මියගියා." ස්ට්‍රැවට් මහතා කීය.

"සේවයෙන් අස්කළ කෙනෙක් ගැන ඔබට මතක් කරන්න පුළුවන්ද? ඔබ හෝ ඔබේ බිරිඳ සමග කෝපයෙන් පසුවුණා යයි සිතිය හැකි කෙනෙක්?"

"මතක ඇති කාලෙකටම අපට රැකියාවෙන් අස්කරන්න වුණේ සේවකයන් තුන්දෙනයි"

"ඔවුන් ගැන මට කියන්න"

"ප්‍රධාන ගෘහ සේවකයා හැටියට මාස දෙකක් වැඩ කළ රිචඩ් ස්නෙලිං අස්කරන්න මට සිදුවුණා; ඔහු නොයෙක් වංචනික කටයුතුවල යෙදීම නිසා."

"ඔහුගේ පෙනුම කොහොමද?"

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔහු අඩි පහමාරක් පමණ උස. තට්ටය පෑදුණු වයස පනහක පමණ..................."

"ඔහු ගැන අමතක කරන්න පුළුවනි" හෝම්ස් කීය. "කවුද අනික් අය?"

"අවුරුදු හතරකට පෙර රැකියාවෙන් නෙරපූ බිලිංටන් තවත් අයෙක්. ඔහු උද්‍යාන සේවකයා. අධික ලෙස මත්පැන් පානය කරමින් සේවය පැහැර හැරීම නිසා තමයි අස්කළේ. මෑතකදීත් අසනීපවෙලා රෝහල් ගතකර තිබුණා. මා ගෙදර නැති වෙලාවට ඇවිත් මගේ බිරිඳගෙන් මුදල් ඉල්ලාගෙන ගිහින් තිබුණා"

"ඔහුගේ ශරීර පෙනුම? වයස?"

"වයස හැටක් හෝ හැටපහක් පමණ මදක් තරබාරුයි. උස අඩි පහමාරකට ටිකක් වැඩියි"

"ඔහු ගැනත් අමතක කරන්න පුළුවනි. වෙන කවුද?"

"අනෙක් පුද්ගලයා ඉස්තාල්යේ සුළුසේවකයෙකුව සිටි ලිට්ල්ජෝන් නම් තැනැත්තා. උස අඩි හයක් පමණ, කෙසඟ සිරුරක් තිබූ ඔහු වයස අවුරුදු තිහක පමණ තරුණයෙක්."

"ඔහු සේවයෙන් අස්කළේ ඇයි?"

"ඔහු ඉතා සුළු දෙයින් පවා තදින් කේන්ති ගන්නා අයෙක්." ස්ටුවට් මහතා කීය. "වරක් තම කෑමවේල ප්‍රමාද වීම ගැන ඔහු මුළුතැන්ගෙයි සේවිකාවකට කම්මුල්පහරක් දී තිබුණා. මාත් බිරිඳත් හෙන්ඩසන් මහතාගේ ගෙදර රෑ කෑමකට ගිය වෙලාවෙ, ඔහු අපේ රියැදුරාට හොරෙන් අපේ අශ්වකරත්තයත් පදවාගෙන පෞද්ගලික ගමනක් ගිහින් තිබුණා. ඒ ගැන රියැදුරා මට දනුම් දුන්නා. ඒකට ඔහු රියැදුරාට මරණ තර්ජන කරාලු. ඒ වෙලාවෙත් මං ඔහුට සමාව දුන්නා. ඊට මාස දෙකකට පමණ පස්සේ මට දැනගන්න ලැබුණා ඔහු රේස් ඔට්ටු දමා මුදල් නැතිනාස්තිකළ පුද්ගලයෙකු බව"

"ඇයි ඔහුව රැකියාවෙන් අස්කරන්න වුණේ?"

"අපි සේවකයන්ට වැටුප් ගෙවන්නේ මාසයකට සැරයක්. ඒ කටයුතු හැමදමත් කළේ මගේ බිරිඳ" ස්ටුවට් මහතා කීය. "ඔහු වරක් ඉදිරි මාසයේ වැටුපත් මගේ බිරිඳගෙන් ඉල්ලා තියෙනවා. ලිට්ල්ජෝන් නාස්තිකාරයෙකු බව දන්නා නිසා මගේ බිරිඳ මාසයකම වැටුප ඔහුට කලින් දී නැහැ. දී තිබෙන්නේ සති දෙකකට අත්තිකාරමක්. ඒකට ඔහු මගේ බිරිඳගේ මුහුණටම බැණ වැදී තිබුණා"

 http://sherlockholmesinvestigations.blogspot.com

"මේ බව ඇය ඔබට කියන්න ඇති?"

"ඇය මට කිසිවක් කිව්වේ නැහැ. අශ්වකරත්ත රියැදුරා සහ මුළුතැන්ගෙයි සේවිකාව දෙදෙනාම මට රහසෙන් දැනුම් දුන්නා. මං කිරිදගෙන් විමසා බලල එය සත්‍යයක් නිසා තුන්මාසයක වැටුප් ගෙවා ලිට්ල්ජෝන්ව රැකියාවෙන් අස්කළා."

"ඔහු ඊට පස්සේ කවදාවත් ඔබ හමුවෙන්න ආවේ නැහැ?"

"නැහැ"

"ඔහු මේ ගමේම කෙනෙක්ද?"

"නැහැ. ඔහු ඉයෝවිල් නගරයේ කෙනෙක්"

"ඉයෝවිල් ගැන අද දවසට මේ අපට අහන්න ලැබුණු දෙවැනි වතාව" හෝම්ස් කීය. "ඔහු කලින් කළ රැකියාව කුමක්ද කියා ඔබට දැනුම් දී තිබුණද? ඒ ගැන සහතික එහෙම?"

"ඉස්තාලයේ සුළුසේවකයෙක් හැටියට ගත් නිසා, මං කලින් කළ රැකියාව, සහතික ආදිය විමසුවේ නැහැ" ස්ටුවට් මහතා කීය.

"ඔහු හමුදා සේවයේ යෙදී සිට එයින් ගෙරපූ කෙනෙක් බව මට පසුව දැනගන්න ලැබුණා."

"ඔහුගේ දෙමව්පියන්ගේ නම, ඔවුන්ගේ නිවසේ ලිපිනය ආදිය ඔබ ළඟ තියෙනවාද?"

"ඒ කිසිවක් නෑ මහත්මයා" ස්ටුවට් මහතා පිළිතුරු දුන්නේය.

හෝම්ස් නිහඬව මදවේලාවක් කල්පනා කළේය.

"ස්ටුවට් මහත්මයා, මං කැමතියි ඔබේ බිරිඳගේ නැතිවූ මුදු ගැන සම්පූර්ණ විස්තරයක් දැනගන්න."

"එයින් එකක් රත්තරන් පටිටම් මුද්දක්. අප දෙදෙනා විවාහ වූ වෙලේ මා ඇයට පැළඳූ මුද්ද. එහි ඇතුළු පැත්තේ JSS+M AH 1855 යනුවෙන් කැටයම් කර තිබුණා. අනික් මුද්දක් ඉන්දියාවේ සිටින මගේ පුතා ආනල්ඩ්, මේරිගේ උපන්දිනයක් වෙනුවෙන් තෑගි කළ එකක්. එහි බෝංචි ඇටයක ප්‍රමාණයේ, ඒ හැඩයේම තද කොළ පාට මරකත මැණිකක් අල්ලා තිබුණා. අනෙක් මුදු දෙක දියමන්ති ඇල්ලූ මුදු දෙකක්"

"ඒවා ඇයට හිමිවුණු ආකාරය ගැන ඔබට මතකයක් තියෙනවාද?" හෝම්ස් විමසුවේය.

"ඇගේ පියා දේවගැතිවරයෙක් ලෙස අප්‍රිකාවේ ට්‍රාන්ස්වල්හි සේවය කර තිබුණා. ඒ කාලයේ ඔහුට තෑගි ලැබුණු අලංකාර

http://sherlockholmesinvestigations.blogspot.com

දියමන්තියකින් මුද්දක් සාදා ඔහු මේරිගේ මවට තෑගිකර තිබුණා. මේරිට වැඩිමහල් පුතා උපන්වෙලේ, ඇගේ අම්මා ඒ මුද්ද මේරිට තෑගි කළා. අනෙක් මුද්දේ දියමන්තිය මං දකුණු අප්‍රිකාවේ සිටි කාලයේ ඩිබියර්ස් දියමන්ති සමාගමෙන් මිලට ගත් එකක්. එයින් මුද්දක් සාදවා මං ඇයට පරිත්‍යාග කළේ අපේ විසිපස්වැනි විවාහ සංවත්සරය වෙනුවෙන්. මේ දියමන්ති දෙකම හේසල්නට් ඇටයක හැඩැති ඒවා. නමුත් ප්‍රමාණයෙන් බෝංචි ඇටයකින් භාගයක් පමණ. ඒවායේ මුහුණත් කපා ඔපදමා තිබුණා. ඒ නිසා අලංකාරව දිළිසුණා"

"මේවා ඇය නිතරම පැළඳගෙන සිටියාද?"

"නිතරම වගේ අඟුත් තිබුණේ මඟුල් මුද්ද පමණයි. නමුත් නිවසට එන අමුත්තතු පිළිගන්න සූදානම් වෙලාවට, නැත්නම් කොහේ හරි ගමනක් යද්දී මේ මුදු පැළඳුවා"

"පෙරේද ඇය මේ මුදු පළඳින්න ඇත්තේ හේග් මෙනෙවිය පිළිගන්න සූදානම්වුණු නිසා විය හැකිද?"

"සත්තකින්ම ඔව්"

"මෙතරම් වටිනා මුදු පැළඳගෙන නිතර ගමන්බිමන් යෑම ගැන ඔබ විරුද්ධත්වයක් දක්වූයේ නෑ?" හෝම්ස් විමසුවේය.

"මුලදී මං කිහිපවාරයක්ම ඇයට ඒ ගැන කිව්වා. ඇය කිව්වේ මේ හැම එකක්ම ඇයට තදින් ආදරය කළ අයගෙන් ජීවිතයේ වැදගත් අවස්ථාවල ලැබුණු ඒවා බව. ඒ නිසා ඇය ඒවාට දැඩි කැමැත්තක් දක්වූවා. පළඳින්න බැරි ආභරණ ළඟ තිබීම වැඩක් නැහැ කියලයි ඇය කිව්වේ. කොහොම වුණත් මට මතකයි මේරිගේ මව කියූ දෙයක්. මේරි වයස අවුරුදු හය හත කාලයේදීත් මුදු, මාල, කරාබු පළඳින්න දැඩි ආශාවක් දක්වූවලු"

"මේ දියමන්ති මුදු දෙක හඳුනාගත හැකි ලකුණු මොනවා හරි තියෙනවාද?"

"ඇගේ මවගෙන් ලැබුණු මුද්දේ ඇතුළු පැත්තේ මවගේ නම වූ "තෙරේසා හාට්ලි" යන නම කොටා තිබුණා. අනෙක් මුද්දේ ආතල්ඩ්ගෙන් අම්මාට" කියා කොටා තිබුණා"

"මේ මුදු නැවත දකින්න ලැබුණොත් ඔබට හඳුනාගන්න පුළුවන්ද?"

"ඇත්තෙන්ම ඔව්. පහසුවෙන්ම හඳුනාගතහැකියි"

http://sherlockholmesinvestigations.blogspot.com

"හොඳයි ස්ටුවට් මහත්මයා" හෝම්ස් කීය. "ඔබට හිරිහැරයක් නොවෙයි නම්, මං කැමැතියි ඔබේ පවුලේ හා ඔබේ බිරිඳගේ පවුලේ මුල් කාලයේ සිට ගත් ඡායාරූප ඇල්බම් තිබෙනවා නම් ඒවා බලන්න. මං ඒකට වැඩිකාලයක් ගතකරන්නේ නැහැ. බාගවෙලාවට මට ප්‍රයෝජනවත් විය හැකි කරුණු මොනවා හරි ඒවායින් මට දැකගන්න හැකිවේවි"

හෝම්ස්ගේ ඉල්ලීමට විශ්‍රාමලත් සෙන්පතියා කැමැත්තෙන්ම එකඟ විය. පැරණි අල්මාරියක් විවෘත කොට ඡායාරූප ඇල වූ ඇල්බම කිහිපයක් ගෙන ආවේය. රෙදි මලුවල දමා නූල්වලින් ගැටගසා තිබූ ඒවා අවුරුදු ගණනකින් එළියට ගත් බවක් නොපෙනිණ.

සමහරක් ඡායාරූප කාලය විසින් දුර්වර්ණ කොට තිබූ අතර සමහරක් කාවුන් විසින් කා දැමීම නිසා විනාශයට පත්ව තිබිණ. එහෙත් සමහරක් අපූරුවට ආරක්ෂා වී තිබුණේ කිසිදු පළුදුවීමකට භාජනය නොවී ය. ස්ටුවට් යුවළ අප්‍රිකාවේදී ගත් ඡායාරූප මා ඉතා ආශාවෙන් බලද්දී මගේ මිත්‍රයා දෙනෙත් යොමුකළේ, දෙදෙනා විවාහයට පෙර කාලවල ඔවුන්ගේ දෙමාපියන් හා පවුල්වල අය සමග ගත් ඡායාරූප වෙතය.

"මෙන්න මේ යුවළ කවුද?" හෝම්ස් විමසුවේය.

"මේ ඇගේ පියාගේ - ඒ කියන්නේ හාට්ලි දේවගැතිතුමාගේ වැඩිමහල් සොහොයුරා සහ ඔහුගේ බිරිඳ"

"මේ ඡායාරූපයේ ඉන්නේ ඔබේ බිරිඳ වෙන්න ඇති?" හෝම්ස් ඇසුවේ වෙනත් ඡායාරූපයක් පෙන්වමිනි.

"ඔව්. මෙරි පාසලෙන් අස්වුණු අලුත. ඇය සමග ඉන්නේ ඇගේ වැඩිමහල් සොහොයුරා ජෙෆ්රි"

"ඔහු නේද ඔහුගේ බිරිඳ සමග දුම්රිය අනතුරකින් මියගියා කිව්වෙ?"

"ඔව්. ජෙෆ්රි තමයි"

"ජෙෆ්රි ගේ මුහුණත් ඔහුගේ මහප්පාගේ මුහුණ වගේම යි" හෝම්ස් කීවේ ඡායරූප දෙක දෙසම කිහිප වරක් බලමිනි. "ඉදිරියට නෙරා ආ හැප්ස්බර්ග් යටිහනුව. ගොටු දෙකක් ලෙස විශාලව විහිදුණු කන්පෙති දෙක. පටු හැලල් තලය. මේ පුද්ගලයින් ඉතාම තදින් කේන්ති යන අය බව ස්ටුවට් මහත්මිය ඔබට කියල නැද්ද?"

"ඇත්තෙන්ම ඔව් හෝම්ස් මහත්මයා" ස්ටුවට් මහතා කීය. "ඇගේ මහප්පාත්, ඇගේ අයියා ජෙෆ්රීත් ක්ෂණිකව කෝන්ති ගන්නා අය බව මා සමග කියා තිබෙනවා. ඒකට ඇගේ පියා හාට්ලි දේවගැතිතුමා. ඔහුට තිබුණේ පුදුම ඉවසීමක් වගේම කරුණාවන්ත කමක්. ජෙෆ්රිගේ පුතාගේ ජායාරූපයක් මේකෙ නැහැ. ඔහුටත් තිබුණේ ඔහුගේ පියාගේ වගේම මුහුණක්"

"ඔහුට මොකද වුණේ?" මම ඇසීමි.

"ඔහු අකාලයේ මියගියා. පතල් භාරත සමාගමක රැකියාවකට බැඳුණු ඔහු, ඉක්මනින්ම යැවුණේ සියරාලියොනයට. එහිදී උණසන්නිපාතය වැලඳී වැඩපොළේ සේවකයන් රාශියක් මියගියා. ඔහුත් එක් අයෙක්"

"හාට්ලි දේවගැතිතුමාගේ බිරිඳ මොන වගේ කෙනෙක්ද?"

"මේරිගේ දෙමව්පියන් දෙදෙනාම ඉතාම කාරුණික අය. තරුණ කාලයේ ඔවුන් යටත් විජිතවල ආගම් ප්‍රචාරක කටයුතුවල යෙදෙමින්, ඒ රටවල ළමයින්ට අධ්‍යාපනය ලබා දෙමින් විශාල මෙහෙයක් ඉටුකළාලු. මේරිටත් තිබුණේ දෙමව්පියන්ගේ ඒ ත්‍යාගශීලී කාරුණික හදවතමයි"

"ඔබට ස්තුතියි ස්ටුවට් මහත්මයා" හෝම්ස් කීවේ අසුනෙන් නැගිටිමිනි. "තව පැයකින් ශාෆ්ට්ස්බරි දුම්රියපොළෙන් ලන්ඩනය බලා පිටත්වෙන දුම්රියෙන් අපි ආපසු යනවා. මේ අපරාධය පිළිබඳ පරීක්ෂණ කටයුතු මං කොහොමටවත් නවත්වන්නේ නැහැ. අපට ලැබුණු හෝඩුවාවන් ඔස්සේ ඉදිරියට යන්න හැකිවේවි කියලා මගේ සෑහෙන විශ්වාසයක් තියෙනවා. අපේ ඉදිරිගමන ගැන ඔබට විදුලිපුවත් මගින් දන්වන්නම්."

"හෝම්ස් මහත්මයා" මේ වයෝවෘද්ධ සෙන්පතියා පැවසුවේ, සිය අසුනෙන් නැගිට හෝම්ස්ගේ අත්දෙකෙන්ම අල්ලා ගනිමිනි.

"ඔබ මේ පරීක්ෂණය විසඳලා ඒ සඳහා ඔබේ ගාස්තුව කියන්න. මං එය ඔබට ගෙවනවා. ඊට කලින් ඔබේ මූලික වියදම් සඳහා මුදලක් දෙන තුරු මොහොතක් ඉන්න........................"

"එපා මහත්මයා. ඔබට ස්තුතියි" හෝම්ස් පිළිතුරු දුන්නේය. "දැනට එවැනි කිසිවක් අවශ්‍ය නැහැ. සමහරවිට තව දින තුනකින් හෝ හතරකින් මම යළිත් මෙහේ එන්න ඉඩ තියෙනවා. ඔබට ආයුබෝවන්"

 http://sherlockholmesinvestigations.blogspot.com

කුලීරියකින් ශාෆ්ට්ස්බරි දක්වා පැමිණ, හැන්දෑයාමයේ ලන්ඩනය බලා පිටත්වෙන දුම්රිය අල්ලා ගැනීමට අපට හැකිවිය. දුම්රියට නැගුණු පසු ද මගේ මිත්‍රයා නිහඬව කල්පනා කරමින් සිටියා මිස කිසිවක් පැවසුවේ නැත. ඔහුගේ සිහිවිලි දමය බිඳීමට උත්සාහ නොකොට, මම දුම්රිය කවුළුවෙන් ඉවත බලාගෙන ගියෙමි.

"මගේ හිතවත් වොට්සන්" අන්තිමේදී හෝම්ස්ගේ කටට පණ ආවේ අප දුම්රියෙන් සැතපුම් විසිපහක් තිහක් ගමන්කළ පසුවය.

"මගේ දීර්ඝ නිහඬතාවය ගැන මට සමාවෙන්න. මං කල්පනා කළේ මේකයි. අපට ඉතාම වැදගත්, ඉතාම වටිනා හෝඩුවාවන් එකක් හෝ දෙකක් ලැබුණු බව ඇත්ත. නමුත් අපරාධකාරයා හොයාගැනීම බොහොම අමාරුවෙන බව මට ඉවෙන් වාගේ හැඟෙනවා. ඒක බාගවෙලාවට පිදුරු ගොඩක වැටුණු ඉඳිකටුවක් හෙවීම වගේ අමාරුවේවි"

"ඇයි ඔබ එහෙම කියන්නෙ?"

"මේරි ස්ටුවර්ට් මහත්මිය මරාදමන්න කිසිකෙනෙකුට උවමනාවක් තිබුණා කියල හිතන්න අමාරුයි" හෝම්ස් කීය. "ඒ මොකද අපට අහන්න ලැබුණු සාක්ෂිවල හැටියට, ඇය ඒ තරම් ගුණ යහපත් කාන්තාවක්. නිර්ලෝභීව අනෙක් අයට මුදල් පරිත්‍යාග කළ තැනැත්තියක්. ඒ වගේ කෙනෙකුට වෙඩිතබනවා තියා පහරදෙන්නවත් කාටවත් හිතේවිද? ඒ පුද්ගලයා නම් ගමේ කෙනෙක් වෙන්න බැහැ. පැහැදිලිවම පිට ගමකින් ආව කෙනෙක්. ඔහු පලායෑමට යොදගත් මාර්ගයෙන්ම ඒ බව ඔප්පු වෙනවා. නමුත් ඇයි ඔහු මේ අපරාධය කළේ? ඇය වයසක කාන්තාවක්. වෙනත් ප්‍රේම සම්බන්ධයක් තිබුණා කියලා අපට හිතන්න බැහැ. නමුත්................ නමුත්............ මේ අපරාධකාරයා ඇය බලාපොරොත්තුවෙන් සෑහෙන තරම් වෙලාවක් අර පඳුරට වෙලා හැංගිලා බලාගෙන ඉඳල තියෙනවා"

"ඔබ කොහොමද දන්නෙ?" මම ඇසීමි.

"මට එතැන තිබිල සිගරට් කොට හතරක් හමුවුණා. ඒ කියන්නේ ඔහු සෑහෙන වෙලාවක් පැයක් නැත්නම් ඊටත් වැඩිය හරි එතැන රැඳී ඉඳල තියෙනවා. ඒකෙන් අපට තේරුම් ගන්න පුළුවන් පැහැදිලි කරුණක් තියෙනවා"

http://sherlockholmesinvestigations.blogspot.com

"ඒ මොකක්ද?"

"උද්‍යාන කුටියේ කාමරවල ඉබියතුරු කඩා බිඳ දමලා බඩු හොරකම් කරන්න ආව කෙනෙක්, මේ තරම් වෙලාවක් එතැන රැඳී ඉන්න උවමනාවක් නැහැ. හැකි ඉක්මනින් තමන් ආව කාරිය ඉවරකරගෙන පිටවී යනවා මිසක. එහෙම නේද?"

"ඔව්"

"එතැන කොළ අතු කඩාදමීමෙන් සහ බිම තිබූ කුඩා පැළෑටි පොඩිවී ගිය ආකාරයෙනුත් අපට කියන්න පුළුවනි, ඔහු හුගක් වෙලා රැඳී හිටි බව. එතැන ඉන්න ගමන් ඔහු කිහිපවාරයක්ම නැගිට ගිහින් බලල තිබුණා, ඇය ඇවිත්ද කියලා."

"එහෙමත් නැත්නම් ඇය කුටියෙන් පිටවෙලා ගියාද කියලා?" මම ඇසීමි.

"ඔව් වොට්සන්. එහෙම වෙන්නත් පුළුවනි." හෝම්ස් කීය. "මගේ විශ්වාසය නම් ඔහු ඇය එනතුරු බලා ඉඳල තියෙනවා.

ඇය එළියට යද්දී නිතරම, වටිනා මුදු පළඳින බව, මුදල් පසුම්බියක් රැගෙන යන බව ඔහු දැනහිටියා වගෙයි මට නම් පෙනෙන්නේ"

"ඔහුට ඔහුගේ කබාය අමතකවුණේ කොහොමද?"

"ඒකෙ නම් ඒ තරම් ගැටලුවක් නෑ" හෝම්ස් කීය. "මේක ග්‍රීෂ්ම ඍතුවේ උච්ඡතම කාලය. මේ පළාතට මාස දෙක තුනකින් වැහැලා නැහැ. නමුත් දින කිහිපයක් තිස්සේම අහස කළුකර වැහිවලා පාවෙමින් තිබුණු බව හෝක් කීවා. ගේ ඇතුළෙ ඉන්න කෙනෙකුට වුණත් මේ දිනවල අධික වශයෙන් ඩහදිය දමනවා. නමුත් එළිමහනේ, පඳුරක් යට ඉන්න කෙනෙකුට මේ ග්‍රීෂ්මය ඉවසන්න බැහැ. විශේෂයෙන්ම ඔහු හිටි තැනට සුළං පාරක්වත් එන්නෙ නෑ. අනික අපි අමතක කරන්න තරකයි තවත් දෙයක්. ඔහු අර ඉයෝවිල් පාරෙන් බැහැලා හැතැක්ම දෙකක් හෝ දෙකහමාරක දුරක් පයින්ම ආවා, ඉරමුදුන්වුණු වෙලාවෙ. විශේෂයෙන්ම කුඹුරුයාය මැදින් ආව හැතැක්මට කිට්ටු දුර ඔහු එන්න ඇත්තේ ගිනි අව්වේ පිළිස්සෙමින්. ශරීරයෙන් ඩහදිය වැගිරෙද්දී ඔහු කබාය ගලවලා පසෙකට දමන්න ඇති, පසුව ඇඳගන්න බලාපොරොත්තුවෙන්. නමුත් ඇයට වෙඩිතැබීම නිසා ඔහු පැනගියේ කලබලයෙන්. ඒ කලබලේට කබාය අමතක වුණා. අපරාධය නොකර ආපහු ගියා

http://sherlockholmesinvestigations.blogspot.com

නම් ඔහුට කබාය මතක් වෙන්නත් ඉඩ තිබුණා. පොලිස් බල්ලන් නොහිටින්න අපිවත් ඒක දකින්නෙ නැහැ."

"මේ වගේ අපරාධකාරයෙක් අමග ස්ටුවට් මහත්මිය වැනි කාන්තාවකගේ ගනුදෙනුවක් තිබුණා කියලා හිතන්න අමාරුයි නේද හෝම්ස්?"

"අන්න ඒක තමා මට තේරුම් ගන්න බැරි ලොකුම ගැටලුව" හෝම්ස් කීය. "නමුත් මට ඉවෙන් වාගේ තේරෙනවා සත්‍යය එයයි කියල. බාගවෙලාවට අපට නොපෙනෙන කුමක් හරි කරුණක්. ඇය භයකරලා කප්පම් ගැනීමක්? මොකක්ද මෙතැන තිබෙන අපට අහුනොවන සියුම් ගැටය?"

මේ වනවිට දුම්රිය අප බැසිය යුතු දුම්රියපොළට ළඟාවූයෙන් අපේ කථාව එතැනින් නැවතිණ. බේකර් වීථියේ නිවහනට ළඟාවෙද්දී අප සිටියේ දැඩි විඩාවකට පත්වය. රාත්‍රී ආහාරය කල් තබා එවන ලෙස හඩ්සන් මහත්මියට දන්වා අපි ස්නානය කිරීමට සූදානම් වුණෙමු. අධික උණුසුම නිසා රාත්‍රියේ නිදාගැනීම පවා අපහසු වන ලකුණු පෙනිණි. මා ස්නානය අවසන්කොට ඇවිත් කෑම මේසයට වාඩිවුවත්, මගේ මිත්‍රයා තවමත් සිටියේ යම්කිසිවක් පරීක්ෂා කරමිනි.

"ඔබ නාන්න යන්නෙ නැද්ද හෝම්ස්?" මම ඇසීමි. "ලන්ඩනයේ තිබෙන මේ උණුසුමෙන් බේරෙන්න දවසකට දෙසැරයක් වත් නාන්න වේවි."

මා එසේ කීවත්, එය මගේ මිත්‍රයාගේ සවනට වැටුණු බවක් වත් නොපෙනිණ. ඔහු තම අන්වීක්ෂය ළංකරගෙන යමක් පරීක්ෂා කරමින් සිටියේය. මම එතැනට ළංවී බැලීමි. මගේ මිත්‍රයා පරීක්ෂා කරමින් සිටියේ උදේ වරුවේ ඔහු අහුලා ගත් සිගරට් කොට කිහිපයයි. ඔහුගේ කටයුත්තට බාධා නොකොට මම නිහඬව බලා සිටියෙමි. මා සමග වචනයක් හෝ කථා නොකොට, දැඩි අවධානයකින් ඔහු ඒ කටයුත්තේ යෙදුණේය. හෝම්ස් අසුනෙන් නැගිට්ටේ තවත් පැය කාලකට පමණ පසුවය.

"හරි" ඔහු කීය. "අපට අඩියක් දෙකක් ඉදිරියට තියන්න පුළුවන් කරුණු කිහිපයක් මං හොයාගත්තා. ආරම්භයක් හැටියට ඒකත් නරක නෑ."

"මොනවද ඔබ හොයාගත්තේ?" මම ඇසීමි.

http://sherlockholmesinvestigations.blogspot.com

"ප්‍රමාද වුණා නේද වොට්සන්?" ඔහු ඇසුවේ ඔරලෝසුව වෙත නෙත් යොමුකරමිනි. "මං නාගෙන එන්නම්. ඒ ඇවිත් කෑමකන ගමන් කතාකරමු. ඒ අතරේ ඔබ බලන්න, ඔබට ඔය සිගරට් කොටවලින් හොයාගන්න පුළුවන් මොනවද කියල"

මගේ මිත්‍රයා අසුනෙන් නැගිට යද්දී මම ඒ අසුනේ හිඳගත්තෙමි. සිගරට් කොට තුනක් එතූ කඩදාසිය මත ඒවායේ වර්ගය මුද්‍රිතව තිබූ අතර අනෙකේ එවැන්නක් සඳහන් නොවීය. ඒ හැරෙන්නට වෙනත් කිසිවක් සොයාගන්නට මම අපොහොසත් වීමි. හෝම්ස් නානකාමරයෙන් එළියට ආවේ තවත් පැය භාගයකට පමණ පසුවය. කෑම මේසයට වාඩිවූ ගමන්ම ඔහු තමාගේ පළමුවැනි ප්‍රශ්නය ඉදිරිපත් කළේය.

"මොනවද වොට්සන් ඔබට හොයාගන්න හැකිවුණේ?"

මා සොයාගත් දේ පිළිබඳව ඔහුට පැවසුවෙමි.

"එපමණද?"

"ඔව්"

"එයින් ඔබට ගතහැකිවූ නිගමන මොනවාද?"

"ඔහු අධික වශයෙන් දුම්පානය කරන්නෙක්. ඒ හැරෙන්න වෙන මොකුත් නෑ."

"මගේ හිතවත් මිත්‍රයා" ඔහු කීය. "මේකෙන් අපට ඊට වඩා දුර යා හැකියි. දැන් බලන්න මේ සිගරට් කොට හතර, වර්ග හතරක ඒවා. එකක් ඇමරිකාවේ නිෂ්පාදනය කරන "රිපබ්ලික්" නම් වර්ගය. එකක් ඕලන්දයේ හදන "ඩිජොං" නම් වර්ගය. තවත් එකක් දකුණු අප්‍රිකාවේ හදන "රැන්ඩ්" නම් වර්ගය. අනෙක් සිගරට් කොටයේ කිසිම සඳහනක් නැහැ. ඒක වෙනත් කුමන හෝ රටක නිෂ්පාදනය කළ එකක්. මෙම කාරණයෙන් ඔබට තේරුම්ගන්න පුළුවන් මොකක්ද?"

මම පිළිතුරක් නොදී නිහඬව සිටියෙමි.

"සාමාන්‍යයෙන් ඕනෑම දුම්බොන්නෙක් ඔහුට හුරුපුරුදු එකම සිගරට් වර්ගයක් තමා පාවිච්චි කරන්නේ" හෝම්ස් කීය. "නමුත් පිට තැනකදී තමන්ට පුරුදු වර්ගය නැත්නම් හෝ තවත් කෙනෙක් පිළිගැන්වූ විටක වෙනත් වර්ගයක සිගරට්ටුවක් පාවිච්චි කරන්න පිළිවන්. නමුත් අතමිට හිඟ, දුම්බීමට කෑදර අය අතර මේ ප්‍රතිපත්තිය නෑ. ඔවුන් ඕනෑම වර්ගයක සිගරට් උරන්න සූදානම්. මොහුත් ඒ වගේ කෙනෙක්. නමුත් ඔහුට කොයින්ද මේ වගේ විවිධ

 http://sherlockholmesinvestigations.blogspot.com

වර්ගවල සිගරට්? මේවා එකක්වත් එංගලන්තයේ මිලට ගන්න ඇත්තෙ නැහැ. එහෙනම් කොහොමද ඔහුට ලැබුණේ? ඔබට හිතන්න පුළුවන්ද?"

"මට හිතාගන්න අමාරුයි" මම කීවෙමි.

"මොහු නිසැකවම වරායේ රැකියාව කරන කෙනෙක්." හෝම්ස් කීය. "එහෙම අයට තමා නිතරම නැව්වලින් ගොඩබහින විදේශිකයන් හමුවන්නේ. බඩු ඉඟාඩ බෑමේ කටයුතුවලදී වරායේ සේවකයන් මිතුරුකර ගැනීමටත්, ඔවුනට නොමිලේ සිගරට් ලැබෙනවා නාවිකයන්ගෙන්. ඊට අමතරව සංචාරකයන්ගෙන්, විදේශිකයන්ගෙන් කරදර කරලා හෝ සිගරට් ලබා ගැනීම වරාය සේවකයන්ගේ පුරුද්දක්. ඔබට තේරුණාද?"

"ඔව්"

"අපට පුළුවනි තවත් කරුණු හොයාගන්න මේවායින්" හෝම්ස් කීවේ සිගරට් කොට දෙසට ඇඟිල්ල දිගුකරමිනි. "ඔබ දකින්න ඇති එක් සිගරට් කොටයක කඩදාසියේ, එහි නම මුද්‍රණය කර නොමැති බව. මං එය මගේ අණ්වීක්ෂයෙන් පරීක්ෂා කළා. ඒකෙ ඉතාම කුඩාවට තියෙනවා චීන හෝ ජපන් අකුරු හතරක්. මේකෙන් අපට හිතාගන්න අමාරු නැහැ මේවා චීනය හෝ ජපානය වැනි ඈත පෙරදිග රටක නිෂ්පාදනය කර ඇති බව. මේවා යුරෝපීය රටක හෝ ඇමරිකාවේ වත් මිලට ගන්න නැහැ. ඒ නිසා නිසැකවම ඈත පෙරදිග රටකින් එංගලන්තයට ආ නැවක නාවිකයෙකුගෙන් ලබාගත් සිගරට්ටුවක්. මේකෙ නොදැවුණු කොටසේ ඇති දුම්කොළ ස්වල්පයක් පොඩිකරලා මං ආඝ්‍රාණය කර බැලුවා. එහි තිබෙනවා ශාකමය විලවුන් සුවඳක්. දුම්කොළ, අළු හා දුම්වැටි ගැන මා ලියූ පොත් පිංච කියෙව්වොත් ඔබට පෙනේවි මේ කරුණු ගැන මා කර ඇති සඳහන. චීනයේ නිෂ්පාදනය කරන දුම්වැටි සමහර වර්ගවලට ඔවුන් ස්වල්ප වශයෙන් අබිං මිශ්‍ර කරනවා. එවැනි සිගරට්වලට එක්තරා පලතුරු සුවඳක් කවලයි තියෙන්නේ. ඒ නිසා මට සහතික වෙන්න පුළුවන් මේක චීනයෙන් ආ නැවකින් ලැබුණු එකක් බව"

"වෙන මොනවද?"

"නැව් ගමනාගමනය පිළිබඳ ඔබගේ දැනුම මෙහිදී ප්‍රයෝජනවත් වෙනවා වොට්සන්. පැසිෆික් සාගරය හරහා යාත්‍රාකරන චීන ජපන් නැව් සියයට අනූවක්ම යාත්‍රා කරන්නේ ෂැංහයි හෝ යොකෝහාමා

http://sherlockholmesinvestigations.blogspot.com

සිට සැන්ෆ්‍රැන්සිස්කෝ දක්වා පමණයි. නමුත් නැව් ඉතාම සීමිත සංඛ්‍යාවක් යුරෝපයට එනවා. අත්ලාන්තික් සාගරය හරහා එන ඔවුන් පුරුද්දක් ලෙස තෝරාගෙන තිබෙන්නේ සවුත්හැම්ටන් වරාය. අනෙක් වරායවලට නො එනවා නෙමෙයි. නමුත් එන්නේ ඉතාම කලාතුරකින්. මේ ගැන කරුණු ඔබට තවදුරටත් තහවුරු කරගන්න හැකිවේවි ලොයිඩ්ස් ආයතනයෙන්. ඒ කරුණේ ඇති වැදගත්කම ඔබට හිතාගන්න පුළුවන්ද වොට්සන්?"

"ඔව්" මම පිළිතුරු දුන්නෙමි. "සවුත්හැම්ටන් කියන්නේ අප ගිය සමර්සෙට් ප්‍රාන්තයට බොහොම කිට්ටු තැනක්. ශාෆ්ට්ස්බරි ඉඳලා පැය තුනක හෝ හතරක දුර. ඒ කියන්නේ අපරාධකාරයා සවුත් හැම්ටන් වරායට සම්බන්ධ කෙනෙක් විය හැකියි"

"විශිෂ්ටයි වොට්සන්" හෝම්ස් කීවේ අතිශය ප්‍රීතියෙනි. "ඔබේ සැඟවී තිබෙන දක්ෂකම් ඔය එන්නේ එළියට. දැන් ඉතින් අපට තියෙන්නේ කාරණා එකින් එක තෝරාගැනීම පමණයි.

මං ඔබට තවමත් කිව්වේ නැහැ. කුඹුරුයායේ මඩ සහිත පොළොවේ තිබ් අඩ දුටු සපත්තු අඩියෙන් හොයාගත් කරුණු. ඔබ දන්නවා මං ඔහුගේ උස අඩි හයක් පමණ විය යුතුයි කියා නිගමනය කළ හැටි?"

"ඔහුගේ පියවර දෙකක් අතර දුරෙන්. එහෙම නේද?" මම ඇසීමි.

"එකක් ඒක. අනෙක ඔහු වැටෙන් පැන්න තැන දුටු වහාම මට ඒක හිතුණා. හුඟක්ම උස පුද්ගලයෙකුට මිස උසින් අඩු අයෙකුට එවැනි තැනකින් පනින්න බැහැ.

ඊළඟට ඔහුගේ සපත්තුවල අඩිය සෑහෙන තරම් ගෙවී ගිහින්. මේ තරම් අබලන්වුණු සපත්තු කුට්ටමක් පාවිච්චි කිරීමෙන් අපට හිතාගන්න පුළුවන් ඔහු අතමිට හිඟ පුද්ගලයෙකු බව. අනෙක සපත්තු අඩියේ කට්ට රටාව අනුවත්, විළුඹේ හා පාඇඟිලිවලට කිට්ටුව සපත්තු අඩියට ගසා ඇති ලෝහ "ටිප්ස්"වලින් තවත් කරුණක් තහවුරු වෙනවා. ඔහු පළඳින්නේ බර උස්සන හෝ බරබඩු ප්‍රවාහනය කිරීමට සම්බන්ධ කම්කරුවන් පළඳින බූට්ස් සපත්තු කුට්ටමක් බව. ඔහු වරායේ සේවකයෙකු බව හිතන්න ඒක රුකුලක්"

"ඔබට තවමත් පරීක්ෂා කරන්න බැරිවුණු පැළඳුම් දෙකක් තියෙනවා නේද හෝම්ස්?" මම ඇසීමි. "මං හිතන්නේ ඒවා පරීක්ෂා කර අවසන් වෙද්දී ඔබට සෑහෙන තරම් ඉදිරියට යා හැකි වේවි"

 http://sherlockholmesinvestigations.blogspot.com

"ඔව් මගේ හිතවත් වොට්සන්" හෝම්ස් කීවේ රාත්‍රී ආහාරය අවසන් කරමිනි. "මං ඒ කටයුත්ත ඉතිරිකළා ඒ කෑම අවසන් කරලම පටන්ගන්න. ඔබ දන්නවාද මිත්‍රයා පුංචි ළමයෙකුට රසවත් කෑම ජාති කිහිපයක් එකවර ලැබුණාම කරන වැඩේ? ඔහු හුගාක්ම රසවත් කියල හිතන කෑම තියාගන්නෙ අන්තිමට කන්න. මාත් ඒ වගේ. මං හිතනවා අපරාධකාරයාගෙ කුබාය පරීක්ෂා කිරීම මට ඉතාම ප්‍රණීත ආහාරයක් වේවි කියල"

"මට සෑහෙන නිදිමතක් දනෙනවා" මම කීවෙමි. "ඒ වුණත් මට හිතයි ඔබ කබාය පරීක්ෂා කරන හැටි බලාගෙන ඉන්න"

"එපා වොට්සන්. ඒ වැඩේට හුගක් වෙලා ගතවේවි. මීළගට මං පරීක්ෂා කරන්නෙ හිස්වැස්ම. ඒකටත් පැයකට කිට්ටු කාලයක් යාවි. ඒ නිසා මං ඔබට අවවාද කරනවා වහාම නින්දට යන්න කියල. මගේ සොයාගැනීම් ගැන අපි හෙට උදේට සාකච්ඡා කරමු."

දින දෙකක් තිස්සේ කළ ගමන්බිමන් නිසා, මම අධික වෙහෙසකට පත්වී සිටියෙමි. මගේ මිත්‍රයාට නම් මහන්සියක් වත් නිදිමතක් වත් ඇති බවට ලකුණක් හෝ නුදුටුවෙමි. කෝපි පෝච්චියක් උඩු මහලට එවන මෙන් ඔහු හඩ්සන් මහත්මියගෙන් ඉල්ලීමක් කළේය. මීළගට තම පසිප්ප දුම්කොළ ගබඩාකර තිබූ පර්සියන් පාවහන ළගට ගත් ඔහු පිගත් මැටි පයිප්පයේ දැවී අවසන් වූ දුම්කොළ රොඩු ඉවත් කළේය. ඉන්පසු පිරිසිදු කර ගත් පයිප්පයට බිරැඩ්ලිගේ දුම්කොළ පුරවන ආකාරය නිදනකාමරයට යාමට පෙර මම දුටුවෙමි.

* * *

පසුවදා උදයේ මා අවදිවන විටත් හෝම්ස් නිවසේ නොසිටියේය. ඔහු උදයෙන්ම අවදි වී, උදේ ආහාරයට වත් නොරැඳී බැහැර ගිය බව හඩ්සන් මහත්මිය පැවසුවාය. ඔහු ආපසු ඒ යයි මම පැයක් පමණ වෙලා බලා සිටියෙමි. හෝම්ස් ආපසු නොපැමිණි නිසා මම උදේ ආහාරය තනිවම ගත්තෙමි. ඉන්පසු උදෑසන පුවත්පත කියවන්නට වීමි.

දහවල් එකොළහ පමණ වන විට මගේ මිත්‍රයා ආපසු පැමිණියේය. සැතපුම් ගණනාවක් පයින් ඇවිදගිය අයෙකු මෙන් හෝම්ස් විඩාපත්ව සිටි බැව් මම දුටුවෙමි.

http://sherlockholmesinvestigations.blogspot.com

"ආ............ වොට්සන්" මා දුටු විගසම ඔහුට කියැවිණි. "ඔබට උදේ ඇහැරුණාම බලන්න ඇති මට මොකක්ද වුණේ කියල. මං උදෙන්ම ස්කොට්ලන්ඩ්යාඩ් එකට ගියා. ඒ ගමන්ම තවත් වැඩකටයුතු රාශියකට ගියා. වෙලාව එතකොලහයි නේද? මෙච්චර දවල්වුණු බවක් මට දැනුණෙවත් නෑ" සීනුව නාද කළ ඔහු සේවක ළමයා කැඳවා තේ කෝප්පයක් ගෙන එන මෙන් නියම කළේය.

"ඊයෙ රෑ මං නින්දට යනකොට හුගක් රෑ වුණා." ඔහු කථාව පටන් ගත්තේ තේ කෝප්පය හිස් කිරීමෙන් අනතුරුවය. "ඔබ දන්නවා නේ. අපරාධයකට අදාළ යම් භාණ්ඩයක් හොයාගන්න ලැබුණාම, මට නින්ද නොයන විග. මට වුණේ ඒකයි. අපි මුලින්ම බලමු අර "බෙරේ" එක ගැන."

මෙසේ කී හෝම්ස් අසුනෙන් නැගිට ගොස් මේසය මත වූ මෘදු හිස්වැස්ම රැගෙන විත් මා අතට දුන්නේය. "හොඳයි. ගන්න කුඩා දේ විශාල කර බලන උත්තල කාචය. බලන්න ඔබට මේකෙන් හොයාගන්න පුළුවන් මොනවද කියල"

මම මිනිත්තු දහයක් පමණ එය හොඳින් පරීක්ෂා කළෙමි. එහෙත් ඔහු සිතන ආකාරයේ, අපරාධකාරයාට සම්බන්ධ යමක් දකීමට මම අපොහොසත් වීමි.

"මේක කැලෑවල සටන්කරන හමුදා භටයින් පළඳින වර්ගයේ හිස් වැස්මක්" මම කීවෙමි. "බාගවෙලාවට ඔහුත් හිටපු හමුද භටයෙක් වෙන්න පුළුවනි. ඔන්න එතකොට මට මතක්වෙනවා ස්ටුවර්ට් මහතා රැකියාවෙන් පහකළ ලිට්ල්ජෝන් නම් ඉස්තාල සේවකයා ගැන. ඔහුත් හමුදවෙන් නෙරපූ කෙනෙක් බව කිව්වා මට මතකයි. මේකෙ කොළ පාට විල්ලූද රෙද්ද හොඳටම නරක් වෙලා. ඒකෙන් කියන්නේ ඔහුගේ නොසැලකිලිමත් බව. මෙය නිෂ්පාදනය කළේ කුමන රටක ද යන ලේබලය කැඩී ගිහින්. ඒ නිසා මට වෙන මොකුත් හිතාගන්න බැහැ" කී මම හිස්වැස්ම හෝම්ස් අතට ආපසු දුන්නෙමි.

"මේක ගැන ඔබට මොනවද හිතෙනන්නේ?" කී හෝම්ස් අපරාධකාරයා කැලෑමෙරාදේ දමා ගොස් තිබූ කබාය මා අතට දුන්නේය.

දුඹුරු පැහැති කුඩා කොටු සහිත ට්වීඩ් රෙද්දකින් මසා තිබූ එය, එතරම් කිළිටි වූ එකක් නොවිය. එහෙත් එහි තැනක් දෙකක් ඉරී ගොස් තිබිණි. එහි ඇතුළත සාක්කු පරීක්ෂා කර බැලීමේදී මට

http://sherlockholmesinvestigations.blogspot.com

දුම්රිය ටිකට්පතක අඩක් හමු විය. ඒ සවුත්හැම්ටන් සිට ශාෆ්ට්ස්බරි දක්වා යෑමට හා ආපසු ඒමට අගෝස්තු 24 වැනිද නිකුත් කළ ටිකට් පතකි. එක් පසෙකට ගමන අවසන් කර තිබූ බැවින් ටිකට් පතේ ඉතිරිව තිබුණේ අඩක් පමණි. මීට අමතරව කිළිටි වූ ලේන්සුවක්, මුවහත් දුනුපිහියක්, අඩක් හිස් වූ ගිනි පෙට්ටියක්, පොඩි වී ගිය සිගරට් දෙකක් සහ ඉතාමත් කලාතුරකින් දැකිය හැකි දෙයක් විය. එනම් කිසිවෙකුගේ බොරුදත් කිහිපයකි. එම කෘතිම දත්, උඩු ඇන්දේ ඉදිරිපසම දත්හතර බව මට හඳුනාගත හැකිවිය. දුම්කොළ කහට නිසා දුඹුරු පැහැයට හුරු කළු පැහැයට හැරී තිබූ මෙය බොහෝ දුරට ගෙවී ගොස් තිබිණි. දකින්නට ලැබුණු දේවල් ගැන මම මගේ මිත්‍රයාට පැවසුවෙමි.

"ඔබේ නිරීක්ෂණයන් හැහෙන තරම් සතුටුදයකයි වොට්සන්" ඔහු කීය. "නමුත් වැදගත් කාරණා කිහිපයක්ම ඔබට මගහැරිල තියෙනවා. බලන්න හිස්වැස්මේ ඇතුළ පැත්ත. ඒක අපට ඉතාම වැදගත්. ඒක උත්තල කාචයෙන් පරීක්ෂා කළොත් ඔබට පෙනේවි එහි ඇලී ඇති හිසකෙස් ගස් හතක් හෝ අටක්. මේ බලන්න" කී ඔහු කුඩා දේ අල්ලන අඬුවෙන් කෙස්ගස් කිහිපයක් ගෙන ඒවා සුදුකඩදාසියක් මත තැබීය. "මේකට හොඳට ආලෝකය වැටීමට සලස්වා පරීක්ෂා කළ යුතුයි. වඩාත්ම හොඳයි අන්වීක්ෂයෙන් බැලුවොත්. ඔබට දැකගන්න ලැබේවි මේවා අයත් පුද්ගලයාගේ කෙස් කළඹේ තොරතුරු. ඒ මොනවද? ඔහු තද දුඹුරු පැහැති කෙස් ඇති කෙනෙක්. ඒ කෙස් අක්බමරු - ඒ කියන්නේ "කේ‍්‍රල්" වුණු කෙස්. කෙස් ගස් හතෙන් දෙකක් පමණ යන්තමින් පැසිලා. එතකොට අපට හිතේ මවාගත හැක්කේ මොන වගේ කෙනෙක් ද? හිසේ තැනින් තැන පැසුණු, දුඹුරු පැහැති අක්බමරු හිසකෙස් තිබෙන කෙනෙක්."

"එයින් ඔබ අදහස් කරන්නේ ඔහු තරමක් වයස්ගත කෙනෙක් කියලද?"

"සාමාන්‍යයෙන් මා කර ඇති නිරීක්ෂණවල හැටියට මේ ප්‍රමාණයට කෙස් පැසුණු කෙනෙකු වයස අවුරුදු 40 - 50 අතර විය යුතුයි." හෝම්ස් කීය. "නමුත් එහෙම නිශ්චිත තීරණයකට එන්න බැරි බව ඔබ වෛද්‍යවරයෙක් හැටියට දන්නවා ඇති. සමහර අයගේ කෙස් ලෙඩ රෝග නිසා අකාලයේ පැහෙනවා. සමහරවිට

http://sherlockholmesinvestigations.blogspot.com

ආරෙටත් ඉක්මනින් පැෂෙනවා. වොට්සන් ඔබ කිව්වා මොහු හමුද සේවයේ යෙදී හිටි කෙනෙක් විය හැකියි කියලා. එහෙම නේද?"

"ඔව්. ඇයි ඒක වැරදිද?"

"මං එහෙම හිතන්නේ නැහැ" හෝම්ස් කීය. "මේ වර්ගයේ හමුද හිස්වැසුම්වල ඇතුළේ අදාළ සේනාංකයේ හෝ බලකායේ නම සඳහන් ලේබලයක් තියෙනවා. නමුත් මේකෙ එහෙම එකක් නැහැ. ඉතා හොඳින් බැලුවොත් ඔබට පෙනේවි මුවහත් කතුරකින් එම ලේබලය මසා තිබූ තැනින් කපා ඉවත්කර ඇති බව. බොහොම වෙලාවට ඒ වගේ දෙයක් කරන්නෙ, හමුදාවට අයත් පරණ වූ බඩුභාණ්ඩ ඉවත් කිරීම සඳහා වෙළඳුන්ට විකුණා දැමීමේදී. අප සොයන පුද්ගලයා බොහොම වෙලාවට මේක මිලට ගන්න ඇත්තේ පරණ ඇඳුම් විකුණන වෙළඳ සලකින්. මේක තවදුරටත් කාචයකින් පරීක්ෂා කළොත් ඔබට පෙනේවි, මෙහි තියෙනවා වර්ණ තුනක හෝ හතරක ඉතාම කුඩා රවුම් තිත් වගයක්. ඒවා විසිරිලා තියෙන්නෙත් අනුමවත්ව. බලන්න ඔබට පෙනෙනවාද කියලා"

මම ඔහු කියූ තැන් දෙස පරීක්ෂාවෙන් බැලීමි.

"ඔව් තියෙනවා තේන්නම්. මං හිතුනේ තීන්ත බින්දු වගයක්. ඒත් ඒවා අඩි හයක් උස පුද්ගලයෙකුගේ හිස්වැස්ම උඩට වැටුණේ කොහොමද? ඒක මට හිතාගන්න අමාරුයි"

"ඔබේ නිරීක්ෂණය හරි" හෝම්ස් කීය. "ඒවා තීන්ත බින්දු තමයි. ඒවා වැටෙන්න ඇත්තේ තීන්ත ගාන බුරුසුවකින් තීන්ත ආලේප කරද්දී. ඒ කියන්නේ ඔහුගේ හිසේ මට්ටමටත් ඉහළ තැනක ආලේප කරද්දී. රැකියාවෙන් ඔහු තීන්ත ආලේප කරන්නෙක් වුණත් වියහැකියි. නමුත් අප දන්නවා ඔහු සම්බන්ධ වරායට බව. මුහුදු වතුරෙන් වෙන බාදනය වැළැක්වීමට සමුද්‍ර යාත්‍රාවල නිතර නිතර තීන්ත ආලේප කරනවා. මේ පුද්ගලයා එම රැකියාවේත් යෙදී ඇති බවයි පෙනෙන්නේ. බාගවෙලාවට තීන්ත ආලේප කළේ ඔහුගේ නිවසේ වෙන්නත් පුළුවනි.

කලින් කී ඒවාට අමතරව හිස්වැස්මේ ෆෙල්ට් රෙද්ද තැන් හතරක් පමණ ඉරී පළුදු වී ගොස් තිබෙනවා. මේක හරියටම කුමක් නිසා සිදුවුණාද කියල කියන්න අමාරුයි. නමුත් මං විශ්වාස කරන්නේ කැලෑවේ පඳුරු යටින් රිංගලා ගමන් කරද්දී සිදුවූ ඒවා කියල. ඒ කියන්නේ මොහු මීට කලිනුත් කැලේ රිංගපු කෙනෙක්."

 http://sherlockholmesinvestigations.blogspot.com

"මොනවද ඔබට ක්බායෙන් සොයාගන්න හැකිවුණේ?" මම ඇසීමි.

"හුගක් පාවිච්චි කළ පිරිසිදු නොකළ කබායක් කියන්නේ හෝඩුවාවන් ආකරයක්" හෝම්ස් කීවේ පයිප්පය මුවේ රඳවාගෙන දල්වා ගනිමිනි. "නමුත් අවාසනාවකට වගේ මේක මෑතකදී පිරිසිදු කරල තියෙනවා. මං කබාය ගැන දෙවනුව කියන්නම්. මුලින් කෘත්‍රිම දත්ගැන. ඔබ අර දුම්රිය ටිකට් පතේ දුටුවා වගේ ඔහු සවුත්හැම්ටන් නගරයට සම්බන්ධයි.

ඊළඟට මේ කෘතිම දත් හතර. ඒක ඉතාම අපිරිසිදු නිසා ඔබ වැඩිය අල්ලා බැලුවේ නැහැ. ඇයි මේ පුද්ගලයා මේක කටේ තියාගන්නේ නැතුව එය කබා සාක්කුවේ දමාගත්තේ? බලන්න වොට්සන් මේක දෙපැත්තේ පිටුපසින් .තිබෙනවා ලෝහ කම්බි කැබලි දෙකක්. සැකයක් නෑ කලින් මේවා කුම්බිවලින් හැදූ කොකු දෙකක්. ඒවා තිබෙන්න ඇත්තේ ඔහුගේ හක්කේ තිබෙන ශක්තිමත් දත්දෙකකට කෘතිම දත් හිරවෙන්න. නමුත් කොකු දෙක කැඩී ගිහින් නිසා කෘතිම දත් පහසුවෙන් පහළට මැටෙනවා ඇති. ඔහුට අලුතෙන් කෘතිම දත් සකස් කරවා ගන්න උවමනාවක් තිබිල නැහැ. එක්කො මුදල් නැතිකම නිසා........... නැත්නම් තවත් කැඩී ගිය දත් තිබෙන නිසා. අලුත් එකක් සාදවා ගැනීම කල්දැමුවා වෙන්නත් පුළුවනි.

දැන් බලන්න වොට්සන් මේ කෘතිම දත්වලින් අපට ලබාගතහැකි වැදගත්ම හෝඩුවාව. මේකෙ තල්ලේ බැඳී ඇති දුම්කොළ කාරම, තනුක හයිඩ්රොක්ලෝරික් අම්ලය බින්දුවක් දමා සෝද බලමු. ඔන්න කහට තට්ටුව දියවී ගිහින් වල්කනයිට් තල්ලේ රෝස පැහැය මතුවෙනවා. දැන් මොකක්ද ඔබට පෙනෙන්නේ?"

"ඉංග්‍රීසි අකුරු තුනක් නේද?"

"ඔව් ROH යන අකුරු" හෝම්ස් කීය.

"එපමණක් නොවෙයි ලාංඡනයක් අහ අංකයකුත් තිබෙනවා. අංකය 071086. ඊළඟට ලාංඡනිය ත්‍රිකෝණයක් තුළ යෙදූ W.G අකුරු. මේකෙන් මොකක්ද ඔබට හිතන්න පුළුවන්?"

"බාගවෙලාවට ඔහුගේ නාමේ මුලඅකුරු?""

"නැහැ" හෝම්ස් කීය. "මං මේ උදේම ගිහින් ආවේ. දන්ත ශල්‍ය වෛද්‍ය ඔස්බෝන් හමුවෙන්න. ඔහු මට කිව්වා රෝගීන්ගේ කෘතිම

http://sherlockholmesinvestigations.blogspot.com

දත් නිෂ්පාදනය කිරීමේදී ඉතාමත් වැදගත් කටයුතු කිහිපයක් ගැන. කෘතිම දත් සෑදීමේ කාර්මික කොටස කරන්නේ දන්ත කාර්මිකයෙකු විසින්. ඔහුට දන්ත වෛද්‍යවරු කිහිපදෙනෙකුගෙන් ඇණවුම් ලැබෙනවා. වල්කනයිට් තල්ල තුළට කැපූ ත්‍රිකෝණයක් තුළ ඇති අකුරුවලින් කියන්නේ දන්ත වෛද්‍යවරයාගේ නමේ මුල අකුරු. ඊළඟට අංකය. 071086 කියන්නේ 07 ද දිනය; 10 වැනි මාසය; '86 අවුරුද්ද; මේක දන්ත වෛද්‍යවරයා ලියා එවන අංකයක්ලු. ROH කියන්නේ රෝගියාගේ නමේ මුල අකුරු. රෝගීන් පසු කාලවලදී කෘතිම දත් අකාලයේ කැඩිබිඳී ගිය බවට කරන පැමිණිලි නිසා, සෑදූ දිනය එහි සටහන් කර තැබීම වැදගත් වෙනවලු.

"එහෙම නම් ඔබේ කටයුත්ත ඉතාම පහසුවේවි. එහෙම නේද හෝම්ස්?"

"අවාසනාවකට වගේ පසුව කී අත්තවලින් ප්‍රයෝජනයක් ගැනීම ඒ තරම් පහසුවෙන්නෙ නෑ වොට්සන්" ඔහු කීය. W. G කියන නමේ මුල්අකුරු තිබෙන වෛද්‍යවරයා එංගලන්තයේ කොහේ ඉන්නවද කියල අපි කොහොමද දන්නෙ? නැත්නම් සමහරවිට මේක පිටරටකදී සෑදූ එකක් වෙන්නත් පිළිවන්. නමුත් ROH කියන්නේ අපරාධකාරයාගේ නමේ මුල්කුරු කියල මට විශ්වාසයි. ඒක නම් බොහොම ප්‍රයෝජනවත් වෙනවා"

"වෙන මොනවද ඔබ හොයාගත්තේ?"

"වොට්සන්. ඔබ කබාය පරීක්ෂා කළ ආකාරයට නොවෙයි, මං එය පරීක්ෂා කළේ"

"එහෙනම්?"

"ඔබ මුලින් බැලුවේ කබායේ පිටපැත්ත. නමුත් මා කරන්නේ මුලින්ම කබාය නොපිටට හරවනවා." කී ඔහු කබාය නොපිටට හැරෙව්වේ කබා අත්දෙකද ඉවතට අදිමිනි.

"දැන් මොනවද ඔබට පෙනෙන්නේ?" ඔහු ඇසීය.

"කබායේ ඇතුළත කහපාට සිල්ක් රෙද්දෙන් "ලයිනිං" කර තිබෙනවා. ඒ හැරෙන්න වෙන මොකුත් මට නම් පෙනෙන්නේ නෑ"

"බැලූ බැල්මට නම් ඔබට පෙනෙන්නේ නැති බව ඇත්තයි" හෝම්ස් කීවේ පයිප්පය පසෙකින් තබා කාචය අතට ගනිමිනි."

 http://sherlockholmesinvestigations.blogspot.com

"මේ වගේ ඇඳුමක් හමුවුණොම අප මුලින්ම බැලිය යුතු දෙය තමයි එය මැසූ ස්ථානය - ටේලර්වරු කවුද කියන එක. ඇතුළු සාක්කුව අසල පැහැදිලිවම පේන්න එම්බ්‍රොයිඩර් කළ ලේබලයක් තිබෙනවා. මේ බලන්න.

වින්චෙස්ටර් ටේලර්ස්, අංක 445

ග්‍රේට් සමසෙට් වීථිය, සවුත්හැම්ටන්.

මේ කබාය මැහුවේ අප හොයන පුද්ගලයා වෙනුවෙන්ම නම්, බොහොම වෙලාවට ඔවුන් ළඟ මොහුගේ තොරතුරු තිබේවි. නමුත් මොහු මෙය මිලට ගන්නේ පරණ ඇඳුම් අලෙවිකරන තැනකින් නම් මේකෙන් පලක් නෑ.

ඇඳුමක බැලිය යුතු දෙවැනි දේ තමයි පිරිසිදු කරන්නාගේ ලකුණු - ලෝන්ඩ්‍රි ලකුණු යොදන්නේ කබා අතේ ඇතුළු පැත්තේ සේද රෙද්ද මත. ඔබට බැලුවොත් ඉපනෙන්වි වම් කබා අතේ තිබෙනවා ලකුණත් සමග අංකයක් $ RO 40756 දැන් දකුණු කබා අත බලන්න."

මම එය පරීක්ෂා කර බැලීමි. එහි ලකුණු හා අංක දෙකක් විය.

@ NF 1823

@ NF 9790

"මට මේ මොකුත් තේරුම් ගන්න බැහැ හෝම්ස්" මා කීවේ මවිතයට පත්වය.

"ඔව් මිත්‍රයා. මේක ටිකක් තේරුම් ගන්න අමාරුයි" ඔහු කීවේ සිනාසෙමිනි. රෙදි පිරිසිදු කරන ලෝන්ඩ්‍රිවලින් යොදන ලකුණු මගින්, අපරාධවලට සම්බන්ධ අය හොයාගැනීම ඉතාම සිත් ඇදගන්නා ක්‍රමයක්.

එංගලන්තයේ ප්‍රධාන නගරවල රෙදි පිරිසිදු කිරීමේ ව්‍යාපාරය පවත්වාගෙන යන්නේ දකුණු ඉතාලියන් හා අයර්ලන්තයෙන් ආ සංක්‍රමණිකයන් විසින්. ලොන්ඩ්‍රි සියයට අනුවක්ම අයිති ඔවුනට. මං නිරීක්ෂණය කර තිබෙන දෙයක් තමයි අයිරිෂ් ලොන්ඩ්‍රිවල ඔවුන් මොකක් හෝ සංකේතයක් සමග අංකයක් යොදන්නේ නැහැ. ඔවුන් යොදන්නේ ඉලක්කම් හතක පමණ අංකයක්. මේ විදියට 45-18213. මේ 45 කියන්නේ ලොන්ඩ්‍රියේ අංකය. 18213 කියන්නේ ගනුදෙනුකරුවාට නිකුත් කළ රිසිට්පතේ අංකය. නමුත් ඉතාලි අයගේ ක්‍රමය මීට වෙනස්. ඔවුන් යොදන @ හෝ $ එක් එක්

http://sherlockholmesinvestigations.blogspot.com

ලොන්ඩ්‍රියට අයත් ලකුණු. ඊළඟම එන අකුරුදෙක ගනුදෙනුකරුවා අයත් ප්‍රදේශය. ඊට පසුව එන අංකය ඔහුගේ රිසිට්පතේ අංකය. ඔබට පැහැදිලි ද මං කියන දේ?"

"ඔව් පැහැදිලියි"

"හොඳයි. මං දැන් යන්නම් ඊළඟ කාරණයට" හෝම්ස් කීය. "ඔහු කබාය පිරිසිදු කරවාගෙන තියෙන්නේ ඉතාලි පිරිසිදු කරන්නට දීලා බව පැහැදිලියි. මුලින් එක් තැනක. පසුව දෙවරක්ම වෙනත් තැනක. සවුත්හැම්ටන් අසල පදිංචි කෙනෙක් නම් ඔහු යන්න ඇත්තේ ළඟම තැනකට කියල අපි උපකල්පනය කරමු. එහෙම වුණොත් අපට හොයන්න වෙනවා මේ ලකුණු තියෙන ලොන්ඩ්‍රි මොනවද කියල. නමුත් ප්‍රශ්නය තියෙන්නේ ඒ පුද්ගලයාගෙ නම. මොවුන් ලියාගෙන තිබෙද්ද කියන එකයි"

"ඔව් ඒකත් ඇත්තු" මම එකඟවූයෙමි.

"මං අද උදේ ස්කොට්ලන්ඩ්යාඩ් එකට ගියානෙ" හෝම්ස් කීවේ තම අසුන පාමුල තිබූ දුම්කොළ දමීමට යොදගත් පර්සියන් සෙරෙප්පුව ළංකර ගනිමිනි. "මං හොයල බැලුවා R. O. H කියන මුල්අකුරු ඇති අපරාධකාරයෙක් ගැන ඔවුන්ගේ ලිපිගොනුවල සටහන් වෙලා තියෙනවද කියලා. විශේෂයෙන්ම සවුත්හැම්ටන් පැත්තෙන්. නමුත් සාර්ථක ප්‍රතිඵල ලැබුණේ නැහැ. මං බලාපොරොත්තු වෙනවා දින කිහිපයකට සවුත්හැම්ටන් යන්න. ඔබ එනවද මා සමග යන්න?"

"සත්තකින්ම ඔව් හෝම්ස්" මම පිළිතුරු දුන්නෙමි. "ඇයි ඔබ එහේ නවතින්න හිතුවෙ? මේ වැඩේට දින කිහිපයක් ගතවේවිද?"

"මට හිතෙනවා එහෙම වේවි කියලා" මගේ මිත්‍රයා කීය. "වොට්සන් ඔබේ රිවෝල්වරයත් ගමන් මල්ලට දමාගන්න. අපි කටයුතු කරන්නේ බිහිසුණු මිනීමරුවෙක් එක්ක. ඒක ඔබට අමතක නැහැ නේද?"

අප දහවල් ආහාරය අවසන් කරද්දී කිසිවෙකු දොරට තට්ටුකරන හඬක් ඇසිණ.

"මං හිතන්නේ ඉන්වෙල් ජොන්සන්" කී හෝම්ස් අසුනෙන් නැගිට ගොස් දොර විවෘත කළේය.

"ආයුබෝවන් හෝම්ස් මහත්තයා" අමුත්තා කියනු ඇසිණ. "මං ඇතුළට එන්නද?"

 http://sherlockholmesinvestigations.blogspot.com

මින්වෙල් ජොන්සන් කලක් පාතාල ලෝකයේ නමගිය අපරාධකරුවෙක්ව සිටියේය. කිහිපවිටක් හිරදඬුවම් ද විඳ ඇති ඔහු හෝම්ස්ගේ උත්සාහය නිසා නිවැරදි මගට යොමුවිය. පාතාලලෝකයේ අපරාධකරුවන් සිතාසිටියේ මින්වෙල් ජොන්සන් තවමත් ඔවුන්ගේ අයෙකු කියා ය. නමුත් ඔහු ඇත්ත වශයෙන්ම කළේ අපරාධකරුවන් පිළිබඳ තොරතුරු පොලිසියට හා රහස් පරීක්ෂකයන් වෙත රහසින් සැපයීමය.

රටේ විවිධ තැන්වලින් හොරකම් කෙරෙන මැණික්, දියමන්ති හා රන් අබරණ අන්තිමට ආවේ ලන්ඩනයටයි. එම හොරබඩු මිලට ගෙන එංගලන්තයට එහා විදේශියකයනට විකුණන තැන් හතරකට නොඅඩු ගණනක් ගැන හෝම්ස් දැනසිටියේය. අවශ්‍ය වූ විට ඔවුන් ගනුදෙනු කළ හොරබඩු ගැන සොයාබැලීමට හෝම්ස්ට උදව්වූයේ මින්වෙල් ජොන්සන්ය.

විසිත්ත කාමරයට ආ ජොන්සන් අතේ තිබූ රෙදි හිස්වැස්මෙන් අපේ සෝපාවට පහර දුන්නේ එහි දූවිලි තිබූ නිසා නොව ඔහුගේ පුරුද්ද අනුවය.

"හෝම්ස් මහත්තයා" ඔහු කීය. "දන්න කියන හැමතැනකටම මං ගිහින් බැලුවා. ඔබ මට කිව් විදියේ දියමන්ති මුදු හෝ දියමන්ති ඒ එක තැනකටවත් ඇවිත් නැහැ. ඊයේ පෙරේදා ආව බඩු තිබුණේ දියමන්ති මාලයක් සහ නිල්මැණික් ඇල්លූ පෙන්ඩනයක් පමණයි"

"කොළපාට මරකත මැණිකක් ඇල්ලූ මුද්දක් ගැනත් මං ඔබට කිව්වා" හෝම්ස් මතක් කළේය.

"මට ඒක අමතක වුණේ නැහැ මහත්මයා" ජොන්සන් කීය. "කොළපාට ගල් ඇල්ලූ ආභරණයක් මාස ගණනකින් ඇවිත් නෑ. මං කිව්වා සල්ලිකාර මහත්තයෙක් මිලට ගන්න හොයනවා; හොඳ ගණනකට දෙනහැකි කියලා. පස්පොළකට ගියා. එක තැනකවත් නැහැ"

"මුද්දකින් ගලවා වෙන් කළ දියමන්තිවත් තිබුණෙ නැද්ද?"

"නැහැ මහත්මයා. එකම තැනක තිබුණා දියමන්තියක්. චතුර බින්දුවක හැඩේ ලා නිල්පාට එකක්. ඔබ කිව්වේ හේසල් නට් හැඩේ දියමන්ති හා බෝංචි ඇටේ හැඩේ කොළ මැණික ගැන නේද?"

"ඔබේ මතකය ඉතාම හොඳයි ජොන්සන්" හෝම්ස් කීවේ සන්තෝෂයෙනි. "මං හිතන්නේ මේවා තවමත් ලන්ඩනයට ආවෙ

http://sherlockholmesinvestigations.blogspot.com

නැතුවා වෙන්නත් පුළුවනි. හොරකම වෙලා තියෙන්නෙ පිටපළාතකදී නේ. අද හෙටම මෙහේට ළඟාවෙන්න ඉඩ තියෙනවා" හෝම්ස් කීවේ ජොන්සන් අතේ රන්පවුමක් තබමිනි.

"විස්තර දනගන්න ලැබුණු වහාම මං ඇවිත් කියන්නම්"

"නැහැ ජොන්සන්" හෝම්ස් කීය. "අපි අද හවසට සවුත්හැම්ටන් බලා යනවා. අපි නවතින්නේ "ඇට්ලැන්ටික් කාසල්" හෝටලයේ. ආරංචියක් තිබුණත් නැතත් දිගටම විදුලිපුවත් මගින් දන්වන්න. හැබැයි ඒවා එවිය යුත්තේ දෙස්තර ජෝන් වොට්සන් නමට. මං එහේ නවතින්නෙ මොකක් හරි බොරු නමක් යොදගෙන"

"හොඳමයි මහත්මයා" යී ජොන්සන් අසුනෙන් නැගිට්ටේ පිටව යාමට සූදානමෙනි. "මං ඔය හොයා බැලූ තැන් තමා, ප්‍රශ්න නොඅසා හොරබඩුවලට හොඳ මිලක් ගෙවන තැන්. මට හිතෙනවා දවසක් දෙකක් යද්දී ඔබට හොඳ ආරංචියක් දන්වන්න මට හැකිවේවි කියලා"

"අපරාධකාරයා හොඳ පුරුදුකාරයෙක් වගෙයි" මගේ මිත්‍රයා පැවසුවේ ජොන්සන් පිටවී ගිය පසු දොරවසා දමමිනි. "ඔහු කොයිතරම් අත මිට හිඟවුණත් වටිනා බඩුවක් හොරකම් කළ ගමන් විකුණන්නේ නෑ. හොරකමේ උණුසුම යනතුරු හංගාගෙන ඉන්නවා. එහෙම වුණත් අපට ඒ පැත්තෙන් හෝඩුවාවක් ලබාගැනීම අමාරු වෙනවා"

"ඇට්ලැන්ටික් කාසල්" හෝටලයේ කාමර වෙන්කිරීම ලන්ඩන් නගරයේ සිටම කිරීමට හැකියාව තිබිණි. හෝම්ස් අප දෙදෙනා වෙනුවෙන් සුඛෝපභෝගී කාමර දෙකක් වෙන් කරවා ගත්තේය.

අප සවුත්හැම්ටන් වෙත ළඟාවෙද්දී අවස පහ පමණ වී තිබිණි. මෑතකදී ගොඩනංවන ලද එම හෝටලය ඉතාම අලංකාර සුවපහසු එකක් විය. කාමරයේ සඳළුතලයට පිවිසි විට මෑතින් සවුත්හැම්ටන් වරාය ද බොහෝ ඈතින් අත්ලන්තික් සාගරයේ ක්ෂිතිජය ද දක්නට ලැබිණ.

"හැන්දෑවෙද්දී වරායට නැව් එන හැටිත්, නැව් පිටත් වී යන හැටිත් බලාගෙන ඉන්න ලස්සන දර්ශනයක් තමා" හෝම්ස් කීවේ මා සඳළුතලයට පිවිසී සිටිනු දුටු විටය. "ඒත් වොට්සන් අපට සොබාදහමේ සුන්දර දසුන් නරඹමින් විවේක ගන්න වෙලාවක් නෑ. ඉක්මනින් තේ බීල අපි යමු අපේ රාජකාරිවලට"

http://sherlockholmesinvestigations.blogspot.com

"කොහේටද ඔබ මුලින්ම යන්න බලාපොරොත්තු වෙන්නේ?"

"අපි යමු අර කබාය මසා තිබූ වින්චෙස්ටර් ටේලර්ස් ආයතනයට"

මුහුණකට සෝද ගැනීමට වත් ප්‍රමාණ නොවී අපි වහාම හෝටලයෙන් පිටත් වී ගියෙමු. කුලීරියක නැගුණු අපට ශ්‍රේට් සමර්සෙට් වීථියේ මුල් කෙළවරට යාමට පැය භාගයකට වඩා ගතවිය. රියෙන් බැස අපි පාගමනින් ඉදිරියට ගියෙමු. අංක 445 වෙත ළඟාවීමු. එහෙත් එහි තිබුණේ "රිජ්වේ ටේලර්ස්" යයි සඳහන් නාමපුවරුවක් මිස වින්චෙස්ටර් ටේලර්ස් නොවේ.

"මාස හතරකට කලින් ඔවුන් මේ වෙළඳ ආයතනය අපට විකුණුවා" ආචාරශීලී ලෙස අප පිළිගත් තරුණයා කීය. "මේක අයිතිව හිටි මහත්මයා ඊට මාස කිහිපයකට කලින් මියගියාලු. ඉතින් ඔහුගේ බිරිඳට මේහි පාලන කටයුතු කරන්න බැරිව, ඇය තමයි විකිණුවේ"

"ඔවුන් ලවා කබායක් මස්සවා ගත් තරුණයෙකු ගැන විස්තර පොලීසියට උවමනා වෙලා තියෙනවා" හෝම්ස් කීය. "ඔවුන්ගේ පොත්පත් පරීක්ෂාකිරීමට හැකිවේවිද..............?"

"කණගාටුයි මහත්මයා" තරුණයා කීය. "ඒ හැමදෙයක්ම ඔවුන් අරගෙන ගියා. මං ඒ බව හොඳට දන්නවා. ඒ මොකද මගේ පියා ගොඩනැගිල්ල, අල්මාරි හා මහන මැෂින් පමණයි මිලට ගත්තේ. අනෙක් හැමදෙයක්ම ස්මිත් මහත්මියගේ සේවකයන් ගෙන ගියා."

"ඔබට පුළුවන්ද ස්මිත් මහත්මියගේ ලිපිනය අපට දෙන්න?"

ලාච්චුවක් විවෘත කළ තරුණයා ලිපි ගොනුවක් පෙරලා බැලීය. "ආ මේ තියෙන්නේ........................... එච්. එච්. ස්මිත් මහත්මිය, අංක 27, ක්ලීව්ලන්ඩ් මාවත"

අපි ඔහුට ස්තුතිකොට කුලීරියක් නැගී ක්ලීව්ලන්ඩ් මාවත සොයා ගියෙමු. අංක 27 විශාල පැරණි දෙමහල් නිවසක් විය.

"ස්මිත් මහත්මියද? ඇය මේ ගෙදර අපට විකුණා යන්න ගියා." ගෙහිමි කාන්තාව කීවාය. "ඇගේ දරුවන් ඉන්නේ ඕස්ට්‍රේලියාවේ. ඉතින් ඇය ගියේ ඒ රටට. ඇඳුම් මහන සාප්පුවේ පොත්පත් ගැන අපි මොකුත් දන්නේ නැහැ. පදිංචියට පෙර මේ ගේ අපි අලුත්වැඩියා කරවා ගත්තා. එතකොට මේකෙ තිබුණු පරණ පත්තර හා පොත්පත් තොගයක් පිළිස්සුවා. මං හිතන්නෙ................"

http://sherlockholmesinvestigations.blogspot.com

මගේ මිත්‍රයා ආපසු හැරුණේ බලවත් කලකිරීමකට පත්වය. "හරිම අපරාදයක් වොට්සන්. නොවැන්දීම වැදගත් තොරතුරු රාශියක් අපට හොයාගන්න තිබුණු මාර්ගය. ඒක වැහිල ගිහින්. දැන් අපට යන්න වෙනවා ඇඳුම් පිරිසිදු කරන්නන් හොයාගෙන. ඒ වැඩේ ඒ තරම් පහසුවෙන්නේ නෑ"

ක්ලීව්ලන්ඩ් මාවතේ ඒ අසලම වූ ඉතාලි ජාතිකයන්ට අයත් ඇඳුම් පිරිසිදු කරන ආයතනයකට අපි ගියෙමු. තම බෑගයේ තිබූ කබායේ ලෝන්ඩ්‍රි ලකුණු හෝම්ස් ඔවුනට පෙන්වා සිටියේය. නමුත් ඔවුන් පැවසුවේ තමන් ඒ ගැන කිසිවක් නොදන්නා බවයි.

"මට නම් හිතෙන්නේ ඔවුන් දන්නෙ නැතුව නෙමෙයි" හෝම්ස් කීවේ අප එතැනින් පිටව එද්දීය. "මේ ලකුණු අයිති මොන පළාතටද කියන එක ඔවුන් දන්නවා. නමුත් ඔවුන් ඒක අපට අඟවන්නෙ නෑ"

"ඒ ඇයි?"

"ඉතාලි ජාතිකයන් කියන්නේ හරි පුදුමාකාර පුද්ගලයින් පිරිසක්" හෝම්ස් කීය. "ඔවුන් මේ රටට සංක්‍රමණය වෙලා ඉන්නවා අසීමිතව. ඔවුනට හොඳ ස්ථිර රැකියා නැහැ. ඉතාලි තරුණයන්ගෙන් විශාල කොටසක් අපරාධ හා හොරමැරකම්වලට සම්බන්ධයි. අපි මේ හොයන්නේ මොකක් හරි අපරාධයක් නිසා බව ඔවුන් හොඳාකාරවම දන්නවා. ඉතින් තක්කඩියෙක් ගැන ඔත්තු දීලා අවදානමකට ලක්වෙන්න ඔවුන් කැමැති නෑ. දැන් ඉතින් හොඳටම හැන්දෑවුණා. අපි ආපහු යමු හෝටලයට."

එදින අපි හෝටලයේදී රාත්‍රී භෝජනය ගනිමින් සිටියදී මා නමට විදුලිපුවතක් ලැබිණි.

"ලිපි ලේඛන දිගින් දිගටම පරීක්ෂා කර බැලුවා. ඔබ කියූ මුල්අකුරු ඇති කෙනෙක් මෑතකදී අපා සමග ගැටී නැහැ. එහෙත් සෙවීම තවදුරටත් කරගෙන යමි - බ්‍රැඩ්ස්ට්‍රීට්"

"මං ඔබට කලින් කිව්වා වගේ මෙගන්දි මගේ රැඳී සිටීම ටිකක් රහසිගතව කරන්නයි මං උත්සාහ කරන්නේ" හෝම්ස් කීය. "ඒක නිසයි වොට්සන් මං හැමතැනකදීම ඔබේ නම පාවිච්චි කරන්නේ. අර කෘතිම දත්වල ROH අකුරු ගැන ඔබට මතක නේ. එහෙම නමක් ඇති කෙනෙක් කවදාහරි පොලීසියට වාර්තාවෙලා තියෙනවාද කියල බැලීම මං බ්‍රැඩ්ස්ට්‍රීට්ට භාරදුන්නා. එහෙම මොකුත් නැතිබවයි දැන් පෙනෙන්නෙ"

 http://sherlockholmesinvestigations.blogspot.com

පසුවද උදේ ආහාරය කල්තබාම ගත් හෝම්ස් ලොන්ඩ්‍රි ලකුණු ගැන සෙවීම ඇරඹීමට තීරණය කළේය. මෙය අධික වෙහෙසකර කටයුත්තක් විය හැකි නිසා, ඔහු අමග නොපැමිණ හෝටලයේම රැඳී සිටින මෙන් ඔහු මට උපදෙස් දුන්නේය.

"බාගවෙලාවට බිරැඩ්ස්ට්‍රීට් ගෙන් හරි මින්වෙල් ජොන්සන් ගෙන් හරි, වැදගත් කාරණා සහිතව විදුලිපුවත් එන්න පුළුවනි. ඒ නිසා ඔබ මෙහි රැඳී සිටීම වැදගත්වෙනවා වොට්සන්"

එවැන්නක් ලැබුණත් හෝම්ස් නොමැතිව මට ක්‍රියාත්මක වීමට නොහැකි බව මා මෙන්ම ඔහු ද දැනසිටියේය. ඔහුට උවමනා වූයේ මේ අතිශය වෙහෙසකර කටයුත්තට මා සහභාගි කර නොගැනීම බව මම තේරුම් ගත්තෙමි. ග්‍රීෂ්ම සෘතුව බැවින් එළිමහනේ වීථිවල ඇවිදීම අප්‍රසන්න කටයුත්තක් බව අමුතුවෙන් කිවයුතු නොවේ. හෝටල් කාමරයේ සඳළුතලයට වී, මුහුදු සුළඟේ සිසිලස විඳිමින් මම පුවත්පත් කියවීමට පටන් ගත්තෙමි. දහවල් එක පහුවෙන තුරු බලාසිටියත් මගේ මිත්‍රයා ආපසු පැමිණියේ නැත. අන්තිමේදී මම තනිවම කෑමශාලාවට ගොස් දිවා ආහාරය ගත්තෙමි.

හෝම්ස් ආපසු පැමිණෙද්දී සවස තුනහමාර පමණ විය. ඔහු අධික ලෙස විඩාවට පත්වී සිටි බැව් බැලූ බැල්මටම පෙනිණ. දවස පුරාම ඩහදිය වගුරුවමින් ඇවිද්දත්, අව්වට පිළිස්සුණත් ඔහුගේ දෙනෙත්වල දීප්තියක් මම දුටුවෙමි. ඒ ඔහුට යම්කිසි හෝඩුවාවක් ලැබී ඇති බවට සලකුණකි. ස්නානය කොට දහවල් කෑම සඳහා ගිය හෝම්ස් ආපසු එනතුරු මම නොඉවසිල්ලෙන් බලා සිටියෙමි.

"ඇඳුම් පිරිසිදු කරන තැන් දහහතකට මං ගියා වොට්සන්" ඔහු කීවේ දහවල් කෑමෙන් පසු මගේ කාමරයට පැමිණ පයිප්පය දල්වා ගනිමිනි. "ලොන්ඩ්‍රි ලකුණු ගැන කිසිවක් කීමට සමහර තැන්වල අය කැමැති වුණේ නැහැ. ඒත් සමහරුන්ගෙන් හොඳ සහයෝගයක් ලැබුණා. අන්තිමට මට හැකිවුණා මං සෙවූ ලකුණු යොදන ලොන්ඩ්‍රි හොයාගන්න.

ඔබට මතක ඇති කබායේ වම් අතේ තිබූ ලකුණ $ RO 40756. මෙම සංකේතය යොදන ලොන්ඩ්‍රිය තිබුණේ නගරයෙන් පිටත හරස්පාරක. ඔවුන් RO කියල යොදල තිබුණේ කබාය අයිතිකාරයාගේ නම හැඳින්වීමට නොවන බව මං දැනගිටියා. RO කියල යොදල තිබුණේ ඔහු පදිංචි රෝම්සී කියන පෙදෙස

හඳුන්වන්න. ඔවුන් තමන්ගේ මේසාත් පෙරලා බැලුවා. මේ කබාය පිරිසිදු කරලා තියෙන්නේ අවුරුද්දකට පමණ කලින්. ඒ හැරෙන්න ඔහුගේ නම හෝ ලිපිනය ඔවුන් ළඟ තිබුණේ නැහැ.

එතැනින් සතුටුදයක ප්‍රතිඵල නොලැබුණාම මං ගියා, කබායේ දකුණු අතේ තිබුණු සංකේතය යොදන ලෝන්ඩ්‍රිය හොයාගෙන. එම ලකුණ යොදන තැන තිබුණේ බොහොම ඈත. ඔබට මතක ඇති ඔවුන් යොද තිබුණේ @ NF සහ අංකයක්. මං හිතූ විදියටම ඔවුන්ගේ පොත්වල ගනුදෙනුකාරයාගේ නම තිබුණේ නැහැ. NF කියල යොදල තිබුණේ නිව් ෆොරස්ට් හඳුන්වන්න. ඒක තමයි ගනුදෙනුකාරයා පදිංචි ප්‍රදේශය. ඔහු කලින් සිටියේ රොම්සිවල වුණාට දැන් පදිංචි නිව්ෆොරස්ට්වල බවයි ඒකෙන් පෙනෙන්නේ. බිල් පොත් පරීක්ෂා කළාම තවත් හොඳ ආරංචියක් ලැබුණා.

ඒ මොකක්ද. කබාය අයිතිකාරයා මේ කබාය පිරිසිදු කරන්න භාරදීලා තියෙන්නේ සතිදෙකකට කලින්. එද ඔහු භාරදීලා තිබුණේ කබාය පමණක් නොවෙයි කලිසමකුත් දීල තිබුණා. ඒවා පිරිසිදු කරලා ආපහු භාරදෙන්න නියමිතව තිබුණේ අගෝස්තු 22 වැනිද යු. නමුත් එතැන සේවකයන්ගේ අතපසු වීමකින් කලිසම නියමිත දිනට සූදනම්ව තිබුණේ නැහැ. ඉතින් මේ ගනුදෙනුකරුවා ලෝන්ඩ්‍රියේ කළමනාකරුට නොඇහෙන්න බැණවැදිලා තියෙනවා. ඔවුන් කියලා තියෙනවා දින දෙකකින් ඒ කියන්නේ අගෝස්තු 24 වැනිදට කලිසම පිරිසිදු කර තබන බව. නමුත් ගනුදෙනුකරුවා එය රැගෙන යන්න ඇවිත් නැහැ. ඔහු එද ආවෙ නැත්තෙ ඇයි කියන එක අපි දන්නවා. ඉතින් ඔහු කොයි වෙලාවක හෝ එතැනට ගිහිං කලිසම ලබා ගනීවි."

"දැන් මොකද කරන්නේ හෝම්ස්? ඔබ එතැනින් ආව අතරේ වුණත් ඔහු ඇවිත් කලිසම අරගෙන යාවි. එහෙම නේද?"

"ඒක තමයි ප්‍රශ්නේ" හෝම්ස් කීය. "මට හිතුණා ඔවුනට කියන්න, මොහු මිනීමැරුමක් සම්බන්ධයෙන් සැකකරන පුද්ගලයෙක් බව. ඒ නිසා ඔහු ආව වහාම ඔහුව රඳවාගෙන පොලීසියට දැනුම්දෙන්න කියලා. නමුත් ප්‍රායෝගිකව ඒක හරියන්නෙ නෑ. මේ කෝන්තියන මැරවරයෙක් රඳවා තියා ගැනීම කරන්නත් බැහැ. ඔය තරම් ඉක්මනට පොලීසියට දැනුම් දෙන්නත් බැහැ. ඔවුනට උවමනාවෙලා තිබුණේ මේ පුද්ගලයාගේ කලිසම

 http://sherlockholmesinvestigations.blogspot.com

ආපහු භාරදීල පුළුවන් ඉක්මනට ඔහුගෙන් නිදහස් වෙන්න. මීට පස්සේ නම් ඔහුගේ ඇඳුම් පිරිසිදු කරන්න භාරගන්නා කථාවකුත් ඔවුන් කතාවෙනවා මට ඇහුණා. ඉතින් මං වහාම ගියා සවුත්හැම්ටන් පොලිසියට. මං කවුද කියල හඳුන්වා දුන්නාම පොලිසියෙන් ලොකු සහයෝගයක් ලැබුණා. මගේ වැඩකටයුතුවලට උපරිම සහයෝගය දෙන්න කියලා අපේ මිත්‍ර බ්‍රැඩ්ස්ට්‍රීට් සවුත්හැම්ටන් පොලිසියට දැනුම්දීල තිබුණා."

"මොකක්ද ඔවුන්ගෙන් ලැබුණු උදව්ව?"

"ලෝන්ඩ්‍රිය ඉස්සරහ පාරෙන් අනෙක් පැත්තේ ඔවුන් දැම්මා ජංගම අවන්හලක්!"

"මොනවා හෝම්ස්?"

"ඔව් මිත්‍රයා. මෙහේ ප්‍රධාන පොලිස් පරීක්ෂක ටයිලර් හරි දක්ෂයෙක්. ඔබ දැකල තියෙනවා නේද ලන්ඩන් නගරයේ මුඩුක්කු පැතිවල තිබෙන ජංගම අවන්හල්? ක්ෂණික ආහාර, දුම්වැටි, සිසිල්බීම සහිතව තල්ලුකරගෙන යන කරත්ත? එහෙම එකක් ගෙනැත් දැම්මා ලෝන්ඩ්‍රියට බොහොම ළඟින් පදික වේදිකාවේ. එහි වෙළෙන්ද ලෙස දැම්මේ සාමාන්‍ය ඇඳුමෙන් සැරසුණු පොලිස් භටයෙක්. ඔහු සමග මාරුවෙන් මාරුවට එම ජංගම අවන්හලේ රැඳී සිටීමට තවත් රහස් පොලිස් භටයෙක් අනුයුක්ත කළා"

"ලෝන්ඩ්‍රියේ අය දන්නවද මේක පොලිසියෙන් දැමූ ජංගම අවන්හලක් කියලා?"

"ඔවුනට රහසින් මේක කරන්න පිළිවෙළක් නෑ" හෝම්ස් කීය. "නමුත් මේකට ක්ෂණිකව ක්‍රියාත්මක කළ හැකි වෙන විසඳුමකුත් නෑ. මං ලෝන්ඩ්‍රියේ කළමනාකරුට කිව්වා, ජංගම අවන්හලේ අයිතිකරු මගේ මිත්‍රයෙක්; ඔහුට වහාම හොර රහසේ දැනුම්දෙන්න කියලා, කබාය අයිතිකරු කලිසම අරගෙන යන්න ආවොත්. කළමනාකරු ඊට එකඟවුණා. අපරාධකාරයා අද නැත්නම් හෙට ඔහුගේ කලිසම අරගෙන යන්න එවි කියලයි මං හිතන්නේ. නමුත් ඔහු මංකොල්ලකෑව ආභරණ විකුණාගත්ත නම්, ඔහු කොහොමටවත් පෙනීඑන්නත් ඉඩතියෙනවා."

"ඔබ ලොකු මහන්සියක් දරලා තියෙනවා ඔහුව කොටුකරගන්න. ඔහු ඉබේරිලා පැනගත්තොත් නම් හරිම අපරාදයක්"

http://sherlockholmesinvestigations.blogspot.com

"ඒක තමයි වොට්සන්" හෝම්ස් කීය. "මට මෙහේ කටයුතු කරන්න සිදුවෙලා තියෙන්නේ හරිහැටි නාඳුනන නුපුරුදු පුද්ගලයන් එක්ක. ඒක මට ලොකු අඩුවක්. ලන්ඩනය මොන තරම් විශාල වුණත්, මගේ කටයුතුවලට උදව් ලබා ගන්න සෑහෙන පිරිසක් ඉන්නවා. අපරාධ විසඳීමට බේකර්වීදියේ හිගන කොලුරැන මට හරියට උදව්කරල තියෙනවා. මින්වෙල් ජොන්සන්ල, කාට්රයිට්ල වගේ අයගෙන් ලැබෙන නිහඬසේවය කොයිතරම් වටිනවාද? නමුත් මෙහේ එහෙම කවුරුවත් නැහැ. ස්ටුවට් මහත්මියගේ අතින් ගළවාගෙන ගිය මුදු මේ වෙනකොට මේ නගරයේ කොහේට හරි විකුණලා ඇති. නැත්නම් උගස්තියලා ඇති."

"දැන් ඉතින් මොකක්ද අපි මීළඟට ගතයුතු පියවර?"

"ඒක නම් මටත් හිතාගන්න අමාරුයි."

ඔහු එද හවස් වරුවම හෝටලයේ කාමරයට වී කල්පනා කළේය. ගැටලුවේ මේ තරම් දුරට සාර්ථකව විසඳූවත්, එය අවසන් කිරීමට නොහැකි ලෙස අතරමග ඇණහිටීම ඔහුට ප්‍රශ්නයක් වූ බව මම තේරුම් ගතිමි. ඔහු සමග කතාබහක යෙදීමට මා උත්සාහ කළත්, ඔහු එය ද නොරිස්සුවේය.

පසුවද උදයේ මා අවදිවන විටත් ඔහු හෝටලයෙන් පිටවී ගොස් තිබිණි. මා වෙත ලියූ ලියුම් කැබැල්ල කාමරයේ මේසය මත විය.

"වොට්සන්,

වැදගත් කටයුත්තක් සඳහා පිටත්ව යමි. ආපසු එනවිට සවස්වීමට ඉඩ ඇත. පොලිස් ඔත්තුකරුවා අපරාධකරුගේ යාම් ඊම් ගැන තොරතුරු රැගෙන පැමිණෙතැයි අපේක්ෂා කරමි. ඒ තොරතුරු ලබා ගැනීමට ඔබ කාමරයේම රැඳී සිටින්න. අවශ්‍ය වුවහොත් සුදුසු පරිදි ක්‍රියා කරන්න.

එස්. එච්."

හෝම්ස් යන්නට ඇත්තේ කුමන කටයුත්තක් සඳහා ද යන්න මට සිතාගැනීමටවත් නොහැකි විය. අප හමුවීමට කිසිවෙකු පැමිණියහොත්, ඔහු මගේ කාමරයට එවන මෙන් හෝටලයේ කළමනාකරුට දන්වීමි. ඉන්පසු මම සේවකයෙකු ලවා පුවත්පත් කිහිපයක් ගෙන්වාගෙන, සඳළුතලයේ තබාගත් හාන්සිපුටුවට වී

http://sherlockholmesinvestigations.blogspot.com

ඒවා කියවීමට පටන් ගතිමි. අත්ලාන්තික් සයුර පිස එන සිසිල් සුළඟ නිසාදෝ මට නින්ද ගියේය.

කිසිවෙකු කාමරයේ දොරට තඩිබාන හඬින් මම තිගැස්සී ඇහැරුණෙමි. වෙලාව දහවල් දොළහ පසුවී තිබිණ. හෝටලයේ සේවකයෙකු සමග තවත් නාඳුනන අයෙක් දොරටුව අසල සිටගෙන සිටියේය.

"ෂර්ලොක් හෝම්ස් මහත්තයා ඉන්නවද?" ඔහු විමසුවේය.

"දැනට නැහැ. ඇයි? ඔහේ කවුද?" මම ඇසීමි.

"මම සවුත්හැම්ටන් පොලිසියෙන්" කී ඔහු තම හැඳුනුම්පත මට පෙන්වීය. මම හෝටල් සේවකයා යවා, අමුත්තා කාමරය තුළට කැඳෙව්වෙමි.

"අර ලෝන්ඩ්‍රියට එන්න ඉඩ තියෙන මැරවරයා ගැන සෝදිසියෙන් ඉන්න හෝම්ස් මහත්තයා අපට භාරදුන්නා" අමුත්තා කීය. "අද උදේ 10ට විතර ඒ මිනිහා ආව. එවෙලේ බිම කඩේ භාරව හිටියේ මම. ලෝන්ඩ්‍රි සේවකයෙක් ඇවිත් මට ඔත්තුව දුන්නා. සැක කටයුතු මිනිහා ලෝන්ඩ්‍රියෙන් එළියට බැහැලා යන්න පටන් ගත්තාම, මං ඔහුට නොපෙන්නේ පිටිපසින් ගියා."

"ඔහුගේ හැඩහුරුකම කොහොමද?"

"ඔහු අඩි හයක් විතර උසයි. කෙට්ටුයි. හිස්වැස්මක් පැළඳ හිටියේ නැහැ. හිසකෙස් දුඹුරුපාටයි. තැනි තැන පැහිලා. කෙස්වැටිය බොකුටුයි. ඔහු එය ගැන සැලකිල්ලක් දක්වන්නෙක් නෙමෙයි වගේ මට පෙනුණා. නමුත් ඇඳුම් නම් පිරිසිදුවට ඇඳලා හිටියා. කටේ තිබුණා සිගරට්ටුවක්. වයස අවුරුදු හතළිහකට කිට්ටු ඇති.

ඔහු වැනැම් වීදියට හැරිලා බොහොම ඉක්මන් ගමනින් වරාය දෙසට ගියා. මං ඔහු පිටුපස ගියේ යාර පනහක් පමණ පිටුපසින්. අපි ඔහු ගැන සෝදිසි කළ බව ලෝන්ඩ්‍රියේ කවුරුවත් ඔහුට ඇඟෙව්වාද මං දන්නේ නැහැ. මිනිහා දෙපාරක්ම පස්ස හැරිල බැලුවා. ඔහු මාව දකින්න නැහැ. මට හිතුණේ එහෙමයි"

"ඉතින්?"

"ඔරලෝසු කණුව ළඟදී ඔහු ඩෙවොන් හෝටලයට ගොඩවුණා. මාත් ඔහු පසුපසින්ම ඒ හෝටලයට ගියා. ඒ වෙලාවෙ හෝටලයේ ලොකු සෙනගක් හිටියා. මං සෙනග අතරින් ගිහින් බැලුවත් ඔහුව

http://sherlockholmesinvestigations.blogspot.com

හොයාගන්න බැරිවුණා- ඔහු ආපහු එයි කියල මං මිනිත්තු 20ක් විතර ඉස්සරහ දොරටුවට කිට්ටුව, ඒත් හුගක් ආවරණය වුණු තැනකට වෙලා බලාගෙන හිටියා. නමුත් ඔහු එළියට ආවේ නැහැ. පස්සේ මං ආයෙමත් හෝටලය ඇතුළට ගිහිං විමසා බැලුවා එතකොටයි මට දැනගන්න ලැබුණේ හෝටලයේ පිටුපස දොර ක්ලිෆඩ් වීථියට විවෘත වෙන බව. එතැන හිටි මුරකරුවාගෙන් මං විමසුවා. ඔහු කිව්වා "එකම එක මිනිහයි අහුගිය පැයටම මේ දොරටුවෙන් පිටවෙලා ක්ලිෆඩ් වීථියට ගියේ. උස කෙට්ටු යකෙක්. මගේ ඇගෙත් හැප්පිලා ගියේ මටත් සාප කර කර"

"හරි වැඩේ නේ" මම කීවෙමි. "ඔය මිනිහා මිනීමැරූ අපරාධකාරයෙක්. මේක ඇහුවාම හෝම්ස් මහත්තයාට හොඳටම තරහා යාවි"

පොලිස් නිලධරයා මඳ වේලාවක් නිශ්ශබ්දව සිටියේය. "මට පුළුවන් සම්පූර්ණ උත්සාහය මං යෙදුවා මහත්මයා. පොලීසිය ඔහු පිටුපස ලුහුබඳින බවට මිනිහට ඔත්තුව ලැබිලා. ඒක මට සහතිකයි"

පොලිස්භටයා සමුගෙන යන්නට ගියේය. සවස දෙක පමණ වන විට හෝම්ස් ආපසු පැමිණියේය. ඔහු එදිනත් අතිශයින්ම විඩාපත්ව සිටි බැව් මම දුටුවෙමි.

"මොනවද වොට්සන් ආරංචි? ලන්ඩනයෙන් විදුලිපුවත් මොකුත් ආවද? මෙහේ පොලීසියෙන් මොනවා හරි තොරතුරක් ලැබුණෙ නැද්ද?"

මා සිතා සිටියේ මගේ මිත්‍රයා කෑම කා මඳක් විවේක ගත් පසු මට ලැබුණු ආරංචිය ඔහුට කීමටය. එහෙත් දැන් ඊට ඉඩක් නැත. පොලිස් භටයා පැවසූ දේ මම හෝම්ස්ට දැන්වීමි.

"අදක්ෂ මෝඩයෝ!" හෝම්ස්ට කෑගැසිණ. "කිසිම සැකයක් නෑ ඌ තමයි අපරාධකාරයා. ච්. අපට ආයෙමත් නම් ඔය වගේ අවස්ථාවක් ලැබෙන්නෙ නෑ. මට එතැනට වෙලා ඉන්න පුළුවන්කමක් තිබුණා නම්, මං ඌව බෙල්ලෙන්ම අල්ලා ගන්නවා" හෝම්ස් කීවේ මිට මොලොවා තම කෝපය පිටකරමිනි.

"මේ සැරේ නම් අපට ලැබිල තියෙන හෝඩුවාවන්ගෙන් කිසිම ප්‍රයෝජනයක් නොලැබෙන හැඩයි වොට්සන්" ඔහු කීවේ බලාපොරොත්තු කඩවූ විලාශයෙනි. "උගස්බඩු ගන්නා තැන් කිහිපයකම මං හොයලා බැලුවා, දියමන්තියක් හෝ දියමන්ති මුද්දක්

http://sherlockholmesinvestigations.blogspot.com

මිලට ගන්න බව අඟවමින්. මං හොයන, මට උවමනා කරන ආබරණ, කිසිම තැනක තිබුණේ නැහැ. මෙහේ පොලීසිය මට හඳුන්වා දුන්නා පොලිස් ඔත්තුකාරයෙක්. ඔහුත් ෂින්වෙල් ජොන්සන් වගේ පාතාල ලෝකය සමඟ සම්බන්ධකම් තියෙන අයෙක්. ඔහු මාව කැඳවාගෙන ගියා වරාය කිට්ටුව පරණ ගොඩනැගිල්ලක බිම්මහලට. ඒකත් හොරබඩු මිලට ගන්නා තැනක්.

"කුඩා දියමන්තියක් මිලට ගන්නයි මං හොයන්නෙ" මං කිව්වා. "ඒක මුද්දකට අල්ලා තියෙනවා නම් වඩාත් හොඳයි. සාධාරණ ගණනකට ආවොත් මිලට ගන්න මං සූදානම්. මං ප්‍රශ්න අහන්නෙ නෑ. හෙට රෑට කේප්ටවුන් බලා යන නැවේන් මං යාත්‍රාකරනවා"

හොරබඩු කඩය අයිතිකාරයා එක වචනයක් වත් කථාකළේ නැහැ. ඔහු අව්වට කුළු පැහැ ගැන්වුණු මුහුණක් තිබූ ඉතාම තරබාරු තට්ටය පෑදුණු මිනිහෙක්. ඔහුගේ ඇස්දෙකු එළියට නෙරා ඇවිත් තිබුණා. ඔහු යටිතොල ඉදිරියට දිගුකරලා හිස දෙපසට වැනුවේ තමා ළඟ අලෙවියට එවැන්නක් නැති බව හඟවමින්.

"පාට මැණික් ගලක්වත් ඔබ ළඟ අලෙවියට නැද්ද?" මං ඇහුවා. "නිල් කැටයක්, රතු කැටයක් හෝ කොළපාට මැණිකක්?"

ඔහුගේ කටින් එක වචනයක් වත් පිටවුණේ නැහැ. ඔහු මිනිත්තු දෙකක් පමණ ඇසිපිය නොහෙළා මා දිහා බලාගෙන හිටියා. ඔහුගේ හිතේ මොකක් හරි සිතිවිල්ලක් ඇතිවුණා. එක්කො මං ගැන සැකයක් ඇතිවුණාද? එහෙමත් නැත්නම් යමක් ඉක්මනට විකුණාගන්න අදහසක් ආවද? මට ඒක තේරුම් ගන්න බැරිවුණා.

"ඔහේට ඕන මොන පාට ගලක්ද?" ඔහු ඇහුවා.

"මං ඔහේට කිව්වේ. නිල් හෝ රතුවලට මං කැමතියි. කොළපාට ගලක් වුණත් කමක් නෑ"

"මරකත මැණිකක් ඇල්லූ රත්රන් මුද්දකට කැමතිද?"

"අකමැත්තක් නෑ. ඒත් ඉස්සරවෙලා ඒක බලල ඉන්න ඕනෑ" මං කිව්වේ ඇසිපිය ගැහිල්ලේ වත් වෙනසක් නොකරමින්.

"අනිද්දා උදේට ආවොත් දෙන්න පුළුවනි" ඔහු කිව්වා.

"අනිද්දා උදේ වෙනකොට මං මෙතැනින් හැතැක්ම පන්සීයක් මුහුදමැද අත්ලන්තික් සාගරයේ" මං කිව්වා. "හෙට රෑ අටට නැව පිටත්වෙනවා. හැන්දෑවෙ හතට කලින් මට බඩුව ලැබුණොත් ගන්නම්. නැත්නම් එපා"

http://sherlockholmesinvestigations.blogspot.com

"දැනට ඒක මා ළඟ නැහැ" ඔහු කිව්වා. "මිනිහෙක් අරගෙන ආවා ඒක විකුණන්න. ඔවට වැඩි ඉල්ලුමක් නැතිනිසා මං ගත්තෙ නැහැ. ඔහේට ඕනෙ නම් මං ගෙන්නල දෙන්නම්. හැබැයි සෑහෙන ගණනක් ගෙවන්න වේවි"

"කීයක් විතරද?"

"ඒ මැණික්ගල හරියටම මේ ප්‍රමාණයයි." ඔහු කිව්වේ ලාච්චුවෙන් බෝංචි ඇටයක හැඩයේ, ඒ තරමේ පබලු ඇටයක් අරගෙන.

"කිසිම පළුද්දක් නෑ. ඇපල් ගෙඩියේ කොළපාටයි. නියම ඉන්දියන් මරකත මැණිකක්. පවුම් දහක් වත් වේවි"

"ඒ ගණන වැඩියි" මං කිව්වේ සැලකිල්ලක් නොදක්වන විදියට "මං හොයන්නෙ පවුම් හත්සිය පනහට අඩු එකක්"

"ඒ මිනිහා ඔය ගණනට දෙන්න කැමැති වේවිද මං දන්නේ නෑ" ඔහු කිව්වා. "නමුසෙ ඉල්ලල බලනවා. හැබැයි ගනුදෙනුව කෙරෙන්නෙ මෙතැනදී නිසා මට සීයට දහයක් ගෙවන්න ඕන. ඒක අඩුකරන්න බැහැ"

"ඒකට මං කැමතියි. කොයි වෙලාවටද මං එන්න ඕන?"

"හෙට හැන්දෑවෙ හය වෙනකොට නොවැරදීම මෙතැනට එන්න" ඔහු කීවේ මා දිහා ඔරවා බලාගෙන "හැබැයි තමුසෙ විතරයි. වෙන කිසිකෙනෙක් එක්කගෙන එන්න බැහැ. ආයුධ අරගෙන එන්නත් බෑ. ගනුදෙනුව පටන්ගන්න කලින් මට පවුම් පහක් ගෙවන්නත් ඕන. වෙළඳාම කෙරුණත් නැතත් ඒක ඔහේට ආපහු ලැබෙන්නෙ නෑ"

"ඒක යක්ස වැඩක් නෙ" මං කිව්වා.

"ඒකට කරන්න දෙයක් නැහැ. ඒකයි අපේ නීතිය." එහෙම කියූ ඔහු අසුනෙන් නැගිට්ටේ මට පිටවී යෑමට වෙලාව පැමිණ ඇතිබව හඟවමින්.

"ඉතින් ඔබ මොකක්ද කරන්න බලාපොරොත්තු වෙන්නෙ?" මම ඇසීමි.

"මේ කියන මරකත මැණික සහිත මුද්ද බොහෝවිට ස්ටුවර්ට් මහත්මියගෙන් හොරකම් කළ එක වෙන්න පුළුවනි." හෝම්ස් කීය. "නමුත් අපට ඒ ගැන සීයට සීයක් විශ්වාසය තබන්න බැහැ. ඒ වුණත් මං ඒ උත්සාහය දරල බලන්න ඕන. වැඩිම වුණොත් වෙන පාඩුව පවුම් පහයි."

http://sherlockholmesinvestigations.blogspot.com

"අපරාධකාරයා ඔය ගුහුදෙනුවට ආවොත් ඔහු හඳුනාගැනීම ඔබට අමාරුවෙන එකක් නැහැ. එතකොට ඔබ මොකද කරන්නෙ?" මම ඇසීමි.

"එහෙම වුණොත් මං මොකක්ද කරන්නෙ කියන එක තවමත් කල්පනා කරල නැහැ. ඒ ගැන හුඟක් හිතල බලන්න ඕන"

මේ වෙලාවේ අපේ කතාබහට බාධා කරමින් හෝටල් සේවකයෙක් මා අතට විදුලි පුවතක් ගෙනැවිත් දුන්නේය. මම එය විවෘත කර බැලීමි. එහි මෙසේ සඳහන් විය.

"විලියම් ගාෆීල්ඩ් 741 කෙනිංටන් වීථිය සවුත්හැම්ටන්. වෝල්ටර් ගෝල්ඩ්ස්ටයින්, 73 මහාවීථිය. සවුත් හැම්ටන්. විනිෆ්‍රෙඩ් ග්‍රාන්ට් 10 B ඕෂඩ් මාවත, රොම්සී. වින්ස්ටන් ජේ ගේබ්‍රියල් 44 රීඩ් මාවත, නිව්ෆොරස්ට්. විල්බට් ග්‍රිෆින්, වින්ඩ්සර් චතුරශ්‍රය, පෝට්ස්මත්.

බ්‍රැඩ්ස්ට්‍රීට්"

"මේ මොකක්ද හෝම්ස් මේ?"

"මං බ්‍රැඩ්ස්ට්‍රීට්ට දන්නුවා තුමර් W G අකුරු දෙක තියෙන මේ පළාතේ දන්ත ශල්‍ය වෛද්‍යවරුන්ගේ ලේඛනයක් වහාම එවන්න කියලා." හෝම්ස් කීවේ මා මවිතයට පත්ව සිටිනු දැක සිනාසෙමිනි.

"මං හිතන්නේ ඔහු බ්‍රිතාන්‍ය වෛද්‍ය මණ්ඩලයෙන් මේ විස්තර ලබාගන්න ඇති"

"අපරාධකාරයාගේ කෘත්‍රිම දත් හැදූ දන්ත වෛද්‍යවරයා හොයන්නද?"

"අන්න හරි. මං හිතන්නේ මට ඉතිරිවෙලා තියෙන අන්තිම තුරුම්පුව ඒක." හෝම්ස් කීවේ අසුනෙන් නැගී සිටිමිනි. "මං හිතාගෙන හිටියේ කෙටි විවේකයක් ගන්න. දැන් ඉතින් ඒකට වෙලාවක් නෑ. මං යනවා මේ වෛද්‍යවරුන් හොයාගෙන. අද රෑ වෙන්න කලින් හැකියාවක් ලැබුණොත් මං යනවා මේ හැම වෛද්‍යවරයෙක්ම හමුවෙන්න"

"එතකොට ඔබ අර මැණික් මුද්ද ගැන තවදුරටත් හොයන්නේ නැද්ද?" මම ඇසීමි.

"මිත්‍රයා. ඒකට මට එන්න කිව්වේ හෙට රෑට නේ" හෝම්ස් පිළිතුරු දුන්නේය. "මාව ඇතුළට ගන්නවා කිව්වේ ආයුධ නැතිව. අනෙක තනියම. මේක ටිකක් අවදානම් ගමනක්. උන් ළඟ නම් බොහොම භයානක අවිආයුධ තිබේවි."

http://sherlockholmesinvestigations.blogspot.com

"ආයුධයක් හංගාගෙනවත් යන්න හැටියක් නැද්ද?"

"ඒක හරියන්නෙ නෑ වොට්සන්. උන් මාව හොඳට සෝදිසි කරල මිසක් ඇතුළට ගන්න එකක් නැහැ." හෝම්ස් කීය. "ගිනිඅවියක් හංගාගෙන ඉඳල අහුවුණොත් වැඩේ අවුල්වෙනවා"

දහවල් ආහාරය අවසන් කළ වහාම හෝම්ස් විදුලිපුවත යළිත් වරක් කියවා බැලුවේය. ඊළඟට හැඳ පැළඳගත් ඔහු විදුලි පුවත කබා සාක්කුවට දමා ගත්තේය.

"රෑට මං එනතුරු බලාගෙන ඉන්න එපා වොට්සන්." ඔහු කීය. මං එන්න හුඟක් රෑ වෙන්න ඉඩතියෙනවා. අපේ අන්තිම තුරුම්පුව මේක කියලයි මට හිතෙනන්නෙ. බාගවෙලාවට මට පෝට්ස්මත් දක්වා යන්නත් සිදුවේවි."

අපරාධකාරයා පෙනි ළපනී අපේ අතෙත් ගිලිහී යාම ගැන මගේ සිතේ ඇතිවූයේ කුණගාටුවකි. හෝම්ස්ගේ දක්ෂතාවය අනුව අපරාධකරුගේ කබායෙන් ඔහු අල්ලාගැනීමට තිබූ අවස්ථාව මගහැරිණි. දැන් ඔහු එම ලෝන්ඩ්‍රිය පිහිටි පළාතකටවත් නොපැමිණෙනු ඇත. ඔහු සමග හිතවත්කමක් තිබූ ලෝන්ඩ්‍රි සේවකයෙකු පොලිසිය ඔහු සොයා පැමිණි බව අපරාධකාරයාට ඉඟිකරන්නට ඇත. ඔහු ලුහුබැඳයාම පොලිස් භටයාට දුෂ්කරවීම පුදුමයක් නොවේ. මේ කුටයුත්ත මට පැවරුණා නම් මා මුහුණදෙන්නේ ද එම ඉරණමට ඔබට සැක නැත. දන්ත වෛද්‍යවරයාගේ මාර්ගයෙන් අපරාධකරුගේ නම දැනගත්තත් ඔහු අල්ලාගැනීමට එයින් පිටිවහලක් ලැබෙතැයි සිතිය නොහැක.

හොරබඩුකාරයා ළඟට යන ගමනෙන් ලැබෙන ප්‍රතිඵල කුමන මාර්ගයක් ගනු ඇත්දැයි සිතීමටත් අපහසුය. හෝම්ස්ට එහි යාමට සිදුවන්නේ නිරායුධව, තනිවමය. අපරාධකරු කල්තබා එහිගොස් මුද්ද කඩය හිමිකරුට භාරදී සැඟවී සිටියොත්? එය ස්ටුවට් මහත්මියගේ එක දැයි කවමත් විශ්වාස නැත.

මේ ආකාරයෙන් දිගින් දිගටම කල්පනා කරමින් මම සවස්වරුවම ගත කළෙමි. රාත්‍රි නවය පමණ වන විට හෝම්ස් ආපසු පැමිණියේය.

උදේ සිට රෑ වන තුරු නොකඩවාම මහන්සිවීම නිසා ඔහුගේ මුහුණේ තිබුණේ අතිශයින්ම විඩාපත් ස්වභාවයකි.

"හුඟක් විස්තර තියෙනවා වොට්සන් කියන්න" ඔහු කීය. "ඒ වුණත් ඒව ඔබට, මේ වෙලාවෙ විස්තර කරල කියන්න මට

 http://sherlockholmesinvestigations.blogspot.com

අපහසුයි. මට ඒ තරමට මහන්සියි. කෑම ටිකක් කාල ඉක්මනින් නින්දට යන්නයි මට උවමනා. හෙට උදේ අපි කතාකරමු"

වයින් වීදුරුවක් බී, රාත්‍රී ආහාරය ගෙන ඔහු ඉක්මනින් තම කාමරයට ගියේය. දැඩි වෙහෙස නිසා ඔහුට ඉක්මනින් නින්ද යන්නට ඇත. පරීක්ෂණයේ ඉදිරිගමන ගැන දැනගැනීමට මා සිටියේ නොඉවසිල්ලෙනි. දැන් එය තවත් පැය කිහිපයකින් ප්‍රමාද කිරීමට සිදුවී ඇත.

පසුවදා උදයේ මා අවදිවන විට තරමක් ප්‍රමාද වී තිබිණ. හෝම්ස් උදෑසනින්ම අවදි වී රැවුල බෑම හමාරකොට උදේ ආහාරය සඳහා යාමට සූදනමින් සිටියේය.

"මං ඊයේ හවස බ්‍රැඩ්ස්ට්‍රීට් සහ හෝක්ට විදුලිපුවත් යැව්වා" ඔහු කීය. "මං විශ්වාස කරනවා ඔවුන් මෙහේට ඒවි කියල අපට සහාය වෙන්න."

"කොහොමද ඊයේ හවස ඔබේ උත්සාහයෙන් ලැබුණු ප්‍රතිඵල?"

"මං පටන්ගත්තේ සවුත්හැම්ටන්වලින් වොට්සන්" මගේ මිත්‍රයා පැවසුවේ දිගු කථාවකට මුලපුරමිනි. "ගාෆීල්ඩ් හා ගෝල්ඩ්ස්ටයින් වෛද්‍යවරුන් දෙදෙනාගේම දන්ත ශල්‍යාගාර තිබුණේ වරාය කිට්ටුවම. අර සඳහන් දිනයට කෘතිම දත් හදවා ගත් ROH නම් තැනැත්තා කවුද කියල මට හොයල දෙන්න ඔවුන් අවංකව උත්සාහ කළා. නමුත් ඔවුන්ගේ ලේඛනවල එහෙම කෙනෙක් හිටියේ නැහැ.

ඊළඟට මම ගියා රොම්සී නගරයේ වෛද්‍ය විනිෆ්‍රඩ් ග්‍රාන්ට් ළඟට. කෘතිම දත් පරීක්ෂා කළ ගමන් ඔහු කිව්වා ඒක ඔහුගේ රසායනාගාරයේ සෑදූ එකක් නොවෙන බව. ඔහුටම අයත් රසායානාගාරයක් තිබෙන නිසා W G කියන අකුරු යොදන්නේ නැතිලු.

ඊළඟට මට යන්න තිබුණු කිට්ටුම තැන නිව්ෆොරෙස්ට්. ඔබට මතක ඇති කබායේ ලෝන්ඩ්‍රි ලකුණකත් NF අකුරු තිබූ බව.' එහි මට හමුවෙන්න තිබුණේ වෛද්‍ය වින්ස්ටන් ගේබ්‍රියල්. ඔහු අවුරුදු 60ක් පමණ වයස කෙට්ටු උස පුද්ගලයෙක්. මං පැමිණි කාරණය කිව් වහාම ඔහු කාචයකින් කෘතිම දත් පරීක්ෂා කළේ මං බලන විදියට. ඊළඟට අල්මාරියෙන් ගත්තා කිළිටි වී ගිය ලොකු පොතක්. ඔහු ඒකෙ පිටු පෙරළාගෙන ගියේ බොහොම ඉක්මනින්.

http://sherlockholmesinvestigations.blogspot.com

"හ්ම්. මේ තියෙන්නේ" ඔහු කිව්වා. "ආර්. ඕ. එච්. කියන්නේ රොඩ්නි ඔලිවර් හාට්ලි"

"ඔබට මතකද ඔහුව?" මං ඇහුවා.

"මතකද?" වෛද්‍ය ගේබ්‍රියල් කෑගැසූ හඬට මං තිගැස්සිලා ගියා. "මට ඌව හොඳට මතකයි. ඒ මොකද මේ දත්සෙට් එකට ඔය තක්කඩියා එක පැන්සයක් ගෙව්වේ නැහැ!"

"හැබෑට?"

"අවුරුදු දෙකක් තුනක් කියන්නේ ඒ තරම් දිග කාලයක් නෙමෙයි" ඔහු කිව්වා. "මං මේක හදලා ඔහුගේ කටේ සවිකරලා කැටපතෙන් පෙන්නුවා. එහෙත් මට වචනයක් නොකිව් ඔහු කියනවා; "දොස්තර මහත්තයො. මට ලොකු කරදරයක් වෙලයි ඉන්නෙ. මගේ බිරිඳගේ නංගි අද කසාද බඳිනවා. ඇගේ මගුල් ගෙදරට මං යායුතුමයි. මේ දත්ටික අපූරුයි. අනේ මේක මට දෙන්න. හෙට එළිවෙන්න කලින් මං ඔබේ මුදල ගෙවනවා. දෙයියම්පා! සහතිකයි!"

ඌ එහෙම කිව්වාම මං ඌට අනුකම්පා කළා. මං හිතුවා ඌ නියම ඉංග්‍රීසිකාරයෙක් විධියට මුදල් ගෙනත් දෙයි කියලා. ඒත් ඒ හොරතක්කඩියා අද වෙනතුරුත් මේ පළාතෙ ආවෙ නැහැ."

වෛද්‍ය ගේබ්‍රියල් මෙහෙ කියද්දී මට ලොකු සතුටක් ඇතිවුණා. "දොස්තර මහත්මයා. ඔහුගේ හැඩහුරුකම කොහොමද? ඔබට ඒක මතකද දන්නෙ නෑ?" මං ඇහුවා.

"මොකද මට මතක නැත්තෙ!" වෛද්‍යවරයා කෑගැහුවා. "උසයි අඩිහයක් විතර. සාක්කුවේ පැන්සයක් නැතිවුණාට අඳින්නේ බොහොම අලංකාරෙට සාමිවරයෙක් වගේ. කොණ්ඩය දුඹුරු පාටයි. අක්බමරු වෙලා. යෝධ කන්පෙති දෙකක් තියෙනවා. ඉස්සරහට දික්වුණු යටිහක්කක් තියෙනවා; දෙකෙළවරෙන් ඉහළට නැමුණු උඩුරැවුලක් තියෙනවා."

"ඔහුගේ වයස, ලිපිනය ආදිය.........."

"ඔහොම ඉන්න බලන්න............. ආ මේ තියෙන්නෙ "හාට්ලි; රොඩ්නි ඔලිවර් - වයස අවුරුදු 35යි. පදිංචිය 773B රෝස් කොටේජ්, ඕක් ෂේඩ්, නිව්ගොරෙස්ට්............ ආ තවත් විස්තර තියෙනවා. මේවා මං ලියාගෙන තියෙන්නේ ඔහුගේ දිරාගිය දත් ගළවන්න කලින්......... පූර්ව වෛද්‍ය තොරතුරු.......... කුඩා කාලයේ නිතර නිතර

 http://sherlockholmesinvestigations.blogspot.com

මීමැස්මොර රෝගයට ගොදුරු වී ඇත. දනුත් ඉඳහිට වළිප්පුව සෑදේ. අධික වශයෙන් දුම්පානය හා මත්පැන් පානය. රැකියාව - සවුත් හැම්ටන්වරායේ කම්කරුවෙකි............ ඔය විස්තර ඇතිද?"

"ඔය හොඳටම ඇති මහත්මයා" කී මම වෛද්‍යවරයා කියූ ලිපිනය මගේ කමිස අතේ සටහන් කරගත්තා. ඔහුට ස්තුති කොට, එතැනින් පිටවෙලා මං ගියේ ඊස්ට්ලේ හොයාගෙන. එය අඩු ආදායම් ලාභීන්ගේ නිවාස යෝජනා ක්‍රමයක්. එහි 773B රෝස් කොටේජ් හොයාගැනීම මට අමාරු වුණේ නැහැ. නමුත් මං ඒ ගෙදරට නොගිහිං ගෙවල් දෙකක් එහා ගෙදරක දොරට තට්ටු කළා.

"හාට්ලි ඉන්නේ මේ ගෙදරද? රොඩ්නි හාට්ලි?" මං ඇහුවා.

"කවුද රොඩ්නිද?" ඒ ගෙදර හිටි ගෑනු කෙනෙක් ඇහුවා. "එයාල දැන් මෙහේ නැහැනේ. ඉඳහෙං ගිහිං හුඟක් කල්. එයා අර වරායේ මිනිහෙකුට පිහියෙන් ඇනලා කරදරේ වැටුණා නේ. ඊට පස්සේ එයාගෙ පවුල ළමයත් එක්ක යන්න ගියා. කොහේ ගියාද කියල කවුරුවත් දන්නෙ-නෑ"

රොඩ්නි මට ගිය සුමානෙත් හම්බවුණා. ඇයි එයා පිහි ඇනුම් නඩුවෙන් බේරුණානේ" මං කිව්වේ ඔහු අඳුනන මිතුරෙකු බව හඟවමින්.

"හම්බවුණා නම් ඔහේට කියන්න ඇති නේ ඉන්න තැන" ඒ ගෑනි ගත් කටටම කිව්වා. "අපේ මිනිහ කිව්වෙ රොඩ්නි වරාය ළඟ සීවීව් නිවාසවල ඉන්නවා දැක්ක කියල"

මං ඇයට ස්තුතිකරලා "සීවීව්" නිවාස පැත්තේ ආවා. ඒක මැරවරයින්ගේ රාජධානියක් වගේ තැනක්. තක්කඩින්, මිනීමරුවන්, පාතාල ලෝකයේ අපරාධකාරයින් හැම එකෙකුම ඇති එතැන. පොලිස් හමුදවක් අරගෙන ගිහිං වට කළත් මිනිහ අත්අඩංගුවට ගැනීම ලෙහෙසි වෙන්නෙ නෑ. ඔන්න ඕකයි තත්ත්වය" කී හෝම්ස් කථාව අවසන් කළේය.

සවස හතර පමණ වනවිට බ්‍රැඩ්ස්ට්‍රීට් හා හෝක් පොලිස්නිලධරයන් දෙදෙනාම හෝම්ස් සොයා පැමිණියහ. පැයක් පමණ කතාබහේ යෙදීසිටි ඔවුහු පිටත්ව ගියහ.

"මීළඟට මට තියෙන කටයුත්ත මුදුව මිලට ගැනීම" හෝම්ස් කීය. "වොට්සන් ඔබේ රිවෝල්වරයේ උණ්ඩ පුරවලා නේද? බොහොම හොඳයි. ඒක සාක්කුවට දමාගෙන මා සමග එන්න. ඔබ

යන්නේ අපරාධකාරයින් මැද්දට. ඒ නිසා අකමැත්තක් නැත්නම් විතරයි මා සමග ආ යුත්තේ..............................

"මගේ කිසිම අකමැත්තක් නෑ. මං බොහොම කැමැත්තෙන් එනවා"

"ඔබට ස්තුතියි මගේ හිතවත් වොට්සන්. ඔබ එන බව මං දැන හිටියා............ ඉතින් ඔබ මා සමග ඇවිදගෙන ඉදිරියට යද්දී, එක් තැනකදී ඔබට වැළමිටෙන් ඇනලා මං සංඥාවක් කරනවා. ඒ හරියෙදී ඔබ නවතින්න ඕන. මං විතරක් තනියෙන්ම ඉදිරියට යනවා - තේරුණාද?"

"ඔව්"

"මං "වොට්සන්!" කියල හරි "පොලිස්!" කියල හරි කෑගැහුවොත් මිසක් ඔබ මං ගිය ඇත්තුට දුවගෙන එන්න එපා. තේරුණාද?"

"ඔව්" මම කීවෙමි. "නමුත් මේ අපරාධකාරයින්ගේ ගුහාවකට ඔබ තනියම යන එක ගැන නම් මගේ හිතට භයයි හෝම්ස්. ඔබ ඇවිත් ඉන්නේ අපරාධකාරයෙක් අත්අඩංගුවට ගන්න කියල දැනගත්තොත්, ඔවුන්ගෙන් ඔබට සමාවක් ලැබෙන එකක් නෑ"

"වෙන්න පුළුවන්. නමුත් මේ වෙලාවේ මට වෙන විකල්පයක් නෑ. හවස පහට අපි හෝටලයෙන් පිටවෙමු"

සවස 5ට හෝටලයෙන් පිටවූ අපි, කුලීරියක නැඟී වරායේ "ඩොක්යාඩ්" නමින් හැඳින්වූ පෙදෙසට පැමිණියෙමු. නැව්බඩු ගබඩාකරන ගුදම් අතරින් ගොස් අප ළඟාවූයේ මාළු අලෙවිකිරීමටම වෙන්වූ විශාල වෙළඳපොළක් අසලටය. කුණුමාළු ගඳ හැමූ මෙතැනට විශාල සෙනඟක් රැස්වී සිටියහ. මගේ කබා අතෙන් අදිමින් හෝම්ස් සංඥාවක් කළේය. ඒ කුලී අශ්වකරත්ත ගාල කෙළවරට අප යා යුතු බවය. එතැනදී ඔහු වැළමිටෙන් මගේ අතට ඇන්නේ වෙනත් කිසිවෙකුට නොපෙනෙන අයුරෙනි.

"වොට්සන්. ඔබ මේ හරියේ බංකුවක වාඩිවෙලා මුහුද දිහා බලාගෙන ඉන්න බවක් අඟවන්න. කවුරුවත් ඇවිත් කතාවකට අල්ලගන්න හැදුවොත් වචනයක් දෙකක් කතාකරන්න. වැඩි කතාබහට යන්න එපා." මගේ කනට කර මෘදු හඬින් කී හෝම්ස් නොනැවතී ඉදිරියට ගියේය.

මේ වනවිට වේලාව සවස 5.45 පසු වී තිබිණි. හෝම්ස්ට පැමිණීමට වේලාව දී තිබුණේ සවස 6ට බව මට සිහිවිය. මේ

 http://sherlockholmesinvestigations.blogspot.com

වෙලාවේ අපරාධකාරයාත් සමහර විට ඒ දෙසට ගමන්කරමින් සිටිනවා ඇත. ඔහුගේ පෙනුම පිළිබඳව යම් තරමක අවබෝධයක් මා සතුව ඇත. මට ඔහු හඳුනාගැනීමට හැකිවේද? ධීවර ඇඳුමෙන් සැරසුණු හැඩිදැඩි සිරුරු තිබූ හත් අට දෙනෙක්, ඉක්මන් ගමනින් ඒ දෙසට ගමන්කළහ. මඳ වේලාවකට අසූ වරායේ බඩු ගොඩ බාන්නන් යයි සිතිය හැකි කිළිටි ඇඳුමෙන් සැරසුණු හතරපස්දෙනෙක් ද ඒ පැත්තටම ගියේ සෙමින් සෙමින් අලස ගමනෙනි. හෝම්ස් මට උගන්වා ඇති ආකාරයෙන් විමසිලිමත් ඇසෙන් මම ඔවුන් දෙස බැලීමි. එහෙත් කෙට්ටු උස පුද්ගලයෙකු නම් ඒ අතර නොසිටියේය. තවත් පැය කාලක් පමණ ගතවෙද්දී මත්පැනින් හොඳට පදම් වූ තරුණයෝ හතරදෙනෙක් ගමන් කළහ. අශ්වරේස් දැමීමට ගොස් තුමනට සිදුවූ අලාභ ගැන ඔවුහු උස්හඬින් කතාකරමින් ගියහ. මේ වනවිට අඳුරු වැටෙන්නට පටන්ගෙන තිබිණි. ඈත ඔරලෝසු කණුවක සවස 6.30 නාදවනු ඇසිණ. එහෙත් හෝම්ස් ගේ සලකුණක් හෝ නොදිටිමි.

මේ හෝම්ස් රැවටීමට අපරාධකරුවන් යෙදූ උපායක්ද? මේ වනවිට ඔහු කාගේ හෝ ග්‍රහණයකට හිරවී සිටීද? මේ සිතිවිලි මගේ සිතේ ඇතිකළේ ඉමහත් කැළඹීමකි. සිගරට්ටුවක් උරමින් ඉදිරියට එන පුද්ගලයෙකු වෙත මගේ අවධානය යොමුවූයේ එවිටය.

හිසට තදවනසේ පැළැඳි කැන්වස් රෙදි හිස්වැස්ම නිසා ඔහුගේ හිසකෙස් මට නොපෙනිණ. එහෙත් ඔහු අඩිහයක් පමණ උස කෙසඟ පුද්ගලයෙක් විය. මීයෙකුගේ වැනි තියුණු දෙනෙත් තිබූ ඔහු දුඹුරු පැහැති කලිසමකින් හා කබායකින් සැරසී සිටියේය. බියෙන් හා සැකයෙන් මෙන් ඔහු ගමන් කළේ වටපිට බලමිනි. එයින් මගේ සිතේ ඔහු ගැන සැකයක් ඇතිවිය.

තවත් පැය භාගයක් පමණ ගතවිය. දැන් සම්පූර්ණයෙන්ම අඳුරු වැටී ඇත. බංකුව අසලම වූයේ විශාල මල් පඳුරකි. එයට මුවාවී මම හෝම්ස් ගිය දිශාව වෙත නෙත් යොමු කළෙමි.

එක්වරම ඒ දෙසින් වෙඩිහඬක් ඇසිණ. කිසිවෙකු පොරබදන හා කෑගසන හඬක් ද, ඒ සමගම කවුරුන් හෝ පැනදුවද්දී ඇසෙන පාවහන් හඬ ද අසන්නට ලැබිණ. මා කළයුත්තේ කුමක් දැයි සිතාගැනීම මට අපහසු විය. කබා සාක්කුවේ තිබූ රිවෝල්වරය එළියට ගෙන එහි ආරක්ෂක අගුළ ලිහිල් කළෙමි. ඊළඟට මා සූදානම් වූයේ වෙඩිහඬ ඇසුණු පැත්තට දිවයාමටය.

http://sherlockholmesinvestigations.blogspot.com

"වොට්සන්! ඔය එන එකාව අල්ල ගන්න!" මගේ මිත්‍රයාගේ කටහඬ අඳුර මැදින් ඇසිණ. ඊළඟට සිමෙන්ති පොළොව මත පාවහන් ගැටෙන හඬකි. මම වහාම මල්පඳුරට මුවා වුණෙමි. දිව එන්නා කවුරු වුණත් ඔහු වරින් වර නැවතී, ආපසු හැරී, තමා ලුහුබැඳ එන්නන්ට වෙඩි පහර දෙකක් හෝ තුනක් එල්ල කළේය.

ඔහු තවත් ළංවන්නම මල්පඳුරෙන් පිටුපසින් එළියට වීත් මම ඔහුට කකුල් මාට්ටුවක් දැමුවෙමි. තරුණකාලයේ රගර් ක්‍රීඩාවේ යෙදී ඇති මට මේවා ගැන වැටහීමක් තිබිණ. පාර හරහට මා දැමූ කකුලේ පැටලී දිව ආ පුද්ගලයා පාරේ ඇදවැටුණේ කපා හෙළූ ගසක් විලසිනි. ඔහුගේ අතේ තිබූ රිවෝල්වරය ද ඉවතට විසිවී ගියේය. මම වහාම එතැනට පැන බිම තිබූ රිවෝල්වරය ඉවතට යන සේ පා පහරක් එල්ල කළෙමි. ඊළඟට මගේ අතේ තිබූ ගිනිඅවිය ඔහුගේ හිසට එල්ල කොට කෑගැසුවෙමි.

"ඒයි හෙල්ලෙන්න එපා! වෙඩි තියනවා ඔලුවටම"

ඒ මිනිත්තු කිහිපයකට පෙර සිගරට්ටුවක් උරමින් එතැනින් ගිය පුද්ගලයාමය. එක් ක්ෂණයකින් එතැනට ළඟාවූ පොලිස් භටයෝ අපරාධකරුවා මර්දනය කරගත්හ. බ්‍රැඩ්ස්ට්‍රීගේ මාංචු යුගළ බිමවැටී සිටි පුද්ගලයාගේ දෑතේ හිරවිය. ධීවරයන් හා සුරා මතෙන් වෙරි වූ තරුණයන් යයි මා සිතූ අය වෙස්වළාගත් පොලිස්භටයන් බව මා තේරුම් ගත්තේ එවිටය.

* * *

"මං හරිම පව්කාරයෙක් මහත්වරුනි" පොලිස් අත්අඩංගුවට පත් අපරාධකරුවා සවුත්හැම්ටන් පොලිස් ස්ථානයේදී අපට පැවසුවේය. තමාට ගැළවීමට කිසිදු මගක් නොමැති බව තේරුම් ගත් පසු, ඔහු පාපෝච්චාරණයකට කැමැත්ත පළකළේය.

"මේරි ඇන්ජලීනා ස්ටුවර්ට් කියන්නේ මගේ නැන්ද" ඔහු කීය. "කුඩා කාලයේ මාව උකුලේ තබාගෙන නැළවූ මගේ ඒ නැන්දා අන්තිමට මේ විදියට මරාදැමීම ගැන දෙවියන් වහන්සේගෙන් මට කිසිදවසක සමාව ලැබෙන්නේ නැහැ. උන්වහන්සේ මට දැඩි දඬුවම් පමුණුවාවි. උසාවියකින් මොනතරම් දඬුවම් ලැබුණත් ඒක කෙළවරක් වෙන්නේ නැහැ. මං මහා පාපිෂ්ඨයෙක්. මං ඔබට හැමදෙයක්ම කියන්නම්"

 http://sherlockholmesinvestigations.blogspot.com

මගේ සීයා තමා බෝන්මත්හි ක්‍රයිස්ට්චර්ච් නගරයේ චාල්ස් හාට්ලි දේවගැතිතුමා. ඔහුට සහ ඔහුගේ බිරිඳට මේ රටේ විතරක් නෙමෙයි, පිටරටවල මිනිසුනුත් ගෞරව කළ බව මං අහල තියෙනවා. ඔවුනට හිටි ළමයි දෙන්නා වුණේ මගේ තාත්තා ජෙෆ්රි හාට්ලි සහ නැන්ද මේරි ඇන්ජලීනා. මගේ සීයාට තිබූ දේපොළ ඔහු සමසමව තාත්තාටත් නැන්දටත් බෙද දුන්නා. නැන්ද 1855 දී කපිතාන් ස්ටුවර්ට් සමග විවාහවෙද්දී, මං කුඩා දරුවෙක්.

මගේ තාත්තා කවදවත් තම රැකියාව හරිහැටි කළ අයෙක් නොවෙයි. පශු වෛද්‍යවරයෙකු වීමට පුහුණුව ලබලා, ඔහු රොම්සී හි පශු වෛද්‍ය ආයතනයක් පිහිටුවා ගත්තා. නමුත් ඔහු සූදුවට ඇබ්බැහි වුණු කෙනෙක්. රැකියාවෙන් ඉපැයූ හැම පැන්සයක්ම ඔහු වියදම් කළේ රේස් ඔට්ටු දැමීමට. ඔහු තම පියාගෙන් උරුම වූ ඉඩම් හා ගෙවල් පවා විකුණා මුදල් ලබාගත්තා. ඒ මුදලිනුත් ඔහු කළේ සූදුකෙළීම.

තාත්තා මේ විධියට මුදල් නැති නාස්තිකරමින් අපේ පවුල විනාශය කරා ගෙනගියා. ඒ අතරේ මා නරක මිතුරන්ගේ ආශ්‍රයට පත්වුණා. ඔවුන් මාව අබිංවලට පුරුදු කළා. සවුත්හැම්ටන් වරාය කිට්ටුව චීන ජාතිකයෙක් පවත්වාගෙන ගිය අබිං ගුහාවට මං සතිපතා විශාල මුදලක් වැය කළා. ගෙදර තිබුණු බඩුමුට්ටු පවා විකුණලා මං කළේ ඒ කටයුත්තයි. මේ කාලයේදී තමා මගේ දෙමව්පියන් දුම්රිය අනතුරකින් මියගියේ. එතකොටත් අගහිඟකම්වලින් වෙළී හිටි අපේ පවුලේ වියදමට මුදල් දුන්නෙත් මගේ නැන්ද මේරි. ඇය මේ හැමදෙයක්ම කළේ ඇගේ සැමියාට හොරෙන්. ඔහු දැනහිටියා නම් මේවාට ඉඩ නොදෙන බව ඇය තේරුම් ගන්න ඇති.

තාත්තා මියගියාට පසු මට රක්ෂාවක් හොයාදෙන්න නැන්ද මහන්සි ගත්තා. එතකොට මගේ වයස අවුරුදු 34ක් විතර ඇති. අබිං මිතුරන්ගෙන් මාව වෙන්කිරීම සඳහා, මාව වෙනත් රටකට යවන්නයි ඇයට උවමනා වී තිබුණේ. ඇය මේ හැමදෙයක්ම කළේ මා ගැන තිබුණු ආදරය නිසා. අබිං යක්ෂයාගෙන් මාව මුදවාගැනීමට ඇය වෙනත් ක්‍රමයක් දැනහිටියේ නැහැ. ඇය හිතුවේ මාව එංගලන්තයෙන් පිටත්කර යැව්වොත් මේ ප්‍රශ්නය විසඳේවි කියලයි.

http://sherlockholmesinvestigations.blogspot.com

මම මත්ද්‍රව්‍යවලින් මිදුණු ටික කාලයක් සියරාලියොනයේ රැකියාව කළා. නමුත් එහි පැතිර ගිය උණසන්නිපාත වසංගතයට, බ්‍රිතාන්‍යයෙන් ගිය සේවකයන් විශාල සංඛ්‍යාවක් ගොදුරු වුණා. එකසිය ගණනක් මියයද්දී, පණබේරාගත්තේ මා සහ තවත් තුන්හතර දෙනෙකු පමණයි.

මාස ගණනක් ඒ රටේ දුක් විඳලා මං ආපසු එංගලන්තයට ආවා. එතකොට මං ඇවිදින ඇටසැකිල්ලක් බවට පත්වෙලයි තිබුණේ. එක දවසක් මං මගේ නැන්දව හොයාගෙන, ලෞඩර් හි ස්ටුවර්ට් මන්දිරයට ගියා. වාසනාවකට මෙන් මගේ මාමා එදා ගෙදර හිටියේ නැහැ. මාව දුටු නැන්දා හරිම පුදුමයකට පත්වුණා. ඔවුන් සිතාගෙන ඉඳලා තියෙන්නේ මාත් මියගිහින් කියලා. ඊළඟට මගේ හැටි දැකලා ඇය හඬා වැටුණා. ඇයට උවමනා වුණේ මා ගැන ඇගේ සැමියාට දැනුම් දෙන්නයි. නමුත් මං ඒකට කැමැති වුණේ නැහැ. ඒ මොකද සැමුවෙල් මාමා කලින් වුණත් මට හෝ මගේ පියාට කැමැත්තක් දැක්වූ කෙනෙක් නෙමෙයි. ඒ නිසා මාමාට මං ගැන නොකියන ලෙසට මං ඇයට බැගෑපත්ව ආයාචනා කළා. අන්තිමේදී මා අතට මුදලකුත් දීලා, ඇය මාව සවුත්හැම්ටන් වෙත එව්වා. එහි දින කීපයක් නැවතී ඉන්න අතරේ වරායේ රැකියාවක් හොයාගන්න මට හැකිවුණා. ඔහොම ඉන්න අතරෙදි මට නිව්ෆොරස්ට් හි තරුණියක් හඳුනාගන්න ලැබුණා. හදිසි තීරණයක් අරගෙන මං ඇයව විවාහ කරගත්තා. නමුත් මං රැකියාවෙන් හොයාගත් මුදල අපට ජීවත්වෙන්න ප්‍රමාණවත් වුණේ නැහැ.

මං සතිදෙකකට සැරයක් නැන්දා හොයාගෙන ආවා. මං ඒකට යොදා ගත්තේ සිකුරාදා දිනවල හවස්වරුව. ගොල්ෆ් ක්‍රීඩාකරන්න නොයන දිනවලට මාමා දවාලට පැයක් දෙකක් නිදගන්නවා. ඒ වෙලාවට ඇය ගෙදරින් පිටවුණේ කැළෑමල් කඩන්න යන බව කියමින්. නමුත් ඇය ඇත්තෙන්ම කළේ හෙන්ඩසන් මහතාට අයත් වත්ත කෙළවර තිබූ උද්‍යාන කුටියට ඇවිත් මාව හමුවීම. අපේ පවුලට ජීවත්වෙන්න තරම් ප්‍රමාණවත් මුදලක් ඇය සතිදෙකකට වරක් මා අතට දුන්නා. ඇය මේ ගැන එක වචනයක්වත් මාමාට කිව්වේ නැහැ. කිව්වා නම් කෝපවෙලා ඔහු මාව පන්නාදමන බව ඇය දැනහිටියා.

උපතින්ම මාත්, මගේ තාත්තා වගේ තදින් කේන්තියන කෙනෙක්. ඒ නිසා මාමා මාව එළවාදැම්මොත් එක කෝලාහලයක්

 http://sherlockholmesinvestigations.blogspot.com

වීමට ඉඩ ඇති බව, නැත්නම් මහගත් ඔහුට හිරිහැරයක් වීමට ඉඩ ඇති බව ඇය දැන හිටියා.

දූනට මාස තුන හතරකට පෙර වරායේ කම්කරුවන් දෙපක්ෂයක් අතර මහා කෝලාහලයක් ඇතිවුණා. ඒකෙදි අපට විරුද්ධ පක්ෂයේ දෙදෙනෙක් පිහි ඇනුම් කා මියගියා. ඒකට සැකපිට මාත් තවත් කෙනෙකුත් රක්ෂිත බන්ධනාගාරෙ ගත කෙරුණා. මාසයක් පමණ රක්ෂිතයේ හිටි මාව, නීතිඥයෙකුට විශාල මුදලක් ගෙවලා නිදහස් කරගත්තේ මගේ නැන්ද. මං ආපහු ගෙදර එද්දි මගේ බිරිඳ මාව අත්හැර ගිහින්. ඊට පස්සේ මං මගේ මිතුරන් පදිංචිව හිටි වරාය අසල සීවිව් නිවාසවල පදිංචියට ගියා. ආයෙත් මං අබිං බොන කල්ලියකට වැටුණා. ඒකෙන් මට රැකියාව හරිහැටි කිරීමත් අමාරු වුණා. නමුත් මට වැඩි වැඩියෙන් මුදල් උවමනා වුණා.

ගිය 24 වැනිද - සිකුරාදත් මං පුරුදු විදියට නැන්ද හමුවෙන්න ලෞඩර් ගම්මානයට ආවා. මාමා මුණගැහෙවි කියන භය නිසා මං කවදාවත් ප්‍රධාන පාරෙන් එන්නෙ නැහැ. මං එන්නේ ඉයෝවිල් බලා යන අශ්වකරත්තයක. ඒ ඇවිත් මගදි බැහැලා, රක්ෂිත වනාන්තරය හා කුඹුරුයාය මැදින් වැටුණු පාරේ ඇවිත් හෙන්ඩසන් මහතාගේ ඉඩමට පනිනවා. එහෙම එනකොට කිසිකෙනෙකුට මාව දකින්න ලැබෙන්නෙ නෑ.

පිහිඇනුමට රක්ෂිත බන්ධනාගාරයේ ඉඳල එළියට ආවට පස්සෙ, මම කොයි වෙලෙත් මගේ ආරක්ෂාවට රිවෝල්වරයක් සාක්කුවේ තියාගත්තා. ඒ මොකද අපෙන් මැරුම් කෑ කල්ලියේ මැරයන් දෙදෙනෙක්, මා මරා දමන බවට දිවුරා හිටි බව අහන්න ලැබී තිබුණු නිසා.

එද නැන්ද හමුවෙන්න ආවත් ඇය පුරුදු වෙලාවට උද්‍යාන කුටියට ආවේ නැහැ. ඒ නිසා මට හුගක් වෙලා කැලෑ රොදට වෙලා හැංගිලා බලාගෙන ඉන්න සිද්දවුණා. ඉවසන්න බැරි රස්නයට ඩහදිය ගලන්න පටන් අරගත්තා. බැරිම තැන මං කබාය ගලවා පැත්තකට දැම්මා. පැයක් පමණ මා එතැන රස්තියාදු කිරීම ගැන මගේ හිතේ නැන්ද ගැන ඇතිවුණේ තරහක්. ආව ගමන් මං ඇයට බැණ වැදුණා.

"නැන්ද මෙච්චර වෙලා මොකද කළේ? මට මෙහෙම රස්තියාදු වෙන්න පුළුවන්ද?"

http://sherlockholmesinvestigations.blogspot.com

"මාමා අද හවස වෙනදා විධියට දිගටම නිදගත්තේ නැහැ" ඇය කිව්වා. "ගොල්ෆ් ගහන්න යන්න සූදනම් වුණා. ඉතින් මට එයා එක්කම එන්න සිද්දවුණා. මං කලින් ඇවිත් මෙහෙ ඔයා එක්ක කතාකර කර ඉඳලා මාමාට අහුවුණා නම් මොකද වෙන්නෙ? ඔයාට ලැබෙන්නෙ සල්ලි නෙමෙයි; මාමාගෙන් හොඳ කම්මුල් පාරක්. ඊට පස්සෙ ඔයාට කවදාවත් සල්ලි දෙන්න මාමා ඉඩ තියෙන්නෙ නෑ. එයා තවමත් හිතාගෙන ඉන්නෙ ඔයා මියගිහින් කියලයි"

"ඒ නාකියා මට මොනවා කරන්නද?" මං කීවා. "මට කම්මුල් පාරක් දෙන්න ආවොත් මං උන්දැව යවන්නෙ අනික් ලෝකෙට"

"තමුසෙ එක මිනිහෙක් මැරුවා මදිවාට මගේ ස්වාමියාත් මරන්නද හදන්නෙ?" නැන්දා ඇහුවේ තරහෙන් "මගේ වැරැද්ද. ඔයාව එල්ලුම්ගස් යන්න තියෙද්දී මං මුදල් ගෙවලා බේරාගත්තා. මගේ අයියාගේ පුතා මේ වගේ කාලකණ්ණියෙක් වේවි කියා මං කවදාවත් හිතුවේ නෑ" ඇය කීවේ කඳුළු වගුරුවමින්.

"මට තවත් මෙහේ රස්තියාදු වෙන්න බැහැ. නැන්දා සල්ලි ගෙනාව නම් ඒ සල්ලි මෙහාට දෙන්න" මං කිව්වා.

"උඹට දෙන්න තියෙන්නෙ සල්ලි තමයි" කී ඇය සාක්කුවට අත දමා මුදල් පසුම්බිය එළියට ගත්තා. "මෙන්න මෙතැන පවුම් 20ක් තියෙනවා. මේක අරං යන්න. ආයෙත් මාසෙකටවත් මේ පැත්තෙ එන්න එපා. ලබන සතියේ අපි නිවාඩුවකට ජිබ්‍රෝල්ටාවට යන්නයි හිතාගෙන ඉන්නේ. ඒ නිසා ඔයා සති දෙකකින් එද්දී මං ගෙදර ඉන්න එකක් නැහැ. ඒ නිසයි මං මාසයකම මුදල් අරගෙන ආවේ."

ඇය මා දිහාවට මුදල් දිගුකළා.

"නැන්දේ තරහගන්න එපා" මං කිව්වා. "මට ලොකු මුදල් හදිසියක් වෙලා තියෙනවා. ආයෙත් නැන්දා හමුවෙන්නේ මාසෙකින් නම් මට තව වැඩිපුර මුදල් ටිකක් දෙන්න. පවුම් විස්ස නම් හොඳටම මදි. මට පවුම් පනහක්වත් ඕන."

"පවුම් 20 උඹට එපා නම් මං තියාගන්නවා" ඇය කිව්වේ තරහෙන්. ඊළඟට මුදල් ටික පසුම්බියට ඔබා සාක්කුවේ දමාගෙන එහි බොත්තමුත් පියවා ගත්තා. "උඹට මේ මුදල ලැබෙන්නෙත් මගේ අනුකම්පාව නිසයි. ඒක මතක තියාගනින්. අර අහිංසක මනුස්සයාට මං මේ කිසිදෙයක් කියලා නැහැ. ඔහු දැනගත්තොත් බැනා ගැන ලැජ්ජාවෙන් අසනීපවේවි"

 http://sherlockholmesinvestigations.blogspot.com

ඇය මට මුදල් දිගු කළ වේලේ ඇගේ අතේ තිබූ දියමන්ති මුදු දෙක හා කොළ මැණික් ගලක් සහිත මුද්ද මං හොඳට දුටුවා. මේවා අනර්ඝ දියමන්ති බව මං දැන හිටියා.

"නැන්ද ළඟ දූන් සල්ලි නැහැනේ" මං කිව්වා. "එහෙනම් මට ඔය මුදුවලින් එක මුද්දක් දෙන්න. මං ඒක උගස් තියලා සල්ලි හොයාගන්නම්. ඊට පස්සේ මං ඒක බේරලා ආපහු ගෙනැත් දෙන්නම්"

"රොඩ්නි" ඇය කිව්වේ තරහෙන්. "උඹ මුද්ද උගස් තියා ආයෙත් බේරා ගන්න? අපොයි. උඹට ලොකු පඩියක් ලැබෙනවානේ. උඹේ තාත්තා කලේ එයාට ලැබුණු දේපොළ ඔක්කොම විකුණ විකුණ සුදු කෙළි එක. මගේ තාත්තා මං විවාහ වුණු වෙලාවෙ මට තෑගි දුන්නු අශ්වකරත්තය එයා අරගෙන ගියේ මුදල් හදිසියක් කියලා. අන්තිමට ඒක උගස්කරලා ලබාගත් මුදලත් ඔක්කොම විනාස කළා. ඔයා අන්තයි ඔයාගෙ තාත්තාටත් වඩා. මං ඒක හොඳට දන්නවා."

"මට ඕන ඔය දියමන්ති මුද්දක්" මං කිව්වා. "ඕක අපේ ආච්චිට අයිතිව තිබුණු එකක්. ආච්චි නේද ඕක නැන්දට දුන්නෙ?"

"ආච්චි දුන්නා තමයි" ඇය කීවා. "ඒ මගේ ලොකු පුතා උපන් වෙලාවේ. උඹලගේ තාත්තට ආච්චි දුන්නා මේ මුද්දට වඩා සිය ගුණයක් වටිනා ඉඩම් සහ ගෙවල්. ලන්ඩන් නගරයෙන්. ඒවට මොකද වුණේ? උඹලගේ තාත්තා විකුණුවා. මේක නම් මං මැරුවත් උඹට ලැබෙන්නෙ නෑ"

එහෙම කියූ ඇය සූදානම් වුණේ තරහෙන් ආපසු යන්න. මං වහාම ඇගේ අත්දෙකෙන් අල්ලා ගත්තා. ඒ වෙලාවේ ඇය මගේ ග්‍රහණයෙන් ගැළවෙන්න බැලුවා. මං උත්සාහ කලේ කොහොම හරි ඇගේ අතෙන් මුද්දක් ගලවා ගන්න.

"මාව අතඇරපන්" ඇය කිව්වා. "නැත්නම් මං කෑගහනවා"

"නැන්ද කෑගැහුවට කාටවත් ඇහෙන්නෙ නෑ. මට ඔය මුද්ද දෙන්න"

මං ඇගේ අත අත්නොහරින බව දුටු නැන්ද මගේ අත හැපුවා. මට දැනුණේ දැඩි වේදනාවක්. මගේ ග්‍රහණය ලිහිල්වුණු ගමන් ඇය දුවන්නයි ලෑස්ති වුණේ. වේදනාවෙන් කෝපාවිෂ්ටවුණු මගේ අතට රිවෝල්වරය ආවේ මං නොදැනුවත්ම.

"දුවන්න එපා!" මං කියද්දීත් ඇය සූදානම් වුණේ දුවන්න. "මේක සෙල්ලම් පිස්තෝලයක් නෙමෙයි" මං ඇගේ ළඟින්ම යන්න

http://sherlockholmesinvestigations.blogspot.com

වෙඩිල්ලක් තැබුවේ ඇය භයකරන්න. නමුත් වැඩක් වුණේ නැහැ. ආපහු හැරිලා මගේ අතින් පිස්තෝලය උදුරාගන්න ඇය උත්සාහ කළා. ඊළඟට ඇය ආපසු හැරුණේ පිටවී යන්න. එතකොට මගේ මලුවේ සිටි යක්ෂයා ක්‍රියාත්මක වුණා. දෙවියනේ මං කළ අපරාධයක්. මේ මගේ තාත්තාගේ නංගී කියන එක ඒ වෙලාවෙ මගේ මොළයට ආවේ නැහැ. මගේ වෙඩිපහරින් ඇය ජීවිතක්ෂයට පත්වුණා. මං වහාම ඇගේ අතේ තිබූ මුදුන් උදුරාගෙන, සාක්කුව කපලා මුදල් පසුම්බියත් අරගෙන් පැනගියා. මහත්වරුනි. මං කළ අපරාධයට මං ඔබෙන් සමාවක් ඉල්ලන්නේ නැහැ. මට දැන් මේ ලෝකයේ ජීවත්වෙලා වැඩක් නැහැ. ඔබ කැමැති දඬුවමක් මට දෙන්න"

* * *

රොඩ්නි ඔලිවර් හාට්ලිට විරුද්ධව නඩුව ලන්ඩනයේදී විභාගයට ගැනිණ. ජූරි සභාවේ ඒකමතික තීරණය අනුව ඔහු මරණ දණ්ඩනයට නියම විය.

"වොට්සන් ඔබ කාලයක් ඉන්දියාවේ පදිංචිව සිටි නිසා මේ කථාව අහල තියෙනවද මං දන්නෙ නෑ" හෝම්ස් කීවේ එද රෑ බේකර් වීථියේ අපේ නිවහනේ දී ය. "මේක පෙරදිග රටවල ආප්තෝපදේශයක්. විෂඝෝර සර්පයාත් ගින්දරත්, මොනතරම් පුංචි වුණත් සුළුවට තකන්න එපාලු. බොහොම හීලෑවට හිතවත්ව ඉන්න විෂඝෝර සර්පයා කොයි මොහොතේ කෝපයට පත්වෙලා, ඔබට දෂ්ටකරල මරාදමාවිද දන්නෙ නෑ. එහෙම අයට අනුකම්පා කිරීමෙන් තමා ළං කරගන්නේ විනාශයමයි."

http://sherlockholmesinvestigations.blogspot.com

කළු ව්‍යාළයා

මගේ බිරිඳ මේරිගේ අකල් මරණයෙන් කලකට පසු, මගේ චිකිත්සාගාරය විකුණාදමා මම බේකර් වීථියේ නිවහනට සංක්‍රමණය වූයෙමි. ඒ බව මීට පෙර මා ලියූ කථාන්තරවල ද සඳහන් කර ඇත. මගේ හිතමිත්‍ර ෂර්ලොක් හෝම්ස් මහතාගේ රහස් පරීක්ෂණ කටයුතුවලට සහාය වීමටවත්; ඒ දිනවල මට සිතක් නොතිබිණ. මගේ මිත්‍රයාට එංගලන්තයේ ඈත පළාත්වල පරීක්ෂණ කටයුතු යෙදුණු විට ඔහු සමග එහි යෑම, මුල් කාලයේ සිටම මගේ පුරුද්දක් විය. එහෙත් මා මේ කියන දිනවල පරීක්ෂණ සඳහා හෝම්ස් යැවුණේ තනිවම ය.

සිතේ ශෝකය තුනී කිරීමට හොඳම පිළියම, වැඩ කටයුතුවල නිරතවීම බව මගේ මිත්‍රයා මට මතක් කළේය. ඔහු සමග ඈත පළාත්වලට ගොස්, ඔහුගේ පරීක්ෂණවලට උදව්කරන මෙන් හෝම්ස් දිගින් දිගටම මගෙන් ඉල්ලා සිටියේය. එහෙත් මගේ සිතේ ඊට කැමැත්තක් නොවීය. මා බොහෝ විට කාලය ගතකළේ මේරිගේ ඡායාරූප දෙස බලමින් අපේ විවාහ ජීවිතයේ ගෙවී ගිය කාලය මෙනෙහි කරමිනි. හෝම්ස් ගෙදර නොමැති විට මම සවස් වරුවේ තනිවම ඔක්ස්ෆර්ඩ් වීථියේ ඇවිදින්නට ගියෙමි. සැන්දෑවේ ආපසු එන අතරේ ක්‍රයිටීරියන් අවන්හලට ගොඩවැදී බීර පයින්ටුවක් හෝ දෙකක් පානය කළෙමි. මාෂල් කිං යළිත් මට හමුවූයේ ක්‍රයිටීරියන් අවන්හලේ එලෙස ගතකළ මොහොතකය.

යළිත් හමුවූයේ යයි මා කීවේ, මීට පෙර පාසලේදී ඔහු මට හමුවී තිබූ බැවිනි. මා පාසලේ ඉගෙනුම ලැබූ අවසන් වසර කිහිපයේදී ඔහු මට වඩා පහළ පංතියක ඉගෙනුම ලැබීය. එකල මාෂල් කිං මගේ කුළුපග සගයෙකු වූයේ නැත. මා ජ්‍යෙෂ්ඨ රග්බි පාපන්දු කණ්ඩායමේ ක්‍රීඩාකරද්දී ඔහු කනිෂ්ඨ කණ්ඩායමේ ක්‍රීඩකයෙකු විය. ළඟ මිතුරෙකු නොවූ නිසා ඔහුගේ පවුලේ තොරතුරු කිසිවක් මම දැන නොසිටියෙමි. හදිසියේම ඔහු මා හඳුනාගෙන කථාකළ විට මම ඉමහත් පුදුමයට පත්වූයෙමි.

http://sherlockholmesinvestigations.blogspot.com

"මේ ජෝන් වොට්සන් නේද?" ඔහු විමසුවේය.

"ඔව්................ ඔබ...........?"

"වොට්සන්. ඔබට බැරිද මාව හඳුනගන්න?" යයි ඇසූ ඔහු සේවකයා දූන් බීර ජෝගුව අතට ගෙන මා අසලට පැමිණ හිඳගත්තේය.

මම තත්පර කිහිපයක් ඔහුගේ මුහුණ දෙස එකඑල්ලේ බලා සිටියෙමි. අන්තිමේදී මගේ මතකය යන්තමින් අවදිකර ගැනීමට මට හැකිවිය.

"කනිෂ්ට රග්බි කණ්ඩායමේ හිටි.............. මාෂල්............... මාෂල් කිං නේද?"

"හරියට හරි" ඔහු කීය. "එහෙනම් මං එච්චර වෙනස්වෙලා නැහැ. ඔබ නම් හුඟක් වෙනස්වෙලා වොට්සන්. මුහුණ ඇදිලා ගිහින් කළුවෙලා; කට්බාරු වෙලා ටිකක් බඩත් ඇවිත්. පුදුමයක් නෑ. වෛද්‍යවරයෙක් හැටියට ඔබට කොහේද ක්‍රීඩා කරන්න විවේකයක්? ඔබේ බිරිඳගේ අකල් මරණය ගැනත් මට අහන්න ලැබුණා. ඒ ගැන මගේ ශෝකය පිළිගන්න"

"ස්තුතියි. මාෂල් කොහොමද දැනගත්තේ මං මෙහේ ඉන්න බව?" මම ඇසීමි. "අපි පාසලෙන් අස්වෙලා මං හිතන්නේ දූන් අවුරුදු පහළොවකට කිට්ටුයි. එහෙම නේද?"

"වොට්සන්. ඔබ ලන්ඩනයේ ජීවත්වෙන බව මං දූනහිටියා." ඔහු කීවේ බීර උගුරක් පානය කළ පසුවය. "ඔබ ඔබේ හිතවත් මිත්‍ර ෂර්ලොක් හෝම්ස් මහත්මයාගේ වික්‍රමාන්විත පරීක්ෂණ ගැන සඟරාවලට ලියන ලිපි, මං අනිවාරයෙන්ම කියවනවා. ඊට අමතරව අපි යහළුවෝ එකතුවුණාමත් හෝම්ස් මහත්මයා දක්ෂ ලෙස අභිරහස් විසඳූ හැටි ගැන කොයිතරමක් කතාවෙනවද?"

"ඔබ ඒවා කියවන බව අහන්නත් මට සන්තෝෂයි" මම පිළිතුරු දූන්නෙමි.

"ඇත්තම කියනවා නම් මං හිතාගෙන හිටියේ වෙලාවක ඔබේ මිත්‍රයා හමුවෙලා උපදෙසක් ගන්න" මාෂල් කිං පැවසුවේය.

"හැබෑට? ඒ මොකක් ගැනද?"

"ඒක තරමක් දිග කථාවක්" ඔහු කීය. "කෝ හෝම්ස් මහත්මයා බේකර් වීථියේ අද ඉන්නවද?"

"ඔබට කියන්න කණගාටුයි මාෂල්. මගේ මිත්‍රයා මේ දිනවල ලන්ඩන් නගරයේ නැහැ. එක්තරා ගැටලුවක් විසඳීම සඳහා ඔහු

 http://sherlockholmesinvestigations.blogspot.com

ස්කොට්ලන්තය බලා ගියේ ඊයේ උදේ. එහෙම ගියාම ඔහු දින තුනක් හෝ හතරක් ඒ ස්ථානයේ නවතිනවා. ඉතින් ඔහු කවදා ආපහු එව්ද කියන එක මට හරියටම කියන්න බැහැ. ඔහු ගිය රාජකාරිය ඉක්මනින් අවසන් කළොත් නම් හෝම්ස් ස්කොට්ලන්තයේ රැඳී ඉන්න එකක් නැහැ. නමුත් බාග වෙලාවට දින තුන හතරක් ගතවෙන්නත් ඉඩ තියෙනවා."

"මට එච්චර දවසක් ලන්ඩනයේ රැඳී ඉන්න හැටියක් නැති එකයි ප්‍රශ්නෙ" මාෂල් කීය. "මගේ විස්තරය අහද්දී ඔබට තේරේවි මං මුහුණ දීලා ඉන්න තත්ත්වය. මං කියන්නම් ඔබට විස්තර. ඔබ ඒවා හෝම්ස් මහත්මයාට දැනුම් දෙන්න. ඔහුට මේ ගැන හොයා බලන්න පුළුවන් නම් ලොකු උදව්වක්"

"ඔබ කියන විස්තර තුම් මං හෝම්ස්ට කියන්නම්" මම කීවෙමි. "එහෙත් ඔහු ඔබේ පරීක්ෂණය භාරගන්න කැමැති වේවිද කියන එක ගැන නම් මට සහතික වෙන්න බෑ මාෂල්. මං හෝම්ස් සමග දීර්ඝ කාලයක් පරීක්ෂණවල යෙදුණු බව ඇත්තයි. සමහර ගැටලු විසඳීම ඔහු භාරගන්නවා. සමහර ඒවා භාරගන්නෙ නැහැ. ඔබේ ප්‍රශ්නය ඔබම හෝම්ස්ට කියන්න. ඒකයි වඩාම සුදුසු ක්‍රමය. මොකක්ද මේක හදිසි ප්‍රශ්නයක් ද?"

"මං කියන්නම් වොට්සන්" ඔහු කීය. "ඔබ බාගවෙලාවට අහල ඇති මර්වින් කිං ගැන. ඔහු තමා මගේ වැඩිමහල් සොහොයුරා. මාස හතරකට පෙර ඔහු වෙඩිවැදී මියගියා!"

"මොනවා? ඒ ඔබේ සොහොයුරාද? මට කණගාටුයි මාෂල්. මං ඔය මිනීමැරුම ගැන පුවත්පත්වල කියෙව්වා. ඒ අපරාධය කළේ කවුද කියන එක තවමත් හෙළිවුණේ නැද්ද?"

"මගේ අයියා අකාලයේ මියයාම මට මුළු ලෝකයක්ම නැතිවුණා වගේ වොට්සන්" මාෂල් කිං පැවසුවේ දුක්මුසු ස්වරයෙනි. "ඔහු මට වඩා අවුරුදු අටකින් වැඩිමහල්. මට ඉතාම ආදරය කළ අයියාගේ පිහිටෙන් තමයි මං ජීවත්වුණේ. ඔහුගේ මරණය සමගම මං සම්පූර්ණයෙන්ම අසරණ වුණා. මේ මිනීමැරුම ගැන සෙවීම ස්කොට්ලන්ඩියාඩ් පොලීසියට භාරවුණා. ඔවුන් කියනවා මේක පාතාල ලෝකයේ මිනීමැරුමක් වෙන්න ඇති කියලා. එතැනින් එහාට ඔවුන් කිසිදෙයක් කරන්නෙ නෑ. අයියා මට අහිමිවුණු බව ඇත්තයි. නමුත් ඔම් අපරාධය කළ උන් සොයා නිසි

http://sherlockholmesinvestigations.blogspot.com

දඬුවම් ලබාදීමයි මගේ එකම අරමුණ. මට කොච්චර වියදමක් ගියත් මං ඒ දේ කරනවා. ඔබ මට මේකට උදව් කළ යුතුයි වොට්සන්"

"මගේ මිත්‍රයාට කියලා පුළුවන් හැමදෙයක්ම කරන්නම්" මම කීවෙමි. "නමුත් හෝම්ස්ට උවමනා වේවි මර්වින් කිං ගැනත්, ඔහුට අදාළ හැම කෙනෙක් ගැනමත් තොරතුරු දැනගන්න. ඉතින් ඔහු හමුවෙලා ප්‍රශ්නය ඉදිරිපත් කළොත් නේද වඩා හොඳ?"

"ඔව්. මං අනිවාර්යයෙන්ම හෝම්ස් මහත්මයා හමුවෙන්න එනවා" මාෂල් කීය. "නමුත් මේ වෙලාවේ මට කොහොමටවත් නොගිහින් බැරි ගමනක් යන්න සිදුවෙලා තියෙනවා. ඒක මොකක්ද කියන එක මං ඔබට තේරුම් කරලා කියන්නම්. එතකොට ඔබට හිතාගන්න පුළුවන් වේවි මං අන්වෙලා ඉන්න තත්ත්වය.

වොට්සන්. අපි ආසලේ එක කාලයේ ඉගෙනගත්තා වුණත්, මං හිතන්නේ නැහැ, ඔබ මා ගැන තොරතුරු හරිහැටි දන්නවා ඇති කියල. ඒවා අහන්න ඔබට කම්මැලි හිතේවිද මම දන්නෙ නෑ. නමුත් මගේ අර්බුදයේ මුල තේරුම් ගන්න උවමනා නිසා මං කියන්නම්.

ඔබ අහලා තියෙනවා නේද සදර්ටන් සාමිවරයා ගැන? දැනට ඉන්න සදර්ටන් සාමිවරයා-ඩන්කන් කිං, තමා මගේ මහප්පා. ඔහු තමා සදර්ටන් වතුයාය නමින් ප්‍රසිද්ධ ඕට්ස් සහ බාර්ලි වගා කළ ඉඩම් සහ කැලෑ ඉඩම් අක්කර අටසිය ගණනක එකම හිමිකරුවා. ඔහුට වඩා ධනවත් පුද්ගලයන් එංගලන්තයේ තවත් ඉන්නවා නම්, ඒ අතලොස්සයි. මම ඔහුගේ ළඟම ඥාති පුත්‍රයා. නමුත් මගේ වත්කම කොහොමද? මං දුන් අන්ත දුගීදුප්පතෙක් බවට පත්වෙලයි ඉන්නේ. මට ණය දුන් අය අද නැත්නම් හෙට, මට විරුද්ධව නඩු දමාවි. එතකොට මට හිරේ යනවා ඇරෙන්න වෙන විකල්පයක් නැහැ. ඔබට මේක තේරුම් ගන්න අමාරුයි. එහෙම නේද? හැමදෙයක්ම මං තවත් පැහැදිලි කරන්නම්.

අපේ සීයා වන සදර්ටන් සාමිට හිටියේ පුතුන් දෙදෙනෙක් සහ දුවක් පමණයි. වැඩිමහල් පුතා තමයි, මං මේ කියන මගේ මහප්පා ඩන්කන් කිං. ඊළඟට හිටියේ වෙරෝනිකා නම් මගේ නැන්ද. පවුලේ බාලයා වුණේ මගේ තාත්තා හැරල්ඩ්. මගේ මහප්පා විවාහවුණේ නැහැ. ඔහු අද දක්වාත් තනිකඩයෙක්. මගේ නැන්ද ඇගේ තනි කැමැත්තට විවාහවුණා. ඒ ඊනොක් ජේකොබ් නම් කෙනෙකු සමග. ඔහු යුදෙව් සම්භවයක් තිබූ කෙනෙකු නිසා සීයා

 http://sherlockholmesinvestigations.blogspot.com

ඒ විවාහයට කැමැතිවෙලා නැහැ. ඔහුගේ දේපොළ කිසිවක් ඇය නමට ලියුවෙත් නැහැලු. වෙරෝනිකා නැන්ද ඒ කාලෙම ඇගේ සැමියා සමග දකුණු ඇමරිකාවට සංක්‍රමණය වෙලා තියෙනවා. ඔවුනට ඉන්නේ එක පුතෙක් පමණයි. ඔහු හැරී ජේකොබ් නම් මගේ ඥාති සොහොයුරා. මගේ නැන්ද සහ මාමා පසු කාලයක මියගිහින්. දැන් ඉතිරිවෙලා ඉන්නේ හැරී පමණක් බව අපට දැනගන්න ලැබුණා.

අපේ තාත්තා හැරල්ඩ්ට හිටියේ පුතුන් තුන්දෙනයි. වැඩිමහල් අයියා මර්වින් කිං. දෙවැනි අයියා වර්නන් කිං. ඔහු කුඩා කාලයේ ඉඳලම ඉගෙනීමටලොකු දක්ෂකමක් පෙන්නුවා. භූගර්භ විද්‍යාව ඉහළටම ඉගෙන ගත් ඔහු කැම්බ්‍රිඩ් සරසවියේ කථිකාචාර්යවරයෙකු ලෙස පත්වුණා. මම තමයි පවුලේ බාලයා. මං පාසලේදී ක්‍රීඩා කටයුතුවලට කාලය ගතකළා මිස ඉගෙනගන්න උනන්දුවුණේ නැහැ.

මගේ තාත්තාත් මං වගේම ජීවිතය බොහොම සැහැල්ලුවට ගත් කෙනෙක්. මහන්සිවෙලා ඉගෙන ගන්න කියලා, ඔහු මට කවදවත් කරදර කළේ නැහැ. ඔහු හිතුවේ මහප්පා විශාල ධනවතෙක් නිසාත්, ඔහු අවිවාහක නිසාත්, හැමදෙයක්ම උරුම වෙන්නේ අපට. ඒ නිසා මහන්සිවෙලා වෘත්තියක් සඳහා ඉගෙනගන්න උවමනා නැහැ කියලයි. සදර්ටන් වතුවල පාලක තනතුරු මට ලැබේවි; එහෙම නැතිවුණත් මට රජයෙන් පත්වීමක් ලැබේවි කියල තාත්තා නිතර කිව්වා. ඔබ දන්නවානේ වොට්සන්. එංගලන්තයේ වංශවත් පරම්පරාවල අය ඉහළට ඉගෙන නොගත්තත්, රජයේ උසස් තනතුරු, පත්වීම් ලැබෙනවා. කොහේ හරි යටත්විජිතයක පොලිස්පතිකමක් හෝ ආණ්ඩුකාර තනතුරක් මට ලැබේවි කියලා තාත්තා හිතුවා. නමුත් මගේ අවාසනාවද මම දන්නේ නෑ. තාත්තා හිතාගෙන හිටි, ඔහු අනුමාන කළ දේවල් කිසිවක් ඒ පිළිවෙළට සිදුවුණේ නැහැ. මහප්පා මං ගැන බැලුවෙත් නැහැ. රජයෙන් තනතුරක් ලැබුණෙත් නැහැ. මේ කිසිවක් දකින්න පෙර තාත්තා අසනීපයකින් මියගියා.

තාත්තා මං වෙනුවෙන් කියා ඉතිරි කළ විශාල මුදලක් තිබුණේ නැහැ. තිබුණේ සුළු මුදලක් පමණයි. ඒක බොහොම ඉක්මනින් වියදම් වෙලා ගියා. මර්වින් අයියාට පෙනීහිටි නඩුවලින් තරමක

http://sherlockholmesinvestigations.blogspot.com

ආදායමක් ලැබුණා. ඔහු ඒ කාලයේම බිරිඳගෙන් වෙන්වී හිටි නිසා පවුල් බරක් තිබුණෙත් නැහැ. ඒ නිසා ඔහු මට නිතරම මුදල් දුන්නා. නමුත් මා ගතකළ විනෝදකාමී ජීවිතයට, ඒ මුදල් ප්‍රමාණවත් වුණේ නැහැ. මං ජීවත්වුණේ මුදල් ණයට ගනිමින්. මං විශාල දේපොළකට හිමිකාරයෙක් බව මුදල් ණයට දෙන්නන් දන්නවා. ඒ නිසා එම ආයතනවලින් පොලියට ණය ලබාගැනීම මට මුලදී අපහසුවුණේ නැහැ. නමුත් ණය සහ පොලී දිගින් දිගටම එකතුවෙලා අන්තිමට මං ලොකු අමාරුවක වැටුණා. අයියාගේ මරණයෙන් පස්සේ මට මුදල් ණයට දෙන්න ණයකරුවන් කැමැතිවුණේ නැහැ. මා ඉදිරියේ තිබුණේ විනාශය විතරයි. ඒක දවසින් දවස මට වඩාත් පැහැදිලිව පෙනුණා. දැන් මෙතැනින් ඉදිරියට මට ගන්න ඉතිරිවෙලා තියෙන්නේ එකම ක්‍රියාමාර්ගයයි. හෝම්ස් මහත්මයා එක්ක හමුවෙන්න නොවැ මං මේ යන්න හදන්නේ ඒ කටයුත්තටයි."

"ඔබේ සොහොයුරාගේ ඝාතනය ගැන ඒ දවස්වල ලොකු ආන්දෝලනයක් ඇතිවුණා. එහෙම නේද?" මම ඇසීමි. "මගේ මිත්‍රයා හෝම්ස් ඒ දිනවල හරි උනන්දුවෙන් ලෙස්ට්‍රේඩ් සමග ඒ ගැන කතාබහ කරනවා මට මතකයි. නමුත් ඒ පරීක්ෂණය හෝම්ස්ට භාරවුණේ නැහැ.............."

"මර්වින් ඝාතනය කළේ කවුද කියන එක තවමත් අභිරහසක්" මාෂල් කීය. "බාගවෙලාවට මේක මුලින්ම හෝම්ස් මහත්මයාට භාරදුන්නා නම් ඔහු මෙලහකට මේක විසඳලා. ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියේ පරීක්ෂකයන් තවමත් මේ ගැන කිසිම දෙයක් අමුතුවෙන් හොයාගෙන නැහැ."

"එතකොට කෝ ඔබේ දෙවැනි අයියා?"

"වර්නන් භූගර්භ විද්‍යාඥයෙක් බව මං ඔබට කිව්වා. ඒ ක්ෂෙත්‍රයේ පර්යේෂණ සඳහා ඔහු ලෝකයේ නොයෙක් රටවලට සංචාරය කළා. මේ අතරේ ඔහුට දකුණු ඇමරිකාවට එන්න කියලා ඇරයුමක් ලැබුණා. එවකට බ්‍රසීලයේ ජීවත් වූ අපේ ඥාතීන් ගැන මං ඔබට කිව්වා. වෙරෝනිකා නැන්දා හා ඇගේ සැමියා මේ වෙනකොට මියගිහින්. මගේ ඥාති සොහොයුරා හැරී ජේකොබ් පමණයි බ්‍රසීලයේ ජීවත්වුණේ. ඔහු තමා අයියාට එහේ එන්න කියලා ආරාධනය කළේ. ජේකොබ් පදිංචිව හිටියේ පර්නම්බුකෝ

 http://sherlockholmesinvestigations.blogspot.com

ප්‍රදේශයේ. එම ප්‍රදේශයේ පොළොවේ රත්‍රන් ඉල්ලම් මතුවෙලා කියල ආරංචියක් පැතිර ගියාලු. මිනිස්සු තැනින් තැන පොළොව හාරමින් රත්‍රන් හොයල තියෙනවා. ඇමෙසන් ගං ඉවුරේ හැරී ජේකොබ් සතු ඉඩමෙත් පොළොව හාරා ඉල්ලම් ගැන පරීක්ෂා කළාලු. ඔහු අපේ අයියාට එහේ එන්න කියල ඇරයුම් කළෙත් ඒවා ගැන හොයන්න. නමුත් මට ඒ කාලයේම බ්‍රසීලයේ සිට අයියා ලියුමක් එවා තිබුණා. ඔහු කියා තිබුණේ වෙනත් නොවටිනා ලෝහයකට මිනිසුන් රත්තරන් කියා රැවටී ඇති බවයි. ඊට මාසයකට පමණ පසු බ්‍රසීලයේ සිදුවූ හදිසි අනතුරකින් වර්නන් මියගියා"

"දෙවියනේ! ඒ කොහොමද?"

"අප දන්නේ බ්‍රසීලයෙන් දන්වා එවා තිබූ තොරතුරු පමණයි." මාෂල් කීය. "පර්යේෂණ කටයුතු සඳහා වර්නන් සහ තවත් අය ඇමෙසන් ගඟේ ඉහළට යාත්‍රාකරල තියෙනවා. ඔවුන් ගිහින් තියෙන්නේ වාෂ්ප බලයෙන් ක්‍රියාකරන බෝට්ටුවකින්. ප්‍රධාන ගංගාවෙන් හැරිලා අතුගංගාවක් දිගේ බොලිවියාව පැත්තට යාත්‍රා කරද්දී ගඟ මැද්දී බෝට්ටුව පෙරළී ගිය බවයි ආරංචිය. අයියාත් ඔහුගේ උදව්කාරයින් දෙදෙනාත් ගඟේ ගිලී ජීවිතක්ෂයට පත්වූ බව අපට දැනගන්න ලැබුණා. එය පවා දන්වා එව්වේ අපේ ඥාති සොහොයුරා හැරී. මේ ගැන හොයා බලන්න බ්‍රිතාන්‍ය තානාපති කාර්යාලය කිසිදු උනන්දුවක් දක්වූයේ නැහැ."

"වර්නන්ගේ දරු පවුල?"

"ඔහු විවාහවෙලා හිටියේ නැහැ."

"ඔහුගේ මරණය සිදුවෙලා දැන් කොච්චරම් කාලයක් වෙනවද?"

"අවුරුදු දෙකක් විතර වුණා"

"සොහොයුරන් දෙදෙනාම අකාලයේ මියයාමෙන් ඔබ වැටුණේ ලොකු අමාරුවක. එහෙම නේද?"

"ඒක ඇත්ත වොට්සන්" මාෂල් කීය. "ඔවුන් ඉන්නා තුරු මට ජීවිතේ බරපතලක් තේරුණේ නැහැ. දැන් මං ඉන්නේ මහ අවුලක පැටලිලා. ඉතින් මං දැන් හදන්නේ මගේ අන්තිම තුරුම්පුවත් ක්‍රීඩා කරන්නයි"

"ඒ මොකක්ද?"

"බ්‍රසීලයේ අපේ ඥාති සොහොයුරා හැරී ජේකොබ් ගැන මං ඔබට දැන් කිව්වේ." මාෂල් කීය. "ඔහු මීට මාස හයකට පමණ කලින්

http://sherlockholmesinvestigations.blogspot.com

බ්‍රසීලය අත්හැර දමා එංගලන්තයේ පදිංචියට ආවා. ඔහු සෆෝක් ප්‍රාන්තයේ ඉඩම් මිලට ගෙන එහි පදිංචිවුණු බව මට ආරංචිවුණා. හැබැයි මට ආරාධනයක් නොකළ නිසා මං ඔහු හමුවෙන්න ගියේ නැහැ. මං බලාගෙන හිටියා ඔහු මට ලිපියක් එවාවි කියල. එවැන්නක් ලැබුණෙත් නැහැ. අන්තිමට මං ඔහුට ලියුමක් යැව්වා. මට ඔහු හමුවීමට අවශ්‍ය බව කියමින්. ඒකට පිළිතුරක් ලැබුණේ මාසයකට විතර පස්සෙයි. ඒ ලියුමෙ ඔහු මට සාදරයෙන් ඇරයුම් කර තිබුණා, සතියක පමණ කාලයක් ඔහුගේ ගෙදර නැවතී යන්න එන්න කියලා. ඒ ඇරයුම පිළිගෙන මං එනබව කියලා ඔහුට අද විදුලි පුවතක් යැව්වා. හෙට මං එහේ යන්නයි බලාපොරොත්තු වෙන්නේ"

"සෆෝක්හි කොහේද ඔහු පදිංචි වෙලා ඉන්නේ?"

"ඔහු මිලට ගත් ඔතුයාය ග්‍රේලන්ඩ්ස් බවයි කියල තියෙන්නේ" මාෂල් කීය. "ඒක තියෙන්නේ ක්ලිප්ටන් ඔන් ද මාෂ් ගම්මානයට නුදුරුවලු. මට යන්න වෙන්නේ දුම්රියෙන් ඉප්ස්විච් හරහා............"

"ඉප්ස්විච්?" මට කියැවිණ. "මගේ බිරිඳගේ බාප්පා ඉන්නෙත් ඉප්ස්විච්වල. ඔහු කාලයක් එහි දුම්රියපොළේ ස්ථානාධිපති ලෙස සේවය කළා. දැන් නම් විශ්‍රාම අරගෙන. දැන් ඔවුන්ගේ පුත්‍රයා සමග මෝස්ටන් යුවළ පදිංචි ඉපස්විච් දුම්රියපොළ කිට්ටුවමයි"

"වොට්සන්. ඔබේ බලාපොරොත්තුවක් නැද්ද ඔවුන් බලන්න යන්න?"

"මේරිගේ අවමඟුල වෙනුවෙන් ඔවුන් ඇවිත් ලන්ඩනයේ දින කීපයක් නැවතී ඉඳලයි ගියේ" මම කීවෙමි. "මේරි ඇගේ නෑදෑයින්ව හුගක් ළඟින් ආශ්‍රය කළා. ඉතින් ඇගේ බාප්පාත් මට ඇරයුම් කරලයි තියෙන්නේ, වෙලාවක එහේ ඇවිත් යන්න කියලා"

"විශිෂ්ටයි. යමු මා එක්ක" මාෂල් යෝජනා කළේය.

"ඒත් මං කොහොමද එක පාරටම එහෙම යන්නෙ?" මම ඇසීමි. "ඔවුනට කලින් දන්වන්නෙත් නැතුව?"

"අදම විදුලිපුවතක් යවන්න. හෙට දවාලට එනවා කියල දන්වන්න"

"එය නොලැබුණොත්? නැත්නං ඔවුන් ගෙදර නොහිටියොත්?"

"ප්‍රශ්නයක් නෑ" මාෂල් කීය. "එහෙම වුණොත් වොට්සන් එන්න මා එක්ක ග්‍රේලන්ඩ්ස් වත්තට යන්න. මගේ ඥාති සොහොයුරා

 http://sherlockholmesinvestigations.blogspot.com

බොහොම කැමති වේවි ඔබව දැනහඳුනාගන්න. තවත් එක්කෙනෙක් නවතින්න ආවා කියල ඔහුට ප්‍රශ්නයක් වෙන එකක් නෑ"

"ඔය ජේකොබ් මහත්මයා මොන වගේ ව්‍යාපාරයක යෙදෙන කෙනෙක්ද?"

"ඔහු දීර්ඝ කාලයක් බ්‍රසීලයේ ඉඳලා විශාල මුදලක් උපයාගෙන ආව බව නම් මම දන්නවා" මාෂල් කීය. "ඒත් ඔහු මුදල් ඉපයීමට කළ රක්ෂාව මොකක්ද කියලා නම් මම දන්නේ නැහැ. වර්නන් මට ඒ ගැන කියල එවල තිබුණෙත් නැහැ. මට නිකමට හිතුණේ ඔහු රත්රන් හෝ වෙනත් ලෝහ වර්ග නිස්සාරණය මගින් මුදල් උපයන්න ඇති කියලයි. කොහොම වුණත් ඔහුට මුදල් හදල් නම් අඩුවක් නැතිව තියෙනවා පාටයි. නැත්නම් එකපාරටම ඔහු ලේලන්ඩ්ස් වතුයාය වැනි විශාල වත්තක් මිලට ගත්තේ කොහොමද? මොකද කියන්නේ? ඔබ එනවද මා සමග යන්න?

බිරිඳගේ මරණය ගැන හිත හිතා, ඒ ගැන ශෝක වෙවී ගෙදරටම වෙලා ඉන්න එපා වොට්සන්. ඒක අමතක කරන්න ඔබට කරන්න තියෙන්නේ කොහේ හරි ගමනක් යන එකයි. ඔබ එනවා නම් මටත් පාළු නැතිව යන්න පුළුවනි. ඔබ ඉප්ස්විච්වල නෑයින්ගේ ගෙදර නැවතුණත්, මාව බලන්න ලේලන්ඩ්ස්වලට ඇවිත් යන්න ඔබට පුළුවන් නේ."

"ඒ වුණත් මාෂල් එතකොට මං කොහොමද ඔබේ ගැටලුව ගැන හෝම්ස්ට දනුම් දෙන්නෙ? ඔහු ආපහු එනකොට මං ගෙදර නොහිටියොත් ඔහු හරි පුදුමයකට පත්වේවි."

"මගේ ගැටලුව විසඳීම තවත් දවස් දෙක තුනකින් එහාට ගියා කියල, ඒ හැටි වෙනසක් වෙන්නෙ නෑ වොට්සන්" මාෂල් කීය. "දැනටමත් මාස 4ක් ගතවෙලා නේ. මගේ මුදල් ප්‍රශ්නය ඉක්මනට විසඳාගන්න හැකිවුණොත් මං ඉක්මනටම ආපහු එනවා. ඔබ එනවා නේද හෙට උදේ මා එක්ක සෆෝක් යන්න?"

"තවත් ටිකක් කල්පනා කරල බලල මං තීරණයක් ගන්නම්" මම කීවෙමි.

"මං යන්නේ හෙට උදේ නවයයි කාලට ලිවර්පූල් වීදියේ දුම්රියපොළෙන් පිටත්වෙන දුම්රියේ. ඒ වෙලාවට ඔබ ඒවි කියල මං විශ්වාස කරනවා"

http://sherlockholmesinvestigations.blogspot.com

තවත් මඳ වේලාවක් මා සමග කතාබහ කරමින් සිටි ඔහු, මගෙන් සමුගෙන පිටවී ගියේය.

මේරිගේ බාප්පා වූ ජෙරාඩ් මෝස්ටන් හා ඔහුගේ බිරිඳ හර්මිනා දෙදෙනා, ඉතා කරුණාවන්ත අය වූහ. අප විවාහ වූ අලුත මේරි සමග ගොස් ඔවුන්ගේ නිවසේ නවාතැන් ගෙන ආ අවස්ථා කිහිපයක්ම මට සිහිවිය. එබැවින් නැවත වරක් එහි යාමට මට සිත්විය. හෝම්ස්ට කෙටි ලිපියක් ලියා තබා, මාෂල් කිං ගැන ද සඳහන් කොට, ඔහු සමග ඉප්ස්විච් වෙත යෑමට මම අන්තිමේදී තීරණය කළෙමි.

පසුවද උදයේ මා ලිවර්පූල් වීථියේ දුම්රියපොළ වෙත ළඟාවෙද්දී උදේ නවය පසුවී තිබිණ. මා බලාපොරොත්තුවෙන් සිටි මගේ මිත්‍රයා, නොඉවසිල්ලෙන්, වේදිකාවේ ඉහළ පහළ ඇවිදින අයුරු මම දුටුවෙමි. මම ප්‍රවේශපත්‍ර කවුන්ටරයට ළඟාවුණෙමි. මාෂල් කිං ගේ සුපරීක්ෂාකාරී දෙනෙතට මා හසු විය. ඔහු වහාම එතැනට දුව ආවේය.

"ඔබ අද එන බව මං දැනහිටියා වොට්සන්" ඔහු කීය. "මං පළමුවැනි පංතියේ ටිකට්පතක් ගත්තෙ, අද දුම්රියට සෑහෙන සෙනගක් ඉන්නවා"

මම දුම්රිය ප්‍රවේශපත්‍රය රැගෙන ඔහුට එකතුවීමි. විශාල සෙනගක් සිටියත් පළමුවැනි පංතියේ මැදිරියක අපටම වෙන්වූ කුටියක අසුන්ගැනීමට අපට හැකිවිණි.

"හෝම්ස් මහත්මයා ඊයෙ රෑ ආවෙ නැද්ද?" මාෂල් ඇසුවේ ඔහුගේ ඇඳුම් මල්ල ආසනයට ඉහළින් වූ රාක්කයට දමමිනි.

"නැහැ. මං ඔබට කිව්වෙ, හෝම්ස්ට ආපසු එන්න. තවත් දවස් තුනහතරක් ගතවේවි"

"එහෙනම් ඔබ මගේ ප්‍රශ්නය ගැන කියල ලියුමක් ලියල තියල එන්න ඇති?"

"මං දිග විස්තරයක් ලිව්වෙ නැහැ" මම කීවෙමි. "ඔබේ නම සහ ඔබ පැවසූ කාරණය සඳහන් කළා, ඔහුට මතක ඇති මර්වින් කිං මහත්මයාගේ මරණය. හෝම්ස්ගේ හොඳ සිරිතක් තියෙනවා මාෂල්. යම්කිසි අභිරහසක් විසඳීම ඔහුට භාරවුණත් නොවුණත්, ඔහු ඒ ගැන පුවත්පත්වල පළවෙන තොරතුරු කපලා පොතක අලවා ගන්නවා. ඒ නිසා සෑහෙන තරම් විස්තර දැනටමත් දන්නවා ඇති. නමුත් මං ඔබට කලිනුත් කිව්වා වගේ, ඔහු මේ පරීක්ෂණය

 http://sherlockholmesinvestigations.blogspot.com

භාරගන්නවාද නැද්ද කියන එක මට කියන්න බැහැ. අනිවාර්යයෙන්ම ඔබ ගිහින් ඔහු හමුවියයුතුයි."

ඉන්පසු අප දිගටම කතාබස් කළේ අප සමග පාසලේ එකට උගත් මිත්‍රයන් පිළිබඳවය. සමහරුන් උසස් නිලතලවලට පත්වී සිටි අතර තවත් සමහරුන් විදේශ ගතවී සිටි බැව් මට දැනගන්නට ලැබිණ. දහවල් එක පමණ වෙද්දී අපි අපේ ගමනාන්තයට ළංවෙමින් සිටියෙමු.

"මොකක්ද වොට්සන් දැන් ඔබේ සැලැස්ම?" මගේ මිතුරා විමසුවේය.

"මං ඊයෙ රෑම මෝස්ටන්ලට විදුලිපුවතක් යැව්වා" මම කීවෙමි. "වයසක ජෝඩුවක් නිසා මං හිතනවා ඔවුන් ගෙදර ඇති කියලා. එහෙම වුණොත් මට ප්‍රශ්නයක් වෙන්නෙ නෑ."

"හදිසියෙ නැතිවුණොත්?" මාෂල් ඇසීය. "ඔබ මේ ගමන ආවෙත් මං නිසා. මං කොහොමද ඔබට අතරමං වෙන්න ඇරලා මගේ ගමන කරන්නෙ? ඉප්ස්විච්වලදී මං එන්නම් ඔබ සමග මෝස්ටන්ලගෙ ගෙදරට?"

"ඒක හොඳයි" මම ඊට එකඟවීමි. "එයාලගෙ ගේ තියෙන්නෙත් දුම්රියපොළ කිට්ටුව. ඔබට පුළුවනි අත් ටිකක් බීලා ගමනේ ඉතිරි කොටසට පිටත්වෙන්න"

"අන්න හොඳයි" මාෂල් කීය. "මගේ බලාපොරොත්තුව එහේ සතියක් විතර ගතකරන්නයි. දවස් තුන හතරක් යද්දී පුළුවන් වුණොත් මං ඔබ හමුවෙන්න ඇවිත් යන්නම්. ඔහුගේ අකමැත්තක් නැත්නම් මට පුළුවනි, ඔබව එහි කැඳවාගෙන යන්න ග්‍රේලන්ඩ්ස් වතුයාය බලන්න"

මේරිගේ ඥතීන් වූ මෝස්ටන් පවුල වාසය කළේ, ඉප්ස්විච් දුම්රියපොළට සැතපුම් කාලක් පමණ දුරින් පිහිටි නිවසකය. කුලීරියක යාමටවත් අවශ්‍යතාවයක් නොතිබිණි. අප දෙදෙනා එහි ළඟාවන විටත් දෙමහල්ලෝ ආලින්දය වෙත පැමිණ මග බලාගෙන සිටියහ. ඔවුන් නිවසේ සිටිනු දැකීම මට සැනසිල්ලට කරුණක් විය. ඔවුන්නාවුන් හඳුන්වා දුන් පසු ග්‍රේලන්ඩ්ස් වතුයාය වෙත යාහැකි මාර්ගය මෝස්ටන් මහතාගෙන් විමසා සිටියෙමි.

"ක්ලිප්ටන්? ආ...... ඔය කියන්නේ මාෂ් ගංඉවුරේ තිබෙන කුඩා ගමක්." මෝස්ටන් මහතා කීය. "එතැනට යන්න තිබෙන පහසුම

http://sherlockholmesinvestigations.blogspot.com

ක්‍රමය ඉපස්විච්වලින් ශෙනාසම්බන්ධක දුම්රියේ ගමන් කිරීම. ඒකෙ හැතැක්ම පහක් ගියාම ඔබට හමුවෙනවා හැඩ්ලි දුම්රියපොළ. එතැනින් බැස්සාම හරි. වතුයායට මං හිතන්නේ හැතැක්ම දෙකක් තුනක් විතර ඇති. ඔබට කුලීරියක් අල්ලාගන්න වේවි"

"ඔබට ස්තුතියි මෝස්ටන් මහත්මයා" මාෂල් කීවේ වහාම පිටත්වීමට සූදානම් වෙමිනි.

"මහත්මයා. දැන් හොඳටම දවල් වුණා" මෝස්ටන් මහතා කීය. "දවල් කෑම සූදානම්. ඔබට දවල් කෑම ටිකක් ඉක්මනින් කාල යන්න වෙලා තියෙනවා. හැඩ්ලි යන ඊළඟ දුම්රියට තවත් විනාඩි හතළිස් පහක් විතර තියෙනවා" ඔහු කීවේ බිත්ති ඔරලෝසුව දෙස බලමිනි.

දහවල් ආහාරයෙන් පසු මාෂල් කිං අපෙන් සමුගත්තේ දින දෙක තුනකින් යළි පැමිණීමට පොරොන්දු දෙමිනි.

එම දින දෙක තුන ගතකර ගැනීම මට ඉතාම අපහසු විය. ඇගේ පුත්‍රයා රාජකාරි සඳහා පිටත්ව ගිය පසු මෝස්ටන් මහත්මිය කාලය ගතකළේ ආගමානුකූල කටයුතුවල යෙදෙමිනි. පුවත්පත් කියවීමේ රුසියෙකු වූ මෝස්ටන් මහතා දිගින් දිගටම ඒ වෙනුවෙන් කාලය ගතකළේය. ඒ අතරතුර ෂර්ලොක් හෝම්ස් යෙදුණු පරීක්ෂණ ගැනත්, අලුතින් අසන්නට ලැබෙන ලෙඩ රෝග ගැනත් මගෙන් විමසීමට ඔහු අමතක නොකළේය.

තුන්වැනි දිනයේ උදයේ නවයයි තිහ වන විට, මාෂල් කිං පොරොන්දුවුණු අයුරින්ම අප හමුවීමට පැමිණියේය.

"වොට්සන්. මං ඔබට කිව්වනේ දවස් දෙක තුනෙන් එනවා කියල? ඔන්න මං පොරොන්දු වුණු විදියටම ආවා" ඔහු කීවේ මෝස්ටන් මහතාට ද ආචාර කරමිනි.

"එහෙනම් අද දවල්ට කෑම ටිකක් කාලා, හවස් වෙන තුරු මෙහේ ඉඳල යන්න. ඔබේ නෑදෑයට පණිවුඩයක් යවන්න හැන්දෑවෙ දුම්රියේ එනව කියල" මෝස්ටන් මහතා කීය.

"ඔබට ස්තුතියි මහත්මයා" මාෂල් පැවසුවේ ඇරයුම පිළිගනිමිනි. "වොට්සන් එක්ක කථාකරන්න මට හුඟක් දේවල් තියෙනවා. ඒ හින්ද මං හිතාගෙන හිටියේත් හවස 3.10 දුම්රියෙන් යන්නයි"

අපට නිදහසේ කතාබහ කිරීමට ඉඩදී මෝස්ටන් මහතා එතැනින් ඉවත්ව ගියේය.

"කොහොමද මාෂල්? ඔබ හිතාගෙන ආව අරමුණ ඉටුවුණාද?" මම ඇසීමි.

 http://sherlockholmesinvestigations.blogspot.com

"මං හිතන්නේ සාර්ථකයි" මැෂල් කීවේ සිනාමුසු මුහුණෙනි. "මං ඔබට හැම දෙයක්ම කියන්නම් වොට්සන්.

මං මෙහෙන් ගිය දුම්රිය මගදී වැඩි ප්‍රමාදයක් නැතිව හැඩ්ලි වෙත ගියා. මං එන බව දන්වලා කල් ඇතුව මං ඔහුට විදුලිපුවතක් යැව්වා නෙ. නමුත් මා බලාපොරොත්තුවෙන් ඔවුන්ගේ අශ්වකරත්තයක් නම් දුම්රියපොළේ තිබුණේ නැහැ. පස්සේ මට දැනගන්න ලැබුණා. මගේ විදුලිපුවත ඔවුනට වෙලාවට ලැබිලා නැති බව. ඉතින් මං කුඩා කුලීරියක් අල්ලාගෙන ග්‍රේලන්ඩ්ස් බලායන්න පිටත්වුණා.

මං ගිය කරත්තයේ රියැදුරා හොඳ මනුස්සයෙක්. ඔහු කරත්තය දක්කුවේ දිගින් දිගටම මා සමග කතාබහ කරමින්. හැරී ජේකොබ් මගේ ඥාතියෙක් බව කිව්වාම ඔහු හරි සතුටට පත්වුණා. ඔහු කිව්වා, ජේකොබ් මහත්මයා ඇවිත් ගතවුණේ බොහොම ටික කාලයයි; ඒ වුණාට දැන් මේ පළාතෙම ඔහුගේ නම හරි ප්‍රසිද්ධයි කියලා.

ජේකොබ් ලොකු දානපතියෙක්ලු. අනාථ නිවාසවලට, වැඩිහිටි නිවාසවලට, මුදලින් හරියට ආධාර උපකාර කරනවලු. ප්‍රදේශයේ පාසල් ළමයින් යනවලු ඔහුගේ වතුයාය නරඹන්න. ඔවුනට පමණක් නොවෙයි අමුත්තන්ටත් ඔහුගේ වතුයාය බලන්න ඉඩදෙනවලු.

"රියැදුරු උන්නැහේ" මම කිව්වා. "ඔහු මගේ ඥාතියෙක් වුණාට ජේකොබ් මහත්මයා මට තවම හමුවෙලාවත් නැහැ. මෙහේ පදිංචියට ආව ඉක්මනින් මොකද ඔහු නිර්ලෝභී දානපතියෙක් වුණේ? ඇත්ත තත්ත්වය ඒක නම් එය මටත් සන්තෝෂයට කාරණයක්"

"එහෙම වෙන්න හේතුව අපිටත් හිතාගන්න බැහැ මහත්මයා" රියැදුරා කිව්වා. "බාගවෙලාවට ඊළඟ මැතිවරණයේදී, ඡන්දඅපේක්ෂයෙකු හැටියට ඉදිරිපත්වෙන්න ඔහුගේ අදහසක් තියෙනවාද දන්නෙ නෑ"

රියැදුරාගේ විහිළු කතාවට හිනාවෙමින් අපි ඉදිරියට ගියා. මගේ අවධානය ඊළඟට යොමුවුණේ පාර අයිනේ දුරකතන කම්බියක හිටි අලංකාර කුරුල්ලෙකු වෙත.

"මේ වර්ගයේ අලංකාර කුරුල්ලෙක් එංගලන්තයේදී මං කවදාවත් දැකල නැහැ. මොකාද මේ කුරුල්ලා?" මං රියැදුරාගෙන් ඇහැව්වා:

http://sherlockholmesinvestigations.blogspot.com

"මහත්මයා" ඔහු පිළිතුරු දුන්නා. "ඔය කුරුල්ලා අයිති, ඔබ දූත් මේ හමුවෙන්න යන මහත්මයාට"

"ඒ කොහොමද?" මං ඇහුවේ පුදුමයෙන්.

"නොයෙක් වර්ගවල විදේශික සතුන් ගෙනැවිත් මෙහේ ඇති කිරීම ජේකොබ් මහත්මයාගේ විනෝදාංශයක්" රියැදුරා කිව්වා. "ඔහු බ්‍රසීලයේ ඉඳලා එද්දී අරගෙන ආව නොයෙක් වර්ණ හා ප්‍රමාණවල කුරුල්ලන් ගණන අප්‍රමාණයි. උන් සමහරක් ඉන්නේ කූඩුවල දමලා. අනික්වුන් නිදහසේ අහඇරලා ඉන්නවා. එයින් එකෙක් තමා අපි ඔය දුටුවේ"

"කුරුල්ලන් විතරද ඔහු ඇතිකරන්නේ?" මං ඇහුවා.

"නැහැ නැහැ." රියැදුරා කිව්වා. "තවත් හුගාක් සත්තු ඉන්නවා. ගිහින් බලන්නකො. තව හැනැක්ම කාලක් යද්දි අපි ශ්‍රේලන්ඩ්ස් වතුයායේ ප්‍රධාන ගේට්ටුවෙන් ඇතුළුවෙනවා. එතකොටත් ඔබට දකගන්න ලැබේවි සෑහෙන තරම් සතුන්"

වතුයායේ ගේට්ටුවෙන් ඇතුළුවෙලා අපි වංගු සහිත මාර්ගයේ කන්ද උඩට ගමන් කළා. රියැදුරා කියූ කතාව ඇත්තක් බව මං වැඩිදුර යන්න කලින් තේරුම් ගත්තා. සුදුතිත් වැටුණු මුවන් වර්ගයක් රංචු වශයෙන් වත්තේ ගැවසුණා. වල් ඌරෙකුට සමාන එහෙත් ඒ තරම් රෞද්‍ර නැති සතෙක්, තවත් තැනක පොළොව හාරමින් සිටියා. ඊට අමතරව සිරුරම කොරපොතුවලින් වැසුණු ආමඩිලෝවෙක්, මුළු සිරුරම කහපැහැති පිහාටුවලින් වැසුණු ලොකු කුරුල්ලෙකු හා සත්වෝද්‍යානවල පමණක් දකින දඬුලේනෙකුත් මට දකින්න ලැබුණා.

අශ්වකරත්තය මැඳුරේ මිදුලට ළඟාවෙද්දියි මට ඔහු දකින්න ලැබුණේ. මගේ ඥාති සොහොයුරු හැරී ජේකොබ් ඔහුගේ මැඳුරේ ප්‍රධාන දොරටුව අසල බලාගෙන හිටියා.

"මං ඔබව සාදරයෙන් පිළිගන්නවා මගේ හිතවත් මාෂල්" ඔහු කිව්වේ මගේ අත්දෙකතම්ම අල්ලාගනිමින්. "මං දූක්කා හැනැක්ම බාගයක් පමණ ඈත මේ කරත්තය මේ පැත්තට එන හැටි. ඔබගෙන් විදුලිපුවතක් නොලැබුණත් මං හිතුවා ඒ ඔබ වියයුතුයි කියලා. ඉතින් කොහොමද සැප සනීප? ඔබට මහන්සි ඇතිනේ. අපි තේ ටිකක් බීලම කතාකරමු"

 http://sherlockholmesinvestigations.blogspot.com

"ඔය කුරුල්ලා අයිති අපි දැන් කතාකළ ජේකොබ් මහත්මයට"

http://sherlockholmesinvestigations.blogspot.com

මගේ නෑදෑයා අවුරුදු හතලිස් පහක් පමණ වයස කෙනෙක්. ඔහුගේ මුහුණේ තිබුණේ ඉතාම ප්‍රසන්න සුහද බවක්. ඔහු උසින් අඩුයි. අඩි පහකට වඩා ඕනෙ නම් අඟල් දෙකක් උස ඇති. උෂ්ණ කලාපික රටක දීර්ඝ කාලයක් ජීවත්වීම නිසා අව්වට පිළිස්සුණු ඔහුගේ මුහුණ, දුඹුරු පැහැයට හැරිලයි තිබුණේ. එහි පුංචි පුංචි රැළි හා කැළැල් දහස්ගණනක් මා දුටුවා. වැවිලිකරුවන් අඳින මෝස්තරයට ඔහු සුදු ෆ්ලැනල් ඉරෙද්දෙන් මැසූ ඇඳුම් කට්ටලයකින් සැරසී හිටියා. හිසේ දමාගෙන හිටියේ පැනමා මෝස්තරයේ හිස්වැස්මක්. මේ වගේ ඇඳුමකින් සැරසුණු කෙනෙක් අපට දකින්න ලැබෙන්නේ මෙක්සිකෝවේ නැත්නම් දකුණු ඇමරිකාවේ මිස එංගලන්තයේ නොවෙයි නේද කියලා මට එක්වරම හිතුණා.

"ජෙසිකා! ජෙසිකා!" ඔහු කෑගැසුවේ ආපසු හැරී නිවස දෙස බලමින්. "මෙන්න අපේ අමුත්තා ඇවිත් ඉන්නවා - මගේ ඥාති සහෝදරයා මාෂල්. ග්‍රේලන්ඩ්ස් වෙත පැමිණි ඔබ සාදරයෙන් පිළිගන්නවා. මහත්මයා. කිසිකෙනෙකුත් නොඑන මේ වගේ පාළු ගම්බද පළාතකට පැමිණීමෙන් ඔබ අපට කළේ විශාල ගෞරවයක්"

ඔහුගේ ආචාරශීලී ප්‍රසන්න ස්වභාවය මගේ හිතේ ඇතිකළේ ලොකු සැනසීමක්. ඒ වගේම සතුටක්. නමුත් ඔහුගේ කැඳවීමෙන් එතැනට ආවේ ඔහුට වඩා සම්පූර්ණයෙන්ම වෙනස් විධියේ චරිතයක්. කෙට්ටු උස ගැහැනියක වුණු ඇයට තිබුණේ ඉතාම අප්‍රසන්න පෙනුමක්. ඇතුළට ගිලා බැහැණු ඇස්දෙක නිසාත්, සිරුර මඳක් කුදුවීම නිසාත් ඇයට තිබුණේ දුෂ්ට පෙනුමක්. ඇය බ්‍රසීල ජාතික කාන්තාවක වෙන්න ඇති කියා මං අනුමාන කළා. නමුත් හොඳට ඉංග්‍රීසි කථාකරන්න ඇයට හැකියාව තිබුණා. මං දුටුවා කියල ඇගේ මුහුණේ ආචාරශීලී සිනාවක් නම් මතුවුණේ නැහැ. ඒ, ඇය අපේ රටේ සිරිත්විරිත් දන්නේ නැති නිසා වෙන්න ඇති කියලයි මට හිතුණේ. ඒ කොහොම වුණත්, ඒ වෙලාවෙත් පසුවත් මට එක කාරණයක් හිතාගන්න පුළුවන් වුණා. ඒ මොකක්ද? ග්‍රේලන්ඩ්ස් මන්දිරයට ඇය නම්, මා සාදරයෙන් පිළිනොගන්නා වග. ඇය කථා කළ වචනවල නම් තිබුණේ විනීත බවක්. ඒ වුණත් ඇගේ හිතේ තිබුණු අදහස්, කළු පැහැති දෙනෙතේ ලියැවී තිබුණා. ඒ පණිවුඩය මං තේරුම් ගත්තා. එයින් කියැවුණේ මා හැකි තරම් ඉක්මනින් ආපහු ලන්ඩනයට යනවා නම් ඇය කැමැති බව.

 http://sherlockholmesinvestigations.blogspot.com

හමුත් මං මුහුණපාල තිබුණු ප්‍රශ්නය ඇය දන්නේ නැහැනේ. මං හතර අතට ණයවෙලා; ජීවත්වීම සඳහා තවත් ණයක් ගන්න බැරුව අමාරුවේ වැටිලයි ඉන්නේ. මගේ මේ ධනවත් ඥතියා ත්‍යාගශීලී පුද්ගලයෙක් බවත් මට අහන්න ලැබුණා. ඉතින් ඔහුගේ බිරිඳ කොයි තරම් අකාරුණික වුණත්, මට ඔහු අත්හරින්න හැකියාවක් නැහැ. ඔහු හැර මට වෙන පිහිටක් නැහැ. හැරී ජේකොබ්ගේ තිබෙන ළබැඳි සුහද බව නිසා, ඔහුගේ බිරිඳ ගැන මට අමතක කරන්න පුළුවන් නේද කියලයි මට හිතුණේ.

ග්‍රේලන්ඩ්ස් හි මං ගතකරපු දින කිහිපය මට ඉතාම සැපවත් එකක් කරන්න, හැරී නොකළ දෙයක් නෑ. ඔහු මට දීල තිබුණේ සියලු සැපපහසුකම්වලින් පිරුණු ඉතාම අනර්ඝ කාමරයක්. "ඔබේ සතුටට හේතුවෙන තව ඕනෑම දෙයක් ගැන කියන්න, මොහොතකටවත් මැලිවෙන්න එපා සහෝදරයා" කියලයි ඔහු මට කිව්වේ. ඔහු හිස් චෙක්පතක් අත්සන් කරලා දුන්නා නම්, මං ඒ තරම් සතුටුවෙන වෙනත් දෙයක් නැහැ. ඒ බව කියන්න මගේ දිව අගටම ආවා. ඒත් ආයෙමත් මට හිතුණේ එවැනි කතාවලට තවම කලින් වැඩියි කියලයි. අපි තවම හඳුනාගත්තා පමණයි නේ.

රාත්‍රී භෝජනය ඉතාම ප්‍රණීත එකක් වුණා. එවැනි රසවත් කෑමවේලක් මට කන්න ලැබුණේ බොහොම කාලෙකින්. කෑමෙන් පසු බොන්න කෝපි සහ දුම්පානයට ඔහුගේ ඉස්තරම් හවානා සුරුට්ටු ලැබුණා. මේ කෝපි බ්‍රසීලයේ ඔහුටම අයත් වතුයායක විශේෂයෙන් වැවූ ඒවා බව හැරී මට කිව්වා. මට හිතුණේ මං ආව අශ්වකරත්තයේ රියැදුරා, හැරී ජේකොබ් ගැන කළ වර්ණනාව සම්පූර්ණ සත්‍යයක් කියලයි. මේ තරම් කරුණාවන්ත, ත්‍යාගශීලී ප්‍රසන්න මනුෂ්‍යයෙක් මට කවදාවත් හමුවෙලා නැහැ.

ඔහු කොතරම් කාරුණික ප්‍රසන්න කෙනෙක් වුණත්, වෙලාවකට බොහොම තදින් කේන්ති යන තද හිතක් ඇති පුද්ගලයෙක් බව තේරුම් ගන්නත් මට අවස්ථාවක් උදාවුණා. ඒ පහුවදා - ඒ කියන්නේ ඊයෙ උදේ. මං ඔබට කිව්වා ඔහුගේ බිරිඳ ජෙසිකාගේ ස්වභාවය. ඊයේ උදේ කෑම මේසෙදි ඇය හැසිරුණේ මට අපහාස වෙන තරම් නින්දිත ආකාරයට. ඇගේ සැමියා කෑම කාමරයෙන් එළියට ගිය වෙලේ ඒක වඩාත් කැපී පෙනුණා.

"ලන්ඩනය බලායන්න පහසුම දුම්රිය තියෙන්නේ දෙළහයි කාලට" ඇය කිව්වා.

http://sherlockholmesinvestigations.blogspot.com

"ඒ වුණාට අද ආපහු-යන්න, මගේ බලාපොරොත්තුවක් නැහැ" මං පිළිතුරු දුන්නා. මේ ගෑනිට මාව එළවා දමන්න ඉඩ නොදී, මාත් ටිකක් සැරපරුෂ වෙන්න ඕන කියල මං ඒ විධියට කිව්වේ.

"ඔහෝ එහෙමද? එහෙනම් ඉතින් ඒක ඔහේගේ වැඩක්" ඇය අපහාසාත්මක තාලෙන් මට කිව්වේ ඇස්දෙකෙන් කුරිරු බැල්මක් හෙළමින්.

"සැකයක් නෑ" මං කිව්වා. "ඔහුගේ හරු නැලකිලි ඉක්මවා මං මෙහේ රැඳී ඉන්නවා නම්, ජේකොබ් මහත්මයා මට ඒ බව කියාවී. එතකොට මං යන්නම්"

"මොකක්ද ප්‍රශ්නේ? මොකක්ද ප්‍රශ්නේ?" හැරී කාමරයෙන් පිටත සිට කෑගහනවා මට ඇහුණා. ඊළගට ඔහු මොහොතින් ආවා කාමරය ඇතුළට. මගේ කටින් පිටවුණු අන්තිම වචන ටික ඔහුට ඇහෙන්න ඇති. අපි දෙන්නාගේ මූහුණු දිහා බැලුවාම ඔහු ඉතිරි හරිය තේරුම් ගන්න ඇති. ඔහුගේ මූහුණ එක් ක්ෂණයකින් කෝපා විෂ්ඨව වියරු වුණා.

"මාෂල්. ඔබට මොහොතකට මේ කාමරයෙන් එළියට යන්න පුළුවන්ද?" ඔහු ඇසුවා.

මං එළියට ගිය විගාම ඔහු කාමරයේ දොර වසා දැමුවා. ඊළගට මට ඇහුණා ඔහු ඇයට තදින් බැණවදින හැටි. ඔහුගේ ආගන්තුක සත්කාරයට අපහාස වන විධියට ඇයගේ තිබූ හැසිරීමෙන්, ඔහු කෝපයට පත්වුණු එකේ පුදුමයක් නැහැ. ඔවුන්ගේ කතාවට කන්දෙන්න මං එතැන රැඳී හිටියේ නැහැ. මං මිදුලේ තණ පිට්ටනිය දිහාවට ඇවිදගෙන ආවා. මිනිත්තු කුනාහතරකට පසු කවුරුන් හෝ මා පිටිපස එන අඩිශබ්දයක් මට ඇහුණා. ආපහු හැරිලා බැලූ මට දකින්න ලැබුණේ ජේකොබ් මහත්මියයි. ඇගේ මුහුණ හොඳටම සුදුමැලි වෙලා. රතුවෙලා තිබුණු දෙනෙත්වලින් කඳුළු වැගිරුණා.

"මගේ සැමියා කිව්වා ඔබෙන් සමාව අයදින්න කියලා" ඇය කිව්වේ බිම බලාගෙන.

"ඔය ගැන එක වචනයක්වත් කියන්න උවමනා නැහැ ජේකොබ් මහත්මිය. ඕක සුළු දෙයක්" මං කිව්වේ තරහ අමතක කරමින්.

ඇගේ කළුපැහැති ඇස් මිළගට මං දිහාවට යොමුවුණා. ඒ දෑස්වලින් නිකුත්වුණේ ගිනිදැල් කියලයි මට හිතුණේ.

"උඹ මහා මෝඩයෙක්!" කියූ ඇය, නාසයෙන් පිම්බෙ සතෙකු පිඹින්නාක් වැනි විලසින්. ඊළගට ආපසු හැරී ඇය ගේ දිහාවට ඉක්මනින් ඇවිදගෙන ගියා.

 http://sherlockholmesinvestigations.blogspot.com

මේක මගේ මුහුණටම කළ ලොකු අපහාසයක්. මට එක්වරම කිසිවක් කථාකරගන්න බැරිවුණා. මේ හැසිරීමට හේතුවත් තේරුම් ගන්න බැරිව මං ඇය ගිය දිහාවම බලාගෙන හිටියා. මේ මොහොතේ හැරී ගේ තුළ ඉඳලා මා සිටි තැනට ආවේ සතුටු සිනාවකින් මුව සරසාගනිමින්.

"මගේ බිරිඳ ඇගේ කටින් පිටකළ නපුරු වචනවලට ඔබෙන් සමාව ඉල්ලුවාද මාෂල්?"

"ඔව් ඔව්"

මගේ අතින් අල්ලාගත් ඔහු මිදුලේ ඉහළ පහළ ඇවිදින්න පටන් ගත්තා.

"ඇය කී දේවල් හිතට ගන්න එපා මාෂල්" හැරී මට කීවේ ආයාචනාත්මක හඬකින්. "ඔය වචනවලට හිත රිදවා ගෙන ඔබ මෙහේ ඉන්න කාලය එක පැයකින් හරි අඩු කළොත්, ඒක මගේ හිතට ලොකු වේදනාවක් වේවි. බලාගෙන ගියාම මේ කාරණා ගැන ළඟම නෑදෑයින්ට හංගන්න වැඩකුත් නෑ. මගේ බිරිඳ පුදුමාකාර ඊර්ෂ්‍යාවයි. ඇය හා මා අතරට කිසිම මනුස්සයෙක් එනවාට ඇය කැමති නැහැ. ඒ මනුස්සයා ගැහැනුද, පිරිමිද කියන එක ඇය තකන්නේ නැහැ. එක් මොහොතකට හරි මගේ අවධානය ඇයට නැතුව වෙන කෙනෙකුට යොමු කළොත් ඇය තදින් කෝපවෙනවා. ඇයට ගැළපෙන විදියට අපට ජීවත්වෙන්න සුදුසු කොහේද දන්නවද? වෙනත් කිසිම මනුස්සයෙක් නැති පාළු දූපතක. මට කියන්න මාෂල්. ඔබ ඒ කාරණය ගැන තවත් හිතන්නෙ නැහැ නේද?"

"නැහැ. නැහැ. මං ඒක අමතක කළා" මං පිළිතුරු දුන්නා.

මාෂල් කිං මට මේ විස්තරය කියමින් සිටියදී දහවල් කෑම වෙලාවද ළංවී තිබිණි. එහෙත් ඔමුත්තා කථාව නවත්වන ලකුණක් නොවූ නිසාදෝ, මෝස්ටන් මහතා පැමිණ කෑමට ඇරයුම් කළේය.

"ඔබ දෙදෙනාට ලොකු කතාබහක් තිබෙන බව පෙනෙනවා මහත්මයා" මෝස්ටන් මහතා කීය. "ඒ වුණත් දැන් දවල් වුණා. බඩගිනි ඇති නේ. කෑම කාල ඉඳිමු" කෑම කන අතරේ අපේ කතාබහට මාතෘකාව වූයේ රටේ දේශපාලන තත්ත්වයයි. කෑමවේල අවසන් කිරීමෙන් පසු අපි යළිත් වරක් විසිත්ත කාමරයේ සුවපහසු අසුන්වල හිඳගත්තෙමු. අපට නිදහසේ කතාබහ කිරීමට ඉඩසලස්වා ගෙහිමියා එතැනින් ඉවත්ව ගියේය.

http://sherlockholmesinvestigations.blogspot.com

"...... මගේ අතින් අල්ලාගෙන ඉහළ පහළ ඇවිදිමින් කතාබහ කළා"

Reading Purpose Only.. Not For Print.
http://sherlockholmesinvestigations.blogspot.com

"ඉතින් ඔබේ මුදල් ප්‍රශ්නය විසඳාගන්න හැකිවුණාද මාෂල්?" මම ඇසුවෙමි.

"ඔහොම ඉන්න වොට්සන් කියනු තුරු" මාෂල් කීය. "මං තවමත් එතැනට ආවෙ නැහැ.

මං කිව්ව නේ ඊයෙ උදේ අප අතර ඇතිවුණු කතාබහ? ඔව්. ඊළඟට හැරී මට මෙහෙම කිව්වා.

"මාෂල් දැක්කෙ නැහැනෙ මගේ වනසතුන් එකතුව. කැමතිද ඒක බලන්න?"

"බලමු. බලමු. මටත් ආසයි බලන්න"

"එහෙනම් මේ සුරුට්ටුව දල්වා ගන්න. එන්න මේ පැත්තෙන්" කියූ ඔහු වත්ත පහළට මාව කැඳවාගෙන ගියා. මුළු උදේ වරුවම ගතවුණේ ඒකට. ඔහු බ්‍රසීලයෙන් ගෙනැවිත් තිබුණා පුදුමාකාර සතුන් ප්‍රමාණයක්. පක්ෂීන්, උරගයින්, සිව්පාවුන් විශාල එකතුවක්. මං හිතන්නේ ඇමේසන් වනාන්තරයේ ඉන්නා අලංකාරම පක්ෂීන්, දුර්ලභම උරගයින් එතැන හිටියා. කුඩුකර සිටි දුර්ලභ සිව්පාවුන් නම් ගණනින් අඩුයි. නමුත් උන් හැම එකෙක්ම එංගලන්තයේ සත්වෝද්‍යානවල දකින්න නොලැබෙන දුර්ලභ එවුන්. සමහර සතුන් වත්ත පුරා ඇවිදිමින් හිටියා. සමහරුන් කූඩුවල. සමහර කුරුල්ලන් හා ක්ෂීරපායින් ඔහුගේ නිවසෙත් නිදහසේ ගැවසුණා. මේ සතුන් පිළිබඳ විස්තර ඔහු මට කිව්වේ හරි ආශාවකින්. සමහර සතුන් අල්ලා ගන්න ඔහු වින්ද දුක්කරදර. නවත් සමහර සතුන් මිලට ගන්න ගෙවූ විශාල මුදල් ප්‍රමාණ, ආදී ඔහුගේ ජයග්‍රහණ, පරාජයන් මට විස්තර කළා. අප ඇවිදගෙන වත්ත පහළට ගමන් කරද්දී සමහර හීලෑ කුරුල්ලන් පියාඹාගෙන ඇවිත් ඔහුගේ උරහිසේ වැහුවා. සමහර සතුන් දුවගිහින් පඳුරු අතරේ හැංගුණා. මේව දකල ඔහුට සතුටෙන් කෑගැහුණේ පුංචි ළමයෙකුට වගේ.

"මාෂල්. ඔබ කැමැතිද මගේ සතුන් එකතුවේ ඉන්න වටිනාම, අලංකාරම සත්ත්වයා දකින්න?" හැරී ඇසුවේ මඳකට නැවතෙමින්.

"ඔව්. මං කැමතියි"

"එහෙනම් අපි යමු මේ පැත්තට" කියූ ඔහු මාව කැඳවාගෙන ගියේ වත්ත පහළට. ඒක නිවසට තරමක් දුරින් සෑදූ වෙනම අංගනයක් බව මට පෙනුණා.

කුඩා තණබිමක් මැදින් ගමන් කළ මට දකින්න ලැබුණේ, ගඩොලින් හා සිමෙන්තියෙන් තැනූ වෙනම ගෙයක් වගේ එකක්.

http://sherlockholmesinvestigations.blogspot.com

එය දිගින් අඩි විස්සක් පමණ. පළලින් අඩි දහසයක් පමණ. තරප්පු දෙකක් නැගලා අප පිවිසුණේ එහි ආලින්දයට. ඒ ළඟම තිබූ ඉදිරි බිත්තියේ දකුණු පැත්තේ තිබුණා, හතරැස් කොටු සිටින සේ යකඩකූරුවලින් හැදූ උස දොරක්. බිත්තියේ වම්පැත්තේ තිබුණා පියන එහා මෙහා තල්ලු කළ හැකි ලෑලි ජනේලයක්. ඒ ළඟම බිත්තියට සවිකළ යකඩ රෝදයක්. රෝදය වටේ ගිය ශක්තිමත් යකඩ තේඩාවක් බිත්තියේ තිබුණු සිදුරු දෙකකින් ඒ වසා තිබූ කාමරයට ඇතුළු වුණා.

"මං ඔබට දැන් පෙන්වන්න හදන්නේ මගේ සතුන් එකතුවේ වටිනාම මාණික්‍යය" ඔහු කිව්වා. "මූ ඇණරන්නට මේ වර්ගයේ සතුන් මුළු යුරෝපයේම ඉන්නේ තවත් එකෙක් පමණයි. රොටර්ඩෑම් සත්තුවත්තේ තවත් එකෙක් හිටියා. නමුත් ඌ ළඟදී මියගියා. ඔබ කැමැතිද මේ සතා බලන්න? එහෙනම් ඔය ලෑලි ජනෙල් පියන වම් පැත්තට තල්ලුකරන්න"

ඔහු කියූ ආකාරයට මම ජනෙල් පියන තල්ලු කළා. මට දකින්න ලැබුණේ විශාල හිස් කාමරයක්. පොළොව සිමෙන්තියෙන් තනා තිබූ එහි, ඈත කෙළවරේ බිත්තිවල යකඩකූරු සවිකළ ජනේල තිබුණා.

මුලින් හිස් වගේ තිබුණාට ඊළඟට මං දුටුවා ඌ කාමරය මැද ඉන්නා හැටි. කාමරය ඇතුළටම ගොඩින් හිරු එළිය වැටී තිබුණු තැනක, ඌ බිම වැතිරී අව්ව තපිමින් හිටියා.

"මූ තමයි බ්‍රසීල ව්‍යාඝ්‍රයා!" ඔහු කිව්වේ හරිම සතුටෙන්. "ඉතාම අලංකාරයි නේද?" ඌ බළල් පවුලට අයත් කොටියෙකු තරම් ඉතා විශාල සතෙකු බව මං දුටුවා. ඌගේ පාට ඔප දැමූ කළුවර ලීයක් මෙන් කළුම කළු පාටයි.

"අලංකාරයි නේද?" මගේ ඥාතියා යළිත් ඇහුවා.

"ඇත්තෙන්ම ඔව්" මම පිළිතුරු දුන්නා. "මේ වගේ ලස්සන සතෙක් මං කවදාවත් දැකලා නැහැ."

"සමහරු කියනවා මූ පියුමාවෙක් කියලා. නමුත් මූ පියුමා නෙමෙයි" හැරී කිව්වා. "මූ කළු ව්‍යාඝ්‍රයෙක්. උගේ වලිගය කෙළවරේ ඉඳලා නාස් තුඩට අඩි එකොළහක් දිගයි. අවුරුදු හතරකට කලින්, මූ කළුපාට පුංචි ලූල්බෝලයක් විතරයි. ඒ බෝලයේ එකතැනක තුඹපාටම පුංචි ඇස් දෙකක් තිබුණා. රියෝ නෙග්‍රෝ ගංගාව පටන්ගන්නා රියෝ නෙග්‍රෝ දියඇල්ල ළඟදීයි මං

 http://sherlockholmesinvestigations.blogspot.com



ව්‍යාඝ්‍ර ගෘහයේ සැලැස්ම

Reading Purpose Only. Not For Print.
http://sherlockholmesinvestigations.blogspot.com

මූව මිලට ගත්තේ. මූගේ අම්මා බොහොම නපුරු මිනීකන ව්‍යාඝ්‍ර ධේනුවක්. ඇය මිනිසුන් දහදෙලොස් දෙනෙකු මරාගෙන කෑවලු. ඒ නිසා ඇය පිටුපස ගිය රතුඉන්දියානුවන්ගේ හෙල්ල පහරෙන් තමයි ඇය මරණයට පත්වෙලා තිබුණේ."

"මූ එහෙනම් මිනීකන වන මෘගයෙක්ද?"

"ඇත්තෙන්ම ඔව්" ඔහු කිව්වා. "මේ මිහිපිට ඉන්නා වැඩියෙන්ම ලේ පිපාසිත භයානකම සතුන් වර්ගය තමා බ්‍රසීල ව්‍යාඝ්‍රයා. ඇමේසන් වනාන්තරයේ ඉන්නා රතුඉන්දියානුවෙකුට කළු ව්‍යාඝ්‍රයා ගැන මතක් කරන්න. ඔහු භයෙන් ඇවිලෙන්න ගනීවි. මේ සත්ත්ව වර්ගයේ එක් විශේෂත්වයක් තියෙනවා. ඒක තමා මුව, ගෝන, වල් ඌරු ආදී ඕනෑම සතෙකුගේ මස්වලටත් වඩා, මූං කැමැති මිනීමස් කන්න. මේ ටොම් නම් තවමත් මනුෂ්‍යයින්ගේ ලේවල රහබලල නෑ. ඒ හින්ද ඒ ලේ රස ඌ දන්නේ නෑ. එහෙම දැනගත්තු දට මූ ඉතාම භයානක එකෙක් වෙන බව සහතිකයි."

"ඉතින් හැරී කිසිම මනුස්සයෙක් මූ ළඟට යන්නෙ නැද්ද?"

"ඌ උගේ කූඩුව ඇතුළට යන්න ඉඩ දෙන්නේ මට විතරයි. මගේ සතුන් බලාගන්න ඉන්න පළපුරුදු සේවකයා තමා බෝල්ඩ්වින්. ඔහුත් බයයි මූගේ කූඩුව ඇතුළට යන්න. මං මූව හදන්න ගත්තේ පුංචි පැටියෙක් කාලෙ ඉඳල නේ. ඒ නිසා උගේ අම්මටත් තාත්තාටත් දෙන්නටම ඌ හඳුනන්නේ මාව"

මෙහෙම කියූ ඔහු එක්වරම අර යකඩ කොටු තිබූ දෙර ඇරගෙන කාමරය ඇතුළට රිංගුවේ මාව පුදුමයට පත්කරමින්. ඊළඟට ක්ෂණිකව ඔහු දෙර වැහුවා. ඒකට හේතුවුණේ තත්පර ගණනයි. ඔහුගේ කටහඬ ඇහුණාම මේ දැවැන්ත ව්‍යාඝ්‍රයා හිටිතැනින් නැගිට්ටා. මොහොතක් ඉවකුරල් බැලුවා. ඊළඟට ඔහු ළඟට ඇවිත් හැරී දිහා බලාගෙන ලොකු ගුගුමක් ඇරියා. ඊටපස්සේ උගේ හොම්බ, හැරීගේ කකුලේ පැත්තක ඇතිල්ලුවේ, හරියට සුරතල් බළලෙක් උගේ ස්වාමියාගේ ඇගේ ආදරයෙන් දවටෙනවා වගේ. ව්‍යාඝ්‍රයාගේ හිසට තට්ටු කළ හැරී උගේ හිස ඇඟිලිවලින් පිරිමැද්දේ බළලෙකු සුරතල් කරනවා වගේ.

"ටොම්!" ඔහු කීවේ ව්‍යාඝ්‍රයාට. "දැන් පලයං උඹේ කූඩුවට" ඔහුගේ විධානයට කීකරුවෙලා ව්‍යාඝ්‍රයා යකඩකූරුවලින් හදා තිබුණු උගේ කූඩුවට ඇතුළුවුණා. ඒක තිබුණේ කාමරයේ ඈත කෙළවරේ. එය යකඩකූරුවලින් සෑදූ කූඩුවක්. ඌ ඒ කූඩුවට

 http://sherlockholmesinvestigations.blogspot.com

"....... ව්‍යාඝ්‍රයාගේ හිසට තට්ටු කළා"

http://sherlockholmesinvestigations.blogspot.com

ඇතුළුවුණු සැනින් කොඩු දෙකරෙන් එළියට ආව හැරී බිත්තියේ තිබුණු යකඩ රෝදය කරකවන්න පටන් ගත්තා. එතකොට ව්‍යාඝ්‍රයාගේ කූඩුවේ දොරටුව වැහෙන පරිද්දි, යකඩ කූරුවලින් තැනූ ග්‍රිල් ගේට්ටුවක් කුඩා යකඩ රෝද මත පීල්ලක් උඩ හරහට ගමන්කළා. ඒක ගිහින් බිත්තියේ සාද තිබුණු තව්වකට ඇතුළු වී නැවතුණා. මේ ග්‍රිල් ගේට්ටුව ඒ ව්‍යාඝ්‍ර කූඩුවේ වහල දක්වාම උසයි. ඒ නිසා සතා කූඩුව ඇතුළේ හිරවුණා. එවිට ඊතැන ඉදිරියෙන් තිබූ කුටිය හිස්වුණා. එතැන තිබුණේ දැඩි දුර්ගන්ධයක්. මස්කන භයානක සතුන් ඉන්න තැන්වල එවැන්නක් තියෙන බව මං අහල තියෙනවා.

"ඌට නිදහසේ හැසිරෙන්න, කූඩුව ඉස්සරහ තියෙන හිස් කුටියට එන්න අපි ඉඩ හැරලයි තියෙන්නේ" හැරී කිව්වා.

"එතකොට ව්‍යායාම හැටියට ඌට කුටිය පුරාම දුවන්න පුළුවනි. නමුත් රෑට විතරක් ඌව කූඩුව ඇතුළට දලා ග්‍රිල් ගේට්ටුව වහනවා. මේ ආකාරයෙන් අපට එළියේ ඉඳගෙනම පුළුවනි; එක්කො ඌව කූඩුව ඇතුළට දමලා වහන්න. නැත්නම් ග්‍රිල් ගේට්ටුව ඇරලා, ඌට කුටියට ඇවිත් නිදහසේ හැසිරෙන්න ඉඩ හරින්න.

ඌ කූඩුවට දමා ග්‍රිල්ගේට්ටුව වැසුවාද පසු මමත් කුටිය තුළට ගිය බව ඔබට කිව්වා. ඌ ග්‍රිල් ගේට්ටුව ළඟට ඇවිත් මං දිහාට ඉවකරන්න ගත්තා. මාත් හැරී අනුගමනය කරමින් උගේ හිස අතගාන්න උත්සාහ කළා.

"එපා මාමේ!" ඔහු කෑගැසුවා. "ඔබ ඒක උත්සාහ කරල බලන්න එපා. මහ අවදානම් වැඩක්. මං ඔබට සහතික කරල කියන්නම්. මූ මහා භයානක සතෙක්. ඌ මට හීලෑවුණාට අනෙක් අයට එහෙම වේවිද කියල හිතන්න බෑ - උඹ උඹේ මිත්‍රයන්ව තෝරා ගන්නේ බොහොම පරෙස්සමෙන්. එහෙම නේද ටොමී? අන්න එයාගෙ දවල් කෑම අරගෙන එන සද්දෙට ටොමීට ඇහිල. උඹට ඒ සද්දෙ ඇහුණ නේද ටොමී?"

නිවස පැත්තේ සිට පහළට වැටී තිබුණු පාර දිගේ එන කෙනෙකු අතේ තිබූ ලෝහ බාල්දියක් ගැටෙන හඬ ඇසුණා. කූඩුව තුළ වකුටුවුණු ව්‍යාඝ්‍රයා නැගිටලා, ඉහළ පහළ ඇවිදින්න පටන් ගත්තේ බොහොම කලබලයෙන්. උගේ කහපැහැති ඇස් දෙක දීප්තිමත් වුණා. තද රතු පැහැති දිව එළියට ආවා. ඊළඟට කියත් තුඩු වැනි උගේ උල්දත් පේළිය උඩින් දිව එහාමෙහා ගමන් කළ හැටි මං බලාගෙන හිටියා.

 http://sherlockholmesinvestigations.blogspot.com

සේවකයා හරකෙකු වැනි සතෙකුගේ මස්පිරුණු ගාතයක් අරගෙන ආවා. ඔහු එය ග්‍රිල් ගේට්ටුවේ යකඩ කූරු අතරින් ව්‍යාඝ්‍රයාගේ කූඩුවට තල්ලුකළා. එක්වරම එය උගේ කටින් අල්ලා ඔසවාගත් ටොම්, ඒක අරගෙන කූඩුවේ මුල්ලකට ගියා. ගිහින් එය කකුලකින් පාගාගෙන, දත්වලින් අල්ලා මස් ඉරාගෙන කන්න පටන්ගත්තා. ඒක බලාගෙන ඉන්න භය හිතෙන දසුනක්.

"මං මේ සතාට ලොකු කැමැත්තක් දක්වන එකේ පුදුමයක් නැහැ නේද?" මගේ ඥාති සොහොයුරා ඇහුවේ අපි එතැනින් එන්න පිටත්වෙද්දී. "දකුණු ඇමරිකා මහාද්වීපලය් මැද ඉඳලා පරා නගරයටත්, එතැනින් එංගලන්තය දක්වාත්.මේ සතා අරගෙන ඒම ලේසිපහසු කටයුත්තක් වුණේ නැහැ. දැන් ඉතින් මූ මෙහේ ආරක්ෂා සහිතව ඉන්නවා. මං ඔබට කිව්වා වගේ මුළු යුරෝපා මහාද්වීපයටම ඉන්න මහාදම කළු ව්‍යාඝ්‍රයා ටොම්. ලන්ඩන් සත්වෝද්‍යානයේ භාරකාරයින් මැරෙන්න හදනවා මූව ඉල්ලලා. මං ඉල්ලන ඕනම මුදලක් ගෙවන්න ඔවුන් සූදානම්. ඒ වුණත් මූව වෙනත් කාටහරි විකුණලා දාන්න මට හිතක් නෑ. මගේ විනෝදාංශය ගැන ඔබත් එක්ක කතාකළා ඔය් මදයි. අපිත් යමු කෑමට"

ඊට හුගක් ඊ වෙනතුරු අපි දෙන්නා බිලියඩ් කාමරයට වෙලා කතාබහ කරමින් ඉන්නවා. කොහොම හරි අපි දෙන්නා අතර ඇතිවුණේ සමීප මිත්‍රත්වයක්. ඒයෙ ඊ ඔහු කිව්වේ දකුණු ඇමරිකාවේ ඔහුට මුහුණ දෙන්න සිදුවුණු ත්‍රාසජනක අත්දැකීම්. මේ දුඹුරුපාට තරබාරු මිනිහා මෙවැනි වික්‍රමාන්විත ජීවිතයක් ගතකළාද කියල මට හිතාගන්නවත් බැහැ. ඔහු මගෙන් ලන්ඩනය ගැන තොරතුරු ඇහුවා. ලන්ඩන් නගරයේ මං ගෙවන ජීවිතය ගැන මං කියූ දේවල් ඔහු අහගෙන හිටියේ හරි ආශාවෙන්. දවසක මට කලින් දැනුම්දීලා ග්‍රොව්නර් හෝටලයේ මා සමග නවතින්න එන බවට ඔහු පොරොන්දු වුණා. ඔන්න ඉතින් එතකොට මගේ ආර්ථික ප්‍රශ්නය ගැන ඔහුට කියන්න මට අවස්ථාවක් ලැබුණා. එහෙම කියලයි මට හිතුණේ. කිසිම ආදායමක් නොලැබී මට මුහුණදෙන්න සිදුවී තිබෙන අර්බුදය ගැන මං අවංකව ඔහුට විස්තර කළා. ඔහු ඒ හැමදේකටම කන්දුන්නේ බොහොම සාවධානව.

"ඒ වුණත්..............." හැරී අන්තිමේදී කිව්වේ ඔහුගේ කටේ තිබූ සුරුට්ටුව අතට ගනිමින්. "දැන් ඔබ නේද අපේ ඥාති සදර්ටන් සාමිවරයාගේ බූදලයට ඉන්න එකම උරුමක්කාරයා?"

http://sherlockholmesinvestigations.blogspot.com

"එහෙම කියල තමයි මං හැමදාම හිතුවේ" මං කිව්වා. "ඒ වුණත් අපේ මහප්පා මගේ මාසික වියදමට කියලා එක පැන්සයක්වත් දෙන්නේ නෑ"

"ඔව්. ඒක හරි" හැරී කිව්වා. "සද්ධර්ටන් සාමි හරි මසුරෙක් බව මං අහල තියෙනවා. අනේ අසරණ මාෂල්. ඔබට මුහුණදෙන්න වෙලා තියෙන්නේ විශාල ප්‍රශ්නයකට නේද? ඒක නෙමෙයි. මහප්පාගේ සෞඛ්‍ය තත්ත්වය ගැන ඔබට ලැබුණු අලුත්ම ආරංචි මොනවාද?"

"ඔහු හැමදාමත් අසනීපෙන්" මං කිව්වා. "අපි පුංචි කාලෙ ඉඳලම අපට අහන්න ලැබුණේ මහප්පා බරපතල ලෙස රෝගාතුර වෙලා, ඔහුට අන්තිමයි, අද හැන්නාම් හෙට මැරෙයි'කියලා. එහෙම අවුරුදු ගණනාවක් ගියත් ඔහු තාමත් හොඳින් ඉන්නවා"

"හරියට හරි" හැරී කිව්වා. "බොහොම කලාතුරකින් දකින්න ලැබෙන ප්‍රාණය ශක්තිමත් කෙනෙක්. එහෙම නේද? ඔහුගේ ධනස්කන්ධය ඔබට උරුමවෙන්න සෑහෙන කාලයක් යාවි වගේ. මට පෙනෙනවා මාෂල්, ඔබ දැන් ඉන්නේ ලොකු අමාරුවක වැටිලා බව"

"මං හිතන්නේ හැරී, ඔබට මගේ තත්ත්වය හොඳින් තේරුම් ගන්න ඇති" මං කිව්වා. "සෑහෙන මුදලක් මට ලැබෙන්න සලස්වන්න ඔබට පුළුවන් නම්................."

"ඒ ගැන තවත් එක වචනයක් කතාකරන්න එපා මාෂල්" ඔහු කිව්වා. ඔබට පිහිටවෙන්න මට පුළුවන් හැමදෙයක්ම මං කරනවා"

මගේ මිත්‍ර මාෂල් කිං ඔහුගේ දීර්ඝ කථාව අවසන් කළේය.

"එහෙනම් ඔබේ ප්‍රශ්නය පහසුවෙන්ම විසඳෙන බවට සැකයක් නෑ" මම කීවෙමි. "ඒක අහන්නත් සන්තෝසයි. ඔබ කවදද ආපහු ලන්ඩන් යන්නෙ? මං හිතාගෙන ඉන්නෙ අද හවස ආපහු යන්න"

"වොට්සන්" මාෂල් කීය. "ඔම් තවත් දවස් තුනක් මගේ ඥාතියා සමග නවතිනවා. ඒ අතරේ මට පුළුවනි හැමදෙයක්ම සැලසුම් කරගන්න. දැන් මගේ හිතට ලොකු සැහැල්ලුවක් දැනෙනවා. අද ලන්ඩන් නොයා ඔබ කැමැති නැද්ද අද හවසට මා එක්ක ශ්‍රේලන්ඩ්ස් වත්තට යන්න?"

"ඇරයුම ගැන ස්තුතියි මාෂල්" මම කීවෙමි. "නමුත් ඔබ සමග එන්න මට විධියක් නෑ. බාගවෙලාවට මගේ මිත්‍රයා ෂර්ලොක් හෝම්ස් මේ වෙනකොට ආපහු ඇවිල්ලත් ඇති. ඔබේ සොහොයුරාගේ සිද්ධිය ගැනත් මං ඔහුට මතක් කරන්නම්."

 http://sherlockholmesinvestigations.blogspot.com

"..... අපි ඒ වෙන්තුරු කතාබහේ යෙදුණේ බිලියඩ් කාමරයේදී"

http://sherlockholmesinvestigations.blogspot.com

Reading Purpose Only..Not For Print.

මාෂල් කිංට පිටවී යාම සඳහා කාලවේලාව ළංවී තිබිණ. ඔහු අපෙන් සමුගෙන පිටවී ගියේ ලන්ඩන් පැමිණි වහාම මා හමුවන බව දන්වමිනි.

එදම සවස පහට ඉප්ස්විච් නගරයෙන් පිටත්වූ දුම්රියෙන් මම ආපසු ලන්ඩනය බලා පැමිණියෙමි. මගේ මිත්‍රයා බේකර් වීදියේ නිවහනට ආපසු පැමිණ සිටියේය.

"වොට්සන්. ඔබ මා නැති අතුරේ නෑදෑයින් දකින්න ගිහිං වගෙයි?"

"ඔව්. මම මෝස්ටන් මහත්මයාගේ ගෙදරට ගියා" මම කීවෙමි. "ඒක හරිම අහම්බෙන් යෙදුණු ගමනක්. අර මාෂල් කිං කියල මගේ පාසල් මිත්‍රයෙක්......... මං ඒ ගැන ලියුමේ ලියල තිබුණා නේද?"

"ආ ඔව්" හෝම්ස් පිළිතුරු දුන්නේ ඔහුගේ මේසය මතට අතදිගු කරමිනි.

"නීතිඥ මර්වින් කිං ඝාතනය ගැන පුවත්පත්වල පළවූ විස්තර මං අයෙමත් ස්ක්‍රැප් පොත්වලින් කියවා බැලුවා. හරිම අභිරහස් මිනීමැරුමක්. මං කැමතියි මේ ගැන ඔබේ මිත්‍රයා හමුවෙලා කථාකරන්න තිබුණා නම්. පොලිසිය කියන්නේ මර්වින් කිංට කිසිම සතුරෙක් නොහිටි බවයි. අපේ මිත්‍රයා ලෙස්ට්‍රේඩ් තමා ඔය ගැන පරීක්ෂණ පැවැත්තුවේ. ඒ දවස්වල ඔය මිනීමැරුම ගැන මමත් විමසිල්ලෙන් හිටියා. නමුත් අර ගෝල්ඩ්ස්ටයින්ලාගේ ප්‍රශ්නය මට භාරවුණානේ ඒ දවස්වල. ඒකෙන් මට මේක මගහැරුණා. දැන් ඉතින් මට පොඩි විවේකයක් ලැබිල තියෙන නිසා, මං කැමතියි මර්වින් කිං ඝාතනය ගැන හොයල බලන්න. කවදද ඔබේ මිත්‍රයා ආපහු එන්නේ?"

"තව දින තුනකින්, ඒ කියන්නේ සෙනසුරාද ආපහු එනබව ඔහු කිව්වා."

"ප්‍රමාණවත් තරම් දත්ත නොමැතිව ඔය ප්‍රශ්නයට අතදාන්න මං කැමති නැහැ" හෝම්ස් කීය. "බොහෝවෙලාවට ලෙස්ට්‍රේඩ්ලා යන්න ඇත්තේ වැරදි පාරක වෙන්නත් පුළුවනි. මර්වින් කිං ගැන හොඳින්ම තොරතුරු දන්නේ මාෂල් කිං විය යුතුයි. ඔහුගෙන් ලබාගන්නා තොරතුරු මතයි අපි ඉදිරියට යායුත්තේ. ලෙස්ට්‍රේඩ්ලගෙ දෘෂ්ටි කෝණයෙන් ඔය ප්‍රශ්නය දිහා බලල වැඩ පටන් ගැනීම ඒ තරම් ඥානාන්විත නැහැ"

 http://sherlockholmesinvestigations.blogspot.com

සිකුරාද උදේ නවයයි තිහ පමණ වනවිට උදේ ආහාරය නිමකොට අපි පුවත්පත් කියවීමට සූදානම් වූයෙමු. අපේ නිවස ඉදිරිපිට වේගයෙන් පැමිණි අශ්වකරත්තයක් නවත්වන හඬත්, ඒ සමගම කිසිවෙකු අපේ තරප්පු පෙළෙල් ඉහළට දිව එන හඬත් අපට අසන්නට ලැබිණි. අප දෙදෙනා මුහුණට මුහුණ බැලුවේ තරමක් පුදුමයට ද පත්වය.

"ලෙස්ට්‍රේඩ් වගෙයි වොට්සන්" හෝම්ස් කීය. "අද ඔහු හුඟක් කලබලයෙන්"

විසිත්ත කාමරයේ දොරට කිහිපවරක්ම තට්ටුකළ ලෙස්ට්‍රේඩ් අප ඉදිරියට ආවේ හතිදමමිනි.

"හෝම්ස් මහත්මයා මට සමාවෙන්න" ලෙස්ට්‍රේඩ් කීවේ අප පුදුමයෙන් ඔහු දෙස බලාසිටියදීය. "ඉප්ස්විච්වල භයානක අනතුරක්. මට මේ දැනුයි පණිවුඩය ලැබුණේ. ඔබට මතක නේද පොලිස් පරීක්ෂක ජෝර්ජ් මැකන්සි? ලන්ඩනයට කිරි ගෙන එන දුම්රියෙන් ඔහු මට විශේෂ පණිවුඩයක් එවා තිබුණා. ගෙදරක ඇතිකළ ව්‍යාඝ්‍රයෙක් මිනුස්සයෙකුව මරාදමලලු. මළසිරුර කෑලි කෑලිවලට ඉරල ලු. ඒ සත්තා හාරව හිටි මිනිහා පැන ගිහින්ලු........."

"........... ඉප්ස්විච්වල කොහේද? කවුද ඔහු? මියගිය මනුස්සයගෙ නම මොකක්ද?" ප්‍රශ්න වැලක්ම මගේ මුවෙන් නිකුත්වූයේ නොදැනුවත්මය.

"මෙය සිදුවෙලා තියෙන්නෙ ඉප්ස්විච්වලට හැතැක්ම පහක් ඈතින් පිහිටි ග්‍රේලන්ඩ්ස් වතුයායෙ." ලෙස්ට්‍රේඩ් කීවේ ඔහුට ලැබී තිබූ ලිපිය සාක්කුවෙන් අතට ගෙන එය පරීක්ෂා කරමිනි. "මියගිහින් තියෙන්නෙ මාෂල් කිං නම් අමුත්තෙක්ලු!"

මගේ හිසට කිසිවෙකු වේගවත් පහරක් එල්ල කළ විටක මෙන් මගේ මොළය හිරිවැටී ගියේය.

"දෙයියන්ට ඔප්පු වෙච්චාවෙ!" මට කෑගැසිණ. "මේ මනුස්සයා ඉප්ස්විච් ගියේ මා එක්ක! පෙරේදා ඇවිත් මා එක්ක කතාකර කර ඉඳල ගියේ. දෙවියනේ මෙහෙමත් අපරාධයක්!"

මා කම්පාවට පත්වූ විලාසය දකිමෙන් දෝ ලෙස්ට්‍රේඩ්ගේ කථාව නැවතිණ. හෝම්ස් මා ඇමතුවේ මිනිත්තු කිහිපයකට පසුවය. "මට කණගාටුයි වොට්සන්. අපි ඊයෙ රෑත් මේ මනුස්සයා ගැන කතාබහ කළා ලෙස්ට්‍රේඩ්. ඔහු දෙස්තර වොට්සන්ගේ පාසල්

http://sherlockholmesinvestigations.blogspot.com

මිනුමෙයක්. ඔබට මතකද පහුගිය නත්තල් දවස්වල ඝාතනයට ලක්වුණු මර්වින් කිං? මේ ඔහුගෙ බාල සහෝදරයා. ඉතින් අපට කියන්න ඔබට දැනගන්න ලැබිල තියෙන තොරතුරු."

"මැකන්සි කියල තියෙන්නෙ මේක බොහොම වෙලාවට අත්වැරැද්දකින් සිද්ධවුණු මරණයක් වෙන්න ඇති කියලයි." ලෙස්ට්‍රේඩ් කීය. "නමුත් සති භාරව හිටි සේවකයා පැනල ගියේ ඇයි? ඒකෙන් ප්‍රශ්න මතුවෙන්න ඉඩ තියෙන නිසා. හැකිනම් ෂර්ලොක් හෝම්ස් මහත්මයාවත් කැඳවාගෙන වහාම එන්න කියලයි මැකන්සි දන්වලා තියෙන්නෙ. වෙනත් විස්තර මොකුත් නෑ. අපට ගිහිං තමයි බලන්න වෙන්නෙ."

"මොහොතක් ඉන්න" කී මගේ මිත්‍රයා පුවත්පත් ගොඩගසා තිබූ තැනට ගොස් පසුගිය සතියේ හෝ සතියකට පුවත්පත් ඉක්මනින් පෙරලා බැලීමට පටන්ගත්තේය. ඔහුට හමුවූ එක් පුවත්පතක පිටුවක් ඔහු මිනිත්තු දෙකක් පමණ කියවා බැලීය. ඊළඟට තමාටම යමක් කියාගත්තේය. ඉළිත් අප සිටි තැනට ඔහු පැමිණියේ ඉන්පසුවය.

"හෝම්ස් මහත්තයා" ලෙස්ට්‍රේඩ් කීය.

"ඉප්ස්විච් යන දුම්රියක් තියෙනවා තව පැය භාගයකින්. ඔබට ඉක්මන් කරන්න පුළුවන් නම් අපට හැකිවේවි ඒක අල්ලාගන්න."

"වොට්සන්. අවශ්‍ය වුණොත් දවසක් නවතින්න, ඇඳුම් පැළඳුම් මොනවා හරි ගමන් මල්ලකට දමාගන්න" හෝම්ස් කීය. "අපට අප්‍රමාදව එතැනට යන්න පුළුවන් නම් ඒකෙ ලොකු වාසියක් තියෙනවා."

පැය කාලක් ගතවෙද්දී අපි කුලීරියක නැගී, දුම්රියපොළ වෙත යමින් සිටියෙමු. දුම්රිය පිටත්වීමට මිනිත්තු පහක් තිබියදී දුම්රියපොළට ළඟාවීමට අපට හැකිවිය.

දින කිහිපයකට පෙර මාෂල් කිං සමග මා ඉප්ස්විච් ගිය ගමන ගැන මම ලෙස්ට්‍රේඩ්ට පැවසුවෙමි. මෙම භයානක ව්‍යාඝ්‍රයා ගැන මාෂල් මට පැවසූ විස්තර කියද්දී පොලිස් නිලධරයා ඒවා අසා සිටියේ ඉමහත් පුදුමයෙනි.

"හෝම්ස් මහත්මයා. ඔබට හිතෙන්නේ මේ මරණය අබිරහස් එකක් කියලද?" ලෙස්ට්‍රේඩ් ඇසීය. "මතුපිටින් අපට පෙනෙන දේට වැඩි යමක් මෙතැන ඇති කියල ඔබ සැකකරනවද?"

 http://sherlockholmesinvestigations.blogspot.com

"එහෙම නිගමනයකට එන්න තරම් මට ලැබිල තියෙන දත්ත ප්‍රමාණවත් නෑ" හෝම්ස් කීය. "ඒ නිසා මං මේ පිළිබඳව තියාගෙන ඉන්නේ විවෘත මනසක්. හැමදේකටම කලින් අපි මේ පිළිබඳව තොරතුරු සොයාගතයුතුයි. වොට්සන්. මෙතැනදී මට ඔබේ උදව් උවමනා වෙනවා. පනුහිය බදද මාෂල් කිං ඔබ හමුවෙන්න ආවා නේ. ඒ උදේ කීයට විතරද?"

"උදේ නවයහමාරට විතර මං හිතන්නේ"

"පිටත්වෙලා ගියේ කීයටද?"

"තුනයි දහයේ දුම්රියෙන් යනවා කියල ඔහු ගෙදරින් පිටවුණේ තුනට"

"එහෙම නම් ඔහු පැය පහකට කිට්ටු කාලයක් ඔබ සමග කතාබහ කළා. ශ්‍රේලන්ඩ්ස් වතුයාය ගැනත් එහි පදිංචිකරුවන් ගැනත් විස්තර කියන්න ඇති. එහෙම නේද?"

"ඔව්"

"ඔබ ඒ තොරතුරුවල සාරාංශය මට කිව්වා තමයි" හෝම්ස් කීය. "අපි හිතුවේ නැහැනෙ මෙහෙම දෙයක්. දැන් මට හිතෙනවා වොට්සන්, ඒ කථාවේ හුඟක් වැදගත් කරුණු අඩංගු වෙන්න ඇති කියල. බොහෝ විට මේක කාගෙ හරි අමනකවීමකින් සිදුවුණු අත්වැරැද්දක් වෙන්න පුළුවනි. නමුත් මට මතකයි ඔබ කිව්වා, ඉඩම්හිමියාගේ බිරිඳ, මාෂල් කිං මහත්මයා ගැන දැක්වූ ආකල්පය ගැන. ඒ නිසා මං කැමතියි ඔබට අහන්න ලැබුණු කථාව මුල සිටම යළිත්වරක් අහගන්න. කරුණාකරල ඔබට මතක හැමදෙයක්ම යළිත් කියන්න"

මාෂල් කිං මට කියූ විස්තරය සෑම වචනයක් පාසාම මගේ මතකයේ නොරැඳිණ. යළිත් වරක් සියලු තොතුරු මතකයට නගා ගැනීම පහසු කටයුත්තක් නොවේ. මම ඒ බව මගේ මිත්‍රයාට කීවෙමි.

"අපට තවත් පැය දෙකක පමණ කාලයක් තියෙනවා වොට්සන්" හෝම්ස් කීවේ ඔහුගේ සාක්කු ඔරලෝසුව පරීක්ෂා කර බලමිනි. "අපි ඉප්ස්විච්වලට ළඟාවෙද්දී ඔය කථාව විස්තර සහිතව මට කියල අවසන් කරන්න ඔබට හැකිවේවි."

"මට හැකිතරමින් විස්තරය මං කියන්නම්. කරුණු අතරින් පතර මට අමතක වෙච්ච මං දන්නෙ නෑ"

එසේ පැවසූ මම, මාෂල් කිං සහ මෝස්ටන් නිවසට පැමිණ මට කියූ කථාන්තරය හෝම්ස් හා ලෙස්ට්‍රේඩ් වෙත විස්තර කළෙමි. ගැටලුවලට මුහුණදුන් අනුග්‍රාහකයන් බේකර් වීථියේ අපේ නිවහනට පැමිණ ඔවුන්ගේ කථා කියද්දී, ෂර්ලොක් හෝම්ස් ඒවාට සවන්දෙන එක් විශේෂ ඉරියව්වක් ඇත. දෙනෙත් අඩවන් කරගෙන, දෑත්වල ඇඟිලි තුඩු එකට තබාගෙන, දල්වාගත් පයිප්පය මුවේ රඳවාගෙන සිටීම හෝම්ස්ගේ සුපුරුදු ඉරියව්වය. දුම්රිය තුළ හාන්සිපුටුවක් නොතිබුණත් හෝම්ස් මගේ කථාවට සවන් දුන්නේද ඔහුට සුපුරුදු ඉරියව්වෙන්මය. මගේ කථාන්තරය අවසන් කළ පසු කිසිත් නොකියූ ඔහු, මිනිත්තු දහයක් පමණ නිහඬව කල්පනා කළේය.

"මෙතැන යම්කිසි අපරාධයක් සිදුවී තිබෙනවාද කියල මට සහතික වෙන්න බැහැ" මගේ මිතුරා අන්තිමේදී කීවේ දීර්ඝ නිහඬතාවය බිඳ දමමිනි. "ඒ වුණත් මේ සිද්ධියේ පැහැදිලිකිරීමට අමාරු තැන් කිහිපයක්ම තියෙනවා. ඒ හැම එකක් ගැනම මං වැඩිදුරටත් හිතා බලන්න ඕන. දැනට මං කාරණා එකක් හෝ දෙකක් ඔබට කියන්නම්. බලන්න. ඇයි මේ බෝල්ඩ්වින් කියන සේවකයා අතුරුදන් වුණේ?"

"ව්‍යාඝ්‍ර කූඩුව අගුළු දැමීම ඔහුට අමතක වුණා වෙන්න පිළිවන්." ලෙස්ට්‍රේඩ් කීය. "ඒකෙන් තමන්ගේ ස්වාමියාගේ ඥතියා මරණයට පත්වීම නිසා, බෝල්ඩ්වින්ට භය හිතෙන්න ඇති"

"ඒ වුණත් මේක හිතන්න" හෝම්ස් කීය. "හැරී ජේකොබ්ම කියනවා, ව්‍යාඝ්‍රයා ළඟට කිට්ටුවෙන්න පුළුවන් ඔහුට විතරයි කියලා. අනික මාෂල්ට දකින්න ලැබිල තිබුණා සේවකයා සතාගේ ආහාර, කූඩුවේ යකඩකූරු අතරින් ඇතුළට දමන හැටි."

"ඔව්. ඒකත් ඇත්ත"

"ඊළඟට අප හිතාබැලිය යුතුයි ජෙසිකා ජේකොබ් හෙවත් හැරීගේ බිරිඳ, මාෂල් කිංට දක්වූ ප්‍රතිචාරය ගැන" හෝම්ස් කීය. "කවදාවත් නුදුටු ඥතියෙකු සතියක නිවාඩුවකට ආවාම ඇයි ඇය මේ තරම් කෝපයට පත්වුණේ? ඔවුන් ඥතියාට සලකන්න බැරිතරම් අගහිඟ කම් ඇති අය නෙමෙයි? ඇයගේ තිබෙන්නේ දැඩි ඊර්ෂ්‍යාවක් කියල ජේකොබ් කීයූ කතාව අපට විශ්වාස කරන්න පුළුවන්. මීට ඉහත කීප වතාවක්ම බ්‍රසීලය ඇතුළු දකුණු ඇමරිකානු

http://sherlockholmesinvestigations.blogspot.com

රටවල්වලින් එංගලන්තයට ආ පුද්ගලයින් අපට පරීක්ෂණවලදී හමුවී තියෙනවා. ඝර්ම කලාපික දේශගුණය නිසා, ඔවුන් දැඩිලෙස කෝපයට පත්වෙන අය බවයි සාමාන්‍ය මතය. ඒක මෙතැනදීත් බලපෑවද? ව්‍යාඝ්‍ර කූඩුවේ නැත්නම් අර කාමරයේ මොකක්ද සිද්ධවුණේ?"

"මට හිතෙනවා හෝම්ස් මෙහෙම" මම කීවෙමි. "අර පැනගිය සේවකයා බෝල්ඩ්වින් හොයාගන්න පුළුවන් නම්, මෙතැන නොපැහැදිලි අඳුරු තැන්වලට ලොකු ආලෝකයක් ලබාගන්න හැකිවේවි"

"විශිෂ්ටයි වොට්සන්" හෝම්ස් කීය. "ඔබත් හිතෙනවා ගැටලුව විසඳා ගැනීමට පහසුම ක්‍රමය ඒකයි කියලා. නමුත් ඒ අපට ඔහු හොයාගන්න පුළුවන් වුණොත්"

මේ වනවිට අපි ඉප්ස්විච් නගරයට ළංවෙමින් සිටියෙමු. තම සටහන් පොත අතට ගත් හෝම්ස් එහි යම් යම් කරුණු ලියාගැනීමට පටන් ගත්තේය.

ඉප්ස්විච් පොලිසියේ පරීක්ෂක ජෝර්ජ් මැකන්සි මහතා අප හමුවීමට දුම්රියපොළට පැමිණ සිටියේය. තහ-රන්වන් හිසකෙස් තිබූ ඔහු සිහින් සිරුරක් තිබූ ප්‍රසන්න පුද්ගලයෙක් විය.

"ආයුබෝවන් මහත්වරුනි." ඔහු කීය. "දිනුම්දී කෙටි කාලයක් ඇතුළත ඔබ මෙහි පැමිණීම අපට ගෞරවයක්. මේක වඩාත් අවුල්වෙන්න කලින් ඔබේ අවධානය යොමුවුණොත් හොඳයි කියල මට හිතුණා හෝම්ස් මහත්මයා. ඒකයි මං වහාම අපේ ලෙස්ට්‍රේඩ් මහත්මයාට ඔබ ගැන මතක් කළේ"

"ස්තුතියි මැකන්සි" හෝම්ස් කීවේ පොලිස් නිලධරයාගේ සුරත ගෙන සොලවමිනි.

"වොට්සන් ඔබට මතක නේද පොලිස්-පරීක්ෂක මැකන්සි? අර ක්‍රොස්බි නම් බැංකු කළමනාකරුමගේ අභිරහස ගැන හොයද්දී අපට හමුවුණේ............... ඔබට මතක නැද්ද? ආ......... මං හිතන්නේ ඒක සමහරවිට වොට්සන් උදව්කර නොගෙන මං තනියම විසඳූ පරීක්ෂණයක් වෙන්න ඇති."

ඉප්ස්විච් සිට හැඩ්ලි වෙත දුම්රියෙන් ගිය අපි එතැන් සිට රෝද හතරේ ලොකු අශ්වකරත්තයක ගමන් කළෙමු. මැකන්සි විසින් එය සූදානම් කර තිබිණ. ටිය හෙමින් හෙමින් කන්ද නගිද්දී ඔහු අප ඇමතුවේය.

"ඔබ පරීක්ෂණ කරන පිළිවෙළ මං දන්නවා නේ හෝම්ස් මහත්මයා" ඔහු කීය. "මරණය සිදුවුණු තැන හා ඒ අවට පොලිස් ආරක්ෂාව දැම්මා. කිසිකෙනෙකුට ඒ හරියට ළංවෙන්නවත් අපි ඉඩදෙන්නේ නෑ"

"ඒ ගැන මං ඔබට කෘතඥ වෙනවා මැකන්සි" මගේ මිත්‍රයා පැවසුවේ අපමණ සන්තෝෂයෙනි

ග්‍රේලන්ඩ්ස් වතුයාය වෙත යද්දී අද මාපල් කිං, වෛර්ණ කුරුල්ලන් ඇතුළු විවිධ සතුන් දකින්නට ලැබුණු බැව් මට පැවසුවේය. ග්‍රේලන්ඩ්ස් වතුයායේ ප්‍රධාන ගේට්ටුවෙන් ඇතුළු වී ඉදිරියට යද්දී අපට දකින්නට ලැබුණේ ද ඔහු පැවසූ ආකාරයේ දකුණු ඇමරිකාවේ වන සත්ත්වයින්මය.

පොලිස්පරීක්ෂක මැකන්සි විසින් අප තිදෙනා ග්‍රේලන්ඩ්ස් මන්දිරය වෙත කැඳවාගෙන යනු ලැබිණ. ඔහු අප තිදෙනා මැදුරේ හිමිකරුවා වූ හැරී ජේකොබ් මහතාට හඳුන්වා දුන්නේය.

"ඔබගේ පැමිණීම මට ලොකු අතුටක් මහත්වරුනි" ඔහු කීය. "නමුත් මේක හරිම ශෝකජනක අවස්ථාවක්. මගේ ඥාති සොහොයුරා මොන තරම් අවංක කරුණාවන්ත කෙනෙක්ද? ඔහු අකාලයේ මිය යන්න මගේ නිවස්ටම ආ හැටි"

"මේ සිදුවීම ගැන අපටත් හරි කණගාටුයි මහත්මයා" හෝම්ස් කීවේ විසිත්ත කාමරයේ අසුන්වල අප හිඳගනිද්දීය. "දැන් අප කැමැතියි මේ සිද්ධිය ගැන සම්පූර්ණ විස්තරයක් ඔබෙන් දැනගන්න. කරුණාකරල අපට හැමදෙයක්ම කියන්න. එතරම් වැදගත් නැතැයි සියල හිතල සුළු කරුණක් වත් අතහරින්න එපා. ඔබ ගැනත් ඔබේ බිරිඳත් ගැනත් අප කිසිවක් දන්නේ නැහැ. ඔබ එංගලන්තයට පැමිණියේ මෑතකදී බව අපට අහන්න ලැබුණා. ඒ නිසා ඒ ගැනත් යමක් කිවහැකිනම් අපට මෙහි පසුබිම තේරුම් ගැනීමට හැකිවේවි."

"මහත්වරුනි. මගේ දෙමව්පියන් ඉංග්‍රීසි ජාතිකයන් වුණත්, ඔවුන් ඒ කාලයේම බ්‍රසීලයට සංක්‍රමණය වූ අය. ඒ නිසා මම හැදුණේ වැඩුණේත්, මෑතක් වනතුරු පදිංචිව සිටියේත් ඒ රටේ. විදේශික සම්භවයක් ඇති අය දිගින් දිගටම එහි පදිංචිව සිටිනවාට ඒ රටේ ස්වදේශිකයන් කැමැති නැහැ. මගේ බිරිඳ ජෙසිකා බ්‍රසීල ජාතික කාන්තාවක්. කොහොම වුණත් නව අවුරුදු හත අටක් යද්දී

 http://sherlockholmesinvestigations.blogspot.com

ඒ රටේ දේශපාලන ප්‍රශ්න තුනක් ඇතිවෙන්න පුළුවන්. රටේ කලබල ඇතිවෙලා අපට නොයෙකුත් කරදරවීමට ඉඩ තිබේවි කියල මට හිතුණා. ඒ නිසා මං තීරණය කළා ස්ථිර පදිංචියට එංගලන්තයට එන්න. ඉතින් මගේ ඉඩකඩම් විකුණාදමා මං මේ රටට ආවා. ඒ මීට මාස හයකට පමණ කලින්.

මහත්වරුනි. මං වනාන්තරයට හා එහි සතාසීපාවට ආදරය කරන කෙනෙක්. ඒ නිසා මං මෙහේ පදිංචියට එද්දී, ඒ රටේ ඉන්නා අලංකාරම සතුන් රැසක් මෙහේට අරගෙන ආවා. විශාල මුදලක් වැයකරලා වතුයායක් මිලටගෙන මං මෙහේ පදිංචිවුණා. මගේ සතුන්ටත් ආරක්ෂාව උවමනායි. ඒ වගේම මේ බිහිසුණු සතුන්ගෙන් මිනිසුනුත් ආරක්ෂා විය යුතුයි. ඒ හින්දම තමයි මං මේ ව්‍යාඝ්‍රයා බොහොම ආරක්ෂා සහිත කූඩුවක දමලා තැබුවේ. එතැනට ගිහින් බලද්දී ඔබට ඒ බව පෙනේවි.

දැනට මාසයකට පමණ පෙර මගේ ඥාති සහෝදරයෙකු වන මාෂල් කිං මට ලියුමක් එවලා තිබුණා. ඔහු අහල තිබුණේ පෞද්ගලික උවමනාවක් සඳහා මාව හමුවෙන්න අවස්ථාවක් ඔහුට ලබාදෙන්න පුළුවන්ද කියලයි. ඉතින් මං ඔහුට මෙහෙ එන්න කියලා දන්වා යැව්වා. මගේ ඥාතියෙක් වුණත් මීට කලින් මට ඔහු හමුවෙලා නැහැ. ඒ මොකද මං විදේශයක ජීවත්වුණු නිසා. මං ඔහුව හඳුනාගත්තේ පසුගිය සඳුද මෙහේ ආ වෙලාවේ."

"ඔහුට ඔබ හමුවෙන්න උවමනාවෙලා තිබුණේ වනසතුන් පිළිබඳ තොරතුරු දැනගන්නද?" ලෙස්ට්‍රේඩ් විමසුවේය.

"නැහැ මහත්මයා" ජේකොබ් කීය. "ඔහුට ලොකු මුදල් ප්‍රශ්නයකට මුහුණපාන්නවෙලා තිබුණා. මේ වෙලාවේ ඒ කරුණ ඔබට හෙළිකළාට වරදක් නැහැ. මං හිතන්නේ ඔහුට විශාල ණය මුදලක් උවමනා වෙලා තිබුණා. මං ඒක දෙන්න එකඟ වුණා. දෙවියන්ට ස්තුතිවන්ත වෙන්න ඒ මුදල ණයක් හැටියට නෙමෙයි; තෑග්ගක් හැටියට ඔහුට දෙන්න වුණත් මට වත්කමක් තියෙනවා. අනේ අසරණ දුප්පතාට අත්වුණු ඉරණම" සුසුමක් හෙළූ ජේකොබ් මහතා කථාව මොහොතකට නතර කොට, ඔහුගේ ඉස්තරම් හවානා සුරුට්ටු අපට පිළිගැන්විය. ඔහු ද එයින් සුරුට්ටුවක් දල්වාගෙන අනතුරුව කථාව පටන්ගත්තේය.

"මාෂල් මෙහේ ඇවිත් දෙවැනි දවසේ මං ඔහුට පෙන්නුවා මගේ සතුන් එකතුව. ඒ සතුන් බොහොම කැමැත්තෙන් ඔහු

http://sherlockholmesinvestigations.blogspot.com

නැරඹුවා. එයිනුත් ඔහු ලොකු ආශාවක් දක්වූයේ මේ බුසිල බිළාලයා නමින් හැඳින්වෙන කළු ව්‍යාඝ්‍රයාට.

මෙම සතා පෙන්නූ වෙලේ මං ඔහුට කිව්වා මූ ඉතාම භයානක මිනීකන සතෙක් බව. ඒ බව නොතකා මාශල් මොකද කළේ? ඔහු කූඩුවේ යකඩකූරු අතරින් අතදමලා ව්‍යාඝ්‍රයාගේ හිසට තට්ටු කළා. ඌ මට හීලෑ නිසා එහෙම දෙයක් කරන්න මට පුළුවනි. මං ඌ ළඟට ගියත් උගෙන් මට මොකුත්ම හිරිහැරයක් නෑ. නමුත් පිටකෙනෙක් එහෙම දෙයක් කරනු එක හරිම භයානකයි.

ඊයේ හවස ඉඳලම අහස තදින්ම කළුකරගෙන තිබුණා. රෑ එකට විතර මට ඇහැරුණේ අපේ ගෙදර සමීපයේම අකුණක් වැදුණු හඬට. ඒ වෙලාවේ වේගවත් කුණාටුවකුත් හමන්න පටන්ගෙනයි තිබුණේ. කොයිතරම් වේගයෙන් හුළං හැමුවාද කිව්වොත් වහලේ උළුකැට කිහිපයකුත් බිමට වැටුණා. නිවස වටා ඇති ගස්වල අතුරිකිලි කැඩී වැටුණු ශබ්දය මට ඇහුණා. පසුගිය මාස කිහිපය තිස්සේම තිබුණේ දැඩි නියඟයක්. මේ විධියට දේශගුණික වෙනස්වීමක් එද්දී සතුන් හරියට කැළඹෙනවා. තදින් කෝපයට පත්වෙනවා. මේක වැඩියෙන්ම දකින්න පුළුවන් ක්ෂීරපායී සතුන් අතර.

මට හිතුණා ගෙදරින් එළියට ගිහින් සතුන් ගැන හොයා බලන්න. නමුත් ඒ වෙලාවේ විදුලි කොටමින් නොනවත්වාම අකුණු ගහන්න පටන්ගත්තා. එහෙම වෙලාවට නිවසෙන් පිටවී එළිමහනකට යාම බොහොම අවදානම් වැඩක්. කුණාටුවෙන් ගස්වල අතුකඩා වැටීම ගැනත් මට සිහිවුණා. ඒ නිසාද මං දෙවනුව හිතුවා එළියට බහින්නේ නැතුව ඉන්න. අනෙක බෝල්ඩ්වින් හා අනෙක් සේවකයන් දෙදෙනා ඉන්නේ සතුන්ගේ කූඩු තියෙන පැත්තේ ගොඩනැගිල්ලක. රෑ හෝ දවාලේ ඕනෑම වෙලාවක සතුන් ගැන හොයා බලන්න මං ඔවුනට නියම කරලයි තියෙන්නේ. ඒ විශ්වාසය උඩ මං යළිත් නින්දට ගියා.

කොහොමහරි උදේ හතරට විතර මට ඇහැරුණා. ඒ වෙලාව වෙනකොට වැස්ස, ගෙරවීම් හා විදුලි කෙටීම් සියල්ලම නැවතිලයි තිබුණේ. මට නිකම්ට හිතුණා ව්‍යාඝ්‍ර කූඩුව දිහාට ගිහින් බලන්න. මං කාමරයේ තිබූ ලන්තෑරුම දල්වාගෙන නිවසෙන් පිටවෙලා ඒ පැත්තට ගියා. මං බලාපොරොත්තු වුණේ මං එහි යද්දී ව්‍යාඝ්‍රයා ටොම් එහි නිදාගෙන ඉඳීවි කියලයි. නමුත් මට ඇහැදීම අහන්න

 http://sherlockholmesinvestigations.blogspot.com

ලැබුණේ අසාමාන්‍ය ශබ්දයක්. එනම් ඌ නිදිනැතුව කූඩුව ඇතුළේ කලබලයෙන් එහා මෙහා දුවන හඬ හා ගොරවන හඬ. රාත්‍රියට ඌ සිටිය යුත්තේ ඇතුළෙන්ම තිබෙන උගේ කූඩුව තුළ මිසක්, දවාලට ඉන්න කුටියේ නෙමෙයි. ඒ නිසා මං යකඩ කොටු සහිත දොර විවෘත නොකර, ලන්තෑරුම එළිය කර බැලුවා.

මට එක්වරම දකින්න ලැබුණේ තැලී කැලිවලට ඉරීගිය ඇඳුම් සහිත මළසිරුරක් සහ කුටිය පුරා විසිරී ගලා ගිය ලේ. මට එක්වරම හිතුණේ මේ බෝල්ඩ්වින්ද කියලයි. නමුත් මේ මෘතල් බව හඳුනාගැනීමට මට මිනිත්තුවකට වඩා ගියේ නැහැ. ඔහුගේ උරහිසෙන් ලොකු කොටසක් හා බෙල්ලෙන් පැත්තක් ටොම් මේ වනවිටත් කා දමා අවසන්. ඌ උගේ කූඩුව තුළට ගොස් සිටියා. මට එක්වරම කෑගැසුණේ "බෝල්ඩ්වින්! බෝල්ඩ්වින්!" කියලා. ඔහු නොපැමිණි නිසා මං කිහිපවාරයක්ම උස්හඬින් කෑගැසුවා. ඒත් ඔහු ආවේ නැහැ. ආවේ අනෙක් සුළු සේවකයන් දෙදෙනා. බෝල්ඩ්වින් ඔහුගේ කාමරයේ නොමැති බව ඔහුන් කීවා. මගේ කටහඬට ටොම් උගේ කූඩුවෙන් එළියට එන හැටි මා දුටුවා."

"ඊළඟට ඔබ මොකද කළේ?"

"මං එක සේවකයෙකුට නියම්කළා වහාම අශ්වකරත්ත රියැදුරා අවදිකරගෙන පොලීසියට යන ලෙස. අම් වේලාවට හැඬිලිවලින් දුම්රිය නොමැති නිසා දිගටම අශ්වකරත්තයෙන් ඉප්ස්විච් වෙත යන්න මං ඔහුට කිව්වා."

"එතකොට වෙලාව කීයද?" ලෙස්ට්‍රේඩ් ඇසීය.

"හතරයි කාල විතර වෙන්න ඇති"

"ඊළඟට ඔබ මොකද කළේ?" ඒ විමසුම හෝම්ස්ගෙනි.

"සාමාන්‍යයෙන් ඌට කූඩුවට යන්න කියලා මං අණකළොත් ටොම් උගේ කූඩුව ඇතුළට යනවා." ජේකොබ් කීය. "නමුත් මේ වෙලාවේ මං දුන් අණට ඌ කීකරු වුණේ නැහැ. මං යකඩකූරු ආධාරයෙන් තමයි ව්‍යාඝ්‍රයාව උගේ කූඩුවට යවා ගත්තේ. ඒ සේවකයා උදව්කරගෙන මෘත ශරීරය එළියට ගන්නා අදහසින්. ආයෙ මට හිතුණා පොලීසියට සෝදිසි කිරීම පහසුවෙන්න එය එතැනම තිබෙන්න අරින්න. ටොම් උගේ කූඩුවට ගිය පසු, මම එළියේ සිට උගේ කූඩුව වසා දැම්මා.

"ඔබ යකඩ කොටු දොරෙන් කාමරය ඇතුළට ගියේ නැද්ද මහත්මයා?" හෝම්ස් ඇසීය.

http://sherlockholmesinvestigations.blogspot.com

"නැහැ"

"ඒක බොහොම හොඳයි" හෝම්ස් කීය. "ව්‍යාඝ්‍රයා කූඩුව ඇතුළට යවන්න ඇයි ඔබට යකඩකූරක් ආධාර කර ගන්න වුණේ? මීට ඉස්සරත් ඔබේ අණට ඌ කීකරු නොවී තියෙනවද? ඌ ඔබට හීලෑ නම්............?"

"........... මහත්මයා" පේෂ්කාඩ් කීය. "මේ ව්‍යාඝ්‍රයා කවදාවත් මිනිස් ලේ රසබලා තිබුණේ නැහැ. ඒ නිසයි මෙපමණ කාලයක් ඌ ළඟට යාමට මට හැකියාව තිබුණේ. නමුත් ඌ ඊයෙ රෑ මිනිස් ලේ රස බැලුවා. දැන් ඉතින් ඌ ඉතාම භිහිසුණු සතෙක්. එහි යාම දැන් නම් මට වුණත් අවදානම්"

මිනිත්තුවක දෙකක නිහඬතාවයක් පැතිරිණි. මගේ මිත්‍රයා නළල රැළි කරගෙන කල්පනා කරන ආකාරය මම දුටුවෙමි.

"ඊයේ රාත්‍රී කීයට පමණද ඔබ දෙදෙනා නිදගන්න ගියේ?" හෝම්ස් විමසුවේය.

"රෑ එකොළහට පමණ"

"ඒ වෙලාවේ වැස්සක් තිබුණද?"

"නැහැ. වැස්සක් ඉක්මනින් ඇදහැලෙනු ලකුණු තිබුණා"

"නින්දට යාමට පෙර ඔබ ව්‍යාඝ්‍රයා බලලා එන්න ගියේ නැද්ද?"

"නැහැ"

"ඊයේ රාත්‍රී ඔබ ඔහුගෙන් සමුගත් වෙලාවෙ වුණු කතාබහ විස්තර කරන්න" හෝම්ස් ඉල්ලා සිටියේය.

"අපි දෙන්නා රෑ එකොළහ වෙනතුරු බිලියඩ් කාමරයේ නොයෙක් දේ කථා කරකර හිටියා. මං ඔහුට කිව්වා බ්‍රසීලයේ වර්ෂා සමය ඇරඹෙන කොට ඇමේසන් වනාන්තරයේ දරුණුම කාලය උදාවෙන බව. ඒ කාලයේ තිබෙන අධික උෂ්ණය නිසා වනසතුන් හැසිරෙන්නේ වියරු වැටුණා වගේ. ඒ බව මං ඔහුට කිව්වා. ඊයේ රාත්‍රියේත් තිබුණේ අධික වශයෙන් ඩහදිය ගැලූ උණුසුමක්. මාලේ මෙහෙ ආව මුල දවසෙ ඉඳලම අපි රෑ එකොළහ විතර වෙනකම් කෝපි බිබී සුරුට්ටු බොමින් කතාබහ කිරීම සිරිතක් වුණා. ඒ පුරුදු විදියට කරලා, ඊයෙ රෑත් එකොළහට මං ඔහුට සුභ රාත්‍රියක් පතලා නිදගන්න ගියා"

"නිදගන්න රෑ එකොළහට තමන්ගේ කාමරයට ගිය මාලේ මහතා උදේ හතරට හමුවුණේ ව්‍යාඝ්‍ර කුටිය ඇතුළෙ ඉඳලා" හෝම්ස්

Reading Purpose Only. Not For Print

 http://sherlockholmesinvestigations.blogspot.com

ඇසීය. "ඔබට හිතෙන හැටියට ඒක ඒ විදියට සිද්දවුණේ කොහොමද?"

"හිතන්න පුළුවන් එකම දෙයයි" ජේකොබ් පිළිතුරු දුන්නේය. "රාත්‍රියේ තිබුණු අධික උණුසුම නිසා මාෂල්ට නිදගැනීම අපහසුවෙන්න ඇති. මේ උණුසුම් කාලගුණය සමග සතුන්ගේ චර්යාව වෙනස් වෙනවා කියලා මං කියූ දෙය ඔහුට සිහිවෙන්න ඇති. එක්වරම ඔහුට ආසා හිතුණ්න ඇති ව්‍යාඝ්‍රයාගේ හැසිරීමේ වෙනස්වීමක් තියෙනවාද බලන්න. ඔහු කාමරයේ තිබුණු ලන්තෑරුමත් අරගෙන එහි ගිය බව අපට පැහැදිලියි. නමුත් එතැනින් එහාට සිද්දවුණේ මොකක්ද කියල මට හිතාගන්න අමාරුයි. එක්කො.............."

"මොකක්ද ඔබ අදහස් කළේ?"

"මොන හේතුවක් නිසා හෝ ඔහු යකඩ කොටු දොර ඇරගෙන කුටිය ඇතුළට ගිහිං තියෙනවා. නමුත් ඊට පෙර එළියේ සිට රෝදය කරකවා ටොමීගේ කූඩුවේ ග්‍රිල්ගේට්ටුව විවෘතකර ඌට කුටියට එන්න ඉඩ සලස්වා තියෙනවා. ඒක තමයි මට තේරුම් ගන්න අමාරු. මේ දොරවල් අරින වහන එක ගැන නුහුරු නිසා ඔහුට අමතක වෙලා කලින් රෝදය කරකැව්වාද දන්නෙත් නැහැ."

"ඔබට හිතෙන්නේ එහෙමද?"

"මට මොකුත් හිතාගන්න බෑ මහත්මයා" ජේකොබ් කීවේ නිකටේ අත තබාගෙන සීලිම දෙස බලාගෙන කල්පනා කරමිනි.

"බාගවෙලාවට ඊයෙ රෑ කූඩුවේ ග්‍රිල්ගේට්ටුව වහන්න බෝල්ඩ්වින්ට අමතකවුණාද දන්නෙත් නෑ. ඒ අමතකවීම නිසා සිද්දවුණු විනාශය බෝල්ඩ්වින් මට කලින් දකින්න ඇති. ඔහු මගේ සේවය අතහැර දමා පැනගොස් සිටින්නේ ඒ නිසා විය හැකියි"

"බෝල්ඩ්වින් ද්වේෂ සහගතව ඒ දේ කළා වෙන්න බැරිද?" ලෙස්ට්‍රේඩ් ඇසීය.

"එහෙම කරන්න හේතුවක් නැහැ මහත්මයා" ජේකොබ් පැවසුවේය. "එහෙම දේකින් බෝල්ඩ්වින්ට ඇති ප්‍රයෝජනයක් නැහැ. වයසට යාම නිසා ඔහුට නොයෙක් වැඩකටයුතු අමතක වෙන ස්වභාවයක් නම් තිබුණා.

"ඔහු මානසික විකෘතියකට ලක්වුණු උන්මත්තකයෙක් නොවෙයිද?" මම ඇසීමි.

http://sherlockholmesinvestigations.blogspot.com

"ඒ බවක් මට නම් පෙනිලා නැහැ"

"මේ දින තුන හතරට කවුරුන් හෝ මාෂල් කිං සමග අමනාපයක් ඇතිකරගත්තද?" හෝම්ස් විමසුවේ ජේකොබ්ගේ මුහුණදෙස දැඩි අවධානයක් යොමුකරමිනි.

"කාගෙවත් කිසිම අමනාපයක් ඇතිවුණේ නැහැ මහත්මයා" ජේකොබ් පිළිතුරු දුන්නේය. "මාෂල් පුංචි ළමයෙක් වගේ අහිංසක කෙනෙක්. ඔහු සමග කෙනෙක් අමනාප වෙන්නේ, සණ්ඩු වෙන්නේ කොහොමද?"

"රෑ එකොළහට ඔබ නිදාගන්න යද්දිද ඔබේ බිරිඳත් නිදාගන්න ගියේ?"

"නැහැ" ජේකොබ් කීය. "මේ දිනවල ඇය රෑ කෑම අවසන්කළ වහාම නින්දට ගියා. මං කාමරයට යද්දී ඇයට තදින්ම නින්දගොස් තිබුණා"

"ඊයේ රාත්‍රී ඩහදිය ගලන තද උණුසුමක් තිබුණු බව ඔබ කිව්වා" හෝම්ස් ඇසීය. "නමුත් අකුණු හඬින් රෑ එකට අවදිවුණු අවස්ථාව හැරෙන්නට, ඔබට උදේ හතරට ඇහැරෙන තුරු තදින්ම නින්ද ගියාද?"

"ඔව් මහත්මයා." ජේකොබ් කීය. "බ්‍රසීලයේ දීර්ඝ කාලයක් ජීවත්වූ මට උණුසුම, ඩහදිය ගැලීම අමුතු දේවල් නෙමෙයි. එයින් මගේ නින්දට හිරිහැරයක් නැහැ."

"ඔබ කොහොමද බෝල්ඩ්වින් ඔබේ සේවයට බඳවාගත්තේ?" හෝම්ස් ඇසීය. "කොහේ හරි රැකියාව කළ තැනක සහතික අනුවද? නැත්නම් ඔබ ඔහු බ්‍රසීලයෙන්ම කැඳවාගෙන ආවාද?"

"නැහැ. ඔහු එංගලන්තයේම ඈත පළාතක කෙනෙක්" ජේකොබ් කීය. "මම මේ සත්තුවත්ත පටන්ගත් දිනවල, ඔහු රැකියාවක් හොයාගෙන ආවා. ඔහු යටහත් පහත් වයස්ගත කෙනෙක් නිසාත්, මං නියම කළ වැටුපට එකඟවුණු නිසාත් මං බෝල්ඩ්වින්ව රැකියාවට බඳවාගත්තා. ඒ මිසක් මං ඔහුගේ සහතික බැලුවේ නැහැ. ඔහුගේ ගම කොහේද, මවුපියන් කවුද ලිපිනය මොකක්ද ආදිය විමසුවේ නැහැ"

"ඕක බොහොම දෙනෙකු අතින් සිදුවෙන වැරැද්දක් ජේකොබ් මහත්මයා" ලෙස්ට්‍රේඩ් කීය. "ඔහුං හරියට හොයා නොබලා තමන් ළඟට එන මිනිසුන් රස්සාවට ගන්නවා. පස්සේ හාම්පුතා ලොකු

 http://sherlockholmesinvestigations.blogspot.com

අමාරුවක දලා සේවකයා පැනයනවා. ඔහු ඉන්නා තැනක් හොයාගන්න කිසිම පිළිවෙලක් නැහැ"

"ඔබේ කතාව හරියටම හරි මහත්මයා." ජේකොබ් කීය. "ඒක මගේ අතින් වුණු ලොකු වැරැද්දක්. දැන් තමයි මට තේරෙන්නෙ"

"ඊයෙ රෑ වැස්ස පටන්ගත්තේ කීයට විතරද කියලා ඔබට මතකද?" හෝම්ස් ඇසීය.

"නැහැ මහත්මයා. ඇඳට වැටුණු ගමන් මට තදින්ම නින්ද ගියා" ජේකොබ් පිළිතුරු දුන්නේය. "මං කලින් කියූ විධියට එකට විතර අකුණු ශබ්දයට ඇහැරුණා. එතකොට වැස්සක් තිබුණේ නැහැ. නමුත් උදේ හතරට පමණ අවදිවෙලා බලද්දි රාත්‍රියේ තදින් වැහැලා"

මගේ මිත්‍රයා දල්වාගත් පයිප්පය උරමින්, බිම බලාගෙන දිගටම කල්පනා කරමින් සිටියේය. මඳ විරාමයකට පසු ඔහු අසුනෙන් නැගිට්ටේය.

"හොඳයි ජේකොබ් මහත්මයා. එහෙනම් අපි යමු සිද්ධිය වුණු තැනට" හෝම්ස් කීය.

හැරී ජේකොබ් පෙරමුණු ගත්තේය. මාර්ගය දන සිටි පොලිස් පරීක්ෂක මැකෙන්සි ද ලෙස්ට්‍රේඩ් ඊට පිටුපසින් ද ගමන් ගත්හ. හෝම්ස් පැමිණියේ අප සැමදෙනාටම පිටුපසිනි. නිවසෙන් පහළට තරප්පු කිහිපයක් බැසයාමට මුලින්ම අපට සිදුවිය. සිමෙන්ති නොදැමූ එහෙත් ගල් අල්ලා සකස් කළ පාරක් දිගේ යාර තිහක් පමණ ගිය පසු ජේකොබ් මහතා නැවතුණේය. වැස්සට මඩවී තිබූ තණ බිමකින් එහා පැත්තේ වූ ගෙය විහාලයාගේ නිවහන බව ඔහු අපට පැවසුවේය.

"එතැන පරීක්ෂාකරන්න කලින් මං කැමතියි බෝල්ඩ්වින් ගේ කාමරය බලන්න" හෝම්ස් කීය.

"ඔබේ කැමැත්තක්" කී ජේකොබ් තවත් යාර විසිපහක් තිහක් දුරින් වූ නිවසක් වෙත අප කැඳවාගෙන ගියේය. සතුන් බලාගැනීමට සිටි අනෙක් සුළු සේවකයන් දෙදෙනා, රාජකාරී නිමකොට තම කාමර වෙත ආපසු පැමිණ සිටි බැව් අපට දකින්නට ලැබිණි.

"ලෙස්ට්‍රේඩ්" හෝම්ස් කීය. "මෙතැන මරණයක් සිදුවෙලා තියෙනවා නෙ. මං කැමතියි ඔබ මේ සේවකයන් දෙදෙනාගෙන් කටඋත්තර ගන්නවා නම්"

තම සටහන් පොත එළියට ගත් ලෙස්ට්‍රේඩ්, සාමාන්‍ය පොලිස් ක්‍රියා පටිපාටිය අනුව, සේවකයන්ගෙන් වෙන වෙනම විස්තර විමසා, කට උත්තර සටහන් කර ගැනීමට පටන් ගත්තේය. මෙය අනවශ්‍ය ලෙස කාලය නාස්තිකිරීමක් නොවේදැයි මට සිතිණි. ජේකොබ් මහතාගේ මුහුණෙන් පළවුණේ ද එම හැඟීම ය. එහෙත් පොලිස් නිලධරයා එම කාර්යය කරන තුරු අපි නිහඬව බලා සිටියෙමු.

එම කටයුත්තට පැය කාලක් පමණ ගතවිය. වටපිට බැලූ මා දුටුවේ හෝම්ස් එතැන නොමැති බවය. ඔහු හෙමින් සීරුවේ එතැනින් ගියේ කුමක් සඳහා ද? හෝම්ස් ව්‍යාඝ්‍ර කූඩුව වෙත වැටුණු පාර තිබූ තණබිම් කඩ පරීක්ෂා කරමින් සිටියේය.

අපි වහාම එතැනට ගමන් කළෙමු. දීර්ඝ කාලයක් තිස්සේ පැවැති නියඟය නිසා තණබිමේ විශාල ප්‍රමාණයක තණකොළ මැරී ගොස් තිබිණි. කලින්ද රාත්‍රියේ පැවැති වර්ෂාව නිසා ඒ තැන්වලට වතුර උරාගෙන පස මෘදුබවට පත්වී ඇති බව ද අපි දුටුවෙමු. එමෙන්ම සමහර තැන් මඩ වළවල් බවට පත්වී තිබූ අතර වල් ඌරු පැටවු දෙදෙනෙක් එම මඩ වළවල් හාරමින් සිටියෝය. අප එතැනට ළඟාවෙද්දී හෝම්ස් ඔහුගේ කටයුත්ත අවසන් කළේය.

"හොඳයි ජේකොබ් මහත්මයා, දැන් අපි යමු ව්‍යාඝ්‍ර කූඩුව බලන්න" හෝම්ස් යෝජනා කළේය.

ව්‍යාඝ්‍රයා වෙනුවෙන් තැනූ ගෘහයේ පිහිටීම ගැන මම කලින් තැනක විස්තර කොට, එහි දළ සටහනක් ද ඔබ වෙත ඉදිරිපත් කළෙමි. මාෂල් කිං ගේ මළසිරුර, කුටිය නමින් හඳුන්වන ඉදිරිපස වඩාත් විශාල කොටසේ මුහුණින් අතට වැටී තිබිණ. ඔහුගේ කබාය කුටියේ එක් කෙළවරක වැටී තිබූ අතර සිරුර තිබුණේ වෙනත් තැනකය. ඔහුගේ සිරුරේ මෙන්ම ඇඳුම්වල ද කැබලි කඩා ඉවත්කොට ගෙන තිබිණි. කුටිය පුරා පොළොවේ තැන් තැන්, ගලා ගොස් කැටිගැසුණු ලෙයින් වැසී ගොස් තිබූ අයුරු දකිය හැකි විය. ඒවා දැන් රතු පැහැයට වඩා මඳ වශයෙන් දුර්වර්ණ රතු පැහැයකට හැරෙමින් තිබූ බැව් මට සනිටුහන් විය.

අප උගේ ගෘහයේ පිටත යකඩ දොර වෙත ළංවෙද්දී ව්‍යාඝ්‍රයා ගොරවන්නට පටන්ගත්තේය. මළසිරුර පිහිටි කුටිය වෙත අපට ඇතුළුවීමට හෝම්ස්ගෙන් අවසර නොලැබිණි.

 http://sherlockholmesinvestigations.blogspot.com

"මහත්වරුනි. ඔබට ඇහෙනවා නේද සද්දේ?" ජේකොබ් මහතා කීය. "අද උදේ පාන්දර මං මෙතැනට එද්දිත් ටොම් ගෙරෙව්වේ ඔය විධියට තමයි"

කිසිවක් නොකී හෝම්ස් තම සාක්කුවෙන් කුඩා දේ විශාල කර බලන කාචය අතටගෙන කුටියේ පොළොව පරීක්ෂා කර බැලීමට පටන් ගත්තේය.

දකින්නට ලැබුණු දර්ශනය, ඕනෑම කෙනෙක් කම්පනයට පත්කිරීමට සමත් බිහිසුණු එකක් විය. හමුදා ශල්‍යවෛද්‍යවරයෙකු ලෙස සේවය කර තිබුණත්, එම දසුනෙන් මගේ සිත ද සසල විය. එහෙත් මගේ මිත්‍රයා නොසැලී මෘතශරීරය වටේම පොළොව සෝදිසි කළේය. අනතුරුව ලේ පැල්ලම් හා මළසිරුර තිබූ තැන් තම සටහන් පොතේ සලකුණු කරගත්තේය. ඔහු මෙම කටයුතුවල යෙදෙද්දී ව්‍යාඝ්‍රයාගේ ගෙරවීම වඩාත් වැඩිවූයේ අප වෙත උගේ අප්‍රසාදය පළකිරීමට මෙනි.

"ජේකොබ් මහත්මයා" හෝම්ස් කීය.

"ව්‍යාඝ්‍රයා දැනට ඉන්න කූඩුව සහ මේ ඉදිරිපස කුටිය සෝදන්නේ දින කීයකට වරක්ද?"

"ඌ ඉන්න කූඩුව නම් සෝදන්නේ දවසකට එක්වරයි" ජේකොබ් කීය. "ඒ උදේට විතරයි. නමුත් මේ කුටිය දවසට දෙවරක් සෝදනවා. ඒ මොකද වැඩිපුරම අපිරිසිදු වෙන්නේ මේ කුටිය නිසා. ඌ දවසේ වැඩිවෙලාවක් ජීවත්වෙන්නෙත් ආහාරය ගැනීම සිදුකරන්නෙත් මේකෙ නිසා. ආහාරයට ගන්නා මස්වල කැබලි, ලේ සහ අනෙක් අපද්‍රව්‍ය සියල්ලක්ම වැඩිපුර එකතුවෙන්නේ මෙහි. උදේ දහයට පමණත් හැන්දෑවේ හයටත් විෂබීජනාශක දියර දමා බුරුසුවකින් අතුල්ලා මෙතැන සෝදනවා."

"ඊයේ උදේත් හැන්දෑවෙත් ඒ කටයුත්ත එලෙසම සිදුවුණාද?"

"ඔව්"

කුටිය ඇතුළත පරීක්ෂාව අවසන් කිරීමෙන් පසු මළසිරුර ඉවතට ගැනීමට හැකි බව හෝම්ස්, පොලිස් පරීක්ෂක මැකන්සිට දැනුම් දුන්නේය. ඒ අනුව එහි පැමිණි පොලිස්භටයන් දෙදෙනෙකු විසින් මළසිරුර ඉවතට ගෙන යන ලදී.

මේ වනවිට පශ්චාත් මරණ පරීක්ෂණය පැවැත්වීම සඳහා වෛද්‍යවරයෙක් ද, එය විභාගකිරීම සඳහා හදිසි මරණ

පරීක්ෂකවරයෙක් ද පැමිණ ඇති බැව් අපට අසන්නට ලැබිණි. එම කටයුත්ත පැවැත්වීම සඳහා සූදනම් කෙරුණේ ග්‍රේලන්ඩ්ස් මන්දිරය ඉදිරිපිට පිහිටි තණකොළ වැවූ මිදුලය. සියලු දෙනාම එතැනට එකතුවෙද්දී, එහි යෑමට මගේ මිත්‍රයා උනන්දු වූ බවක් නොපෙනිණ. තවමත් කුටිය ඇතුළේ සිටි ඔහු ලේ කැටි ඉවත්කරමින් පොළොව පරීක්ෂා කරමින් සිටියේය. මම පශ්චාත් මරණ පරීක්ෂණය පැවැත්වූ තැනට ගියෙමි.

මරණයට හේතුව නිගමනය කිරීම වෛද්‍යවරයාට අපහසු කරුණක් නොවීය. වනමෘගයෙකු විසින් සපා කෑමෙන් ඇතිවූ තුවාලවලින්, අධික ලෙස ලේ වහනය වීමෙන් සහ, වේදනාව නිසා ඇතිවූ ස්නායු කම්පනයෙන්, මරණය සිදුවී ඇතිබවට වෛද්‍යවරයා නිගමනය කළේය. පොලීසියේ මෙහෙයවීමෙන් ජේකොබ් මහතා සහ සුළු සේවකයෝ සාක්ෂි දුන්හ. බෝල්ඩ්වින් නම් සේවකයාගේ මෙන්ම බොහෝවිට මියගිය අයගේ ද නොසැලකිල්ල නිසා රෞද්‍ර ව්‍යාඝ්‍රයෙකු විසින් මේ මරණය සිදුකර ඇති බවට මරණ පරීක්ෂකවරයා තීන්දු කළේය. මෙහිදී නොසැලකිලිමත් ලෙස කටයුතු කර ඇතැයි සිතිය හැකි, රොබට් බෝල්ඩ්වින් නම් සේවකයා වහා අත් අඩංගුවට ගන්නා මෙන් මරණපරීක්ෂකවරයා පොලීසියට නියෝග කළේය. එම කටයුතු අවසන්වෙද්දී හෝම්ස් එතැනට පැමිණෙන අයුරු මම දුටුවෙමි.

"ඒ වැඩත් අවසන් නම් අපට අදම ආපහු ලන්ඩනය බලා යන්න පුළුවන්. එහෙම නේද වොට්සන්?" හෝම්ස් ඇසුවේ ආලින්දයේ සැපපහසු පුටුවක වාඩිවෙමිනි.

"ඒ වුණත් වැඩේ තවමත් ඉවර නෑ" ලෙස්ට්‍රේඩ් කීය.

"ඇයි, ඒ මොකද?"

"නෑ. මේ රොබට් බෝල්ඩ්වින් හොයාගැනීම"

"ඒ වුණත් ඒකෙ ඒ හැටි වැදගත්කමක් නෑ. එහෙම නේද?" හෝම්ස් ඇසීය. "අපි හොඳටම දන්නවා මාලේ කිං මියගියේ ව්‍යාඝ්‍ර ප්‍රහාරයෙන් කියල. ඉතින් බෝල්ඩ්වින් හොයාගත්තත්, ඔහු රැකියාවෙන් නෙරපා දැමීම හැරෙන්න වෙන දෙයක් ඉතිරිවෙලා ඇති කියල මං හිතන්නේ නෑ. එහෙම නේද ජේකොබ් මහත්මයා?"

"ඔබේ කථාව සම්පූර්ණ ඇත්ත හෝම්ස් මහත්මයා" ජේකොබ් කීය. "මගේ ඥාති සහෝදරයා මේ ව්‍යාඝ්‍ර කූඩුවට බලෙන්

 http://sherlockholmesinvestigations.blogspot.com

ගෙනගියා නොවෙයි නේ. ඒ නිසා බෝල්ඩ්වින්ට දඬුවම් කළ හැකි මාර්ගයක් මට නම් හිතාගන්න අමාරුයි. තමන්ගේ රාජකාරිය නොසැලකිල්ලෙන් කරන සේවකයෙක් මට නම් කොහොමටවත් උවමනා නැහැ"

"ඒ වුණත් ජේකොබ් මහත්මයා අපට ඔහු උවමනායි" ලෙස්ට්‍රේඩ් කීය. "රාජකාරි කටයුතු නිසිලෙස අවසන් කිරීමට ඔහු සොයාගෙන උසාවියට ඉදිරිපත් කළයුතුයි. ඒත් ඔහු හොයාගන්නෙ කොහොමද කියල හිතාගන්නයි මට අමාරු............"

"ඔහුගේ හැඩහුරුකම කියලා පුවත්පතකට දැන්වීමක් දන්න" හෝම්ස් කීය. "එතකොට පහසුවෙන්ම හොයාගත හැකි. ඔහුගේ වයස පෙනුම සහ රැකියාව ගැන සඳහන් කළාම ඇති. ජේකොබ් මහත්මයා. ඔබට හැකිනම් දැන්වීමක් ලියල මට දෙන්න. මං හවසට පුවත්පත් කාර්යාලයට භාරදෙන්නම්. හෙට උදේ පත්තරවල පළවේවි."

දැන්වීම ලියූ ජේකොබ් එය හෝම්ස් අතට ගෙනත් දුන්නේය. එය වෙත නෙත් හෙළූ හෝම්ස් එම දැන්වීම ආපසු ජේකොබ් වෙතම භාරදුන්නේය.

අපට ඇහෙන්න ඔබම කියවන්න.

"රොබට් බෝල්ඩ්වින් - වන සතුන් බලාගන්නා. සත්වෝද්‍යාන සේවකයා. බ්‍රහස්පතින්ද රාත්‍රියේ සිට ආගිය අතක් නොමැතිය. වයස අවුරුදු හැටයි. හිසකෙස් පැසී ඇත. උස අඩි පහමාරයි. සිහින් සිරුරක් ඇත. දුටුවෙකුනොත් වෙතොත් ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියට දැනුම්දෙන්න."

"ඔබේ දැන්වීම හොඳයි ජේකොබ් මහත්මයා" හෝම්ස් කීය. "නමුත් ඔබේ අත්අකුරු නම් ඒ හැටිම පැහැදිලියි කියල මට කියන්න බැහැ. මේක පුවත්පතට යැව්වොත්, මුද්‍රණයේදී ඔවුන් වැරදි විසිපහක් වත් කරාවි. වඩාත් හොඳයි මේක යතුරු ලියනය කළ හැකි නම්. නැද්ද ඔබ ළඟ යතුරු ලියනයක්?"

"මා ළඟ පරණ යතුරු ලියනයක් නම් තියෙනවා" ජේකොබ් කීය. "ඒකෙ සමහර යතුරු වැඩකරන්නෙ නෑ හරියට. කමක් නැද්ද?"

"අපොයි ඒකට කමක් නෑ"

"එහෙනම් මං ඒකෙන් ලියාදෙන්නම්."

කාමරයට ගිය ජේකොබ්, දැන්වීම යතුරුලියනය කරන හඬ අපට ඇසිණ.

http://sherlockholmesinvestigations.blogspot.com

එදු දහවල් ආහාරය අපි ගත්තේත් ඉප්ස්විච් හෝටලයෙහිය. ඉන්පසු ලන්ඩනය බලා පිටත්වුණෙමු.

ඇඳිරිවැටෙද්දී අපි බේකර් වීථියේ නිවහනට ළඟාවූයෙමු. ඇඟට දැනුණු මහන්සිය නිසා මම විවේක ගැනීමට තීරණය කළෙමි. එහෙත් හෝම්ස් කළේ එය නොවේ. හඩ්සන් මහත්මිය එවූ තේපෝච්චියෙන් කෝප්ප දෙකක්ම පානය කළ ඔහු, නිවසෙන් පිටවී ගියේය. මා කල් තබා රාත්‍රී ආහාරය ගෙන නින්දට යනවිටත් හෝම්ස් ආපසු පැමිණ සිටියේ නැත. පසුවදා උදයේ මා අවදිවෙද්දී මට අසන්නට ලැබුණේ ඔහු උදේ ආහාරය ද නොගෙන නිවසෙන් පිටවී ගිය බවයි.

තනියම නිවසේ සිටි මම පුවත්පත් කියවීමට පටන්ගත්තෙමි. මාෂල් කිංගේ ඛේදජනක මරණය පිළිබඳ දුක්මුසු පුවත පුවත්පත් කිහිපයකම මුල්පිටුවේ පළ වී තිබිණ.

මීළඟ දින කිහිපයම හෝම්ස් කුමක් හෝ පරීක්ෂණයක් සඳහා වෙහෙස මහන්සි වෙමින් සිටියේය. ඒ කුමක් පිළිබඳව දැයි මට නොකී අතර මා ඇසූ ප්‍රශ්නවලට ද ඔහු කෙටියෙන් පිළිතුරු දුන්නේ එතරම් කැමැත්තකින් නොවේ. විශේෂ දහවල් කෑමවේල සඳහා නිවසට නොආ ඔහු, රාත්‍රියේ ආපසු පැමිණි විට ද සුහද කතාබහක යෙදීමට තරම් මානසිකත්වයක නොසිටියේය. දින ගණනාක් තිස්සේ ඔහු විදුලිපුවතක් බලාපොරොත්තුව සිටියේය. පස්වැනි දිනයේ හැන්දෑවේ ඔහු නමට විදුලිපුවතක් ලැබිණි. එය කියවා බැලූ හෝම්ස් එයින් තෘප්තියට පත්වූ බව මම තේරුම් ගතිමි. එය හතරට නමා කබා සාක්කුවේ දමාගත් ඔහු, මා ඇමතුවේය.

"වොට්සන්. ඔබ කැමැතිද හෙට ඉප්ස්විච් පැත්තේ ගිහින් එන්න?"

"ඉප්ස්විච්? ඒ මොනවටද?"

"ඉපස්විච් කියල කිව්වට මං අදහස් කළේ ග්‍රේලන්ඩ්ස් මන්දිරය - ඔබේ යාළුවා මාෂල් කිං ඛේදජනක ලෙස මියගිය තැන"

"මොකටද එහේ යන්නේ?" මම ඇසීමි. "එතැන මොකුත් අභිරහසක් නැහැනේ. කෝ අර අතුරුදන්වුණු බෝල්ඩ්වින් අල්ලාගන්න ලෙස්ට්‍රේඩ්ලට බැරිවුණා නේද?"

"හැරී ජේකොබ් ඔහුගේ මිනීකන වහාලුයා ලන්ඩන් සත්වෝද්‍යානයට භාරදෙන්න තීරණය කරලලු" හෝම්ස් කීය. "මං

http://sherlockholmesinvestigations.blogspot.com

කැමැතියි ඒක මගේ දෑසින්ම බලාගන්න. ලෙස්ට්‍රේඩුත් යනවා මා එක්ක. ඔබට කැමැති නම් යමු හෙට උදේ"

මා එයට කැමැත්ත පළකළේ නිවහනේ රැඳී සිට කළ යුතු විශේෂ කටයුත්තක් නොතිබූ බැවිනි.

පසුවද උදෑසනින්ම ලන්ඩනයෙන් පිටත්වී ගොස් උදේ නවයහමාර වෙද්දී ග්‍රේලන්ඩ්ස් වෙත ළඟාවීමට අපට හැකිවිය. අප නැවත වරක් එහි පැමිණීම ගැන හැරී ජේකොබ් මහතා එතරම් සතුටට පත්වූ බවක් මම නුදුටුවෙමි.

"ලෙස්ට්‍රේඩ් මහත්මයා" ජේකොබ් කීය. "මාෂල් කිංගේ මරණය සම්බන්ධ වැඩකටයුතු හැමදෙයක්ම දැන් අවසන් නේ. මගේ ටොමීගෙන් ඊට පස්සේ කාටවත් හිරිහැරයක් වුණේ නැහැ. තවත් එහෙම වෙන්න මං ඉඩ තියෙන්නෙත් නැහැ. මං අලුත් සේවකයෙකු ගත්තා. මං ඔහුට නියම කරලා තියෙන්නේ කෑම දෙන්න යන වෙලාවට හැර අනික් හැම වෙලාවකම පිටත දොර ඉබියතුරු දමා වහල තියන්නයි. ඒ මඟින් අපට පුළුවනි හදිසි අනතුරක් වීම වළක්වාගන්න. ඉතින් මොකටද ලන්ඩන් ඉඳල විශේෂයෙන් මෙහේ ආවේ? ඔයි මොනවද මගෙන් බලාපොරොත්තු වෙන්නෙ?"

"අපට ආරංචියක් ලැබුණා ඔබ වහාලයා අද ලන්ඩන් සත්වෝද්‍යානයට භාරදෙන්න හදනවා කියල" ලෙස්ට්‍රේඩ් කීවේ හෝම්ස්ගේ මුහුණ බලමිනි.

"මම? වහාලයා දෙනවා කියලා?" ජේකොබ්ගේ කටහඬේ කෝපයක සේයාවක් විය. "කවුද කිව්වේ? මොන පත්තරේද තිබුණේ?"

"ඔබ හඳුනන කෙනෙක් තමා කිව්වේ" හෝම්ස් පිළිතුරු දුන්නේය. "ඔහු අද මෙහෙ එනවා කිව්වා. මං හිතුවා ඔහු දැනටමත් ඇවිත් ඇති කියල. අපිත් ආවෙ ඒකයි"

ඈතින් එන අශ්වකරත්තයක හඬ යන්තමින් අසන්නට ලැබිණ.

"කවුද එනවා කිව්වෙ?" ජේකොබ් ඇසුවේ කෝපාවිෂ්ටවය. "මගේ ටොමී සත්වෝද්‍යානයට දෙන්න? ඔහේලට පිස්සුද? මගෙන් අවසරයක් නැතුව එහෙම දේවල්..................."

ඔහු කථාව නැවැත්වූයේ අශ්වකරත්තය මිදුලට ළඟාවූ බැවිනි. අපි නිහඬව බලාසිටියෙමු. කරත්තයෙන් මුලින්ම බිමට බැස්සේ පොලිස් පරීක්ෂක මැකෙන්සිය. ඊළඟට බැස්සේ අප නාඳුනන

http://sherlockholmesinvestigations.blogspot.com

වයස්ගත පුද්ගලයෙකි. අන්තිමට කරත්තයෙන් බිමට බට පොලිස්භටයන් දෙදෙනා නිවසෙන් පිටත රැඳී සිටියහ.

"හා බෝල්ඩ්වින්!" ජේකොබ්ට කෑගැසිණ. "මොන යක්ෂ ලෝකෙකටද තමුසෙ ගිහින් හිටියේ? කොහේ ගියත් තමුසෙ අන්තිමට පොලීසියට අහුවුණා එහෙනම්? මට කිසිම දැනුම්දීමක් නොකර පැනගිය, තමුසෙව බේරගන්න කියල මට නම් කියන්න එපා. ඒවා තමුසෙම බලාගන්නවා පොලීසියත් එක්ක. මැකෙන්සි මහත්මයා. මෙයා කොහේ හැංගිලා ඉඳිද්දිද ඔබට අහුවුණේ?"

"මෙයා මට හමුවුණේ ලන්ඩනයේ වයිට් චැපල්වල පෙනීක්වික් වීථියේ නිවසක ඉඳල" හෝම්ස් කීවේ එම ප්‍රශ්නයට පිළිතුරු දෙමිනි. "ඔහු අයිති මේ පළාතට නිසා, මං මැකෙන්සිව කැඳවලා ඔහුට භාරදුන්නා"

"ජේකොබ් මහත්මයා" මැකෙන්සි කීය. "මං මෙයාගෙන් දිගින් දිගටම ප්‍රශ්න කෙරුවා. මෙයාට කියන්න තියනවලු දිග කතාවක්. මේ මහත්වරුත් කැමැතිවේවි ඒකට නිවිහැනහිල්ලේ කන්දෙන්න. අපට පුළුවන්ද පැය භාගයකට ඔබේ විසිත්ත කාමරයේ අසුන් ගන්න? ඔබට කරදරයක් නැත්නම්?"

"මේ බෝල්ඩ්වින් මගේ ගේ හරියට වැද්දගන්නවත් මං කැමති නෑ" ජේකොබ් කීය. "ඒ වුණත් ඔබේ ඉල්ලීම නිසා මං මේ වතාවට ඉඩදෙන්නම්."

අපි සියලුදෙනාම නිවසේ විසිත්ත කාමරය වෙත ගියෙමු. බෝල්ඩ්වින් මැකෙන්සි හා ලෙස්ට්‍රේඩ් දෙදෙනාට මැදිව සෝපාවක අසුන්ගත්තේය.

"හොඳයි බෝල්ඩ්වින්" හෝම්ස් කීවේ සංවාදය අරඹමිනි. "ඔබට විරුද්ධව චෝදනාවකුත් තියෙනවා බ්‍රහස්පතින්ද රෑ නොසැලකිලිමත් ලෙස රාජකාරි කරල, රැකියාව අත්හැර පැන ගියා කියල. මුලින්ම අපට කියන්න බලන්න, මෙහේ රැකියාවට එන්න කලින් මොකද කළේ කියල"

"මං රැකියාව කළේ ලන්ඩන් සත්වෝද්‍යානයේ"

"එහේ කොයිතරම් කාලයක් රාජකාරි කළාද?"

"අවුරුදු විස්සයි"

"ඒ මොන තනතුරේද?"

"මුලින්ම අවුරුදු පහක් සුළු සේවකයෙකු හැටියට වැඩ කළා. ඊළඟට අවුරුදු දෙකක් සිංහයින් භාරකරුගේ සහායක ලෙස

http://sherlockholmesinvestigations.blogspot.com

කටයුතු කළා. ඉතිරි සම්පූර්ණ කාලයම ඉන්දියාවෙන් ගෙනෙන බෙංගාල ව්‍යාඝ්‍රයින් භාරකරු ලෙස"

"ඊට පස්සේ?"

"මාස හතකට කලින් මං රැකියාවෙන් විශ්‍රාම ගත්තා" බෝල්ඩ්වින් කීය. "ඊටපස්සේ මොකක් හරි රැකියාවක් හොයාගන්නා අදහසින් පුවත්පත්වල රැකියා ඇබෑර්තු දැන්වීම් බලමිනුයි හිටියේ. ව්‍යාඝ්‍රයෙකු රැකබලා ගැනීමට පළපුරුදු සේවකයෙකු ඉල්ලා මෝනිං ක්‍රොනිකල් පත්‍රයේ දැන්වීමක් තිබුණා. ඒකට අයදුම්කරාම තමයි මෙහේ රැකියාව ලැබුණේ"

"බොහොම හොඳයි බෝල්ඩ්වින්" හෝම්ස් කීය. "දැන් අපට කියන්න බලන්න ගිය බ්‍රහස්පතින්දා රාත්‍රියේ. - අර විදුලි කොටල ගොරවල මහවැස්සක් වැස්ස දවසේ ඔබගේ අත්දැකීම් හා දුටුදේවල්"

"එදා හවස්වරුවේ ඉඳලම අහස කළුකරලා විදුලි කොටමින් තිබුණා" බෝල්ඩ්වින් කීය. "වේගයෙන් හැමූ කුණාටුවකුත් පැවතුණා. දවස පුරාම තිබුණේ උෂ්ණාධික ගතියක්. හැමදම හැන්දෑවෙ හය වෙනකොට මං ටොමීට කෑම දෙනවා. එළියෙ දොර ඇරලා හරක් ගාතයක් ගෙනිහින් කූඩුවේ කූරු අතරින් ටොමීට කෑමට දැම්මා. ඊළඟට වතුර බාල්දි කිහිපයක් ගහලා ඉස්සරහ කුටිය හේදුවා. විෂබීජනාශක දමලා බුරුසුවකින් අතුල්ලමින් හේදුවා. ඒ වැඩ ඉවර කරලා යකඩ කොටු සහිත පිට දොරත් වැහුවා."

"ඒ දොර වහලා යතුරු දැම්මද?"

"ඒ දොර හදලා තියෙන්නේ නිකම් තල්ලු කරලා වැහුවාම අගුළු වැටෙන්න" බෝල්ඩ්වින් කීය. යතුරකින් ඇරියේ නැත්නම් ඇතුළෙන් හෝ පිටින් අරින්න බැහැ"

"එතකොට ව්‍යාඝ්‍රයාගේ ඇතුළෙන් තිබෙන කූඩුවේ ග්‍රිල් ගේට්ටුවත් ඉබේම වැහෙනවාද?" හෝම්ස් ඇසීය.

"නැහැ." සේවකයා කීය. "ඒක අරින්න පුළුවන් කාමරයෙන් පිටත ඉඳන් පමණයි. අර පැත්තේ බිත්තියට සවිකරලා තියෙනවා තේද යකඩ රෝදයක්? එහි හැඬලයක් අල්ලා රෝදය කරකවන්න ඕන. එතකොට රෝදය වටේ තිබෙන තේඩාව ක්‍රියාකරවීමෙන් පුංචිරෝද සහිත ග්‍රිල්ගේට්ටුව අරින්න වහන්න පුළුවනි"

"හොඳයි. දැන් ඔබ කියන්න සුදනම් වුණු කථාව කියන්න" හෝම්ස් ඉල්ලා සිටියේය.

http://sherlockholmesinvestigations.blogspot.com

"ටොමීට කන්න දීලා ඉවරවෙලා, අනික් සතුන් කිහිපදෙනාටත් කෑම දුන්නා. කුඩු පිරිසිදු කළා. මං ඒව ඉවරකරලා ඇවිත් නාලා, කෑම කාල නිදගන්න ගියා.

"එතකොට වෙලාව කීයද?"

"ඒ අට විතර වෙන්න ඇති. ඇඳට ගියාට මට නින්ද ගියේ නැහැ" බෝල්ඩ්වින් කීය. "අධික ලෙස ඩහදිය දැම්මත්, ගොරවන, අකුණු ගහන ශබ්දයත් නිසා මං හිතන්නේ ඒ දහය විතර වෙනතුරු නින්ද ගියේ නැහැ. එතකොට තමා වැස්ස පටන් ගත්තේ. ඒක තදින් වැස්සා. උණුසුම් ගතිය ඉක්මනින්ම අඩුවුණු නිසා මට ඉක්මනින් නින්ද ගියා. වැස්ස නැවතුණේ කොයි වෙලාවෙද කියන්න මං දන්නේ නැහැ. ඊළඟට ආයෙත් සැරයක් මට ඇහැරුණා.

ඒ වෙලාවේ වැස්සක් තිබුණේ නැහැ. නමුත් වේගයෙන් කුණාටුව හැමූ ශබ්දය අහන්න ලැබුණා. විදුලි කෙටුවා. එතකොට වෙලාව රාත්‍රී දෙක බව මං දැනගත්තා. ඒ මොකද මට ඇහුණා ගමේ දෙව්මැඳුරේ ඔරලෝසුවේ දෙක වදින ශබ්දය.

මේ වගේ කුණාටු දවස්වලට සිව්පා සතුන් හුඟක් කලබල වෙනවා. ඒක මම පහුගිය අවුරුදු ගණනාවක් තිස්සේම දැක තිබුණු දෙයක්. නිදගැනීමත් අපහසුවුණු නිසා මට නිකමට හිතුණා ව්‍යාඝ්‍රයාගේ කාමරය පැත්තට ගිහිං බලන්න. මං මගේ කාමරයෙන් එළියට ආවා. ඇවිත් ව්‍යාඝ්‍ර කාමරය පැත්තට පියවර කිහිපයක් ඉදිරියට ගියා. මට අහන්න ලැබුණා ඈතින් දෙදෙනෙකු කතාබහ කරන හඬ.

එක්වරම මට හිතුණේ සතෙකු හොරකම් කරන්න කවුරුහරි ඇවිත් කියලයි. ඒ මොකද අපේ මහත්මයා මට කලින් දැනුම්දීල තිබුණේ; කළු ව්‍යාඝ්‍රයා මිලකරන්න බැරි තරම් වටිනා එකෙක් නිසා හොරහතුරන්ගෙන් පරෙස්සම් කරගත යුතු බව. මම වහාම පඳුරක් පිටුපස හැංගිලා බලාගෙන හිටියා. මඳ වෙලාවක් යද්දී මං දුටුවා ඒ කථාකළ දෙන්නා ලන්තෑරුමක් අරගෙන කන්ද බැහැලා එනබව. ඔවුන් අඳුනාගන්න මට අපහසුවුණේ නැහැ. ඒ අපේ ජේකොබ් මහත්තයා සහ ඔහුගේ ඥාති සහෝදරයා කිං මහත්තයා බව මං තේරුම් ගත්තා. ලන්තෑරුම තිබුණේ ජේකොබ් මහත්මයා අතේ. ඔවුන් ගියේ ව්‍යාඝ්‍රයා දමා තිබූ ගේ පැත්තට. මේ මහ රෑ ඔවුන් මොනවද කරන්න හදන්නේ? මගේ සිතේ කුතුහලයක් ඇතිවුණා.

 http://sherlockholmesinvestigations.blogspot.com

ඔවුනට නොපෙනෙන්න, අඩි ශබ්දය නොඇහෙන්න මමත් පිටිපසින් ගියා. ගිහින් ඒ ළඟම තියෙන එල්ම් ගහට මුවාවෙලා බලාගෙන හිටියා. ඔවුන් ආවේ මොකක් හරි දෙයක් ගැන කතා කර කර.......

"..... මාෂල්. ඔබ කිව්වනේ වැඩ කටයුතු රාශියක් සඳහාම මුදල් ඕනෑ වෙන බව?" ජේකොබ් මහත්තයා කිව්වා. "ඒව සමහරක් දැන් මට මතකත් නැහැ. මාෂල්ට තියෙන්නේ ඒව ඔක්කොම මට කොළයක ලියලා දෙන්න. එතකොට මට හිතාගන්න පුළුවනි ඔබට කොයිතරම් මුදලක් උවමනා වෙනවද කියලා. එච්චරයි. එහෙනම් මට හෙට උදේට ලියලා දෙන්න. හරිද?"

"බොහොම හොඳයි" මාෂල් මහත්තයා කිව්වා.

"මං හිතුවා වගේමයි." ජේකොබ් මහත්තයා කිව්වා. "කුණාටුවත් විදුලි කෙටීමත් නිසා ටොම් හරි කලබලයට පත්වෙලා. මය ඇහෙන්නේ ඌ ගොරවමින් කූඩුවේ ඉහළ පහළ යන සද්දෙ"

ඊළඟට ඔහු ලෑලි ජනෙල් පියන පැත්තකට තල්ලු කරලා බැලුවා.

"හරි. ඌ කූඩුව ඇතුළෙ තමයි ඉන්නෙ" එහෙම කියූ ජේකොබ් මහත්තයා යකඩ කොටු තියෙන එළිමය දෙර ඇරගෙන ඇතුළුවුණා. ඔහුගේ අතේ තිබුණා ලන්තෑරුම. මාෂල් මහත්තයා ගියා ඒ පිටිපසින් කුටිය තුළට. දෙන්නාම කුටිය තුළට ගියාම මාත් හුගක් ළඟට ගිහින් බිත්ති කණ්ඩියට මුවාවෙලා බලාගෙන හිටියා. ඒ වෙලාවෙ ටොම් බිම පහුරු ගාමින් කූඩුව ඇතුළේ එහා මෙහා දුවමිනුයි හිටියේ. ඒ අතරේ උගේ වලිගය කසයක් මෙන් ඉහළට පහළට ගැසුවා.

"අසරණ ටොම් ඉන්නේ හරි හිතේ අමාරුවෙන්" ජේකොබ් මහත්තයා කිව්වේ ලන්තෑරුම ඉහළට ඔසවා එළියකර බලමින්. "බැලූ බැල්මට පෙනෙන්නේ ඌ මිහා කළු යක්ෂයෙක් වගේ නේද මාෂල්! අපි මේ අසරණ සතාට කෑම ටිකක් දෙමු. එළියේ මේ ළඟම තමයි මුගේ කෑම ගබඩාව තියෙන්නේ. ඒකෙන් මස් කුට්ටියක් අරගෙන මං මිනිත්තුවෙන් එන්නම්. මාෂල්ට පුළුවන්ද මේ ලන්තෑරුම ටිකකට අල්ලාගෙන ඉන්න?"

කිසිවක් නොකියූ මාෂල් මහත්තයා ලන්තෑරුම අතට අරගෙන ටොම් දිහා බලාගෙන කුටිය ඇතුළේ හිටියා. ජේකොබ් මහත්තයා එළියට ඇවිත් යකඩකොටු සහිත එළියේ දෙර වැහුවා. මාෂල්

මහත්තයා ඇතුළේ. ඔහු තිගැස්සී ආපසු හැරී බැලුවා. ලන්තෑරුමේ එළියෙන් මං දුටුවා ඔහුගේ භීතියට පත් මුහුණ.

"මේ මේ දොර අරින්න! හැරී! මට එළියට එන්න ඉඩදෙන්න!"

"හරි හරි කලබල නොකර ඉන්න" ජේකොබ් මහත්තයා කිව්වා. "ඔහේගේ අතේ තියෙනවා නේ ලන්තෑරුම"

"ඔව්. ඒ වුණාට මේ කුටිය ඇතුළේ තනියෙන් ඉන්න මං කැමති නෑ. දොර අරින්න හැරී" මාෂල් මහත්තයා කෑගැහුවා. ඒ දොර ඇතුළෙන් අරින්න බැහැ. මං කලින් කියූවා වගේ පිටින් අරින්නත් යතුරක් ඕනෑ.

"මොනවා? ඔහේ කැමති නැද්ද තනියෙන් ඉන්න?" අපේ මහත්තයා ඇහුවේ හිනාවෙමින්. "නෑ නෑ වැඩිවෙලා ඔහේට තනියෙන් ඉන්න වෙන්දෙන නෑ මාෂල්"

"මට එළියට එන්න මේ දොර අරින්න හැරී!" මාෂල් මහත්තයා කෑගැහුවේ කේන්තියෙන්. "මේ වගේ විහිළුවලට මං කැමති නෑ"

"විහිළු? මෙතැන කිසිම විහිළුවක් නෑ" ජේකොබ් මහත්තයා එහෙම කිව්වේ යළිත් හිනාවෙමින්. මීළඟට ඔහු ටික ටික අර ග්‍රිල් ගේට්ටුව අරින රෝදය කරකවන්න පටන්ගත්තා. ඔහු මේ හදන්නේ මාෂල් මහත්තයා හිටි කුටිය ඇතුළට වඳුරුලයා නිදහස් කරන්න නේද? මගේ ඇඟ භීතියෙන් කිළිපොළා ගියා......"

කථාව කියමින් සිටි බෝල්ඩ්වින් එක්වරම එය නැවැත්විය. මේ අවස්ථාවේ ඉතා බියකරු සිදුවීමකට අපි මුහුණ දුන්නෙමු. කෝපයෙන් පිපිරෙමින් සිටි හැරී ජේකොබ් තම සේවකයා වෙතට කඩා පැන්නේය. ඔහු දෑතින්ම බෝල්ඩ්වින්ගේ ගෙල හිරකරගෙන එය මිරිකීමට උත්සාහ කළේ දෙපසින් පොලිස් නිලධරයන් දෙදෙනෙකු සිටි බව ද නොසලකමිනි. කකුළුවෙකු මෙන් දැඩි ග්‍රහණයක් යෙදූ ජේකොබ්ගේ දෑත් මුවනට ගැනීමට පොලිස් නිලධරයන් දෙදෙනාට අපහසු විය. හුස්මගැනීම අපහසු වී සේවකයා දඟලීමට පටන්ගත්තේය. බෝල්ඩ්වින්ගේ මුහුණ සුදුමැලි වූ අතර දෙනෙත් එළියට පැනීමට මෙන් ඉදිරියට තල්ලු විය. ඔවුන් දෙදෙනාගේම ශක්තිය යෙදුවත් ලෙස්ට්‍රේඩ්, මැකන්සි දෙදෙනාට සේවකයා, බේරා ගැනීමට නොහැකිවන බැව් පෙනිණ. වහාම එතැනට පිනූ හෝම්ස් තම සාක්කුවේ තිබූ රිවෝල්වරය ගෙන, ජේකොබ්ගේ හිසට වේගවත් පහරක් එල්ල කළේය. ඒ පහරේ

 http://sherlockholmesinvestigations.blogspot.com



"ග්‍රිල් ගේට්ටුව ඇද්දත් එය ඇදී ගියා"

http://sherlockholmesinvestigations.blogspot.com

වේදනාවෙන් ජේකොබ්ගේ ග්‍රහණය මඳකට ලිහිල් වූ බැව් පෙනිණ. ඒ අවසරයෙන් පොලිස් නිලධරයන් දෙදෙනාට බෝල්ඩ්වින් ඉවතට ඇදගැනීමට හැකිවිය.

"කතාව තවමත් ඉවර නෑ ජේකොබ්" හෝම්ස් කීවේ ඔහු දෙසට රිවෝල්වරය එල්ල කරමිනි. "තමුසෙ හිතුවද මේ මිනිහාගේ බෙල්ල මිරිකුවොත් ඒ වේදනාවෙන් ගැලවෙන්න පුළුවන් කියලද? අර පුටුවෙන් වාඩිවෙලා ඉන්නවා, කලබල කරන්නෙ නැතුව. වොට්සන් බලන්න අර මනුස්සයට මොකද කියලා"

ගෙලට එල්ල වූ දැඩි ග්‍රහණය නිසා බෝල්ඩ්වින් සිටියේ කම්පනයට පත්වූ විලසිනි. මිනිත්තු කිහිපයක් ගතවෙද්දී ඔහු යථා තත්ත්වයට පත්විය. තම රිවෝල්වරය ඉවතට ගත් පොලිස් පරීක්ෂක මැකෙන්සි හෝම්ස් අසලට ගොස් ජේකොබ් ළඟින් අසුන්ගත්තේය. ඒ සමගම ඔහු තම ගිනි අවිය ජේකොබ්ගේ හිස දෙසට එල්ල කරගෙන සිටියේය.

"මහත්තයා. ඔබේ සේවකයාට ඒ කතාවේ ඉතුරුහරිය කියන්න ඉඩහරින්න. නැත්නම් මගේ ගිනිඅවිය ක්‍රියාත්මක කරන්න මං ප්‍රමාදවෙන්නේ නෑ!" මැකෙන්සිගේ එම තර්ජනයෙන් ජේකොබ් භයට පත්වූ බැව් පෙනිණ.

"බෝල්ඩ්වින්. දැන් කියන්න ඔබේ කතන්දරය" හෝම්ස් කීවේ ජේකොබ්ට එල්ල කළ රිවෝල්වරය ඔහු වෙතට ළංකරමිනි.

"...... මහත්වරුනි. මං කිය කිය හිටියේ ජේකොබ් මහත්තයා අර යකඩ රෝදය කරකවමින් ග්‍රිල්ගේට්ටුව අරින්න උත්සාහ කළ බව. මාෂල් මහත්තයා විලාප නගමින් ඒකේ එල්ලිලා ඇද්දේ ඔහුගේ ශක්තියෙන් ඒක වහන්න පුළුවන්ද බලන්න. නමුත් ඒ ග්‍රිල්ගේට්ටුව යකඩ පීල්ලක් මත දුවන රෝද සවිකළ එකක්. කෙනෙක් එළියේ තිබෙන රෝදය කරකවල අරිද්දී අනේ ශක්තියෙන් ඒක නවත්වන්න කාටවත් බෑ. මාෂල් මහත්තයා ඇරෙන ග්‍රිල් ගේට්ටුව සමග ඇදී ගියා. ඔහු ජේකොබ් මහත්තයාට ආයාචනා කළා.

"මං ඔබේ නෑදෑයෙක්" මාෂල් මහත්තයා කිව්වා. "මං ඔබේ අමුත්තෙක්. ඇයි දෙවියනේ මාව මේ විදියට මරා දමන්න හදන්නේ? මං ඔබට මොන වැරැද්දක් කළාටද? මං එක වචනයකින් වත් ඔබේ හිත රිදවලා තියෙනවද? ඇයි දෙවියනේ ඔබට හිතක් පපුවක් නැද්ද? මේක මහා දරුණු අපරාධයක්! දෙවියනේ!"

 http://sherlockholmesinvestigations.blogspot.com

"ග්‍රීල් ගේට්ටුව අස්සෙන් රිංගලා කූඩුව තුළට පැන්නා

Reading Purpose Only Not For Print
http://sherlockholmesinvestigations.blogspot.com

ග්‍රිල් ගේට්ටුව අඩක් ඇරියත් ව්‍යාඝ්‍රයා ඌ හිටිතැනින් හෙලවුණේ නැහැ. මේක ඌට නුපුරුදු දර්ශනයක් නිසා වෙන්න ඇති. ඌ නගුට සොලවමින් හිටිතැනම බලාගෙන හිටියා. මං හිතුවේ මාෂල් මහත්තයාගේ වචනවලට හිත උණුවෙලා අපේ මහත්තයා ග්‍රිල් ගේට්ටුව වහලා දමාවී කියලා.

නමුත් අපේ මහත්තයා රෝදය ළඟට වෙලා බලාගෙන හිටියේ එක වචනයක් හෝ නොකියා. ඔහු යන්න ගියා නම් මං මාෂල් මහත්තයාව බේරාගන්නවා. නමුත් මගේ ස්වාමියා දැඩි ශරීර ශක්තියක් ඇති කෙනෙක්. පොරබදලා ඔහුව පරාජය කරන්න තරම් ශක්තියක් මහලු මට නැහැ. මීට මොහොතකට පෙර ඔබ එය දකින්න ඇති. ඒ ඇරෙන්න ඔහුගේ කබා සාක්කුවේ සමහර වෙලාවට ගිනිඅවි පවා තියෙන බව මං දැනහිටියා.

මාෂල් මහත්තයා යළිත් ආයාචනා කළේ වෙන කරන්න දෙයක් නොතිබුණු නිසා. "ඇයි හැරී මට මෙහෙම කරන්නේ? ඔබට උවමනා කරන්නේ මේ සතා ලවා මාව මරා දමන්නද? ඇයි මෙහෙම අපරාධ කරන්නේ?"

මිනිත්තුවක් දෙකක් යද්දී ව්‍යාඝ්‍රයා ඌ වාඩිවෙලා හිටි තැනින් නැගිටලා මාෂල් මහත්තයා දිහාවට ආවා. ඔහු ග්‍රිල්ගේට්ටුව ළඟින් ඉවත්වෙලා කූඩුව මැදට ආවා. ටොම් ඉවකරමින් ඉදිරියට එද්දී ගොරවන්න පටන්ගත්තේ ඌට ගොදුරක් ලැබුණාම වගෙයි. මාෂල් මහත්තයා තමන්ගේ කබාය ගලවලා අත්දෙකෙන්ම ඔසවා ගත්තේ ටොම්ගේ මුහුණ වැහෙන්න දමන්න. ඔහු ඒක ටොම්ගේ හිස මතට විසිකර උගේ කූඩුව ඇතුළට ගිහින් යළිත් ග්‍රිල්ගේට්ටුවෙන් ඇද්දේ පුළුවන් ශක්තිය යොදමින්. නමුත් මේ පැත්තේ ඉඳගෙන අපේ මහත්තයා රෝදය කරකවමින් ග්‍රිල්ගේට්ටුව සම්පූර්ණයෙන් ඇරියා.

උගේ මුහුණට කබාය වැටීම නිසා කෝපයට පත්වෙලා හිටි ව්‍යාඝ්‍රයා මාෂල් මහත්තයාගේ ඇඟට පැන්නේ එක් මොහොතෙන්. ඒ සමගම ඔහු බිමට පෙරළුණා. මාෂල් මහත්තයා යටිගිරියෙන් නැගූ විලාපයට මගේ ඇඟ සීතලවුණා. මේ භයානක අපරාධය දෑසින් බලාගෙන ඉඳලා මට දැනුණේ මං ක්ලාන්තවුණා වගෙයි.

මාෂල් මහත්තයා ව්‍යාඝ්‍රයාට ගොදුරු වෙද්දී ඔහු වේදනාවෙන් නැගූ විලාපය මිනිත්තු ගණනක් තියෙන්න ඇති. ඒ වෙලාවේ තිබුණු කුණාටුවේ හඬ නිසා ඒක වැඩි ඈතකට ඇහෙන්න නැහැ.

 http://sherlockholmesinvestigations.blogspot.com

මිනිත්තු කිහිපයකට පසු ජේකොබ් මහත්තයා එතැනින් ඉවත්ව් යන අඩි ශබ්දය මට ඇහුණා. තවත් ටිකවේලාවක් මං හිටිතැනම ඉඳලා ඊට පස්සෙ එළියට ආවා.

මේ වගේ භයානක මිනීමරුවෙකු ළඟ මං තවත් රැකියාව කරන්නේ කොහොමද කියලයි මට හිතුණේ. අද ඔහුගේ ඥාති සොහොයුරා මැරුවා. ඊට වඩා පහසුවෙන් හෙට ඔහු මාවත් මරා දමාවි. රැකියාව නැතිවුණත් කමක් නෑ. මේ වගේ අපරාධකාරයෙකු ළඟ ඉඳීමෙන් මගේ ජීවිතයත් අනතුරේ වැටෙන්න පුළුවනි. නිශ්ශබ්දව හිටියොත් මං මේ අපරාධයට හවුල්කරුවෙකුත් වෙනවා. ඒ නිසා මං තීරණය කළා වහාම මෙහෙන් පැනයන්න.

මගේ කාමරයට ගිහින් මගේ ඇඳුම් ටිකකුත්, එකතුවී තිබුණු සුළු මුදලත් සාක්කුවේ දමාගෙන එළවෙලේම ශ්‍රේලන්ඩ්ස් වත්තෙන් පිටවී ආවා. මං හැඬලිවලට ආවේ එදින්ම කළුවරේ. නිව්මාකට් සිට ඉප්ස්විච් දක්වා ගල්අඟුරු ගෙනියන දුම්රියක් හැඬලි දුම්රියපොළේ නවත්වා තිබුණා. ඒකෙ නැඟී ඉප්ස්විච් දක්වා ඇවිත්, පාන්දර ලන්ඩන් යන සීඝ්‍රගාමී දුම්රියක යන්න මට හැකිවුණා. ඔහුට විරුද්ධව සාක්ෂි දුන්නොත් ජේකොබ් මහත්තයා මාව මරා දමනවා නියතයි. ඒ නිසා මං ඥාතියෙකුගේ ගෙදර හැංගුණා. මේ ෂර්ලොක් හෝම්ස් මහත්තයා කොහොම හරි මාව හොයාගත්තා"

"ඔබට නිදහසට කීමට මොනවා හරි තියෙනවද ජේකොබ්?" ලෙස්ට්‍රේඩ් ඇසුවේ තම සාක්කුවේ තිබූ මාංචු එළියට ගනිමිනි.

"මේ මිනිහා කියන්නෙත් සම්පූර්ණ බොරු" කෝපාවිෂ්ට වී සිටි ජේකොබ් කෑගැසීය. "පුළුවන් නම් ඔප්පු කරන්න මා එවැනි දෙයක් කළා කියලා. ඔහුගේ අතින්වුණු වැරැද්ද වහගන්න බොරු ගොතා කියනවා. මං මොකටද ඒ අහිංසක මෑළේව මරන්නේ? මේව අමූලික බොරු. මාව නිදහස් කරන්න! බොරු චෝදනා උඩ මාව අත්අඩංගුවට ගන්න ඔහේලට බෑ"

මේ අයුරින් කෑගැසුවත් ලෙස්ට්‍රේඩ්ගෙන් හා මැකෙන්සිගෙන් ජේකොබ්ට බුරුලක් නොලැබිණි. ඔහුගේ කෑගැසීම අසා එතැනට දුව ආ ඔහුගේ බිරිඳ ජෙසිකා, කිසිත් නොකියා නිහඬව ඔහු දෙස බලා සිටියාය.

* * *

http://sherlockholmesinvestigations.blogspot.com

"හෝම්ස්. ඔබ කොහොමද දැනගත්තේ මේ අපරාධය ජේකොබ් විසින් කළ එකක් බව?" මා මගේ මිත්‍රයාගෙන් ඇසුවේ එද හැන්දෑවේ බේකර් වීථියේ අපේ නිවහනේදිය. හෝම්ස්ගෙන් ඇරයුම් ලැබ අප නිවසේ රාත්‍රී භෝජනය සඳහා තවත් අමුත්තෝ දෙදෙදෙනක් පැමිණ සිටියහ. ඒ ස්කොට්ලන්ඩ්යාඩ් පොලිසියේ ලෙස්ට්‍රේඩ් හා ඉප්ස්විච් පොලිසියේ ජෝජ් මැකෙන්සි ය. හඩ්සන් මහත්මිය රාත්‍රී භෝජනය සූදානම් කරන තුරු අපට කථාකිරීමට බොහෝ දේ තිබිණ.

"ඔබ හැමදෙනාම පශ්චාත් මරණ පරීක්ෂණයට සහභාගි වන වෙලේ මං කළේ මොකක්ද?" හෝම්ස් විමසුවේ තම වීදුරුවට සෝඩා ස්වල්පයක් වත්කර ගනිමිනි. "මං ඉතාම පරෙස්සමෙන් අර කුටියේ සිමෙන්ති පොළොව මත තිබුණු ලේ කැටි ඉවත් කළා. ඒවාට යට වී තිබුණු ඉතාම වැදගත් සාක්ෂියක් මට දකින්න ලැබුණේ ඒ වෙලාවේ. ජේකොබ්ගේ හා මාෂල්ගේ මඩ තැවරුණු සපත්තුවල අඩි සලකුණු.

ඊට කලින් මා දුටුවා එම සලකුණුම ව්‍යාඝ්‍ර කාමරය වෙත තණබිම හරහා තිබුණු පාරේ. ඒ පාර මඩවී තිබුණු නිසා තමයි, මඩ සහිත අඩි සලකුණු කුටිය ඇතුළේ සලකුණු වුණේ. මාෂල්ගේ පාවහන් සාමාන්‍ය එංගලන්ත පාවහන් ජේකොබ් ගෙදරටත් පැළඳ හිටියේ මාළු කොරපොතු මෝස්තරය සහිත ක්‍රේප් රබර් අඩියක් ඇති බූට් සපත්තු"

"ඔබ කොහොමද කියන්නේ ඒවා එද රාත්‍රියේ ඇතිවුණු සලකුණු කියලා?" මම ඇසීමි. "එද උදේ හෝ කලින් දිනයක ඇතිවුණු සලකුණු වෙන්න බැරිද?"

"මං එහෙම කියන්නේ කාරණා දෙකක් නිසා" හෝම්ස් කීය. "එකක්, මේ කුටියේ සිමෙන්ති පොළොව හැමදම උදේ සහ සවස, විෂබීජ නාශක යොදා, බුරුසුවකින් අතුල්ලා පිරිසිදු කරන බව අපට දැනගන්න ලැබුණා. ඊළඟට මාසයකට වැඩි කාලයක් වැස්සක් නොමැතිව වියළි කාලගුණයක් තිබිලා එද රාත්‍රියේ තමා මහ වැස්සක් වැටුණේ. ඒ වැස්සෙන් තමා පොළොව ඔක්කොම මඩවුණේ. ඊට කලින් දවස්වල ඇතිවුණු සලකුණුවලින් මඩපැල්ලම් ඇඳෙන්න හැටියක් නෑ. අනික ව්‍යාඝ්‍ර කූඩුව හා කුටිය සේදීමට යොදන වතුර ඔක්කොම ඉවතට ගලා බහින්න හොඳ කාණු පද්ධතියක් එහි තිබුණා.

 http://sherlockholmesinvestigations.blogspot.com

ලේ කැටිවලට යටින් තිබූ මඩ සහිත සපත්තු අඩිවලට අමතරව තවත් දේවල් තිබුණා. සුරුට්ටු කෝට දෙකක් සහ සුරුට්ටු අළු. මෙයින් පැහැදිලියි මාෂල් කිංගේ මරණයට පෙර, මහ වැස්සට පසු ඔවුන් දෙදෙනා එම කුටිය තුළට පැමිණි බව.

ජේකොබ් කිව්වේ, අද රාත්‍රියේ මාෂල් තනියම ව්‍යාඝ්‍රයා බලන්න එන්න ඇති කියල නේ. ඒ කතාව බොරු වෙනවා මා සොයා ගත් දෙදෙනාගේම පා සටහන්වලින්. එතකොට මං තේරුම් ගත්තා, මොනවා හරි ක්‍රමයකින් මාෂල් රවටා ගෙන එහි ගෙනැවිත් ඇති බව. ඊළඟට කූට උපායක් යොදලා මාෂල් කුටිය ඇතුළට යවලා පිටදොර වසා ව්‍යාඝ්‍රයා ලවා මරවා ඇති බව මම තේරුම් ගත්තා."

"ඇයි හෝම්ස් මහත්මයා ඔහු එවැනි අපරාධයක් කළේ?" මැකෙන්සි ඇසීය.

"ඒකට හේතුව තියෙනවා අද දවස "ස්ටාර්" පුවත්පතේ" හෝම්ස් පැවසුවේ එම පුවත්පතේ මුල් පිටුවේ පහළින් තිබූ ප්‍රවෘත්තියක් අපට පෙන්වමිනි.

සදර්ටන් සාමිවරයා අභාවප්‍රාප්ත වෙයි

මහා ධනකුවේරයකු ලෙස සැලකෙනු සදර්ටන් සාමිවරයා අද උදෑසන ක්වීන් ඇලෙක්සැන්ඩ්‍රා රෝහලේදී මියගියේය. මියයන විට 92 වැනි වියේ පසුවූ සාමිවරයා ඉතා දීර්ඝ කාලයක සිට රෝගාබාධ කිහිපයකින් පෙළෙමින් සිටියේය. සිය පියාණන්ගේ ඇවෑමෙන් සාමි පදවිය හිමිවීමට පෙර ඔහු හැඳින්වුණේ ඩන්කන් කිං යන නාමෙනි. ඔහු කිසිදිනෙක විවාහ නොවූ බැවින් මීළඟ සදර්ටන් සාමි තනතුර හිමිවන්නේ කාටද යන්න පිළිබඳව අවිනිශ්චිත බවක් ඇතැයි තතු දන්නෝ පවසති.

සදර්ටන් සාමිගේ එකම සොහොයුරා වූ හැරල්ඩ් කිං මහතා මියගියේ මීට අවුරුදු පහකට පමණ පෙර්ය. ඔහුට පුත්තු තිදෙනෙක් වූහ. වැඩිමහල් පුතා වූ අධිනීතිඥ මර්වින් කිං ලන්ඩනයේ සමාජශාලාවකදී ඝාතනය කෙරිණි. දෙවැනි පුත්‍රයා වූ ආචාර්ය වර්නන් කිං, භූ විද්‍යා සමීක්ෂණයක් සඳහා බ්‍රසීලයට ගොස් සිටියදී හදිසි අනතුරකින් මියගියේය. බාලයා වූ මාෂල් කිං, පෞද්ගලික සත්වෝද්‍යානයකදී මිනීකන ව්‍යාඝ්‍රයකු විසින් මරාදමන ලද්දේ මීට සතියකට පමණ ඉහතදීය.

http://sherlockholmesinvestigations.blogspot.com

සාමි නගනුර කෙසේ වෙතත් පවුලේ අතිවිශාල ධනස්කන්ධය උරුම වෙන එක් වාසනාවන්තයකු ජීවතුන් අතර සිටියි. ඔහු නම් සෆෝක් ප්‍රාන්තයේ ග්‍රේලන්ඩ්ස් වතුයායේ හිමිකරු වන හැරී ජේකොබ් මැතිතුමාය. සදර්ටන් සාමිගේ එකම සොහොයුරියගේ එකම පුත්‍රයා වන ඔහු, අසරණයිනට සැමවිටම පිහිට වෙන දනපතියෙකු බවට ප්‍රසිද්ධියක් උසුලයි"

"මහත්වරුනි" හෝම්ස් කීය. "මේ ප්‍රවෘත්තිය කියෙව්වාම ඔබේ හිතේ ඇතිවෙන අදහස් මොනවාද?"

"මොහු මාළල් මරාදමුවේ සාදර්ටන් සාමිගේ මරණයෙන් පස්සේ ධනස්කන්ධය අයිතිකරගන්න" මම කීවෙමි.

"බොහොම හරි" හෝම්ස් කීය. "ලෙස්ට්‍රේඩ් ඔබට මොකක්ද හිතෙන්නේ?"

"මමත් ඒ අදහසට එකඟයි"

"මැකෙන්සි?"

"වොට්සන් මහත්තය කියූ එක ඉතාම නිවැරදියි"

"ඔව් මහත්වරුනි" හෝම්ස් කීය. "එම කරුණ ඔබ තුන්දෙනාටම පැහැදිලි වීමේ පුදුමයක් නැහැ. නමුත් ඔබට පෙනෙන්නේ නැද්ද තවත් වැදගත් කරුණු දෙකක්? ආචාර්ය චර්චිල් කිං, ජේකොබ්ගේ ඇරයුම පිට බ්‍රසීලයට ගිහිං ඇමේසන් ගඟේ වුණු හදිසි අනතුරකින් මියගියා. ඒක ඇහින්දුටු කෙනෙකුගේ සාක්ෂි නැහැ. ඒක බාගවෙලාවට ඇත්තෙන්ම හදිසි අනතුරක් වෙන්නත් පුළුවනි. නැත්නම් හැරී ජේකොබ්ගේ සියුම් මොළයෙන් කළ හපන්කමක් වුණත් විය හැකියි. එහෙම නේද?"

"හැබෑමයි. අපට ඒක පෙනුණේ නෑ" මම කීවෙමි.

"ඊළඟට මර්වින් කිං මාස හතරකට පෙර නාඳුනන තුවක්කුකරුවෙකුගේ වෙඩිපහරින් මියගියා." කී හෝම්ස් ලාච්චුව විවෘත කොට එහි තිබූ දිනපොත තුළින් කඩදසි කැබලි දෙකක් ගත්තේය. "මෙන්න මේ මගේ වම් අතේ තිබෙන කොළය තමා එද මං ජේකොබ් ලවා යතුරු ලියනය කරවාගත් දැන්වීම - අර බෝල්ඩ්වින් ගැන පුවත්පත් දැන්වීමක් සකස්කරවා ගත්තේ. මගේ දකුණු අතේ තිබෙන්නේ නීතිඥ මර්වින් කිංට, ඔහුගේ මරණය සිදුවීමට පෙර, සමාජශාලාවට කැඳවමින් එද හවස ලැබිල තිබුණු ලියුම. මේකත් යතුරු ලියනය කළ ලියුමක්.

 http://sherlockholmesinvestigations.blogspot.com

මේ දෙක හොඳින් පරීක්ෂා කළොත් ඔබට පෙනේවි ලියවිලි දෙකේ ඇති සමානකම් රාශියක්. දෙකේම කැපිටල් M අකුරු වැදිලා තියෙන්නේ කෙළින් නොවෙයි ඇදක් ඇලවෙලා. ඒ වගේමයි සිම්පල් g, f සහ y අකුරුවල යටට දික්වී ඇති කොටස් කඩදාසියේ හොඳින් ලියැවී නැහැ. මේකට හේතුව එම යතුරුවල එම කොටස් ගෙවී යාම. ඊළඟට බලන්න ලියවිලි දෙකේම නැවතීමේ ලකුණු වෙනුවට හැමතැනකම යොදලා තියෙන්නේ තිත්කොමාව (සෙමි කෝලෝනය). ඒකට හේතුව එක්කෝ යතුරු ලියනයේ නැවතීමේ තිත යොදන යතුර නරක් වෙලා. නැත්නම් ලියන්නා විරාම ලකුණු යෙදීම ගැන හරි අවබෝධයක් නැතිකම. කොහොම වුණත් ලියවිලි දෙකේම ඒ වැරැද්ද නැඹන නැවතත් තියනවා. ඒකෙන් අපට හිතාගන්න පුළුවන් මොකක්ද වොට්සන්?"

"මර්වින් කිං සමාජශාලාවට කැඳවූ ලියුම ලිව්වෙත්, හැරී ජේකොබ්ගේ යතුරු ලියනයෙන්, බොහෝවිට ඔහු විසින්මයි කියලා"

"විශිෂ්ටයි වොට්සන්" හෝම්ස් කීය. "ඔබට මතක ඇති අපේ මුල්කාලයේ පරීක්ෂණයකදීත් යතුරු ලියනයක අඩුපාඩුවලින් මේ විධියේම සොයාගැනීමක් කළා"

"මගේ මතකය නිවැරදි නම් ඒ අර මේරි සදර්ලන්ඩ් මෙනෙවියගේ පරීක්ෂණයේ දී."

"අන්න හරි"

"හෝම්ස් මහත්මයා" ලෙස්ට්‍රේඩ් කීය. "එතකොට ඔබ කියන්නේ මර්වින් කිං ඝාතනයත් හැරී ජේකොබ්ගේ වැඩක් කියලද?"

"ඒ ගැන මට කිසිම සැකයක් නෑ" හෝම්ස් කීය. "මර්වින් කිංට වෙඩිතැබූ ගිනිඅවිය ජේකොබ්ලාගේ ගෙදර ලාච්චුවකින් හමුවුණොත් පුදුමයට කරුණක් නොවෙයි."

"මේ විශාල ධනස්කන්ධය හිමිකරගන්න ජේකොබ් අර අසරණ කිං සහෝදරයන් තුන්දෙනාම ඝාතනය කරලා තියෙනවා" මැකෙන්සි කීය.

"ජේකොබ් ගැන විමසලා මම බ්‍රසීලයේ පර්නැම්බුකෝ නගරයේ පොලිස්පතිවරයාට විදුලි පුවතක් යැව්වා" හෝම්ස් කීය. "රැකියාව ලෙස ජේකොබ් කරල තියෙන්නේ ඇමෙසන් වනාන්තරයේ බිහිසුණු සතුන් අල්ලාගෙන, විදේශ රටවල සත්වෝද්‍යාන හා

http://sherlockholmesinvestigations.blogspot.com

සර්කස් සමාගම්වලට විකිණීම. ඒ මගින් ඔහු විශාල මුදලක් උපයාගෙන තිබෙන බව ඇත්තලු. ඔහුගේ පළමු බිරිඳ හදිසියේ මියගියාලු. ඒ විකිණීම සඳහා කුඩුවක දමා ගෙදර තබාගෙන සිටි ව්‍යාඝ්‍රයෙකු විසින් සපාකෑම නිසා. බාගවෙලාවට ඇයට අත්වුණෙත් මේ ඉරණමද කියන එක දෙවියො තමා දන්නෙ. ඊළඟට ඔහුට විරුද්ධව නඩුවක් තිබිල තියෙනවා, සේවකයෙකුට අමානුෂික ලෙස පහරදී මරා දැමීම ගැන. ප්‍රමාණවත් තරම් සාක්ෂි නොමැතිවීම නිසා ඔහු නඩුවෙන් නිදහස්වුණාලු. එතකොට තමයි ඔහු බ්‍රසීලයෙන් පිටවෙලා එංගලන්තයට එන්න තීරණය කරලා තියෙන්නෙ. ඒ මාස හයකට කලින්. ඔවුන්ගේ අවසන් නිගමනය හැරී ජේකොබ් කියන්නේ සූක්ෂම ලෙස අපරාධ කරන බිහිසුණු පුද්ගලයෙක් බව"

"බෝල්ඩ්වින් තමුන් කළ අපරාධය බලාගෙන හිටි බව දුටුවා නම්, ඔහු බෝල්ඩ්වින් වත් ඉතිරි කරන්නෙ නැහැ" මම කීවෙමි.

"ඒක නොවෙයි හෝම්ස්. ඔබ කොහොමද බෝල්ඩ්වින් හොයාගන්න සමත්වුණේ?"

"ඒක ඒ තරම් අමාරු කටයුත්තක් වුණේ නැහැ මගේ හිතවත් වොට්සන්" හෝම්ස් කීය. "මේ වගේ භයානක සතුන් බලාගන්න එක හැමෝටම කරන්න පුළුවන් දෙයක් නෙමෙයි. ඒකට සතුන්ගේ හැසිරීම ගැන හොඳ දැනුමකුත්, ඔවුන් බලාගෙන පළපුරුද්දකුත් තියෙන්න ඕන. මේ වගේ අය මොන රටකවත් විශාල වශයෙන් නැහැ. හිටියොත් බොහෝ විට ඔවුන් සත්වෝද්‍යානයට සම්බන්ධ අය. ඉතින් මං තීරණය කළා ලන්ඩන් සත්වෝද්‍යානයෙන් විමසලා බලන්න. මං මුලින්ම හමුවුණේ එහි වයස්ගත සේවකයෙක්.

"මෙහේ වැඩකරනවද රොබට් බෝල්ඩ්වින් කියල කෙනෙක්?" මං ඇහුවා.

"ඔය කියන්නේ බෙංගාල ව්‍යාඝ්‍රයින් බලාගත්තු බෝල්ඩ්වින්ද?"

"අන්න හරි"

"එයා රැකියාවෙන් විශ්‍රාම අරගෙන හුඟක් කල් නේ" සේවකයා කිව්වා. "දැන් සහෝදරයා පළාතේ පෞද්ගලික සත්වෝද්‍යානයක වැඩ කරනවා කියල ආරංචියි."

"හැබැට? මට එයාව හමුවෙන්න උවමනාවෙලා තියෙනවා. මෙහේ රක්සාවට එනු කාලෙ එයා ලන්ඩනයේ පදිංචි වෙලා හිටියේ කොහේද කියල මතකද?"

 http://sherlockholmesinvestigations.blogspot.com

"තැන් තැන්වල හිඳියා" සේවකයා කිව්වා. "කාලයක් පෙනික්වික් පටුමගේ එයාගෙ අක්කලගේ ගෙදර ඉඳගෙනත් වැඩට ආවා." මං ඔහුට ස්තූතිකරලා වහාම ගියා කාර්යාලයට. ඔවුන්ගේ ලිපිගොනුවේ තිබුණා ලිපිනය - අංක 77 සී, පෙනික්වික් පටුමග.

මං ඒ ගෙදරට ගිහින් දොරට තට්ටුකළා. ඇවිත් දොර ඇරියේ බෝල්ඩ්වින්. ග්‍රේලන්ඩ්ස්වල ඇත්තෙන්ම සිදුවුණු දේ මොකක්ද කියලා පොලීසිය දන්න බව මං ඔහුට අහදලා දුන්නා. එතකොට ඔහු කැමැතිවුණා ඇසින් දුටු සාක්ෂිය කියලා පොලීසියට සහයෝගය දෙන්න."

* * *

හැරී ජේකොබ්ගේ බිරිඳ ඇගේ ස්වාමියාගේ කටයුතු පිළිබඳව පොලීසියට හෙළිකළාය.

"මට හරි කණගාටුයි මාෂල් කිං මහත්මයාට අත්වුණු ඉරණම ගැන" ඇය කීවාය. "ඔහුට එංගල්න්ඩ් රාගෙන ලන්ඩන් නගරයට පැන ගන්න, මට පුළුවන් තරමින් මං අනතුරු ඇඟෙව්වා. නමුත් ඔහුගේ මෝඩකමට ඔහු ඒ අවවාදය පිළිගත්තේ නැහැ. හැරී කියන්නේ මොන තරම් බිහිසුණු තිරිසනෙක්ද අපරාධකාරයෙක්ද කියන එක දැනගිටියේ මං විතරයි. ඔහුගේ නියම ස්වභාවය මං එක වචනයකින් හරි හෙළිකළා නම්, ඔහු මාවත් මරා දමනවා. මං හිතාගෙන හිටියේ මගේ ජීවිතේටම හැරීගෙන් මට ගැළවීමක් නැතිවේවි කියලයි. නමුත් හෝම්ස් මහත්මයාගේ හපන්කම නිසා, මං සදකාලයටම හැරීගෙන් ගැළවුණා. ඒකට මං හෝම්ස් මහත්මයාට සදකාලයටම ණයගැතියි."

ජේකොබ් මහත්මිය ලබාදුන් තොරතුරු නිසා මර්වින් කිං ඝාතනය හෙළිකරගැනීමට හෝම්ස්ට ඉතා පහසුවෙන්ම හැකිවිණ. හැරී ජේකොබ් පොලිස් අත්අඩංගුවට පත්වී ඇති බව දුටුවිට ඔහුට සහාය වූ කුලී අපරාධකරුවා පාපෝච්චාරණය කළේය. ජේකොබ්ගෙන් මුදල් ලබාගෙන නීතිඥයා රාත්‍රී සමාජශාලාව වෙත ගෙන ගොස් ඝාතනය කළ හැටි ඔහු හෙළි කළේය. අපරාධ දෙක පිළිබඳවම නඩු දෙකක් අසාවිය හමුවට ගිය අතර හැරී ජේකොබ්ට නඩු දෙකෙන්ම මරණ දඬුවම නියමවිණි.

http://sherlockholmesinvestigations.blogspot.com

සදර්ටන් සාමිවරයාගෙන් උරුම වූ මහාධනස්කන්ධය ජේසිකා ජේකොබ් අනාථ ළමයින් හා වැඩිහිටියන් සඳහා වූ අරමුදලකට පරිත්‍යාග කළාය. සිය ගමන්වියදම් සඳහා පමණක් සුළු මුදලක් ඉතිරිකරගත් ඇය සිය මව්රට බලා නැව් නැග්ගාය. පර්නැම්බුකෝ ප්‍රාන්තයේ රෙයිෆෝ නගරයේදී ඇය යළිත් විවාහ වූ බව අපට පසුව දැනගන්නට ලැබිණි.

නිමි.

Reading Purpose Only, Not For Print

කළු ව්‍යාඝ්‍රයා

සහ තවත් ෂර්ලොක් හෝම්ස් කථා

THE BRAZILIAN CAT

කළු ව්‍යාඝ්‍රයා

[illegible]

පැරඩෝල් කුටියේ වික්‍රමය

[illegible]

ලොව්නර් හෝටලයේ මිනීමැරුම

[illegible]

සමර්සෙට් ඛේදවාචකය

[illegible]

චන්දන මෙන්ඩිස් ප්‍රකාශන

http://sherlockholmesinvestigations.blogspot.com